257 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 257 - இல. 5
Volume 257 - No. 5

2017 නොවැම්බර් 22 වන බදාදා
2017 நவம்பர் 22, புதன்கிழமை
Wednesday, 22nd November, 2017

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**වරප්‍රසාද:**

දුරකථන සංවාද පිළිබඳ අපහාසාත්මක මාධ්‍ය වාර්තා

**විසර්ජන පනත් කෙටුම්පත, 2018 – [එකොළොස්වැනි වෙන් කළ දිනය]:**

[ශීර්ෂ 118, 281, 285 (කෘෂිකර්ම අමාත්‍යාංශය); ශීර්ෂ 160, 283, 291 (මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය); ශීර්ෂ 198, 282 (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය); ශීර්ෂ 199, 289 (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය)] - කාරක සභාවේදී සලකා බලන ලදී.

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය :**

**වාර්ෂික වාර්තාව හා ගිණුම් (2012)**

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය :**

**වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013)**

**රාජ්‍ය දැව සංස්ථාව :**

**වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013)**

**කල් තැබීමේ යෝජනාව:**

ගුරු පත්වීම් අපේක්ෂකයින්ට පදිංචි ප්‍රදේශය තුළම පත්වීම් ලබා දීම

---

# பிரதான உள்ளடக்கம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**சிறப்புரிமை:**

தொலைபேசி உரையாடல் பற்றி நிந்திக்கும் ஊடக அறிக்கைகள்

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2018 [ஒதுக்கப்பட்ட பதினோராம் நாள்]:**

[தலைப்புக்கள் 118, 281, 285 (கமத்தொழில்); தலைப்புக்கள் 160, 283, 291 (மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல்); தலைப்புக்கள் 198, 282 (நீர்ப்பாசன மற்றும் நீர் வளமூல முகாமைத்துவம்); தலைப்புக்கள் 199, 289 (ஆரம்பக் கைத்தொழில்)] – குழுவில் ஆராயப்பட்டது

**இலங்கை மகாவலி அதிகாரசபை:**

ஆண்டறிக்கையும் கணக்குகளும் (2012)

**இலங்கை மகாவலி அதிகாரசபை:**

ஆண்டறிக்கையும் கணக்குகளும் (2013)

**அரச மரக் கூட்டுத்தாபனம்:**

ஆண்டறிக்கையும் கணக்குகளும் (2013)

**ஒத்திவைப்புப் பிரேரணை:**

விண்ணப்பதாரிகள் வசிக்கும் பிரதேசத்தினுள் ஆசிரியர் நியமனங்களை வழங்குதல்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

PRIVILEGE:

Insulting Media Reports Regarding Telephone Conversations

APPROPRIATION BILL, 2018- [Eleventh Allotted Day]:

Considered in Committee – [Heads 118, 281, 285 (Agriculture); Heads 160, 283,291 (Mahaweli Development and Environment); Heads 198,282 (Irrigation and Water Resources Management); Heads 199,289 (Primary Industries)]

MAHAWELI AUTHORITY OF SRI LANKA:

Annual Report and Accounts (2012)

MAHAWELI AUTHORITY OF SRI LANKA:

Annual Report and Accounts (2013)

STATE TIMBER CORPORATION:

Annual Report and Accounts (2013)

ADJOURNMENT MOTION:

Providing Teaching Appointments within the Residential Area of Appointees

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2017 නොවැම්බර් 22 වන බදාදා***
*2017 நவம்பர் 22, புதன்கிழமை*
*Wednesday, 22nd November, 2017*

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස්විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයා ගමගේ මහතා - [සභා ගර්භය තුළ නැත.]

ගරු නිශාන්ත මුතුහෙට්ටිගම මහතා - [සභා ගර්භය තුළ නැත.]

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා - [සභා ගර්භය තුළ නැත.]

ගරු ප්‍රසන්න රණවීර මහතා - [සභා ගර්භය තුළ නැත.]

**ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
ගරු කථානායකතුමනි, කොළඹ 01, ජනාධිපති මාවතෙහි පිහිටා ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ, ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සේවය කරන යූ.ඩී. වීරක්කොඩි මහතා ඇතුළු පිරිසගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுவைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petition ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ අවස්ථාවේදී ගරු සභාවේ අවධානයට මම මේ කාරණය යොමු කරන්න කැමැතියි. අපි ඊයේ දිනයේ ප්‍රධාන කටයුතුවලට යන්න පැය භාගයක් පමණ ප්‍රමාද වුණා. අනෙක් මන්ත්‍රීතුමන්ලාගේ පහසුව සඳහා කරුණාකරලා ප්‍රශ්න ඇසීමේදීත්, පිළිතුරු දීමේදීත් අවශ්‍ය පරිදි, ඉතාම කෙටියෙන් ඒ කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ඇත්තටම ඊයේ පරක්කු වුණේ ප්‍රශ්න නිසා නොවෙයි. මුලදී වරප්‍රසාද ප්‍රශ්නයකුත්, ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්නයකුත් අහපු නිසා තමයි ප්‍රමාද වුණේ. ඒවා ප්‍රශ්න ඇසීමෙන් පස්සේ ගත්තා නම්, ප්‍රශ්න අහන අයට සාධාරණයක් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ප්‍රශ්නය අහන්න.

### ප්‍රථම බාහිර උපාධි පාඨමාලා: විස්තර
### ஆரம்ப வெளிவாரி பட்டப் பாடநெறிகள்: விபரம்
### EXTERNAL BACHELOR'S DEGREE PROGRAMMES: DETAILS

116/'15

**1. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බාහිර සිසුන් සඳහා ප්‍රථම උපාධි පාඨමාලා පවත්වන ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාල කවරේද;

(ii) එම විශ්වවිද්‍යාල පවත්වන එවැනි පාඨමාලා එක් එක් විශ්වවිද්‍යාලය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) දැනට බාහිර උපාධිය සඳහා ලියාපදිංචි සිසුන් ප්‍රමාණය, එක් එක් විශ්වවිද්‍යාලය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත විශ්වවිද්‍යාලවල බාහිර උපාධි හැදෑරීම සඳහා අවසන් වරට සිසුන් ලියාපදිංචි කළ දිනය එක් එක් විශ්වවිද්‍යාලය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සිසුන් ලියාපදිංචි කිරීම ක්‍රමවත් කාල ප්‍රාන්තරයක් අනුව සිදු නොකිරීමට හේතු කවරේද;

(iii) ප්‍රථම බාහිර උපාධිය සඳහා සිසුන් ලියාපදිංචිය සීමා කිරීමට කටයුතු කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வெளிவாரி மாணவர்களுக்காக ஆரம்பப் பட்டப் பாடநெறிகளை நடத்துகின்ற இலங்கையின் அரச பல்கலைக் கழகங்கள் யாவை யென்பதையும்;

(ii) மேற்படி பல்கலைக் கழகங்களால் நடத்தப்படுகின்ற பாடநெறிகள் ஒவ்வொரு பல்கலைக் கழகத்தின்படி தனித்தனியாக யாவையென்பதையும்;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iii) தற்போது வெளிவாரிப் பட்டப்படிப்பிற்காக பதிவு செய்யப்பட்டுள்ள மாணவர்களின் எண்ணிக்கை ஒவ்வொரு பல்கலைக் கழகத்தின்படி தனித்தனியாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி பல்கலைக்கழகங்களில் வெளிவாரிப் பட்டப்படிப்புக்காக இறுதியாக மாணவர்கள் பதிவு செய்யப்பட்ட திகதி ஒவ்வொரு பல்கலைக்கழகத்தின்படி தனித்தனியாக யாதென்பதையும்;

(ii) மாணவர்களைப் பதிவு செய்தல் முறைசார்ந்த காலஇடைவெளியின்படி மேற்கொள்ளப்படாமைக்கான காரணங்கள் யாவையென்பதையும்;

(iii) ஆரம்ப வெளிவாரிப் பட்டத்திற்கான மாணவர் பதிவை மட்டுப்படுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

116/'15

asked the Minister of Higher Education and Highways:

(a) Will he inform this House -

(i) the names of the State universities in Sri Lanka in which bachelor's degree programmes are conducted for external students;

(ii) separately, the nature of the degree programmes conducted by each of the aforesaid universities; and

(iii) separately, the number of students that have been registered with each of the aforesaid universities for external degrees at present?

(b) Will he also inform this House -

(i) separately, the dates on which students were registered for the last time for following external degree programmes in each of the aforesaid universities;

(ii) the reasons as to why registration of students is not done at regular intervals; and

(iii) whether action has been taken to limit the number of external students that get registered for the bachelor's degrees?

(c) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේය:

(අ) (i) ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත.

(ii) ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

(iii) ඇමුණුම 03 මඟින් ඉදිරිපත් කර ඇත.

(ආ) (i) ඇමුණුම 04 මඟින් ඉදිරිපත් කර ඇත.

එම ඇමුණුම් **සභාගත*** කරමි.

(ii) විශ්වවිද්‍යාල අභ්‍යන්තර සිසුන් බඳවා ගැනීම හා එම ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් ප්‍රමුඛතාවන් ලබා දෙනු ලබන අතර, බාහිර ශිෂ්‍යයන් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කරගනු ලැබීමේදී එම කටයුතු සඳහා කැපකළ යුතු මානව හා අනෙකුත් සම්පත්වල සීමා සහිත බව නිසා බඳවා ගැනීමේ කාලසීමාව කලින් කලට වෙනස් වේ. එමෙන්ම විශ්වවිද්‍යාල මඟින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණය ද මෙම වෙනස්කම්වලට හේතුපාදක වී ඇත.

(iii) ඔව්.

2010.10.15 දිනැති අංක 932 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව, විශේෂ අවස්ථා යටතේ හැර බාහිර උපාධි පාඨමාලාවක් සඳහා ඇතුළත් කර ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව ඒ හා සමාන අභ්‍යන්තර අධ්‍යයන වැඩසටහනක් සඳහා ඇතුළත් කරගන්නා අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව මෙන් දෙගුණයක් නොඉක්මවිය යුතුය.

තවද, ඉහත විධිවිධාන පහත දැක්වෙන පරිදි සීමා කෙරේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2016.08.31 දිනැතිව නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 13/2016 අනුව පීඨයේ බාහිර උපාධි පාඨමාලා සඳහා වාර්ෂිකව ලියා පදිංචි කරන ලද මුළු ශිෂ්‍ය සංඛ්‍යාව එම වසරේ එම පීඨයේ අභ්‍යන්තර උපාධි පාඨමාලා සඳහා ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව නො ඉක්මවිය යුතුය.

ඉහත කරුණුවලට අමතරව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පවත්නා යටිතල පහසුකම් ප්‍රමාණය අනුවද සිසුන් ලියා පදිංචිය සීමා කර ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, පැහැදිලි පිළිතුරක් ලබාදීම පිළිබඳව මම ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, ඇත්තටම ලංකාවේ උපාධිධාරියාගේ quality එක පිළිබඳව ප්‍රශ්න කරනකොට, සියලුම උපාධිධාරීන් එකම basket එකේ තියලා තමයි මේ ප්‍රශ්නය ඇති කරන්නේ. නමුත්, ඇත්ත කථාව මොකක්ද කියලා ගැඹුරින් බැලුවොත්, මේ ප්‍රශ්නයේ මූල හේතුව තමයි බාහිර උපාධි අපේක්ෂකයා. ඔහු විශ්වවිද්‍යාල ශික්ෂණය ලබන්නේ නැහැ. සාම්ප්‍රදායික ටියුෂන් පන්තියක වාගේ

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ඉගෙන ගන්නවා. බොහෝ වෙලාවට ප්‍රතිපෝෂණ සම්මන්ත්‍රණවලදී විශ්වවිද්‍යාලයේ ඉන්න කථිකාචාර්යවරුන් තමයි බාහිර උපාධි පන්ති කරන්නේ. Exam hints කියලා තමුන් විසින්ම හදන ප්‍රශ්න පත්‍රයක ප්‍රශ්න ටිකක් දෙනවා. එම නිසාම ඊළඟ අවුරුද්දේදී ඔහුගේ පන්තිවලට එන පිරිස වැඩි වෙනවා. මේ වගේ දේවල් තිබෙනවා. මේකෙන් කියන්නේ, බාහිර උපාධි අහෝසි කරන්න කියන එක නොවෙයි. නැත්නම් විවිධ කණ්ඩායම් මේක අර්ථ කථනය කරයි, " බාහිර උපාධිය අහෝසි කරන්න ඇමතිතුමායි මමයි deal එකක් දමලා ප්‍රශ්නයක් අහලා උත්තරයක් ගන්නවා" කියලා. ඒක නොවෙයි මම කියන්නේ. බාහිර උපාධියේ ප්‍රමිතිය පිළිබඳවයි මම මේ කියන්නේ. ඒ උපාධි අපේක්ෂකයා විශ්වවිද්‍යාලයකින් ලබන්න ඕනෑ සැබෑ ශික්ෂණය, විශ්වවිද්‍යාලයක පුස්තකාල පහසුකම් පාවිච්චි කිරීම කියන කාරණාවල ලොකු ඌනතාවක් තිබෙනවා. ඒ නිසා බාහිර උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් එකතු වෙනවා. ඒ සියලුදෙනාට රජයේ රස්සාවක් දෙන්න ඕනෑය කියන ආකල්පය තුළ හිර කරලා, නැති අර්බුද ඇති වෙනවා. ඒ නිසා මේ බාහිර උපාධිය අර්ධකාලීන උපාධියක් බවට පත් කරලා, එහි ගුණාත්මකභාවය වැඩි කරන්න අමාත්‍යාංශයට දැක්මක් තිබෙනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒ ගැන අපට සාකච්ඡා කරන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි. නමුත් ප්‍රශ්නය මේකයි. අධ්‍යාපනයට නිදහස තියෙන්න ඕනෑ. සමහර කට්ටියට ආර්ථික අපහසුකම් නිසා තමන්ගේ පාසල් කාලයේ ඉගෙන ගන්න බැරිව යනවා. ඉන් පසු මැදිවියට ඇවිත් ඒ අයට ආර්ථික ශක්තිය ලැබුණාට පසුව යම්කිසි උපාධියක් ගන්න, සහතිකයක් ගන්න වුවමනාව ඇති වෙනවා. අප ඒක නවත්වන එක හොඳ නැහැ. පිට රටවල නම් විශ්වවිද්‍යාලය ඇතුළේ පළමුවැනි අවුරුද්ද ඉගෙන ගෙන, අවුරුදු දෙක තුනක් පිට වෙලා ඉඳලා ආයෙත් ඇවිත් විභාගයට ඉඳගන්න පුළුවන්. අධ්‍යාපනයට තිබෙන නිදහස අප නැති කරන්න හොඳ නැහැ. ඔබතුමා කියපු කාරණය මම පිළිගන්නවා, ගරු මන්ත්‍රීතුමනි. මේ පාඨමාලාවල ප්‍රමිතිය - quality එක - ඉතාම අඩුයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඉරිදා දිනයේ පළවන පුවත් පත් ටික අරගෙන බැලුවාම, ඒවායේ විවිධාකාරයේ රැකියා මිටි පිටින් තිබෙන බව අපට පෙනෙනවා. හැබැයි සමාජයට බැහැලා බැලුවොත්, රැකියා නැතිව රැකියා සොයන්නන් තමයි අපට හමු වන්නේ. ස්වයං රැකියා නොවෙයි, "සොයන් රැකියා" තත්ත්වයක් තමයි සමාජය තුළ තිබෙන්නේ. රැකියා විශාල ප්‍රමාණයක් තිබෙනවා, රැකියා සොයන විශාල ප්‍රමාණයක් ඉන්නවා. මේ අය අතර පාලමක් ඇති කිරීමේදී, -මම කියන්නේ නැහැ, මේ සියලු රැකියා උපාධිධාරීන් ඉලක්ක කළ රැකියා කියලා. අද රාජ්‍ය අංශය හැකිළෙනවා, පෞද්ගලික අංශය ප්‍රසාරණය වෙනවා. ඒක තමයි ලෝක ආර්ථික යථාර්ථය.

මේ යථාර්ථය තුළ පෞද්ගලික අංශයේ ප්‍රසාරණය වන රැකියාවලට උපාධිධාරීන් අවශෝෂණය කර ගන්න පුළුවන් විධියට ඇත්තටම අපේ බාහිර උපාධි පාඨමාලා ඒ රැකියා ඉලක්ක කරගෙන ඇති වුණොත්, රැකියා විරහිත උපාධිධාරීන්ගේ බරෙන් රටට නිදහස් වන්න පුළුවන් නේද? ඒ නිසා ඒ අය ඉලක්ක කරගෙන පාඨමාලා ඇති වීම නේද, වඩා ප්‍රඥාගෝචර වන්නේ, ඇමතිතුමනි?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අද රටේ සෑම තරුණයකුම කැමැති වන්නේ රජයේ රැකියාවකට යන්නයි. පෞද්ගලික අංශයේ රැකියාවලට යන්න කැමැති නැහැ. මොකද, පෞද්ගලික අංශයේ පඩි අඩුයි. ඒක තමයි අපේ ආණ්ඩුව පටන් ගන්නකොටම අගමැතිතුමාත් කිව්වේ, පෞද්ගලික අංශයේ පඩි වැඩි කරන්න ඕනෑ කියලා. අඩු ගණනේ රුපියල් 35,000ක පඩියක්වත් ලැබෙන්න ඕනෑ. නමුත් පෞද්ගලික අංශයේ ගෙවන ප්‍රමාණය ඇත්ත වශයෙන්ම ඉතා අඩුයි. මා දන්නවා, සමහර සමාගම්වල ගෙවන්නේ රුපියල් 15,000යි කියලා. ඒකයි, ප්‍රධාන හේතුව. පෞද්ගලික අංශයේ පඩි වැඩි කිරීමක් කළොත් තරුණ පිරිස් පෞද්ගලික අංශයේ රැකියාවලට යන්න කැමැති වෙයි. කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ ඇබෑර්තු ලක්ෂයක් තිබෙනවා. But, there are no takers; රැකියා සඳහා ගන්න අය නැහැ. මොකද, ඒ අයට රුපියල් 20,000ක් පමණ ලැබෙන්නේ. කොළඹට ඇවිල්ලා, බෝඩිං කාසි ගෙවලා, කෑමට වියදම් වනකොට ගෙදරට යවන්න මුදලක් ඉතිරි වන්නේ නැහැ. අඩු ගණනේ රුපියල් 35,000ක්වත් ලැබෙනවා නම් කීයක් හෝ ඉතිරි වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

What is your point of Order?

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, ඇත්තටම බාහිර උපාධිය ලියන එක ඉතාම අමාරුයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

That is not a point of Order.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

බාහිර උපාධිය pass කර ගන්න අමාරුයි. මා මේ පොඩි පැහැදිලි කර ගැනීමකටයි අහන්නේ. අභ්‍යන්තර උපාධියට වඩා බාහිර උපාධිය ඉතාමත් අමාරුයි; අපහසුයි. ඒ නිසා විශ්වවිද්‍යාල සඳහා වරම් ලැබෙන්නේ නැති අයට මේ බාහිර උපාධිය තමයි ගොඩ එන්න තිබෙන එකම මාර්ගය. 1970 ගණන්වලදී බාහිර උපාධිය සඳහා බඳවා ගත්තේ බොහොම සුළු ගණනයි. දැන් ලක්ෂ ගණනක් බඳවා ගන්නවා. ඒ ළමයින්ට බාහිර උපාධි පාඨමාලා හදාරලා රැකියාවලට යන්න තිබෙන අවස්ථා පුළුල් කරන්න, ඒකට බාධා ඇති කරන්න එපා කියන එක මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඒ ගැන අවධානය යොමු කරන්න, ගරු ඇමතිතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම එතුමාට උත්තරයක් දෙන්න ඕනෑ. ඒක තමයි අපි කියන්නේ පෞද්ගලික උසස් අධ්‍යාපනය රටට අවශ්‍යයි කියලා. ඔබතුමන්ලා ඒකට සහයෝගය දෙන්න. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වාදයකට යන්න අවශ්‍ය නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
දැන් ඔබතුමාම කියනවා නේ. [බාධා කිරීමක්] පෞද්ගලික උසස් අධ්‍යාපනය රටට අවශ්‍යයි. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2-1215/'16-(4), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3-1420/'16-(1), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා මේ සභාවට අදාළ විශාල ප්‍රශ්නයක් ගැන. ඊයේ දිනයේ "දිනමිණ" පත්තරයේ මුල් පිටුවේ තිබෙනවා, "පසුගිය රජයේ රහසිගත ණය අගමැති හෙළිකරයි. ගිය ආණ්ඩුවේ සිදුවීම්වලට විදේශිකයන් තවමත් මුදල් ඉල්ලනවා" කියලා. මේක බරපතළ ප්‍රශ්නයක්. හංගපු ණය තිබෙනවා නම් ඒ ණය පිළිබඳව මේ පාර්ලිමේන්තුව වග කියන්නට ඕනෑ. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ගැන අවධානය යොමු කරන්නම්, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි.

## රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයන්හි මුළු සේවා නියුක්තිය : විස්තර

### அரச மற்றும் அரசசார் துறைகளின் மொத்த தொழில்நிலை : விபரம்

### EMPLOYMENT FIGURES OF GOVERNMENT AND SEMI-GOVERNMENT SECTORS: DETAILS

1512/'17

**4. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016.12.31 දිනට රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයන්හි මුළු සේවා නියුක්තිය කොපමණද;
(ii) 2016.12.31 දිනට රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයන්හි සේවා නියුක්තිය වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iii) 2016.12.31 දිනට රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයන්හි සේවා නියුක්තිය ස්ත්‍රී/පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iv) 2014.12.31 සහ 2015.12.31 දිනට සාපේක්ෂව, 2016.12.31 දිනට රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයන්හි සේවා නියුක්තිය ඉහළ ගොස් ඇති ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2016.12.31ஆம் திகதியில் உள்ளவாறு அரச மற்றும் அரசசார் துறைகளின் மொத்த தொழில்நிலை யாதென்பதையும்;
(ii) 2016.12.31ஆம் திகதியில் உள்ளவாறு அரச மற்றும் அரசசார் துறைகளின் தொழில்நிலை தனித்தனியாக எவ்வளவென்பதையும்;
(iii) 2016.12.31ஆம் திகதியில் உள்ளவாறு அரச மற்றும் அரசசார் துறைகளின் தொழில்நிலை ஆண்/பெண் பால்நிலைக்கேற்ப தனித்தனியாக எவ்வளவென்பதையும்;
(iv) 2014.12.31 மற்றும் 2015.12.31ஆம் திகதிக்கு ஒப்பீட்டளவில் 2016.12.31ஆம் திகதி உள்ளவாறு அரச மற்றும் அரசசார் துறைகளின் தொழில்நிலை அதிகரித்துள்ள அளவு தனித்தனியாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House -

(i) the total employment figure of the government and semi-government sectors as at 31.12.2016;

(ii) separately, the employment figures of the government sector and the semi-government sector as at 31.12.2016;

(iii) separately, the gender-wise breakdown of employment figures in the government sector and the semi-government sector as at 31.12.2016; and

(iv) separately, the increase in employment figures of the government sector and the semi-government sector as at 31.12.2016 when compared with the employment figures of 31.12.2014 and 31.12.2015;

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, we have a time factor. ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
උත්තරයක් දෙන්න ඉඩ දෙන්න කෝ. ගරු කථානායකතුමනි, මේක රහසක් නොවෙයි. අගමැතිතුමා මේක කිහිප සැරයක් කියලා තිබෙනවා. රහසිගත ණය තිබෙනවා කියන එක අගමැතිතුමා කිහිප සැරයක් කියලා තිබෙනවා. රහසිගත ණය තිබෙනවා, හිටපු හැටියේ බිලක් එනවා කොහෙන් හරි. සිංගප්පූරුවෙන් හෝ හොංකොංවලින් හෝ තායිවානයෙන් හෝ- [බාධා කිරීම්]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන අද අය වැය විවාදයේදී කථා කරන්න.[බාධා කිරීම්] කරුණාකර, ගරු රාජ්‍ය ඇමතිතුමා උත්තර දෙන්න. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමන්ලා අවස්ථාව දෙන්න. අද වැදගත් විවාදයක් තිබෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා ඉඳ ගන්න.[බාධා කිරීම්]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා සහ බුද්ධ ශාසන අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife and Minister of Buddhasasana)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලාගේ- [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඉඳගන්න. [බාධා කිරීම්] Hon. State Minister, you may go ahead with the Answer.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට පොඩි රෝගයක් තිබෙනවා, අනවශ්‍ය වෙලාවට ප්‍රශ්න ඇති කරන. ඒකයි වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පිළිතුර දෙන්න. වේලාව ඉතිරි කර ගන්න ඕනෑ. [බාධා කිරීම්]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
අනවශ්‍ය වෙලාවට ප්‍රශ්න ඇති කරන රෝගයක් එතුමාට තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පිළිතුර දෙන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2016 නොවැම්බර් මස 17 දිනට රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයන්හි මුළු සේවා නියුක්තිය - 1,117,808කි.

(ii) 2016 නොවැම්බර් මස 17 දිනට රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය - 874,395 වන අතර අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 243,413කි.

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

(iii) 2016 නොවැම්බර් මස 17 දිනට

* රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පුරුෂ - සියයට 50.4
* රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය ස්ත්‍රී - සියයට 49.6
* අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පුරුෂ - සියයට 71.1
* අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය ස්ත්‍රී - සියයට 28.9

(iv) රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ 2016 නොවැම්බර් මස 17 දින පවත්වන ලද සංගණනය ඇසුරින් ඉහත සඳහන් තොරතුරු ලබාදී ඇති අතර, මීට පෙර මෙවැනි සංගණනයක් පවත්වා ඇත්තේ 2006 වර්ෂයේ වේ.

(ආ) අදාළ නොවේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

(අ) (iv) ප්‍රශ්නයෙන් මා ඇහුවේ, රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයවල සේවා නියුක්තිය කොපමණ ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇද්ද කියලායි. අපි දන්නවා, ශ්‍රී ලංකා මහ බැංකුවත්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවත් වාර්ෂිකව මේ තොරතුරු එකතු කරන බව. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ අනුව ඔබතුමා මේ ප්‍රශ්නයට පිළිතුර ලබා දුන්නේ නැහැ.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, මම උත්තරයේදී පැහැදිලිව කිව්වා, මීට පෙර මෙවැනි සංගණනයක් පවත්වා ඇත්තේ 2006දී කියලා. ඒක තමයි මට උත්තරය විධියට දෙන්න තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, තව අතුරු ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, "යන්නෙ කොහේද ඇහුවාම - මල්ලෙ පොල් කිව්වා වාගේ" උත්තරයක් දුන්නේ. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ දැන ගැනීම පිණිස මම කියනවා, පසු ගිය වසර දෙකේ- [බාධා කිරීමක්]

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මට අතුරු ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ. ඊට පස්සේ ඔබතුමා උත්තර දෙන්න. ශිෂ්ට බව තියා ගන්න.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය ඉහළ යෑම පසු ගිය වසර දෙකටම 60,000ක් පමණ වනවා. ඒ අනුව දශලක්ෂයක් රැකියා දීමේ පස් වසරක සැලැස්ම අසාර්ථක වී ඇති බව ඔබතුමා පිළිගන්නවාද?

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, කොහොමටවත් පිළිගන්නේ නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමාත් කිව්වා, ලක්ෂ හතරකට වඩා අපි රැකියා බිහි කරලා තිබෙනවා. අපි රැකියා දශලක්ෂයේ වැඩසටහන සාර්ථකව නිම කරනවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 - 1622/'17 - (2), ගරු හේෂාන් විතානගේ මහතා.

**ගරු හේෂාන් විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப் பட்டது.*
*Question ordered to stand down.*

## විදුලිය පිළිබඳ ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණය: ප්‍රගතිය
### மின்சாரம் தொடர்பில் கேள்வி தரப்பிலான முகாமைத்துவம்: முன்னேற்றம்
### DEMAND SIDE MANAGEMENT OF ELECTRICITY: PROGRESS

1632/'17

**7. ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) විදුලිය පිළිබඳ ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණය (Demand Side Management) පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු බව පිළිගන්නේද;

(ii) විදුලිය පිළිබඳ ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණය පිළිබඳව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන කවරේද;

(iii) එකී වැඩසටහන මෙතෙක් ලබා ඇති ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மின்சாரம் தொடர்பாக கேள்வி தரப்பிலான முகாமைத்துவம் (Demand Side Management) பற்றி விசேட கவனம் செலுத்தப்பட வேண்டுமென்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) மின்சாரம் தொடர்பாக கேள்வி தரப்பிலான முகாமைத்துவம் பற்றி மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சினால் நடைமுறைப்படுத்தப்படும் நிகழ்ச்சித்திட்டம் யாதென்பதையும்;

(iii) மேற்படி நிகழ்ச்சித்திட்டம் இற்றைவரை அடைந்துள்ள முன்னேற்றம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House-

(i) whether he admits that special attention should be focused on the Demand Side Management of Electricity;

(ii) the programme implemented by the Ministry of Power and Renewable Energy in respect of the Demand Side Management of Electricity; and

(iii) the progress made hitherto by the said programme?

(b) If not, why?

**ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) විදුලිය පිළිබඳ ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණය පිළිබඳව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කර තිබෙනවා.

මේ සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් පිහිටුවා ඇති ඉල්ලුම් පාර්ශ්වීය බලශක්ති කළමනාකරණය පිළිබඳව ජනාධිපති කාර්ය සාධක බළකාය - Presidential Task Force on Demand Side Management - යටතේ ක්‍රියාත්මක වන මෙහෙයුම් කමිටුවේ අධීක්ෂණය යටතේ ඉල්ලුම් පාර්ශ්වීය බලශක්ති කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර බලශක්ති පරිභෝජනය සිදු කරන සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ක්‍රියාකාරි සැලසුමක් යටතේ ඉල්ලුම් පාර්ශ්වීය බලශක්ති කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක වේ.

ඒ සඳහා වෙනම කාර්යාලයක් තිබෙනවා; වෙනම කාර්ය මණ්ඩලයක් ඉන්නවා. මේ මොහොතේත් එය ක්‍රියාත්මක වනවා.

(iii) එම වැඩසටහන විශාල ප්‍රගතියක් ලබා තිබෙනවා. එමගින් විශාල විදුලි ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට, කළමනාකරණය කර ගැනීමට සමත්වෙලා තිබෙනවා. ඉදිරියේදීත් ඒ සඳහා වැඩ කටයුතු කරගෙන යනවා.

විදුලිබල ක්ෂේත්‍රයේ මෑතකදී පවත්වනු ලැබූ අධ්‍යයනයක් මඟින් පෙන්නුම් කරනු ලැබුවේ ප්‍රමුඛ පරාස කීපයක් කෙරෙහි අවධානය යොමු කරන්නේ නම්, ශ්‍රී ලංකා රුපියල් බිලියන 135ක ආයෝජන මත 2020 වර්ෂය වනවිට වාර්ෂිකව ගිගාවොට් 1895 (ශ්‍රී ලංකා රුපියල් බිලියන 28 වටිනාකමක්) ඉතිරි කර ගැනීමට හැකියාව තිබෙන බවයි. ලංකා විදුලිබල මණ්ඩලයේ 2015 - 2034 දිගු කාලීන උත්පාදන සැලැස්මෙහි ඉල්ලුම් පාර්ශ්වීය බලශක්ති කළමනාකරණය (DSM) සඳහා පදනම සැපයූ මෙම සංකල්පය ක්‍රියාත්මක කිරීම වියදම් අවම විකල්පය ලෙස හඳුනාගෙන තිබේ. මෙම විකල්පය අනුව වාණිජ, නේවාසික සහ කාර්මික අංශවල තෝරා ගත් ප්‍රමුඛ පරාස, ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මෙහෙයුම් කමිටුවක් වෙත මාර්ගෝපදේශ ලබා දෙනු ලබන බලශක්ති ඉල්ලුම් කළමනාකරණය සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් පත් කරන ලදී.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) හැරුණු කොට ලංවිම, ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) සහ LTL හෝල්ඩින්ස් පුද්ගලික සමාගමද, ව්‍යාපෘතිය සඳහා ආධාර ලබා දීමට නියමිතය. එමෙන්ම, ඒ සඳහා විදේශ ආධාර ද ලැබීමට නියමිතය. 2017.01.02 දින නිල වශයෙන් මෙම විශේෂ ඒකකය වෙනම පරිශ්‍රයක වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(ආ) අදාළ නොවේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

සාම්පූර් ගල් අඟුරු බලාගාරය හදන්න නියමිතව තිබුණත්, පරිසරය පිළිබඳ ප්‍රශ්න නිසා අපි සාම්පූර් ගල් අඟුරු බලාගාරය හදන එක නවත්වා, සූර්ය බලය සහ සුළං බලය වැනි විකල්ප බලශක්ති උපයුම් යෝජනා ක්‍රමවලට ගියා. අපි දැන් කර්මාන්තපුර හදලා තිබෙනවා; හදන්නත් තිබෙනවා. ඒ සඳහා ආයෝජකයන්ටත් කථා කරනවා. අපි කර්මාන්ත පැත්තෙන් විශාල ප්‍රගතියක් අත් කරගන්න යන මොහොතක, ලංකා විදුලිබල මණ්ඩලයට යම්කිසි සැලැස්මක් තිබෙනවා ද, රටට අවශ්‍ය විදුලිය ලබා දෙන ගමන් ඉදිරියේදී බලාපොරොත්තු වෙන සංවර්ධන ඉලක්කවලටත් විදුලිය ලබා දෙන්න?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අලුතින් ආයෝජනයක් කරන ඕනෑම කර්මාන්තකරුවෙක් විදුලි ඉල්ලුම සිදු කළාට පස්සේ, සාධාරණ කාලයක් තුළ ඒ විදුලි ඉල්ලුම සියයට සියයක්ම සපයන්න අපේ විදුලි පද්ධතිය සමත්. ඒ බව මා ඉතා වගකීමෙන් කියනවා. අපට අභියෝග තිබෙන බව ඇත්ත. ඒත් අද වෙනකම් විදුලිය ඉල්ලපු, සෑම ව්‍යාපාරයක් සඳහාම, නිවසක් සඳහාම අපි විදුලිය ලබා දීලා තිබෙනවා; අනාගතයේදීත් ලබා දෙනවා. ගරු

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කථානායකතුමනි, සැපයුම පමණක් නොවෙයි, අපේ තිබෙන විදුලිය ඉතිරි කර ගැනීමත් Demand Side Management කියන විෂයයෙන් සිදු කෙරෙනවා.

ලොකුම ප්‍රශ්නය තිබෙන්නේ රාත්‍රී කාලයේ. ගරු මන්ත්‍රීතුමනි, කිලෝ වොට් පැය 90කට වඩා මාසයකට පාවිච්චි කරන පාරිභෝගිකයන් අතර 9 Watts LED බල්බ මිලියන 10ක් - ලක්ෂ 100ක් - මූලික ගෙවීමක් නොමැතිව බෙදා දීමට අපේක්ෂා කරනවා. ඒ සඳහා දැන් ටෙන්ඩර් කැඳවා තිබෙනවා. එමඟින් පමණක් රාත්‍රී කාලයේ තිබෙන මෙගාවොට් 200ක පමණ peak demand එක අඩු කර ගන්න අපි බලාපොරොත්තු වනවා. එයින් අපට ප්‍රශ්න රැසක් කළමනාකරණය කරන්න පුළුවන්. මේක ලොකු ව්‍යාපෘතියක්. ඒ සඳහා ටෙන්ඩර් කැඳවලා; ටෙන්ඩර් විවෘත කරලා; ටෙන්ඩර් ඇගයීමයි මේ දිනවල සිදු වන්නේ. ඒ අනුව, ඊළඟ මාස දෙක ඇතුළත LED බල්බ ජනතාවට බෙදා දීම ආරම්භ කරන්න පුළුවන්. මේ LED බල්බ මූලික ගෙවීමක් නොමැතිව ලබා දීමේ ව්‍යාපෘතියෙන් පවුල් ලක්ෂ 28ක් ප්‍රතිලාභ ලබනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

දෙවන අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ලංකා විදුලිබල මණ්ඩලය විසින්, කර්මාන්ත සඳහා ස්වයං රැකියා කරන අයට -පොඩි පොඩි කර්මාන්ත කරන අයට- ගෙවීමේ ක්‍රමයට විදුලිය ලබා දීම මේ වර්ෂයේ සිට ක්‍රියාත්මක වෙලා, එය බොහොම සාර්ථකව සිද්ධ වෙනවා. විදුලිය ලබා ගැනීමේදී මූලික මුදලක් නොගෙවා, මාසිකව විදුලි බිල්පතට ඒ මුදල එකතු කර අවුරුදු ගණනකින් කැපී යන ආකාරයෙන් අඩු ආදායම්ලාභීන්ගේ නිවෙස්වලට විදුලිය ලබා දීමේ යෝජනා ක්‍රමයක් පසුගිය වසරේ ක්‍රියාත්මක වුණා. නමුත්, ඒක මේ අවුරුද්දේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එය ක්‍රියාත්මක නොවීම අඩු ආදායම්ලාභී ග්‍රාමීය පවුල්වලට ලොකු පහරක් වෙලා තිබෙනවා. ඔවුන්ට ලබා දුන් හොඳ අවස්ථාවක් තමයි මඟහැරිලා තිබෙන්නේ. එම අවස්ථාව මඟහැරීම වැළැක්වීම සඳහා ගෙන තිබෙන ක්‍රියා මාර්ග මොනවාද? 2018 වසරේ තවදුරටත් මේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් සකස් කර ගෙන යනවාද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, පසුගිය වසර තුළ අපි ක්‍රියාත්මක කළ "සැමට විදුලිය" ව්‍යාපෘතිය තුළින් තම නිවසට විදුලිය ලබා ගැනීමට බැරි වුණු පවුල් 262,000කට අප නොමිලේ විදුලිය සැපයුවා. ගෙදර wiring කරලාත් දුන්නා. එම ක්‍රමය සඳහා අපි රුපියල් බිලියන 6ක් වියදම් කළා. ඇත්තටම අපි එහිදී සියයට 100ක ජයග්‍රහණයක් ලැබුවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන මේ ක්‍රමවේදය අපි කර්මාන්තකරුවන්ට හඳුන්වා දෙනවා. ගරු කථානායකතුමනි, එය විශේෂ දෙයක්. ඕනෑම කර්මාන්තකරුවෙකුට විදුලිය සඳහා - ඒ කියන්නේ ලොකු transformers අයිති වෙන්න පුළුවන්, ලක්ෂ ගණනක් වෙන්න පුළුවන්. ඕනෑම කර්මාන්තකරුවෙකුට මුලින් සියයට 25ක් ගෙවා, ඉතුරු සියයට 75 තමා ව්‍යාපාරයෙන් ලාභ ලබන අතරතුර, අවුරුදු 5කදී තමන්ගේ විදුලි බිල සමඟ වාරික වශයෙන් ගෙවීමට අපි අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. සුළු සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයන් බොහෝ දෙනෙකුට three-phase විදුලිය ලබා ගැනීමේදී transformers දමන්න සිද්ධ වුණු නිසා, ලොකු බාධාවක් තිබුණා. විශේෂයෙන්ම ගම්බද පළාත්වල එම ගැටලුව ඇති වුණා. අපි එම අභියෝගයට උත්තරයක් දීලා තිබෙනවා. මුලින් සියයට 25ක් ගෙවා පසුව සියයට 75ක් ගෙවීමේ ක්‍රමවේදය ඕනෑ කෙනෙකුට ඉල්ලන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 8 - 1641/'17 - (2), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## ත්‍රස්තවාදී ක්‍රියා නිසා විනාශ වූ රාජ්‍ය ආයතන : මඩකලපුව දිස්ත්‍රික්කය
### பயங்கரவாத நடவடிக்கைகளால் அழிவுற்ற அரச நிறுவனங்கள் :மட்டக்களப்பு மாவட்டம்
### GOVERNMENT INSTITUTIONS DESTROYED BY TERRORIST ACTS: BATTICALOA DISTRICT

1215/'16

**2. ගරු බන්දුල ගුණවර්ධන මහතා (ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு பந்துல குணவர்தன - மாண்புமிகு ஆர்.எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Bandula Gunawardane on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4) :

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983 න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට, වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தில் அமைந்துள்ள அரச நிறுவனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) எல்.ரீ.ரீ.ஈ. பயங்கரவாதிகளால் 1983ஆம் ஆண்டுக்கு பின்னர் அழிக்கப்பட்டுள்ள அரச நிறுவனங்களின் எண்ணிக்கை யாதென் பதையும்,

(iii ) அழிவடைந்துள்ள மேற்படி சொத்துகள் பற்றி அரசாங்கத்தினால் ஏற்றுக்கொள்ளக்கூடிய மதிப்பீடொன்று செய்யப் பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அச்சொத்துகளின் மொத்த பெறுமதி யாதென்பதையும்;

(v ) அழிக்கப்பட்டுள்ள ஒவ்வொரு சொத்து தொடர்பாகவும் பொறுப்புக்கூற வேண்டிய பயங்கரவாதிகளுக்கு எதிராக சட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(vi ) ஆமெனில், அந்த நடவடிக்கைகள் யாவையென்பதையும்;

(vii ) மேற்படி (i) - (vi) வரை விசாரிக்கப்பட்டுள்ள தகவல்கள் தொடர்பான முழுமையான அறிக்கையொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House -

(i) the number of Government institutions in the Batticaloa District;

(ii) the number of Government institutions that were destroyed by the LTTE terrorists after 1983;

(iii) whether a government approved valuation has been done on the destroyed property;

(iv) if so, the total value of the said property;

(v) whether legal action has been taken against the terrorists who were responsible for the said destruction;

(vi) if so, what those steps are; and

(vii) whether a comprehensive report with regard to the facts that have been questioned in above (i) to (vi) will be submitted?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) රාජ්‍ය ආයතන 91 කි.

(ii) එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද රාජ්‍ය ආයතන 13 කි.

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව තක්සේරුවක් කර ඇත.

(iv) එම දේපළවල සම්පූර්ණ වටිනාකම රුපියල් 197,216,292.63 කි.

(v) එක් එක් දේපළවලට අදාළව වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන ඇත.

(vi) දෙපාර්තමේන්තුගත කාර්යපටිපාටීන් අනුගමනය කර ඇත.

(vii) දැනට ලැබී ඇති වාර්තාව ඉදිරිපත් කරමි. ඇමුණුම 01 සහ 02** බලන්න.

(ආ) අදාළ නොවේ.

## එස්. එම්. සිජාවුදීන් මහතාගේ නිවස බලහත්කාරයෙන් පැහැර ගැනීම : ගනු ලැබූ පියවර
## திரு. எஸ்.எம். சிஜாவுதீனின் வீடு பலவந்தமாகப் பறிக்கப்பட்டமை: நடவடிக்கை
## FORCIBLE DISPOSSESSION OF MR. S.M. SIJAVDEEN'S HOUSE: ACTION TAKEN

1583/'17

**5. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා වෙනුවට)**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. (Dr.) Nalinda Jayathissa)

ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) හම්බන්තොට, රුවන්පුර සුනාමි නිවාස සංකීර්ණයේ, මයුරපුර, රුවන්පුර, අංක 35 දරන නිවස එස්. එම්. සිජාවුදීන් මහතාට ලබාදුන්නේද;

(ii) එසේ නම් , එම දිනය කවරේද;

(iii) ඔහු, එම නිවසේ කොපමණ කාලයක් පදිංචිව සිටියේද;

(iv) මේ වනවිට එම නිවසේ පදිංචිව සිටින්නේ කවුරුන්ද;

(v) ඉහත පුද්ගලයාගෙන් එම නිවස බලහත්කාරයෙන් පැහැරගෙන ඇති බව දන්නේද;

(vi) 2010 දෙසැම්බර් මාසයේදී, මේ සම්බන්ධයෙන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම්වරයාට ඉදිරිපත් කළ පැමිණිල්ල සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

( அ) (i ) அம்பாந்தோட்டை, ருவன்புர சுனாமி வீடமைப்புத் தொகுதியில் மயுரபுர, ருவன்புர, 35ஆம் இலக்க வீடு திரு. எஸ்.எம். சிஜாவுதீனுக்கு வழங்கப்பட்டதா என்பதையும்;

( ii ) ஆமெனில், அத்தேதி யாதென்பதையும்;

( iii ) இவர் இவ்வீட்டில் எவ்வளவு காலம் குடியிருந்தார் என்பதையும்;

( iv ) தற்போது மேற்படி வீட்டில் குடியிருப்பவர் யாரென்பதையும்;

( v ) மேற்படி ஆளிடமிருந்து இவ்வீடு பலவந்தமாக பறிக்கப் பட்டுள்ளமையை அறிவாரா என்பதையும்;

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

(vi) 2010 டிசம்பர் மாதத்தில் இது சம்பந்தமாக அம்பாந்தோட்டை பிரதேச செயலாளருக்கு சமர்ப்பிக்கப்பட்ட முறைப்பாடு சம்பந்தமாக மேற் கொள்ளப்பட்ட நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House -

(i) whether the house No.35 at Ruwanpura, Mayurapura of the Ruwanpura Tsunami Housing Complex in Hambanthota was provided to Mr. S.M. Sijavdeen;

(ii) if so , the date on which it was provided;

(iii) the period of time for which he had resided in that house;

(iv) the name of the person who is residing in the aforesaid house at present;

(v) he is aware that the aforesaid person was forcibly dispossessed of the said house; and

(vi) the action taken in regard to the complaint made to the Divisional Secretary of Hambanthota about this matter in December 2010?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) සුනාමි නිවාස ලබා දීමේ ලේඛනයේ සටහන් අනුව එම්.එස්.එම්. සිරාවුදීන් මහතාට මෙම නිවස ලබා දී ඇත.

(ii) නිශ්චිත දිනයක් සඳහන් නොවේ. (2006 වර්ෂයට පෙර)

(iii) මෙම නිවස සුනාමි ආපදා තත්ත්වය හේතුවෙන් ලබා දුන් නිවසකි.

එය ලබා දුන් දිනයේ සිට 2006 වර්ෂය දක්වා එම අය එම නිවසේ පදිංචිව සිට ඇති බව තහවුරු වේ.

(iv) මේ වනවිට කිසිවකු එම නිවසේ වාසය නොකරයි.

(**පසුබිම් වාර්තාවේ**** විස්තර කර ඇත.)

(v) මෙම පුද්ගලයා නිවස නීත්‍යානුකූල නොවන අයුරින් ගිවිසුම් පත්‍රයක් මඟින් අත්සතු කර ඇත.

(vi) මේ සම්බන්ධව විවිධ අවස්ථාවලදී හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පැමිණිලි ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා ග්‍රාම නිලධාරි වාර්තා කැඳවා ඇත. 2007.12.07 දින 4/10/25188 - 17 අංකය දරන නිදහස් දීමනා පත්‍රය එම්.එස්.එම්. සිෆාවුච්ඩීන් (සිරාවුදීන්) යන අයට ලබා දී ඇත. **ඇමුණුම iii****. බලන්න. දීමනා පත්‍රයක් නිකුත් කිරීමෙන් පසු එය පුද්ගලික ඉඩමක් ලෙස සලකා කටයුතු කළ යුතු බැවින්, ඒ සම්බන්ධයෙන් මතුවන ගැටලුවකදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් නොමැති බව ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කර ඇත.

(ආ) අදාළ නොවේ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## නියඟය නිසා පීඩාවට පත් වූ ගොවීන්: වන්දි
## வறட்சியினால் பாதிப்புற்ற விவசாயிகள் : நட்டஈடு
## FARMERS AFFECTED BY DROUGHT: COMPENSATION

1641/'17

**8. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Chaminda Wijesiri)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) පසුගිය මාස කිහිපයේ සිට රටේ පවතින දැඩි නියඟය හේතුවෙන් ගොවීන් දැඩි පීඩාවට ලක් වූ බව පිළිගන්නේද;

(ii) එම නියඟය නිසා දැඩි හානියට පත් දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ගොවිජන සේවා කලාප වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එසේ පීඩාවට පත් වූ ගොවීන් වෙනුවෙන් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් යම් වන්දි ගෙවීමක් සිදු කර තිබේද;

(iv) එසේ නම්, එම ගොවීන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) නියඟය නිසා පීඩාවට පත් වූ ගොවීන් සඳහා වන්දි ලබාදීම කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය හරහා ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த சில மாதங்களாக நாட்டில் ஏற்பட்டுள்ள கடுமையான வறட்சியின் காரணமாக விவசாயிகள் பெரிதும் பாதிக்கப்பட்டுள்ளனர் என்பதை ஏற்றுக்கொள்கின்றாரா என்பதையும்;

(ii) மேற்படி வறட்சியின் காரணமாக கடுமையாகப் பாதிக்கப்பட்ட மாவட்டங்கள், பிரதேச செயலாளர் பிரிவுகள் மற்றும் கலநல சேவை வலயங்கள் தனித்தனியாக யாவையென் பதையும்;

(iii) அவ்வாறு பாதிக்கப்பட்ட விவசாயிகளுக்கு விவசாய மற்றும் கமநல காப்புறுதிச் சபையினால் ஏதேனும் நட்டஈடு செலுத்தல் மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அந்த விவசாயிகளின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவையென்பதையும்;

(v) வறட்சியின் காரணமாகப் பாதிக்கப்பட்ட விவசாயிகளுக்கு நட்டஈடு வழங்கப்படுதலை

விவசாய மற்றும் கமநல காப்புறுதிச் சபையின் ஊடாகப் பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House -

(i) whether he admits that the farmers faced severe hardships due to drought that prevailed for the last few months in this country;

(ii) the names of the Districts, Divisional Secretary's Divisions and Agrarian Service Zones that were severely affected by the drought;

(iii) whether any compensation was paid by the Agriculture and Agrarian Insurance Board for the farmers who were so rendered helpless ;

(iv) if so, the names and the addresses of those farmers; and

(v) whether steps will be taken to pay compensation to the farmers, who were affected by the drought, through Agricultural and Agrarian Insurance Board?

(b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) පසුගිය කාලය තුළදී ඇති වූ දැඩි නියං තත්ත්වය හේතුවෙන් ගොවි ජනතාව දැඩි පීඩාවට ලක් වී ඇත.

(ii) එම නියඟය නිසා දැඩි හානියට පත් ගොවීන්ගේ විස්තර දිස්ත්‍රික් මට්ටමින් හා ගොවිජන සේවා මට්ටමින් DVD* තැටියක් මඟින් ඉදිරිපත් කර ඇත.

(iii) මෙම වගා හානි වූ ගොවීන් සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වන්දි ගෙවීමට කටයුතු කර ඇත. මේ වනවිට ගොවීන් 496,272 ක් වෙනුවෙන් රුපියල් මිලියන 4,962.72 ක වන්දි මුදලක් ගෙවා ඇත.

(iv) වගා රක්ෂණ යෝජනා ක්‍රම යටතේ මේ වනවිට වන්දි ගෙවා අවසන් ගොවීන්ගේ විස්තර දිස්ත්‍රික් මට්ටමින් DVD* තැටිය මඟින් ඉදිරිපත් කර ඇත.

(v) ඔව්.

නියඟය නිසා පීඩාවට පත් ගොවි ජනතාව වෙනුවෙන් වන්දි ගෙවීමේ වැඩ පිළිවෙළක් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය හරහා ක්‍රියාත්මක කර ඇත.

(ආ) අදාළ නොවේ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order. Specially, ස්ථාවර නියෝග 78 අනුව, the conduct of the President සම්බන්ධයෙන් ඉතා පැහැදිලිව දක්වා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙමයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඉතා කනගාටුවෙන් කියන්නට ඕනෑ, අපේ ගරු සුජීව සේනසිංහ මැතිතුමා, 2017.11.22 දින "ඩේලි මිරර්" පුවත් පතට කළ ප්‍රකාශයක් ගැන. එහි මෙසේ සඳහන් කර තිබෙනවා:

> "While addressing a press conference at the UNP headquarters Sirikotha in Pitakotte, State Minister Senasinghe said that the President should not become party to the wants of some people to destroy the young politicians of the UNP."

I **table*** this news item. He further states, I quote:

> "I am telling the President that we are also of the same age as his children. If he is protecting his children, if he is being hit by E-news, in the same way it's not correct for a certain media to attack us."

And, he goes onto criticize the President of the country. මම මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. මේ ආකාරයෙන් ජනාධිපතිතුමා විවේචනය කිරීමේ අයිතියක් පාර්ලිමේන්තුවට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට නැහැ. එසේ කිරීමට ඉඩ දීමෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග පමණක් නොව, ව්‍යවස්ථාවත් උල්ලංඝනය කිරීමේ තත්ත්වයකට පරිවර්තනය වෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් මේ සම්බන්ධයෙන් තීරණයක් දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මම සොයා බලා ඒ ගැන කටයුතු කරන්නම්.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා, ඔබතුමාත් සඳහන් කරන්න යන්නේ ඒ කාරණය ගැනමද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ විශේෂ අවධානයට යොමු කර වන්නේ අද දින පුවත් පතක පැහැදිලිව වාර්තා කර තිබෙන කරුණක් පිළිබඳවයි. " මිග් ගනුදෙනුවට කෝ ජනාධිපති කොමිසමක්? නැව් ගනුදෙනුවලට කෝ ජනාධිපති කොමිසම්? ඇඩ්වර්ටයිසින් කොම්පැනිවලට කෝ ජනාධිපති කොමිසම්? ජනාධිපතිතුමාට මම කියනවා එතුමන්ගේ දරුවන්ගේ වයසේ තමයි අපිත්. එතුමා දරුවන් ආරක්ෂා කරනවා නම් එතුමාට ඊ නිව්ස් එකෙන් ගහනවා නම් අපට ගහන එකත් හොඳ නැහැ යම් මාධ්‍යයක්" යනුවෙන් -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කරුණු දෙක ගැනම බලන්නම්.

ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා.

## වරප්‍රසාද: දුරකථන සංවාද පිළිබඳ අපහාසාත්මක මාධ්‍ය වාර්තා
## சிறப்புரிமை: தொலைபேசி உரையாடல் பற்றி நிந்திக்கும் ஊடக அறிக்கைகள்
## PRIVILEGE: INSULTING MEDIA REPORTS REGARDING TELEPHONE CONVERSATIONS

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කිරීමට ඔබතුමාගේ අවසරය ඉල්ලා සිටිනවා. ගරු කථානායකතුමනි, පසුගිය දිනවල පුවත් පත්වල පළ වුණා, අර්ජුන් ඇලෝසියස් නැමති හොරකම් කරන ලද බවට චෝදනා ලබා ඇති, මා කිසිසේත් නොහඳුනන තැනැත්තෙකු විසින් මට දුරකථන ඇමතුමක් දීලා තිබෙනවා; මම දුරකථන ඇමතුමක් දීලා තිබෙනවා කියලා.

ජීවිත කාලයටම දුරකථන ඇමතුම් දෙකක් දුන්නා කියලා වාර්තාවක සඳහන් වෙනවා කියලා. මේ කරුණ දැන ගත්තාම මම විශ්මයට පත් වුණා; පුදුමයට පත් වුණා. ඒ වාගේම "කෝප්" එකේදී මම මෙම තැනැත්තාට සහ පවුලේ අයට විරුද්ධව නිශ්චිතව කරුණු දක්වපු කෙනෙක්. මම මගේ නීතිඥ මංජුල බාලසූරිය මහතා මඟින් බැඳුම්කර කොමිසමෙන් ඉල්ලීමක් කළා, "ඔය කියන ලේඛන මට ලබා දෙන්න, ඒ ලේඛනවල අන්තර්ගතය පිළිබඳ අදාළ සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අහන්න මට අවස්ථාව දෙන්න, audio tapes තිබෙනවා නම් ඒවා ලබා දෙන්න, මේක මගේ ආත්ම ගරුත්වය පිළිබඳ ප්‍රශ්නයක්" කියලා.

ගරු කථානායකතුමනි, ජීවිත කාලය පුරාම අපි ආරක්ෂා කර ගත් දෙයක් තිබෙනවා. දේශපාලනයට එන්නේ කීර්තිමත් වෘත්තිය පදනමක් සහිතවයි. මම ලිඛිතව කරපු ඉල්ලීමට අද දින බැඳුම්කර කොමිසමේ ලේකම් එස්. උඩුගමසූරිය මහතා කොමිසමේ උපදෙස් මත මට පිළිතුරක් එවා තිබෙනවා. එම පිළිතුරේ අමුණා තිබෙනවා, සී 352 ලකුණ සඳහන් කොමිසමේ ඉදිරිපත් වුණු ලේඛනය. කොමිසම එම ලිපියේ සඳහන් කර තිබෙනවා, මෙහෙම ලේඛනයක් ඉදිරිපත් වුණත් මා වෙත, මට අදාළ බව -ඒ කියන්නේ අජිත් පෙරේරා වන මට අදාළ බව කියන- දුරකථන ඇමැතුම් පිළිබඳව දින එහි සඳහන්ව නැති බවත්, වේලාව සඳහන්ව නොමැති බවත්, කාල පරාසය සඳහන් නොමැති බවත්. ගරු කථානායකතුමනි, මේ නිසාමයි මට හරස් ප්‍රශ්න අහන්න අවස්ථාව දෙන්න කියලා මම ඉල්ලුවේ.

පොලිස් නිලධාරියකු අධිකරණයක ලේඛනයක් ඉදිරිපත් කරපු පමණින් -විශේෂයෙන්ම සංස්කරණය කරන ලද ලේඛනයක් ඉදිරිපත් කරන ලද පමණින්- මගේ වෘත්තීය ජීවිතයේ, දේශපාලන ජීවිතයේ -ජීවිත කාලය තුළ- මා ගොඩ නඟා ගත් කීර්තියට හානි වනවා දකින්න මට බැහැ.

ගරු කථානායකතුමනි, කොමිසම අද මට ලියා එවා තිබෙනවා, කොමිසමට කාලයක් නැත කියා මට සවන් දෙන්න; කොමිසමට කාලයක් නැත කියා මගේ නීතිඥවරුන් ලවා මේ සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කරන්න; කොමිසමට කාලයක් නැත කියන්න - මම, මේ රටේ පාර්ලිමේන්තුවේ දෙවන වාරයේ වැඩ කරන මන්ත්‍රීවරයෙක්; මේ රටේ අධිකරණයේ අවුරුදු 25ක් වෘත්තීය කටයුතුවල නිරත වූ මේ රටේ ප්‍රසිද්ධ නීතිඥවරයෙක්; මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ නියෝජ්‍ය සංවිධායකවරයායි; මේ ආණ්ඩුවේ නියෝජ්‍ය ඇමතිවරයෙක්. මා කෙරෙහි, මගේ කීර්තිය කෙරෙහි ඉතාම තදින් බලපාන කාරණයක්, මෙය. මම විශ්වාස කරනවා, මෙතැන යම් දෝෂයක් වෙලා තිබෙනවා කියා. මම විශ්වාස කරනවා, යම් ආකාරයක වැරැදීමක් වෙලා තිබෙනවා කියා. මොකද, මේ කොමිසම ගැන මට විවේචනයක් නැහැ. නීතිපති දෙපාර්තමේන්තුව ගැන මට විවේචනයක් නැහැ, ගරු කථානායකතුමනි. මගේ ගෞරවය පිළිබඳ ප්‍රශ්නයක් මට තිබෙන්නේ. වැරැදි වෙන්න පුළුවන්. වෙනත් දේවල් එක්ක පටලන කොට මේ හානිය වෙන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, මගේ වරප්‍රසාද ප්‍රශ්නය මෙයයි. මේ පාර්ලිමේන්තුවේ කමිටුවක් වන "කෝප්" කමිටුවේ මා සාමාජිකයකු වන නිසා තමයි සී352 කියන මේ ලේඛනය සාක්ෂි වශයෙන් අනුකූල කරගෙන තිබෙන්නේ. මේ ලිපියේ ඒ ගැන සඳහන් කර තිබෙනවා. "කෝප්" කමිටුව පාර්ලිමේන්තුවේ. මට මේ කාරණය පටලන්නේ මා පාර්ලිමේන්තුවේ "කෝප්" කමිටුවේ සාමාජිකයකු වන නිසායි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස මගේ ගෞරවය පිළිබඳව දැඩි ලෙස අභියෝග එල්ල වෙලා තිබෙන මේ මොහොතේ මගේ අවංකකම කියාගන්න මට අවස්ථාවක් නැද්ද? මගේ දුක කියන්න මට තැනක් නැද්ද? මගේ නීතිඥයන් මඟින් -මා නියෝජනය කරන ජනාධිපති නීතිඥ සාලිය පීරිස් මහත්මයා මඟින්- මා මේ කරුණු කිව්වා. මට වෙනත් විවාදයක් නැහැ, ගරු කථානායකතුමනි. මම හොරු ආරක්ෂා කරන්නේත් නැහැ; හොරු වෙනුවෙන් ඉදිරිපත් වෙලාත් නැහැ; හොරු රකින්නේත් නැහැ. හැබැයි මගේ ගෞරවය රකින්න, කවුද ඉන්නේ?

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඔබතුමාගේ තිබෙන ඒ -

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමාට භාරයි මාව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන මම බලන්නම්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමාට භාරයි මගේ ගෞරවය. ඔබතුමා මැදිහත් වෙලා මට හරස් ප්‍රශ්න අහන්න අවස්ථාව දෙන්න; මේ ලේඛන මට අරගෙන දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි කථා කරන්නම්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
( மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී තිබෙන බලතල අනුව බැඳුම්කර කොමිසම පත් කළා. ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් දැඩි ලෙස අවධානය යොමු වෙච්ච කරුණක් ලෙස අද දවසේ මෙය පත් වෙලා තිබෙනවා. මේ කොමිසම හරහා මේ කෙරෙන පරීක්ෂණ පිළිබඳව විපක්ෂය විධියට අපිත් බොහෝ අවධානයෙන් සිටිනවා. ගරු කථානායකතුමනි, අද දවසේ "ලංකාදීප" පුවත් පතේ මුල් පිටුවේ පළ වෙලා තිබෙනවා,"බැඳුම්කර කොමිසම එජාපයට එරෙහි කුමන්ත්‍රණයක්" කියලා. එතකොට රජයේ පාර්ශ්වයෙන් රජයේ වගකිවයුතු රාජ්‍ය ඇමතිවරයෙක් මෙවැනි ප්‍රකාශ කිරීම තුළ අතිගරු ජනාධිපතිතුමා සහ ඒ නිලධාරින් හැල්ලුවට ලක් වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන ඔබතුමා ගරු සභාවට පැමිණීමට ප්‍රථමයෙන් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කළා; ඒ ගැන අවධානය යොමු කළා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මටත් අයිතියක් තිබෙනවා නේ?

**ගරු කථානායකතුමා**
மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන මීට පෙර කතා කළා මන්ත්‍රීතුමා. ඒ ගැන මීට ප්‍රථම අවධානය යොමු කළා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මම කියන්නේ මේ ගැන-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. අද කථා කළා. එකම දේ ආපහු කියන්න අවශ්‍ය නැහැ, ගරු මන්ත්‍රීතුමා, අද කාලවේලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
( மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මට point of Order එකක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
( மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ඔබතුමාගේ point of Order එක? ඒ කරුණ ගැන කථා කළා. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාත්, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් ඒ ගැන කථා කළා. මොකක්ද, වෙන කියන්න ඕනෑ දේ?

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් ලබා දෙන්න.

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
පොඩ්ඩක් දෙන්න. කියන්න තිබෙන දේ කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද කිව්වේ, රණවීර මන්ත්‍රීතුමා?

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
පොඩ්ඩක් ඉන්න. වෙනත් අවස්ථාවක් - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. ඒක මම දෙන්නම්. ඔබතුමා ඒවාට උපදෙස් දෙන්න ඕනෑ නැහැ. උපදෙස් දෙන්නේ නැතිව ඔබතුමා ඔතැන කට වහගෙන ඉන්න. ගරු ටී.රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා, ඔබතුමාට කියන්න තිබෙන්නේ මොකක්ද? ඊයෙත්, වේලාව පැය භාගයක් පහු වුණා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මෙවැනි තත්ත්වයක් තුළ මේ කොමිසම හැල්ලුවට ලක් වෙනවා. ඒ එකක්. අනෙක තමයි, ඊයේ

මේ රාජ්‍ය ඇමතිවරයා විසින්ම ප්‍රසිද්ධ නාලිකා ගණනාවක් හරහා මාධ්‍ය සාකච්ඡා පවත්වමින් කිව්වා, කථානායකතුමා අනිවාර්යයෙන්ම පක්ෂග්‍රාහීව කටයුතු කරනවාය කියලා. මේ සම්බන්ධයෙනුත් ඔබතුමාගේ මතය කියන්න. අපි කියනවා, ඔබතුමා ස්වාධීනයි කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම පක්ෂග්‍රාහීයි කියලා ඔය පැත්තෙන් හුඟක් අය කියනවා. ඒ නිසා මට ඒවා ගැන කථා කරන්න අවශ්‍ය වන්නේ නැහැ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මේ රාජ්‍ය ඇමතිවරයා ඒක ප්‍රසිද්ධියේ කියනවා. මේ විධියට මේගොල්ලෝ පාර්ලිමේන්තුව හැල්ලුවට ලක් කරනවා. බැඳුම්කර- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එක එක අය දහ සැරයකට වඩා ඒක කියලා තිබෙනවා. මම පිළිතුරු දෙන්න අවශ්‍ය නැහැ. ගරු අනුර දිසානායක මැතිතුමා. [බාධා කිරීමක්] ඔබතුමා කෙටියෙන් කියන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම COPE එකේ මන්ත්‍රීවරු සංඛ්‍යාවක් ඒ පරීක්ෂණය පැවැති කාල පරිච්ඡේදයේදී ප්‍රධාන වශයෙන් චෝදනාවට ලක් කර සිටින අර්ජුන් ඇලෝසියස් සමඟ දුරකථන ඇමතුම් කළා යයි කියන බැඳුම්කර කොමිසම හමුවේ ඉදිරිපත් වූ වාර්තාව මත පසුගිය දින කිහිපය පුරාම ඒ මන්ත්‍රීවරු මේ ගරු සභාව තුළ විවිධ අවස්ථාවල නැඟිට, නැඟිට ඒකට විවිධ තර්ක ඉදිරිපත් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, දැන් මේක විසඳිය යුතුව තිබෙනවා. දැන් කොමිෂන් සභාවට පැවරී තිබුණු කාලය අවසන් වී තිබෙන නිසා, ඒ මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා දීම සඳහා, එක්කෝ කොමිෂන් සභාවේ කාලය දීර්ඝ කරන්නය කියලා ආණ්ඩුව පැත්තෙන් ඉල්ලන්න ඕනෑ. එහෙම නැත්නම් ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේක පාර්ලිමේන්තුවත් එක්ක සම්බන්ධ වී තිබෙන නිසා COPE එකේ මන්ත්‍රීවරු එම පරීක්ෂණය පැවැත්වෙන කාල වකවානුව තුළ එම අර්ජුන් ඇලෝසියස් සමඟ කරන ලද දුරකථන ඇමතුම්වල කාල පරාසය, කරන ලද දිනයන්, කථා කරන ලද මන්ත්‍රීවරු සහ හැකි නම් කථා කරන ලද දේවල් පවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා නම් වඩාත් යෝග්‍යයි. මොකද, එතකොට මේක නිරාකරණය වන නිසා.

**ගරු කථානායකතුමා**
( மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි අනිද්දාට ඒක දීර්ඝ ලෙස සාකච්ඡා කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඒක COPE එකේ පැවැත්ම වෙනුවෙනුත් වැදගත්. ඒ වාගේම හැමදාම උදේට මේ සාකච්ඡාව මතු වන නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඒ සඳහා නියෝගයක් ලබා දීලා ඉතා ඉක්මනින්, ඒ පිළිබඳව විධිමත් වාර්තාවක් ඉදිරිපත් කරන්නය කියායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ සම්බන්ධයෙන් සිකුරාදා සාකච්ඡා කරනවා.

විසර්ජන පනත් කෙටුම්පත - 2018, කාරක සභා අවස්ථාව, එකොළොස්වන වෙන් කළ දිනය.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සී.බී. රත්නායක මහතා.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමාට යොමු කරන්න ප්‍රශ්නයක් තිබෙනවා. මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ ශ්‍රීමත් ෆ්‍රැන්සිස් මොලමුරේ කථානායකතුමාගේ ඉඳලා අද මේ වර්තමාන කථානායක කරු ජයසූරිය මැතිතුමා දක්වාම පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළ -මේ උත්තරීතර සභාවේ- මධ්‍යස්ථවාදීව කටයුතු කළ කථානායකවරු තමයි සියලු දෙනාම ඉන්නේ. නමුත් ඊයේ රාජ්‍ය ඇමතිවරයෙක් මාධ්‍යයට ප්‍රකාශ කළා, කථානායකවරු පක්ෂපාතීව වැඩ කරනවා කියලා. ඔබතුමා තමයි අපේ මේ පාර්ලිමේන්තු සභා ගර්භයේ ඉන්න අග්‍ර විනිශ්චයකාරවරයා; ඔබතුමා තමයි නීතිපතිවරයා; ඔබතුමා තමයි විනිසුරුවරයා. නමුත් ඔබතුමා ඒ කාර්යය කරනකොට ඔබතුමා පක්ෂපාතීව ක්‍රියා කරනවා නම්, විපක්ෂයේ ඉන්න අපට කාගේ පිළිසරණක්ද කියන එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ඔබතුමා ඒ කාරණය පිළිගන්නවාද කියන එක-

**ගරු කථානායකතුමා**
( மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට දෙපැත්තෙන්ම ඒ චෝදනාව එනවා. ඒ නිසා ඒක balance වෙනවා. ඒ නිසා කමක් නැහැ. බොහොම ස්තුතියි.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ගරු කථානායකතුමනි, ගරුත්වය ආරක්ෂා කර ගන්න කියලායි මම මේ කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
අපට වෙන කියන්න කෙනෙක් නැහැ. ඔබතුමා තමයි මැදිහත් වෙන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක කෙරෙනවා.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ඔබතුමා ආරක්ෂා කිරීම අපේ වගකීම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. විසර්ජන පනත් කෙටුම්පත - 2018, කාරක සභා අවස්ථාව.

ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER l*eft the Chair, and* DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

**[විසර්ජන පනත් කෙටුම්පත, 2018**
**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2018**
APPROPRIATION BILL, 2018

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී. - [ප්‍රගතිය: නොවැම්බර් 21]
[කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பட்டது. - [தேர்ச்சி : நவம்பர் 21]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee- [Progress: 21st November]
[MR. SPEAKER in the Chair.]

**118 වන ශීර්ෂය.- කෘෂිකර්ම අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 522,846,000

**தலைப்பு 118.- கமத்தொழில் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 522,846,000

HEAD 118.- MINISTER OF AGRICULTURE
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 522,846,000

**160 වන ශීර්ෂය. - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.375,250,000

தலைப்பு 160.- மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 375,250,000

HEAD 160.- MINISTER OF MAHAWELI DEVELOPMENT AND ENVIRONMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure
Rs. 375,250,000

**198 වන ශීර්ෂය.- වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.355,740,000

**தலைப்பு 198.- நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 355,740,000

HEAD 198.- MINISTER OF IRRIGATION AND WATER RESOURCES MANAGEMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 355,740,000

**199 වන ශීර්ෂය.- ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.130,345,000

**தலைப்பு 199.- ஆரம்பக் கைத்தொழில் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 130,345,000

HEAD 199.- MINISTER OF PRIMARY INDUSTRIES
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 130,345,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
කෘෂිකර්ම අමාත්‍යාංශය, වැය ශීර්ෂ අංක 118, 281 සහ 285; මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, වැය ශීර්ෂ අංක 160, 283, සහ 291; වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, වැය ශීර්ෂ අංක 198 සහ 282; සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය, වැය ශීර්ෂ අංක 199 සහ 289.

සලකා බැලීම - පූර්ව භාග 10.00 සිට අපර භාග 12.30 දක්වා සහ අපර භාග 1.00 සිට අපර භාග 7.30 දක්වා. වැය ශීර්ෂ කපා හැරීමේ යෝජනාව, ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා.

[பி.ப. 10.06]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran
கௌரவ தவிசாளர் அவர்களே, 2018ஆம் ஆண்டுக்கான ஒதுக்கீட்டுச் சட்டமூலம் தொடர்பாக இன்றைய தினம் குழுநிலையில் விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்படுகின்ற அமைச்சுக்கள் மற்றும் அவற்றின் கீழுள்ள திணைக்களங்கள் மற்றும் நிறுவனங்களுக்குரிய 118, 281, 285, 160, 283, 291, 198, 282, 199 மற்றும் 289 ஆகிய இலக்கங்களைக் கொண்ட செலவினத் தலைப்புகளின் கீழான ஒவ்வொரு நிகழ்ச்சித்திட்டங்களுக்குமுரிய அனைத்து மீண்டுவரும் மற்றும் மூலதனச் செலவின ஒதுக்கீடுகளிலிருந்து சம்பிரதாயபூர்வமாக 10 ரூபாய் வெட்டப்பட வேண்டுமென நான் முன்மொழிகின்றேன்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you can continue, if you wish to.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
கௌரவ தவிசாளர் அவர்களே, இன்று நடைபெறுகின்ற மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு, நீர்ப்பாசன மற்றும் நீர் வளமூல முகாமைத்துவ அமைச்சு, ஆரம்பக் கைத்தொழில் அமைச்சு மற்றும் கமத்தொழில் அமைச்சு என்பவற்றின் குழுநிலை விவாதத்திலே கலந்துகொண்டு பேசுவதற்கு எனக்குச் சந்தர்ப்பம் தந்தமைக்காக முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். வரவு செலவுத்திட்ட குழுநிலை விவாதத்தின்போது, மிகவும்

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

முக்கியத்துவம் வாய்ந்த பல பிரச்சினைகளை அடையாளம்கண்டு அவற்றை முன்வைக்கும்போது, அவற்றுக்கான தீர்வுகளும் இந்த உயரிய சபையில் வழங்கப்படுகின்றன. அந்த வகையில், மேதகு ஜனாதிபதி அவர்கள் பொறுப்பேற்றிருக்கின்ற அமைச்சுக்குக் கீழ் வருகின்ற சில திணைக்களங்களின் செயற்பாடுகளினால் - அத்திணைக்களங்கள் மேற்கொள்கின்ற நடவடிக்கைகளினால் - எங்களுடைய பகுதியில் ஏற்படுகின்ற நிலைமைகளை நான் இந்த உயரிய சபையில் சுட்டிக்காட்டலாம் என்று நினைக்கின்றேன்.

முதலாவதாக, ஒலுவிலிலிருந்து பொத்துவில் வரையான பகுதியை மையப்படுத்திய கடற்கரைப் பிரதேசத்தில் கனிய வளங்களை அகழ்வதற்கான செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டு வருகின்றன. அந்த இடத்தில் இல்மனைற் போன்ற கனிய வளங்களை - தாதுப் பொருட்களை - அகழ்கின்ற நடவடிக்கைகள் மேற்கொள்ளப்படுவதனால், அந்தப் பகுதிகளில் - ஒலுவில், அக்கரைப்பற்று, திருக்கோவில், பொத்துவில் போன்ற பிரதேசங்களில் -வாழுகின்ற மக்கள் பாரிய இழப்பைச் சந்திக்கவேண்டியிருக்கிறது. குறிப்பாக, இல்மனைற் அகழ்கின்ற செயற்பாடானது, அந்தப் பகுதியில் வாழுகின்ற மக்களின் பொருளாதாரத்தை வலுவிழக்கச் செய்கின்றதாக அமைகின்றது.

இந்த மண் அகழ்வின் மூலம் இல்மனைற், சிலிக்கன் போன்ற தாதுப்பொருட்கள் எடுக்கப்படுகின்றபொழுது அந்த இடத்திலுள்ள கடல் வளங்கள் முற்றாக அழிவடையக்கூடிய ஒரு சூழ்நிலை ஏற்படும். அந்தக் கரையோரப்பகுதியிலே இலட்சக்கணக்கான மக்கள் வாழ்கின்றார்கள். அவர்கள் தங்களது வாழ்வாதாரத்தைப் பெற்றுக்கொள்வதற்கு, தங்களது வாழ்க்கையைக் கொண்டுசெல்வதற்கு அந்தக் கடற்பகுதியைத் தான் நம்பியிருக்கின்றார்கள். அந்தப் பகுதியில் கூடுதலாக விவசாயிகளும் மீனவர்களும்தான் வாழ்கின்றார்கள். இன்று ஒரு திட்டமிடப்படாத துறைமுக அபிவிருத்தியினால், அந்தப் பிரதேசத்தின் கரையோரப்பகுதி கடலரிப்பின் காரணமாக கிட்டத்தட்ட 100 அல்லது 150 மீற்றர் கடலுக்குள் சென்றிருக்கின்றது. அந்தப் பகுதியிலே இருந்த பெறுமதிமிக்க நிலங்கள், தென்னந்தோப்புக்கள், மக்களின் வீடுகள் என்பன இந்தக் கடலரிப்பினாலே பாதிக்கப்பட்டு மிகவும் ஆபத்தான நிலைக்கு உள்ளாகியிருக்கின்றன. இந்த நிலையிலே கனியவள அகழ்வை மேற்கொள்கின்றபோது பாரம்பரியமாகக் கடைப்பிடிக்கப்பட்டு வந்த சில செயற்பாடுகள் இல்லாதொழிக்கப்படுகின்றன.

மேலும், இந்தக் கரையோரங்களிலே ஆயிரம் வருடங்களுக்கு அதிகமான மண் மலைகள் - sand dunes காணப்படுகின்றன. அந்த மண் மலைகள் அல்லது அந்த மண் திட்டுக்கள்தான் 2004ஆம் ஆண்டு ஏற்பட்ட சுனாமி அனர்த்தத்தின்போது அந்த மக்களைக் கூடுதலான உயிரிழப்பிலிருந்து பாதுகாத்தவையாகக் காணப்படுகின்றன. அந்த இடத்திலே மண்ணை அகழ்ந்து எடுக்கின்றபோது பழைமை வாய்ந்த இந்த மண் திட்டுக்கள் அழிவடையக்கூடிய ஒரு நிலை ஏற்படும். இந்த நிலையினாலே இன்னொரு சுனாமி அல்லது இன்னொரு கடற்கோள் அனர்த்தம் ஏற்படுமானால் எங்களது மக்கள் கூடுதலான உயிரிழப்புக்களைச் சந்திக்க நேரிடும் என்பதையும் இந்த உயரிய சபையிலே சுட்டிக்காட்ட விரும்புகின்றேன். அவ்வாறு இந்த மண் அகழ்வு செய்யப்பட்ட பின்னர் சுனாமி போன்ற அனர்த்தங்கள் ஏற்பட்டு அங்கு கூடுதலான உயிரிழப்புக்கள் ஏற்படுமானால், அதற்குப் பதில் சொல்லவேண்டிய நிலை இந்த அரசுக்கு ஏற்படும். ஆகவே, இப்படிப்பட்ட செயல்களைத் தடுத்து நிறுத்தவேண்டிய கடப்பாடு இந்த நல்லாட்சிக்கு இருக்கின்றது. ஏனென்றால், அந்தப் பகுதியிலே இருக்கின்ற மக்கள் இந்த நல்லாட்சியை உருவாக்குவதற்காக, மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களை ஜனாதிபதி ஆக்குவதற்காக 100 வீதம் பாடுபட்டவர்கள். அப்படிப்பட்ட மக்களுக்கு ஒரு துரோகத் தனத்தைச் செய்ய முடியாது. கடந்தகால அரசாங்கத்திலே இந்த இல்மனைற் அகழ்வு மேற்கொள்வதற்கான முயற்சி எடுக்கப்பட்டபோதும் மக்களின் எதிர்ப்பினாலே அது தடுத்து நிறுத்தப்பட்டது. ஆகவே, அந்தப் பகுதி மக்களினால் கொண்டுவரப்பட்ட இந்த நல்லாட்சி அரசாங்கத்தின் ஜனாதிபதி அவர்கள் இதற்கு அனுமதியளிப்பது எந்தவிதத் திலும் நியாயமான ஒரு செயற்பாடல்ல என்பதையும் இந்த இடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், இந்த இல்மனைற்றை எடுப்பதற்காக கரையோரத்திலிருந்து கிட்டத்தட்ட 150 மீற்றர் நீளத்தைக் கொண்டதும் 150 மீற்றர் அகலத்தைக் கொண்டதும் 5 மீற்றர் அல்லது 6 மீற்றர் ஆழத்தைக் கொண்டதுமான அளவுக்கு மண் அகழ்கின்றபோது அந்த இடத்திலுள்ள விவசாய நிலங்கள், அதற்கண்மையில் உள்ள விவசாய நிலங்கள் உப்புத்தன்மையாகி உவர் நிலமாக மாறுகின்ற வாய்ப்பு அதிகமாகும். ஆகவே, அந்த இடத்திலே விவசாயம் பாதிப்புக் குள்ளாகின்றது. அதேபோன்று, அந்த இடத்திலே இருக்கின்ற பல ஏக்கர் தென்னந்தோப்புக்களும் அழிவடையக்கூடிய சூழ்நிலை இருக்கின்றது.

கடல் அரிப்பு ஏற்பட்டு 100 - 150 மீற்றர் தூரத்திலுள்ள தென்னந்தோப்புக்கள் இப்போது கடலுக்குள் உள்வாங்கப் பட்டிருக்கின்றன. அந்தப் பிரதேசத்திலே கடலரிப்பைத் தடுக்கின்ற தடையணைகளை இன்னமும் போடாமல் இந்த அரசாங்கம் செயற்பட்டுக் கொண்டிருக்கின்றது. அந்த இடத்திலே கடலரிப்பைத் தடுப்பதற்காக கல்லணைகளைப் போடுங்களென்று பல தடவைகள் இந்த உயரிய சபையிலே நாங்கள் வேண்டுகோள் விடுத்திருந்தோம். ஆனாலும், இந்த உயரிய சபையில் சொல்லப்பட்ட விடயங்கள் யாரினது காதுகளுக்கும் கேட்கவில்லை. நீர்கொழும்பிலிருந்து காலி வரையான பகுதிகளில் கடலரிப்பைத் தடுப்பதற்காக கல்லணைகளைப் போடுகின்ற நீங்கள், பாரிய அளவில் பிரச்சினைகளை எதிர்நோக்கியிருக்கின்ற குறிப்பிட்ட இடத்தில் கல்லணைகளைப் போடுவதற்குத் தாமதம் காட்டுவது ஏன்? என்பதனை இந்த உயரிய சபையில் கேட்க விரும்புகின்றேன்.

மேலும், ஒலுவிலிலிருந்து பாணமை - அறுகம்பை வரையிலான பகுதிகள் tourism - உல்லாசப் பிரயாணத் துறைக்குப் பெயர்போன இடங்களாக இருக்கின்றன. அந்தப் பகுதியில் இல்மனைற் அகழ்வை மேற்கொள்வதானது, உல்லாசப் பிரயாணத்துறையைப் பாதிக்கின்ற ஒரு செயற்பாடாகவே நான் கருதுகின்றேன். எமது மக்களின் வாழ்வாதாரத்தில் உல்லாசப் பிரயாணத்துறையும் ஒன்றாக இருக்கின்றது. ஆகவே, அந்த அகழ்வை நீங்கள் தடுத்து நிறுத்த வேண்டும். பாரியதோர் ஆபத்தான நிலைமையை அந்த மக்கள் எதிர்நோக்கியிருக்கின்றார்கள். அது மட்டுமல்ல, எங்கள் கடல் பகுதியிலிருக்கின்ற அல்காக்களும் அழிவடையக்கூடியதாக இருக்கின்றது.

**ගරු දයා ගමගේ මහතා (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயா கமகே - ஆரம்பக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Primary Industries)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු දයා ගමගේ මහතා.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே )
(The Hon. Daya Gamage)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන ඉල්මනයිට් කැණීම් මේ අවස්ථාවේදී ඔබතුමන්ලාගේ ප්‍රදේශයේ සිදු වෙමින් පවතිනවාද? මොකද, මම දැනුවත් වෙලා නැහැ. අපි දන්නවා, ගිය ආණ්ඩුව කාලයේදී-

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
இல்மனைற் அகழ்வதற்கான நடவடிக்கைகள் மேற் கொள்ளப்பட்டிருக்கின்றன. EIA என்ற சூழலியல் ரீதியான test இனை எடுப்பதற்கான முயற்சி எடுக்கப்பட்டிருக்கிறது. அந்த test ஆனது வெறுமனே நெல் குத்துகின்ற mill இற்கான test போன்றிருக்கிறது. ஆரம்பகட்ட test இனை எடுத்தபொழுது மக்கள் அதற்கு எதிர்ப்புத் தெரிவித்தார்கள். அதனால் பாதிப்பு ஏற்படுவதாகக் கூறி அதனைச் செய்ய வேண்டாமென Divisional Secretary கூறிய பிறகும் இப்போது EIA என்ற அந்த test இனைச் செய்துகொண்டிருக்கின்றார்கள். கௌரவ அமைச்சர் அவர்களே, இந்த விடயத்திலே உங்களது பங்கும் இருப்பதாக நாங்கள் அறிகின்றோம். அந்த மக்கள் உங்களுக்கும் வாக்களித்திருப்பதால் நீங்களும் இதனைக் கருத்திற்கொள்ள வேண்டும். அந்தவகையில், அந்தப் பகுதிக்குரிய பாராளுமன்ற உறுப்பினராக, அமைச்சராக இருக்கின்ற நீங்களும் பாராளுமன்ற உறுப்பினராக இருக்கின்ற நானும் இல்மனைற் அகழ்வைத் தடுத்து நிறுத்துவதற்கான கடமைப்பாட்டைக் கொண்டுள்ளோம். கடந்த ஆட்சியில் முன்னெடுக்கப்பட்ட அந்த அகழ்வுக்கு மக்கள் எதிர்ப்புத் தெரிவித்ததனால் அது நிறுத்தப்பட்டது. அதனை இப்போது முன்னெடுப்பதானது அந்த மக்களை மிகவும் பாதிப்புள்ளாக்குகின்ற ஒரு செயற்பாடாக இருக்கின்றது.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
ඔබතුමා කියන දේ ගැන මම බලන්නම්. පසුගිය රජය විසින් මොනම හෝ අනුමැතියක් ලබා දීලා තිබෙනවා නම්, ඒ තුළින් පරිසරයට හානියක් සිද්ධ වෙනවා නම්, අනිවාර්යයෙන්ම මම ඒ ගැන සොයා බලන්නම්. ඒ තුළින් පරිසරයට හානියක් සිදු වෙනවා නම්, ඒක අපි නවත්වන්නම්. අපට DCC රැස්වීමේදී මේ ගැන සාකච්ඡා කරන්නත් පුළුවන්. ඔබතුමාට මේ ගැන-

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
நன்றி. DCC இலே அது சம்பந்தமாகத் தீர்மானம் எடுத்திருக்கிறோம். Divisional ரீதியாக தீர்மானத்தை எடுத்து அதனை district ரீதியான தீர்மானத்திற்காக அனுப் பியிருக்கின்றோம். நீங்களும் எங்களோடு சேர்ந்து அதற்குச் சாதகமான பதிலைத் தருவீர்களென்ற நம்பிக்கை இருக்கின்றது.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
මොකක්ද වෙලා තිබෙන්නේ කියලා පරිසර අමාත්‍යාංශයෙනුත් අහලා අනිවාර්යයෙන්ම ඒ ගැන ඔබතුමා දැනුවත් කරන්නම්. මෙය ජනාධිපතිතුමා යටතේ තිබෙන අමාත්‍යාංශයක්. එතුමා හැම තිස්සේම පරිසරය ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් තමයි ක්‍රියාත්මක කරන්නේ. අද තිබෙන සංවර්ධනයටත් ඉතාමත්ම අමාරු තත්ත්වයක් උදා වෙලා තිබෙනවා, පරිසරය ආරක්ෂා කරන්න ඒ දාපු නීති-රීති. එය, සංවර්ධන ක්‍රියාවලිය කරගෙන යාමේදී විශාල ගැටලුවක් බවට පත්වෙලා තිබෙනවා. නමුත් හැම තිස්සේම පරිසරය ආරක්ෂා කරගෙන තමයි ජනාධිපතිතුමා හැම වැඩ කටයුත්තක්ම කරන්නේ. ඒක නිසා එතුමා එක්ක කථා කරලා මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් කියලා මං විශ්වාස කරනවා. ඒක නිසා, ඒ ගැන කලබල වෙන්නට අවශ්‍යතාවක් නැහැ.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
நன்றி.

கௌரவ தவிசாளர் அவர்களே, விசேடமாக இந்தப் பகுதியில் மண் அகழ்வை மேற்கொள்ள எத்தனித்தது -proposal ஐச் செய்தது அவுஸ்திரேலிய கம்பனியொன்றுதான். அந்த இடத்திலே மீன்பிடித்தொழிலை தமது வாழ்வாதாரமாகக் கொண்ட மக்கள்தான் அதிகமாக இருக்கின்றார்கள். எனவே, அவர்கள் மீன்பிடித்தொழிலை மேற்கொள்வதற்கு இது தடையாக இருக்கின்றது. மேலும், அப்பிரதேசத்தில் பல புராதன கோவில்களும் பல புராதன கட்டிடங்களும் இருக்கின்றன. எனவே, அப்பிரதேசத்தில் மண்ணை அகழ்வதால் அக்கட்டிடங்களும் அழிய வாய்ப்புண்டு. மேலும், அப்பிரதேசத்திலுள்ள மண்ணை அகழும்பொழுது இல்மனைற் போன்ற தாதுப்பொருட்களும் அழிவடைய வாய்ப்புண்டு. அங்கு அணுவாயுதங்களைத் தயாரிப்பதற்கு உபயோகப் படுத்தக்கூடிய சில மூலப்பொருட்களும் காணப்படுகின்றன. அந்தத் தாதுப்பொருட்களின் உள்ளீடுகள் அணுவாயுதத்துக்குப் பயன்படுத்தக்கூடியவை எனக் கூறப்படுகிறது. நாங்கள் ஒரு மீற்றர் நீளமும் ஒரு மீற்றர் ஆழமும் ஒரு மீற்றர் அகலமும் கொண்ட - ஒரு கன மீற்றர் பகுதியை அகழ்ந்தெடுக் கும்பொழுது அந்தக் கம்பனிக்குக் கிடைக்கின்ற இலாபம் 2 மில்லியன் ரூபாயாகும். எனவே, இதனை ஒரு வெளிநாட்டு நிறுவனத்துக்குத் தாரைவார்த்துக் கொடுப்பது கேள்விக்குரிய விடயமாக இருக்கின்றது. ஆகவே, நாங்கள் இதனைத் தடுத்து நிறுத்த வேண்டும். அதுமட்டுமல்ல அப்பிரதேசத்தில் பல அரியவகையான கண்டல் தாவரங்களும் ஆயுர்வேத மூலிகைத் தாவரங்களும் காணப்படுகின்றன. இவ்வாறு மண் அகழ்வதால், அவையும் அழிவடையக்கூடிய சூழ்நிலை இருக்கிறது. ஆகவே, நாங்கள் இவ்விடயங்களைக் கருத்திற் கொண்டு அப்பிரதேசத்திலுள்ள வாழ்வாதாரத்தில் பங்கெடுத்து அவர்களைப் பாதுகாக்க வேண்டும். அப்படி நீங்கள் பாதுகாக்காது, அந்த மண் அகழ்வுப் project ஐச் செயற்படுத்தினால் அப்பிரதேச மக்கள் பெரும் பாதிப்புக்குள்ளாவார்கள்.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
Sir, I rise to a point of Order.

ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී එහෙම සිද්ධ වෙලා තිබෙනවා කිව්වාට, ඇත්තටම තවම එහෙම දෙයක් සිද්ධ වෙලා නැහැ. විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී මේ කාරණය කියන්න ඕනෑ. දැන් ඔබතුමා කථා කරනවා, ඉල්මනයිට් ගැන.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
தற்பொழுது அப்பிரதேசத்திலே அதற்குரிய testing யாவும் செய்யப்பட்டுக் கொண்டிருக்கின்றன. நேற்றைய தினமும்

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

அந்த இடத்திலே மண் அகழ்வதற்கு முன்னரான ஆரம்ப செயற்பாடுகளை முன்னெடுக்காமல், சுற்றுச்சூழலைப் பற்றியும் ஏனைய விடயங்களையும் ஆராய்ந்து பார்க்காமல் மிகவும் விரைவாக மண் அகழ்வதற்கான முயற்சிகளை மேற்கொண்டிருக்கின்றார்கள்.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් හැටියට හිටියාට, ඔබතුමා හොඳ ව්‍යාපාරිකයෙක්; ව්‍යවසායකයෙක්. මම විශ්වාස කරනවා, අද අපේ රට ණය වෙලා තිබෙන මේ ණය ගොඩින් එළියට එන්න නම්, අපේ රටේ වැඩි වටිනාකමක් ගන්න පුළුවන් ඛනිජ සම්පත් තිබෙනවා නම්, පරිසරයට හානියක් නොවන ආකාරයට ඒ ඛනිජ සම්පත් අපි අරගන්න ඕනෑ. පසු ගිය රජය වැලි පටවනවා වාගේ ඉල්මනයිට් පැටෙව්ව එක අපි නවත්වා තිබෙනවා. ඉල්මනයිට්වල අගයදාමය වැඩි කරන්න කවුරු හරි ආයෝජකයෙක් එනවා නම්, ඔහු මේ රටට ඇවිල්ලා විශාල ආයෝජනයක් කරන්න ඕනෑ.

එසේ ආයෝජනයක් කරලා, එහි අගයදාමය වැඩි කරලා අපේ රටට විශාල ආදායමක් ලබාගන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදන්න පුළුවන් නම්, එය අපේ ප්‍රදේශවල ජීවත් වන ජනතාවට විශාල ශක්තියක්. ඇත්තටම ගත්තොත් යුද්ධය නිසා ඒ ප්‍රදේශ දියුණු වුණේම නැහැ. ඒ ප්‍රදේශවල කරන්න කිසිම රැකියාවක් නැහැ. තමුන්නාන්සේට ඡන්දය දුන්, මට ඡන්දය දුන් දෙමළ ජනතාව ඉතාමත්ම අසරණ තත්ත්වයක ඉන්නේ. රැකියා මඟින් හෝ ඔවුන්ගේ ආදායම් තත්ත්වය වැඩි කරන්න පුළුවන් මොනවා හෝ ව්‍යාපෘති ඇති කරන්න පුළුවන් නම්, අපි එකතුවෙලා ඒ කටයුතු කරමු කියන එක මම කියනවා. ඒ වාගේම ඔවුන්ගේ ජීවිතවලට කිසිම ආකාරයක හානියක් වෙන්න ඉඩ තියන්නේ නැතුව, පරිසරයටත් හානි නොවන ආකාරයට ඒ කටයුතු කරන්න අපි එකට එකතුවෙලා අපේ ප්‍රදේශයේ වැඩ කටයුතු කරමු කියලා මේ අවස්ථාවේ මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, ඔබතුමා දැන් මේ කියන දේ,-

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)

நன்றி! கௌரவ அமைச்சர் அவர்களே. இந்த நாட்டுக்கு வருமானம் வருகின்றது என்பதற்காக, மக்கள் ஆபத்தான நிலையில் இருக்கின்றபொழுது அவர்களை ஏறி மிதித்து அல்லது அவர்களின் உயிர்களைப் பறிகொடுக்கச் செய்கின்ற செயற்பாடுகள் முன்னெடுக்கப்படுவதைத் தடுத்துநிறுத்தவேண்டிய கடமைப்பாடு எங்களுக்கு இருக்கிறது.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා (වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Irrigation and Water Resources Management)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලයෙන් මම වැඩි වේලාවක් ගන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, අපේ ඉල්මනයිට් නිධිය සම්බන්ධයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. පළමුවැනි කාරණය තමයි, එහි වගකීම පැවරිලා තිබෙන්නේ අතිගරු ජනාධිපතිතුමාගේ අමාත්‍යාංශයට නොවෙයි, ගරු රිසාඩ් බදියුදීන් අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට. දෙවැනි එක තමයි, මේ රටේ තිබෙන ඛනිජ සම්පත්වල සම්පූර්ණ අයිතිය තිබෙන්නේ මධ්‍යම රජයට. ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී ඔබතුමන්ලාත් එක්ක සාකච්ඡා කරලා ඒ තීරණ ගතයුතුයි කියලා අපි විශ්වාස කරනවා. එම නිසා, මේක රිසාඩ් බදියුදීන් අමාත්‍යතුමාගේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළ විවාදයේදී කථා කළොත් හොඳයි කියලා මම හිතනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු ඇමතිතුමනි, දේශීය සම්පත් විකුණාගෙන කන එක නතර කරන්න මැදිහත්වීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)

மாண்புமிகு அமைச்சர் அவர்களே, சுனாமி அனர்த்தத்தின்பொழுது அந்தப் பிரதேசத்தில் மண்மேடுகள் - மண்திட்டுக்கள் இருந்தபடியால் கடல் அலை தரைப்பகுதிக்கு உட்புகாமல் தடுக்கப்பட்டு அப்பகுதியிலுள்ள மக்கள் பாதுகாக்கப்பட்டார்கள். அப்படியிருந்தும் அப்பிரதேசத்திலே ஆயிரக்கணக்கானவர்கள் இறந்திருக்கின்றார்கள். அதேபோன்ற இன்னோர் அனர்த்தம் வருமாகவிருந்தால் அது மக்களுக்கு மிகவும் பாதகமாக அமையும். இந்த நாட்டுக்கு வருமானம் வரவேண்டும் என்பதை நாங்கள் அனைவரும் ஏற்றுக்கொள்கிறோம். அதற்காக அம்மக்களுக்கு பாரிய பாதிப்பை ஏற்படுத்துகின்ற செயற்பாடு நடைமுறைப் படுத்தப்படுமானால், நாங்கள் அதனைத் தடுத்து நிறுத்த வேண்டும்.

கௌரவ அமைச்சர் அவர்களே, நானோ அல்லது நீங்களோ அல்லது அமைச்சர் தயா கமகே அவர்களோ சொல்வதைவிட, அங்கு எதிர்நோக்குகின்ற பிரச்சினைகள் பற்றி அந்த மக்களுக்குத்தான் தெரியும். அப்பகுதியில் லட்சக்கணக்கான மக்கள் வாழ்கின்றார்கள். அவர்கள் மிகுந்த கொந்தளிப்புடன் அப்பகுதியிலிருந்து மண் அகழ்வுக்கு எதிராகப் போராடுகின்ற நிலைமை காணப்படுகிறது. ஆகவே, இதனைக் கருத்திற்கொண்டு மண் அகழ்வைத் தடுப்பதற்கான நடவடிக்கை எடுக்க வேண்டுமென இந்த உயரிய சபையிலே கேட்டுக்கொள்கின்றேன்.

மேலும், நேற்று நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சர் அவர்கள் சிறந்த முறையிலே ஒரு கூட்டத்தை ஒழுங்குபண்ணியிருந்தார். அதில் அமைச்சர்களும் பாராளுமன்ற உறுப்பினர்களும் கலந்துகொண்டிருந்தார்கள். அந்தக் கூட்டத்திலே அனைவருக்கும் தீர்வை வழங்குவதற்காக பலதரப்பட்ட விடயங்கள் ஆராயப்பட்டன. உண்மையில் அமைச்சர் அவர்கள் தனது அமைச்சுத் தொடர்பான விவாதத்திற்கு முன்னர் இப்படியான ஒரு கலந்துரையாடலை நடத்தியது ஏனைய அமைச்சர்களுக்கு முன்னுதாரணமான ஒரு செயலாக அமைந்திருக்கின்றது. அந்தவகையில், கௌரவ அமைச்சர் அவர்களை நான் பாராட்டுகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நான் சில proposal களை உங்களிடம் முன்வைத்திருந்தேன். அந்த விடயங்களை நீங்கள் கருத்திற்கொண்டு செயற்படுத்துவீர்கள் என்ற நம்பிக்கை எனக்கிருக்கின்றது. விசேடமாக, சேனநாயக்க சமுத்திரத்தினூடாக வலதுகரை வாய்க்கால் புனரமைக்கப்பட வேண்டும். இது புனரமைக்கப்பட்டால் 10,000 ஏக்கருக்கும் அதிகமான வயல்களை இரண்டு போகமும் செய்யக்கூடிய சூழ்நிலை ஏற்படும். எனவே, இந்த விடயத்தைக் கவனத்தில் எடுக்க வேண்டும்.

அதேபோல் தோணிக்கல், பொத்தானை போன்ற இடங்களிலே sluice-மதகு அமைக்கப்பட வேண்டியிருக்கின்றது. அவற்றை அமைத்தால் அங்குள்ள விவசாயிகளின் விளைச்சலை மென்மேலும் அதிகரிக்க முடியும். மேதகு ஜனாதிபதி அவர்களும் இந்த நாட்டில்

விவசாயத்தைக் கூடுதலாகச் செய்ய வேண்டுமென்று சொல்லியிருக்கின்றார். அந்தவகையில் இந்த வளங்களை நீங்கள் வழங்குகின்றபோது உண்மையிலே அதனைச் சிறந்த முறையில் செயற்படுத்த முடியும். ஏனென்றால், கடந்த 30 வருட காலமாக யுத்தம் நடைபெற்ற பிரதேசங்களாக அவை இருந்தமையால், அங்கு அபிவிருத்திகள் மிகவும் குறைந்தளவிலேயே காணப்படுகின்றன. நீங்கள் சிறந்த ஓர் அமைச்சராக, நீரக வளமூல முகாமைத்துவத்திலே சிறந்த ஒரு நபராக இருக்கிறீர்கள்! ஆகவே, இதனைக் கருத்திற்கொண்டு நீங்கள் நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்திலே விசேடமாக றூகம், கித்துள் ஆகிய இரண்டு குளங்களையும் ஒன்றாக இணைத்தால் பல்லாயிரம் ஏக்கர் வயல்களை இரண்டு போகம் செய்யக்கூடியதாக மாற்றலாம். ஆகவே இந்த இரண்டு குளங்களையும் ஒன்றாக இணைக்கின்றபொழுது பாரிய ஒரு குளமாக - நீர்த்தேக்கமாக அது உருவெடுக்கும். அதனால் அந்தப் பகுதியிலுள்ள மக்கள் மிகவும் நன்மையடையக்கூடிய வாய்ப்பு இருக்கின்றது.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

ගරු මන්ත්‍රීතුමනි, රුගම - කිතුල් වැව ව්‍යාපෘතිය සඳහා කැබිනට් මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කරලා, එය අනුමත වෙලා තිබෙනවා. ඒවාට මුදල් සොයාගෙන වැඩ කරන්න අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් ක්‍රියා කරගෙන යනවා.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! ஆகவே இந்த விடயங்களை நீங்கள் கருத்திற்கொண்டு செய்கின்றபோது அந்தப் பகுதியிலே அபிவிருத்தியை மேற்கொள்ளக்கூடியதாக இருக்கும்.

அதேபோல் அங்கு விவசாய வீதிகள்கூட புனரமைக்கப்படாத நிலையில் காணப்படுகின்றன. விவசாயிகள் பல கிலோமீற்றர் தூரம் தங்களது பசளைகள் மற்றும் ஏனைய பொருட்களைச் சுமந்துசெல்லுகின்ற ஒரு நிலை காணப்படுகின்றது. இந்தப் பிரதேசத்திலே அந்த வீதிகள் புனரமைக்கப்பட வேண்டிய தேவையிருக்கின்றது. கமத்தொழில் அமைச்சர் அவர்கள் எங்களிடம் சில proposal களைக் கேட்டிருந்தார். குறிப்பாக, திருக்கோவில் பிரதேசத்திலே வீதிகளின் விபரங்களைத் தரும்படி கேட்டிருந்தார்; அதனை நாங்கள் கொடுத்திருந்தோம். அதேபோல் ஆலையடிவேம்பு பிரதேசத்திலுள்ள வீதிகளின் விபரத்தையும் கொடுத்திருந்தோம். இந்த வீதிகளைப் புனரமைத்துத் தருவதாகவும் அதற்கான நிதியை ஒதுக்கித் தருவதாகவும் எங்களுக்குக் கடிதம் வந்தது. ஆனால், அது இன்னமும் நடைமுறைப்படுத்தப்படாமல் இருக்கின்றது. அதனால், அந்தப் பகுதியிலுள்ள அபிவிருத்திகளை முன்னெடுக்க வேண்டிய கடப்பாடு உங்களுக்கு இருக்கின்றது. ஆகவே, நான் குறிப்பிட்ட விடயங்களைக் கவனத்திலெடுத்து, அவற்றினைச் செயற்படுத்த வேண்டுமென்று இந்த உயரிய சபையிலே கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் தயா கமகே அவர்களுடைய அமைச்சின்கீழ் இருக்கின்ற சில விடயங்களையும் முன்னெடுக்க வேண்டியிருக்கின்றது. ஏனென்றால், அந்த அமைச்சுத்தான் பாரிய கைத்தொழில்களுக்கு அடிப்படையான ஓர் அமைச்சாக இருக்கின்றது. பாரிய கைத்தொழில்களை மேற்கொள்வதற்கான ஓர் ஆரம்பக் கட்டமாக ஆரம்பக் கைத்தொழில் அமைகின்றது. ஆகவே, இந்த ஆரம்பக் கைத்தொழிலை நாங்கள் வலுவாகவும் நிலையாகவும் நிறுத்துகின்றபோதுதான் இந்த நாட்டிலே பாரிய வளர்ச்சியைக் கொண்டுவர முடியும்.

இன்று சீனா, பாங்கொக் போன்ற நாடுகள் அனைத்தும் ஆரம்பக் கைத்தொழில்களைச் சிறந்த முறையிலே, ஒரு கட்டமைப்பின்கீழ் மேற்கொண்டமையினால்தான் இன்று அவை பாரிய வளர்ச்சியைக் கண்டிருக்கின்றன. அந்த வகையிலே இந்த அமைச்சைச் சரியாக நிர்வகிக்கின்றபோது, சரியான ஒரு கட்டமைப்பின்கீழ் - பொறிமுறையின்கீழ் இயக்குகின்றபொழுது சிறந்த முறையில் நெறிப்படுத்த முடியும். நீங்கள் இந்த அமைச்சினூடாக நிறைய விடயங்களை மேற்கொள்கின்றீர்கள். ஆனாலும் அதற்கு ஒதுக்கப்படுகின்ற பணம் சரியான முறையிலே செலவழிக்கப்படுகின்றதா? - சரியான திட்டங்களில் முதலிடப்படுகின்றதா? அதன்மூலம் நாட்டுக்கு வருமானம் வருகின்றதா? என்பதையும் அல்லது இந்த நிதிகள் வீண்விரயம் செய்யப்படுகின்றனவா? என்பதையும் கருத்திற்கொண்டு அதற்குரிய நடவடிக்கையை எடுக்க வேண்டும். நிச்சயமாக அதனை மேற்கொள்கின்றபொழுது - monitor செய்கின்றபொழுதுதான் அந்த நிதிக்குரிய செயற்றிட்டம் வெற்றியளிக்கும் என்பதை இந்த இடத்தில் கூறி, சந்தர்ப்பத்திற்கு நன்றி தெரிவித்து விடைபெறுகின்றேன். நன்றி.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

මීළඟට, ගරු රවීන්ද්‍ර සමරවීර රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.35]

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரவீந்திர சமவீர - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ravindra Samaraweera - State Minister of Labour and Trade Unions Relations)

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය, වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කරන අද දිනයේ ඒ පිළිබඳව කථා කරන්න කාලය ලබාදීම පිළිබඳව ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට මුලින්ම මගේ ස්තුතිය පිරිනමනවා.

උඩරට ජීවත් වන අපේ ගොවි ජනතාව වෙනුවෙන් තමයි මම මුලින්ම කරුණු ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන්නේ. අපේ කෘෂිකර්ම රාජ්‍ය ඇමතිතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. මේ දවස්වල අපි ලොකු වගා සංග්‍රාමයක් පිළිබඳව කථා කරනවා. වී ගොවිතැන පිළිබඳව අප බොහෝ තැන්වල කථා කරනවා. නමුත් අප නියෝජනය කරන ප්‍රදේශවල සිටින එළවලු වගා කරන, අර්තාපල් වගා කරන ගොවීන් ගැන අද කිසි කෙනෙක් කථා කරන්නෙත් නැහැ; බලන්නෙත් නැහැ. ඒක තමයි ඇත්ත. අමාත්‍යාංශ ගණනාවක් එකතු කරලා ස්ථාපිත කර තිබෙන ජීවන වියදම් පිළිබඳ කමිටුවේදීත් පාරිභෝගිකයාගේ පැත්ත දිහා බලනවා. නමුත් අපේ අසරණ ගොවි ජනතාව දිහා බලන්න, ඔවුන් වෙනුවෙන් ඉදිරිපත් වෙන්න අද කිසි කෙනෙක් නැහැ. ගොවි සංවිධානවල නියෝජිතයන් කීප දෙනෙක් ගෙන්වලා, මුදල් ඇමතිතුමාත් සමඟ ඒ අයගේ ප්‍රශ්න පිළිබඳව සාකච්ඡාවක් කරන්න පසුගිය සතියේ මට සිද්ධ වුණා. අතීතයේදී එළවලු වගාව සිද්ධ වුණේ උඩරට පමණයි. අද එහෙම නොවෙයි, වියළි කලාපයේ පවා එළවලු වගාව සිද්ධ වෙනවා. අද දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට අපෙන් විතරක් නෙවෙයි, අනෙකුත් පළාත්වලිනුත් එළවලු එනවා. කල්පිටිය තිබෙන්නේ මුහුදු වෙරළ පෙනි පෙනි. අද එහෙත් එළවලු වවනවා; යාපනය ප්‍රදේශයේත් එළවලු වවනවා. අද එළවලු

[ගරු රවීන්ද්‍ර සමරවීර මහතා]

වගාව හැම තැනම ව්‍යාප්ත වෙලා තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශයත්, රජයත් මෙම එළවලු ගොවියා පිළිබඳව මීට වඩා සැලකිලිමත් විය යුතුය කියන එකයි මගේ අදහස.

ගරු සභාපතිතුමනි, මේ දවස්වල අපේ අර්තාපල් ගොවීන්ට ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

ආනයනය කරන අර්තාපල් වෙනුවෙන් බද්දක් පනවා තිබුණා. දැන් සති දෙකකට පමණ කලින්, අය වැයට කලින් දිනයේදී මුදල් ඇමතිතුමා විසින් ඒ බද්ද ඉවත් කළා. ඒ බද්ද ඉවත් කිරීමත් සමඟම අපේ ගොවි මහත්වරුන් අද විශාල අර්බුදයකට මුහුණ දෙනවා. ගිය සතියේ අපි ගත්ත තාවකාලික විසඳුමත් එක්ක සතොස ආයතනය මඟින් අර්තාපල් මිල දී ගැනීම සඳහා විධිවිධාන යොදලායි තිබෙන්නේ. තාවකාලිකව ලබා දුන්නු මේ විසඳුමත් එක්ක මුදල් ඇමතිතුමා පොරොන්දු වුණා, අය වැයෙන් පස්සේ ගොවි සංවිධාන නැවත රැස් කරලා, ගොවි ජනතාවට බලපාන කාරණා පිළිබඳව ස්ථිර විසඳුමක් ලබා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් යොදන්න.

අද මෙරටට ගෙන්වන බීජවල මිල අධිකයි. අල හොණ්ඩරයක් ලංකාවට ගෙනාවාට පස්සේ රුපියල් 15,000ක්, රුපියල් 16,000ක් පමණ මිලකට තමයි අලෙවි කරන්නේ. මා හිතන විධියට ජනාධිපතිතුමාත් ඊයේ පෙරේදා මේ පිළිබඳව සඳහන් කරලා තිබුණා. ගොවි සංවිධාන ඉල්ලීමක් කළේ, මේ මිල අවම වශයෙන් සියයට 50කින්වත් අඩු කරන්න කියලායි. ඒ අයගේ නිෂ්පාදන වියදම අඩු කර ගැනීම සඳහා ඒ අය යම්කිසි සහනයක් බලාපොරොත්තු වනවා. අය වැයෙන් පස්සේ මුදල් ඇමතිතුමාත් සමඟ සාකච්ඡා කරලා මේ සඳහා ස්ථිර විසඳුමක් ලබා ගැනීමට අපි බලාපොරොත්තු වනවා.

කෘමි නාශක, පොහොර, බෙහෙත් වර්ග, එළවලු වගා කරන ගොවීන්ට එළවලු ඇට වර්ග ආදිය ලබා ගැනීමට තිබෙන අපහසුතාව මඟ හරවා ගැනීම සඳහා යම්කිසි ස්ථිර වැඩ පිළිවෙළක් සකස් කර ගත යුතුයි කියන එකයි මා ඊළඟට යෝජනා කරන්නේ. ගරු කෘෂිකර්ම ඇමතිතුමාටත් මේ ගැන කරුණු ඉදිරිපත් කරලා, මුදල් අමාත්‍යාංශයේත් උදවු උපකාර ඇතිව අපේ ගොවි ජනතාව වෙනුවෙන් මේ සඳහා සහනයක් ලබා ගන්න හැකි වෙයි කියලා අපි බලාපොරොත්තු වනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට නියමි කාලය අවසන් වෙමින් යනවා.

**ගරු රවීන්ද්‍ර සමරවීර මහතා**
(மாண்புமிகு ரவீந்திர சமவீர)
(The Hon. Ravindra Samaraweera)
ගරු සභාපතිතුමනි, ඊළඟට ආනයනය කරන ද්‍රව්‍ය ගැනත් කියන්න ඕනෑ. උදාහරණයක් විධියට ගත්තොත්, පරිභෝජනය සඳහා අවශ්‍ය අල ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යා ලේඛන කෘෂිකර්ම අමාත්‍යාංශයේ හෝ වෙළෙඳ අමාත්‍යාංශයේ තිබෙන බව අපි දන්නවා. කෘෂිකර්ම අමාත්‍යාංශයට පුළුවන්, වෙළෙඳ අමාත්‍යාංශයට කියන්න, "අපේ පරිභෝජනය සඳහා දේශීය නිෂ්පාදනය මෙපමණ ප්‍රමාණයක් තිබෙනවා" කියලා.

මේ දේශීය නිෂ්පාදනය කොපමණද කියලා බලලා, පරිභෝජනයට අවශ්‍ය වන ඉතිරි කොටස විතරක් ආනයනය කරනවා නම් මෙතැන ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. අද වෙලා තිබෙන්නේ ඒක නොවෙයි. ආනයනය කරන්නට අවසර දුන්නාම පිරී ඉතිරී යන විධියට ආනයනය සිද්ධ වෙනවා. එම නිසා තමයි ලොකු අර්බුදයක් ඇති වෙන්නේ. ඒ නිසා මේ අමාත්‍යාංශ කිහිපය එකතුවෙලා සාකච්ඡා කරලා අවශ්‍ය ප්‍රමාණය පමණක් ගෙන්වන්නට කටයුතු කළොත් මේ සඳහා විසඳුමක් ලැබෙයි කියලා මා හිතනවා.

මගේ කථාව අවසන් කරන්නට පෙර වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය ගැනත් වචනයක් කියන්නට ඕනෑ. මගේ ඉල්ලීමකට අනුව ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා ඇමතිතුමා මගේ වැලිමඩ ආසනයට පැමිණියා. එතුමා මමත් සමඟ ගිහින් බලලා වාරි යෝජනා ක්‍රම තුනක් පිළිබඳව කටයුතු කරන්නට තීරණය කළා. අඹේවෙල ග්ලෙනොකි වැව අලුතෙන් ඉදි කිරීමේ වැඩ ලබන වර්ෂයේ ආරම්භ කරන බව එතුමා මට ඊයේත් රැස්වීමේදී කිව්වා. මේ වැවේ ජලය වගාවට පමණක් නොවෙයි බීමට ලබා ගැනීමටත් හැකි වෙනවා. ඒ වාගේම 1940 ගණන්වල, 1950 ගණන්වල නිර්මාණය කළ අඹේවෙල යෝජනා ක්‍රමයේ, අඹේවෙල ඇළේ ධාරිතාව වැඩි කර ගැනීම සඳහා වැව් බැම්ම අඩි හතරකින් පහකින් පමණ උස්සන්නට අවශ්‍ය වෙනවා. මම හිතන විධියට මේ වන විට වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඒ කටයුතු කරගෙන යනවා. මීට අමතරව බෝගහකුඹුර ප්‍රදේශයේ අලවතුගොඩ දිවුල්අත්තදෝව නමින් හැඳින්වෙන වැව අලුතෙන්ම නිර්මාණය කිරීමටත් එතුමා කටයුතු කරලා තිබෙනවා. ඒ ගැන ගරු අමාත්‍යතුමාටත්, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයටත් මාගේ ස්තුතිය පුද කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
( மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
ගරු සභාපතිතුමනි, සමාජයේ වැදගත් ප්‍රශ්නයක් ගැන කථා කරන්නට මම අවස්ථාව ලබා ගන්නවා. පසුගිය කාලයේ ප්‍රකාශ කරලා තිබුණා ලබන ජනවාරි මාසය වන විට පළාත් පාලන ආයතන මැතිවරණය පැවැත්වීමට කටයුතු කරනවා කියලා. අද වන විට දැනගන්නට තිබෙනවා, ඒක කල් ගියා කියලා. අපේම කට්ටිය තහනම් නියෝගයක් ඉල්ලා තිබෙන නිසා, පළාත් පාලන ආයතනවල සීමා නිර්ණය කිරීමේ ගැසට් පත්‍රයට හතරවෙනි දා තෙක් වාරණ නියෝගයක් නිකුත් කර තිබෙනවා කියලා දැන ගන්නට ලැබුණා. එම නිසා අපට ඒ ගැන දැන ගන්නට ඕනෑ. මේක ජනතාව බලාගෙන ඉන්න මැතිවරණයක්. මේ මැතිවරණය කල් යාම පිළිබඳව අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරන අතර, මේ මැතිවරණය පුළුවන් තරම් ඉක්මනින් පැවැත්වීම රජයේ වගකීමක් කියලා මම විශ්වාස කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු සභානායකතුමා මේ පිළිබඳව යමක් ප්‍රකාශ කරනවාද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි අධිකරණයේ නොවෙයි පාර්ලිමේන්තුවේ නේ ඉන්නේ. [බාධා කිරීමක්] ඒක තේරෙන්නේ නැද්ද?

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
( மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
මා හිතුවා, අධිකරණය තිබෙන්නේ සිරිකොත පැත්තේ කියලා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු සභාපතිතුමනි, ඡන්දය කල් දමනවාට අපිත් විරුද්ධයි. අපට -එක්සත් ජාතික පෙරමුණට- ඡන්දයක් ඕනෑ. අපි දැන් නාම යෝජනා හදලා, ලැයිස්තු හදලා, කට්ටිය තෝරාගෙන තිබෙනවා. දැන් ඒ ගොල්ලන් ඡන්දයට ඇවිදිනවා.

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
( மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
ගරු සභාපතිතුමනි,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා.

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
( மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
ගරු සභාපතිතුමනි, ඡන්දය අවුරුදු දෙකහමාරක් කල් ගියා. දැන් තුන්වැනි අවුරුද්දටත් ඇවිල්ලා තිබෙනවා. රට තුළ මේ පිළිබඳව විශාල ආන්දෝලනයක් ඇති වෙලා තිබෙනවා. මේ මැතිවරණය පොඩි මැතිවරණයක් නේ. ප්‍රාදේශීය සභා මැතිවරණයක් කියන්නේ පොඩි දෙයක්. ඒ නිසා මේ මැතිවරණය පැවැත්වීමේ අයිතිය, සම්පූර්ණ වගකීම ආණ්ඩුවටයි තිබෙන්නේ. මොකද, ආණ්ඩුවෙන් නේ කල් දැම්මේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමා පිළිගන්නවා, වගකීම තිබෙන්නේ ආණ්ඩුවට බව.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
දැන් මේක විවාදයක් බවට පත් කරගන්න බැහැ. අපි ඉන්නේ අය වැය කාරක සභා අවස්ථාවේ විවාදය තුළ. ගරු විමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව ආරම්භ කරන්න. [බාධා කිරීමක්] We cannot open this to a debate. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභාපතිතුමනි, අපි මේ ඉන්නේ අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරමින් සිටින්නේ. ගරු සභාපතිතුමනි, හැබැයි මේ ප්‍රශ්නය රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නයක්. මේ පාර්ලිමේන්තුව ප්‍රජාතන්ත්‍රවාදයේ සංකේතය නම්, මධ්‍යස්ථානය නම් මේ ගැන අද කථා කළ යුතුව තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අපි දැන් මේ ගැන කථා- [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පොඩ්ඩක් ඉන්න, ගරු සභාපතිතුමනි. ආණ්ඩුව ඉතා පැහැදිලිව අමාත්‍යවරුන්ගේ ලේකම්වරු, අමාත්‍යවරුන්ගේ සමීපතමයින් මේ නඩුවට ඉදිරිපත් කළා. ඒ විතරක් නොවෙයි. දැනටමත් ශ්‍රේෂ්ඨාධිකරණයේ එක් පුරප්පාඩුවක් තිබෙනවා. අනාගතයේ තව පුරප්පාඩුවක් ඇති වීමට නියමිතව තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
I cannot allow you to have a Debate on this.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ පුරප්පාඩු පිරවීම සඳහා අභියාචනාධිකරණයෙන් කෙනකු තෝරා පත් කර ගැනීමේ තරගයක් බවටයි මේ නඩුව පත් කර ගත්තේ. මේ ක්‍රියාදාමය ඉතා පැහැදිලි ලෙසම ආණ්ඩුව ඡන්දය කල් දමා ගැනීම සඳහා කරන ලද සැලසුමේ ප්‍රතිඵලයක්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මේක විවාදයක් බවට පත් කරගන්න බැහැ. I cannot allow you to have a Debate on this. ගරු විමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව ආරම්භ කරන්න. [බාධා කිරීමක්]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sumanthiran, what is your point of Order?

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Sir, it is true that you cannot allow a Debate on this. But, since you have already allowed two-three Members to speak. I want to say that we also want the Elections held as early as possible and we oppose the abuse of process of courts in this regard.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

2015 ජනවාරි 08 මේ ආණ්ඩුව බලයට ගෙනෙන්න කර ගහපු සියලුදෙනාම වග කියන්න ඕනෑ, ප්‍රාදේශීය සභා ඡන්දයක්වත් පවත්වන්න බැරි කොන්ද පණ නැති ආණ්ඩුවක් මේ රටේ බලයට ගෙනාවට.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු විමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා, ඔබතුමා කථාව ආරම්භ කරන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன இராஜாங்க அமைச்சர்)
The Hon. Palitha Range Bandara - State Minister of Irrigation)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Palitha Range Bandara, what is your point of Order?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු සභාපතිතුමනි, අපට මැතිවරණ කල් දමන්න කිසිම අවශ්‍යතාවක් නැහැ. මැතිවරණය කල් දැමීමට හේතු වෙලා තිබුණේ, සීමා නිර්ණයේ වරද.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු චමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා.

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
ඔය ආණ්ඩුවේ ඉන්න පළාත් සභා හා පළාත් පාලන ඇමතිවරයාට ගැසට් නිවේදනය නිකුත් කර ගන්න බැහැ. ගැසට් එකත් වරද්දලා ගහලා. යහ පාලන ආණ්ඩුවේ පළාත් සභා -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
බාධා කරන්න එපා. ගරු චමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව ආරම්භ කරන්න.

[පූ.භා. 10.48]

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
ගරු සභාපතිතුමනි, මැතිවරණ සිතියම හකුළා තිබෙන මෙවැනි අවස්ථාවක වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය කියන අමාත්‍යාංශ තුනේ වැය ශීර්ෂවලදී කථා කරන්න අවස්ථාවක් ලැබීම ගැන ස්තුතිවන්ත වනවා. අනාගතයේදී මේවා ගැන කථා කරන්න අවස්ථාවක් ලැබේවිද කියන සැකයත් තිබෙනවා. සමහර වෙලාවට මෙය අවසාන වතාව වෙන්නත් පුළුවන්.

වාරිමාර්ග විෂය භාර අමාත්‍යතුමා ගරු සභාවේ ඉන්නවා. එතුමාට අපි ගිය වැය ශීර්ෂයේදී අභිසංක කම්කරුවන්ගේ ප්‍රශ්නය ඇතුළු යම් යම් ප්‍රශ්න වගයක් ඉදිරිපත් කළා. නමුත්, තවම ඒවාට පිළිතුරක් නැහැ; විසඳුමක් නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා නියෝජනය කරන ප්‍රදේශය සිංහල රජ දරුවන්ගේ කාලයේ රුහුණු රටට අයිතිව තිබුණු ප්‍රදේශයක්. මට පොඩි සැකයක් තිබෙනවා, අනාගතයේදී ජල ප්‍රශ්නය පිළිබඳ යුද්ධයක් ඇති වෙයිද කියලා. මොකද, අපට ඉතිහාසයක් තිබෙනවා නේ. දැන් ජෝර්දානයේ ගඟ පිළිබඳව ඊශ්‍රායලය -

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඌවයි, හම්බන්තොටයි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
ඔව්, ඌවයි, හම්බන්තොටයි.

ඊශ්‍රායලය, සිරියාවට බෝම්බ දැම්මෙත් ජෝර්දාන ගඟේ වතුර බෙදා ගන්න ගිහිල්ලා. ඒ වාගේම නයිල් ගඟේ වේලි හරස් කරන්න ගියාම, ඊජිප්තුව සටන් කරනවා. චීනයේ කහ ගංගාව තිබෙනවා නේ. ඒකට තායිලන්තයේ ගොවිතැන් කරන අය අතර ජලය පිළිබඳව අර්බුදයක් තිබෙනවා.

දැන් අපට තිබෙන අර්බුදය මෙයයි. ගරු විජිත් විජයමුණි සොයිසා ඇමතිතුමනි, ඔබතුමා නියෝජනය කරන මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදි කර තිබෙන වැව්වල ජලය ගලාගෙන එන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයටයි. පහළ පැත්තට තමයි ඒ ජලය ගලාගෙන එන්න ඕනෑ. මේ අතර හිතුවක්කාර ලෙස "ඇනිකට්" දාලා, -ඔබතුමා නොවෙයි.- ජලය ලබා ගන්නවා කියා ගොවීන් පැමිණිලි කරනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත් වෙහෙරගල සහ ලුණුගම්වෙහෙර අතර තිබෙන ජලාශයෙන්, මව්ආර ජලාශය සහ කිරිඉබ්බන්වැව අතර තිබෙන ජලාශවලින් මේ ආකාරයට ජලය ලබා ගන්නවා. මේ කාරණා නිසා අනාගතයේදී අපි දෙගොල්ලන්ම හැප්පෙන්න පුළුවන්. නමුත් ඔබතුමා බොහොම සාධාරණව වැඩ කරන නිසා එහෙම වෙන එකක් නැහැ කියා මා හිතනවා.

ඡන්දය ගැන විතරක් නොවෙයි, මේ කාරණා ගැනත් ඔබතුමා අවධානය යොමු කරන්න ඕනෑ. ඡන්දය ලබා ගන්න ඔය වැඩ කළාට වැඩක් නැහැ. වතුර ටික රැකගෙන, ඒ වතුර පහළ ප්‍රදේශවලටත් ලැබෙන්න සලස්වන්න ඕනෑ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
අපේ ගරු චමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, මා මේ කාරණය ඔබතුමාට විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ඒ ආකාරයට වැරදි විධියට කවුරු හෝ ජලය ලබා ගන්නවා නම් වාරිමාර්ග ආඥාපනත අනුව අපි ක්‍රියාත්මක වනවා. කිසිසේත්ම දැනුවත්ව නම් එහෙම සිදු වන්නේ නැහැ. හැබැයි, අපේ පහළ කඳුකරයේ - පහළ ඌවේ- වතුර ටික ඔක්කොම හම්බන්තොටට තමයි ගලාගෙන යන්නේ. අපි ඒ සම්බන්ධයෙන් විරුද්ධතාවක් පළ කර නැහැ.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
හොඳයි. ගබඩා කරලා අපට ජලය ලබා දෙනවා. එහේ ජලය ගබඩා කරලා, අපට දෙනවා. උඩවලව ජලාශය ඉදි කරන කොට එදා වාරිමාර්ග ඇමති වශයෙන් හිටපු සී.පී. ද සිල්වා මැතිතුමා නියෝගයක් ලබා දීලා තිබෙනවා, "රිදියගම ජලාශයේ වතුර හිඟවෙලා, ගොවිතැනට අවශ්‍ය ජලය ලබා දෙන්න බැරි වුණොත්, උඩවලව ජලාශයෙන් වහාම ජලය නිදහස් කරන්න" කියලා. ඒ කටයුත්ත මා හිතන්නේ දැන් ක්‍රියාත්මක වන්න ඕනෑ.

තවත් ප්‍රශ්නයක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. දැන් වැව් භාරන්න පටන් ගෙන තිබෙනවා. වැව් හැරීම දැන් ව්‍යාපාරයක් බවට පත්වෙලා. සමහර වැව් හැරීම නිසා ඒවායේ වතුර රඳා පවතින්නේ නැහැ. මා කෘෂිකර්ම අමාත්‍යාංශය බාරව හිටපු කාලයේ කුරුණෑගල පැත්තේ වැව් හැරීමේ බිස්නස් එකක් තිබුණා. වාරිමාර්ග රාජ්‍ය ඇමති ගරු පාලිත රංගේ බණ්ඩාර මැතිතුමා මේවාට සම්බන්ධ නැහැ. නමුත් ඔබතුමා ඒ ගැන දන්නවා ඇති. ඒ කාලයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැව් භාරනවාට විරුද්ධ වුණා. ඉංජිනේරුවන්, විද්‍යාඥයන් කියන්නේ වැවේ කණ්ඩිය උස්සලා අවශ්‍ය තරම් ජලය රඳවා ගන්න කියායි. මේක දැන් විලාසිතාවක් වෙලා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, ඔබතුමා නියෝජනය කරන මහාමාර්ග අමාත්‍යාංශය යටතට අයත් වන මාර්ග සෑදීමේදී අවශ්‍ය වන පස් ගන්නේත් වැව් භාරලායි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, විද්‍යාත්මක පදනමකින් තොරව, ගොවි සංවිධානවල ඉල්ලීමකින් තොරව කිසිම වැවක් හාරන්න අපි අනුමැතිය ලබා දෙන්නේ නැහැ කියලා. විශේෂයෙන්ම අක්කර අඩියක් හාරන්න ලක්ෂ 5ක පමණ මුදලක් අපට වියදම් වෙනවා. මොනරාගල දිස්ත්‍රික්කය ගත්තොත්, වැව් 32ක් අපි ප්‍රතිෂ්ඨාපනය කරලා තිබෙනවා. ඔබතුමාත් පොරොන්දු වෙච්ච වැවකුත් අපි ප්‍රතිෂ්ඨාපනය කරලා තිබෙනවා. ඒ වැව් සම්බන්ධයෙන් අපි ගත්ත ක්‍රියාමාර්ගය තමයි, වැව් දෙකයි ගොවි සංවිධානවලට දීලා තිබෙන්නේ. අනෙක් වැව් 30ම වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් තමයි කටයුතු කළේ.

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
( மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
වැව් හාරන එක කොන්ත්‍රාත්කරුවන්ට දීලා ද කරවන්නේ?

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
නැහැ, නැහැ. අපි ඒවා සෘජුවම මැදිහත් වෙලායි කරන්නේ, හිටපු ජනාධිපතිතුමනි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
ගරු ඇමතිතුමනි, හොඳ අධීක්ෂණයක් යටතේ පසු විපරම් කරමින් මේ කටයුත්ත කරන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු මන්ත්‍රීතුමනි, මේ වහින වැස්ස රඳවා ගන්න අපට අවශ්‍ය වෙනවා. මේ වැව්වල ජල ධාරිතාව වැඩි කරගන්න අපට අවශ්‍යයි. යම්කිසි චෝදනාවක් තිබෙනවා නම්, ඔබතුමා ඒ පිළිබඳව අපට දැනුම් දෙන්න. ඒ ගැන සොයා බලා මම ඔබතුමාට කරුණු ඉදිරිපත් කරන්නම්.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
අපේ ශ්‍රී ලංකාවේ ජලය ක්‍රමවත්ව හසුරුවා ගත යුතුව තිබෙනවා. එහෙම නැති වුණොත්, ඉදිරියේදී අපට ලොකු අවදානමකට මුහුණ දෙන්න සිදු වෙනවා. මේ වන විට ලෝකයේ තුනෙන් එකක පමණ ජනතාවට පිරිසිදු පානීය ජලය නැහැ. ඒ කියන්නේ ලෝක ජනගහනයෙන් බිලියන 2.3ක ජනතාවක්. මේ තත්ත්වය අපේ රටේත් ඇති වෙන්න පුළුවන්. අපේ රටේත් සමහර ප්‍රදේශවලට පිරිසිදු පානීය ජලය නැහැ.

අපේ ලුණුගම්වෙහෙර පැත්තෙත්, තිස්සමහාරාමය පැත්තෙත්, මොනරාගල දිස්ත්‍රික්කයේත්, අනුරාධපුරය, පොළොන්නරුව දිස්ත්‍රික්කවලත් වකුගඩු රෝගය විශාල වශයෙන් පැතිරිලා ගිහින් තිබෙනවා. ඒ රෝගයෙන් මැරෙන සංඛ්‍යාව අතිවිශාලයි. ඒ නිසා පිරිසිදු පානීය ජලය ලබාදීමේ වගකීමත් තමුන්නාන්සේට පැවරෙන වගකීමක් හැටියටයි මම දකින්නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
නියත වශයෙන්ම මේ පානීය ජල ප්‍රශ්නය ලබන අවුරුද්දේ මැයි මාසය වෙන්න ඉස්සෙල්ලා ඉවර කරනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
ඒ කියන්නේ පානීය ජලය ඉවරම වෙලා යනවා ද?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
අවශ්‍ය ප්‍රමාණයට ජලය ලබා දෙන්න කටයුතු කරලා ඒක ක්‍රියාත්මක කරගෙන යනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
බොහොම හොඳයි. අපි දැදුරුඔය යෝජනා ක්‍රමය ආරම්භ කරන්න ගියාම විශාල පිරිසක් එයට විරුද්ධ වුණා. ඒ අවස්ථාවේදී මමත් සමඟ නාවින්න ඇමතිතුමාත් ගියා. එදා අපට ගල් මුල් ගැහුවා. පොලීසියේ වාහන කුඩු කරලා දැම්මා.

නාවින්න ඇමතිතුමා ඊයේ-පෙරේදා මුණ ගැහුණු වෙලාවකදී මට කිව්වා, "අද දැදුරු ඔය ජලාශයේ වතුර පිරිලා තිබෙනවා. අපි බලාපොරොත්තු වූ ප්‍රදේශවලට ජලය ගෙන යනවා. ජනතාව බොහොම සන්තෝෂයෙන් ඉන්නවා." කියලා. එදා මගේ උදව්වට රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා ආවේ නැහැ. එතුමා අනිත් පැත්තේ හිටියාද මම දන්නේ නැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔබතුමා කියන්නේත් නැතිවයි ගිහින් තිබුණේ. අපි දන්නේත් නැහැ.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
ඒ ව්‍යාපාරය අපි කිසිම මුල්ගලක්, උත්සවයක් නැතිව ඒ දිනයෙන් පසුව පටන් ගත්තා. අපේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහත්වරු බොහොම දක්ෂ අය. ඒ කාර්යය ඉටු කිරීම වෙනුවෙන් අපි ඒ අයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ අය ඉතා කඩිනමින් එය ඉටු කළා. ඊට පසුව විවෘත කළා. දැන් ඒ ප්‍රදේශයේ ජනතාවට එමඟින් ලොකු සහනයක් සැලසිලා තිබෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
අම්පාර දිස්ත්‍රික්කයේ රඹකැන් ඔය ජලාශය ඉදිකරලා අවසන් කරන්න ඒ කාලයේ පුළුවන් වුණා. වෙහෙරගල ජලාශය, මව්ආර ජලාශය, යාන්ඔය ජලාශය ඉදිකළා. ඒ වාගේම මොරගහකන්ද ව්‍යාපෘතියත් 2007-2008 පමණ ඉඳලායි ආරම්භ කළේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඔබතුමන්ලා පටන් ගත්තාට, අපි තමයි ඉදිකිරීම් කටයුතු කළේ.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
හැමදේම කවුරු හෝ පටන් ගන්නවා. කවුරු හෝ අවසන් කරන්නත් ඕනෑ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
කවුරු හෝ විවෘත කරනවා.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
ප්‍රජාතන්ත්‍රවාදය අනුව, අවසන් කළේ කවුද කියන ප්‍රශ්නය නොවෙයි තිබෙන්නේ. මුලදි තබන ලද මුල්ගල් ගලවලා දමන එක නම් හොඳ නැහැ. ඒ නාමපුවරු ගලවලා,- [බාධා කිරීමක්] ඔබතුමාගේ අමාත්‍යාංශය නොවෙයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
මගේ අමාත්‍යාංශයෙන් එවැනි කිසිම දෙයක් කරන්න මම ඉඩ තියන්නේ නැහැ. එහෙම දෙයක් කළා නම් ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. මමත් පසුගිය ආණ්ඩුවේ හිටපු ඇමතිවරයෙක්.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
නොහිටිය ඇමතිවරුත් ඉන්නවා නේ. ඒකත් මතක් කරනවා.

ඒ වාගේම තවත් ප්‍රශ්නයක් තිබෙනවා. අපි ආරම්භ කරපු උමා ඔය ව්‍යාපෘතිය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. එයින් බණ්ඩාරවෙල ප්‍රදේශයේ ජනතාවට ලොකු පීඩනයක් ඇති වෙලා තිබෙනවා. එක පැත්තකින්, අවශ්‍ය ප්‍රදේශයට ජලය ගෙන යන්න ඕනෑ; විශේෂයෙන්ම ආහාර අර්බුදය විසඳීම සඳහා මහා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ වාගේම, මේවායින් මතු වන ගැටලු කඩිනමින් විසඳා දීමට කටයුතු කරන්න ඕනෑ. ඒ ගැටලු විසඳන්නේ නැති වෙනකොට තමයි ඒවා ඔඩු දුවන්නේ. ඒ හේතුව නිසාම වෙනත් ප්‍රයෝජන සඳහා ජනතාව හසුරුවන්න එක එක අයට අවස්ථාව ලැබෙනවා. අපේ රටේ තිබෙන ලොකු ප්‍රශ්නයක් තමයි, ව්‍යාපෘතියක් පටන් ගන්න ගියාම එයට විරෝධය දක්වන පිරිස්; කරුණු නොදැන එයට පොළඹවා ගන්න පිරිස් නිසා ඒ ව්‍යාපෘතිය එක පැත්තකින් කල් යාම; එහෙම නැත්නම් එයින් නිසි ප්‍රයෝජනයක් ගන්න ලැබෙන්නේ නැහැ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
උමා ඔය ව්‍යාපෘතියට කිලෝමීටර දෙකක් වැනි ප්‍රදේශයක තමයි ඔය ගැටලුව තිබෙන්නේ. අවිධිමත්ව ආරම්භ කිරීම නිසා තමයි ඒ ගැටලුව ඇති වෙලා තිබෙන්නේ. දැන් ඒක විධිමත් කරලා තිබෙනවා. අනාගතයේ ඒ ගැටලුව නිරාකරණය වෙයි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
අවිධිමත්ව නොවෙයි. මෙය අද-ඊයේ පටන් ගත් එකක් නොවෙයි. 2000දී විවිධ ක්‍රමවලින් පටන් ගත් විදුලි යෝජනා ක්‍රමයක්. මෙය මුලින් විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා යෝජනා කර තමයි ශක්‍යතා අධ්‍යයන සකස් කළේ. පසුව එය බහු කාර්ය යෝජනා ක්‍රමයක් ලෙස අපේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඇමතිවරයෙකු වශයෙන් කටයුතු කළ කාලයේ 2004දී බොහොම සද්භාවයෙන් යුතුව කරපු යෝජනාවක්. ඒ අනුව තමයි මේ වැඩ පටන් ගත්තේ. මේක, credit එකක් ගන්න කියන දෙයක් නොවෙයි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඒ ගැන කිසිම තර්කයක් නැහැ. ගැටලුව තිබෙන්නේ, කැණීම් කටයුතු කිරීමේදී නිසි යන්ත්‍ර යොදා ගෙන නොතිබීමයි. ඒ නිසා තමයි මේ ගැටලුසහගත තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත්වීම තුළ දැන් මෙය නිසි ක්‍රමවේදයට හරවා තිබෙනවා. මම මාසයකට ඉස්සෙල්ලා ගිහින් බැලුවා. ඉංජිනේරු මහත්වරුත් හමු වුණා. තව මාසයක් දෙකක් ඇතුළත මෙම ගැටලුව සියයට 95කින් විතර නිමා වෙයි.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
බොහොම ස්තුතියි. එතකොට වැල්ලවාය, තණමල්විල, සෙවනගල, අම්බේගමුව වාගේම ලුණුගම්වෙහෙර ආදී ප්‍රදේශවල තිබෙන ජල ප්‍රශ්නයත් විසඳෙයි. එහෙම වුණොත් අවශ්‍ය ආහාර ටික සපයා ගෙන මේ නියඟයට ඔරොත්තු දෙන්නත් පුළුවන් වෙනවා.

මට ලැබී තිබෙන කාලය අනුව වාරිමාර්ග පැත්තෙන් මහවැලිය පිළිබඳවත් වචන දෙකක් කථා කිරීමට මා බලාපොරොත්තු වෙනවා. මගේ දිස්ත්‍රික්කයට බලපාන ව්‍යාපෘතියක්. ඒ කියන්නේ මහවැලි-වලව කලාපයේ සූරියවැව ඉඳලා හම්බන්තොට දක්වා විශාල ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා. මහවැලිය මෙම ඉඩම් ලබා දීම සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවා තිබුණා. රුපියල් 50ක් බැඳලා ඉල්ලුම් පත්‍රයක් ගන්න ඕනෑ. අපේ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉඩම් බිම් අඟලක් නැති විශාල පිරිසක් මේ සඳහා ඉල්ලුම් කළා.

ඒ සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වුවා. සුදුසු අය තෝරාගෙන තිබෙනවා. පර්චස් 20 බැගින් දෙන්නට 4,000ක පමණ පිරිසක් ඉන්නවා. අනාගතයේදී ඇතිවන සංවර්ධනයත් එක්ක වරාය, ගුවන්තොටුපොළ ආදී මහා පරිමාණ ව්‍යාපෘති වාගේම කර්මාන්තශාලා විශාල වශයෙන් ඒ ප්‍රදේශවලට එන්න ඕනෑ. එසේ තෝරාගෙන සිටියත් මේ ඉඩම් සියල්ල ලබාදෙන්න පුළුවන්කමක් නැහැ කියා මා හිතනවා. මොකද, විශාල ව්‍යාපෘති නිසා බිම කර්මාන්තශාලාවලට තියෙන්නත් ඕනෑ. මේ තෝරාගත් උදවිය සිටිද්දී, තෝරාගත් ඉඩම් නැති ජනතාව සිටිද්දී ඉඩම් කච්චේරි හෝ කිසිවක් නොතියා හිතු හිතු විධියට ඉඩම් ලබාදීමට ක්‍රියා කරගෙන යනවා; දෙනවා. මම හිතන්නේ සොයා බලා මේවා නතර කළ යුතුයි.

සභානායකතුමා, මට මතකයි 2004 ඉඩම් කච්චේරි තියලා ඉඩම් දෙන්න ගියාම, 1988 ඉඩම් කච්චේරිවලට ගියපු 300ක පමණ පිරිසක් ඇඹිලිපිටිය උසාවියට ගිහිල්ලා නඩුවක් දැම්මා. ඒ නඩුවේදී තීන්දුවක් දුන්නා, 1988 තෝරාගත් පිරිසට ඒ ඉඩම් පළමුව දීලා 2004 තෝරාගත් අයට දෙන්න කියලා. ඒ අනුව ඒ 300ටම ඉඩම් දෙන්න සිද්ධ වුණා. මේ ප්‍රශ්නයේදීත් ඉඩම් අලුතෙන් දෙනවා නම්, ඉස්සෙල්ලා තිබ්බ්ච කච්චේරිවලින් තෝරාගත් අයට ප්‍රමුඛතාව දෙන්න සිදු වෙනවා. මේවා ගැනත් සොයන්න සිදු වෙනවා. තාවකාලික යම් යම් අවශ්‍යතාවන් සඳහා නැත්නම් වාසි ප්‍රයෝජන සඳහා අවිධිමත් විධියට ඉඩම් දෙන්න ගියොත් මම හිතන්නේ ගැටලු ඇති වනවා.

අපේ රජයත් වරායත්, ගුවන්තොටුපොළවල් ඇති කරලා කර්මාන්තශාලා හදන්න තමයි කටයුතු කළේ. ඔබතුමන්ලාගේ රජය වෙනත් ආකාරයකින් ඒවායේ කර්මාන්තශාලා ඉදි කරන්න කටයුතු කරනවා. දැන් මේ ඉඩම් ඒවාටත් ආරක්ෂා වෙන්න ඕනෑ. ඒ නිසා ඒ සඳහා අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

ඊළඟට, කෘෂිකර්මාන්තය. 1932 රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ -අපේ පක්ෂයේ- නිර්මාතෘ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ප්‍රකාශ කළා, "රජයක ප්‍රධාන හා ප්‍රමුඛ යුතුකම සහ වගකීම වන්නේ රටේ තම ජනතාව ජීවත්කරවීම මිස මියයාමට ඉඩ නොදීමයි." කියලා.

එතුමා කෘෂි කර්මාන්තය ගැන කථා කරපු අවස්ථාවක කළ ප්‍රකාශයක්. එය හැන්සාඩ් වාර්තාවෙන් ලබා ගත්තේ. හැබැයි, ස්වාභාවිකව ඇතිවූ ප්‍රශ්නත් තිබෙනවා. නමුත්, අද හම්බන්තොට දිස්ත්‍රික්කයේ සහල් කිලෝව රුපියල් 100ට රුපියල් 125ට ගිහින්. පොල් ගෙඩියක් රුපියල් 100යි. කොළඹ ගණන් කොහොමද දන්නේ නැහැ. ඒ වාගේම පොල් අස්වැන්න විශාල වශයෙන් අඩු වෙලා තිබෙනවා. නියඟය නිසා අනුරාධපුරය, පොළොන්නරුව, වවුනියාව, කුරුණෑගල යනාදී ප්‍රදේශවල වී නිෂ්පාදනය නැති වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

අපේ හිටපු කථානායකතුමාගේ වෙන් කළ කාලය නම් ඉවරයි. ඒකයි මම බැලුවේ. මම බාධා කරන්නත් කැමැති නැහැ.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)

මම අවසාන කරන්නම්. නීතිගරුක වෙන්න එපායැ. ආදර්ශවත් වෙන්න එපායැ. ඔබතුමාගේ ඉල්ලීම පිළිගන්න ඕනෑ නේ. නියඟය පිට දමලා සහල් පිට රටින් ගෙන්වීම සඳහා විශාල මුදලක් වැය කිරීම නොවෙයි කළ යුත්තේ. අපි ජලය ගබඩා කරලා තබා ගත යුතුයි. 2015 වසරේ ඔබතුමන්ලාගේ රජය බලයට පත් වෙන්න කලින් කෘෂිකර්ම ඇමැති වශයෙන් හිටියේ වර්තමාන ජනාධිපතිතුමායි. එදා එතුමාගේ සහ එම රජයේ දූරදර්ශී වැඩ පිළිවෙළ නිසා වී අතිරික්තයක් ඇති වුණා. පොහොර සහනාධාරය, ජලාශ ඉදිකිරීම, ඉඩම් ලබා දීම යනාදී කරුණු නිසා විශාල වී අතිරික්තයක් ඇති වුණා. මේ අතිරික්තය ගෙන ගොස් මත්තල ගුවන් තොටුපළ ගබඩාවේ දමලා පසුව සත්ව ආහාර සඳහා බෙදා දුන්නා. ඒ අතිරික්ත වී ප්‍රමාණය තබාගෙන හිටියා නම්, සුරක්ෂිත කර ගත්තා නම්, මේ වේලාවේ ප්‍රයෝජනයට ගන්න තිබුණා. ඒ කරුණු පිළිබඳව තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරනවා. මගේ කාලය ඇමතිවරු දෙදෙනෙක්ම ගත්තා. ඒ වුණත් මම මා මීට වඩා කාලය ගන්නේ නැහැ. මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The next speaker is Hon. V.S. Radhakrishnan. You have only four minutes.

**ගරු වී.එස්. රාධාක්‍රිෂ්ණන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. V.S. Radhakrishnan -State Minister of Education)

The TNA said that they would be giving me five minutes, but there is no Member from the TNA in the House.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

They have to declare as to who is giving you time. We do not have any information about that. Please go ahead as you have only four minutes.

[மு.ப. 11.07]

**ගරු වී.එස්. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வாய்ப்பளித்த மைக்கு நன்றி. கமத்தொழில் அமைச்சைப் பொறுத்தளவில் கௌரவ அமைச்சர் துமிந்த திசாநாயக்க அவர்களும், கௌரவ வசந்த அலுவிஹார அவர்களும் குறிப்பிடத்தக்க நல்ல பல வேலைத்திட்டங்களை முன்னெடுத்து வருகின்ற அதே வேளையில், விவசாயத் துறையைப் பொறுத்தளவில் எமது நாட்டுக்கு புதிய தொழில்நுட்பங்கள் அறிமுகம் செய்து வைக்கப்பட வேண்டுமென்றும் அதன்மூலமாக எங்களுடைய உற்பத்திச் செலவைக் குறைத்துக்கொள்ள முடியுமென்றும் குறிப்பிட விரும்புகின்றேன்.

இன்று எங்களுடைய விவசாயிகள், தமது விவசாயப் பயிர்ச்செய்கைக்கான உற்பத்திச் செலவு அதிகரித்துள்ள காரணத்தினால், அதற்கு உரிய விலை கிடைக்காவிட்டால் பெரும் பொருளாதார நட்டத்தைச் சந்திக்க வேண்டியுள்ளது. அதன் காரணமாக அரசாங்கத்துக்கெதிராக ஆர்ப்பாட்டம் செய்து தாம் விவசாயத்துக்காகப் பெற்றுக்கொண்ட கடன் தொகையை இரத்துச்செய்யுமாறு கோரிக்கை விடுக்கின் றார்கள். இதன்மூலம் அரசாங்கத்துக்கும் திறைசேரிக்கும் பாரிய நட்டம் ஏற்படுகின்றது. ஆகவே, விவசாயத்துறையில் புதிய தொழில்நுட்பத்தை அறிமுகம் செய்வதன்மூலம் உற்பத்திச் செலவு குறைந்து வருமானம் அதிகரிக்கும்பொழுது இந்த நிலைமை மாறும் என்பதையும் செய்யப்படுகின்ற விவசாயப் பயிர்களுக்கமைய அவற்றை ஏற்றுமதி செய்வதற்கு விவசாய அமைச்சின் மூலமாக நடவடிக்கை எடுக்கவேண்டு மென்பதையும், அதன்மூலம் எமது நாட்டிலுள்ள இளைஞர், யுவதிகளுக்கு வேலைவாய்ப்புக்களை ஏற்படுத்த முடியுமென் பதையும் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

எமது நாடு விவசாய நாடாக இருந்தாலும் சுதந்திரமடைந்த காலம் முதல் இன்று வரையில் விவசாயத்தில் தன்னிறைவடையாத ஒரு நாடாகவே இருக்கின்றது. நான் அண்மையிலே பங்களாதேஷ் நாட்டுக்குச் சென்றிருந்த பொழுது, அவர்கள் விவசாயத்துறையில் தன்னிறைவுகொண்ட ஒரு நாடாக இருப்பதை என்னால் அறிந்துகொள்ள முடிந்தது. அந்த நாடு, எமது நாடு சுதந்திரமடைந்த பின்னர் சுதந்திரத்தைப் பெற்றுக்கொண்ட ஒரு நாடாகும். அதுபோல், எங்களுடைய நாட்டின் பொருளாதார நிலையுடன் ஒப்பிட்டுப் பார்க்கும்பொழுது அந்நாட்டின் பொருளாதாரம் பின்தங்கிய நிலையிலேயே காணப்படுகின்றது. அப்படியானால், ஏன் எங்களுடைய நாடு விவசாயத்தில் தன்னிறைவு அடைய முடியாத நிலையில் இருக்கின்றது? என்பதே என்னுடைய கேள்வியாகும்.

இன்று பல நாடுகளில் நச்சுத்தன்மையற்ற, சூழலுக்குப் பாதிப்பை ஏற்படுத்தாக வகையில் விவசாயத்தை முன்னெடுத்து வருகின்றனர். அவர்களுடைய அந்த முறையை எங்களுடைய நாட்டிலும் அறிமுகம் செய்வதற்கான நடவடிக்கை எடுக்க வேண்டும். எங்களுடைய விவசாயிகளைத்

[ගරු වී.එස්. රාධාක්‍රිෂ්ණන් මහතා]

தெரிவுசெய்து, அவர்களை வெளிநாடுகளுக்கு அனுப்பிவைத்து, அவர்களுக்கான பயிற்சிகளை ஏற்பாடு செய்து கொடுப் பதற்கும் அமைச்சு நடவடிக்கை எடுக்க வேண்டும். எமது நாட்டிலுள்ள அனைத்துக் குளங்களையும் புனரமைப்புச் செய்து மழை காலங்களில் நீரைச் சேகரிப்பதற்கான நடவடிக்கை எடுக்கவேண்டும். விசேஷமாக எங்களுடைய மலையகப் பகுதிகளில் உள்ள குளங்களைப் புனரமைப்பதன் மூலமாக இந்த நாட்டின் அனைத்துப் பகுதிகளுக்கும் நீரைக் கொண்டுசெல்வது மிக இலகுவாக இருக்குமென்பதையும் வரட்சியான காலங்களில் விவசாயத்துக்குத் தேவையான நீரைப் பெற்றுக்கொள்வதற்கு அது வாய்ப்பாக அமையுமென்பதையும் தெரிவித்துக்கொள்கின்றேன்.

விவசாயத்தை நம்பியிருப்பவர்களுக்கு, அவர்களுக்குத் தேவையான ஊக்கமும் ஆக்கமும் அளிப்பதுடன் விவசாயத் திணைக்களத்தின் ஒத்துழைப்பும் வழங்கப்பட வேண்டும். நான் ஏன் இவ்வாறு குறிப்பிடுகின்றேனெனில், இன்று எமது நாட்டில் விவசாயத் திணைக்களம் விவசாயிகளை ஊக்குவிக் கின்ற வேலைகளைச் செய்வது மிகமிகக் குறைவாகக் காணப்படுகின்றது. இந்தியா போன்ற நாடுகளிலே 24 மணிநேரமும் வானொலி வாயிலாகவும் தொலைக்காட்சி வாயிலாகவும் விவசாயிகளுடைய பிரச்சினைகளை அறிந்து, அவர்களுக்குத் தேவையான அறிவுரைகளை வழங்குவதுடன், விவசாயத்தை எவ்விதம் அபிவிருத்தி செய்ய முடியும் என்பது தொடர்பாகவும் காலநிலை மாற்றங்கள் பற்றிய விபரங் களையும் அறிவித்துக்கொண்டிருப்பார்கள். அதே போன்ற தொரு திட்டத்தை இங்கும் உருவாக்க வேண்டுமென்று நான் இன்று இச்சபையிலே எமது கமத்தொழில் அமைச்சர் கௌரவ வசந்த அலுவிஹார அவர்களிடம் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இதேபோன்று இன்னும் பல விவசாயத் தேவைகளை மக்கள் விவசாயத் திணைக்களத்திடம் எதிர்பார்க்கின்றனர். அந்த மக்களுக்கு விவசாயத் திணைக்களத்தினர் நேரடியாகச் சென்று சேவைகளைச் செய்வதில்லை. கடந்த காலங்களிலே விவசாயத் திணைக்களம் நல்ல உயரிய நிலையில் செயலாற்றியது. இன்று அது co-operative மாதிரி மாறிவிட்டது. அந்த நிலையில் மாற்றத்தைக் கொண்டுவர வேண்டும்.

பெரும்பாலும் உருளைக்கிழங்கு உற்பத்திச்செய்கையில் ஈடுபட்டுள்ள நுவரெலியா பகுதியில் உள்ள விவசாயிகள் தமது உருளைக்கிழங்குக்கு நல்ல விலை கிடைக்கவேண்டுமென எதிர்பார்க்கின்றார்கள். அதேபோன்று ஊவா மாகாணத்திலும் உருளைக்கிழங்கு செய்கை பண்ணப்படுகின்றது. இதனுடைய விலையை நிலையாக வைத்திருக்க வேண்டுமாகவிருந்தால், அந்தந்தப் பகுதிக்கேற்ற விவசாய உற்பத்திகளை விவசாயிகள் மேற்கொள்ள வேண்டும். எனவே, விவசாயத் திணைக்களம் அவ்விவசாயிகளுக்கு உரிய அறிவுறுத்தல்களை உரிய காலங்களில் வழங்க வேண்டுமெனவும், தயவுசெய்து விவசாயத் திணைக்களத்தை ஒரு திறன்மிக்க திணைக்களமாக மாற்றியமைக்க நடவடிக்கை எடுக்கவேண்டுமெனவும் விவசாயத் திணைக்கள அத்தியட்சகர் அவர்களிடம் வேண்டுகோள் விடுக்கின்றேன். அத்துடன், அவசிய தேவையேற்படுகின்றபொழுது மட்டும் அரசாங்கம் உருளைக்கிழங்கை இறக்குமதி செய்ய வேண்டுமென்றும், தேவையேற்படாதவிடத்து உருளைக்கிழங்கை இறக்குமதி செய்து எமது விவசாய மக்களின் திறமையை மழுங்கடிக்கச் செய்வது வருந்தத்தக்க செயலாகுமெனவும் தெரிவித்துக் கொள்கின்றேன்.

வரவு செலவுத்திட்டத்தில் விவசாய அமைச்சுக்கு ஒதுக்கப்பட்டுள்ள நிதியானது 16,800 மில்லியன் ரூபாயாகும். அது தவிர, வரவு செலவுத்திட்ட முன்மொழிவுகள் 4,000 மில்லியன் ரூபாயாகும். உர மானியத்திற்காக 35,000 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது. அந்த வகையில், மொத்தமாக 55,800 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இதன்மூலமாக இந்த அமைச்சுக்குப் பாரிய அளவு நிதி ஒதுக்கப்பட்டுள்ளது; இதனை நான் வரவேற்கின்றேன். அந்த வகையில் நெற்காணிகள் மற்றும் தொடர்புடைய நீர் வழங்கல் அபிவிருத்திக்கு 28 சதவீதமும் உணவுப் பாதுகாப்புக்காக 27 சதவீதமும் விவசாய தொழில்முயற்சி வர்த்தகத்திற்கு 4 சதவீதமும் அனர்த்த முகாமைத்துவப் பங்களிப்புக்காக 8 சதவீதமும் ஒதுக்கப்பட்டுள்ளது. இதில் விவசாய தொழில் முயற்சி வர்த்தகத்திற்கு இன்னும் அதிகமாக நிதி ஒதுக்க வேண்டும் என்ற கோரிக்கையை நான் முன்வைக்க விரும்புகின்றேன்.

உருளைக்கிழங்கின் இறக்குமதி வரி நீக்கம் காரணமாக எங்களுடைய விவசாயிகள் பெரும் பாதிப்பைச் சந்திக்க வேண்டிய ஒரு நிலைமை ஏற்பட்டுள்ளது. நீக்கப்பட்ட வரியை மீண்டும் அமுல்படுத்த நடவடிக்கை எடுக்க வேண்டும். அதாவது, 40 சதவீதமாக இருந்த இறக்குமதி வரி இப்பொழுது மிகவும் குறைக்கப்பட்டிருக்கின்றது. ஆகவே, மீண்டும் அந்த வரியை 50 சதவீதமாக விதித்தாவது நுவரெலியா, பதுளை, மற்றும் நுவரெலியா மாவட்ட உருளைக்கிழங்கு விவசாயிகளைக் காப்பாற்ற வேண்டும் என்பது என்னுடைய வேண்டுகோளாக இருக்கின்றது. இதன்மூலம் அதிகமான வர்கள் அவ்வுற்பத்தியில் ஈடுபடும்போது, அரசாங்கத்திற்குப் பெரும் சுமையாக இருக்கின்ற வேலையில்லாப் பிரச்சினையை இந்த மாவட்டங்களிலே கட்டுப்படுத்த முடியும் என்பதும் என்னுடைய கருத்தாகும்.

விதை உருளைக்கிழங்கு இறக்குமதியைப் பொறுத்த வரையில், ஒவ்வொரு வருடமும் அதனுடைய விலை அதிகரித்தவண்ணமே இருக்கின்றது. பொதுவாக 50 கிலோ கொண்ட விதை உருளைக்கிழங்குப் பெட்டி ஒன்றின் விலை 15,000 ரூபாயாக இருக்கின்றது. இதைக் கட்டுப்படுத்துவதற்கு இலங்கையிலே விதை உருளைக்கிழங்கை உற்பத்தி செய்வதற் கான நடவடிக்கையை எடுக்க வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. State Minister, your time is over.

**ගරු වී.එස්. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
Sir, please give me two more minutes.

தேவைக்கு ஏற்ப மரக்கறி வகைகளை உற்பத்தி செய்யாததன் காரணமாகவே மரக்கறி விலை ஒரு காலத்தில் அதிகமாகவும் ஒரு காலத்தில் மிகவும் குறைவாகவும் இருக் கின்றது. எனவே, அதனைக் கட்டுப்படுத்தி, தேவைக்கு ஏற்ற வகையில் மரக்கறியை உற்பத்தி செய்ய விவசாயிகளுக்கு அறிவுறுத்தலும் ஆலோசனையும் வழங்க வேண்டும்.

இந்த hybrid விதைகள் அதிகமாக இறக்குமதி செய்யப் படுவதன் காரணமாகக் குறித்த மாவட்டங்களிலே விவசாயிகள் மிகவும் மோசமான நிலைக்குத் தள்ளப்படு கின்றார்கள்.

ஏனென்றால், hybrid விதைமூலம் இலங்கையினுடைய எல்லாப் பாகங்களிலும் அதிகமாக மரக்கறிகள் விளைவிக்கப்படுவதன் காரணமாக, அந்தப் பகுதிகளில் அவற்றுக்குரிய முழுமையான விலை கிடைக்காமற்போகின்றது. கடந்த காலங்களிலே DG அவர்களுடனும் அமைச்சர் அவர்களுடனும் நாங்கள் குறித்த விடயம் சம்பந்தமாகப் பேச்சுவார்த்தை நடத்தினோம்.

වාරිමාර්ග අමාත්‍යාංශයේ ඇමතිවරු දෙදෙනාම - වාරිමාර්ග ඇමතිවරයාත්, රාජ්‍ය ඇමතිවරයාත් කියන දෙදෙනාම- මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ සිට හැම පළාතටම අපේ වතුර ගෙන යනවා. නුවරඑළියට යම්කිසි දෙයක් කරන්න උත්සාහ කරාවි කියා අපි බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමාගෙන් ඒ ගැන අහන කොට එතුමා කිව්වා, "ඔබතුමන්ලා ඉල්ලන්නේ නැහැ, ඒක නින්දා දෙන්නේ නැහැ" කියා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

නැහැ, නැහැ. එහෙම කිව්වේ නැහැ. "දෙනවා" කියලායි කිව්වේ.

**ගරු වී.එස්. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

ඒ නින්දා අපි ලබන වතාවේ වැඩියෙන් ඉල්ලනවා. අපට වැඩියෙන් හම්බ වේවි කියා අපි බලාපොරොත්තු වෙන බව පවසමින් මම නිහඬ වෙනවා. සියලුදෙනාටම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The next speaker is Hon. Ameer Ali Shihabdeen. You have four minutes.

[மு.ப. 11.15]

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා (ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன் - கிராமிய பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ameer Ali Shihabdeen - Deputy Minister of Rural Economic Affairs)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய குழுநிலை விவாதத்தில், நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சின்மீதான ஒதுக்கீடுகள்மீது பேச எண்ணுகிறேன். என்னுடைய உரையைக் கேட்டுக் கொண்டிருக்குமாறு அமைச்சர் அவர்களிடம் வேண்டுகோள் விடுக்கின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்திலே, கல்குடா தொகுதியிலே இருக்கின்ற வாகனேரி நீர்ப்பாசனக் குளம் மத்திய அரசாங் கத்தின் நேரடிக் கட்டுப்பாட்டின்கீழ் வருகின்றது. அங்கு 8,500 ஏக்கர் நிலத்தில் வேளாண்மை செய்யப்படுகின்றது. கிரான், வாழைச்சேனை போன்ற கமநல நிலையங்களும் 15 விவசாய அமைப்புக்களும் இதிலிருந்து நன்மை பெறுகின்றது. இந்தக் குளத்தை நம்பி 2,500 விவசாயக் குடும்பங்கள் வாழ்க்கை நடத்தி வருகின்றன. ஆயினும், இக்குளம் நீண்டகாலமாகப் புனரமைப்புச் செய்யப்படவில்லை என்பதை கௌரவ அமைச்சர்களுக்கு நான் இந்த இடத்திலே மிகவும் கவலை யோடு கூறக் கடமைப்பட்டவனாக இருக்கின்றேன். இதன் காரணமாக அங்கு வாய்க்கால்கள் திருத்தப்படவில்லை; அணைக்கட்டுகள் திருப்பப்படவில்லை. அவற்றின் கதவுகள் கூடப் புனரமைக்கப்படாத நிலைமை காணப்படுகின்றது. இதனால் அங்கு மிகுந்த பிரச்சினையையும் சர்ச்சையையும் விவசாயிகள் எதிர்நோக்குகின்றார்கள் என்பதை இந்தச் சபையிலே நான் உங்களுக்குக் கூறக் கடமைப்பட்டவனாக இருக்கின்றேன்.

வாகனேரி குளத்திற்கு மதுறு ஓயாவிலிருந்து திறந்து விடப்படுகின்ற நீர் முழுமையாகக் கிடைப்பதில்லை. காரணம், விளாளவை, மூக்கராயன்குளத்து ஓடை ஆகிய இடங்களில் காணப்படும் உடைப்புக்கள் ஆகும். இந்த அமைச்சின் அதிகாரிகள் அவற்றை நிரந்தரமாகத் திருத்துவதற்குக் காத்திரமான நடவடிக்கைகளை இதுவரை எடுக்கவில்லை என்பதுதான் அந்தப் பிரதேச விவசாயிகளினது குற்றச்சாட்டாக இருக்கின்றது. எனவே, அந்த விளாளவை, மூக்கராயன்குளத்து ஓடை ஆகிய இரண்டு இடங்களிலும் உள்ள உடைப்புக்களை நிரந்தரமாகச் சீர்செய்வதற்கான வேலைகளைச் செய்ய வேண்டும். இந்த உடைப்புக்களால்தான் கடந்த ஆண்டிலும் இந்த ஆண்டிலும் பெரும்போகம், சிறுபோகம் ஆகிய இரண்டு போகங்களிலும் விவசாயிகள் கடுமையான பாதிப்புக்குள்ளாகி னார்கள். இது தொடர்பான அமைச்சுக்குரிய கௌரவ அமைச்சர்கள் இப்போது இங்கிருப்பது மிகவும் சந்தோசமாக இருக்கின்றது. அவர்கள் இதனைக் கருத்திற்கொண்டு, எதிர்காலத்திலே தேவையான நடவடிக்கைகளை எடுக்க வேண்டும் என்பது எங்களுடைய எதிர்பார்ப்பாகும்.

கௌரவ தவிசாளர் அவர்களே, அதேபோன்று புனானை மேற்கு விவசாயிகள் வாகனேரி நீர்ப்பாசனத் திட்டத்திற்குள் உள்வாங்கப்படாமை நீண்டகாலமாகப் பாரிய பிரச்சினையாக இருக்கின்றது. இந்த விடயத்திலே அந்தப் பிரதேசத்திலே இருக்கின்ற மினுமினுத்தவெளி மேற்கு விவசாய அமைப்பு, கிடைச்சிமடு கமநல அமைப்பு, முருங்கையடிப்பட்டி கமநல அமைப்பு, புனானை மயிலந்தன்னை கமநல அமைப்பு, காரையடிப்பட்டி களுவாமடுக் கமநல அமைப்பு போன்றவற்றின் விவசாயிகள் தங்களையும் நிரந்தர நீர்ப்பாசனத் திட்டத்திற்குள் இணைத்துக்கொள்ளுமாறு நீண்டகாலமாகக் கோரிவருகின்றனர். 1942ஆம் வருடம் முதல் அவர்கள் அந்த வடிச்சல் நீரைப் பயன்படுத்தி விவசாயம் செய்து வருகின்றார்கள். ஆனால், வர்த்தமானி அறிவித்தல் மூலம் அந்த விவசாய சமூகத்தையும் ஒரு நிரந்தரமான நீர்ப்பாசனத் திட்டத்திற்குள் இணைத்துக்கொள்கின்ற வேலைத்திட்டம் நீண்டகாலமாகவே அதிகாரிகளினாலும் அமைச்சினாலும் இழுத்தடிக்கப்பட்டு வருவதை இந்தச் சபையிலே நான் சொல்லியாக வேண்டும்.

24.07.2017 அன்று நடைபெற்ற மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்திலே வாகனேரி விவசாய நீர்ப்பாசனத் திட்டத்திற்குள் புனானை மேற்கு விவசாயிகள் உள்வாங்கப்பட வேண்டும் என்கின்ற பிரேரணை முன்வைக்கப்பட்டு, அதற்குரிய வேலைத்திட்டங்கள் ஆரம்பிக்கப்பட வேண்டு மென்று றூகம் பிரிவு நீர்ப்பாசனப் பொறியியலாளர்களுக்குத் தெரிவிக்கப்பட்டிருந்தும், இதுவரையில் அந்த வேலைத்திட்டம் நடைபெறவில்லை. புனானை மேற்கு விவசாயிகளை நிரந்தர விவசாயிகளாக அங்கீகரித்து, வாகனேரி நீர்ப்பாசனத் திட்டத்தில் இணைந்து செயற்படுகின்ற விவசாயிகளாக அவர்களும் உள்வாங்கப்பட வேண்டும் என்பது எங்களுடைய எதிர்பார்ப்பாகவும் அந்த விவசாயிகளுடைய எதிர்பார்ப் பாகவும் இருக்கின்றது. இது தொடர்பிலே கௌரவ அமைச்சரிடத்திலே பல தடவைகள் சொல்லியிருக்கின்றேன்.

[ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා]

கௌரவ அமைச்சர் அவர்கள் இதுபற்றி அதிகம் அக்கறை எடுத்துக்கொள்ள வேண்டும் என்பது எங்களுடைய எதிர்பார்ப்பாக இருக்கின்றது.

அதுமட்டுமல்லாமல், மூக்கராயன்குளத்து ஓடைப் பாலத்தை அமைப்பதற்குரிய திட்ட அறிக்கையை நான் கடந்த வருடம் கௌரவ அமைச்சரிடத்திலே சமர்ப்பித்திருந்தேன். இதனை நிறுவுவதன்மூலம் கிட்டத்தட்ட 2,000 ஏக்கருக்கு மேற்பட்ட காணிகளில் பயிர் செய்கின்ற விவசாயிகள் பலன் பெறுவார்கள். எனவே, அதன்மூலம் விவசாயத்தைச் சிறப்பிக்க முடியுமென்று நாங்கள் நினைக்கின்றோம். எனவே, விசேடமாக வட பிரதேசங்களாக இருக்கலாம், கிழக்குப் பிரதேசங்களாக இருக்கலாம், அங்கிருக்கின்ற விவசாய சமூகத்திற்கு நீரையும் விவசாயம் தொடர்பான நிரந்தர வசதி வாய்ப்புக்களையும் பெற்றுக்கொடுப்பீர்களாக இருந்தால், அவர்கள் அரசாங்கத்திடம் எதிர்பார்ப்புகளின்றித் தங்களது உழைப்பை, ஊதியத்தை நம்பி வாழ்கின்ற ஒரு நிலைவரத்தைத் தோற்றுவிக்கலாம். கடந்த காலத்திலே யுத்தம், சுனாமி போன்றவற்றால் பாதிக்கப்பட்டிருக்கின்ற அந்த மக்களுக்கு இந்த இயற்கை வளத்தை நீங்கள் அள்ளிக்கொடுப்பதன்மூலம் அவர்களை முன்னேற்றலாம். இதிலே அரசியல் காரணங்கள் காட்டப்படாமல் அல்லது வேறு இனக்குரோதமான முறையில் எந்த நடவடிக்கையும் செய்யாமல் அந்த மாவட் டத்திலேயிருக்கின்ற எல்லா விவசாயிகளுக்கும் நீர் கிடைக்க வேண்டும் என்ற நோக்கத்துடன் கடந்த காலத்திலே எந்த வேலைத்திட்டமும் செய்யப்படவில்லை என்பதை நான் இந்த இடத்திலே குறிப்பிட்டுக் காட்டித்தான் ஆகவேண்டும். அந்த நிலை எதிர்காலத்திலும் தொடராமல், பாதிக்கப்பட்டுப் போயிருக்கின்ற சமுதாயத்தினுடைய எதிர்பார்ப்புக்களை, அவர்களுக்குக் கிடைக்கவேண்டியிருக்கின்ற இறைவனுடைய கொடையாக இருக்கின்ற நீரைப் பெற்றுக்கொடுக்கின்ற வேலைத்திட்டத்தை நீங்கள் மேற்கொள்ள வேண்டும்.

இந்த விடயத்தில் மட்டக்களப்பு மாவட்டத்திலே இருக்கின்ற அதிகாரிகள் இன்னமும் இழுத்தடிப்புச் செய்கின்ற ஒரு நிலைதான் காணப்படுகின்றது. "சாமி வரம் கொடுத்தாலும் பூசாரி விடுவதில்லை" என்பதுபோன்ற நிகழ்வு மட்டக்களப்பு மாவட்டத்திலே புனானை மேற்கு விவசாயிகளுக்கு ஏற்பட் டிருக்கின்றது. இதனைச் செய்து கொடுப்பதற்குக் கொழும் பிலே இருக்கின்ற நீர்ப்பாசனத் துறையைச் சேர்ந்த, மதுறு ஓயாவைச் சேர்ந்த, அல்லது நீர் முகாமைத்துவத்தைச் சேர்ந்த அதிகாரிகள் தயார் என்றபொழுதிலும்கூட, மட்டக்களப்பு மாவட்டத்திலே நீர்ப்பாசனத்திற்குப் பொறுப்பாக இருக்கின்ற அதிகாரிகள் அதை ஏற்றுக்கொள்வதற்கும் அதனைப் பெற்றுக் கொடுப்பதற்கும் இழுத்தடிப்புச் செய்வதால்தான் 1942ஆம் ஆண்டிலிருந்து இந்தப் பிரச்சினை தொடர்ந்து கொண்டிருக் கின்றது. கௌரவ அமைச்சர் அவர்களே, அம்மக்களின் கோரிக்கையை ஏற்று, இதைக் கருத்திலெடுத்து, இதனைச் செய்துகொடுக்க நீங்கள் முன்வரவேண்டுமென்று நான் எதிர்பார்க்கிறேன்.

விசேடமாக றூகம், கித்துள் நீர்த்தேக்கத் திட்ட அமுலாக் கலுக்காக இந்த நாட்டின் சனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களுக்கும் பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களுக்கும் - *[இடையீடு]* කියන්න ඇමතිතුමා..

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඒ නිලධාරින්ගේ යම්කිසි අකාර්යක්ෂමතාවක් තිබෙනවා නම්, ඒ ගැන තොරතුරු ඉදිරිපත් කරනවා නම් අපට සොයා බලන්න පුළුවන්.

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
කථාවට අදාළ ලියකියවිලි ඔබතුමාට අද මම භාර දෙනවා. [බාධා කිරීමක්] හොඳමයි, ගරු ඇමතිතුමා.

கௌரவ அமைச்சர் அவர்களுக்கும் இராஜாங்க அமைச்சர் அவர்களுக்கும் அமைச்சின் செயலாளர் உட்பட அமைச்சின் அனைத்து அதிகாரிகளுக்கும் நான் இந்த இடத்திலே -

මගේ හෘදයංගම ස්තුතිය පුද කරනවා, ඔබතුමන්ලා මේ සඳහා මැදිහත් වෙලා කටයුතු කිරීම ගැන. විශේෂයෙන් රුගම් වැව සහ කිතුල්වැව ඒකාබද්ධ කිරීමෙන් ඒ පළාතේ ගොවිතැන් කරන ජනතාවට ලොකු වාසනාවක්, ආඩම්බරයක් වේවිය කියා මම බලාපොරොත්තු වෙනවා. සියලුම ඇමතිවරුන්ට - නියෝජ්‍ය ඇමතිතුමා, රාජ්‍ය ඇමතිතුමා- ඔබතුමාගේ ලේකම්තුමා, DG ඇතුළු සියලු දෙනාටම මම මේ අවස්ථාවේදී ස්තුතිය පුද කරනවා.

ගරු ඇමතිතුමනි, ගිය අවුරුද්දේ අය වැය කථාවේදී හැඩිඔය ප්‍රශ්නය ගැන අපි ඉල්ලීමක් කළා. ඔබතුමා ඒ ගැන විසඳුමක් අරගෙන ඇති කියා මම බලාපොරොත්තු වෙනවා. ඒ සඳහාත් මගේ හෘදයංගම ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි. [බාධා කිරීමක්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔව්. ගරු ඇමතිතුමා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
හැඩිඔය සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාව දැන් අත්සන් කළා.

**ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා**
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
ඒ ගැන හුඟක් ස්තුතිවන්ත වෙනවා, ගරු ඇමතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඊළඟට, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

[පූ.භා. 11.24]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු සභාපතිතුමනි, යහපාලන රජයේ නීල හරිත අය වැය යටතේ කාරක සභා අවස්ථාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම සතුටක්. මොකද, රට වටා ඇති නිල් පැහැති මුහුදත් ඉන් වට වෙච්ච හරිත පැහැ ගත් ගොඩබිමේත් සම්පත් නිසි ලෙස

කළමනාකරණය කර ගනිමින් තිරසර සංවර්ධනයක් කරා මේ රට ගෙනියන්නේ කෙසේද කියන තේමාව යටතේ කථා කරන්නට ලැබීම සතුටක්.

මේ රටේ ආර්ථිකය ඉහළ නංවන්නට උර දෙන ප්‍රධාන අමාත්‍යාංශ කිහිපයක් අද සාකච්ඡා කරන්නට යෙදී තිබීම ගැන සතුටු වෙනවා. විශේෂයෙන් මහවැලි සංවර්ධන හා පරිසර, කෘෂිකර්ම, වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ, ප්‍රාථමික කර්මාන්ත යන මේ අමාත්‍යාංශ ගැන සාකච්ඡා කිරීම එක දිනකට යෙදී තිබීම සතුටක්. නමුත් අපේ ප්‍රදේශවලට සෘජුවම බලපාන අමාත්‍යාංශ හතරක් එක තැන යෙදිලා කාලය හරස් වේය කියා ගැටලුවක් තිබෙනවා.

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා පැමිණීම ගැන මම සතුටු වෙනවා. මට ප්‍රශ්නයේ වැඩි කොටසක් තිබෙන්නේ එතුමාත් එක්කයි. මහවැලි ව්‍යාපාරය තුළ මේ රටේ විශාල සංවර්ධනයක් ඇති වුණා; යුග පෙරළියක් සිද්ධ වුණා. ඒ තුළ සැබෑ දැවැන්ත සංවර්ධනයක් රට තුළ සිද්ධ වුණා. අපි ඒක පිළිගන්නවා. ගොවි ජනපද බිහි වුණා. නව ජීවන රටාවන් ඇති වුණා. ඇළ වේලි සංවර්ධනය වුණා. නව ගොඩනැඟිලි ඇති වුණා. ජල විදුලි බලය ලබා දුන්නා. වැදගත්ම කාරණාව තමයි වගා කරන්නට භූමිය තිබෙන නමුත් ජලය නොමැති ප්‍රදේශවලට ජලය ලබා දෙන්නට, ජලය ලබා ගන්නට හැකියාවක් ලැබුණා. නමුත් ගැටලුව තිබෙන්නේ එතැන නොවෙයි. එම ජලාශ ඉදි කිරීමට භූමිය ලබා දුන් ජනතාව කෙරෙහි ඒ ඒ රජයන් ක්‍රියා කළ ආකාරය පිළිබඳවයි අපට ගැටලුව තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, මීට පෙර කථා කළ මන්ත්‍රීවරුන් කියනවා ඇහුණා, credit එක කාටද කියා. Credit එක කාට ගියත් අපට කමක් නැහැ. ප්‍රශ්න ටික ඉතිරි වුණ එක විතරයි අපට ගැටලුව තිබෙන්නේ. මොන ආණ්ඩුවෙන් පටන් ගත්තත් අපට කමක් නැහැ, රටට යහපතක් වනවා නම්. නමුත් ප්‍රශ්න ටික විතරක් අපට ඉතිරි වුණු එක පිළිබඳව තමයි අපට ගැටලුව තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, පසුගිය එක්සත් ජාතික පක්ෂය රජය කාලයේදී මේ මහවැලි ව්‍යාපාරය ඇති කළේ කොහොමද කියන එක පසු ගිය රජය අධ්‍යයනය කළා නම් අද ලග්ගල ජනතාව මෙවැනි ගැටලුවකට මුහුණ දෙන්නේ නැහැ කියන එක මම මතක් කරන්නට ඕනෑ. විශේෂයෙන් උදාහරණ හැටියට, මම මොරගහකන්ද සහ කළුගඟ ව්‍යාපෘති ගැන කථා කරනවා. ඒ ව්‍යාපෘතියෙන් රටට විශාල සෙතක් සිද්ධ වෙනවා කියා අපි විශ්වාස කරනවා. පොළොන්නරුව ඇතුළු රජ රටට උතුරට ජලය ගෙන යනවා. අවංකවම මම ඒ ගැන සතුටු වෙනවා; අපේ ලග්ගල ජනතාව සතුටු වෙනවා. නමුත් ඒ ගැටලුව විසඳන්න වතුර ලබා දෙන්න භූමිය පූජා කළ, ජීවිතය නැති කර ගත් ජනතාවගේ ගැටලු තවමත් විසඳී නැති වීම ගැන අප කනගාටු වෙනවා.

ගරු සභාපතිතුමනි, මම අකෘතඥ වෙනවා, මේ ගැන සඳහන් කළේ නැත්නම්. විශාල ගැටලු සංඛ්‍යාවක් තිබුණා. නමුත් පසු ගිය දෙවසර තුළ විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා, මුදල් අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශයේ හිටපු ලේකම්තුමා, හිටපු අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු මහවැලි අධිකාරියේ සියලුම නිලධාරින්ගේ සහයෝගය ඇතිව ප්‍රශ්න ගැටලු ගණනාවක් අපට විසඳාගන්න හැකියාව ලැබුණා. ඒ ගැන මම ස්තුතිවන්ත වෙනවා. ලග්ගල පල්ලේගම සහ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යටිතල පහසුකම් සියයට 75, 80, 90 ඉක්මවා ලැබී තිබෙන බව මා පිළිගන්නවා. විශේෂයෙන් පානීය ජල ගැටලුව විසඳීමට කටයුතු කර තිබෙනවා.

ලග්ගල, විල්ගමුව කියන්නේ වකුගඩු රෝගය බහුලව තිබෙන ප්‍රදේශ. කළු ගඟ යෝජනා ක්‍රමය මඟින් ඒ සියලු වසම් ආවරණය වන විධියේ පානීය ජල යෝජනා ක්‍රමයක් ලැබී තිබෙනවා. හීං ගඟ ජල මූලාශ්‍රය යටතේත් ලැබී තිබෙනවා. නමුත් නොවිසඳුණු ගැටලු ගණනාවක් තිබෙනවා. මා දිගින් දිගටම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට මේ සම්බන්ධයෙන් දැනුම් දෙනවා. ඒවාට විසඳුම් නැති නිසා, රජය නියෝජනය කරන මන්ත්‍රීවරියක වුණත් මම ඒ ගැන කතා කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, අලුත් සංස්කෘතියක් අද අපේ රටේ හැදිලා තිබෙනවා. එදා වාගේ නොවෙයි, අද රජය විවේචනය කරන්නත් අපට පුළුවන්. අගමැතිතුමාත් කොමිසමක් හමුවට ගිහින් අලුත් සංස්කෘතියක් පෙන්වා තිබෙනවා. ඒ නිසා අපේ ළඟ තිබෙන අඩු පාඩු ගැන කතා කරලා අපි ඒවා නිවැරැදි කර ගනිමු කියා මම මේ වෙලාවේ යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, පළමුවන කාරණාව වන්නේ, වන්දි සමාලෝචනය තවම ප්‍රමාද වීමයි. ඉඩම් අහිමි වූවන්ට තවම ඉඩම් ලබා දීලා නැහැ. අවුරුදු හතක් වෙනවා, ඒ අයගේ ඉඩම් අහිමි වෙලා. ඒ අයට වගා කරගන්න ඉඩම් නැහැ; ජීවත් වෙන්න විධියක් නැහැ. අක්කර එකහමාරට අඩුවෙන් ඉඩම් හිමිව තිබූ අයට ඉඩමක හිමිකාරිත්වය නැහැ කියනවා. ඒ අයගේ ඉඩම් පවරාගන්න කොට කිවේ ඔබතුමන්ලාගෙන් ඉඩම් අඟලක් ගත්තත් අපි අක්කර දෙකක් දෙනවා කියලායි. දැන් කියනවා, අක්කර එකහමාරට වඩා නැත්නම් දෙන්න විධියක් නැහැ කියලා. "අර්ධ වශයෙන් ඉඩම් යට වූ අයට වන්දිය විතරයි. අක්කර එකහමාරට වඩා අඩු නම් ඉඩම් නැහැ" කියනවා. මා අහනවා, ගෙදර විතරක් ඉතිරි වන ඒ මිනිසුන් වහලේ උළු කන්නද? කියලා. ඒ මිනිසුන්ගේ කුඹුරු යට වෙලා.

**ගරු අනුරාධ ජයරත්න මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுராத ஜயரத்ன - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne- Deputy Minister of Mahaweli Development and Environment)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
එතුමියට පොඩි වෙලාවක් තිබෙන්නේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
මගේ වෙලාව නම් මට ඕනෑ, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමිය අවස්ථාව දෙන්න කැමැති නැත්නම්, කතා කරගෙන යන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාගේ වෙලාවේදී උත්තර දෙන්න. මොකද, මට තිබෙන මේ ප්‍රශ්න ටික කියන්න ඕනෑ.

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ගරු මන්ත්‍රීතුමියනි, මා මෙය කිව්වාම ඔබතුමියගේ ප්‍රශ්න ගොඩක් විසඳෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
කියන්න, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ඒ වගා කරපු භූමි ප්‍රමාණවලට අදාළව ඉඩම් ලබා දීමේ තීරණය අපි ගත්තා, ගරු මන්ත්‍රීතුමියනි. අපට තිබෙන එකම කාරණාව, බිසෝපුර ඇතුළු ප්‍රදේශවල ඉඩම් හඳුනා ගැනීමයි. ඒ හඳුනා ගත් ඉඩම්වල දැන් නැවත පදිංචි කිරීමේ කටයුතු කරගෙන යනවා. අනෙකුත් අය පදිංචි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගෙන ඒවා ලබා දීම තුළ මේ අර්බුදය විසඳෙනවා. අනෙක් එක, අප මේ කතා කරන "මොරගහකන්ද හා කළු ගඟ ව්‍යාපෘතිය" නිසා බලපෑමට ලක්වූ පවුල් සංඛ්‍යාව විශාලයි. විසඳුම් ලබා දීපු ප්‍රමාණය ගැන ඔබතුමිය දන්නවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
මා ඒකයි කිව්වේ, විසඳපු ඒවා සම්බන්ධයෙන් මා ස්තුතිය පුද කරනවා කියලා. ඒ විතරක් නොවෙයි. ඉඩම් ලබා ගන්නා ආකාරය ගැනත් කතා කරන්න මා අද බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මට නියමිත කාලය මට ඕනෑ.

විශේෂයෙන් රජාවෙල, මොරගොල්ල, ගුරුවෙල, මාඔය ආදි ප්‍රදේශවල ඉඩම් අත්පත් කර ගත්තා. ඒ ගොල්ලන්ගේ ගොඩ ඉඩම යට වුණේ නැහැ, මඩ ඉඩම විතරයි යට වුණේ කියලා වන්දිය දෙන්නේ නැහැ. එතකොට අද ගොවියාට මොකද වෙන්නේ කියන එක අපට කල්පනා කරන්න වෙනවා. රජාවෙල ප්‍රදේශය ගත්තොත්, ඒ ප්‍රදේශයේ ඉඩම් හිමියෝ පස්දෙනයි ඉන්නේ. අනෙක් සියලු දෙනා අද ගොවියෝ. අද ගොවියාට ඉඩමක අයිතියක් නැහැ. අර ඉඩම් හිමියන් පස්දෙනා අලුත් ඉඩම් අරගෙන ගියාම, අද ගොවියෝ ටික ජීවත් වෙන්නේ කොහොමද කියලා අපි හිතන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, මොරගොල්ල කියන ගම්මානයේ මිනිස්සු අනෙක් කුඹුරුවල කම්කරුවන් විදියට ගිහිල්ලා වැඩ කරලා ජීවත් වෙච්ච මිනිස්සු. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒ මිනිසුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවන්නට ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක මම මේ වෙලාවේ ඔබතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ලග්ගල, පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුල් පදිංචිකරුවන්ගේ ඉඩම් මහවැලියට අත්පත් කර ගෙන තිබෙනවා. තවමත් ඒ අයට හිමි වන්දි හෝ ඉඩම් ලබා දීලා නැහැ. ඕනෑ නම් මම උදාහරණ කිහිපයක් කියන්නම්. මාඔය, දේවාලදෙණිය, කපුයාය කියන්නේ එයින් ප්‍රදේශ කීපයක් පමණයි. මේ අයගේ ඉඩම් අරගෙන තමයි මහවැලියෙන් අවතැන් වුණු අයට ඉඩම් ලබා දුන්නේ. නමුත් මෙතැන ගැටලුව තිබෙන්නේ, මේ ප්‍රශ්නය ඇති කරපු දේශපාලනඥයන් අද ඒ මිනිසුන්ගේ ප්‍රශ්න වෙනුවෙන් කථා කරන්න පුළුවන් වෙලාවේ නැති එකයි. ලග්ගලින් පිටත මේ මිනිසුන් යවන්න එපා කිව්වා. ඒ මිනිස්සු ලග්ගල ප්‍රදේශය ඇතුළේම පදිංචි කරවන්න ඕනෑය කිව්වා, ඒ මිනිසුන්ගේ ඡන්දය බලාගෙන. නැත්නම්, ඒ මිනිසුන්ට පොළොන්නරුවෙන් ඉඩම් ලැස්ති කරලායි තිබුණේ. ලග්ගල මිනිස්සු අද ඒ කිසි දෙයක් නැතිව අසරණ වූ වෙලාවේ ඒ අය ගැන කථා කරන්න කවුරුත් නැහැයි කියන එක මම මේ වෙලාවේ කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, අවුරුදු අටක් තිස්සේ මේ මිනිස්සු ජීවත් වෙන්නේ කොහොමද කියලා මා ඔබතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් කළ කාලය අවසන් වෙලා තිබුණත්, තව විනාඩි දෙකක් ලබා දෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
මගේ වෙලාව ගත්තා නේ. ඒ වෙලාව මට ඕනෑ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඒක දුන්නාට පසුවත් තවත්-

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
අනේ! තව විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු සභාපතිතුමනි.

ඉඩම් අක්කර එකහමාරට අඩුයි කියන අයට ඉඩම් දෙනවාය කියන සහතිකය ඇමතිතුමා අපට දෙනවා නම්, අපි ඒ ගැන සතුටුයි; මම තවත් ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ.

ඒත් එක්කම, වැමැඩිල්ල හරහා වයඹ ඇළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න යනවා. එතකොට දඹුල්ලටත් ඔය ප්‍රශ්නය ඇති වෙයි. ඒ නිසා එවැනි තත්ත්වයක් ඇති නොවෙන්නට වගබලා ගන්න. ඒත් එක්කම, ගොඩනැඟිලිවල ප්‍රමිතිය සම්බන්ධයෙන් ගැටලුවකුත් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මගේ ඉල්ලීම මෙයයි. ලග්ගල ජලාශ හතරක් තිබෙනවා වැමැඩිල්ල, බෝවතැන්න, කළුගඟ, මොරගහකන්ද කියලා. මෙන්න මේ ජලාශ හතරෙන් ලංකාව පුරාම වතුර ගෙනියනවා. අපේ ප්‍රදේශවල සියයට 85ක් ඉක්මවලා ඉන්නේ ගොවි ජනතාව. එම නිසා මේ ජනතාවට ජලය ලබා දෙන්න කටයුතු කරන්න. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරින් හා එක්ව අපි වාර්තාවක් හදලා තිබෙනවා ඉඩම් ලබා ගන්නේ කොහොමද කියලා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මම මේ වාර්තාව ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්.

මේ වාර්තාවේ හැටියට අපට වැව් ටික හදලා දුන්නොත්, අද අක්කර 180ක් විතරක් වගා කරන භූමිය, අක්කර 2200ක් දක්වා වගා කරන්න පුළුවන් තත්ත්වයකට හැදෙනවා. ඒ නිසා මේ අය වැය ප්‍රතිපාදනවලින් මේ වාර්තාව අනුව අවශ්‍ය කටයුතු කර දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

මම යෝජනා කරනවා, කළුගඟ ව්‍යාපෘතියෙන් හිඹිලියාකඩ වැවට ජල මාර්ගයක් හදලා දෙන්න කියලා. එහෙම වුණොත් විල්ගමුව ප්‍රදේශයේ මිණිපේ ඇළෙන් ඉහළ කොටසේ තිබෙන සියලු වාරි ජල ගැටලු විසඳෙනවා.

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ නව ප්‍රවණතා ඇති කර තිබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම තරුණ ව්‍යවසායකයන්ට, ගොවීන්ට සහන සැලසීම, අඩු පොලී ණය ලබා දීම මම අගය කරනවා. මොකද, අද තරුණ ප්‍රජාව සියයට 89ක් කෘෂිකර්මාන්තයෙන් ඈත්වෙලා තිබෙන නිසා.

ඒ එක්කම මම ඉල්ලීමක් කරනවා, ගොවි විශ්‍රාම වැටුප යාවත්කාලීන කරවන්න කියලා. එහි නිර්මාතෘවරයා මගේ පියා. ඒක එතුමා අහිංසක ගොවි ජනතාව වෙනුවෙන් නිර්මාණය කළ

දෙයක්. නමුත් පසු ගිය ආණ්ඩුව කාලයේ එය අකර්මණ්‍යවෙලා ගිහිල්ලා තිබෙනවා. අද එය නැත්තටම නැතිවෙලා යන තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. ඒ නිසා නැවතත් එය ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

තරුණ ජවය මේ රට නඟන වැඩ පිළිවෙළකට ගෙන එන ජාතික ව්‍යාපාරයක අවශ්‍යතාව තිබෙනවා. විශේෂයෙන්ම අපනයනකරුවන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. නමුත්, ඒ අයට වගා කරන්න භූමිය නැතිවයි දඟලන්නේ. නමුත් ලංකාව ඇතුළේ, විශේෂයෙන් අපේ වතු යායවල වගා නොකළ භූමි ඕනෑ තරම් තිබෙනවා. ඒ අයට ඒවා ලබා දෙන්න කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මීළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මේ වෙලාවේ කථා කරන්න මමද ඉන්නේ?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔව්, ඔබතුමා තමයි.

[පූ.භා. 11.35]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි, අද අපේ රටේ කෘෂි ක්ෂේත්‍රයේ විශාල පසුබෑමක් තිබෙන බව. මේක අපේ අය වැය විවාදවලදීත් පිළිගෙන තිබෙනවා. පසු ගිය කාලය තුළ වී ගොවිතැනේ හිඟතාවක් තිබුණා. ඒ නිසා සහල් පිට රටින් ගෙන්වන තත්ත්වයකට රට පත් වෙලා තිබෙනවා.

තේ, රබර් ඇතුළු වැවිලි භෝග සියල්ලේම නිෂ්පාදනයත් බිඳ වැටිලා. අපේ රටට විදේශ විනිමය ලැබෙන නිෂ්පාදන අපනයනය පහළ ගොස් තිබෙනවා. ඒ වාගේම වී ගොවිතැන ගැන කථා කරනකොට විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, අපේ රට සහලින් ස්වයංපෝෂිත රටක් බව. ඒ සඳහා අවශ්‍ය සියලුම සම්භාව්‍යතා රට තුළ තිබෙනවා. ඉතිහාසය දෙස බලන විට කෘෂි ක්ෂේත්‍රය තුළ අපි ඉතාම ආදර්ශවත් විධියට කටයුතු කර තිබෙන බව පෙනෙනවා. අපේ රටේ ජනතාව කුස ගින්නේ තියන්නේ නැතුව වී ගොවිතැන ශක්තිමත්ව කරගෙන ගියා.

වාරි කර්මාන්තයේ සම්බන්ධතා ඇතුව, පර්යේෂණාත්මකව කෘෂි ක්ෂේත්‍රය ඉස්සරහට අරගෙන ගියා. කෘෂිකර්මාන්තයේ දී අපි වී ගොවිතැන ශක්තිමත්ව ඉදිරියට ගෙන යන්න නම්, අපේ රටේ පස, කාලගුණික තත්ත්වය, ජලය සහ ජෛව විවිධත්වය යන ඔක්කෝම එකට බැඳී තිබෙන්න ඕනෑ. පැරණි කෘෂිකර්මාන්තයේදී අපි අද කල්පනා කරන විධියට මහා පරිමාණ වාණිජ කර්මාන්තයක් විධියට නොවෙයි, තමන්ගේ ගෘහස්ත ශ්‍රම ඵලදාව ලබා ගෙන, කුඩා බිම් කොටස්වල කෘෂි කර්මාන්තය ශක්තිමත්ව ඉස්සරහට ගෙන ගියා. සියල්ලම විවෘත කරපු සමාජයක් ඇතුළේ අපි අපේ කෘෂිකර්මාන්තය අනවශ්‍ය විධියට ලිහිල්කරණය කරන්න ගියොත්, ඇත්ත වශයෙන්ම ඒකෙන් ලොකු වාසියක් ලැබෙන්නේ මහා පරිමාණ ව්‍යවසායකයන්ට. නමුත් ඒ මහා පරිමාණ ව්‍යවසායකත්වයන් තුළින් අපි යොදවන යන්ත්‍ර සූත්‍ර ආදී සියල්ල දෙස බලන විට, ඒ සියල්ල නිවස -කුටුම්බය- තුළ තිබෙනවා.

මොකද, තමන්ට තිබෙන කුඩා ඉඩමේ වගා කරන්න අපේ පැරණි අය තමන්ගේ පවුල් ඒකකය තුළ තිබෙන ශ්‍රම ඵලදායිත්වය යොදා ගනිමින්, ඊට අවශ්‍ය සාමූහික සමාජමය යටිතල පහසුකම් සම්බන්ධ කර ගෙන කෘෂි කර්මාන්තය ඉදිරියට ගෙන ගියා. කෘත්‍රිම පොහොර භාවිත කරන්නේ නැතිව අපේ කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය ස්වාභාවික පස ශක්තිමත් කර ගෙන; ඒ වාගේම ජල පෝෂිත ස්වභාවයන් වර්ධනය කර ගෙන; ඒවා රඳවා ගෙන තමන්ට ආසන්න වූ කුඩා වැව් පද්ධතියෙන් ජලය ලබා ගෙන කෘෂි කර්මාන්තය ඉදිරියට ගෙන යෑම සම්බන්ධයෙන් ඔවුන්ට හොඳ දැනුමක් තිබුණා. දැන් ක්‍රමක්‍රමයෙන් ඒ දේවල් අහෝසි වී තිබෙනවා.

අද අපේ කුඩා වැව් පද්ධතිය හිඳිලා තිබෙනවා. ඒවා ගැන අපි නොසලකා හැර තිබෙනවා. මා හිතන විධියට අපට දැන් කරන්න තිබෙන හොඳම දේ තමයි, අපේ කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය ලෝකය පුරාම විවෘත කිරීම වෙනුවට කෘෂි ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේදී රට තුළ තිබෙන ජලය, පස ආදී ස්වාභාවික සම්පත් ද, කාලගුණික සාධක හා ජෛව සාධක කියන මේ සියල්ල ගැන සලකා පර්යේෂණාත්මක ප්‍රවේශයකට යන එක. අද බොහෝ විට පර්යේෂණාත්මක ප්‍රවේශයකින් කරන්නේ ක්ෂණිකව වැඩියෙන් ඵලදායිත්වය ලබා ගන්නා ක්‍රම සොයා යෑමයි. ඒකට තමයි අපි උත්සාහ කරන්නේ. අපි ඒක තරගකාරී විධියට පරිවර්තනය කරගෙන තිබෙනවා. හැබැයි, ඒවා තාවකාලිකයි. එම නිසා ජනතාවගේ සිතුම් පැතුම් තේරුම් ගෙන, පරිසරයේ තිබෙන විවිධත්වය හඳුනා ගෙන, පරිසරයේ තිබෙන ජෛව සාධක තේරුම් ගෙන කෘෂි කර්මාන්තය ඉදිරියට ගෙන යන්න අවශ්‍ය මූලෝපායික වැඩසටහනක් හැදීම සම්බන්ධයෙන් කල් පවත්නා තිරසාර කෘෂි සංවර්ධනයකදී අපට විශාල වග කීමක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අද හදන වැඩ සැලසුම්වල තිබෙන්නේ එක්කෝ ඇමතිතුමාගේ අදහස, එහෙම නැත්නම් පොළොවේ පය ගහලා නැති ඇතැම් පර්යේෂකයන්ගේ අදහස්. මේවා ක්‍රියාවට නංවන්න ගියොත් අපට තිරසාර කෘෂි කර්මාන්තයක් ලැබෙන්නේ නැහැ. එම නිසා අද කෘෂි කර්මාන්තයට අදාළව වඩා ඵලදායී කළ යුතු, ඒ වාගේම වියදම් අඩු ප්‍රවේශයකින් කරන්න තිබෙන වැඩ කටයුතුවලට වැඩි වැය බරක් යෙදවීම නිසා අප බලාපොරොත්තු වන ඉලක්කවලට යන්න අපට බැරි වෙලා තිබෙනවා.

මේ අවස්ථාවේදී මා තවත් කරුණක් මතක් කරන්නට කැමැතියි. ආණ්ඩුවෙන් ආණ්ඩුවට මේ ප්‍රතිපත්ති මාරු වෙන්න බැහැ. රට තුළ කෘෂි කර්මාන්තය සංවර්ධනය කිරීමේදී අපි සියලුම කරුණු මත තිරසාර කෘෂි සංවර්ධනයක් ඉදිරියට ගෙන යන්න අවශ්‍යයි. ඇත්ත වශයෙන්ම මෙහිදී විද්වත් දැනුම සහ මහජන විඥානය, ඔවුන්ගේ අත් දැකීම් එකිනෙකට ගළපා ගෙන දිගු කාලීන ප්‍රතිපත්තියක් සහ කෙටි කාලීන ප්‍රතිපත්තියක් කරා යන තිරසාර වැඩ පිළිවෙළකට රට ගෙන යන්න ඕනෑ. කෘෂි සමාජය කෙරෙහි විශ්වාසයක් ඇති නොවුණොත්, ඉදිරි කාලයේ දී කෘෂි කර්මාන්තයට තරුණ පරම්පරාව එන්නේ නැහැ. දැනටමත් ඒක සිදු වී තිබෙනවා. මොකද, රටේ අද අපට දකින්න තිබෙන ප්‍රධානම දෙයක් තමයි, මේ තරුණ පරම්පරාව කෘෂි කර්මාන්තයට එන ප්‍රමාණය අඩු වීම. මොකද, අද කෘෂි කර්මාන්තයට නිසි වටිනාකමක් නැහැ; ඒ පිළිබඳ විශ්වාසයක් නැහැ. කල් පවත්නා කෘෂි සංවර්ධනයක් රට තුළ ඇති වනවා කියන විශ්වාසයත්, ඒ නිෂ්පාදකයින්ට නිසි වෙළෙඳ පොළක් ලබා දීමත්, ඒ වාගේම

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

ඔවුන්ට ඒ සඳහා වූ තාක්ෂණික අවබෝධය නැතිකම නිසාත් ඔවුන් අද මේ ක්ෂේත්‍රය අත් හරිනවාද? ඔව්, අත් හරිනවා.

ගරු සභාපතිතුමනි, ඒක නිසා මම මේ කාරණය මතක් කරන්න කැමැතියි. අපි කෘෂි කාර්මික රටක්. අපි වාගේ රටක ප්‍රධාන ඉලක්කය වෙන්න ඕනෑ, සාගතයෙන් තොර වෙන්න වැඩි අස්වනු සහිත කෘෂි නිෂ්පාදන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන එකයි. ආහාර සුරක්ෂිතභාවය බිඳ වැටෙන, වෙනත් තරගකාරී විධියට මුලා ප්‍රතිලාභ වෙනුවෙන් තරග කරන, රටේ කල් පවත්නා ආර්ථික ක්‍රියාවලියකින් මිදුණු කෘෂි වැඩසටහනක් ක්‍රියාවට නැඟුවොත්, ඇත්ත වශයෙන්ම ඒක දිගු කාලීනව අරගෙන බැලුවොත් අපේ රට විතරක් නොවෙයි, ලෝකයම ආහාර සුරක්ෂිතතාවෙන් තොර සමාජයක් බවට පත් වෙන්නට හේතුවක් වෙනවා. අපි එම තත්ත්වය වළක්වා ගත යුතුයි.

අපේ වාගේ රටක තිබෙන සියලු ස්වාභාවික සම්පත් දිහා බැලුවාම, අපි කවුරුවත් කුස ගින්නේ මැරෙන්නේ නැහැ. ඕනෑම භෝගයක් වවන්න පුළුවන් පසක් හා ස්වාභාවික ජල සම්පතක් අපට තිබෙනවා. මේවා හරියට කළමනාකරණය කරගෙන කටයුතු කරන්න අවශ්‍යයි. පස නිසරු වෙන්න ඉඩ නොදී, පස දිරන අනවශ්‍ය පොහොර වර්ග භාවිත නොකර, කෘෂි රසායන භාවිත නොකර ස්වභාවිකත්වය තුළ රඳවා ගතහැකි තත්ත්වයක් අපි නිර්මාණය කර ගත්තොත්, ක්ෂණික ලබන ලාභයට වඩා දිගුකාලීනව ඒ සමාජ පැවැත්ම තිබෙනවා. ඒක නිසා මම මේ වෙලාවේ මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. ජාතික වශයෙන් මේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමේදී කෘෂි කාර්මික ක්ෂේත්‍රයට විශාල වග කීමක් තිබෙනවා.

ප්‍රධාන ඉලක්කයක් හැටියට කෘෂි කර්මාන්තය දියුණු කර ගන්න අරමුණු කර ගනිමින්, එය තිරසාරව අනාගතයේ ජාතික ආර්ථිකය පෝෂණය කරන වැඩ පිළිවෙළකට වාගේම ජන ජීවිත සුරක්ෂිත කරන වැඩ පිළිවෙළකට පරිවර්තනය කරන්න විද්වත් සැලැස්මක් හදන්න කියලා ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින්, මට ලැබුණු මේ කෙටි වෙලාව පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
හොඳයි. මීළඟට, ගරු අනුර සිඩ්නි ජයරත්න මැතිතුමා. ඔබතුමාගේ කාලයට පොඩි වෙලාවක් එකතු කරලා තිබෙනවා.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
මට විනාඩි අටක් පමණ තිබෙනවා, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔව්. කථාව පටන් ගන්න.

[පූ.භා. 11.47]

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු සභාපතිතුමනි, අද වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ, කෘෂිකර්ම, ප්‍රාථමික කර්මාන්ත, මහවැලි සංවර්ධන හා පරිසර යන අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා වෙන කාරක සභා අවස්ථාවේ වුණත්, මට මේ කාරණය පිළිබඳව යමක් කියන්න අවශ්‍යයි. අපේ රටේ මහත් බලාපොරොත්තු තියාගෙන හිටපු කාරණයක් සම්බන්ධයෙන්, අපේ බලාපොරොත්තු බිඳ වැටීමක් ගැන මේ පාර්ලිමේන්තුව පටන් ගැනීමේදී අපට අසන්නට ලැබුණා. මම එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයෙක් හැටියටත්, එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙක් හැටියටත් මම ඉතාම දැඩි අප්‍රසාදය පළ කරනවා, මේ පළාත් පාලන මැතිවරණය කල් යැම ගැන. මම විශ්වාස කරනවා, මේ පළාත් පාලන මැතිවරණය කල් යැම පක්ෂයක් හැටියට අපේ පක්ෂයට ඉතාම අවාසිදායකයි කියලා. කුමන හේතුවක් නිසා, කුමන පුද්ගලයෙකුගේ වුවමනාවට මේ මැතිවරණය කල් දානවාද කියලා කියන්න අපි දන්නේ නැහැ.

අපි මේ වෙන කොට මේ මැතිවරණයට සූදානම් වෙලායි සිටින්නේ. ඒක නිසා මගේ දැඩි අප්‍රසාදය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. මම ආසන සංවිධායකවරයෙක්. අපි මේ මැතිවරණ ව්‍යාපාරය පටන් ගෙන තිබෙනවා. අද බොහොම කනගාටුදායක විධියට මේ දේශපාලනයේ නොවුණු දෙයක් ගැන අපට අහන්න සිදු වුණා, ඇයි මේ මැතිවරණ කල් දැම්මේ කියලා. කවුරු කළත්, මොන පක්ෂයෙන් කළත් ඒක වැරැදියි. මම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. අපි හවුලේ ආණ්ඩුවක් කරනවා. අපි දෙගොල්ලන් එකතු වෙලා ආණ්ඩුවක් කරන බව ඇත්ත. අපි ගම් මට්ටමේ, බිම් මට්ටමේ ඉන්න මන්ත්‍රීවරයෙක් විධියට මම මේ ක්‍රියාවලියට විරුද්ධයි. කවුරු කළත් මේ මැතිවරණය කල් දැම්ම ගැන දැඩි අප්‍රසාදය පළ කරන අතර එය දැඩි පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා. මොකද, මේ මැතිවරණය අත්‍යවශ්‍යයි. මම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් හැටියට 1990 දී පටන් ගත් දේශපාලන ගමන තමයි අද මේ දක්වා ඇවිල්ලා තිබෙන්නේ. අවුරුදු 27ක මගේ දේශපාලන ජීවිතයේදී මම දෙවතාවක් පාර්ලිමේන්තුවට ආවා, හතර වතාවක් පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට කටයුතු කළා. ඒ විධියට තමයි මම මෙතැනට ආවේ. ඒ නිසා මම පළාත් පාලන ආයතන ගැන දන්නවා, පළාත් පාලන ව්‍යුහය ගැන දන්නවා. මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවට ඡන්දයෙන් පත්වුණු මුල්ම මන්ත්‍රීවරයා මම. ඒ නිසා මේක ගමට අත්‍යවශ්‍ය දෙයක්. ගමෙන් හැදෙන දේශපාලන නායකයෝ ප්‍රාදේශීය සභාවෙන් ආවා. ප්‍රාදේශීය දේශපාලනයෙන් පරිණතභාවයක්, අත් දැකීම් රැසක් ලැබුණු අය පාර්ලිමේන්තුවට ආවා. දැන් අවුරුදු දෙකක්, තුනක් තිස්සේ ඒ තත්ත්වය අහිමි වෙලා තිබෙනවා. එම නිසා මේ කටයුත්තට මගේ දැඩි කනගාටුව හා අප්‍රසාදය පළ කරනවා.

විශේෂයෙන්ම අද අපි කෘෂිකර්ම අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය පිළිබඳව කථා කරන නිසා, විශේෂයෙන් කිව යුතු දෙයක් තිබෙනවා. විශේෂයෙන්ම මම වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා අවස්ථා ගණනාවක් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු කැඳවලා, එතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරින් කැඳවලා ඒ අමාත්‍යාංශයට අදාළව අපේ ප්‍රදේශයේ තිබෙන අවශ්‍යතාවන් ගැන කරුණු ඉදිරිපත් කරන්න ඉතාම සුබවාදී විධියට අපට අවස්ථාව දුන්නා.

එතුමා ඊයේ ඒ වාගේ අවස්ථාවක් අපට ලබා දුන්නා. මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මීට පෙරත් ඒ වගේ අවස්ථාවක් ලබා දුන්නා. මම එතැනදී කථා කරපු එක කාරණයක් තමයි, ගොවිතැන් කරන ප්‍රදේශයක් හැටියට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, විශේෂයෙන්ම මම නියෝජනය කරන මැදිරිගිරිය ප්‍රදේශයේ වී වගාව අවුරුදු 2ක් තිස්සේ අසාර්ථක වීම ගැන. ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී කිව්වා, පිට රටින්

හාල් ගෙන්වනවා, පිට රටින් හාල් ගෙන්වන්න සිද්ධ වුණේ ඇත්තට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී වගාව අහිමි වීම නිසා - ගොවිතැන් කටයුතු අහිමි වීම නිසා- කියලා. පොළොන්නරුව දිස්ත්‍රික්කය මේ රටේ විශාල වශයෙන් වී නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කයක්. හැබැයි, මේ වෙනකොට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කවුඩුල්ල ව්‍යාපාරයට මාස් කන්නයේ ගොවිතැන් කටයුතු ආරම්භ කරන්න නොහැකි තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. ඒ නිසා ඒ ගැන දැඩි අවධානයක් යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. මොකද, නොවැම්බර් මාසයේ -මේ වෙනකොට- අපේ වගාවන් පටන් අරගෙන තිබුණේ නැත්නම්, දෙසැම්බර් මාසයේ වැස්ස එනකොට අපේ වගාවන් හානි වෙන්න පටන් ගන්නවා. වපුරලා පැළවෙන ගොයම හානි වෙනවා. නමුත්, තවම ඒ සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර නැහැ. ඒ සඳහා මම අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කරවනවා. එතුමා සමඟ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයාත් ඊට සම්බන්ධ විය යුතුයි. මොකද, අද මොරගහකන්ද ජලාශයේ ජලය බෙදීම නතරවෙලා තිබෙනවා. මොරගහකන්දෙන් මුදාහරින ජලය තමයි අපේ වැව්වලට එන්නේ. ඒ නිසා එම ජලය අපට ලබා දෙන්න කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්න කියා මා ඉල්ලා සිටිනවා.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මිනිස්සුන්ට කොස් නැහැ, දෙල් නැහැ, පොල් නැහැ, තේ නැහැ. කුඹුරු වගා කළොත් තමයි ඒ මිනිස්සුන්ට ජීවන රටාව ගෙනියන්න පුළුවන් වෙන්නේ. කර්මාන්තශාලා නැහැ, වෙනත් ආදායම් මාර්ග නැහැ. හැමදාම ඒ මිනිස්සුන්ට සහනාධාර මත යැපෙන්න බැහැ. ඒ මිනිස්සුන්ට හැමදාම ඉල්ලගෙන කන තත්ත්වයට පත්වෙන්න දෙන්නත් බැහැ. මේ රටේ නම්බුකාර විදියට ජීවත් වුණු ගොවි පරම්පරාවක් පොළොන්නරුව ඉතිහාසයේ ඇතිවෙලා තිබෙනවා. ඒ නිසා ජලය ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු කරන්නය කියා මම බොහොම ගෞරවයෙන් ඉල්ලනවා.

විශේෂයෙන්ම ජනාධිපතිතුමාට අයිතිවෙලා තිබෙන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයත්, ඒ වාගේම වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාත් එකතුවෙලා මේ ප්‍රශ්නය සඳහා කඩිනම් විසඳුමක් සොයන්න කියා මම මේ ගරු සභාවේදී ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. ඒ වාගේම වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකාරණ අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, වාරිමාර්ග සංවර්ධනය සඳහා ඔබතුමා ගිය අවුරුද්දේ අපේ ප්‍රදේශයට විශාල මුදලක් වෙන්කළා. ඒ පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වාරි පද්ධති නඩත්තු කිරීම සහ ඇළ, අමුණු, කෘෂි මාර්ග වෙනුවෙන් රුපියල් ලක්ෂ 3,000කට වඩා වැඩි මුදලක් ගිය අවුරුද්දේ වෙන්කර තිබුණා. ඒ වාගේම CRIP ව්‍යාපෘතියෙන් රුපියල් ලක්ෂ 3,000ක් පමණ වෙන්කර තිබෙනවා. මම දකින විදියට මෙය අවුරුදු ගණනාවකට පස්සේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිදු වන බොහොම සාධනීය, කඩිනම් සංවර්ධනයක්. මෙය අවුරුදු ගණනාවකට පසු වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ ඇමතිතුමාගේ නායකත්වය යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයට එන ව්‍යාපෘතියක්. ඒ පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් මම කෘෂිකර්ම ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා, මේ වෙනකොට ඒ ප්‍රදේශයේ තිබෙන කෘෂි මාර්ග වැඩි දියුණු කිරීම, වැව් අමුණු ගොඩ දැමීම, ඒ වාගේම ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයත් වැව්වල ශීඝ්‍ර සංවර්ධනයක් කරගෙන යෑම පිළිබඳව.

ගරු අනුරාධ ජයරත්න නියෝජ්‍ය අමාත්‍යතුමාත් මෙතැන ඉන්නවා. මම බොහොම ගෞරවයෙන් යුතුව, මෙන්න මේ කාරණය කෙරෙහි එතුමාගේ අවධානය යොමු කරවනවා. බිසෝපුර සංවර්ධනය වෙමින් පවතින ප්‍රදේශයක්. එය මා නියෝජනය කරන මැදිරිගිරිය ආසනයේයි තිබෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙම සංවර්ධනය වෙමින් පවතින ප්‍රදේශයේ මේ වන විට මහවැලි ක්‍රීඩාංගණයක් ඉදි වෙනවා. මේ ක්‍රීඩාංගණය ඉදිවීම නිසා පවුල් 10කට පමණ ලක්ෂ 50ක්, 60ක් පමණ වටිනා තමන්ගේ ගෙවල් අහිමි වී තිබෙනවා. ඒ අය මේ වෙනකොට වෙන තැන්වල තමයි පදිංචි වෙලා ඉන්නේ. මේ වන විට රුපියල් 50,000ක මුදලක් පමණයි ඒ අයට ලැබී තිබෙන්නේ. ඒ අය දැන් වෙනත් තැන්වලයි ඉන්නේ. ඒ අයට වියළි සලාක මල්ලක් ලැබෙනවා. හැබැයි, බොහොම නම්බුකාර විදියට හොඳ ගෙවල් ඉදිකරගෙන සිටි අයට අද ඒ ස්ථාන අහිමි වී තිබෙනවා. ඒ අයට වන්දි දීලා, ඒ නිවාස හදාගන්න ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියා ඉල්ලා සිටිනවා. ඊළඟට, බිසෝපුර මාර්ගය. මැදිරිගිරිය වටදාගෙය ළඟින් ඉදිකර තිබූ මාර්ගය පුළුල් කිරීම නිසා නිවාස අහිමි වුණු අයට වන්දි ගෙවා නැහැ. මේ නිසා මිනිසුන් 50කගේ පමණ නිවෙස් කැඩිලා විනාශ වෙලා තිබෙනවා. ඒ වන්දි ගෙවීමත් කඩිනමින් ආරම්භ කරන්න කියා ඉල්ලා සිටිමින්, අවසාන වශයෙන් මැතිවරණය කල් දැමීම ගැන මගේ දැඩි පිළිකුල හා අප්‍රසාදය පළ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

[පූ.භා. 11.55]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු සභාපතිතුමනි, සමහර විට මම මගේ සම්පූර්ණ වෙලාවම ගන්න එකක් නැහැ. මොකද, අපේ විජිත හේරත් මන්ත්‍රීතුමාත් කථා කරන්න ඉන්නවා. මම කෙටියෙන් අදහස් ඉදිරිපත් කරන්නම්.

අද දිනයේත් අප අමාත්‍යාංශ කීපයක වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරනවා. අප කවර අමාත්‍යාංශවල වැය ශීර්ෂ සම්මත කළත්, බොහෝ දේශපාලන කරුණු අප මේ පාර්ලිමේන්තුවේ කථා කළත්, අප මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් මොන තරම් ප්‍රමාණයකට උත්සුක වෙනවාද කියන කාරණයයි වැදගත් වන්නේ. ඒ නිසා මම සෘජුව මේ වැය ශීර්ෂ පිළිබඳ කථා නොකළත්, වෙනත් කරුණු කීපයක් පිළිබඳව අවධානය යොමු කරන්න කැමැතියි.

අපේ රටේ පළාත් පාලන ආයතනවල දැන් ඇති වී තිබෙන තත්ත්වය කෙරෙහි පළමුකොටම මගේ අවධානය යොමු කරනවා. ගරු සභාපතිතුමනි, 2015 මාර්තු මාසයේ තමයි මෙම පළාත් පාලන ආයතන විශාල ප්‍රමාණයක කාලය ඉක්මවා ගියේ. පසුව 2015 වසරේ මැයි මාසයේ 15වැනි දා දක්වා එම ආයතනවල කාලය දීර්ඝ කරනු ලැබුවා. මැයි මාසයේ 15වැනි දායින් පසුව මෙම පළාත් පාලන ආයතන මුළුමනින්ම බිඳ වැටුණා. 2015 මැයි 15 සිට දැන් 2017 නොවැම්බර් මාසය තෙක් අප ඇවිත් තිබෙනවා. ආසන්න වශයෙන් ගත්තොත්, අවුරුදු දෙකහමාරකට වැඩි කාලයක් මේ මැතිවරණය පමාවී තිබෙනවා. එයට යම් සාධාරණ හේතු තියෙන්න ඇති. සීමා නිර්ණය අවසන් කර ගැනීම, නව ඡන්ද ක්‍රමයක් සකස් කර ගැනීම, ආඥාපනත් සංශෝධනය කර ගැනීම, සීමා නිර්ණය ගැසට් කර ගැනීම වැනි අත්‍යවශ්‍ය කරුණු කීපයක් පමා වුණා. ඒක අපට පිළිගන්න පුළුවන්. හැබැයි, එතැනින් පසුව අද විශේෂයෙන්ම අධිකරණයේ ඇති වී තිබෙන තීරණය අප කිසිසේත්ම විශ්වාස කරන්නේ නැහැ. මොකද, මේක යුක්තිය, සාධාරණත්වය පිළිබඳව අධිකරණයට ගොනු කරන ලද නඩුවක් නොවෙයි. ගරු සභාපතිතුමනි, නිශ්චිත ලෙසම අප දන්නවා, කවර හෝ පුද්ගලයකුට යම් අසාධාරණයක්, අයුක්තියක් වුණාට පසුව අධිකරණය වෙත පියමං කිරීමේ අයිතිය තිබෙන බව.

***[මෙම අවස්ථාවේදී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]***

*[இச்சந்தர்ப்பத்தில் மேதகு சனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]*

*[At this stage, His Excellency President Maithripala Sirisena entered the Chamber.]*

[ගරු අනුර දිසානායක මහතා]

ඒ, සාධාරණය සහ යුක්තිය පසිඳලා ගැනීම වෙනුවෙන්. හැබැයි, පළාත් පාලන ආයතන පිළිබඳව අධිකරණයට ගොනු කරන ලද මෙම නඩුව යුක්තිය සහ සාධාරණත්වය පිළිබඳ නඩුවක් නොවෙයි. එය තමන්ගේ කැත, කිලිටි, වංක වුවමනාව ඉටු කරගැනීම වෙනුවෙන් අධිකරණය උපයෝගී කර ගැනීමක්. රටේ ප්‍රජාතන්ත්‍රවාදය; ජනතාවට තමන්ගේ නියෝජිතයන් තෝරා පත් කරගැනීමේ අයිතිය, පළාත් පාලන ආයතනවලට තමන්ගේ නියෝජිතයන් පත් කර ගැනීමේ අයිතිය, මේ විධියට තමන්ගේ පටු, කෙටි දේශපාලන වුවමනා වෙනුවෙන් යොදා ගැනීම කවුරුවත් අනුමත කරයි කියා මා හිතන්නේ නැහැ. ඒ සඳහා අධිකරණය උපයෝගී කර ගැනීම අප කවුරුත් හෙළා දැකිය යුතුව තිබෙනවා.

මෙතැන සඟවන්න කරුණක් නැහැ, ගරු සභාපතිතුමනි. කවුද මේ නඩුව දමලා තිබෙන්නේ? ඩිලාන් පෙරේරාගේ බඳුල්ලේ, බණ්ඩාරවෙල ඉතාම සමීපතමයින්. දෙනියායේ කවුද මේ වෙනුවෙන් පෙනී සිටින්නේ? ලක්ෂ්මන් යාපා අබේවර්ධනගේ පුතා, ඔහුගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙක්. පඩුවස්නුවර කවුද පෙනී සිටින්නේ? දයාසිරි ජයසේකරගේ දේශපාලන හිතවතෙක්. ඉතින් කවුද මේ නඩුවට ඉන්නේ? මේ නඩුව ඡන්දය කල්දමා ගැනීම වෙනුවෙන් ආණ්ඩුවේ පාර්ශ්වයක් විසින් හිතා මතාම දරන ලද වංක උත්සාහයක්.

මේ අවස්ථාවේදී ජනාධිපතිතුමා මේ ගරු සභාවේ ඉන්න එක ගැන මා ඉතාමත් සතුටු වනවා. ගරු ජනාධිපතිතුමනි, අද ඔබතුමාත් එක්ක ඉන්න බොහෝ අය එදා ඔබතුමාගේ පැත්තේ නොවෙයි සිටියේ. එතුමන්ලා ඔබතුමාට පිටුපාලයි සිටියේ. ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා අමාත්‍යතුමා, ගරු එස්.බී. දිසානායක අමාත්‍යතුමා, ගරු දයාසිරි ජයසේකර අමාත්‍යතුමා ඒ කාලයේ කරන ලද ප්‍රකාශවල වීඩියෝ පටයක් මේ දවස්වල Facebook එකේ යනවා මේ ළඟදී මා දැක්කා. එය බැලුවාට පස්සේ මා කල්පනා කළා, අද ජනාධිපතිතුමාගේ අමාත්‍ය මණ්ඩලයේ තමන්ගේ පක්ෂයේ ප්‍රබලයින් බවට පත් වී සිටින මේ කණ්ඩායම එදා ජනාධිපතිවරණයේදී මොනවාද කිව්වේ කියලා. මට හිතා ගන්න බැහැ, මේ වෙනස්වීම් සිද්ධ වන්නේ කොහොමද කියලා. මා ඒවා ගොඩක් කියන්න යන්නේ නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa )

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා ඇමතිතුමා. ඔබතුමාගේ නමත් කිව්වා නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
පරණ වීඩියෝ පට ඔක්කොම ගන්න, ඒ කාලයේ ඉඳලා කරපුවා. 1970 ඉඳලා, 1971 ඉඳලා, 1988-1989 ඉඳලා ගත්තාම ඒවා ඔක්කොම බලන්න පුළුවන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හොඳයි. ඔබතුමා කලබල වෙන්න එපා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
නැහැ, කලබලයක් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
වාඩිවෙන්න. ගරු සභාපතිතුමනි, ඔබතුමා point of Order එකක් විතරක් ඉදිරිපත් කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීමක්] කරුණාකරලා, නිකම් කෑලිවලට ඔහේ නැඟිටින්න ඔබතුමා ඉඩ දෙන්න එපා. නිශ්චිත ප්‍රශ්නයක් තිබෙනවා නම් කථා කරන්න. [බාධා කිරීමක්] හොඳයි. වාඩිවෙන්න මහත්තයෝ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
අපි ආවේ සම්මුතිවාදයට.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හරි සම්මුතිවාදය. අපට ඔක්කොම තේරුම් ගන්න පුළුවන්. හරිද? [බාධා කිරීමක්] මා දන්නවා, කලබල වන බව. ඒ කලබල වීම බලාපොරොත්තුවෙන් තමයි මා කිව්වේ. ජනවාරි මාසයේ 08 වන දා ලැබුණු ජන වරමේ පිටු පස තිබෙන්නේ අන් කවරක්වත් නොවෙයි. වර්ධනය වෙමින් ආපු ප්‍රජාතන්ත්‍ර විරෝධී ගමන, ඒකාධිපති ගමන පරාජයට පත් කිරීමේ අරමුණ තමයි ජනවාරි මාසයේ 08 වන දා ජනතාවගේ අපේක්ෂාව බවට පත් වී තිබුණේ. දෙවරකට සීමා වී තිබෙන ජනාධිපතිවරයාගේ ධුර කාලය දීර්ඝ කර ගැනීම වෙනුවෙන්, ඒ වාගේම කොමිෂන් සභා මුළුමනින්ම අහෝසි කර ගැනීම වෙනුවෙන් දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගනිමින් තිබුණා. ඒ අනුව ව්‍යවස්ථානුකූලව ඒකාධිපතිත්වයට අවශ්‍ය වන නීතිමය රැකවරණ සකස් කර ගෙන තිබුණා.

ඒ විතරක් නොවෙයි. තමන්ට එරෙහිව නඩු විභාග කරනවා යැයි කියන චෝදනාව මත, මන්ත්‍රීවරු කණ්ඩායමක් නඩුකාරයන් හැටියට වාඩි කරවා, නඩුවක් අහලා ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරවරිය පළවා හැරියා. ඒ වාගේම මාධ්‍ය වේදීන් ඝාතනය කළා, භීතියක් නිර්මාණය වෙලා තිබුණා, දුරකථනයෙන් දුරකථනයකට කථා කිරීමේ භය තත්ත්වයක් ඇති වෙලා තිබුණා. කොතැනදී, කොහේදී tap කරනවාදැයි කියන සැකයක් මතුවෙලා තිබුණා. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ බරපතළ අනතුරකට මුහුණ දීලා තිබුණා. ඒ නිසා ජනවාරි මාසයේ 08 වන දා ඒ ජන වරම පිටුපස තිබුණේ අන් කවරක්වත් නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල වී තිබෙන තර්ජනයට එරෙහිව තිබෙන ජන මතයයි. ඒ නිසා එතෙක් බලයට පත් වුණු හැම පාලකයාටම වඩා වැඩියෙන් වර්තමාන ජනාධිපතිවරයාට වග කීමක් තිබෙනවා, ප්‍රජාතන්ත්‍රවාදයේ සහ ජනතාවගේ නිදහස තහවුරු කර ගැනීම වෙනුවෙන්.

"ප්‍රජාතන්ත්‍රවාදය" කියන එක රඳා පවතින්නේ වේදිකාවේ කරන කථාවල නොවෙයි, වේදිකාවේ ඉදිරිපත් කරන මහා සානුකම්පික හැඟීම්වල නොවෙයි. ඒවාට අපේ ගම්වල කියනවා, "කටේ නරිවාදම් රෙද්ද පල්ලෙන් බේරෙනවා"යි කියලා. ඒවාට අපේ ගම්වල කියනවා, "හක්කේ බුදු රැස්, බොක්කේ දඩ මස්." කියලා. ඒවා තමයි වේදිකාවල තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව අපේ ගම්වල කථාබහ. ඒ නිසා අපට අවශ්‍ය වී තිබෙන්නේ වේදිකාවේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව, වේදිකාවේ යහ පාලනය

පිළිබඳව උඩු බිරීම් නොවෙයි. ප්‍රායෝගික තලයේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මොන තරම් කැප කිරීමක්, මොන තරම් මැදිහත් වීමක් කරන්න පාලකයා සූදානම්ද කියන සාධකය තමයි අපි ගණන් බැලිය යුතු වන්නේ. එසේ නැතිව අපි ගණන් බැලිය යුතු වන්නේ වේදිකාවේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කෑ මොර දීම නොවෙයි. මා දන්නවා, මා මේ කථාව කළාට පසුව බොහෝ දුරට අප වෙත එල්ල කරන්න හදන චෝදනාව තමයි, 1988-1989 සිද්ධි පිළිබඳව කියලා.

ගරු සභාපතිතුමනි, මා දන්නවා, මේ කථාවෙන් පසුව බොහෝ අය ඒ ගැන කියයි කියලා. ඒකයි මා දැන් නැවත කියන්නේ. 1988-1989 ඇති වී තිබුණු සිවිල් යුද්ධය පිළිබඳ බොහෝ කරුණු කියන්න පුළුවන්. ඇති වී තිබුණේ සිවිල් යුද්ධයක්. ඒ සිවිල් යුද්ධය ඕපපාතිකව නිර්මාණය වුණා නොවෙයි. අපව මර්දනය කරලා, 1978 අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව අහෝසි වුණාට පසුව අපේ විශාල පිරිසක් අත් අඩංගුවෙන් එළියට ආවා. අත් අඩංගුවෙන් එළියට ආවාට පස්සේ අපේ පක්ෂ නැවත ශක්තිමත්ව වැඩ කරමින් තිබුණා.

විශේෂයෙන්ම 1978 පවත්වන ලද අතුරු මැතිවරණවලට අපි තරග කළා. ආනමඩුව අතුරු මැතිවරණය, හොරොව්පතාන අතුරු මැතිවරණය ඇතුළු අතුරු මැතිවරණ හතරකට අපි තරග කළා. ඒ විතරක් නොවෙයි. 1981 සංවර්ධන සභා මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වර්ජනය කළ අවස්ථාවේදී ජනතා විමුක්ති පෙරමුණේ අපි තරග කළා.

1981 සංවර්ධන සභා මැතිවරණයේදී දිස්ත්‍රික් නියෝජිතයන් 13 දෙනෙකු තෝරා පත් කර ගැනීමේ හැකියාව අපට ලැබුණා. අනතුරුව ජනාධිපතිවරණය ආවා. ජනාධිපතිවරණයට අපේ පක්ෂයෙන් අපේක්ෂකයකු ඉදිරිපත් වුණා. අපි ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි හැමදාමත් විශ්වාසය තැබූ මිනිස්සු. එතැනින් නතර නොවී ජේ.ආර්. ජයවර්ධන කළගෙඩි - ලාම්පු සෙල්ලමක් ගෙනැල්ලා මැතිවරණ කල් දැම්මා; රටේ ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තමන්ගේ නියෝජිතයන් තෝරා පත් කර ගැනීමට තිබෙන අයිතිය බිඳ හෙළුවා. ඒ බිඳ හෙළීමේ ප්‍රතිඵලයට එරෙහිව අපි අධිකරණයට ගියා. ඒ මැතිවරණය ඉතාමත් ප්‍රජාතන්ත්‍ර විරෝධී මැතිවරණයක්. ඒ මැතිවරණය කිසිසේත්ම සාධාරණ, යුක්ති සහගත මැතිවරණයක් නොවන බව අපි අධිකරණයට ගිහිල්ලා කිව්වා. ඒ නඩුවේ ප්‍රධාන පැමිණිලිකාරයෙක් අපේ පක්ෂය. ඒ නඩුව විභාග වෙමින් තිබුණා. එතකොට හිටිය මැතිවරණ කොමසාරිස්, චන්ද්‍රානන්ද සිල්වා මහත්මයා. ජනමත විචාරණය පිළිබඳ චන්ද්‍රානන්ද සිල්වා මහත්මයාගේ වාර්තාව කියවන්න. ඒ වාර්තාවේදී එතුමා කියනවා, එතෙක් සිදු වූ දූෂිතම මැතිවරණයකට අවශ්‍ය ඉඩ කඩ සකස් වී තිබුණු බව ඉතා හොඳින් නිරීක්ෂණය වූ බව.

අපි කොයි පැත්තේද හිටගත්තේ? අපි එදාත් හිටගත්තේ ප්‍රජාතන්ත්‍රවාදය පැත්තේ. අපිට වඩාත් යෝග්‍ය, අපි වඩාත් විශ්වාසය තබන්නේ, අපේ අදහස්, අපේ අරමුණ ජනතාවත් එක්ක සංවාදයට විවෘත කරන දේශපාලන ව්‍යාපාරයක්. නමුත් එදා ජේ.ආර්. ජයවර්ධන තමන්ගේ දේශපාලන බල වුවමනාව වෙනුවෙන් 1983දී කළු ජූලිය නිර්මාණය කළා. අපි කිසිසේත්ම කළු ජූලියට සම්බන්ධ වුණු ව්‍යාපාරයක් නොවෙයි. එදා සිරිල් මැතිව් ඇතුළු ජාතිවාදී කණ්ඩායම් ගිහිල්ලා හෙට්ටිවීදිය ගිනි තියමින් විශාල ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාදාමයකට එක්සත් ජාතික පක්ෂය අවතීර්ණ වුණා. බොහෝ දෙමළ අයව අපේ පක්ෂයේ අයගේ ගෙවල්වල තියාගෙන ආරක්ෂා කර ගත්තා.

ගරු වී.එස්. රාධාක්‍රිෂ්ණන් රාජ්‍ය ඇමතිතුමා දන්නවා ඇති, තලවකැලේ දෙමළ ජනතාව හිටියේ සිංහල අපේ පක්ෂයේ සහෝදරවරුන්ගේ ගෙවල්වල බව. අපි එදාත් ජාතිවාදයට එරෙහියි. එදා ජේ.ආර්. ජයවර්ධන ප්‍රජාතන්ත්‍රවාදය හැකිළීම වෙනුවෙන් ගෙනාව ඒ යුද්ධයේදී, ඒ භීෂණයේදී, ඒ කළු ජූලියේදී අපි එදාත් පෙනී සිටියේ ප්‍රජාතන්ත්‍රවාදය පැත්තේ. හැබැයි අපේ පක්ෂය තහනම් කළා. පක්ෂය තහනම් කළාම අපේ වෘත්තීය සමිති ව්‍යාපාරය ඒ තහනම ඉවත් කරන්න කියලා නඩුවක් දැම්මා. එතකොට අපේ වෘත්තීය සමිති ව්‍යාපාරයත් තහනම් කළා. අපට නඩු කියන්නවත් අවස්ථාවක් දුන්නේ නැහැ. අපි Amnesty International වාගේ ජාත්‍යන්තර සංවිධානවලට කිව්වා, අපේ පක්ෂ තහනම ඉවත් කරන්න කියලා. නමුත් අපේ පක්ෂ තහනම ඉවත් කළේ නැහැ. තහනම ඉවත් කරනවා වෙනුවට අපේ පක්ෂයට මර්දනය ගෙනාවා.

1984දී තමයි මාතර දිස්ත්‍රික්කයේදී අපේ පක්ෂයේ සහෝදරයකුගේ පළමු ඝාතනය සිදු කරන්නේ. 1984 කියන්නේ අපි අවියකට අතවත් තියලා නැති කාලයක්, අවියක් ගැන කල්පනා නොකළ කාලයක්. 1984දී අපේ පක්ෂයේ සහෝදරයකු මාතරදී ඝාතනය කරනවා, අනතුරුව අනුරාධපුරයේදී ඝාතනය කරනවා. ඒ මොකක්ද දියත් වෙමින් තිබුණේ? එක්කෝ ඒ මර්දනය හමුවේ අපි අපේ දේශපාලනය අත් හරින්නට ඕනෑ. හැබැයි කවර හෝ මර්දනයකට, කවර හෝ භිය ගැන්වීමකට අත් හරින දේශපාලනයක් නොවෙයි අපි තෝරාගෙන තිබුණේ. කවර මර්දයක් හමුවේ හෝ මේ රටේ පොදු ජනයාගේ වුවමනාව වෙනුවෙන් දේශපාලනය කරන ව්‍යාපාරයක්. එවැනි තහනම් කිරීම් මධ්‍යයේත් අපි දේශපාලනය කරගෙන ගියා. අපි වෙත මර්දනය එල්ල වුණා. අපි ඉතාමත් නිශ්චිත සන්ධිස්ථානයකට ආවා. එක්කෝ අපි දේශපාලනය අත් හරින්නට ඕනෑ; නැත්නම් අපි මර්දනයට මුහුණ දෙන්නට ඕනෑ. මොකක්ද අපි දේශපාලන ව්‍යාපාරයක් හැටියට කරන්නට ඕනෑ? අපිට එරෙහි සතුරන් අපි දේශපාලනය අත් හරින්නට ඕනෑ කියලා කල්පනා කරන විට, දේශපාලනය අත් හරිනවා වෙනුවට ඒ වෙලාවේ හිටපු අපේ නායකයන් තෝරා ගත් මාවත තමයි මර්දනයට එරෙහිව දේශපාලනය කරන්නට ඕනෑ කියන එක. අපි අදත් එහෙමයි. කවර මර්දනයකට එරෙහිවත් එහෙමයි.

බොහෝ අය රාජපක්ෂගේ, ගෝඨාභයගේ මර්දනයට එරෙහිව ඇකිළිලා ඉන්න විට, කැබිනට් මණ්ඩලයේ "මීක්" ශබ්දයක්වත් කරන්නේ නැතිව ඉන්න විට, එළියට ඇවිල්ලා පඹයින් වාගේ අත උස්සන විට ඒ මර්දනයට එරෙහිව කටයුතු කළ දේශපාලනය ව්‍යාපාරයක්, අපි. අපි අදත් එහෙමයි; හෙටත් එහෙමයි. එම නිසා මම මේ මහත්වරුන්ට කියන්නේ, ඔබතුමන්ලා නැවත නැවත උත්සාහ කරන්නේ මම මේ කියන කථාවට 1988 - 1989 වාගේ කාල මතක් කරලා පහර දෙන්න නම්, ඒ ලාභ දේශපාලනයට යන්න එපා කියන එකයි. ඒක ඉතිහාසයක්. ඒ ඉතිහාසය පිළිබඳ සංවාදයක් ඕනෑ නම් අපි ගැඹුරින් ඒ සංවාදය කරමු. අපි ලැහැස්තියි, 1988 - 1989 ගැන එවැනි ගැඹුරු සංවාදයකට. අපටත් අපේ කාර්ය භාරය පිළිබඳ ඇගැයීමක් තිබෙනවා. ඒ වාගේම අපිට කාර්ය භාරයේ අතපසුවීම් පිළිබඳ යම් ඇගැයීමකුත් තිබෙනවා. එහෙම ඇගැයීම් කරන දේශපාලන ව්‍යාපාරයක් අපි. අවසානයේදී අපේ දේශපාලන ව්‍යාපාරය සන්නද්ධ ව්‍යාපාරයක් බවට පරිවර්තනය වුණා. අපිව මර්දනය කරන්න එන විට ඒ මර්දනයට එරෙහිව අපි අවි ගත්තා. ඒක ඇත්ත. ඒ තුළින් රටේ සිවිල් යුද්ධයක් නිර්මාණය වුණා.

ගරු සභාපතිතුමනි, මා ඕ සේතුං සහෝදරයා කියලා තිබෙනවා, "යුද්ධයක් කියලා කියන්නේ රාත්‍රී භෝජන සංග්‍රහයක් නොවෙයි" කියලා.

ඒක ඇත්ත. යුද්ධයක් කියන්නේ, ආරාධනා පත්‍ර ගහලා, හොඳ ඇඳුමින් සැරසිලා එන්න කියලා, දිලිසෙන බල්බ් දාලා කරන පාටියක් නොවෙයි. යුද්ධයකදී, සිදු නොවිය යුතු දේ සිදු වෙනවා.

[ගරු අනුර දිසානායක මහතා]

අපි අතින් එවැනි දේ සිදු වී තිබෙනවා. ඒ පිළිබඳව අවංක කනගාටුවක් සහ අවංක වේදනාවක් අපට තිබෙනවා. හැබැයි, අපි ඒවා ගැන පශ්චාත්තාප වෙමින් ඉන්න දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි. අපි අපේ අත්වැරදීම් තේරුම් ගන්නේ ඒවා නිවැරදි කරගැනීමේ දිශාවෙන්. අපි අත්වැරදීම් නිවැරදි කරගැනීමේ දිශාවෙන් තේරුම් ගත්තා.

ගරු සභාපතිතුමනි, මේ 2017 වර්ෂය. 1994න් පසුව මේ දක්වා අවුරුදු 23ක කාලයක් අපි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයේ ඉඳලා තිබෙනවා. අපේ සහෝදරයින් ගණනාවක් ඝාතනය වුණා. ගරු එස්.බී. දිසානායක ඇමතිතුමනි, ඔබතුමාට විශේෂයෙන් මතක ඇති. කිරුලපනදී පහරදීලා වම්මික සුදන්ත සහෝදරයා ඝාතනය කළා. අපි අවිආයුධ අතට ගන්න ගියේ නැහැ. අපි ගල් කැටයක්වත් අතට ගන්න ගියේ නැහැ. එතැනින් නතර නොවී ඊළඟට, මාතලේදී උද්ඝෝෂණයකට වෙඩි තියලා කුරුණෑගල අපේ සිරිදේව සහෝදරයා ඝාතනය කළා. අපි ගල් කැටයක්වත් අතින් ගන්න ගියේ නැහැ.

ඒ විතරක් නොවෙයි. සජින් ද වාස්ගේ මැරයින් යොදවා අම්බලන්ගොඩදී අපේ නයිදූවාවඩු සහෝදරයාව ඝාතනය කළා. බස්නාහිර පළාත් සභා මැතිවරණයේදී, ගම්පහදී ආණ්ඩුවේ මැරයින් යොදවා, පිස්තෝලයෙන් වෙඩි තියලා නන්දන බාලගේ සහෝදරයාව ඝාතනය කළා. අනුරාධපුරයේදී දෙදෙනකු ඝාතනය කළා, 2000න් පසු කාලයේදී. මේ වනකොට මේ ප්‍රජාතන්ත්‍රවාදී තලයේ අපේ සහෝදරයින් හය දෙනකු ඝාතනය කර තිබෙනවා, ඔබතුමන්ලා. කටුවනදී, අපේ ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස සහෝදරයා ජනතාව අමතමින් හිටපු වේදිකාවට මැරයින් යොදවා වෙඩි තියලා අපේ හිතවතුන් දෙදෙනකු ඝාතනය කළා. හැබැයි, ඒ වෙනුවෙන් අපි මේ රටේ ගල් කැටයක්වත් අතින් ගත්තේ නැති දේශපාලන ව්‍යාපාරයක් බව මතක තබා ගන්න. දිවුලන්පිටියේ අමරේලා යොදවායි ඒ ඝාතන කළේ.

අපි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ඇති තරම් ජීවිතවලින් වන්දි ගෙවූ, ඇති තරම් බැටකෑම්වලට ලක් වුණු දේශපාලන ව්‍යාපාරයක්. මා මේ මහත්වරුන්ට මේවා කියන්නේ, හැමදාමත් අපි කවර හෝ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කරුණක් කථා කළොත්, 1988 -1989 කාල වකවානුව ගැන මතක් කරන නිසයි. මම ලෑස්තියි, මේ ගැන දවස් දෙක තුනක වුණත් විවාදයක් ගන්න. 1988-1989 ඉතිහාසය ගොඩනැඟුණු ආකාරය, ඒ ඔක්කෝම පිළිබඳව අපට අපේ පැත්තෙන් කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. අපි නිවැරදි දේ වාගේම අපේ වැරදි දේත් පිළිගන්න පසුබට නොවන ව්‍යාපාරයක්. අනිවාර්ය ලෙස මගේ මේ සාකච්ඡාව ඉතිහාසයත් එක්ක දියත් වන නිසයි මා ඒ මඟින් ප්‍රවේශයක් ගන්නේ.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම දැන් මේ පළාත් පාලන මැතිවරණය පවත්වා ගැනීම වෙනුවෙන් අපි මොනවාද නොකළේ? මැතිවරණ ක්‍රමය සකස් කර ගැනීම වෙනුවෙන් දිවා රෑ නොබලා අපි වෙහෙස මහන්සි වුණා. සීමා නිර්ණය අභියාචනා විමර්ශන කමිටුවට අපි ඇති තරම් කරුණු ඉදිරිපත් කළා. එතැනින් නතර නොවී ඒ ඡන්ද ක්‍රමයෙන් පස්සේ සීමා නිර්ණය සම්මත කර ගැනීම වෙනුවෙන් අපි උත්සුක වුණා. නැවත අණපනත් සම්මත කර ගැනීම සඳහා පක්ෂ නායක රැස්වීමේදී තීන්දු තීරණවලට ආවා. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත, නගර සභා ආඥාපනත, මහනගර සභා ආඥා පනත් සංශෝධන කරන්න 11වැනිදායි ගැසට් කර තිබුණේ. ගැසට් කරලා සති දෙකක් ගත වෙන්න ඕනෑ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. 25 වැනිදා වන කොට දින සම්පූර්ණ වෙනවා. 26 වැනිදා විශේෂ පාර්ලිමේන්තුවක් කැඳෙව්වා. මොකක් වෙනුවෙන්ද? ඒ, මේ පනත් කෙටුම්පත් ටික පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ගැනීම වෙනුවෙන්. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සතියක් ඇතුළත ඒක සම්මත කරන්න ඕනෑකම තිබෙනවා. පසුගිය 9 වැනිදා විශේෂ පාර්ලිමේන්තු සැසිවාරයක් කැඳෙව්වා. ඒ, මොකක් වෙනුවෙන්ද? වෙන කිසිවක් සඳහා නොවෙයි. මැතිවරණයට අවශ්‍ය ඉඩකඩ හදන්න. එහෙම කටයුතු කරලා එම නගර සභා, මහනගර සභා, ප්‍රාදේශීය සභා ආඥාපනත් සංශෝධන මේ පාර්ලිමේන්තුවේ ඒකමතිකව සම්මත කරලා දුන්නා. ඒත් ගරු ෆයිසර් මුස්තාපා අමාත්‍යවරයා තමන්ගේ අතේ මේක තියාගෙන සැලකිය යුතු කාලයක් සිටියා. බලපෑම් කරලා, මැදිහත් වෙලා පසුගිය පළමුවැනිදා ගැසට් නිවේදනය නිකුත් කළා. ඊට පස්සේ මොකක්ද කළේ? ඊට පස්සේ තමයි ෆයිසර් මුස්තාපා මේ කුමන්ත්‍රණය දියත් කළේ. ඒ, කාගේ උපදෙස් මතද කියා මා දන්නේ නැහැ. හැබැයි, මේ කුමන්ත්‍රණයකුයි දියත් කළේ.

මේ මැතිවරණයට මුහුණ නොදීමේ අභියෝගයක් තිබෙනවා. ඒ අභියෝගය මොකක්ද කියලා මා අද කියන්නම්. තමුන්නාන්සේලා කල්පනා කරනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බෙදීමක් ඇති වුණොත් මෛත්‍රීපාල ජනාධිපතිවරයා නියෝජනය කරන පාර්ශ්වය කුඩා වෙනවා කියා. දැන් මෛත්‍රීපාල ජනාධිපතිවරයාට කියන්න පුළුවන්කම තිබෙනවා, 2015 ජනවාරි මාසයේ 08 වැනිදා තමන්ට ලබා දීපු ලක්ෂ 62ක ජනවරම තමා පස්සේ තිබෙනවා කියලා. හැබැයි, ජනවාරි මාසයේ පළාත් පාලන මැතිවරණයේදී වෙනම ඉල්ලන්න සිදු වුණොත්, තමන්ගේ ඇත්ත තරම හෙළිදරව් වෙනවායි කියන භය එතුමන්ලාට තිබෙනවා. ඒක එහෙම නොවෙයි නම් අපට කියන්න. අපි කියන්නේ එක ජනවරමක් විසින් තවත් ජනවරමක් යට විය යුතු නැහැ කියන එකයි. පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල විග්‍රහ කළ යුත්තේ වෙනත් ආකාරයකටයි. අපි ජනවාරි මාසයේ 08 වැනිදා ඔබතුමාට ලබා දීපු ජනවරම පිළිගන්න දේශපාලන ව්‍යාපාරයක්. මතක තබා ගන්න. කුඩා මැතිවරණ ප්‍රතිඵලයෙන් ඉහළ මැතිවරණ ප්‍රතිඵලය යට යා යුතු නැහැ. ජනවාරි මාසයේ 08වැනි දා ජනවරම යට යා යුතු වන්නේ, නැවත ජනාධිපතිවරණයක ජනවරමකදී විතරයි. වෙන ජනවරමකදී ඒ ජනවරම සංසන්දනය කළ යුතු නැහැ. නමුත්, භියක් තිබෙනවා. ඒකයි මේ ඇති වී තිබෙන තත්ත්වය. ඒ නිසා මේ මැතිවරණය කිසිසේත්ම පවත්වා නොගැනීමේ වුවමනාවක් මතු වී තිබුණා. ඒ වුවමනාව නිසා තමයි සැලසුම් සහගතව අධිකරණය වෙත මේ නඩුව ගෙනිච්චේ. මේ නඩුවේදී මොකක්ද වුණේ? නඩුවේ ප්‍රධාන පුද්ගලයන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් ආණ්ඩුව අද නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ කණ්ඩායමම නම් අපි කොහොමද කියන්නේ, ඒක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කුමන්ත්‍රණයක් නොවෙයි කියලා?

අපි දේශපාලනයේ තොත්ත බබාලා නොවෙයි. දේශපාලනයේ ඉව හොඳට තිබෙන දේශපාලන ව්‍යාපාරයක් අපි, ගරු සභාපතිතුමනි. අපි ඉතිහාසයේ ඉඳන්ම දේශපාලනයේ දුර දැක්ම, දේශපාලනයේ ඉව ඉතා හොඳින් තිබෙන දේශපාලන ව්‍යාපාරයක් කියලා අපි විශ්වාස කරනවා. අපගේ ඇගයීම්, අපගේ අනාගත වැකි අසාර්ථක වෙලා තිබෙන්නේ ඉතා අඩු ප්‍රමාණයක්; වැඩි ප්‍රමාණයක් සාර්ථක වී තිබෙනවා. ඒ නිසා අපේ දේශපාලනයේ ඉව මෙතැන තිබුණා.

ෆයිසර් මුස්තාපා ඇමතිවරයා පෙබරවාරි මාසයේ 17වැනි දා නම් ගැසට් එක ගැහුවේ, නොවැම්බර් මාසය වන කල් දන්නේ නැත්නම් ඒකේ දුර්වලකමක් තිබෙනවා කියලා, ඒ මොන ඇමතියෙක්ද? ඒ ඇමතියා ඉල්ලා අස් වෙන්න ඕනෑ. ඒ ඇමති මොකටද මේකේ තියා ගෙන? තමන් ගහපු ගැසට් නිවේදනය අධිකරණය හමුවේ ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා නම්, ඇමතිවරයාට තවදුරටත් අමාත්‍ය ධුරය දරන්න අයිතියක් තිබෙනවාද? පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාගේ ප්‍රධාන වගකීම ඉටු කරන්න එතුමා අසමත් වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම දන්න ෆයිසර් මුස්තාපාට වරදින්න විධියක් නැහැ. මොකද, පසු ගිය ආණ්ඩුවෙත් ගොඩක් නීති උපදෙස් දීපු මහත්තයා. එතුමාට වරදින්න පුළුවන් කියලා අපි කොහොමද විශ්වාස කරන්නේ? හිතාමතාම තමයි ෆයිසර් මුස්තාපා මෙච්චර කාලයක් මේ වැරදි ගැසට් නිවේදනය ඇදෙන්න ඉඩ දුන්නේ. මේක, දැන දැන කළේ. ඒක වරද්දන එකත් එතුමාගේ වග කීමක්. එතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශයක් කළ යුතුයි. ප්‍රකාශයක් කරන්නේ නැහැ. ඇයි? මොකද වෙලා තිබෙන්නේ? ගරු සභාපතිතුමනි, මේ රටේ මැතිවරණය පිළිබඳ වැදගත් නඩුවක් තිබෙනවා. ඇමතිවරයා විත්තිකරුවෙකු බවට පත් වෙලා තිබෙනවා. කෝ ඇමතිවරයා? ඇමතිවරයා රට ගිහිල්ලා; රට ගියේ සඳුදා; එන්නේ ඉරිදා. එහෙම තමයි කුමන්ත්‍රණ දියත් කරන්නේ. මතක තබා ගන්න. මේ වාගේ ඇමතිවරු තියාගෙන ආණ්ඩුවක් ගෙන යන එක ගැන ලජ්ජා වෙන්න ඕනෑ. කෝ ඇමතිවරයා?

ඡන්දය තිබෙනවාද, නැද්ද කියලා දැන් තමන්ට විරුද්ධව විභාගයට ලක් වන නඩුවක් තිබෙනවා. එහෙම නම් ඇමතිවරයා ඉන්න ඕනෑ ලංකාවේ; ඒ නඩුවට මුහුණ දෙන්න ඕනෑ. හැබැයි, නඩුවට මුහුණ දෙනවා වෙනුවට ඇමතිවරයා රට යනවා. තමුන්නාන්සේලා විශ්වාස කරනවාද, මේවා නිකම් වනවා කියලා. එය නිකම් වනවා කියලා විශ්වාස කරන්න තරම් අපි දේශපාලනිකව අඥබාලයෝ නොවෙයි. අපි දන්නවා, මේ කුමන්ත්‍රණය මොකක්ද කියලා. ඒ නිසා තමයි ඇමතිවරයාට එරෙහිව නඩුවක් තිබියදී ඇමතිවරයා රට යන්නේ. සඳුදා ගියා ඉරිදා එනවා කියලා. එහෙමයි සිද්ධ වෙලා තිබෙන්නේ. මේ ගැසට් නිවේදනය වැරැද්දීමේ වැරැද්දක් තිබෙනවා නම්, ඒ වැරැද්දට වග කියන්න ඕනෑ ඇමතිවරයා. එයාට තිබුණා කලින් නීතිපතිවරයා ළඟට යන්න. ඇමතිවරයා මේ වැරැද්ද දැනගෙන හිටියා. ඇමතිවරයා මේ වැරැද්ද දැනගෙනම තමයි නොවැම්බර් මාසයේ පළමුවැනි දා ගැසට් නිවේදනය ගැහුවේ, ඊළඟ ගුණ්ඩුව එයාගේ සාක්කුවේ දාගෙන. ගැසට් නිවේදනය දැම්මොත් එයා දන්නවා ඡන්දය කල් දමන්න. ඒ නිසා එයා ගැසට් නිවේදනය ගහලා නඩුවට පිඹුරුපත් සකස් කළා. ඇමතිවරයා මෙයට වග කියන්න ඕනෑ. පිඹුරු පත් සකස් කරලා ගරු සභාපතිතුමනි, කවුද නඩුවට පෙනී හිටියේ? නඩුව දැම්මේ කවුද? නඩුව දාපු අය පැහැදිලියි. පෙනී හිටියේ කවුද? පෙනී හිටියේ වෙන කවුරුවත් නොවෙයි, ෆයිසර් මුස්තාපාගේ තාත්තාගේ -ෆයිස් මුස්තාපාගේ- කාලයක් තිස්සේ කනිෂ්ඨ නීතිඥයා හැටියට වැඩ කරපු නීතිඥයා. ඔහු නඩුව අරගෙන එනවා. දැන් මේවා අහඹු සිදුවීම්ද?

ඒ විතරක් නොවෙයි. අපි ඇල්ලුවා නීතිඥ මහත්මයෙක්. හොයලා බලන්න කෝ ඒගොල්ලන්ටත් කථා කළාද, නැද්ද කියලා ෆයිසර් නඩුව කරන්න. එච්චරයි මම කියන්නේ. නඩුව කරන්න නීතිඥයා එව්වේ ෆයිසර්, පැමිණිලි පාර්ශ්වයෙන්. එහෙම ඇමතිවරයෙක් තියාගෙන ඉන්න ඕනෑද මේ පාර්ලිමේන්තුවේ? ඇමතිවරයා මේ පාර්ලිමේන්තුවෙන් ඉල්ලා අස් වෙන්නේ නැත්නම්, ඉල්ලා අස් කරන විධියත් අපි දන්නවා. ඒක මතක තබා ගන්න. මේ රටේ දේශපාලනය මෙහෙම අනික් පැත්තට ලියන්න බැහැ, ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස තනි මිනිහෙකුට. මේ රටේ මුළු ප්‍රජාතන්ත්‍රවාදයම හකුළමින්, මැතිවරණ හකුළමින්, කුමන්ත්‍රණකාරී ලෙස කටයුතු කරන්න කාටද අයිතිය තිබෙන්නේ? ඒ නිසා පැමිණිල්ලත් එහෙමයි; පැමිණිලි පාර්ශ්වයත් එහෙමයි; නඩුවත් එහෙමයි. ඒ විතරක් නොවෙයි. අධිකරණයේ නඩුව දියත් වුණේ කොහොමද?

අපි දන්නවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩුවක් තිබෙනවා. මාසයකින් විතර ශ්‍රේෂ්ඨාධිකරණයේ තව පුරප්පාඩුවක් ඇති වනවා. දැන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩුව පිරවීමේදී අභියාචනාධිකරණය කෙරෙහි අවධානය යොමු කරනවා. අභියාචනාධිකරණයේ සභාපතිවරයාට සාමාන්‍යයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පනින්න ඉඩක් තිබෙනවා. මේවා ඒ උසස් වීම් බලාගෙන ලියැවෙන නඩු තීන්දු. මේවා නොතේරෙන බබ්බු නොවෙයි අපි. ඒක මතක තබා ගන්න.

ඊළඟට, බලන්න. මම මෙම කාරණය වග කීමෙන් කියනවා. ජනාධිපතිතුමා විසින් ව්‍යවස්ථා සභාවට, "මෙයා ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩුවට එවන්න" කියලා කාව පත්කර ලියා එවාවිද? බලමු, එහෙම නොවෙයිද කියලා. අපි බලාගෙන ඉඳිමු කාවද එවන්නේ කියලා; මොන නමද එවන්නේ කියලා. ඒ නිසා මේවාත්, සැලසුම් සහගත නඩු; සැලසුම් සහගත තීන්දු. ඒක තමයි ඇත්ත කථාව. මේක තමයි සිද්ධ වෙලා තිබෙන්නේ.

මේ ආකාරයට ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ජනතා නියෝජිතයන් තෝරා පත් කර ගැනීම සඳහා තිබෙන අයිතිය පිළිබඳව අපි කවුරුවත් විශ්වාස කළ යුතුව තිබෙනවාද? අපි පළාත් පාලන ආයතන ගොඩක් ජයග්‍රහණය නොකරන්න පුළුවන්. හැබැයි, ගරු සභාපතිතුමනි, අපට මේ ගැන අදහසක් තිබෙනවා.

අපේ දේශපාලනය අපි ගමට ගෙනියන්න ඕනෑ. ගමේ අපේ නියෝජිතයෙකු ඉන්න ඕනෑ. ගමේ නියෝජිතයා එක්ක කථා කරන්න ඕනෑ. ඒක තමයි දේශපාලනය කියන්නේ. දේශපාලනය තුළ ගේම් ගහලා කෙටි කාලයක් දුවන්න පුළුවන්. නමුත් සමස්ත දේශපාලනයම ගේම්වලින් රඳා පවතින්නේ නැති බව මතක තියා ගන්න. තමන්ගේ බල වුවමනාව වෙනුවෙන් ගේම් ගහපු ලෝකයේ බොහෝ නායකයන්ට උරුම වුණේ කුමක්ද? ගේම්වලින් දේශපාලනය තීරණය වනවා නම් අදත් මේ රටේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වෙන්න ඕනෑ. එයා මොනවාද, නොගහපු ගේම්? හැබැයි, එයා ජනාධිපති වුණේ නැහැ. ඒ, ඇයි? ගේම් ගහලා දේශපාලනය කිරීම තුළින් කෙටි කාලයක් සතුටු වෙන්න පුළුවන්. නඩු දාපු අයට අද parties දාන්න පුළුවන් වේවි; නඩුවේ ජයග්‍රහණය වෙනුවෙන් අද සතුටු වෙන්න පුළුවන් වේවි; අද නඩුවේ ජයග්‍රහණ වෙනුවෙන් හිනා වෙන්න පුළුවන් වෙයි.

කෙටි කාලයකට ගේම් ගහලා ලබන සතුට, දිගු කාලයක ප්‍රජාතන්ත්‍රවාදයේ විනාශයක් බවට පත් වන එක වළක්වන්න බැරි බව මතක තබා ගන්න. කෙටි කාලයක තෘප්තිය වෙනුවෙන්, කෙටි කාලීන වුවමනාවකින් ගහන ගේම්වලින් රටේ දේශපාලනය රඳා පවතින්නේ නැහැ. රටේ දේශපාලනය ගේම්වලින් රඳා පවතිනවා නම් මා නැවතත් කියනවා, තවමත් අපේ රටේ ජනාධිපති වෙන්න ඕනෑ මහින්ද රාජපක්ෂ මහත්මයායි කියා. ගේම්වලින් රටේ දේශපාලනය තීරණය වෙන්නේ නැහැ. මැතිවරණවලට බය වුණු, මැතිවරණවලින් පලා ගිය ලෝක නායකයන්ට ඉතිහාසයේ උරුම වී තිබෙන්නේ මොකක්ද? අපි ඕනෑවටත් වඩා ලෝක ඉතිහාසයේ දැකලා තිබෙනවා, මැතිවරණවලට බයේ පලා ගිය කණ්ඩායම්වලට උරුම වුණු තැන. ඒ නිසා මා ඉතාම වගකීමෙන් කියනවා, මේ තැන වර්තමාන ප්‍රධානීන්ට උරුම වෙන්න එපා කියලා. අපේ ප්‍රාර්ථනාව ඒක නොවෙයි. හැබැයි, ප්‍රාර්ථනා කරන ආකාරයටම බොහෝ දේ සිද්ධ වන්නේ නැහැ. දේශපාලන වශයෙන් දිග හැරෙන ප්‍රාර්ථනාවලට ඔබ්බෙන් ප්‍රාර්ථනාවලට බොහෝ දේවල් කරන්න පුළුවන් නම් දේශපාලනයක් අවශ්‍ය නැහැ කියා මා හිතනවා. ඒක සහතිකයි. ඒ නිසා අනිවාර්යය ලෙස මේ කුමන්ත්‍රණ පරාජයට පත් කළ යුතුයි.

එක පැත්තකින් මා කියනවා, ඡන්දවලට බියේ පලා ගිය නායකයන්ට දේශපාලන වශයෙන් උරුම වී තිබෙන තැන මොකක්ද කියා ඉතිහාසය කියවන්න කියා. අනික් අතට මා වගකීමෙන් කියනවා, මැතිවරණ කල් දැමීම නිසා අපේ රටේ ලේ වැගිරුණු ඉතිහාසය කියවන්න කියා. 1981 සංවර්ධන සභා මැතිවරණයේදී යාපනයේ ජනතාවට තමන්ගේ නියෝජිතයන්

[ගරු අනුර දිසානායක මහතා]

තෝරා පත් කර ගැනීමට සාධාරණ අයිතියක් තිබුණා. ඒ මැතිවරණය, පොඩි දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණයක්. ඒ මැතිවරණයේදී ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තමන්ගේ නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේ අයිතිය දුන්නේ නැහැ. යාපනය පුස්තකාලය ගිනි තබලා, පන්නල පොලීසියේ ඡන්ද පෙට්ටි පුරවලා, යාපනයට ගිය කෝච්චියේ කුරුණෑගල ඉඳලා ඡන්ද පෙට්ටි පටවාගෙන ගිහිල්ලා තමයි ඡන්දය පැවැත්වූවේ. නමුත් මොකක්ද වුණේ? එදා ඒ ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩ ලබා නොදීම නිසා තමයි ප්‍රභාකරන්ට මරාගෙන මැරෙන බෝම්බකරුවන් නිර්මාණය කළේ. ඒක තමයි ඉතිහාසය.

1982දී නියමිත ලෙස පවත්වන්න තිබුණු මහ මැතිවරණය නොපැවැත්වීම නිසා මොකක්ද සිද්ධ වුණේ? අපේ රටට ලේ වැගිරුණු ඉතිහාසයක් උරුම වුණා. නියමිත පරිදි මැතිවරණ නොපැවැත්වීම හේතු කොටගෙන ඇති තරම් ලේවලින්, මිනී කඳුවලින් පිරුණු රටක් මේක. මේ රටේ පොළොව යළිත් ලේවලින් තෙත් වෙන්න ඕනෑද කියා අපි තමුන්නාන්සේලාගෙන් අහනවා. මේ පොළොව යළිත් මිනිසුන්ගේ කඳුළුවලින් පිරෙන්න ඕනෑද? තවදුරටත් තමුන්නාන්සේලා කල්පනා කරන්නේ කෙටි කාලයකට තමුන්නාන්සේලාගේ බල වුවමනාව වෙනුවෙන් එවැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී දිසාවකට අවතීර්ණ වෙන්නද? ලෝක ඉතිහාසය ගත්තොත් ප්‍රජාතන්ත්‍රවාදයේ ඇකිලීම හා මැතිවරණ කල් දැමීම නිසා අපි ඕනෑවටත් වඩා අත්දැකීම් ප්‍රමාණයකට මේ වනකොට මුහුණ දීලා තිබෙනවා. මා නැවත කියන්නේ මේ කරුණු දෙකම -මැතිවරණවලට බයේ පලා ගිය නායකයන්ට උරුම වුණු ඉතිහාසයත්, මැතිවරණ කල් දැමීම හේතු කොටගෙන රටට සහ ලෝකයට උරුම වී තිබෙන ඉතිහාසයත්- ඉතා හොඳින් හදාරන්න කියලායි. යළි අපේ රටේ කවර තැනක හෝ කවර හෝ වර්ගයේ සන්නද්ධ ගැටුමක් අපේක්ෂා කරන දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි අපි. ඇති තරමට කඳුළු හලපු, ලේ හලපු, අත්දැකීම් සහිත, ජීවිත පරිත්‍යාග කරපු මිනිසුන් සමුදායකින් පිරුණු රටක් මේ රට. ඒ නිසා නියමිත පරිදි මැතිවරණ පැවැත්වීම ගේම්වලින් පස්සට දමන්නේ ඇයි කියා අපි අහන්න කැමැතියි. මෙය සරල නඩු තීන්දුවක් ලෙස අපි සලකන්නේ නැහැ. ඉතාම කුමන්ත්‍රණකාරී ලෙස, වංක වුවමනාවක් වෙනුවෙන් අධිකරණය උපයෝගී කර ගත්තා විතරක් නොවෙයි, නඩු කිව්වා විතරක් නොවෙයි, නඩු ඇහුවා. නඩු ඇහුවේ ඒගොල්ලන්. ෆයිසර්ට විරුද්ධ නඩුව; තාත්තාගේ junior පෙනී හිටිනවා. මුස්තාපාට එරෙහි මුස්තාපා - Musthapha vs Musthapha - නඩුවක් මේක. මේක fixed නඩුවක්. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා තමයි අධිකරණයෙන් ඔය වාගේ නියෝගයක් එන්නේ.

තමන්ට එරෙහිව මේ වාගේ බරපතළ නඩුවක් තිබෙනවා නම් ඇමතිවරයා රට යනවාද? මේ සියල්ලෙන්ම පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවෙයි, මේක ඉතා සැලසුම්සහගත නඩුවක් බවයි. අද මේකේ වාරණය -තීරණය- ලැබිලා තිබෙනවා. මා එදාත් මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, "තවමත් ලජ්ජා, බය තිබෙනවා නම් කරුණාකරලා මේ නඩුව ඉල්ලා අස් කර ගන්න" කියලා. මේ නඩුව ඉල්ලා අස් කර ගත යුතුයි. හැබැයි, දැන් වාරණයක් ඇවිල්ලා තිබෙනවා. දේශපාලන ව්‍යාපාරයක් හැටියට මැතිවරණ දිනා ගැනීම වෙනුවෙන් අපේ පාර්ශ්වයෙන් ගත හැකි හැම පියවරක්ම අපි ගන්නා බවට සහතික වනවා. අපි මුළුමනින්ම අධිකරණය පිළිබඳව විශ්වාසය තබන දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි.

හැබැයි, අධිකරණයේදී මේ සඳහා අපට ගත හැකි කුමන ක්‍රියා මාර්ගද තිබෙන්නේ, ඒ ඕනෑම ක්‍රියා මාර්ගයකට අපි අවතීර්ණ වෙන්න ලැස්තියි. විශේෂයෙන්ම අභියාචනාධිකරණයේ සභාපතිතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා දෙසැම්බර් 04වැනි දාට පෙර මෙම නඩුව විභාගයට ගන්න කියලා. මොකටද දෙසැම්බර් 04වැනි දා වෙනතෙක් කල් තියන්නේ? දෙසැම්බර් 04වැනි දා තෙක් නඩුව කල් තැබුවාම, ඊට ටික දවසකින් උසාවියේ නිවාඩු කාලය එනවා. නැවතත් උසාවි පටන් ගන්නේ ජනවාරි මාසයේ; ජනවාරිවල නඩුවේ තීන්දුව දෙනවා; ඒ තීන්දුවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට යනවා. එතකොට මේ මැතිවරණ සිතියම හැකිළෙනවා. මේ නඩු තීන්දුවත් එක්ක පැහැදිලි වන්නේ අන් කවරක්වත් නොවෙයි, මේ මැතිවරණ සිතියම හකුළන ලද බවක්. මැතිවරණ සිතියම හකුළපු එක නිවැරදි කරන්න නම්, මම අභියාචනාධිකරණයේ සභාපතිවරයාගෙන් ඉල්ලා සිටිනවා, මෙම නඩුව දෙසැම්බර් 04වැනි දාට පෙර විභාග කරන්න කියලා.

මේ නඩුවේ පැමිණිලි පාර්ශ්වය කවුද කියලා දන්නවා. ඒ තමුන්නාන්සේලාගේ සුරතලුන්; ඒ තමුන්නාන්සේලා වටේ ඉන්න චක්ගොල්ලයෝ. ඒ ගොල්ලන්ට කියන්න අධිකරණයට ගිහිල්ලා මේ පැමිණිල්ල අයින් කරගන්න කියලා. දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි මේ මැතිවරණයට අධිකරණය පැත්තෙන්, නීතිමය පැත්තෙන් අපට ගත හැකි හැම ක්‍රියා මාර්ගයක්ම ගන්නවා.

ගරු සභාපතිතුමනි, සමහර දේවල් බේරා ගන්න පුළුවන් අධිකරණයේ නීතිවලින් විතරක් නොවෙයි. සමහර දේවල් බේරා ගන්න වෙන්නේ මහ පාරේ නම්, අපි ලැස්තියි මහ පාරේදී මේ ප්‍රශ්නය බේරා ගන්න. තමුන්නාන්සේලා අප කැඳවන්නේ මහ පාරේදී මේ ගනුදෙනුව බේරා ගන්න නම්, මහ පාරේදී මේ ගනුදෙනුව බේරා ගන්න අපි ලැස්තියි. ඒ ගනුදෙනුව බේරා ගැනීම වෙනුවෙන් අපි සහතිකයක් දෙනවා. අප අතර නොයෙක් නොයෙක් දේශපාලන වෙනස්කම් තිබුණත්, මැතිවරණයක් දිනා ගැනීමේ සටනේදී ඕනෑම කෙනෙක් එක්ක ඒකාබද්ධව අපි වැඩ කරන්න ලැස්තියි!

සමහර ප්‍රශ්නවලදී තවත් කණ්ඩායමක් සමඟ අපි කවදාවත් එකට වාඩිවෙන්න කල්පනා කළේ නැහැ; එකට උද්ඝෝෂණය කරන්න ඕනෑය කියලා කල්පනා කළේ නැහැ. හැබැයි, ආණ්ඩුව හැසිරෙන්නේ මේ විධියට නම්, ආණ්ඩුවේ ක්‍රියා මාර්ග පෙළ ගැහිලා තිබෙන්නේ මේ විධියට නම්, කවුරුවත් නොහිතන බලවේග එක්ක අපි ලැස්තියි මේ මැතිවරණය ලබා ගැනීම වෙනුවෙන් සටන් කරන්න. මේ මැතිවරණය අපි ලබා ගන්න ඕනෑ, මේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ප්‍රශ්නයක් නිසා.

දේශපාලන පෙත අපට ඕනෑ විධියට ලියන්න පුළුවන්. ප්‍රජාතන්ත්‍රවාදීව දේශපාලන පෙත ලියනවා නම්, අපි කවුරුත් අත උස්සලා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස දේශපාලන පෙත ලියන්න ලැස්තියි. ඒ වෙනුවෙන් අපි දායකත්වය දෙන්න ලැස්තියි. හැබැයි ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පෙත වෙනුවට ඔබතුමන්ලා වෙන හිතුවක්කාරී, තක්කඩි, කුමන්ත්‍රණකාරී දේශපාලන පෙතක් නම් ඉල්ලා සිටින්නේ, ඒ වර්ගයේ දේශපාලන පෙතකට වුණත් මේ රටේ දේශපාලන බලවේග පෙළ ගස්වන්න අපි ලැස්තියි. මෙතෙක් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව ඉතිහාසයේ මොන ගැටලු තිබුණත්, මොන ප්‍රශ්න තිබුණත්, ඒවා අමතක නොකර ඉතිහාසයේ ඒ සිදුවීම්වලට ඒ බර එසේම තබමින්, මේ නිශ්චිත මොහොතේ ප්‍රජතන්ත්‍රවාදයට එල්ල වී තිබෙන තර්ජනයට කවර වර්ගයේ බලවේගයක් එක්ක හෝ එකතු වී අපි සටන් කරන්න ලැස්තියි. අපි ඒ සඳහා ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට, ප්‍රජතන්ත්‍රවාදය අපේක්ෂා කරන සියලුදෙනාට, මේ රටේ සිවිල් සංවිධානවලට, මේ රටේ සිවිල් පුරවැසියන්ට ආරාධනා කරනවා. තනි එක්කෙනෙක්-දෙන්නෙකුගේ හිතුවක්කාර, තක්කඩි වුවමනාව වෙනුවෙන් මේ රටේ ජනතාවගේ ඡන්ද අයිතිය පැහැර ගැනීමට දරන නිර්ලජ්ජිත උත්සාහය පරාජයට පත් කරන්න ඕනෑ. ඒ පරාජයට පත් කිරීම වෙනුවෙන් අපි අපේ පාර්ශ්වයෙන් ලබා දිය හැකි උපරිම මැදිහත්වීම කරනවා.

ගරු සභාපතිතුමනි, කවදාද මේ මැතිවරණය එන්නේ? පළාත් සභාවලට සීමා නිර්ණයක් තිබෙනවා. ඒක කවදා ඒවිද? කවදා වෙනකම් ඒවිද? තමුන්නාන්සේලා දිනන තෙක් මැතිවරණ තියන්නේ නැහැ කියලා කල්පනා කරනවා නම්, කවදාවත් මැතිවරණ තියන්න හම්බ වෙන්නේ නැහැ. මොකද, තමුන්නාන්සේලා කවදාවත් දිනන්නේ නැති නිසා. එච්චරයි කියන්න තියෙන්නේ. දිනන තෙක් මැතිවරණ තියන්නේ නැතුව ඉන්න උපකල්පනයක් තිබෙනවා නම්, කවදාවත් මැතිවරණ නැතිව යන්න ඕනෑ. කවදාවත් දිනන්නේ නැති කණ්ඩායමක් මැතිවරණ දිනන තෙක් මැතිවරණ නොතියනවාය කියලා උපකල්පනයක ඉන්නවා නම්, ඒ කියන්නේ මැතිවරණ නැහැ කියන එකයි. ඒ නිසා මැතිවරණ සිතියම හැකිළීම සඳහා මේ ගන්නා ලද ලජ්ජාසහගත, තක්කඩි, හිතුවක්කාරී ක්‍රියා මාර්ගය අකුළන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුව ප්‍රජාතන්ත්‍රවාදී කේන්ද්‍රස්ථානය බවට පත් වෙන්නේ, ප්‍රජාතන්ත්‍රවාදී කේන්ද්‍රස්ථානය යැයි කියන්නේ, ප්‍රජාතන්ත්‍රවාදයේ ගෙල සිඳීම සඳහා අත එසවීමෙන් නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරගැනීම වෙනුවෙන් සටන් කිරීමෙන්, හඬ නැඟීමෙන් පමණයි මේ පාර්ලිමේන්තුව ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික කේන්ද්‍රස්ථානයක් බවට පත් කර ගත හැකි වන්නේ. එසේ නැත්නම්, අපි තවත් රූකඩ විතරයි. අපි තවත් එහේට මෙහේට අත ඔසවන මිනිස් පඹයන් විතරයි.

අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව පිහිටුවන වෙලාවේ පැවැති විවාද පිළිබඳ හැන්සාඩ් වාර්තා මම කියෙව්වා. ඒ වෙලාවේ හිටපු ගරු සරත් මුත්තෙට්ටුවේගම මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේදී කළ කථාව කියවන්න. ඒ වාගේම, මේ රටේ මැතිවරණ කල් දැමීම සඳහා කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී මේ රටේ මිනිසුන් කරන ලද කථා කියවන්න. එදාත් ප්‍රජාතන්ත්‍රවාදය හැකිළීමට එරෙහිව මේ පාර්ලිමේන්තුවේ හඬක් තිබුණා. හැබැයි, ඒ හඬට ඇහුම්කන් නොදී ඒවා ඩෝසර් කරගෙන ගියා. හැබැයි, ප්‍රජාතන්ත්‍රවාදයේ ඩෝසර් කිරීම නතර වුණේ ප්‍රජාතන්ත්‍රවාදය විතරක් නොවෙයි, මුළු මිනිස් සමාජයක්ම ඩෝසර් කරලා විනාශයට පත් කරමින්. ඒ නිසා වර්තමාන අපේ පරම්පරාව මේ පාර්ලිමේන්තුවේදී හඬ නඟනවා, ප්‍රජාතන්ත්‍රවාදය හැකිළීම සඳහා මේ ගනිමින් තිබෙන ක්‍රියා මාර්ගය කරුණාකරලා හකුළා ගන්න කියලා. එසේ හකුළා ගන්නේ නැත්නම්, ප්‍රජාතන්ත්‍රවාදය විතරක් නොවෙයි බොහෝ දේවල් පොඩිපට්ටම් කරමින් යන අනාගතයක් තමයි නිර්මාණය වෙන්න ඉඩ කඩ තිබෙන්නේ. ඒ නිසා මේ කරන ලද තක්කඩි, හිතුවක්කාරී, කැත, නිර්ලජ්ජිත කුමන්ත්‍රණය ඒ කුමන්ත්‍රණකරුවන්ට අකුළා ගන්න කියලා නැවත නැවතත් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

දිවා ආහාරය සඳහා සභාවේ වැඩ පස් වරු 1.00 දක්වා තාවකාලිකව අත් හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**සහකාර මහ ලේකම්තුමිය**
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)

කරුණාකර, මූලාසනය සඳහා ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)

"ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்படி, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මහින්ද අමරවීර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාමත් වැදගත් අමාත්‍යාංශ ගණනාවක වැය ශීර්ෂයන් පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේ දී මට පෙර කථා කළ අනුර කුමාර දිසානායක, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉදිරිපත් කළ කාරණයක් පිළිබඳව අදහස් දක්වන්නට බලාපොරොත්තු වනවා. එතුමා දිගින් දිගටම කිව්වා, පළාත් පාලන මැතිවරණය කල් දැමීම සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ඒ වාගේම එහි නායකත්වය එම කටයුත්තට යම් ආකාරයකින් දායක වෙලා තිබෙනවාය කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හෝ එක්සත් ජනතා නිදහස් සන්ධානයට මේ මැතිවරණය කල් දැමීම සඳහා කිසිදු ආකාරයක වුවමනාවක් නැහැ කියන එක මම ඉතාම වග කීමෙන් සඳහන් කරන්නට කැමැතියි. ඒ වාගේම, මේ මැතිවරණය ඉතා ඉක්මනින් පැවැත්විය යුතුය කියන මතයේ අපි පැහැදිලිවම ඉන්නවාය කියන එකත් මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මැතිවරණය සම්බන්ධයෙන් අධිකරණයට පෙත්සම් කිහිපයක් ඉදිරිපත් වුණා. ඒ සම්බන්ධව අපේ මැති ඇමතිවරුන්ගේ නම්, ප්‍රදේශ පිළිබඳව කථා කරන්න පටන් ගත්තා. මේ රටේ සිටින බොහෝ පුරවැසියන් දේශපාලන පක්ෂවලට සම්බන්ධ වෙලා ඉන්නවා. විශේෂයෙන්ම

[ගරු මහින්ද අමරවීර මහතා]

මෙවැනි මැතිවරණ කටයුතු, එහෙම නැත්නම් මෙවැනි කාරණා සම්බන්ධව පෙත්සම් ඉදිරිපත් කරන්නේ, දේශපාලන පක්ෂවලට, දේශපාලනඥයන්ට සම්බන්ධ වෙලා සිටින අයයි. ඒක තමයි සත්‍ය කථාව.

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම් විධියට අද දිනයේ ඒ පෙත්සම් විභාගයට ගන්නා මොහොතේ මගේ අත්සනින් යුතුව දිවුරුම් ප්‍රකාශ සමඟ අවශ්‍ය නීතිඥවරුන් යොමු කළා. ඒ වාගේම, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම් දුමින්ද දිසානායක මැතිතුමාත් ඒ සඳහා අවශ්‍ය ලිපි ලේඛන අත්සන් කරලා, අපි වෙනුවෙන් නීතිඥවරුන් ඉදිරිපත් කළා. නීතිඥවරුන්ගේ ඉල්ලීම වුණේ, මේ පෙත්සම් නොසලකා හැරලා; මේවා නිෂ්ප්‍රභ කරලා මැතිවරණය කඩිනමින් පවත්වන්න අවශ්‍ය පියවර ගන්න කියලායි. මේ මැතිවරණය කල් දැමීම අපට හෝ රටට අවශ්‍ය දෙයක් කියලා මම හිතන්නේ නැහැ. නමුත්, ඕනෑම පුරවැසියෙකුට අධිකරණයට ඉදිරිපත් වීමේ අයිතියක් තිබෙනවා. ඔහු මොන දේශපාලන මතයක් දැරුවත්; කුමන දේශපාලන පක්ෂයක ක්‍රියාකාරිකයෙකු හෝ සාමාජිකයෙකු වුණත්; එහෙමත් නැත්නම් ඔහු කුමන මට්ටමක දේශපාලනඥයකු වුණත්, ඒ සඳහා ඔවුන්ට තිබෙන අයිතිය ඒ ආකාරයෙන්ම තිබෙන බවත් අපි හොඳටම පිළිගන්නවා. නමුත්, මම ඉතාමත් පැහැදිලිව නැවත නැවතත් කියන්නේ, පළාත් පාලන මැතිවරණය කල් දැමීමේ කටයුත්තට අපි කිසිදු ආකාරයකට සම්බන්ධ වුණේ නැහැ කියලායි. ඒ වාගේම, කඩිනමින් මේ මැතිවරණය පවත්වන්න අවශ්‍ය පියවර ගන්නවාය කියන එකත් මම සඳහන් කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ස්ථාවරය මේ ආකාරයට මම පැහැදිලිවම සඳහන් කරන්න කැමැතියි. යම් අධිකරණ කටයුත්තක් සිද්ධ වුණත්, එය ඉතාමත් කඩිනමින් අවසාන කර ගැනීම සඳහා පක්ෂය විධියට ඒ සඳහා අවශ්‍ය දායකත්වය ලබා දෙනවාය කියන එක ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා මේ ගරු සභාවේ සිටින අවස්ථාවේ දීම මම එතුමාට සඳහන් කරන්නට කැමැතියි.

ඒ සඳහා අපි පක්ෂය විධියට සාකච්ඡා කරලා තිබෙනවා. ඒ වාගේම සාකච්ඡා කරමින් යනවා. අතිගරු ජනාධිපතිතුමාගේ ස්ථාවරයත් එයයි කියන එක මම ඉතාම පැහැදිලිව සඳහන් කරන්නට කැමැතියි. ඒ වාගේම අපේ ලොකුම බලාපොරොත්තුව තමයි, සියලු ප්‍රාදේශීය සභා මැතිවරණ පවත්වා, එම මැතිවරණයෙන් පත් වෙන සභාපතිවරු දිවුරුම් දුන්නාට පසුව, එම සභාපතිවරුන්ගේ පළමුවැනි රැස්වීම අවම වශයෙන් සිංහල අවුරුද්දට පෙර පැවැත්වීම. ඒක තමයි අපි සතුටු වෙන කාරණය. ඒ සඳහා ගත හැකි සියලු ක්‍රියා මාර්ග ගැනීමට අපි පසුබට වෙන්නේ නැහැ කියන එක අප සඳහන් කරන්න කැමැතියි. එම කාරණය සම්බන්ධයෙන් මා ඊට වඩා පිළිතුරු දෙන්න උත්සාහ දරන්නේ නැහැ.

තමුන්නාන්සේ කියපු තව කතාවක් සම්බන්ධයෙන් මම යමක් කිව යුතුයි. දුරකථන tap කරනවා කියන කාරණය සම්බන්ධයෙන් යම් මන්ත්‍රීවරයකු අදහස් ඉදිරිපත් කළා. අතිගරු ජනාධිපතිතුමා හෝ මේ රජය හෝ කිසිදු ආකාරයකින් දුරකථන tap කිරීමකට සම්බන්ධ වෙන්නේත් නැහැ, එම කටයුත්ත සිද්ධ වෙන්නේත් නැහැ කියන එකත් මම පැහැදිලිව කියන්නට කැමැතියි.

ගරු අනුර දිසානායක මැතිතුමාගේ ප්‍රශ්නය සම්බන්ධව දීර්ඝව උත්තර දෙන්න තිබුණත්, මම ඒකට කාලය ගන්නේ නැහැ. අපි ප්‍රජාතන්ත්‍රවාදය ඉහළින්ම අගය කරන පක්ෂයක්. අපි ඒ වෙනුවෙන් කැප වෙන පක්ෂයක්. මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සඳහා මනාප ඡන්ද ක්‍රමය ඉවත් කරලා කොට්ඨාස මට්ටමේ මැතිවරණයක් පවත්වන්න ඕනෑය කියලා පැහැදිලි ස්ථාවරයක සිටි පක්ෂයක් තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. එසේ නැතුව පරණ ක්‍රමයට මැතිවරණ පවත්වන්න කියලා විවිධ බලපෑම් ආවා. විවිධ කණ්ඩායම් ඒ වෙනුවෙන් ඉදිරිපත් වුණා. සමහර වේලාවට ඔබතුමන්ලාගේත් තර්කය වුණේ, මොන ක්‍රමයකින් හරි මැතිවරණය පවත්වන්න ඕනෑය කියන එකයි. ඒක වෙන්න පුළුවන්. මම ඒකට අගෞරව කරනවා නොවෙයි. නමුත් අපිට ඕනෑ වුණේ, කොහොම හරි මැතිවරණයක් පවත්වන්න නොවෙයි. ජනතාව ප්‍රතික්ෂේප කරන, පක්ෂ අතර ඇන කොටා ගන්නා, එකිනෙකා කුළල් කා ගන්නා, කොට්ඨාසයට මන්ත්‍රීවරයෙක් නැති, මන්ත්‍රීවරයාට කොට්ඨාසක් නැති මුදල් මත මන්ත්‍රී ධුරය ලබා ගන්නා මේ මනාප ඡන්ද ක්‍රමය අහෝසි කරලා කොට්ඨාස මට්ටමේ ඡන්ද ක්‍රමයක් ඇති කිරීමයි. ඒ සඳහා පක්ෂයක් විධියට කැප වුණා නම්, ඊට ඉහළින්ම කැප වුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි කියන එක මට මේ අවස්ථාවේදී බය නැතුව සඳහන් කරන්න පුළුවන්. අපි ඒ වෙනුවෙන් මුල ඉඳලාම කටයුතු කළා.

**ගරු ලොහාන් රත්වත්තේ මහතා**
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
ගරු ඇමතිතුමනි, මට ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න ඉඩ දෙනවාද?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
අහන්න. හැබැයි, ඔබතුමාට ලබා දෙන වේලාවෙන් මට කාලය ලබා දෙන්න ඕනෑ. නැත්නම් එපා. මට ලබා දී තිබෙන වේලාව බොහොම සීමිතයි. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාරණය සම්බන්ධව වේලාව ගත කරන්න පුළුවන්කමක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාවේ දී ප්‍රශ්නය අහන්න. මම ඒකට උත්තර දෙන්නම්. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ගරු අමාත්‍යතුමාගේ කථාවට බාධා කරන්න එපා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න. [බාධා කිරීමක්]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මට වේලාව දෙන්න බැහැ. ඔබතුමා මට අතිරේක වේලාවක් දෙනවා නම් විතරක් පුළුවන්. එහෙම නැත්නම් මට වේලාව දෙන්න පුළුවන්කමක් නැහැ. මොකද, මම නියෝජනය කරන මෙම අමාත්‍යාංශය සම්බන්ධව මට කරුණු-කාරණා රාශියක් ඉදිරිපත් කිරීමට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශ කිහිපයක් පිළිබඳව කථා කරන අද දවසේ ගරු විමල් රාජපක්ෂ මැතිතුමා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳව යම් කාරණා කිහිපයක් සඳහන් කළා. අපි එතුමාගේ දැනුම හැල්ලුවට ලක් කරන්නේ නැහැ. එතුමා ඉතාම අධ්‍යයනයකින් යුතුව කථා කරන මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම එතුමා හිටපු කථානායකවරයෙක්. හිතුමතයට මහවැලියේ ඉඩම් බෙදා දීමක් සම්බන්ධ කාරණයක් එතුමා ඉදිරිපත් කළා. මහවැලි අධිකාරිය භාර අමාත්‍යවරයා විධියට අතිගරු ජනාධිපතිතුමාත්, එහි රාජ්‍ය අමාත්‍යවරයා විධියට

මමත්, නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට ගරු අනුරාධ ජයරත්න මැතිතුමාත් කටයුතු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්න කැමැතියි, අපි කිසිදු ආකාරයකින් මෙම ඉඩම් අයථා ආකාරයෙන් ලබා දීමේ වැඩ පිළිවෙළකට දායක වුණේ නැහැ කියන එක. මේ අවස්ථාවේදී ගරු චමල් රාජපක්ෂ මැතිතුමාත් සභා ගර්භයට පැමිණෙනවා.

ඔබතුමාට මම සඳහන් කරන්න කැමතියි, හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලව කලාපයේ එවන් කටයුත්තක් සිද්ධ වුණා නම්, ඒ සිද්ධ වුණේ ඉඩම් යම් ප්‍රමාණයක් නිවාස යෝජනා ක්‍රමයක් සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත වෙන් කරගෙන තිබුණු නිසා බව. ඒ දුන් ඉඩම් සම්බන්ධව යම් යම් ගැටලු ඇති වෙන්නට පුළුවන්. ඔබතුමා කිව්ව යම් යම් කාරණාවලට මමත් එකඟතාව පළ කරනවා. නමුත් ඊට පරිබාහිරව ජනාධිපතිතුමා හෝ මම හෝ අපේ නියෝජ්‍ය අමාත්‍යතුමාගේ මැදිහත්වීම මත හෝ කිසිම කෙනෙකුට වාසි වෙන ආකාරයෙන් හෝ අයථා ආකාරයෙන් මහවැලි ඉඩම් කිසිවක් ලබා දුන්නේ නැහැ කියන එක මට ඉතාම වගකීමෙන් සඳහන් කරන්න පුළුවන්.

**ගරු චමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
රුපියල් 50ක් බැඳලා ඉල්ලුම් පත් අරගෙන ඉල්ලුම් කරලා, ඉඩම් කච්චේරි තිබ්බ්ච ඒවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
අපේ හිටපු කථානායකතුමනි, මොන තරම් ඉඩම් ප්‍රමාණයක් බෙදිය හැකිව තිබෙනවාද කියලා අපි දැන් හඳුනා ගනිමින් යනවා. මහවැලි බල ප්‍රදේශය තුළ ඉඩම් කැබලි 1,000කට වැඩි ප්‍රමාණයක් විතර නිවාස අමාත්‍යාංශය හරහා බෙදා දීමක් සිද්ධ වුණා. මට තවමත් ඒ සංඛ්‍යා ලේඛන ලබා ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒවා හැරුණුකොට ජනතාවට ලබාදිය හැකි ඉඩම් තව කොච්චර ප්‍රමාණයක් තිබෙනවාද කියන එක පිළිබඳව අපි සොයා බලන්න කිව්වා. ඒ වාගේම ඒ ඉඩම් ලබාදීමේදී, හම්බන්තොට අනාගතයේ දී ඇති වන සංවර්ධනය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වලා ඉඩම් ලබාදීම තමයි අපේ අපේක්ෂාව බවට පත් වෙන්නේ. ඒ ඉඩම් හඳුනා ගැනීමෙන් අනතුරුව ඉඩම් කච්චේරියක් තියලා, නියම සුදුස්සන් තෝරාගෙන ඉඩමක් බලාපොරොත්තුවෙන් ඉන්න, ඉඩමක අයිතිවාසිකමක් නැති සාධාරණ කණ්ඩායමක් වෙත ඉඩම් ලබාදීම තමයි රජයේ බලාපොරොත්තුව; ජනාධිපතිතුමාගේ බලාපොරොත්තුව කියන එකත් මා සඳහන් කරන්න කැමතියි.

ගරු චමල් රාජපක්ෂ මැතිතුමනි, ඔබතුමාත් පිළිගන්නවා ඇති පසුගිය කාලයේ ඉඩම් ලබාදීම සම්බන්ධවත් යම් යම් ගැටලු තිබෙන බව. විශාල ප්‍රමාණයෙන් ඉඩම් අත්පත් කර ගැනීම් කරපු සමහර සභාපතිවරු, දේශපාලනඥයන් ඒ අතර ඉන්නවා. අද මහවැලි ඔප්පු ලබාදීමේදී ඔප්පු 200ක් විතර තිබෙනවා, අයිතිකාරයෝ එන්නේ නැහැ. නමුත් ඒවාට ඉඩම් වෙන් වෙලා තිබෙනවා. ඒ ඉඩම්වල අයිතිකාරයෝ හැටියට කුරුණෑගල පළාතේ අයගේ නම් තිබෙනවා; ගම්පහ අයගේ නම් තිබෙනවා. ඒ විධියට විවිධ ව්‍යාජ නම් ඉදිරිපත් කරලා ඔප්පු සකස් කර තිබෙන බව අපට දැන ගන්න තිබෙනවා. ඒ අය ඉදිරිපත් වෙන්නේ නැහැ. නමුත් මේ ඉඩම් සමහර ප්‍රාදේශීය මට්ටමේ දේශපාලනඥයන් අරගෙන තිබෙනවා. සමහර සභාපතිවරු විශාල ඉඩම් ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. ඒ වාගේම චමල් රාජපක්ෂ මැතිතුමා ඒ කාරණාවලට කිසිසේත් දායක වුණේ නැහැ කියන කාරණයත් මා එතුමාට ගෞරවයක් විධියට සඳහන් කරන්න ඕනෑ. මේ කාරණා මෙවන් ආකාරයට අනාගතයේදී නොවෙන්න, චෝදනා එල්ල නොවන ආකාරයට රජයේ ඉඩම් ලබාදීමේ වැඩ පිළිවෙළට ජනාධිපතිතුමා දැනටමත් ක්‍රමවේදයක් සකස් කරගෙන යන බව මා සඳහන් කරන්න කැමතියි. මහවැලියේ ප්‍රසිද්ධ කථාවක් තිබෙනවා. ඒ තමයි "මහවැලි ඉඩම් ඉල්ලුවොත් පරාදයි; ඇල්ලුවොත් දිනුම්" කියලා. ඒ කියන්නේ මහවැලි ඉඩමක් ඉල්ලලා ගත්ත අය බොහොම අඩුයි. කච්චේරියකට ඉදිරිපත් වෙලා සාධාරණ විධියේ ඉල්ලීමක් කරලා ඉඩමක් ගත්ත පිරිස අඩුයි. අල්ලා ගත්ත ප්‍රමාණය ඉතා ඉහළයි. හැබැයි, බලපුළුවන්කාරයින්, ඒ වාගේම යම් හැකියාවක් තිබෙන කණ්ඩායමක් විතරයි ඉඩම් අල්ලා ගත්තේ. ඒ අල්ලා ගත් ඉඩම් තමයි මිනිස්සු සල්ලි දීලා ගත්තේ කියන එක තමයි මහවැලිය පිළිබඳව තිබෙන කථාව. ඒ කථාව වෙනස් කිරීම සඳහා ජනාධිපතිතුමා, ඒ වාගේම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු සියලුම නිලධාරින් මේ වන විට විධිමත් ඉඩම් ප්‍රතිපත්තියක් සකස් කරමින් යනවා.

අපි පසුගිය මාසයේ කැඳෙව්වා, මහවැලියෙන් ඉඩම් ගත්ත ආයෝජකයන් කණ්ඩායමක්. ඒ කණ්ඩායම අතර, ආයෝජනය සඳහා අක්කර 30, 40, 50, 100 ගත්ත අය හිටියා. දැන් අපි හොයාගෙන යනවා, ඒ ගත්ත ඉඩම්වල ආයෝජනයන් ඒ ආකාරයෙන් සිද්ධ වෙනවාද කියලා. සමහර අය සාර්ථකව ඒ කටයුතු කරගෙන යනවා. ඒ අයට තිබෙන ගැටලු හඳුනාගෙන ඒ අයට උදව් කරන්නත් අපි කටයුතු කරනවා. ඒ වාගේම යම් කෙනෙකු ආයෝජනවලට කියලා, ව්‍යාපෘතිවලට කියලා ඉඩම් අරගෙන ඒවා ඵලදායි විධියට යොදාගෙන නැත්නම් අපි අනිවාර්යයෙන්ම ඒ ඉඩම නැවත පවරා ගෙන එය සාර්ථක කටයුත්තකට ලබා දෙන්න අවශ්‍ය පියවර ගන්නවා කියන එකත් මම කියන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වේලාව ගියා.

කෙසේ වෙතත්, අපි විශිෂ්ට කාර්යභාරයක් කළා. ජනාධිපතිතුමාගේ ඉලක්කයක් තිබුණා, ඔප්පු ලක්ෂයක් ලබා දෙන්න. වලව බල ප්‍රදේශයේ විතරක් ඔප්පු 18,500ක් ලබා දීමේ ඉලක්කය තිබුණා. මහවැලියේ වලව ප්‍රදේශයේ ඔප්පු 18,378ක් ලබා දීමට සමත් වුණා වාගේම, ඔප්පු ලක්ෂයෙන් 86,870ක ඉලක්කයක් සම්පූර්ණ කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඔප්පුවක් බලාපොරොත්තුවෙන් සිටි, අවුරුදු ගණනාවක් කාර්යාල පස්සේ ගිය අයට ඒ අවස්ථාව ලබා ගන්න පුළුවන්කම ලැබුණා කියන එකත් මම ඔබතුමාට කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අමතක කරන්න හොඳ නැති කාරණයක් තිබෙනවා. පසු ගිය කාලයේ දැඩි නියඟයක් ඇති වුණා. මහවැලි බල ප්‍රදේශයටත් ඒ ආකාරයෙන්ම නියඟය බලපෑවා. ඒ වාගේම රට පුරා වගා කළ හැකිව තිබූ කෘෂි කාර්මික බිම්වලින් අඩකට පොඩ්ඩක් වැඩියෙන් තමයි වගා කළේ. ඒ කාරණය අමතක කරලා තමයි සහල් රටින් ගේනවා, ඒ වාගේම රටේ ආහාර හිඟයක් තිබෙනවා කියලා කථා කරන්නේ. සහල් පිටරටින් ගෙනෙන්න සිදු වුණේ දැඩි නියඟය නිසා කන්න තුනක් පමණ අසාර්ථක වුණු නිසායි. නමුත් මහවැලි බල ප්‍රදේශයේ ඉතා අඩු ජල පරිභෝජනයක් තුළ සාර්ථකව වගා කටයුතු කර ගන්න

[ගරු මහින්ද අමරවීර මහතා]

හැකියාව ලැබුණා. සැලකිය යුතු අස්වැන්නක් ලබා ගත්තා වාගේම, ඉතිහාසයේ වැඩිම මිලකට ඒ වී ටික විකුණා ගන්නත් අවස්ථාව ලැබුණා කියන එක මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම නියඟය වෙනුවෙන් ඉතිහාසයේ වැඩිම ආධාර ප්‍රමාණයක් ලබා දුන් රාජ්‍ය නායකයා බවට අපේ ජනාධිපතිතුමා පත් වුණා. මමත් ආපදා කළමනාකරණ අමාත්‍යවරයා විධියට අවුරුදු ගණනාවක් කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මහා දැවැන්ත හානිය පියවා ගන්න ගමන් තමයි ආපදා කටයුතුවලට රුපියල් මිලියන 38,000ක මුදලක් මේ රජය ජනතාව වෙත ලබා දුන්නේ. යම් යම් මූල්‍ය අර්බුද ඇති වෙන්න ඒකත් හේතුවක්. මේක හංගලා කථා කරන්න ඕනෑ නැහැ. අපි ඇත්ත කථා කරන්න ඕනෑ.

ජනාධිපතිතුමා ආරම්භ කරපු වස විස නැති වගා වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට සෑම ආකාරයකින්ම කටයුතු කරනවා. එයින් සාර්ථක ප්‍රතිඵල අත්වෙමින් යනවා. ඒ එක්කම කිව්වා "රජරටින් ජනාධිපතිතුමා පත් වුණා, පිටරටින් සහල් ගෙනාවා" කියලා. මම ඒකට පිළිතුරු දුන්නා. ඒ වාගේම කිව්වා, රජරට ගොවියෙකුගේ පුතෙක් ජනාධිපති වෙලා, පොහොර සහනාධාරය කපලා දැම්මා කියලා. වී ගොවියා වෙනුවෙන් පොහොර මිලදී ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ඒ ආකාරයෙන්ම ලැබෙනවා කියන එකත් මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. ගොවියා වෙත ලබා දෙන සහනාධාර ඒ ආකාරයෙන්ම ලබා දෙනවා පමණක් නොවෙයි, ගොවි ජනතාව ශක්තිමත් කිරීම සඳහා ගොවියෙකුගේ පුතෙක් රටේ ජනාධිපති වුණු වෙලාවේ ගත හැකි, ගත යුතු සියලු ක්‍රියාමාර්ග ගන්න බවටත් සිහිපත් කරමින්, මේ අමාත්‍යාංශයේ කටයුතු කරගෙන යාමට අපට උර දුන් අමාත්‍යාංශ ලේකම්තුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු සියලු නිලධාරීන්ට අපගේ ප්‍රශංසාව පළ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු සිසිර කුමාර අබේසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.17]

**ගරු සිසිර කුමාර අබේසේකර මහතා**
(மாண்புமிகு சிசிர குமார அபேசேகர)
(The Hon. Sisira Kumara Abeysekara)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. අද අපේ රටේ කෘෂිකර්මය දිහා බැලුවොත්, මේ යහ පාලනය යටතේ ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වෙනවා කියලා අපි දන්නවා. නමුත් සොබා දහමට අනුව ඇති වූ වැසි හිඟය නිසා අද නොයෙක් පළාත්වල නියඟයක් ඇති වෙලා තිබෙනවා. අක්කර 15ක් වී ගොවිතැන් කරන ගොවියෙක් හැටියට මමත් ඒ ගැන දන්නවා. අද විශාල අර්බුදකාරී තත්ත්වයක් හලාවත ප්‍රදේශයේ, පුත්තලම ප්‍රදේශයේ ඇති වෙලා තිබෙනවා. දැනට මාස හතරකට උඩදී අපි අපේ ගරු අගමැතිතුමා සමඟ සාකච්ඡා කරන අවස්ථාවකදී එතුමා සංකල්පයක් හැටියට කිව්වා, සියලුම වැව් මේ නියඟ කාලය තුළ සංවර්ධනය කරලා හදන්න කියලා. අපි දන්නවා ඒ වෙනුවෙන් විශාල මුදලක් ලැබී තිබෙනවා කියලා. අපි දැන් එම කටයුත්ත කරගෙන යනවා. මගේ ආසනයේ වැව් 24කට මුදල් ලැබිලා තිබෙනවා. අපි එම කටයුත්ත ඉතාම හොඳින් කරගෙන යනවා. අපේ හිටපු කථානායකතුමා කිව්වා මේ වැව් කපනකොට හරි පිළිවෙළකට කපන්න ඕනෑ කියලා. ඒ කථාව ඇත්ත. අපි අදාළ නිලධාරීන් සමඟ එකතු වෙලා නිවැරදිව, හරියාකාරව රොන් මඩ ටික ඉවත් කරන්න නිගමනය කර ගෙන තිබෙනවා. අපි දන්නවා වැවක සොරොව්වක් තිබෙනවා නම්, ඒ සොරොව්වේ කටේ ඉඳලා අඟලක් පහළට වැවේ පස් ඉවත් කළාට ප්‍රශ්නයක් නැහැ කියලා. නමුත් අපේ ගම්වල තිබෙන වැව්වල අඩි දෙකක් විතර රොන් මඩ ඉවත් කරන්න ඕනෑ.

ඒ නිර්දේශ ලැබී තිබුණත් අපට මේ ක්‍රමවේදය තුළ ඉස්සරහට යන්න හරි අමාරුකාර තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අපි දන්නවා, අපේ යහ පාලනය තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය සහ තවත් පක්ෂ ගණනාවක් එකමුතු වෙලා රජයක් හදා තිබෙන බව. නමුත් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් වන අප නිහතමානීව, නිහඬව සිටියාට කෘෂිකර්ම අමාත්‍යාංශය, වාරිමාර්ග අමාත්‍යාංශය අපට දක්වන සැලකිලිවල පොඩි අඩු පාඩුවක් තිබෙනවා. මොකද, අපි දන්නවා, අප වැඩ කරන්න ඕනෑ ගොවි නිලධාරීන් සමඟයි, ගොවි නියාමකයන් සමඟයි කියා. ඒ අය පත්වීම් ලබා තිබෙන්නේ මීට පෙර ආණ්ඩුවෙන්. ඒ ආණ්ඩුවෙන් පත්වීම් ලැබූ අය හැම තැනකදීම එක්සත් ජාතික පාක්ෂිකයන්ට කිසි දෙයක් දෙන්නේ නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ දිස්ත්‍රික්කය රාජ්‍ය අමාත්‍යතුමාට සම්පූර්ණයෙන් බාර දීලායි තිබෙන්නේ. එතුමා ඔබතුමාගේ පක්ෂයේයි.

**ගරු සිසිර කුමාර අබේසේකර මහතා**
(மாண்புமிகு சிசிர குமார அபேசேகர)
(The Hon. Sisira Kumara Abeysekara)
ඒක ඇත්ත. අපි පිළිගන්නවා. නමුත් ඉතින්, එතුමා සලකන්නේ නැති එකට මා මොකද කරන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, ගරු සිසිර කුමාර අබේසේකර මන්ත්‍රීතුමාට තිබෙන්නේ වෙන් කළ වෙලාවෙන් තවත් විනාඩි දෙකක කාලයක් පමණයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
හරි, හරි.

**ගරු සිසිර කුමාර අබේසේකර මහතා**
(மாண்புமிகு சிசிர குமார அபேசேகர)
(The Hon. Sisira Kumara Abeysekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට එවැනි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. අපි අමාත්‍යවරුන්ට කියනවා, අනේ අමාත්‍යවරුනි, පුළුවන් නම් මේ ගැන සොයා බලා, ඒ තත්ත්වය වළක්වන්න කියා. මොනවා හෝ ආධාර දුන්නත්, ඒ ගොවි නියාමකයෝ ඒවා අපේ එක්සත් ජාතික පාක්ෂිකයන්ට දෙන්නේ නැහැ. නියං ආධාර දුන්නත් එහෙමයි. වැවක් කපන්න ගොවි සමිතියෙන් පුද්ගලයන් ගත්තත් අපේ උදවියට අවස්ථාව දෙන්නේ නැහැ. මෙවැනි හරි අමාරු තත්ත්වයකින් තමයි අප කටයුතු

කරගෙන යන්නේ. නමුත් අපි නම් එහෙම හිතලා නැහැ, යහ පාලනය ගැන. අප හිතලා තිබෙන්නේ උතුම් මනුස්සකමින් මේ යහ පාලනය කරගෙන යන්න පුළුවන් කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වැඩි වෙලාවක් නැති නිසා තවත් එක කාරණයක් කියා කතාව අවසාන කරනවා. අපේ හිටපු ගරු ජනාධිපතිතුමා අපට පණිවුඩයක් ගෙනාවා, අද මැතිවරණය නවත්වලා කියා. හැබැයි මා දන්නා තරමට, මා සොයපු කරුණු අනුව ලබන මස 4වන දා දක්වා වාරණ නියෝගයක් දී තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී රටක එය අනිවාර්යයෙන් දිය යුතුයි. මොකද, අධිකරණය රටේ සෑම පුරවැසියකුටම තිබෙන අයිතිය ආරක්ෂා කරන්න ඕනෑ. නමුත් පෞද්ගලිකව මා මේකට විරුද්ධයි. අපි මෙයට විරුද්ධ වනවා. මා විතරක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු 78දෙනෙක් ඉන්නවා. මේ කාරණය ගැන කතා බහට ලක් වන ආකාරය අනුව මම හිතනවා, ඒ 78 දෙනාම මෙයට විරුද්ධයි කියා. අපට ඕනෑ වෙලා තිබෙන්නේ මැතිවරණයක්. අපි දන්නවා මැතිවරණයක් පහු වෙන්න, පහු වෙන්න එක්සත් ජාතික පක්ෂයටයි අවාසි කියා. හිටපු ජනාධිපතිතුමා පාරට බැහැලා එයට විරෝධය පළ කරනවා කිව්වා. ජනතා විමුක්ති පෙරමුණත් පාරට බැහැලා විරෝධය පළ කරනවා කිව්වා. ඒ අවස්ථාවේදී මා ඇතුළුව අපේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් 78 දෙනාත් පාරට බැහැලා කියනවා, "අපට මැතිවරණයක් ඕනෑ." කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මැතිවරණය පවත්වන්න අවශ්‍ය කටයුතු ඉක්මනින්ම කර දෙන්න කියා අපේ නායකතුමන්ලාගෙන් ඉල්ලමින්, අද දින වචන ස්වල්පයක් කතා කරන්න ලැබීම ගැන තමුන්නාන්සේට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Douglas Devananda, you have 15 minutes.

[பி.ப. 1.23]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற கமத்தொழில் அமைச்சு, மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு, நீர்ப்பாசன மற்றும் நீர் வளமூல முகாமைத்துவ அமைச்சு, ஆரம்பக் கைத்தொழில் அமைச்சு ஆகிய நான்கு அமைச்சுக்களின் குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு, எனது கருத்துக்களையும் முன்வைப்பதற்கு வாய்ப்பளித்தமைக்கு முதலில் உங்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

சூழல் மாசடைகின்ற நாடுகளில் இலங்கை ஐந்தாவது இடத்தில் இருப்பதாக மத்திய சுற்றாடல் அதிகார சபையின் பணிப்பாளர் நாயகம் தெரிவித்திருக்கின்றார். அந்த வகையில், எமது நாட்டில் சூழலை மிகவும் துரிதப்போக்கில் மாசடையச் செய்கின்ற காரணிகளைக் கொண்ட மாகாணங்களில் வடக்கு மாகாணமே முதன்மை வகிக்கின்ற நிலை காணப்படுகின்றது. வடக்கில் சூழலுக்குப் பாதகம் ஏற்படுத்துகின்ற ஓரிரு செய்திகளையாவது தமிழ் ஊடகங்களில் நாளாந்தம் காணக்கூடிய அளவுக்கு எமது பகுதிகளில் அவ்வாறான செயற்பாடுகள் மேற்கொள்ளப்பட்டு வருவதை அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. இது, இந்த அரசின் தவறா, அல்லது, அரச அதிகாரிகளின் தவறா, அல்லது, எமது மக்கள் தெரிவுசெய்திருக்கின்ற அரசியல் பிரதிநிதிகளின் தவறா, அல்லது, எமது மக்களின் துரதிருஷ்டவசமான நிலைமையா? என்றே கேட்கத் தோன்றுகின்றது.

வடக்கு மாகாணத்திலே இருக்கின்ற மாவட்டங்களின் பொருளாதார வளங்கள் யாவும், சூழலுக்குப் பாதிப்பினை ஏற்படுத்துகின்ற வகையில் அபகரிக்கப்பட்டு, அவை பிற மாவட்டங்கள் நோக்கி நகர்த்தப்படுகின்ற நிலையில், கிளிநொச்சியும் முல்லைத்தீவும் யாழ்ப்பாணமும் ஏன், இன்று வறுமை மிக அதிகம் கொண்ட மாவட்டங்களாகப் பின்தள்ளப்பட முடியாது? என்றே கேட்க விரும்புகின்றேன். முன்பு எமது மக்கள் மத்தியில் உழைப்பும் நம்பிக்கையும் இருந்தது. இன்று சுயலாப தமிழ் அரசியல் தலைமைகளின் தவறான வழிகாட்டலால் அவர்களின் உழைப்பும் நம்பிக்கையும் சிதைந்து, எமது பகுதியின் சூழல் மாசடைந்திருப்பதுபோல், சமூகமும் மாசடைந்துள்ள நிலைமையினையே காணக்கூடியதாக இருக்கின்றது.

யாழ்ப்பாணத்தில் மருதங்கேணி, மண்டைதீவு, அரியாலை கிழக்கு, கிளிநொச்சியில் வன்னேரிக்குளத்தின் பின்பகுதி, அக்கராயன் ஆற்றுப்படுக்கை, சுபாஸ் குடியிருப்பு, மணியங்குளத்தின் பின்பகுதி, கிளாலி கடற்கரைக் கிராமம், பூநகரி, குடமுருட்டி, கண்ணகிபுரம், முல்லைத்தீவு, கொக்காவில், துணுக்காய், பழைய முறிகண்டிக் கிராமம், ஒட்டுசுட்டான் பிரதேசத்திலுள்ள பேராறு, மன்னக்கண்டல், மேளிவனம், கனகராயன் ஆறு, ஒலுமடு, தென்னியங்குளம் என வடக்கு மாகாணத்தின் எல்லா இடங்களிலும் தொடரும் சட்டவிரோத மணல் அகழ்வுகள் காரணமாக விவசாயப் பயிர்ச்செய்கைகள் பாதிப்புகளுக்கு உட்பட்டும், உவர்நீர் விவசாய நிலங்களுக்குள் நுழைந்தும் இருக்கின்றன. அதுமாத்திரமன்றி, இந்நடவடிக்கை கடலரிப்புக்கும் காரணமாகியிருக்கின்றது. அத்துடன், மணலுக்கான செயற்கைத் தட்டுப்பாடு ஏற்படுத்தப்பட்டு, அதிக விலைக்கு மணலை விநியோகிக்கின்ற கறுப்புச் சந்தைகள் உருவாக்கப்பட்டு, எமது மக்களுக்கு கிடைக்கின்ற வீடமைப்புத் திட்டங்கள் மற்றும் ஏனைய கட்டுமானப் பணிகளில்கூட தடைகளை ஏற்படுத்துகின்ற செயற்பாடுகள் திட்டமிடப்பட்டு அங்கு மேற்கொள்ளப்பட்டு வருகின்றன.

அதுபோன்று, கிளிநொச்சி மாவட்டத்தின் முழங்காவில் உள்ளிட்ட பகுதிகள் அடங்கலாக முல்லைத்தீவு மாவட்டத்தின் பல பகுதிகளிலும் சட்டவிரோத காடழிப்பு நடவடிக்கைகள் திட்டமிட்ட வகையில் மேற்கொள்ளப்பட்டு வருகின்றன. இங்கிருந்து பெருந்தொகையாக பெறுமதிமிக்க மரங்கள் வெட்டப்பட்டுப் பிற மாவட்டங்களுக்கு கடத்தப்படுகின்ற செயற்பாடுகள் சர்வ சாதாரணமாக இடம்பெற்று வருகின்றன. இத்தகைய காடழிப்புச் செயற்பாடுகளால், இருக்கின்ற குறிப்பிட்ட சில நீர்வள மூலங்களும் மலட்டுத் தன்மையை எதிர்நோக்கிவரும் நிலையில், விவசாயத்தை நம்பி வாழுகின்ற எமது மக்களின் வாழ்வாதாரங்களின் இருப்பு கேள்விக்குறியாக இருக்கின்ற நிலையில், எமது பகுதிகள் வறுமை நிலையில் முதல் இடங்களைப் பிடித்துக்கொண்டிருப்பதில் ஆச்சரியப்படுவதற்கு ஒன்றுமே இல்லை என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

சூழலைச் சவாலுக்கு உட்படுத்துகின்ற இத்தகைய செயற்பாடுகளால் காட்டு யானைகள் உள்ளிட்ட காட்டு விலங்குகளின் தொல்லைகள் காரணமாக, மேற்கொள்ளப்படுகின்ற பயிர்ச்செய்கைகள்கூட அழிக்கப்படுகின்ற நிலைமைகள் தொடருகின்றன. எமது மக்கள் தங்களுக்கான குடிசையைக் கட்டிக்கொள்வதற்காக ஒரு

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

தடியினை வெட்டினாலே காடழிப்பு எனக் கூறி கைதுசெய்கின்ற சம்பவங்கள் நடக்கின்ற எமது மக்களது மண்ணிலே, பெறுமதிமிக்க பெருந்தொகையான மரங்கள் இயந்திரங்களைக் கொண்டு பிற மாவட்டங்களைச் சேர்ந்தவர்களால் வெட்டிச் செல்லப்படுவது ஏன், காடழிப்பாகக் கொள்ளப்படுவதில்லை? என்பது ஆச்சரியமான விடயமாக இருக்கின்றது. எனவே, வடக்கு மாகாணத்தில் சூழலுக்குப் பாதிப்பினை ஏற்படுத்துகின்ற அனைத்துச் செயற்பாடுகளும் நிறுத்தப்பட வேண்டும் என்றும் அதற்கெதிரான சட்டங்கள் தராதரங்கள் பாராது அனைவருக்கும் பொதுவானதாக வலுவுள்ள வகையில் அமுல்படுத்தப்பட வேண்டும் என்றும் வலியுறுத்த விரும்புகின்றேன்.

தோட்டச் செய்கையோடும் நெற்செய்கையோடும் தொடர்பான இரு வேறுபட்ட விவசாயச் செய்கைகள் வடக்கு மாகாணத்திலே காலாகாலமாக மேற்கொள்ளப்பட்டு வருகின்றபோதிலும் யாழ். குடாநாடானது அதிகளவில் தோட்டச் செய்கைக்கே முக்கியத்துவம் பெற்று விளங்குகின்றது. அங்கு துண்டு நிலங்களையும் தரைக்கீழ் நீர் வளத்தையும் பயன்படுத்தி வேறு எப்பகுதியிலும் காணப்படாத வகையில் செறிவான முறையில் மேற்படி பயிர்ச்செய்கை மேற்கொள்ளப்பட்டு வருவது குறிப்பிடத்தக்கது. ஏனைய சிறு அளவிலான நிலப்பகுதிகள் நெற்செய்கைக்கெனப் பயன்படுத்தப்பட்டு வருகின்றன. புகையிலை, மிளகாய், வெங்காயம், பழ வகைகள், உருளைக்கிழங்கு, காய்கறிகள், தினை வகைகள் என்பன இங்கே பெருமளவில் பயிரிடப்படுகின்றன. அந்த வகையில் யுத்தத்திற்கு முற்பட்ட காலப்பகுதியில் இலங்கையில் வெங்காயச் செய்கைக்கு உட்படுத்தப்பட்ட நிலப்பரப்பில் 38 சதவீதத்தினையும் மிளகாய்ச் செய்கைக்கு உட்படுத்தப்பட்ட நிலப்பரப்பில் 15 சதவீதத்தினையும் யாழ். குடாநாடே கொண்டிருந்தது. யாழ். குடாநாடு தவிர்ந்த வடக்கின் பிரதான நிலப்பகுதியிலுள்ள மேட்டுநிலப் பயன்பாட்டுப் பகுதிகள் தோட்டப் பயிர்ச்செய்கைக்கும் தாழ்நிலப் பயன்பாட்டுப் பகுதிகள் நெற்செய்கைக்குமான முக்கியத்துவத்தைக் கொண்டிருக்கின்றன. ஆற்று வடிநிலப் பகுதிகள், நீர்த்தேக்கங்களை அண்டிய பகுதிகள், வண்டல் மண், களிமண் படிவுகளைக் கொண்ட தாழ்வான பகுதிகள் என்பன நெற்செய்கை மேற்கொள்ளப்படுகின்ற நிலங்களாக உள்ளன. மேற்குறிப்பிட்ட இருவேறு நீர்வள மூலங்களும் சூழலைப் பாதிக்கின்ற செயற்பாடுகளினால் இன்று மலட்டுத் தன்மையை அடைந்துள்ளன என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

எமது நாட்டில் அதிகரித்து வருகின்ற சனத்தொகைக்கு ஏற்ப உணவு உற்பத்தியினைப் பெருக்கவேண்டியது அத்தியாவசியமானதொரு ஏற்பாடாக இருத்தல் வேண்டும். அண்மைக்காலமாக அரிசியை இறக்குமதி செய்து கொண்டிருப்பதுபோல், ஏனைய அனைத்து உணவுப் பொருட்களுக்கும் இறக்குமதியினையே நம்பி வாழுகின்ற சூழல் ஏற்படுமானால், அது எமது பொருளாதார வளர்ச்சிக்குப் பாரிய பாதகத்தினை ஏற்படுத்துவது மட்டுமல்லாது, எமது மக்களில் பெருந்தொகையினரைப் பட்டினிக்குள்ளும் வாழ்வாதாரங்கள் இன்றிய வெறுமைக்குள்ளும் தள்ளிவிடும் என்பது உறுதியாகும். எனவே, எமது நாட்டின் விவசாய உற்பத்திகளுக்குப் பெரும் பங்களிப்பினை வழங்கி வந்திருக்கும் எமது பகுதியின் விவசாயத்துறையினை மீண்டும் தூக்கிநிறுத்த வேண்டுமானால், வடக்கு மாகாணத்திற்கென நீர்ப்பாசனக் கொள்கைத் திட்டம் ஒன்று அவசியமாகும். அந்தவகையில் பார்க்கின்றபோது, விவசாயப் பொருட்களின் இறக்குமதி, விவசாய உள்ளீடுகளின் விலையுயர்வு, முறையான நீர்ப்பாசன வசதியின்மை, உயர்ரக விதைகள் இன்மை, கிருமிகள் மற்றும் நோய்களின் தாக்கங்கள், நிலத் துண்டாக்கம், சிறிதளவு நிலப் பயன்பாடு என்பவையே எமது விவசாயச் செய்கையைப் பாதிக்கின்ற பிரதான காரணிகளாக இருக்கின்றன. இவற்றை அகற்றக்கூடிய வழிவகைகளை இந்த அரசு மேற்கொள்வதற்கு முன்வர வேண்டியது அவசியமாகும்.

அத்துடன், விவசாயத் தொழில்நுட்பத்தை விரிவாக்கம் செய்தல், வர்த்தக சேவையை வலுவூட்டல், தனியார் முயற்சிகளைப் பலப்படுத்துதல், விவசாயத் தகவல் தொழில்நுட்பத்தினை விருத்தி செய்தல், விவசாய வளங்களைப் பாதுகாத்தல் போன்ற ஏற்பாடுகளையும் மேற்கொள்வதற்கு முன்வர வேண்டும். இங்கு "விவசாய வளங்களைப் பாதுகாத்தல்" என்று நான் குறிப்பிடுவதில், அவை அபகரித்துச் செல்லப்படுதலும் படையினரின் தேவைகளுக்காகவென முடக்கி வைத்திருக்கப்பட்டிருப்பதும் குறிப்பிடத்தக்கதாகும். எனவே, இவ்வாறான செயற்பாடுகள் நிறுத்தப்பட வேண்டும் என்பதை மீண்டும் மீண்டும் வலியுறுத்த விரும்புகின்றேன்.

நிலைபேறான விவசாயம் தொடர்பில் இம்முறை வரவு செலவுத் திட்டத்தில் 8 விடயங்கள் உள்ளடக்கப்பட்டுள்ளன. அதில், குறிப்பாக சிறிய மற்றும் நடுத்தரக் குளங்கள் தூர்வாரப்படுதல் எனும் திட்டத்தில் வடக்கு மாகாணமும் உள்ளடக்கப்பட்டிருப்பது வரவேற்கத்தக்கது. அந்தவகையில், விவசாயத்துறைக்கு அதிக பயன் தருகின்ற குளங்களை முதன்மை அடிப்படையில் இனங்கண்டு, அவற்றுக்கு முக்கியத்துவம் வழங்கி, அவற்றைத் தூர்வாருவதற்கும் இதனுடன் நிறுத்திவிடாமல், தொடர்ந்து இரண்டாம், மூன்றாம் கட்டங்களாக இத்திட்டத்தை முன்னெடுத்து ஏனைய அனைத்துக் குளங்களையும் படிப்படியாகத் தூர்வாருவதற்கும் நடவடிக்கை எடுக்கப்பட வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

தற்போதும்கூட, ஒருசில குளங்களின் புனரமைப்புப் பணிகளின்போது, மேலோட்டமான புனரமைப்பு நடவடிக்கைகளே மேற்கொள்ளப்பட்டு வருவதைக் காணமுடிகின்றது. அணைக்கட்டுகள் புனரமைக்கப்பட்டால், அதன் கால்வாய்கள் கைவிடப்படுகின்றன; வாய்க்கால்கள், குளத்தினடி என்பன புனரமைக்கப்பட்டால், அணைக்கட்டுகள் கைவிடப்படுகின்றன. எனவே, இந்த நிலை தொடராமல், குளங்கள் அனைத்தும் முழுமையாகவே புனரமைக்கப்படுதல் வேண்டும். வடக்கு மாகாணத்தைப் பொறுத்தவரையில் அங்கு சுமார் 2,000க்கும் மேற்பட்ட சிறிய குளங்களும் சுமார் 54 பெரிய குளங்களும் இருக்கின்றன. இவற்றில் 1,000க்கும் மேற்பட்ட குளங்கள் புனரமைப்புக்கு உட்படுத்தப்படவேண்டியுள்ளன. அத்துடன், குளங்களின் நீர் ஆவியாதலைக் கட்டுப்படுத்தும் வகையில் அதனைச் சுற்றி மரங்களை நாட்டுவதற்கும் புற்றரைகளை உருவாக்குவதற்குமான ஏற்பாடுகளும் அவசியம் என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

மேலும், விவசாயச் செய்கைகளுக்கு காலநிலை மாற்றங்களால் ஏற்படுகின்ற பாதிப்புகளிலிருந்து விவசாய மக்களைக் காப்பாற்றுகின்ற நோக்கில் விவசாய நிலங்களுக்கான காப்புறுதி ஏற்பாடுகள் தொடர்பில் நான் ஏற்கெனவே இந்தச் சபையினூடாக கௌரவ கமத்தொழில் அமைச்சர் அவர்களின் அவதானத்திற்குக்

கொண்டுவந்திருந்தேன். அந்தவகையில், நெல் அடங்கலாக சோளம், சோயா, பெரிய வெங்காயம், உருளைக்கிழங்கு, மிளகாய் ஆகிய 6 பயிர்களுக்கு ஓர் ஏக்கருக்கு குறைந்தது 40,000 ரூபாய் வழங்கக்கூடியதாக அமையவுள்ள காப்புறுதித் திட்டமும் எமது விவசாய மக்களுக்கு பயனுள்ளதாகவே அமையும்.

எமது நாட்டைச் சூழல் பாதிப்புகளிலிருந்து பாதுகாக்கும் பொருட்டு, பொலித்தீன் பாவனைகளில் ஆர்வமின்மையை ஏற்படுத்துகின்ற நோக்கம் பற்றியும் இம்முறை வரவு செலவுத் திட்டத்தில் பிரஸ்தாபிக்கப்பட்டுள்ளது. இதற்கு மாற்றாக, சேதன முறையில் அழிவடையக்கூடிய மூலப்பொருட்களான வாழை, ஓலைகள், தெங்குத்தும்பு, மூங்கில் இழை போன்றவற்றின்மூலமான தயாரிப்புகள் ஊக்குவிக்கப்படும் என்றும் தெரிவிக்கப்பட்டுள்ளது. இதனுடன் பனை வளத்தையும் சேர்க்க வேண்டுமென நான் கோரிக்கை முன்வைத்திருந்தேன். இந்நிலையில், சோளம் மற்றும் மரவள்ளிக்கிழங்கை மூலப்பொருளாகப் பயன்படுத்திப் புதிய lunch sheet வகைகளை சிவில் பொறியியலாளரான அமில் பிரியந்த என்பவர் கண்டுபிடித்திருப்பதாகவும் மேலும் பைகள், 'சிலி கவர்' பெட்டிகளையும் மேற்படி மூலப்பொருட்களைக் கொண்டு தயாரிக்க முடியுமென அவர் தெரிவித்துள்ளதாகவும் அறியமுடிகின்றது. இது வரவேற்கத்தக்கதொரு முயற்சியாகும். எமது நாட்டைப் பொறுத்தவரையில் தற்போது நாளொன்றுக்கு ஒன்றரை மில்லியன் lunch sheets, 2 மில்லியன் shopping bags உபயோகப்படுத்தப்பட்டு வருவதாகத் தெரியவரும் நிலையில், மிகைத்த சூழல் பாதிப்பினைக் கட்டுப்படுத்துவதற்கும் சோளம், மரவள்ளி போன்ற பயிர்ச்செய்கைகளை ஊக்குவிப்பதற்கும் மேற்படி புதிய கண்டுபிடிப்பு வழிவகுக்குமென்றே கருதுகின்றேன்.

மேலும், யாழ். மாவட்டத்திலே சின்ன வெங்காயச் செய்கை பெரிதும் பாதிப்புக்குள்ளான நிலையை அடைந்துள்ளது. அதன் விலை அதிகரித்துள்ளதுடன், வெளிநாட்டு சிறியரக வெங்காயத்துடன் கலந்து யாழ்ப்பாணத்துச் சின்ன வெங்காயத்தினை விற்கின்ற நிலைமைகளும் உருவாகியுள்ளன. அந்த வகையில் கடந்த ஆண்டில் 71,493 மெற்றிக் தொன் சின்ன வெங்காயம் உற்பத்தி செய்யப்பட்டுள்ள யாழ். மாவட்டத்தில், இந்த வருடத்தில் 2,418 ஹெக்டயர் இலக்கு வைக்கப்பட்டும் 966 ஹெக்டயர் நிலமே பெறப்பட்டுள்ளதாகத் தெரிய வருகின்றது. மேற்படி சின்ன வெங்காய உற்பத்தியைத் திறம்பட ஊக்குவிப்பதனூடாக, உள்ளூர் தேவைகள் போக, ஏற்றுமதிப் பங்களிப்பினையும் பெறக்கூடியதாக இருக்கும் எனத் தெரிவித்துக்கொள்கின்றேன்.

அத்துடன் வரட்சி நிலைமை, காலநிலை முரண்பாடுகள், விலை தளம்பல் போன்ற பல்வேறு காரணிகளால் பெரிதும் பாதிப்படைந்துள்ள யாழ். மாவட்டத்தின் உருளைக்கிழங்குச் செய்கையாளர்கள் தமக்கான விதை உருளைக்கிழங்கு மானியத்தினை எதிர்பார்த்துள்ளனர். இந்த விடயம் தொடர்பிலும் சாதகமான நடவடிக்கைகளை மேற்கொள்ளுமாறு கேட்டுக்கொள்கின்றேன்.

அண்மையில் ஏற்பட்டிருந்த வரட்சி காரணமாக வடக்கு மாகாணத்து விவசாயிகள் 8,826 பேர் பாதிப்படைந்துள்ளனர். இவர்களுக்கான நஷ்டஈடுகள் கமநலச் சேவைகள் திணைக்களத்தினூடாக வழங்கப்படுமென அறிவிக்கப்பட்டிருந்தது. இந்த நஷ்டஈடுகள் அனைத்து விவசாயிகளுக்கும் வழங்கப்பட்டதா? என்பது தொடர்பில் வினவ விரும்புகின்றேன். ஏனெனில், தற்போது மழைக்காலம் ஆரம்பித்து, மழையினால் பயிர்ச்செய்கைகள் அழியும் நிலை ஏற்பட்டு வருகின்றது. ஏற்கெனவே தமக்கான வரட்சி நிவாரணங்கள் வழங்கப்படவில்லை எனத் தம்புள்ள விவசாயிகள் 'தபாலட்டைப் போராட்டம்' நடத்தியிருந்தனர் என்பதையும் நாம் மறந்துவிடக்கூடாது. உத்தேச காப்புறுதித் திட்டம் நடைமுறைப்படுத்தப்படுமானால் இத்தகைய நஷ்டஈடுகள், மானியங்கள், நிவாரணங்கள் தேவைப்படாது என நினைக்கின்றேன்.

எமது பகுதியின் விவசாயத்துறையானது அதீத நவீனமயமாக்கலுக்கான தேவையையும் இருக்கின்ற வளங்களுக்கான பாதுகாப்பினையும் மேலும் வளங்களுக்கான தேவைகளையும் கொண்டுள்ளது. இந்நிலையில், ஓரளவு திருப்தியான வகையில் மாத்திரமே அங்கு விவசாயச் செய்கை மேற்கொள்ளப்பட்டு வருவதால், அது சார்ந்த வாழ்வாதாரங்களைக் கொண்ட எமது மக்கள், கடன் சுமைகளையும் கொண்டவர்களாகவே வாழ்ந்துவருகின்றனர். அந்த வகையில் நான் இங்கே மேற்குறிப்பிட்ட பயிர்ச்செய்கைகளுக்கு மேலதிகமாக, பொருளாதார ரீதியில் பயன்பெறத்தக்க பயிர்ச்செய்கையாகப் புகையிலைச் செய்கையும் எமது பகுதிகளில் குறிப்பிட்ட சில நிலப்பரப்புகளில் மேற்கொள்ளப்பட்டு வருகின்றது. எனினும், தற்போது புகையிலைச் செய்கை தொடர்பில் கொண்டுவரப்படவுள்ளதாகக் கூறப்படுகின்ற தடையானது மேற்படி செய்கையில் ஈடுபட்டிருந்தோர் மத்தியில் விரக்தி நிலையை ஏற்படுத்தியுள்ளது. எனவே, புகையிலைச் செய்கையைத் தடைசெய்வதாயின், அதற்கு ஈடான மாற்றுப் பயிர்ச்செய்கையை, எமது வளங்களை ஆராய்ந்து பரிசோதனைகள் மேற்கொண்டதன் பின்னர் அறிமுகப்படுத்துவதற்கும் அதனை ஊக்குவிப்பதற்கும் அரசு துரித நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். அதைவிடுத்து, தற்போது யாழ். குடாநாட்டில் மேற்கொள்ளப்பட்டு வருகின்ற பயிர்ச்செய்கைகளையே புகையிலைக்கு மாற்றாகக் கொண்டுவரப்படுவதை ஒருபோதும் ஏற்க முடியாது. ஏனெனில், தற்போது யாழ். குடாநாட்டில் மேற்கொள்ளப்படுகின்ற ஏனைய பயிர்ச்செய்கைகளிலிருந்து ஈட்டிக்கொள்ள இயலாத பொருளாதாரத்தை ஈட்டிக்கொள்ளும் நோக்கிலேயே புகையிலைச் செய்கை மேற்கொள்ளப்பட்டு வருகின்றது என்பதை உரிய தரப்பினர் கவனத்தில் கொள்ள வேண்டும். எனவே, புகையிலைச் செய்கையைப் போன்று பொருளாதார ஈட்டல்களை மேற்கொள்ளக்கூடிய மாற்றுப் பயிர்ச்செய்கையே அந்த நிலங்களில் மேற்கொள்ளப்படுவது அவசியமாகும் என்பதை இங்கு வலியுறுத்த விரும்புகின்றேன்.

மேலும் எமது பகுதிகளில் செயற்பட்டு வருகின்ற கமநல அபிவிருத்தித் திணைக்கள அலுவலகங்கள் போதிய ஆளணி இன்றிய நிலையில் செயற்பட்டு வருவதாகக் கூறப்படுகின்றது. எமது விவசாயத்துறை பாதிப்பினை அடைவதற்கு இதுவும் ஒரு காரணியாகக் கூறப்படுகின்றது. ஆளணிப் பற்றாக்குறை காரணமாகக் குறிப்பிட்ட சிலரே பதிற் கடமையாற்ற வேண்டிய நிலைக்குத் தள்ளப்பட்டும் அவர்களுக்குப் பதில் கடமைகளுக்கான கொடுப்பனவுகள் தரப்படுவதில்லை என்ற குற்றச்சாட்டுக்களும் முன்வைக்கப்பட்டு வருகின்றன. இது தொடர்பில் கௌரவ விவசாய அமைச்சர் அவர்கள் கவனத்திற்கொள்ள வேண்டும்.

கடந்த காலங்களில் யாழ்ப்பாணதிலுள்ள தீவகப் பகுதியான நாரந்தனையில் விவசாய ஆராய்ச்சி மையம் ஒன்று செயற்படுத்தப்பட்டுவந்த நிலையில், தற்போது அது மூடப்பட்டுள்ளது. தீவகப் பகுதிகளில், குறிப்பாக வரட்சி நிலைக்குத் தாக்குப்பிடித்து வளரக்கூடிய பயிரினங்களைச் செய்கைபண்ணுவது பற்றி வாய்வழியாகக் கூறப்பட்டு

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

வந்தாலும், அது தொடர்பில் உரிய ஆய்வுகள் மேற்கொள்ளப்படாத நிலை காணப்படுகின்றது. அவ்வேளையில், மேற்படி ஆய்வு மையத்தின் தேவை உணரப்பட்டு வருவதால், இந்த ஆய்வு மையத்தினை மீளச் செயற்படுத்த நடவடிக்கை எடுக்குமாறும் கேட்டுக்கொள்கின்றேன்.

யாழ். மாவட்டத்தைப் பொறுத்தவரையில் விவசாய உற்பத்திகளுக்கான களஞ்சியசாலைகள் இன்மை காரணமாக விவசாயிகள் பெரும் பாதிப்புக்களை அடைகின்றனர். அந்தவகையில், நெல்லைக் களஞ்சியப்படுத்தக்கூடிய பாரிய களஞ்சியசாலையொன்றின் தேவையும் ஏனைய மரக்கறிகள் மற்றும் பழங்கள் போன்றவற்றைக் களஞ்சியப்படுத்துவதற்கான குளிரூட்டப்பட்ட களஞ்சியசாலையொன்றின் தேவையும் யாழிலிருந்து விவசாய உற்பத்திகளைக் கொழும்புக்குக் கொண்டுவருவதற்கான குளிரூட்டப்பட வாகன வசதிகளின் தேவையும் இருக்கின்றது. இது தொடர்பில் கௌரவ அமைச்சர் அவர்கள் கூடிய கவனத்தைச் செலுத்திச் சாதகமான ஏற்பாடுகளை முன்னெடுக்க வேண்டும்.

அத்துடன், நெல் அறுவடைகளின்போதும் பொதியிடல் நடவடிக்கைளின்போதும் அதற்குரிய இயந்திரங்களை வெளிமாவட்டங்களிலிருந்து வாடகைக்கு அமர்த்தவேண்டிய நிலையிலேயே யாழ். மாவட்ட விவசாயிகள் இருக்கின்றனர். இதனால், உற்பத்திச் செலவினங்கள் அதிகரிக்கும் நிலைமைகளைத் தவிர்க்க முடியாதுள்ளது. எனவே, இதற்கொரு ஏற்பாடாக உரிய இயந்திரங்களைக் கமநல சேவைகள் திணைக்களத்திற்கு வழங்க விவசாய அமைச்சு நடவடிக்கை எடுக்க வேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Sir, please give me two more minutes.

மேலும், வடக்கின் விவசாயப் பாதைகள் பலவும் புனரமைக்கப்படல் வேண்டும். நவீன நீர்ப்பாசன முறைமைகளான சொட்டு நீர், தூவல் போன்ற முறைமைகளை அறிமுகப்படுத்தி, அவற்றுக்குச் சூரியக்கல மின் வசதிகள் வழங்கப்படுதல் அவசியமாகும். அதேநேரம், விவசாயத்திற்கென ஒரு தேசியக் கொள்கைத் திட்டம் உருவாக்கப்பட வேண்டும். இந்த கோரிக்கையை நான் தொடர்ந்தும் வலியுறுத்தி வருகின்றேன்.

வடக்கில் நீருக்கான தட்டுப்பாடு மிகவும் அதிகரித்துக் காணப்படுகின்ற நிலையில், எதிர்காலத்தில் அதற்கொரு தீர்வாக அமையக்கூடிய வாய்ப்பாக, மொரகஹகந்த பாரிய நீர்த்திட்டத்தை முன்னெடுத்துள்ள மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் துறை அமைச்சராக இருக்கின்ற மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களுக்கு எமது மக்களின் சார்பாக நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். அதேநேரம், இதனை வட மத்திய மாகாணக் கால்வாய் ஊடாக வடக்கு மாகாணத்தின் கனகராயன் குளத்துக்கு இணைக்கின்ற திட்டம் தொடர்பிலான நடவடிக்கைகள் தற்போது எந்த நிலையில் இருக்கின்றன என்பதையும் அறிய விரும்புகின்றேன். தற்போது கனகராயன்குள இயற்கை நீரோட்டமானது ஆனையிறவுக் கடல் நீரேரியுடன் கலந்து, வடமராட்சிக் கடல் நீரேரி ஊடாகத் தொண்டைமானாறு வழியாகக் கடலில் கலக்கின்றது. இந்நிலையில், இந்த இயற்கை நீரோட்டத்தைச் சாதகமாக்கி அந்த நீரை எமது மக்களது பயன்பாட்டுக்கென வழங்குவதற்கான ஒரு திட்டத்தை மேற்கொள்ள வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please conclude your speech. You can table the rest of your speech.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Okay, Sir, I will **table*** the rest of my speech.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.43]

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා වැදගත් විෂයයක් පිළිබඳ කථා කිරීමට මට ලැබුණු කාලය පිළිබඳව තමයි ගැටලුව තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෙසේ වෙතත් මෙවැනි කාලයක් හෝ ලබා දීම පිළිබඳ ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ අවස්ථාවේදී මුලින්ම මගේ කොට්ඨාසයට අදාළ කරුණක් ගැන කථා කරන්න ඕනෑ. 1982දී ගාමිණී දිසානායක මැතිතුමාගේ සංකල්පයක් අනුව ඉදි වුණු කඩිනම් මහවැලි ව්‍යාපාරයට අදාළ යෝජිත "මොරගොල්ල ජල විදුලි යෝජනා ක්‍රමය" පිළිබඳ අදහසක් දැක්වීමට මා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත් මේ පිළිබඳ ඉතා උනන්දුවෙන් කටයුතු කරමින් මූලාරම්භයක් හැටියට මෙහි කටයුතු කරගෙන යනවා. මෙහිදී සඳහන් කළ යුතු එක කාරණයක් තිබෙනවා. "ගඩයා" කියන මාළුවා -ඇමතිතුමාත් හිනා වෙනවා.- සංරක්ෂණය කිරීම සඳහා දැනට රුපියල් මිලියන 30ක් වියදම් කරලා - රුපියල් ලක්ෂ 300ක්- තිබෙනවා. මාළුවා ඉන්න තැනක් දන්නෙත් නැහැ; අල්ලලා ද දන්නෙත් නැහැ. මාළු අල්ලලා සංරක්ෂණය කිරීම සඳහා තවත් රුපියල් මිලියන 30ක් ඉල්ලනවා. රුපියල් මිලියන 30 හරි 40 හරි එකවර දුන්නා නම්, ඒ මාළු විශේෂය අල්ලලා කොහේට හරි ගෙනියලා දාලා මේ කටයුත්ත අවසන් කරන්න තිබුණා. දිගින් දිගටම මේ කටයුත්ත පරක්කු කිරීම සඳහායි මෙහෙම කටයුතු කරන්නේ. මේ රටේ මහා දැවැන්ත සංවර්ධනයක් කිරීම සඳහායි මේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වෙන්නේ. මේ විදුලි බලාගාරය ඉදි වෙමින් පවතින්නේ, කිලෝ මීටර් තුනක් දිග උමං මාර්ගයක් ඇතුළේයි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යතුමා මෙම කටයුත්ත සහ අනෙක් සියලු කටයුතු ඉතා වුවමනාවෙන් කරද්දී, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ අමාත්‍යතුමා අපිත් එක්ක සාකච්ඡා කරලා මේ කටයුතු ආරම්භ කිරීම සඳහා මූලික සිද්ධාන්තයන් කරලා තිබෙනවා. අපි ඒ දෙපොළටම ඒ පිළිබඳ ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොරගොල්ල විදුලි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වුණොත් විදුලි බල පද්ධතියට විශාල විදුලි ප්‍රමාණයක් එකතු වෙනවා. ඒ වාගේම අපේ කොට්ඨාසවල තරුණ-තරුණියන්ට රැකියා විශාල ප්‍රමාණයක් දෙන්න පුළුවන්. එම නිසා ඒ කටයුත්ත සඳහා තිබෙන බාධාවන් ඉවත් කර ඒ කටයුතු සිද්ධ කර දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. මෙම ව්‍යාපෘතිය ඇමෙරිකානු ඩොලර් මිලියන 124ක ව්‍යාපෘතියක්. දැනට මෙම ව්‍යාපෘතිය අවුරුදු දෙකක්, තුනක් පරක්කු වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ පරක්කුව අවම කරලා, ඉතා ඉක්මනින් මෙම විදුලි බලාගාරය සඳහා මුල්ගල් තබලා ඒ කටයුතු සිද්ධ කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දෙන ලෙස මේ අවස්ථාවේ මා ඉල්ලා සිටිනවා.

අපනයන කෘෂිකර්මාන්තය පිළිබඳව කථා කරනවා නම්, අපේ කොට්ඨාසයේ කෘෂිකර්ම කටයුතු වැඩියෙන්ම සිද්ධ කළ කෙනා මමයි. මම තමයි මහනුවර දිස්ත්‍රික්කයේ අපනයන බෝග වැඩි ප්‍රමාණයක් වවලා තිබෙන්නේ. අපනයන බෝග වගාව සඳහා වාගේම වස විසෙන් තොර පලතුරු සහ ආහාර නිෂ්පාදනය සඳහා අපි හෙක්ටෙයාර 1000ක ප්‍රමාණයක ඉඩම් කොටසක් ගරු ඉඩම් අමාත්‍යතුමාගෙන් වෙන් කරගෙන, වගාකරුවන්ට බෙදා දී ඒ කටයුතු සිද්ධ කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් මගේ කථාව මම වෙන අතකට යොමු කරන්නම්. පළාත් පාලන ක්ෂේත්‍රයේ හිටපු කෙනෙක් හැටියටත්, 1997දී ප්‍රාදේශීය සභාවක හිටපු සභාපතිවරයෙක් ලෙසත්, නාවලපිටිය ආසනය නියෝජනය කරන කෙනෙක් හැටියටත් පළාත් පාලන මැතිවරණය කල් දැමීම පිළිබඳ මා දැඩි අප්‍රසාදය පළ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකට කිසි ගැටලුවක් නැහැ. මොකද, නීති හදන්නේ මේ පාර්ලිමේන්තුවෙන්; මේ ගරු සභාවෙන් නීති හදන්නේ. ජනාධිපතිතුමා ඇතුළුව සියලු පක්ෂ නායකයන් එකතු වෙලා තීන්දුවක් අරගෙන මේ නඩුව ඉල්ලා අස් කර ගත්තා නම් මැතිවරණයට යන්න පුළුවන්. කිසි ගැටලුවක් නැහැ. [බාධා කිරීමක්] ඒක තමයි අපිටත් වුවමනාව තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව පිහිටෙව්වේ අපි. ජනාධිපතිවරණයේදී ලක්ෂ 62ක් මහ ජනතාවගේ ඡන්දය අරගෙන දීලා ජනාධිපතිවරයා පත් කළේ අපි. එතුමාට විරුද්ධව යන්නේ කොහොමද දන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ අපට නිරායාසයෙන්ම මැතිවරණයක් ඉල්ලා ගෙන උද්ඝෝෂණ කරන්න සිද්ධ වෙයි. මේක ඉතිහාසයට මහා කැළැලක් වෙනවා. ඒ නිසා, කරුණාකරලා අපව එතැනට යොමු කරන්නේ නැතිව, ලක්ෂ 62ක් ඡන්දය දීපු මිනිසුන්ගේ ගෞරවය රැකලා, කවුරු හරි මේකේ වැරැද්දක් කරනවා නම් ඒ වැරැද්ද නිවැරදි කරන හැටියටත් මෙම ගරු සභාවෙන් මම ඉල්ලා සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.48]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සාකච්ඡාවට ගන්නා විෂයය ගැන කතා කිරීමට පළමුව කිව යුතු කරුණක් තිබෙනවා. අද දින සාකච්ඡා කරන විෂයයට වඩා කවුරුත් අද සාකච්ඡා කරන ප්‍රධාන කාරණය වෙලා තිබෙන්නේ මුළු රටම මවිත කරමින් අද දී ඇති තීරණයයි. ආණ්ඩුව රටට පොරොන්දු වූ පරිදි ඡන්දය පවත්වන්නේ නැතිව එය කල් යැවීමේ තත්ත්වයකට අප ගොදුරු කර තිබෙනවා.

"ආණ්ඩුවක්" කියන්නේ, රටක් පාලනය කරන ආයතනයයි. ආණ්ඩුවකට රටක් පාලනය කර ගන්න බැරි නම් අයින් වෙලා ගෙදර යන එකයි කරන්න තිබෙන්නේ. එක එක අයට චෝදනා කරමින් ආණ්ඩු කරන්න බැරි වීම නිසා තමයි රට ගැන විශ්වාසයක් නැතිව විදේශ ආයෝජන පවා රටට නොලැබී යන තත්ත්වයක් ඇති වී තිබෙන්නේ. There is no confidence in our country. මෙය තමයි අද අපේ රට මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නය. හැම අංශයක්ම කඩා වැටිලා. අද කියන දේ නොවෙයි, එන මාසයේ කියන්නේ. එන මාසයේ කියන දේ නොවෙයි, ඊළඟ මාසයේ කියන්නේ. අද මේ ඡන්දයටත් කර තිබෙන්නේ බොහොම බරපතළ හානියක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතන විසුරුවා හැරපු දවසේ ඉඳලා පසු ගිය අවුරුදු දෙක තුළ ඒකාබද්ධ විපක්ෂය ආණ්ඩුවට කිව්වා, ඡන්දය පවත්වන්න කියා. ආණ්ඩුවට අවස්ථා ගණනාවක් තිබුණා, ඡන්දය පවත්වන්න. ආණ්ඩුව බොරුවට සංශෝධන ගෙන එමින් අවුල් ජාලාවක් ලෙස ඒ පනත් කෙටුම්පත සම්මත කළා. ජනතා විමුක්ති පෙරමුණේ මගේ මිත්‍ර අනුර දිසානායක මන්ත්‍රීතුමා කියපු දේට මා සවන් දුන්නා. නමුත් ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා එදා රාත්‍රියේ ඒ පනතට ඡන්දය දුන් හැටි මතක් කරන්න මා කැමැතියි. ඒ සංශෝධනයෙන් තමයි මේ අවුල ඇති වුණේ. එදා අපත් එක්ක එකතු වෙලා ඡන්දය දීලා මේ ආණ්ඩුව පැරදුවා නම් මෙහෙම වෙන්නේ නැහැ. පළාත් සභා තුනේ ඡන්ද කල් දමන්න හොරට ගෙනා පනත් කෙටුම්පතට අදාළ ඡන්දය එදා රාත්‍රි 8.30 වන කල් නොපවත්වා සිටියා. පනත සම්මත කරන්න තුනෙන් දෙකක බලය ඕනෑය කියලා ඇටෝර්නි ජනරාල්වරයා කියනකොට, තුනෙන් දෙකක බලයක් නැති ආණ්ඩුවට තුනෙන් දෙකේ බලය දුන්නත්, දැන් රටේ පළාත් සභා තුනක මැතිවරණ නැහැ. ඒකාබද්ධ විපක්ෂය පමණයි දිගටම එකම මතයක සිට මේ මැතිවරණය පැවැත්වීම සඳහා බල කරමින් කටයුතු කළේ කියන එක අපි ආඩම්බරයෙන් කියනවා. ඒ නිසා තමයි, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ නඩු තීන්දුව දෙනකොටම අද මෙතැනට ඇවිල්ලා, "මොකක්ද මේ ආණ්ඩුව කරන්නේ, ඇයි මැතිවරණය පවත්වන්න බැරි, මැතිවරණය පවත්වන්න" කියලා ඉල්ලා සිටියේ. ඒ නිසා මම ආණ්ඩුවට කියනවා මැතිවරණය පැවැත්වීමට කටයුතු කරන්න කියලා. ආණ්ඩුවට මැතිවරණය පවත්වන්න පුළුවන්කම තිබෙනවා. අපට ඒ ගැන විවිධ හේතු දීලා වැඩක් නැහැ. ආණ්ඩුව මැතිවරණය නොපවත්වා එක පැත්තකින් ප්‍රජාතන්ත්‍රවාදයට පිහියෙන් අනිනවා.

අනෙක් පැත්තෙන් මේ රටේ 330ට වැඩි පළාත් පාලන ආයතනවල ඒකාධිපති, හිතුවක්කාර, නාස්තිකාර පාලන තන්ත්‍රයක් ඇති කරලා තිබෙනවා. ඒ නිසා ඵලදායි සංවර්ධනයක් වෙනුවෙන් රටේ එදිනෙදා සේවා ඉෂ්ට වෙන්නේ නැහැ. උතුරේ

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ගත්තත්, දකුණේ ගත්තත් කොහේත් තත්ත්වය ඒකයි. මේ කඩා වැටුණු ආයතන පණ ගන්වන්නට ආණ්ඩුවට බැරිවීමට හේතු තිබෙනවා නම්, ඒවා ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ වරද මිස මේ රටේ ජනතාවගේ වරදක් නොවෙයි. ඒවාට මේ රටේ ජනතාවට වග කියන්න බැහැ. ජනතාවගෙන් ඒවාට වන්දි ගන්න හදන්න එපා.

ගරු දුමින්ද දිසානායක ඇමතිතුමනි, ඔබතුමාගේ ආදරණීය පියා, බර්ටි දිසානායක ඇමතිතුමා මගේ හෙඳ මිත්‍රයා. අපි දෙදෙනා එක කැබිනට් මණ්ඩලයේ සිටියා. ඔබතුමා තරුණයකු හැටියට අනුරාධපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු හැටියට පත්වන දවස අපි බොහොම සතුටින් දැක්කා. නමුත් මම අද ඔබට මේ කරුණ කියනවා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයවත් අත නොතැබූ කුඹුරු පනත අහෝසි කරන්න මේ මුදල් ඇමතිගේ අය වැය ලේඛනයට අත උස්සන තත්ත්වයට අපේ රටේ කෘෂිකර්ම ඇමතිවරයා පත් වෙනවා නම්, මේ රටේ දෙලක්ෂ පනස් ගණනකට වැඩි අද ගොවීන් මොනතරම් තත්ත්වයකට පත් වෙනවාදැයි කල්පනා කරන්න. ඔබතුමා කෙළින් ඉන්න.

ගරු ඇමතිතුමනි, ඔබතුමා අද ගොවීන් වෙනුවෙන් කෙළින් ඉන්න. ජනාධිපතිවරයාවත් අද ගොවීන්ගේ කුඹුරු අයිතිය අහෝසි කරන කුඹුරු පනතකට මුදල් ඇමතිට ඕනෑ විධියට අවසර දෙයි කියලා මම හිතන්නේ නැහැ. මේ ඇවිත් තිබෙන්නේ භයානකම යෝජනාවක්. එක්දහස් නවසිය පණස්හය කියන්නේ ලංකාවේ මහ පෙරළියක් වූ කාලයයි. ගොවි ජනතාව වහල්භාවයෙන්, ගොවි ජනතාව දුක්ඛිතභාවයෙන් ගොඩ ගන්නයි එදා කුඹුරු පනත ගෙනාවේ. එය ගෙනාවේ ගොවියාගේ ආරක්ෂාව සඳහා. එයින් කළේ දුක්ඛිත ගොවි ජනතාවගේ දුක නැති කිරීම පමණක් නොවෙයි; වහල්භාවය නැති කිරීම පමණක් නෙවෙයි. ඒ මඟින් රටේ ආහාර නිෂ්පාදනය වැඩි වුණා; සහල් නිෂ්පාදනය වැඩි වුණා. ගොවියා ධෛර්යවත් වුණාම වැඩියෙන් නිෂ්පාදනයට හවුල් වෙනවා. ගොවියාගේ හිස ගසා දමන්නට ගෙනා මේ අය වැය යෝජනාව භයානක යෝජනාවක්. ඒ යෝජනාවට එරෙහිව එන මහජන හඬ ගරු කෘෂිකර්ම ඇමතිවරයා හැටියට අපි ඔබතුමාට කියනවා.

**ගරු දුමින්ද දිසානායක මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Duminda Dissanayake - Minister of Agriculture)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පැහැදිලි කිරීමක් තිබෙනවා. [බාධා කිරීමක්]

ගරු මන්ත්‍රීතුමනි, අපි ඉතාම සතුටු වෙනවා ඔබතුමා මේ ගැන දැඩි අවධානය යොමු කිරීම සම්බන්ධව. නමුත් හිටපු අමාත්‍යතුමනි, මේ පිළිබඳ යෝජනාවක් අය වැය තුළ ඉදිරිපත් වුණාට, ඒ පනතේ මොන කොටස් වෙනස් වෙනවාද කියන සාකච්ඡාවක්වත් අපි තවම කරලා නැහැ. ඔබතුමා කියපු පරිදිම ගොවීන් රකින පනතක්, මේක; ගොවිජනතාව ආරක්ෂා කරන පනතක්. ඒ නිසා ඉදිරියේදී සංශෝධනයක් එනවා නම්, ඒ හරහා ගොවීන්ට කිසිම අසාධාරණයක්, ගොවිතැනට කිසිම අසාධාරණයක් වෙන්න ඉඩ තියන්නේ නැහැ කියන එක ඉතා වග කීමෙන් ඔබතුමාට මතක් කරනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට ගොවිතැන් බත් කරන රටක්. එහි ප්‍රධාන ප්‍රදේශයක් රජරට. මේ රටේ කුඹුරු ගොවිතැන අහෝසි වී ගිය දවසකට සිදුවන හානිය භයානකයි. ගරු ඇමතිතුමනි, මම මේ අනතුරු ඇඟවීම කරනවා. අපට මතකයි කාලයකට පෙර අග්‍රාමාත්‍යතුමා කුඹුරු ගොඩ කරන්න යෝජනා කළ බව. මේ කරන්න හදන්නේ භයානක සංශෝධනයක්. ඒ වාගේම අහෝසි කරන්න හදන්නේ අද ගොවීන්ගේ අයිතිය.

ගරු ඇමතිතුමනි, මේ වගන්ති ඉවත් කළොත් ඒක පරිසරයට බරපතළ ලෙස බලපානවා. අපේ ජල මට්ටම රැඳී තිබෙන්නේ මහ පොළොවේ; කුඹුරුවල. මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා වූ සැලැස්මක් තිබෙනවා. අද අපට බටහිර රටවල් බල කරනවා. මේ බටහිර සැලැස්ම තමයි මුදල් ඇමතිතුමා මේ පනත් අහෝසි කරලා ගෙනෙන්න හදන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජලය ගැන කථා කරන කොට මේ කාරණයත් කියන්න ඕනෑ. මම නියෝජනය කරන කොළඹ දිස්ත්‍රික්කයේ කැලණි මිටියාවතේ "American" water company එකට එරෙහිව මහජනයා පාරට බැහැලා උද්ඝෝෂණ කරන බව මම පරිසර ඇමතිතුමාට කියන්න කැමැතියි. මේ ගැන මධ්‍යම පරිසර අධිකාරියට පැමිණිලි කොපමණ කරලා තිබෙනවාද? නමුත් මධ්‍යම පරිසර අධිකාරිය කිසිම පියවරක් ගන්නේ නැහැ. එම කොම්පැනිය දෙවැනි විශාල ළිඳ නැවතත් පටන් අරගෙන තිබෙනවා. අද ඒ පළාතේම භූගත ජලය නැති වී තිබෙනවා. මධ්‍යම පරිසර අධිකාරියක් තිබෙනවා නම් - ඒක ජනාධිපතිතුමාගේ විෂය- නිහඬව ඉන්නේ නැතිව මධ්‍යම පරිසර අධිකාරියේ අරමුණු හා නීති අනුව කටයුතු කරන්න. "American" water company එක කාට අයිති වුණත් කමක් නැහැ, ඒකට ගන්න පුළුවන් වතුර ප්‍රමාණයේ සීමාවක් තිබෙනවා. ඊට වඩා ගන්න ඉඩ දෙන්න එපා. ඒකයි තිබෙන නීතිය. ඒ කාරණය පරිසර ඇමතිතුමාට මම විශේෂයෙන් ඉදිරිපත් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ හා සමානව ඊළඟ කාරණාව තමයි මීජේ -

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ජලය පිළිබඳව අපි නව ගැසට් නිවේදනයක් නිකුත් කළා. ඒ ගැසට් නිවේදනය අනුව භූගත ජලය පාවිච්චි කරන සියලු වතුර බෝතල් නිෂ්පාදනය කරන සමාගම්වලට අපි යම් නිර්ණායක දීලා, ඒ පිළිබඳව සමීක්ෂණ කරලා කොයි තරම් ප්‍රමාණයක් ජලය ලබා ගැනීම සුදුසු ද කියලා තීරණය කරනවා. අපි ඒ ගැසට් නිවේදනය නිකුත් කරලායි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ ගැන කටයුතු කරන්න කියලායි මම කියන්නේ. ඔබතුමන්ලා ගැසට් නිවේදන නිකුත් කළාට ඒවා මධ්‍යම පරිසර අධිකාරියෙන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. දැන් බලන්න, කුරුණෑගල- [බාධා කිරීමක්] නැහැ. නැහැ. ජල සම්පත් හා ජලාපවහන මණ්ඩලය කටයුතු කරන්නේ භූගත ජලය පිළිබඳවයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඔව්, භූගත ජලය තමයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පරිසරයට සිදු වන හානිය ගැන මධ්‍යම පරිසර අධිකාරිය මඟින්- [බාධා කිරීමක්]

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
මේවා ගන්නේ නළ ළිංවලින්නේ. නළ ළිංවලින් ගන්න එක තමයි අපි කළමනාකරණය කරන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔව්, කරනවා නම් බොහොම හොඳයි.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
අපි ඒක කරනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි කියන්නේත් ඒක කරන්න කියලායි. මොකද, අද ගම්පහ දිස්ත්‍රික්කය තුළ භූගත ජලය පිළිඳව බරපතළ අර්බුදයක් ඇතිවෙලා තිබෙනවා, මෙවැනි සමාගම් කිහිපයක් නිසා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
අපි ඒවා අධීක්ෂණය කරනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
බොහොම හොඳයි. අධීක්ෂණය කරනවා වාගේම අවශ්‍ය පියවරත් ගන්න. පියවර ගන්නේ නැති නිසා තමයි අද ආණ්ඩුව මේ තත්තවයට වැටිලා තිබෙන්නේ. කිසිම පියවරක් ගන්නේ නැහැ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
අවුරුදු පනහක් තිස්සේ ගන්න බැරි වුණු පියවරක් තමයි අපි ගත්තේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගැසට් කරනවා; නීතිය තිබෙනවා. ඒවා ක්‍රියාත්මක වන්නේ නැත්නම් මොකද කරන්නේ ඇමතිතුමනි? ඒකයි මම කියන්නේ. අදාළ බලධාරින්ට කියන්න ක්‍රියාත්මක වෙන්න කියලා. පරිසර අමාත්‍යතුමාට මම තවත් උදාහරණයක් දෙනවා.

දැන් පිටුම්පේ, පාදුක්ක කන්ද කපා ගෙන යනවා. මේ ගැන සීතාවක පරිසර සුරැකීමේ සංවිධානය විසින් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් කිසිම පියවරක් ගන්නේ නැහැ. යනවා, බලනවා, එනවා; යනවා, බලනවා, එනවා. දැන් ඒ කඳුවැටියේ කොටසක් සම්පූර්ණයෙන්ම කඩා වැටිලා. නමුත් මේ ගැන පියවරක් ගන්නේ නැහැ. මෙවැනි පරිසර නීති තිබෙද්දී, මධ්‍යම පරිසර අධිකාරියක් නඩත්තු කරද්දී මේවා මෙහෙම සිද්ධ වන්නේ ඇයි? මේ උදාහරණ දෙකක් පමණයි මම කිව්වේ. මම නියෝජනය කරන දිස්ත්‍රික්කය නිසා, මේකට මැදිහත් වන ලෙස පරිසර ඇමතිතුමාගෙන් මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා, මේ හානිය සිදුවෙලා ඉවර වෙන්න ඉස්සරවෙලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ජලය දෙන ලබුගම ජලාශය අවට කඳුවැටිය, අපේ පාරිසරික වන සම්පත විනාශ කරමින් යනවා. ඒවා සම්බන්ධයෙන් මැදිහත් වන ප්‍රමාණය බොහොම අඩුයි. මේවාට මැදිහත් වන්නය කියලා අපේ වන සංරක්ෂණ නිලධාරින්ගෙන් හා ඒ ආයතනවල ප්‍රධානින්ගෙන් මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ මේ රටේ දිස්ත්‍රික්ක 20ක් වෙළා ගත් මහා නියඟය ගැනත් කියන්න ඕනෑ. දිස්ත්‍රික්ක 20ට වැඩි ප්‍රමාණයක දීර්ඝ කාලයක් සිදු වූ ලොකුම නියඟයට මිලියන එකකට වැඩි ප්‍රමාණයක ජනතාවක් මුහුණ දුන්නා.

අපේ රටේ කෘෂිකර්මාන්තය ආරක්ෂා කර ගැනීමට අපි පියවර නොගතහොත් ඉදිරි කාලයේදී ඇති වන භයානක තත්ත්වය සම්බන්ධයෙන් රජය මීට වඩා සක්‍රියව මැදිහත් විය යුතු බව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන සාකච්ඡා කරන මේ වෙලාවේදී මම සඳහන් කරන්නට කැමැතියි.

ඊළඟට, අපේ රටේ වන ආරක්ෂාව - Sri Lanka's forest cover was estimated by the FAO to be 26.6 per cent of the land area or 1.7 million hectares in 2010. Based on the last forest cover assessments of the 1990s, FAO extrapolated declining forest cover of 0.6 to 0.3 per cent over the past decade. Deforestation is presently taking place on legally-declared forest reserves across the country. මෙය බරපතළ තත්ත්වයක්. උතුරේ ගත්තත්, විල්පත්තු ජාතික වනෝද්‍යානයේ තදාසන්න ප්‍රදේශ ගත්තත්-

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ගරු මන්ත්‍රීතුමනි, වාර්ෂිකව වන ඝනත්වය සියයට 0.03කින් තමයි අඩු වෙමින් පැවතුණේ. 2020 වන විට එය සියයට 32ක් දක්වා වර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ මේ වන විට ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම පසුගිය අවුරුදුවල වන ඝනත්වයේ අඩුවීමක් සිදු වුණේ නැහැ. ඒ නිසා මේ වන විට අපේ වැඩ පිළිවෙළත් එක්ක මේ කාරණාව සම්පූර්ණයෙන් වෙනස් වෙලායි තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ ප්‍රකාශය මම අගය කරනවා. නමුත් FAO එක ලංකාව ගැන කියන දේ වැරදි නම්, ඒ නිලධාරින්ගේ යුතුකම තමයි FAO එක correct කරන එක. I am reading from the FAO's - Food and Agriculture Organization- Report. කැබලිත්ත පැත්තට උඩින් යනකොට පෙනෙනවා, ඔක්කෝම සුද්ද කරනවා. ඇමතිතුමා කියනවා, කිසිවක් නැහැ කියලා. විල්පත්තු පැත්තට උඩින් යනකොට පෙනෙනවා, ඔක්කෝම සුද්ද කරනවා. ඇමතිතුමා කියනවා, එහෙම එකක් නැහැ කියලා. ඔබතුමා නොවෙයි, කුමන ඇමතිවරයෙක් හිටියත් මේ බරපතළ තත්ත්වයෙන් අපි ආරක්ෂා නොවුණොත්, අපේ රටට නිරන්තර නියඟයකට, නිරන්තර සාගින්නකට මුහුණ දෙන්න සිදු වෙනවා. මෙයයි ප්‍රශ්නය. සුදු පාලන තන්ත්‍රය තුළ අවුරුදු 100ක් කන්ද උඩරටට හානි කළා. එහි විපාකවලට පහත රට ජනතාවත් මුහුණ දුන්නා. අද අපි මේ සඳහා ආරක්ෂක පියවර නොගත්තොත්, 2020දී නොවෙයි, තව අවුරුදු 10ක් ඇතුළතදී මහා ජල අර්බුදයකට මුහුණ දෙන්න සිදු වෙනවා. ඒ නිසා මේක ජාතික ප්‍රශ්නයක් ලෙස සලකන්න කියන එකයි මම මේ සභාවේදී කියන්නේ. එක එක ඇමතිතුමන්ලාගේ හෝ ඇමතිතුමන්ලාගේ මිත්‍රයන් ගැන සලකන එක අත් හැරලා දමන්න. මේක බරපතළ දඬුවමක් විය යුතු තත්ත්වයක්. අපි ලොව පුරා පරිසර ගිවිසුම්වලට අත්සන් කරනවා. අපේ රටේ තිබෙන ලොකුම වස්තුව ආරක්ෂා කර ගැනීමට ගත යුතු පියවර ගැන මේ අය වැය ලේඛනවල කුමක් සඳහන් වුණත්, ක්‍රියාත්මක වන්නේ නැති බව මම කනගාටුවෙන් වුණත් මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහවැලි සංවර්ධන හා පරිසර ඇමතිතුමාගේ -අපේ ගරු ජනාධිපතිතුමාගේ-, ඒ වාගේම වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමතිතුමාගේ, ඒ වාගේම කෘෂිකර්ම ඇමතිතුමාගේ අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් අපි අද දින මේ සභාවේ අනුමත කරනවා. කෘෂිකර්ම ඇමතිතුමාගේ විෂය ඉතාම ප්‍රධානයි. කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මම මීට වඩා ඉල්ලීමක් කරන්නේ නැහැ. පොදුවේ කියපු කරුණුවලට අතිරේකව මම කරන එකම ඉල්ලීම, කරුණාකරලා ගොවිතැන් කරන ගොවි ජනතාවගේ අයිතිය උදුරා ගැනීම නවත්වන්න කියන එකයි. කුඹුරු පනත සම්බන්ධයෙන් අය වැය

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ලේඛනයෙන් කළ යෝජනාව අන්තිම දවසේවත් ඉල්ලා අස්කර ගන්න කියලා සමස්ත ගොවි ජනතාව වෙනුවෙන් මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 22ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.04]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට අදාළව මූලික කාරණාවක් හැටියට ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් සඳහන් කළා, සීතාවක, පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළව පිටුම්පේ උතුර, පිටුම්පේ දකුණ, වේවැල්පනාව, ගලගෙදර ආදී ප්‍රදේශ නියෝජනය කරන හෙක්ටෙයාර හතරකට වැඩි භූමි ප්‍රමාණයක පිහිටා තිබෙන නුරාණිවත්ත කන්ද අද සම්පූර්ණයෙන්ම බරපතළ පරිසර හානියකට ලක් කරලා තිබෙන බව.

මේ වන විට ගල් කොරි 15ක් පමණ පවුල් 750ක් යට කර ගෙන මේ ප්‍රදේශවල ක්‍රියාත්මක වනවා. මේක 1994 වර්ෂයේ පමණ ඉඳලා සුළු පරිමාණ මට්ටමෙන් සාමාන්‍ය ජනතාව කර්මාන්තයක් විධියට කර ගෙන ආවා වුණත්, විශේෂයෙන්ම Port City ව්‍යාපෘතියේ අතුරු විපාකයක් හැටියට අද බස්නාහිර පළාතේ සුන්දරම පරිසර පද්ධතිය ජනතාවට ජීවත් වන්න බැරි ව්‍යසනකාරී මට්ටමකට පත් කරලා තිබෙනවා. මේ වනකොට මේ ප්‍රදේශයේ ජීවත් වන පවුල් 750කට පමණක් නොවෙයි, අනාගත මතු පරම්පරාවටත් මේ තුළින් පානීය ජල ප්‍රශ්නයක් මතු කරලා තිබෙනවා. වාරි ජල පද්ධතිය සම්පූර්ණයෙන්ම වගාවට අහිතකර තත්ත්වයකට පත් කර තිබෙනවා. එම නිසා අමුණු 5කට ජලය සැපයීමේ ක්‍රියාවලිය නතර කර තිබෙනවා. ඒ වාගේම නාය යෑම් තත්ත්වයකුත් නිර්මාණය වෙලා තිබෙනවා. දැනටමත් පවුල් 52ක් ජීවත් වන ගලබඩවත්ත ප්‍රදේශයත්, පිටුම්පෙ කනිෂ්ඨ විද්‍යාලයත් ඇතුළුව තවත් ප්‍රදේශ ගණනාවකුත් නාය යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. NBRO එක ගලබඩවත්ත ප්‍රදේශය විශේෂයෙන්ම අධිඅවදානම් කලාපයක් හැටියට නම් කරලා තිබෙනවා. මේක ඉබේ සිදු වූ දෙයක් නොවෙයි. නාය නොයන ප්‍රදේශයක් අද නාය යන ප්‍රදේශයක් බවට පත් කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. දූවිල්ල සහ තවත් බොහෝ දේවල් නිසා මෙම ප්‍රදේශයේ සෞඛ්‍ය ප්‍රශ්න ගණනාවකුත් නිර්මාණය වෙලා තිබෙනවා. කළු ගල් ප්‍රවාහනයත් එක්ක මාර්ග පද්ධතිය කඩා වැටිලා තිබෙනවා. මේ නිසා අද මුළුමහත් ජනතාවක් ප්‍රධාන පාරිසරික පද්ධතියක් විනාශ කිරීමේ ප්‍රතිවිපාකය බුක්ති විඳිනවා. මොන තරම් විනාශයක් මේ ප්‍රදේශය තුළ සිද්ධ වනවාද කියලා සීතාවක පරිසරය සුරැකීමේ සංගමය විසිනුත් පෙන්වා දුන්නා; ඒ ප්‍රදේශයේ මහා සංඝ රත්නය විසිනුත් පෙන්වා දුන්නා; ගූගල් ඡායාරූප මඟින් පවා පෙන්වා දුන්නා. නමුත්, ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. මේ සම්බන්ධයෙන් පරීක්ෂණ සිද්ධ වනවා. නමුත්, ඒ පරීක්ෂණ එහෙමම යට ගැහෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 මාර්තු මාසයේ 28, 29, 30 කියන දවස් තුනේම මේ ස්ථානය සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් කළා. අදාළ බලපත්‍රවල තිබෙන කොන්දේසි උල්ලංඝනය කිරීමේ හේතුව නිසා ගල් කොරි 15ක් භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය විසින් තහනම් කළා. 2017 මාර්තු මාසයේ තහනම් කරපුවා 2017 මැයි මාසය වනකොට නැවතත් සක්‍රිය තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එහෙම වෙන්නේ කොහොමද? එතකොට තහනම් කිරීම මොකක්ද? එතකොට භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය විහිළුවක්ද? ඒ ආයතනවල තීන්දු තීරණ විහිළුවක්ද? එහෙම නම්, නාම මාත්‍රික තහනම් කිරීමක් තමයි මේ සිද්ධ වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම 2017 මැයි මාසයේ 31 වනකොට මේ තත්ත්වය නිසා නැවතත් මේ ප්‍රදේශයේ නාය යන තත්ත්වයක් ඇති වූ නිසා මේක නැවැත්වූවා. නමුත්, පසු කාලයක නැවත මේක ක්‍රියාත්මක වනවා. කිසිදු දැනුවත් කිරීමකින් තොරව 2017.06.23 වන දා වනකොට නැවතත් මේ ගල් කැඩීම ආරම්භ කරලා තිබෙනවා. අපි අහන්නේ එක දෙයයි. මීට අදාළ නිලධාරීන් මොකක් හරි පදනමක් මත මෙතැනට ගිහිල්ලා ක්ෂේත්‍ර පරීක්ෂාවක් කරලා, අදාළ අයගෙන් විමසා තමයි මේ නතර කිරීම් කරන්නේ. ඔවුන් ඒ නතර කිරීම් කළත්, නැවත මේවා පටන් ගන්නේ කවුද? ඒ ක්ෂේත්‍ර නිලධාරීන්ට වඩා; භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයට වඩා; ගල් කොරිවල අයිතිකාරයෝ ප්‍රබල ද, බලවත් ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියන්නේ මේකයි. ගල් කොරිවල අයිතිකාරයින්ගේ පතල් එක්ක ජනතාවට ජීවත් වන්න බැහැ. ගරු විජිත් විජයමුණි සොයිසා ඇමතිතුමනි, ඔබතුමන්ගේ අවධානයට මා සතුව ඇති මෙම ඡායාරූප යොමු කරන්නම්. මේ ප්‍රදේශයේ සිදු වූ මහා විනාශයන් පිළිබඳව මා සතුව ඡායාරූප තිබෙනවා. මා මේ ඡායාරූප **සභාගත*** කරනවා.

එම ප්‍රදේශයේ තිබෙන ගෙවල්වලට සිදු වෙලා තිබෙන හානිය මෙම ඡායාරූප මඟින් පෙනෙනවා. එම ගෙවල්වල හැම තැනින්ම වාගේ ඉරි තලා තිබෙන ප්‍රමාණය ආදී මේ හැම දෙයක්ම මේ ඡායාරූපවල තිබෙනවා. ආණ්ඩුවට මේ පතල් ටික තබා ගන්න ඕනෑ නම්, මේ ප්‍රදේශයේ ජීවත් වන ජනතාව ඉවත් කරන්න. සම්පූර්ණයෙන්ම ජනතාව නැති ප්‍රදේශයක් බවට මේ ප්‍රදේශය පත් කරන්න. ජනතාව ඉන්න ඕනෑ නම්, මේ පතල් ටික ඉවත් කරන්න. ජනතාව සහ පතල් කියන දෙකම එකට තබා ගන්න බැහැ. ආණ්ඩුවට ඕනෑ ජනතාව නොවෙයි නම්, මේ ආණ්ඩුවට ඕනෑ ගල් කොරිවල මුදලාලිලා ටික නම්, ආණ්ඩුවට තිබෙන්නේ මේ ප්‍රදේශයෙන් ජනතාව සම්පූර්ණයෙන් අතු ගා දැමීමයි. මොකද, ජනතාව ඕනෑ වන්නේ මැතිවරණයකදී පමණයි නේ. ආණ්ඩුව ගල් කොරි මුදලාලිලා ටික තමයි දැන් නඩත්තු කරන්නේ. ඒ තරම් මානුෂික ප්‍රශ්නයක් බවට අද මේ ප්‍රශ්නය පත් වෙලා තිබෙනවා; අතිමානුෂික ඛේදවාචකයක් බවට මේ ප්‍රශ්නය පත් වෙලා තිබෙනවා.

වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමතිතුමාත් මේ අවස්ථාවේදී මෙතැන සිටින නිසා මා ඔබතුමාගේ අවධානයට මෙම කරුණ යොමු කරනවා. ජල සම්පත් මණ්ඩලය ඉහළ හංවැල්ල දිද්දෙනිය තල්ගස්හේන වතු යායේ සිදු කරන පාංශු හා පාෂාණ කැනීම් හේතු කොටගෙන ප්‍රදේශයේ ජල සම්පත් කෙරෙහි ඇතිවන බලපෑම සොයා බැලීමේ මූලික පරීක්ෂණ වාර්තාව මා සතුව තිබෙනවා. ඒක ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් කළේ. මම මේ වාර්තාව **සභාගත*** කරනවා. එහි, නිගමන තිබෙනවා; නිර්දේශ තිබෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඔබතුමා ළඟ තිබෙනවාද?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මා ළඟ තිබෙනවා, ඒ වාර්තාව.

**ගරු ගාමිණී විජිත් විජයමුනි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
මම එතැනින් අරගෙන හරි -

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නැහැ, මම ඒක සභාගත කළා. ඔබතුමාට බලන්න ඒ වාර්තාව මම දැන් එවන්නම්. ඒ සියලු විස්තර මේකේ සම්පූර්ණයෙන්ම තිබෙනවා. මේ වාර්තාව අනුව තිබෙනවා, පාංශු තෙතමන ධාරිතාව අඩුවීම, ජලය රඳවා තබා ගැනීමේ කාලය අඩු වීම වැනි භූ විද්‍යාත්මක ප්‍රශ්න. ඒ වාගේම තිබෙනවා, කෘත්‍රිම බාධකයන් ඉවත් කිරීම නිසා, මේ තුරුලතා ආවරණය ඉවත් කිරීම නිසා ඇති වී තිබෙන තත්ත්වය. ඒක, එතුමන්ලා ඡායාරූපත් එක්ක ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, මොකක්ද වෙලා තිබෙන්නේ? වැඩේ කෙරෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුනි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
අපි ක්‍රියාත්මක වෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක තමයි. ඔබතුමන්ලා කොයි වෙලාවේත් ක්‍රියාත්මකයි. නමුත් ක්‍රියාත්මක වෙන්නේ කොයි පැත්තටද කියන එකයි ප්‍රශ්නය. ජල සම්පත් කළමනාකරණ මණ්ඩලය ගිහිල්ලා මේ වාර්තා හදනවා. NBRO එක ගිහිල්ලා වාර්තා හදනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුනි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඉස්සරහට ක්‍රියාත්මක කරන්නත් පුළුවන්. පස්සට ක්‍රියාත්මක කරන්නත් පුළුවන්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
දැන් ඉතාම පැහැදිලියි. ඔබතුමා හොඳට විහිළු සපයන බව මම දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ ඛේදවාචකයක් ඇති වෙලා තිබෙනවා. ඒ ගැන මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මධ්‍යම පරිසර අධිකාරිය, ඒ අය අරගෙන තිබෙන ලිපි ලේඛනවලට අනුව කටයුතු කරනවාද කියලා හොයලා බලනවා. එච්චරයි. හැබැයි, ලිපි ලේඛනවලින් එහා ගිය ක්‍රියාවලියක් මහ පොළොවේ සිදු වෙනවා. විශේෂයෙන්ම බස්නාහිර පළාත ඇතුළේ මුහුදු මායිමේ ඉඳලා තිබෙන උසම කඳු පද්ධතිය -පළමුවැනි කඳු පද්ධතිය- මේ ස්ථානයේයි තිබෙන්නේ. ඉතින් මේක විනාශ වුණාට පස්සේ රටේ පරිසර පද්ධතියේ සිදු වෙන විද්‍යාත්මක වෙනස්කමකට කවුද වග කියන්නේ? විද්‍යාත්මකව ඇතිවන හානියට කවුද වග කියන්නේ? මේක ඉතාම බරපතළ තත්ත්වයක්. ඒක නිසා මේ පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ විෂයයන් පිළිබඳව අද දවසේ සාකච්ඡා කෙරෙන නිසා ඒ විෂය පථයට අදාළව යම් කරුණු ප්‍රමාණයක් ඉදිරිපත් කරන්නත් මා බලාපොරොත්තු වෙනවා. අපි දන්නවා, අපේ රටේ කුඩා පරිමාණයෙන් නිෂ්පාදන කටයුතු කරන ගොවීන් විශාල වශයෙන් විනාශයට පත් වෙලා තිබෙනවා කියලා. ඔවුන්ගේ කර්මාන්ත පවත්වාගෙන යන්න බැරි වෙලා තිබෙනවා. බුලත් ගොවීන් තමයි ඒකෙන් වැඩිම පීඩාවට පත් වෙච්ච එක පිරිසක්. මොකද, උතුර හා නැගෙනහිර පළාත්වල වාගේම මාතර දිස්ත්‍රික්කයේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නුවර දිස්ත්‍රික්කයේ මේ හැම තැනකම බුලත් කර්මාන්තයෙන් ජීවත් වන විශාල පිරිසක් ඉන්නවා. අපේ රටේ බුලත් අපනයනය සෘජුව සිදු වෙච්ච රටක් තමයි පාකිස්ථානය. පාකිස්ථානය තීරණයක් අරගත්තා, ඔවුන්ගේ බුලත් පරිභෝජනය අඩු කරන්න, බදු පනවන්න. ඒක නිසා කලින් 200 ගණනට තිබුණු බද්දට ඔවුන් කිලෝ එකකට රුපියල් 4,400ක පමණ බද්දක් පැනෙව්වා. ඒක නිසා අපේ රටේ බුලත් රට යවන අයට, ඒ බද්ද අනුව බුලත් රට යවන්න බැරි මට්ටමක් නිර්මාණය වුණා. ඒක නිසා අපේ රටේ බුලත් නිෂ්පාදනය කරන බුලත් ගොවීන්ට අද විශාල තර්ජනයක්, අර්බුදයක් ඇති වෙලා තිබෙනවා.

මේවා පුංචි දේවල් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එයින් ජීවත් වෙන පවුල් ගණනාවක් ඉන්නවා. අද ඔවුන්ට බුලත් කර්මාන්තය කරගෙන යන්න බැරි තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ පිළිබඳව අදාළ විෂය භාර ඇමතිතුමාගේ අවධානය යොමු කරලා තිබෙනවා. බුලත් ගොවීන් මහ පාරට බැහැලා උද්ඝෝෂණය කරලා තිබෙනවා. අවස්ථා ගණනාවකදී මේ පිළිබඳව කෑ ගහලා තිබෙනවා. නමුත් කිසිදු ක්‍රියා මාර්ගයක් ගැනෙන්නේ නැහැ. බුලත් ගොවීන්ට ඒ බදු පැනවීම නිසා ඇති වෙලා තිබෙන අර්බුදයට, ඔවුන්ගේ වෙළෙඳ පොළ සකස් කරලා දෙන්න, ඔවුන්ට සාධාරණ මිලක් ඇති කරලා දෙන්න රජය සෘජුව මැදිහත් විය යුතුව තිබෙනවා. නමුත් අද ඔවුන් ඉතාම අසරණ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ රත්නපුර දිස්ත්‍රික්කයේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාතර දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව ගම්මිරිස් වගාවෙන් පීඩාවට පත් වුණා. ගම්මිරිස් මිල විශාල ප්‍රමාණයෙන් පහළ වැටුණු නිසා, ඔවුන්ව අසරණ තත්ත්වයට පත් වුණා. අපේ දයා ගමගේ ඇමතිතුමා කිව්වා, ගම්මිරිස් මිලදී ගැනීමේ මධ්‍යස්ථාන රජයෙන් ඇති කරනවා කියලා. අපි දන්නේ නැහැ, කොහේද ඇති වුණේ කියලා. නමුත් ගම්මිරිස් ගොවීන් අදත් ඒ මට්ටමින් අසරණ වෙලා ඉන්නවා. අපේ රටේ ප්‍රාථමික කර්මාන්තයක් හැටියට පැඟිරි තෙල් කර්මාන්තයේ යෙදෙන ගොවි ජනතාව ස්වාධීනව ඔවුන්ගේ කර්මාන්තය පවත්වාගෙන යනවා. විශේෂයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය වාගේ ප්‍රදේශවල පැඟිරි තෙල් කර්මාන්තයෙන් විශාල ජනතාවක් ජීවත් වෙනවා. අද ඔවුන්ට වෙළෙඳ පොළ නැති වෙලා තිබෙනවා. ඒ වෙළෙඳ පොළත් අද ඒකාධිකාරී මට්ටමට පත් වෙලා කිහිප දෙනෙක් අතේයි තිබෙන්නේ. පැඟිරි තෙල් කර්මාන්තයේ යෙදෙන අයට ඒ කර්මාන්තය පවත්වාගෙන යන්න බැරි වෙලා තිබෙනවා.

අපි දන්නවා, අපේ රටේ පොල් කර්මාන්තයට මොකද වුණේ කියලා; රබර් නිෂ්පාදන කර්මාන්තයට මොකද වුණේ කියලා. අද ඒවා කඩාගෙන වැටිලා තිබෙනවා. ඒවා පිළිබඳව වැඩි අවධානයක් යොමු විය යුතුව තිබෙනවා. විශේෂයෙන්ම මම මේ කාරණය අවධාරණය කරනවා. බුලත් සහ ගම්මිරිස් වගාවන්වලින් ජීවත් වන ගොවි ජනතාව අද අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඔවුන් පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ගරු ඇමතිතුමා නියෝජනය කරන, ජනාධිපතිතුමා නියෝජනය කරන උතුරු මැද

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවට අද කන්න ගණනාවක් වගා කරන්න බැරි මට්ටමට පත්වෙලා තිබෙනවා. ස්වභාවික වතුර නැති ප්‍රශ්නය විතරක් නොවෙයි එයට බලපා තිබෙන්නේ. අද වතුර බෙදා හැරීමත් බරපතළ ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. ඔබතුමන්ලා මහා ලොකු හීනයක් තමයි මැව්වේ, මොරගහකන්ද ව්‍යාපෘතියත් එක්ක ගොවි ජනතාවට වතුර ලැබෙනවා කියලා. අද, මේ වෙනකොට මොරගහකන්ද ජලාශයේ ජලය අක්කර අඩි 256,000ක් තිබෙනවා. ඒ කියන්නේ මොරගහකන්ද ජලාශයෙන් සියයට 56ක් පිරිලා තිබෙනවා. හැබැයි, ගොවි ජනතාවට වතුර නැහැ. සාමාන්‍යයෙන් මේ වෙනකොට දවසකට ජලය අක්කර අඩි 6,000ක් මොරගහකන්ද ජලාශයට ඇතුළු කරනවා. මොරගහකන්දෙන් පිටවෙන්නේ අක්කර අඩි 1,200යි. ඒ කියන්නේ, මොරගහකන්ද ජලාශය තුළ ඔබතුමන්ලාට අවශ්‍ය කරන ජල මට්ටම පවත්වාගෙන ගොවි ජනතාවට ජලය දෙන්න පුළුවන්කමක් දැන් තිබෙනවා. නමුත්, ගොවි ජනතාවට ජලය නැතිවෙලා තිබෙනවා. මොකද, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය කෘෂි කර්මාන්තය නොවන නිසා. ඔබතුමන්ලාගේ මූලික ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ, පළමුවෙන් විදුලි බලය නිෂ්පාදනය සඳහා වතුර සපයා ගැනීමයි. ඊළඟට පානීය ජලය, ඊළඟට කර්මාන්ත.

ඊළඟට තමයි කෘෂි කර්මාන්තය තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, මේ වෙනකොට ගොවි ජනතාවට කන්න තුන හතරක් වගා කරගන්න නොහැකි වීමයි. ගොවි ජනතාව කියන්නේ බැංකු පොත්වල සල්ලි ගොඩාක් තියාගෙන ගොවිතැනට එන අය නොවෙයි. ඒක ඔබතුමා දන්නවා. ඒ අය ඉතාම අසරණ වෙලා, කන-කර උකස් තියලා, ජීවිතයේ බොහොම අසරණ මට්ටමින් ගොවිතැන කරගෙන යන පිරිසක්. අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලන එකම දේ මෙයයි. අද මොරගහකන්දේ ගොවියෝ විතරක් නොවෙයි, උතුරු මැද පළාතේ -පොළොන්නරුවේ, අනුරාධපුරයේ- හැම කෙනෙක්ම මොරගහකන්දෙන් වතුර ටික ඉල්ලා පාරට බැහැලා තිබෙනවා. ගොවීන් ඉල්ලන්නේ මොනවාද? මේ රටට බත සපයන්න ගොවිතැනේ යෙදෙන්න අවස්ථාව දෙන්න කියන එකයි. ඒ සඳහා අවශ්‍ය මූලිකම දේ තමයි ජල සම්පත. අද ඔබතුමන්ලා රජ කාලයේ ඉඳලා එන වාරි පද්ධතිය විකෘති කරලා -වෙනස් කරලා- එහි පරමාර්ථ හා අරමුණු මාරු කරලා, අද ගොවි ජනතාවට ස්වභාවිකව ඉහළින් පහළට ගලාගෙන එන ජලය ලබා ගැනීමේ ක්‍රමවේදය වෙනස් කරලා තිබෙනවා. ඒ නිසා බරපතළ තත්ත්වයක් ඇතිවී තිබෙනවා.

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය පිළිබඳව ගොවි ජනතාවගේ විශාල ඉල්ලීමක් තිබෙනවා. අදත් අනුරාධපුරයේ ගොවි ජනතාව පැමිණිලා ඉන්නවා. ඔබතුමා කිව්ව කාරණාව සම්බන්ධව අද අපි මහවැලි අධිකාරියත් සමඟ සාකච්ඡා කරලා තීන්දුවක් ගන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒ පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මොරගහකන්දෙන් ජලය නිකුත් කරලා මේ අවශ්‍යතාව දැනට සපුරන්න පුළුවන්කම තිබෙන නිසා ඔබතුමන්ලා යම් පියවරක් ගන්නවා නම් එය ගොවි ජනතාවට සහනයක් සිද්ධවෙයි කියලා මම හිතනවා.

අය වැයට කලින් මුදල් අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන්, මහ බැංකුවේ මැදිහත් වීමෙන් ඔබතුමන්ලා කුඩා වී මෝල් හිමියන් එක්ක සාකච්ඡා කළා. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කුඩා වී මෝල් හිමියන්ට ඔවුන් කලින් ණය අරගත් ක්‍රමයට අනුව ණය ගෙවාගන්න බැරි වුණා, වී මිලදීගන්න බැරිවුණා, වී නැතිවුණා. එම නිසා මේ වෙනකොට කුඩා වී මෝල්වලින් සියයට 95ක් පමණ වැසී යන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. එම නිසා මහ බැංකුව වැඩ පිළිවෙළක් සකස් කළා. කුඩා වී මෝල් හිමියන් වී මිලදී ගැනීමට ලබාගත් ණයවල පොලිය කපන්න නොවෙයි ඔවුන් ඉල්ලුවේ; ණය කපා හරින්න කියලා නොවෙයි ඔවුන් ඉල්ලුවේ. ඔවුන් ඉල්ලුවේ ඒ ණය ගෙවීමේ කාලය අඩු තරමින් මාස 6කට කල් දාලා දෙන්න කියායි.

ඒ වාගේම යන්ත්‍ර සූත්‍ර මිලදී ගන්න, එහෙම නැත්නම් වෙනත් ඉදි කිරීමක් කරන්න ඔවුන් ලබාගත් ණයවල පොලිය ඉවත් කරන්න කියලා ඉල්ලුවේ නැහැ. ඔවුන් තමන්ගේ මූලික ඉල්ලීම් දෙක කළා. නමුත් මහ බැංකුවත් එකඟතාවක් නැති තත්ත්වයකට පත්වෙලා තිබෙනවාය කියා මේ වෙනකොට අපට දැනගන්න තිබෙනවා. එකඟ වුණු, පොරොන්දු වුණු ආකාරයට කටයුතු නොකරමින් එම කුඩා වී මෝල් හිමියන් නැවත අසරණ කර තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව ඔබතුමාටත් වග කීමක් තිබෙනවා. මොකද, ගොවියෝ කියන්නේ වගා කරලා මුදල් අතට ගත් ජනතාව විතරක් නොවෙයි. එහෙත් ගොවිතැනත් එක්ක බැඳිලා ඉන්න අනෙකුත් සියලුම කර්මාන්තකරුවන් ඇතුළු ගොවිතැනේ නියැලෙන හැම කෙනාම ආරක්ෂා වෙන්න ඕනෑ. ගොවිතැනින් ජීවත් වන, වී ගොවිතැනේ යෙදෙන හැම කෙනාම ආරක්ෂා වෙන්න ඕනෑ. කුඩා වී මෝල් හිමියනුත් ආරක්ෂා වෙන්න ඕනෑ. මහා ව්‍යාපාරික වී මෝල් හිමියෝ දෙන්නෙක්, තුන්දෙනෙක් රැකුණොත් විතරක් ගොවිතැන රැකෙන්නේ නැහැ කියලා ඔබතුමා දන්නවා. වීවල මිල වෙනස් වුණු නිසා, ඔවුන්ට වැඩිපුර නාඩු ප්‍රමාණයක් මිලදී ගන්න සිදුවුණු නිසා අද කුඩා වී මෝල් හිමියන් අසරණ තත්ත්වයට පත්වෙලා තිබෙනවා. එම නිසා වී ගොවිතැනේ යෙදෙන කුඩා වී මොල් හිමියන් පිළිබඳවත් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්නය කියා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණා මම විශේෂයෙන්ම අවධාරණය කළේ මේ නිසායි. අද අපේ වී ගොවිතැන අර්බුදයකට ලක් වී තිබෙන බව ඔබතුමන්ලා දන්නවා. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා වාගේ, විවිධ බෝග වගා කිරීමට ඉඩ සැලසෙන පරිදි කුඹුරු පනත සංශෝධනය කළොත්, එහි ප්‍රධාන විත්තිකරුවන් බවට පත් වන්න සිද්ධ වන්නේ ඔබතුමන්ලාටයි. ගරු ඇමතිතුමනි, ආණ්ඩුවක ඇමති මණ්ඩලයේ ඉඳගෙනත් - විශේෂයෙන්ම ඔබතුමා කෘෂිකර්ම අමාත්‍යාංශය දරන අවස්ථාවේදී - රජරට වී ගොවිතැනේ යෙදෙන ජනතාවගේ වගඋත්තරකරුවා බවට පත් වන්න සිද්ධ වන්නේ ඔබතුමාටයි. මම හිතනවා ඔබතුමා ඒ වෙනුවෙන් අත උස්සන එකක් නැහැ කියලා.

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, කුඹුරු පනත ගැන මෙවර අය වැය ලේඛනයේ ඡේදියක් පමණයි තිබෙන්නේ. ඒ නිසා මේ රටේ ගොවි මහත්වරු අනවශ්‍ය විධියට බය කරන්න, අවුස්සන්න එපාය කියා අප ඉල්ලීමක් කරනවා. කවදා හෝ මේ ගැන කථා කරන මොහොතකදී ඔබතුමන්ලාට ඒ අදහස් දක්වන්න පුළුවන්කම තිබෙනවා. මේ වන තුරු කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සමඟ හෝ වෙන කවුරුවත් සමඟ ඒ ගැන අප කිසිම සාකච්ඡාවක් කර නැහැ. එම නිසා ඔබතුමන්ලා අනවශ්‍ය බියක් ඇති කරන්න එපා කියා අප ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ඔබතුමන්ලා මේ ගැන දක්වන අවධානය පිළිබඳව අප බොහොම සතුටු වෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙනුත් මා ඉල්ලා සිටිනවා අය වැය කථාවේ පේළියක් විතරක් දමලා අනවශ්‍ය කථාවක් හදන්න එපා කියලා. මොකද, ඔබතුමන්ලා අය වැය කථාවේ පොතක් දමන්නේ නැතිව අවශ්‍ය දෙය පමණක් කරන්න. අප දන්නවා අය වැය කථාව පොතක් නොවෙයි. එක පේළියක් තමයි තිබෙන්නේ. අය වැය කථාවේ ඒ පේළියෙන් කියන්නේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියයි. කුඹුරු පනත සංශෝධනය කරනවාය කියන කථාව ප්‍රතිපත්තිය තමයි. ඒ ප්‍රතිපත්තියට අනුවයි වැඩ පිළිවෙළ හදන්නේ. ඒ නිසායි අප මේ කාරණය අවධාරණය කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුළු කථාවේ තිබෙන හරය දැක්කාම; එම හරයේ දිශානතිය දැක්කාම; කුඹුරු පනත සංශෝධනය කිරීමේ අරමුණ ගැන අපට බියක් ඇති වන එක සාධාරණයි. ඒ සාධාරණකම නිවැරදි කිරීමේ වගකීම විෂය භාර ඇමතිතුමා හැටියට ඔබතුමාට භාරයි. ඒ නිසා අය වැය කථාවේ පේළිය ඇතුළේ තිබෙන අරමුණ වෙනස් කරගැනීමේ අභිලාෂය අපට තිබෙනවා; ජනතාවට තිබෙනවා. ඒ නිසා තමයි මම ඒ පේළියේ තිබෙන අනතුර අවධාරණය කළේ. ඒ පේළියේ තිබෙන අනතුර ඔබතුමාත් ඒ බරින්ම සලකනු ඇතිය කියා මා විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

ඊට පෙර, ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் அக்கிராசனத்திநின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. J.M. ANANDA KUMARASIRI *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

[අ.භා. 2.22]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මට විනාඩි 4යි තිබෙන්නේ. අවසර ගන්නවත් කාලයක් නැහැ. නමුත් අදහස් ගොඩක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා බුලත් වගාව පිළිබඳව කිව්වා. විශේෂයෙන් අපේ වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය, හෙට්ටිපොල, කටුගම්පල, බිංගිරිය ආශ්‍රිත ප්‍රදේශවල අපනයනයේ යෙදෙන බුලත් ගොවීන් රාශියක් ඉන්නවා. එතුමා කියපු විධියටම ඇත්ත වශයෙන්ම ඔවුන් බරපතළ අර්බුදයකට ලක්වී සිටිනවා. හැබැයි, මේකටත් විශේෂයෙන් ඇඟිල්ල දිගු වන්නේ ආණ්ඩුවටයි. බුලත් වගාවේ සිටින ප්‍රධානම ගැනුම්කරුවා පාකිස්තානයයි. ඒ අයගේ ආනයන දුර්වල කරන්න පාකිස්තානය ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නකොට සැබෑ විධියටම අප අර්බුදයකට පත් වෙලා ඉන්නවා. නමුත් මම යෝජනා කරනවා පාකිස්තානයට බුලත් පටවන කටයුත්ත අධෛර්යවත් වෙනවා සමඟම, අපට බුලත්වලින් තව තව නිෂ්පාදනවලට යන්න පුළුවන් නම් -විවිධ තෙල් වර්ග, සායම් වර්ග, විවිධ අතුරු නිෂ්පාදන අපට බුලත් වගාව හරහා කරන්න පුළුවන් නම්- බුලත් ගොවියාට තමන්ගේ නිෂ්පාදනය වැඩිදියුණු කරගන්න පුළුවන්ය කියන කාරණය මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම මතක් කරනවා.

මෙම අය වැය ලේඛනයේ පාවහන් කර්මාන්තය ගැනත් සඳහන් වී තිබෙනවා. විදේශයෙන් අපට පාවහන් ආනයනය කරන්න තිබෙන නීති රීති ලිහිල් කර තිබෙනවා. එය එක අතකින් මම වැරැද්දක් හැටියට දකිනවා. මොකද, දේශීය පාවහන් කර්මාන්තය හරහා ජීවිකාව පවත්වාගෙන යන නිෂ්පාදකයන්, අතුරු නිෂ්පාදකයන්, බෙදා හරින්නන්, සුළු වෙළෙන්දන්, තොග වෙළෙන්දන් රාශියක් අපේ රට තුළ සිටිනවා. ඔවුන්ගේ ව්‍යාපාරය සඳහා හොඳ එළඹීමක් විශේෂයෙන් අපට අවශ්‍ය වෙනවා.

අපේ දළ ජාතික නිෂ්පාදිතය අඩු වීම ගැන මෙතුමන්ලා හරි උජාරුවෙන් කථා කරනවා. පසු ගිය කාලයේ අපේ කෘෂි කාර්මික ආදායම් බින්දුවටම කඩා වැටුණා. අපේ දළ ජාතික නිෂ්පාදිතය අඩුවීමට එම කාරණය ප්‍රධාන වශයෙන්ම බලපෑවා. දැඩි නියඟය, ගංවතුර, ස්වාභාවික ආපදා කියන මේ සියල්ලත් එක්ක කෘෂි කර්මාන්තයේ අපේ ඉපැයීම් -රටේ දළ ජාතික නිෂ්පාදිතයට කෘෂි කර්මාන්තයේ තිබෙන දායකත්වය- විශාල වශයෙන් පහළ වැටුණා.

මේ අවස්ථාවේදී ඒ කාරණයත් මා කියන්නට ඕනෑ. අපේ ආදායම අඩු වෙන්න බලපාන ප්‍රධාන කාරණයක් තමයි, වල් ඌරන්, දඬු ලේනුන්, රිළවුන්, වඳුරන් වැනි සතුන් වගාවන් විනාශ කිරීම. මේ සියලු කාරණා නිසා අපේ ගොවියන්ගේ දේශීය භවභෝග විශාල වශයෙන් විනාශ වනවා. මේ සම්බන්ධයෙනුත් විශේෂ වැඩසටහනක් දියත් කරන්නට අවශ්‍යයි.

ඒ විතරක් නොවෙයි. මෙහිදී පරිසර අමාත්‍යාංශය ගැනත් කථා කරන නිසා අපේ රජයේ සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳවත් මා කථා කරන්න ඕනෑ. අපි පාරවල් හදනවා, අධිවේගී මාර්ග හදනවා, විවිධ මං මාවත්, ඇළ වේළි, බෝක්කු ආදී මේ සියල්ල හදනකොට ඒ අවශ්‍ය වන නීත්‍යානුකූල බලපත්‍ර විශේෂයෙන් පරිසර අමාත්‍යාංශයට සම්බන්ධ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වැනි ආයතනවලින් ලබා ගැනීම සඳහා සමහර විට මාස ගණන් - මාස හයක්, මාස හතක්, මාස අටක්-, එක්කෝ අවුරුදු ගණන් ප්‍රමාද වනවා. නමුත් රජයේ නීතිරීති, චක්‍රලේඛ යටතේ නියමිත කාල වකවානු තුළ ඒ කටයුතු අවසන් කරන්න සිද්ධ වනවා. මේ සම්බන්ධයෙන් තිබෙන තාක්ෂණික ප්‍රශ්නවලට ප්‍රායෝගික වැඩ පිළිවෙළක් අවශ්‍ය වනවා. ඒ පිළිබඳවත් මේ අවස්ථාවේදී මා මතක් කරන්නට අවශ්‍යයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

චමින්ද විජේසිරි මන්ත්‍රීතුමාගේ කාලයෙන් පොඩි වෙලාවක් දෙන්න.

අවසාන වශයෙන්, මා මේ කාරණයත් කියන්නට ඕනෑ. රජය මැතිවරණය කල් දමනවාය කියා දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා විශාල චෝදනාවක් එල්ල කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මට තව තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කාටද මේ චෝදනාව එල්ල කරන්නේ? රජයටයි. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා අපට චෝදනා කරනවා, මැතිවරණය කල් දැම්මාය කියලා. අදත් අධිකරණයෙන් තමයි ඉදිරි දින ගණනාවකට ආපසු දික් කළේ. සැබෑ විධියට එක්සත් ජාතික පක්ෂය හැටියට අපි මැතිවරණයට සූදානම්. මා නියෝජනය කරන පඩුවස්නුවර ආසනය සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරග වදින්නට බලාපොරොත්තු වන අපේක්ෂකයෙක් මේ නඩුව පැවරීමට සම්බන්ධයි. එක්සත් ජාතික පක්ෂය හැටියට අපි නිරන්තරයෙන්ම මැතිවරණයට සූදානම්. මේ මැතිවරණය පවත්වන්නේ අදද, හෙටද, අනිද්දාද කියන එක අපි බලාගෙන ඉන්නවා. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඇතුළු ඒකාබද්ධ පාර්ශ්වයට මා කියනවා, මැතිවරණය කල් දැමීම වෙනුවෙන් කරුණාකරලා, දෙවියන්ගේ නාමයෙන් අපව නම් අල්ලා ගන්න එපාය කියලා. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේ ඕනෑම තැනකට ඇඟිල්ල දික් කරන්න, අපව අල්ලා ගන්න එපාය කියන එකත් විශේෂයෙන්ම මේ අවස්ථාවේදී කියමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා.

(11th Start) [අ.භා. 2.27]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ කෘෂිකර්ම අමාත්‍යාංශය, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය වැනි රටේ ජන ජීවිතයට හා නිෂ්පාදනයට සෘජුවම බලපාන අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කෙරෙන මේ වෙලාවේ ඒ සම්බන්ධයෙන් කථා කිරීමට ඉඩකඩ ලබාදීම පිළිබඳව මා පළමුවෙන්ම තමුන්නාන්සේට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාව, අනාදිමත් කාලයක සිට කෘෂි කාර්මික ආර්ථිකයක් මත යැපුණු ජන සමාජයකට හිමිකම් කියන රටක්; කෘෂි කර්මාන්තයේ නියැලීම, ගොවිතැනේ නියැලීම ඉතාම ඉහළ වැදගත්කමක් තිබෙන රැකියාවක්, ජීවන වෘත්තියක් හැටියට ජනතාව විසින් තෝරා ගනු ලැබූ ජීවන රටාවක් තිබෙන රටක්. සමස්ත රටේ ජනගහනයෙන් සියයට 30ක වැඩි ප්‍රමාණයක් අදත් තමන්ගේ ජීවිකා වෘත්තිය සරිකර ගන්නේ කෘෂි කාර්මික ආර්ථික ක්‍රමයක් තුළිනුයි. මේ වනවිට වී වගාව, වැවිලි භෝග, ආර්ථික භෝග, අපනයන භෝග, පලතුරු භෝග සහ පශු සම්පත් වශයෙන් කෘෂි කර්මාන්තය කැබලිවලට කොටස් කරලා අපි කථා කළත්, මේ තුළින් රටේ දළ දේශීය නිෂ්පාදනයට සෘජු ලෙසම දායක වන ජන කණ්ඩාමක පැවැත්ම තහවුරු කරන්නේ කෘෂි කර්මාන්තය තුළිනුයි. හැබැයි, අද මේ වනවිට අපට ඉතා පැහැදිලිව පෙනී යනවා, වර්තමාන රජය විසින් අනුගමනය කරන්නා වූ ආර්ථික ප්‍රතිපත්ති මත රටේ කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ බරපතළ කඩා වැටීමක් ඇතිවෙලා තිබෙන බව. ඒ සම්බන්ධව කරුණු සාකච්ඡා කර බලනකොට වසරින්-වසර, වසරින්-වසර දළ දේශීය නිෂ්පාදනයට කෘෂි කර්මාන්තයෙන් ලැබෙන දායකත්වය එන්න- එන්නම අඩුවෙලා තිබෙනවා. අද වනකොට කෘෂි කාර්මික අංශය දළ දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය සියයට 7.1 දක්වා අඩුවෙලා තිබෙනවා.

ආසන්නම වශයෙන් 2014 වර්ෂය වෙන කොට දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකර්මයෙන් වුණු දායකත්වය සියයට 10.1ක් වුවත්, අද ඒක සියයට 7.1 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම කෘෂි කාර්මික ක්ෂේත්‍රය තුළ නිරත වන ශ්‍රම බලකායේ පැහැදිලි අඩු වීමක් දක්නට ලැබෙනවා. මේ කරුණු මේ ආකාරයෙන් එකිනෙක පෙළ ගැහෙන්නේ මොකද කියලා හිතලා බලන විට, රජය කෘෂි කර්මාන්තය සම්බන්ධව ගෙන යන ප්‍රතිපත්ති, ආර්ථිකමය කරුණු කාරණා මේ සඳහා බොහෝ සේ බලපානවා කියන එකයි අපි විශ්වාස කරන්නේ.

විශේෂයෙන්ම වර්තමාන රජය බලයට පත්වන විට රටට බත සපයන ගොවි ජනතාවගේ ක්‍රියාකාරීත්වය නිසාම මේ රට සහල් අතින් ස්වයංපෝෂිත වෙලා තිබුණා. රටට අවශ්‍ය කරන සහල් සියල්ල මේ රට තුළ නිෂ්පාදනය කර ලෝක ආහාර සංවිධානයට පරිත්‍යාගයක් හැටියට සහල් මෙට්‍රික්ටොන් 10,000ක් දෙන්න පුළුවන් ශක්තියක් තිබුණු, ස්වයංරක්ෂිත ගොවි ජනතාවක් සිටි රටක් බවට අපේ රට පත්වෙලා තිබුණා. මම හිතන විධියට ඒ තත්ත්වය ඇති කර ගන්නට පුළුවන් වුණේ පසුගිය එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය, මහින්ද රාජපක්ෂ රජය විසින් මේ රටේ ගොවි ජනතාවට ලබා දුන්නු ප්‍රධාන පොරොන්දුවක් ඉටු කරමින් වී වගාව සඳහා රුපියල් 350ට පොහොර මිටියක් ලබා දීමට ගත්ත, -ශක්තිමත්, ආර්ථික වශයෙන් ඵලදායී- තීරණයත් සමඟයි. මොකද, අවශ්‍ය කරන ආකාරයට කෘෂි කාර්මික යෙදවුම් නියමිත පරිදි වගාවට යෙදවීම තුළ වගාවේ අස්වැන්න වැඩිවෙනවා කියන එක කෘෂි කාර්මික සත්‍යයක්. එදා අක්කරයකට අවශ්‍ය කරන පොහොර ටික, ගොවි බිමට අවශ්‍ය කරන පොහොර ටික ගොවි ජනතාවට දරාගත හැකි මිලකට හරියාකාරව ලබාදීමේ ප්‍රතිඵලයක් හැටියට විශාල වශයෙන් රටේ අක්කර අස්වැන්න වැඩි වුණා, අක්කරයකින් බුසල් 125 - 150 දක්වා අස්වැන්නක් ගන්නට පුළුවන් වුණා. හැබැයි, හරියාකාරව පොහොර නොයෙදීමත් එක්ක, වර්තමාන රජය බලයට පත්වීමත් එක්ක ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. එදා රුපියල් 350ට දුන්නු පොහොර මිටිය අද වන විට රුපියල් 3,000 දක්වා වැඩි වෙලා තිබෙනවා. එතකොට ගොවි ජනතාවට වැය කළ හැකි මුදල සමඟ අක්කරයකට යොදන්න පුළුවන් පොහොර ප්‍රමාණයේ අඩු වීමක්, අපහසුතාවක් ඇති වෙනවා. ඒ නිසාම ඒ වගාවට යෙදිය යුතු නිසි පොහොර ප්‍රමාණය නොයෙදීම හේතුවෙන් අක්කර අස්වැන්න විශාල වශයෙන් අඩුවෙලා තිබෙනවා. මට මතකයි, අපේ ගරු කෘෂිකර්ම ඇමතිතුමා 2016 අවුරුද්දේදී ප්‍රකාශයක් කරනවා, "ලංකාවේ වී අස්වැන්න වැඩියි. ඒ නිසා හෙක්ටයාර් ලක්ෂයක් වහාම වී වගාවෙන් ඉවත් කළ යුතුයි" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි ඒ ප්‍රකාශය කරලා තුන් මාසයක් ගියේ නැහැ, ගරු ජනාධිපතිවරයාට පසු ගිය මාසයේ සිද්ධ වුණා, සහල් අතින් දකුණු ආසියාවේ ස්වයංපෝෂිතම රට බවට පත්වෙලා තිබුණු ශ්‍රී ලංකාවට සහල් මෙට්‍රික්ටොන් 15,000ක් තායිලන්තයෙන් ඇණවුම් කරලා වහාම සහල් මිල පාලනය කිරීමට. එතකොට රජය පැත්තෙන් කියනවා, "බරපතළ ආකාරයේ දේශගුණික වෙනස්කම් සිද්ධ වුණා. ඒ දේශගුණික වෙනස්කම් සමඟ රටේ වගා කරන බිම් ප්‍රමාණය අඩු වුණා" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුළඟ හමන එක, වැස්ස වහින එක, ඉර පායන එක, හඳ පායන එක, ගං වතුර ගලන එක වර්තමාන යහ පාලන ආණ්ඩුව කාලයේ විතරක් සිද්ධ වෙන දේවල් නොවෙයි. පෙර අතීතයේ ඉඳලා එහෙම දේවල් සිද්ධ වුණා. නියඟය එනවා නම් නියං කාලයට අවශ්‍ය වතුර ටික වැව්වල ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළක් රජයට තිබෙන්නට ඕනෑ. ඒ වාගේම, මුළු රටටම පැව්වේ නැහැ. අපි ජීවත් වන තෙත් කලාපයේ වගා බිම් පාළු වෙලා ගියේ නැහැ, ඒ පැත්තට වර්ෂාව තිබුණා. කෘෂිකර්ම අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛනවලින් ප්‍රකාශ

කෙරෙනවා, "වගාවට යෙදෙන පොහොර ප්‍රමාණයේ ක්‍රමානුකූල අඩුවීමක් තිබෙනවා. එම පොහොර යෙදීමේ අඩු වීමත් සමඟ ඇති වන නියමිත අක්කර අස්වැන්න නොලැබීයාම රටේ දැවැන්ත සහල් අර්බුදයක් ඇති වීමට එක හේතුවක් වෙලා තිබෙනවා" කියලා. මේ තත්ත්වය තුළ රටට අවශ්‍ය කරන සහල් ටික ජනතාවට සපයා ගැනීමට නොහැකි මට්ටමට මේ රජය පත්වීම පිළිබඳව ඇත්තටම අපි කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ වන විට සාමාන්‍ය ජනතාව තමන්ගේ බත් වේල, ආහාර වේල සකස් කර ගැනීමට බැරි තත්ත්වයට පත්වෙලා තිබෙනවා. වසර 2,600ක ලංකාවේ ලිඛිත ඉතිහාසය තුළ සහල් කිලෝවක මිල රුපියල් 100 පන්නලා රුපියල් 110ට අරගෙන ගිය ආණ්ඩුව හැටියට මේ ආණ්ඩුවත්, එවකට රටේ සිටි කෘෂිකර්ම ඇමතිවරයා හැටියට වර්තමාන කෘෂිකර්ම ඇමතිවරයාත් ඉතිහාසයට එකතු වෙනවා. [බාධා කිරීමක්] ගරු පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට රීති ප්‍රශ්නයක් තිබෙනවා නම් මූලාසනයෙන් අහන්න. මට කථා කරන්න දෙන්න, ගරු රාජ්‍ය ඇමතිතුමනි. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙන කොට තිබෙන ආහාර අහේනියෙන්, සහල් අහේනියෙන් මේ රට ගලවා ගැනීමට මේ රජය යෝජනා කර තිබෙන ක්‍රමවේදය මොකක්ද? දැන් අය වැය පිළිබඳව බොහොම වේගයෙන් සාකච්ඡා කෙරෙනවා. මේ තිබෙන්නේ මෙවර ඉදිරිපත් කර තිබෙන අය වැය ලේඛනය. මේ අය වැය ලේඛනය තුළ ගොවි ජනතාවට දීලා තිබෙන සහන මොනවාද?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය අමාත්‍යතුමා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා පොහොර මිටියක් රුපියල් 350ට දුන්නේ තවත් රුපියල් 150ක් insurance එකට දාලා රුපියල් 500ට.- [බාධා කිරීමක්] පොඩ්ඩක් අහ ගන්න. [බාධා කිරීමක්] රීති ප්‍රශ්නය තමයි කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද හෙක්ටෙයාර් එකකට රුපියල් 25,000ක් දෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා කථා කරන්න.[බාධා කිරීමක්]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වේලාව. මට බාධා කරන්න එපාය කියන්න. [බාධා කිරීමක්] බොහොම ස්තුතියි. ඕවා රීති ප්‍රශ්න නොවෙයි. අපි මේවා කියන කොට මේගොල්ලන්ට රිදෙනවා. රටේ ජනතාවට අවශ්‍ය වන සහල් ටික හොයා දෙන්න බැරි තත්ත්වයට අද ආණ්ඩුව පත් වෙලා තිබෙනවා.

දැන් වැස්ස වහිනවා නේ. දැන් අනුරාධපුරයේ, පොළොන්නරුවේ, ආනමඩුවේ, පුත්තලමේ ඔක්කෝම වැව් ටික පිරීගෙන යනවා. එහෙම නම් අපේ ගරු ඇමතිතුමනි, ලබන කන්නයේ හෝ මේ රටේ වී අස්වැන්න වැඩි කරන්න, අක්කර අස්වැන්න වැඩි කරන්න පුළුවන් තරමට මේ අය වැය ලේඛනය තුළ ඇතුළත් කර තිබෙන යෝජනා මොනවාද? රුපියල් කෝටි කීයක් පොහොර සහනාධාර සඳහා වෙන් කර තිබෙනවාද? රුපියල් 350ට පොහොර දෙන්න මේ තුළ යෝජනා තිබෙනවා ද? නැහැ. හැබැයි පාවිච්චි නොකරන, තට්ටු පහක දැවැන්ත ගොඩනැඟිල්ලක් නඩත්තු කරන්න එක මාසයකට රුපියල් ලක්ෂ 247 බැගින් වසර දෙකක් තුළ වැය කරන තරමට අපේ රටේ කෘෂිකර්ම අමාත්‍යාංශය අකාරුණික වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි තත්ත්වයක් තුළ, අහිංසක ගොවි ජනතාව තමන්ගේ නිෂ්පාදනය හඳා ගන්න බැරි තත්ත්වයට පත් වෙලා ඉන්න කොට, සාමාන්‍ය ජනතාවට සහල් කිලෝ එක හොයා ගන්න බැරි තත්ත්වයට පත් වෙලා ඉන්න කොට ඒකට වගකිව යුත්තේ මේ රජය සහ මේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂිකර්ම ඇමතිවරයා නොවෙයිද? මෙන්න මේකයි, මේ රටේ කෘෂිකර්මය පැත්තෙන් අපට තිබෙන ප්‍රශ්නය.

ඊළඟට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන වාණිජ ලෝකය තුළ අපේ රටේ තිබෙන පාරිසරික, කෘෂි දේශගුණික තත්ත්වයනුත් සමඟ මේ රටේ ගොවි ජනතාවට බොහෝ ආදායම් උපදවා ගත හැකි රැකියා මාර්ගයක් බවට කෘෂි කර්මාන්තය පත් කර ගැනීමේ හැකියාව තිබෙනවා. හැබැයි, වර්තමාන රජය මේ අය වැය ලේඛනය තුළින් ගොවියා දිරිමත් කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙන ක්‍රමවේදය කුමක්ද? රුපියල් 350ට තිබුණු පොහොර හොණ්ඩරය අද රුපියල් 3,500 වෙලා තිබෙනවා.

පසුගිය කාලයේ ගරු ජනාධිපතිතුමා විසින් නියෝගයක් දුන්නා, ග්ලයිෆොසේට් වහාම තහනම් කළ යුතුයි කියලා. ග්ලයිෆොසේට් නමැති වල් නාශකය තහනම් කරන කොට ඒ සඳහා ආදේශකයක් ජනතාවට හඳුන්වා දිය යුතුයි. ලාභදායී ආකාරයට වගාවේ වල් මර්දනය කිරීම සඳහා තිබුණු රසායනික ද්‍රව්‍යයක් තමයි ග්ලයිෆොසේට් කියන්නේ. පාරිසරික වශයෙන් සහ සෞඛ්‍ය අතින් එය නොගැළපෙන්නේ නම් ඒ සඳහා රජය මඟින් ආදේශකයක් හඳුන්වා දිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිද්ධ වෙලා තිබෙන එකම දේ මොකක්ද? තහනමට පෙර ග්ලයිෆොසේට් ලීටර් 4ක් රුපියල් 2,000යි. තහනමෙන් පස්සේ අද ලේබලය ගහපු නැති ඇසුරුම්වල ග්ලයිෆොසේට් ලීටර් 4 රුපියල් 12,000ට ගන්න තිබෙනවා. එක්තරා පෞද්ගලික ආයතනයකින් අවුරුදු 15කට ඇති වෙන්න ග්ලයිෆොසේට් නමැති වල් නාශකය ගෙනැල්ලා ගබඩා කළාට පසු අමාත්‍යාංශය හසුරවන බලධාරින් කරපු ඉල්ලීමක් අනුව, ග්ලයිෆොසේට් තහනම් කළා. නමුත්, රුපියල් 2,000ක මිලට ගන්න පුළුවන් වුණු ග්ලයිෆොසේට් ටික දැන් රුපියල් 12,000ට විකුණන කොට ඒ පෞද්ගලික සමාගම් අද අධික ලෙස ගොවියා සූරා කන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ගොවිතැනට අවශ්‍ය පොහොර ටික යොදා ගන්න බැරි නම්, වල්නාශක ටික යොදා ගන්න බැරි නම්, තම නිෂ්පාදනවලට ඉහළ මිලක් ලැබෙන්නේ නැත්නම් මේ රටේ ගොවියා පත් වෙලා තිබෙන කනගාටුදායක තත්ත්වය පිළිබඳව වගකීම දැරිය යුත්තේ මේ රජය විසින්මයි කියන එක අපි නැවතත් මතක් කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමාගේ වේලාවත් මට ගන්නය කිව්වා. මා ඒක දැනුම් දුන්නා.

මා දැන් කථා කළේ, වී වගාව සම්බන්ධවයි. අද දින ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය ගැනත් සාකච්ඡා කෙරෙනවා. ගරු දයා ගමගේ ඇමතිතුමා නම් ගරු සභාවේ පෙනෙන්න නැහැ. නමුත්, මෙතැන රාජ්‍ය නිලධාරින්ගේ කුටිය තුළ එතුමාගේ අමාත්‍යාංශයේ නිලධාරින් ඉන්නවා ඇති. අද මේ රටේ අපනයන භෝග වගාව සඳහා වෙනම අමාත්‍යාංශයක් පත් කර තිබෙනවා. පසු ගිය කාලයේ අපනයන භෝග සඳහා විෂයය භාර ඇමතිවරු පත් කරන කොට, අද ආණ්ඩුවේ ඉන්න එදා විපක්ෂයේ හිටපු අය-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද ආණ්ඩුවේ ඉන්න, එදා විපක්ෂයේ හිටපු අය, "ගම්මිරිස් ඇමති, පතෝල ඇමති, පොල් ඇමති" කියලා ඒ විධියටයි එදා අපහාස කළේ. අද ගම්මිරිස්වලට පත් කරලා තිබෙන්නේ, අපේ දයා ගමගේ ඇමතිතුමායි. එතුමා අපේ හිතවතෙක්. හැබැයි, මේ වන කොට ගම්මිරිස් වගාව පත් වෙලා තිබෙන තත්ත්වය මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ ගම්මිරිස් ගොවියාට පැළ නොමිලේ දුන්නා. එක පැළයකට රජය මඟින් රුපියල් 6.50ක වැය බරක් දැරුවා. හැබැයි, අද වන කොට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව රුපියල් 15ට වඩා වැඩි ගණනකට පැළයක මිල නියම කරලා, සියයට 50ක් ගොවියාට ගෙවන්න කියනවා. එතකොට අර නිකම් දුන්නු පැළයේ රුපියල් 6.50ත් ගොවියාගෙන් අය කරගෙන නේ. මේ ආණ්ඩුවේ තිබෙන්නේ මහා ඇස් බැන්දුම් සූත්තර වැඩ. නිකම් දීපු ගම්මිරිස් පැළයට අද මුදල් අය කරලා කියනවා, "නැහැ, අපි සියයට 50ක් ගොවියාට ආධාරයක් වශයෙන් දෙනවා" කියලා. ඒක සම්පූර්ණ අසත්‍යයක්.

හොඳයි, අපි ගම්මිරිස් පැළ ගෙනැල්ලා හිටවා ගත්තා කියමු කෝ. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ නිකම් දීපු ගම්මිරිස් පැළ ටික ගෙනැල්ලා වත්තේ හිටවා ගත්තා. කෘෂි කාර්මික ප්‍රදේශවල ජීවත් වන මහජන නියෝජිතයෝ හැටියට අපිත් ඇතුළුව ගම්මිරිස් කිලෝ එක රුපියල් 1,450ට දුන්නා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම පසු ගිය දවස්වල මගේ බල ප්‍රදේශය වන කොළොන්න පැත්තේ ගියා අවිදින්න. එක ගොවියෙක් ළඟ ගම්මිරිස් කිලෝ 18,000ක් ගබඩා කරගෙන තිබුණා. මේ සහතික ඇත්ත. විකුණන්නේ නැතුව ගම්මිරිස් කිලෝ 18,000ක් තිබුණා, මිල රුපියල් 1,400 වන කල් බලාගෙන. හැබැයි, අද වන කොට වෙළෙඳ පොළේ ගම්මිරිස් කිලෝ එකක මිල රුපියල් 630යි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සියයට 60කින් ගම්මිරිස් මිල අඩු වෙලා. ගම්මිරිස් ගොවීන් තමුන්ගේ දරුවන්ගේ ඉගැන්වීම් කටයුතු කරගෙන, ගොවි බිම් සකස් කරගෙන, ඒ සියලු කටයුතුත් කරගෙන ආර්ථික අතින් ශක්තිමත්ව හිටියා, පසුගිය කාලයේ. වර්තමාන යහපාලන ආණ්ඩුවේ කෘෂි කාර්මික ප්‍රතිපත්තියට පින් සිද්ධ වෙන්න අද ගම්මිරිස් ගොවීන් හිඟන්නන් බවට පත් කරලා තිබෙනවා. මේක නොවෙයිද, ඇත්ත කථාව? ඒ සම්බන්ධව ගොවීන් පෙළපාළි ගියා. රැවුල් වවා ගත්ත කට්ටිය, රතු කමිස ඇඳපු කට්ටිය ඔක්කෝම ගිහිල්ලා, අමුඩ ගහගෙන ගිහිල්ලා, ගම්මිරිස් සඳහා මිලක් ඉල්ලුවා. දයා ගමගේ ඇමතිතුමාගේ අමාත්‍යාංශයට ගියා. ඇමතිතුමා කිව්වා, "හරි. රුපියල් 950 ගණනේ ගම්මිරිස් මිලදී ගන්නවා" කියලා. ගොවි සංවිධාන නියෝජිතයන්, ගොවි නායකයන් බොහොම සතුටින් ආවා, "හරි. රුපියල් 950ට හෝ අපිට මේවා දෙන්න තිබෙනවා නම් ඇති" කියලා. අර කනවැන්දුම් වෙලා ඉන්න කොට, අහලා ගියත් ඇති කියනවා වාගේ, රුපියල් 600ට තිබුණු එකට 950 දෙනවා නම් ඇති කියලා ආවා. හැබැයි, අද සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? ගම්මිරිස් කිලෝව රුපියල් 600යි.

මේ වෙලාවේ ගරු ඇමතිතුමා මේ ගරු සභාවේ නැහැ. නියෝජ්‍ය ඇමතිවරයෙක් ඉන්නවාද කියා මා දන්නෙත් නැහැ. අද නිලධාරින් ඇවිත් ඇති. අපි අහන්නේ, පසුගිය කාලයේ අය වැයෙන් සල්ලි වෙන් කරලා ගම්මිරිස් කිලෝව රුපියල් 950ට ගන්නවා කිව්වාම, ලංකාවේ කොහේද රුපියල් 950ට ගම්මිරිස් ගත්තේ? ගත්ත තැනක් කියනවාද? කෝ, මේවාට උත්තර දෙන්න ඇමතිවරයෙක්? මේකට ශ්‍රීලංකා, යූඑන්පී, ජේවීපී භේදයක් නැහැ. තමුන්නාන්සේගේ බල ප්‍රදේශයේත් ගම්මිරිස් ගොවීන් ඉන්නවා. ඒ ගම්මිරිස් ගොවීන්ටත් මේක බලපානවා. අපට වේදනාවක් තිබෙනවා. අද මේවා විකුණා ගන්න බැරිව ගොවීන් හිඟන්නන් බවට පත් කර මහ මඟට ඇද දමා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන හොයලා බලන කොට හෙළිදරව් වුණේ, ආණ්ඩුවේ ඉහළම බලධාරින් විසින් වියට්නාමයෙන් ගම්මිරිස් ගෙන්වලා; ඒ ගම්මිරිස් ලංකාවේ ගම්මිරිස් සමඟ කවලම් කරලා විකුණුවා. අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් රටට ගෙන්වපු නිසා වෙළෙඳ පොළේ ඉල්ලුම අඩු වුණා. ලෝකයේ හොඳම ගම්මිරිස් නිෂ්පාදනය කරන්නේ, අපේ රට. ලෝක නිෂ්පාදනයෙන් සියයට 5.6ක් නිෂ්පාදනය කරන්නේ අපේ රටේ. හැබැයි, අද අපේ රටේ ගම්මිරිස් ගොවියාට හෙනහුරා ලබලා තිබෙනවා. අද යහපාලන ආණ්ඩුවට වෙච්ච දේම ගම්මිරිස් ගොවියාටත් වෙලා තිබෙනවා; යන එන මං නැහැ. ගම්මිරිස් කිලෝ එක රුපියල් 630යි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. මේ රටේ කුඩා රබර් ඉඩම් හිමියා, රබර් වගාකරුවා හොඳ ආර්ථික තත්ත්වයක් ඇතිව හිටියා. රත්නපුර, කෑගල්ල, නුවර වාගේ දිස්ත්‍රික්කවලත්, අපේ ඇමතිතුමා නියෝජනය කරන මොනරාගල වාගේ දිස්ත්‍රික්කවලත් සාර්ථක රබර් වගාවක් තිබුණා. රබර් කිලෝ එක රුපියල් 685ට දීපු ගොවියෝ අපි. මේ යහපාලන ආණ්ඩුව එන්න ඉස්සෙල්ලා අපි රබර් කිලෝ එක රුපියල් 685ට දුන්නා. හැබැයි, අද වන කොට රබර් කිලෝ එකේ මිල රුපියල් 250ට අඩු වෙලා තිබෙනවා. නිෂ්පාදන පිරිවැය පමණක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 200යි. වගාකරුවාට ඉතුරු වෙන්නේ රුපියල් 50යි. ඉතින්, කොහොමද රබර් කර්මාන්තය කරන්නේ? අද රබර් වතුවල කිරි කපන්නේ නැහැ. යහපාලන ආණ්ඩුවේ වයස අවුරුදු 2යි, මාස 11යි. රබර් ගහකට පිහියක් කිට්ටු කරලා නැහැ අවුරුදු 2යි, මාස 11ක් තිස්සේ. මෙන්න රබර් වගාකරුවා පත් වෙලා තිබෙන තත්ත්වය. අද ඔට්ටපාලු විකුණන්න බැහැ. ඔට්ටපාලුවලට වෙලා තිබෙන්නෙත් හරියට පළාත් පාලන ඡන්දයට වෙච්ච දේ. ඡන්දය තියන්නේ නැහැ; හැම දාම ඇදෙනවා. ඔට්ටපාලුවලට මිලක් නැහැ; හැම දාම ඇදෙනවා. මේක තමයි රබර් වගාකරුවාට සිද්ධ වෙලා තිබෙන දේ. මේක අසත්‍යයක් ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද තේ වගාකරුවන් අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් තේ වගාකරුවාට රුපියල් 1,300ට පොහොර මිටිය දුන්නා; අක්කරයට අවශ්‍ය තරම් පොහොර දුන්නා.

සීමාවකින් තොරව පොහොර ලබා දුන්නා. හැබැයි, අද පොහොර මිටිය රුපියල් 3,000යි. ඒ නිසා ගොවීන් පොහොර ගහන්නේ නැහැ. පොහොර නොගහන නිසා අක්කරයකින් ලැබෙන අස්වැන්න ප්‍රමාණය වේගයෙන් අඩුවෙලා තිබෙනවා. දළු අස්වැන්න වේගයෙන් අඩු වීමත් එක්ක, කර්මාන්තශාලාවලට අවශ්‍ය වන දළු ප්‍රමාණය නැහැ. රුපියල අවපාත වීමත් -ඩොලරයේ මිල ඉහළ යැමත්- එක්ක අද දළු කිලෝවකට රුපියල් 95ක්, රුපියල් 96ක් ලැබෙනවා. හැබැයි, දළු කිලෝවකට රුපියල් 95ක්, රුපියල් 96ක් වාගේ මුදලක් ලැබීම නිසා තේ ගොවියාට තමන්ගේ යෙදවුම් යොදා ගන්න බැරිව තේ වගාවත් අතර මං වෙලා.

තේ වගාවේ තිබෙන වල් පැළ නාශනය කිරීම සඳහා මීට පෙර අපි යෙදුවේ වල් නාශකයි. හැබැයි, අද වල් නාශක නැහැ. අද කළු නික හොයනවාට වැඩිය අමාරුයි වල් නාශක හෙවීම. වල් නාශක හොයනවාට වඩා කුඩු හොයා ගන්න එක ලෙහෙසියි. හැම හතර මං හන්දියකම කුඩු තිබෙනවා. හැබැයි, කිසිම කඩේක ග්ලයිෆොසේට් නැහැ. මෙන්න, තේ ගොවියාට මේ ආණ්ඩුව උරුම කර තිබෙන තත්ත්වය. අද තේ ගොවියා, රබර් ගොවියා, ගම්මිරිස් ගොවියා, වී ගොවියා හැම පැත්තෙන්ම බරපතළ ආකාරයෙන් කඩා වැටීමකට ලක්වෙලා සිටිනවා. ඒ නිසාම මේ රටේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂි කර්මාන්තය පැත්තෙන් දෙන දායකත්වය එන්න-එන්නම අඩුවෙලා තිබෙනවා. විරැකියාව වැඩි වෙන්න, ආහාර සුරක්ෂිතාව අඩු වෙන්න, සෞඛ්‍යය පිරිහෙන්න -මේ සියල්ලටම- ආණ්ඩුවේ මුලා ආර්ථික උපාය, උපක්‍රම බලපාලා තිබෙනවා. ඒ නිසා මේ තත්ත්වයට අපි විසඳුමක් සොයා ගත යුතුයි.

2018 වර්ෂය සඳහා වූ අය වැය ලේඛනය සාකච්ඡා කරන මේ වෙලාවේදී අපි ඉතා කරුණාවෙන් ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. මුදල් ඇමතිතුමා මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ නැහැ. නමුත් ආණ්ඩුවේ වග කිව යුතු ඇමතිතුමන්ලා මේ ගරු සභාවේ ඉන්නවා. ගම්මිරිස් ගැන කථා කරන කොට ඔන්න දැන් දයා ගමගේ ඇමතිතුමා මේ ගරු සභාවට ආවා. ගොවි ජනතාව දිහා සානුකම්පිතව බලන්න කියායි අපි කියන්නේ. මේ ගොවීන් ඔක්කොම ශ්‍රී ලංකා ගොවීන් නොවෙයි; මේ ගොවීන් ඔක්කොම යූඑන්පී අයත් නොවෙයි; මේ ගොවීන් ඒකාබද්ධ විපක්ෂයේත් නොවෙයි; මේ ගොවීන් රටේ ජාතික සම්පතක්. මෙන්න මේ ගොවීන් ආරක්ෂා කර ගැනීම සඳහා මේ ආණ්ඩුව 2018 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මේ ආර්ථික සැලැස්ම තුළ යම් අඩංගුවක් කළ යුතුව තිබෙනවා.

තරුණ ගොවි ජනතාව, තරුණ කෘෂි ව්‍යාපාරිකයන් මේ තුළ රඳවා තබා ගැනීමට කෘෂි කර්මාන්තය කාර්මීකරණය කළ යුතුව තිබෙනවා; කෘෂි කර්මාන්තය නවීකරණය කළ යුතුව තිබෙනවා; නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබා දිය යුතුව තිබෙනවා; ඒ සඳහා පහසුකම් වැඩිපුර ලබා දිය යුතුව තිබෙනවා. හැබැයි, ඒ ආකාරයේ කිසිම යෝජනාවක් මෙවර අය වැය තුළ ඇතුළත්වෙලා නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, පොහොර මිල දවසින් දවස, දවසින් දවස රොකට් වේගයෙන් ඉහළ යනකොට, බියර් මිල වේගයෙන් අඩුවෙලා තිබෙනවා. බියර් කෑන් එකක් රුපියල් 100ක් වෙච්ච රටක, ගම්මිරිස් කිලෝව රුපියල් 630ක් වීම සම්බන්ධයෙන් ආණ්ඩුව ලජ්ජා විය යුතුයි.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
Sir, I rise to a point of Order.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මගේ වෙලාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉල්ලීමක් කරන්න කැමතියි, මේ ආකාරයෙන් ගොවියාට,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයා ගමගේ ඇමතිතුමා.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මගේ නමත් කිව්වා. විනාඩියක් මට ලබා දෙන්න, ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තර ලබා දෙන්න. ඔබතුමා කියන කාරණය හරි. ගම්මිරිස් කිලෝවක මිල මේ දවස්වල රුපියල් 650යි. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා මීට ඉහතදී මේ පාර්ලිමේන්තුවේදී අහපු ප්‍රශ්නවලදීත් අපි උත්තර දුන්නා. ගම්මිරිස්වල සහතික මිල රුපියල් 850කට, රුපියල් 900කට තබා ගන්න අපි උත්සාහ කළා. ඇත්තටම අපි ඒ වෙනුවෙන් රුපියල් මිලියන 600ක් භාණ්ඩාගාරයෙන් වෙනම වෙන් කර ගත්තා. නමුත් අපට ගම්මිරිස් මිල දී ගන්න ක්‍රමයක් නැහැ. ඒකට ප්‍රධාන හේතුව තමයි, මේ වෙලාව වනකොට ගම්මිරිස් ගොවියාගේ ගම්මිරිස්, මුදලාලිලා එකතු කරගෙන තිබීම. මං මිලක් නියම කළොත් එහි ප්‍රතිලාභ ලැබෙන්නේ ගම්මිරිස් ගොවියාට නොවෙයි, ගම්මිරිස් මුදලාලිලාටයි. අපි ගම්මිරිස් පැළ මිලියන 27ක් මේ අවුරුද්දේ බෙදා දෙන්න අවශ්‍ය කටයුතු කරනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබුණු කාලයේ ගම්මිරිස් පැළ මිලියන හයක් විතර තමයි බෙදා දුන්නේ. ගම්මිරිස් පැළ මිලියන 27න්, මිලියන 18ක් විතර අපි ලබා දෙන්නේ නොමිලේ. කාන්තාවන් දස ලක්ෂයකට ඔවුන්ගේ ගෙවතුවල වගා කරන්න අපි ගම්මිරිස්, කුරුඳු, අනිකුත් කුළු බඩු වර්ගවලට අදාළ පැළ වාගේම අඹ පැළ බෙදා දෙන්නත් කටයුතු කරනවා. සමෘද්ධි සහනාධාරයෙන් ජීවත් වන උදවිය ඉන් මුදවා ගන්න පුළුවන් වන විධියේ වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කර තිබෙනවා. හැබැයි, එක්වර මේවායෙන් ප්‍රතිඵල ලබා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒවායෙන් ප්‍රතිඵල ලබා ගන්න නම් අවුරුදු දෙක හමාරක් විතර ගත වන බව ඔබතුමාත් දන්නවා. අපි දෙගොල්ලන්ම එකතුවෙලා මේ කටයුත්ත කරන්න ඕනෑ. ඔබතුමන්ලා විරුද්ධ පක්ෂයේ හිටියත්, අපට ඔබතුමන්ලාගේ සහයෝගයත් අවශ්‍ය කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමා කථාව කෙටි කරන්න.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
මොකද, අපි ඒ සියලු දෙනාට සාධාරණය ඉෂ්ට කරන්න ඕනෑ. මගේ වෙලාවෙන් එතුමාට විනාඩි දෙකක් ලබා දෙන්න. ඒ ගැන

[ගරු දයා ගමගේ මහතා]

ප්‍රශ්නයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, අපි සියලු දෙනාම එකතුවෙලා මේ කටයුත්ත කරන්න ඕනෑ. ලෝක වෙළෙඳ පොළට අනුව සියයට පහක ප්‍රතිශතයක් තමයි අපේ රටේ ගම්මිරිස්වලට හිමිවෙලා තිබෙන්නේ.

ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමනි, ඔබතුමාට මගේ කාලය දෙන්නම්. ඒකට ප්‍රශ්නයක් නැහැ. අපේ ගම්මිරිස්වලට ලෝක වෙළෙඳ පොළේ පංගුවෙන් තිබෙන්නේ සියයට පහයි. නමුත්, වියට්නාමයට ලෝක වෙළෙඳ පොළේ පංගුවෙන් සියයට 60ක් තිබෙනවා. ඔබතුමන්ලා අවුරුදු 20ක් මේ රට පාලනය කළා. නමුත්, ඔබතුමන්ලාට බැරි වෙලා තිබෙනවා, ගම්මිරිස් ගොවියාගේ අස්වැන්න වැඩි කරන්න. අස්වැන්න වැඩි කළොත් තමයි අපට නිෂ්පාදන වියදම අඩු කරන්න පුළුවන් වෙන්නේ. වී වගාව ගත්තත් එහෙමයි. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා දැන් කිව්වා, "වී වගාවට දෙන පොහොර සහනාධාරය අපි කැපුවා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ රුපියල් 350ට පොහොර දුන්නා." කියලා. ඒක වැරැදියි. එක්සත් ජාතික පක්ෂයේ අපි තමයි මුලින්ම පොහොර සහනාධාරය දුන්නේ. ඔබතුමන්ලා කිව්වා, "අපි පොහොර සහනාධාරය කපන්න හදනවා" කියලා. නමුත්, අපි ඒක දිගටම දෙනවා. ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට පොඩි දෙයක් කියන්නම්. වී නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කවලින් අම්පාර දිස්ත්‍රික්කයෙන් තමයි සියයට 23ක්ම රටට බත සපයන්නේ. අම්පාරේ වී ගොවිතැන ගැන මම හොඳටම දන්නවා. ගරු මන්ත්‍රීතුමනි, 2002දී රනිල් වික්‍රමසිංහ මහත්මයා මේ රට බාර ගත්තාට පස්සේ, හෙක්ටයාරයකින් නෙළන වී අස්වැන්න කිලෝග්‍රෑම් 4,200ක් දක්වා වැඩි කරලා රට සහලින් ස්වයංපෝෂිත කරන්න අපට පුළුවන් වුණා. අපි සහල් පිටරටත් යැව්වා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
සහල් පිට රට යැව්වේ කොයි කාලයේද?

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
2003-2004 අවුරුදු දෙකේ අපි සහල් පිට රට යැව්වා. පරාක්‍රමබාහු රජ්ජුරුවන්ගෙන් පස්සේ අපේ රටේ සහල් පිට රට යවපු පළමුවැනි අවස්ථාව. පරාක්‍රමබාහු රජ්ජුරුවන්ගෙන් පස්සේ පළමු වතාවට අපට සහල් පිට රට යවන්න පුළුවන් වුණේ එදා රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිවරයා හැටියට කටයුතු කරපු අවස්ථාවේදී. මම හිතන විධියට ගරු අනුර කුමාර දිසානායක මැතිතුමාත් මේකට සාක්ෂි දරනවා. 2014 වන විට අපේ රටේ වී අස්වැන්න හෙක්ටයාර් එකකට කිලෝග්‍රෑම් 3,700ක් දක්වා අඩු වුණා. ඔබතුමන්ලා ගණන් හදලා බලන්න. තමුන්නාන්සේලා සහනාධාරයක් හැටියට රුපියල් 350ට බාල පොහොර ගෙනත් දුන්නා. අපේ අහිංසක ගොවීන්ට වස විස දුන්නා විතරක් නොවෙයි, ඒ පොහොර යෙදීම නිසා ඔවුන් හෙක්ටයාරයකට නෙළන අස්වැන්න කිලෝග්‍රෑම් 3,700ක් දක්වා අඩු වුණා. 2002දී ඔවුන් හෙක්ටයාරයකින් කිලෝග්‍රෑම් 4,200ක අස්වැන්නක් ගත්තා. 2014 වන විට එය කිලෝග්‍රෑම් 3,700 දක්වා අඩු වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] ඒ කියන්නේ, හෙක්ටයාරයකින් කිලෝග්‍රෑම් 500ක් අඩු වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] මේ නිසා ගොවීන්ට විශාල මුදල් ප්‍රමාණයක් පාඩු වුණා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා point of Order ගන්න අවශ්‍ය නැහැ. මට නියමිත කාලයෙන් විනාඩි දෙකකුත් අරගෙන ඔබතුමා කථා කරන්න.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාව දැන් මට ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විමලවීර දිසානායක මන්ත්‍රීතුමාගේ වෙලාවත් මම ගන්නවා. එතුමා මට දැනුම් දුන්නා ඒ වෙලාව ගන්න කියලා. ශ්‍රියානි විජේවික්‍රම මහත්මියගේ කාලයත් මට ලබා ගන්න ඕනෑ.

අපේ ගරු ඇමතිතුමා කරපු ඉල්ලීම ගැන මම සතුටු වෙනවා. ගරු ඇමතිතුමා අපට බොහොම සමීපයි. එතුමා පළමුවෙන්ම ඉල්ලීමක් කළා, කෘෂිකාර්මික ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය යහපත් කිරීම සඳහා අපි එකතු වෙමු කියලා. ඒ කටයුත්තේදී නම් එකතු වෙන්න පුළුවන්. වෙන දේකට නම් එකතු වෙන්න බැහැ. ආණ්ඩු කරන්න නම් ඔබතුමන්ලාත් එක්ක එකතු වෙන්න බැහැ. හැබැයි, ගොවි ජනතාවගේ යහපත වෙනුවෙන් ඔබතුමන්ලා ගන්නා සාධනීය පියවරකට අපි අපේ සහයෝගය දෙනවා. මොකද, රටේ සමස්ත ජනගහනයෙන් සියයට 33ක් කෘෂිකාර්මික දිවි පෙවෙතක් තිබෙන අය නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2003-2004 වර්ෂවලදී සහලින් රට ස්වයංපෝෂිත කරලා එවකට තිබුණු ආණ්ඩුව සහල් පිට රට යැව්වා කියලා අපේ ගරු දයා ගමගේ ඇමතිතුමා කිව්වා. හැබැයි, ඒ කාලයේ ටවුන්වල පෝස්ටර් ගහලා තිබුණා මට මතකයි, "හාල් ෆෝර්ටි, පොල් ටුවෙන්ටි, රනිල් නෝටි" කියලා. ඒ කාලයේත් හාල් කිලෝග්‍රෑම් එකක් රුපියල් 40යි. පොල් ගෙඩියක් රුපියල් 40යි. ඒ නිසා කොයි කාලයේ සහල් පිට රට යැව්වාද කියලා අපි දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හැබැයි, රනිල් තවම නෝටි.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ සෑම වැවිලි භෝගයකම, ආර්ථික භෝගයකම, අපනයන භෝගයකම, පළතුරු භෝගයකම නිෂ්පාදන වියදම් ඉහළ ගිහිල්ලා තිබෙනවා වාගේම, ඒ හැමදේකම නිෂ්පාදන ඵලදායිතාවත් අඩු වෙලා තිබෙනවා. ඒ ඵලදායිතාව අඩුවීමට ප්‍රධාන හේතුවක් ලෙස බලපා තිබෙන්නේ, කෘෂිකාර්මික යෙදවුම්වල මිල අධික නිසායි. වගාවේ නිසි අස්වැන්න නොලැබෙන්න හේතුවක් වෙලා තිබෙන්නේ මේ පොහොර ප්‍රශ්නයයි. එහිදී මහින්ද රාජපක්ෂ හිටපු

ජනාධිපතිතුමාගේ පැත්තටවත්, තව කෙනෙකුගේ පැත්තටවත් ඇඟිල්ල දිගු කරන එක නොවෙයි කරන්න තිබෙන්නේ. අපි දෙනවා, කලින් දුන්නේ නැහැ කියන එක නොවෙයි කියන්න තිබෙන්නේ. මේ පොහොර ටික දුන්නොත්, ඒක හැම ගොවියෙකුටම සැනසිල්ලේ වෙනවා. ඔබතුමාත් කෘෂිකාර්මික ප්‍රදේශයක් නියෝජනය කරන මහජන නියෝජිතයෙක්. අපිත් එහෙමයි. ඒ නිසා ගොවියාට දෙන්න තිබෙන සහනාධාර ඒ ආකාරයෙන් දෙන්න කටයුතු කරනවා හැර, නොදෙන්න හේතුව හෝ තවත් කෙනෙකුට ඇඟිල්ල දිගු කරන්න එපා කියලා මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලනවා. දැන් ඇමතිතුමා කිව්වා නේ, "මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ ගම්මිරිස් පැළ මිලියන 6යි දීලා තිබෙන්නේ, අපි දුන්නා මිලියන 23ක් කියලා". හැබැයි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමියට වෙන් කළ විනාඩි පහක කාලය තවත් මන්ත්‍රීවරයෙකුට ලබා දීලා තිබෙනවා. ඒ නිසා ඔබතුමා තව විනාඩියකින් කථාව අවසන් කරන්න.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමාට නියමිත වෙලාව?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

විමලවීර දිසානායක මන්ත්‍රීතුමාට අද වෙලාවක් වෙන් කර නැහැ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

අද තිබෙනවා නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

අද එතුමාට වෙලාව වෙන් කරලා නැහැ. ඒ නිසා ඔබතුමා විනාඩියකින් කථාව අවසන් කරන්න.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

හොඳයි. බොහොම ස්තුතියි. මම අවසන් කරන්නම්.

මම අවසාන වශයෙන් මේ කාරණය කියනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ව්‍යාජ සංඛ්‍යා ලේඛන සහ ව්‍යාජ දත්ත ඉදිරිපත් කරලා ගොවි ජනතාව රවටන්න හැදුවාට, මේ මහ පොළොව සහ ගොවියා රැවටිය නොහැකියි. කුසගින්නට පිළිතුරක් දිය යුතුයි. එසේ නොකර රජය මේ ආකාරයෙන් යන ගමන අසාර්ථක ගමනක් වෙනවා. [බාධා කිරීමක්] ඉතුරු විනාඩියක කාලය මම ගන්නවා.

මම ජීවත් වෙන්නේ මැණික් කර්මාන්තය බහුලව කරන දිස්ත්‍රික්කයක් වන රත්නපුර දිස්ත්‍රික්කයේ. මේ ගරු ජනාධිපතිතුමාගේ යටතේ පරිසර අමාත්‍යාංශය තිබෙන වෙලාවක්; අපේ හිතවත් අනුරුද්ධ ජයරත්න මැතිතුමා නියෝජ්‍ය ඇමතිතුමා හැටියට ඉන්න වෙලාවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රත්නපුරේ අපට සමන් දෙවියන් දීපු දැවැද්ද තමයි මැණික්; අපට දුන්නු තෑග්ග මැණික්. මහ පොළොව යට තිබෙන මැණික් කැටය ගොඩට ආවොත් තමයි බුලත් විටේ ඉඳලා හාඩ්වෙයාර් වෙළෙඳාම දක්වා වන හැම කෙනාටම කීයක් හරි හොයා ගන්න පුළුවන්. මිනිස්සු ජීවත් වෙන්නේ ඒ ආදායමෙන්. ගඟට, ඇළට බැහැලා, කුඹුරට, වෙල්ලට බැහැලා, කූඩෙන්, උදැල්ලෙන් ඉල්ලං ටිකක් හෝදලා, දළං කැල්ලක් අරගෙන මිනිස්සු සල්ලි හොයා ගන්නවා. අපේ විජිත් විජයමුණි සොයිසා ඇමතිතුමනි, ඒක තමයි අපේ ජීවිකා වෘත්තිය. නමුත්, වර්තමාන ආණ්ඩුව යටතේ අද පවතින පරිසර නීතිරීති අනුව, කුඩුකාරයෝ පස්සේ එළවනවාට වැඩිය, එල්ටීටීඊ එක පස්සේ එළවනවාට වැඩිය පතල් කපන මිනිස්සු පස්සේ පන්නනවා. ඒ වාගේම, මැණික් සඳහා දීපු සියලු බදු සහන අහෝසි කර දමලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

මේ තත්ත්වය යටතේ මැණික් කර්මාන්තකරුවා, පතල් කම්කරුවා අද බරපතළ අසාධාරණයකට ලක් වෙලා තිබෙනවා. අද අපි කුඹුරකට මැණික් බලපත්‍රයක් ගන්න ගියොත් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරින් අපට කියන්නේ, කුඹුර වගා කරලා එන්න කියලායි. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කුඹුරු වගා කරන්න බැහැ, හැල් කුඹුරු නිසා. ඒවා වගා කරන්න බැහැ. ඒවා පතල් කපන්න තමයි තිබෙන්නේ. හැබැයි ඒවාට බලපත් ඕනෑ. ඒ බලපත්‍ර ලබා දීමේ ක්‍රමය වේගවත් කරන්න කියා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. පතල් කපන්න ඉඩ දෙන්න; සමන් දෙවියෝ දීපු තෑග්ග මහ පොළොවෙන් ගොඩට ගන්න ඉඩ දෙන්න. එහෙම නැති වුණොත්, ආණ්ඩුවේ යූඑන්පී මන්ත්‍රීවරු ජනාධිපතිතුමා එක්ක කෝප වෙලා තිබෙනවා වාගේ සමන් දෙවියෝත් කෝප වෙයි. ඔබතුමාට බොහොම ස්තුතියි.

[பි.ப. 2.55]

**ගරු ෆයිසාල් කාසිම් මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைஸால் காசிம் - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Faizal Cassim - Deputy Minister of Health, Nutrition and Indigenous Medicine)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று கமத்தொழில் அமைச்சு, மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு, நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சு, ஆரம்பக் கைத்தொழில் அமைச்சு ஆகியவற்றின் நிதியொதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்திலே கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன். இருந்தாலும் இந்த நாட்டிலே இன்று முஸ்லிம் சமூகத்திற்கு ஏற்பட்டுள்ள அச்சுறுத்தல்கள், பிரச்சினைகள் பற்றியும் சற்றுக் கூறிவிட்டு இன்றைய விவாதத்திற்குச் செல்லலாமென்று நினைக்கின்றேன்.

இந்த நல்லாட்சி அரசாங்கத்தை அமைப்பதற்கு 98 சதவீதமான முஸ்லிம்கள் வாக்களித்ததை யாரும் மறுக்க முடியாது. கடந்த ஆட்சியாளர்களை வீட்டுக்கு அனுப்பியதில்

[ගරු ෆයිසාල් කාසිම් මහතා]

முஸ்லிம்களுக்குப் பங்கு உண்டு என்பதையும் நான் இங்கு நினைவூட்ட விரும்புகின்றேன். அண்மையிலே காலி மாவட்டத்திலே ஜின்தோட்டை, குருந்துவத்தை, மஹாகப்பு வத்தை, விதானகொட உள்ளிட்ட 6 பிரதேசங்களிலே நடைபெற்ற வன்முறைச் சம்பவங்களினால் முஸ்லிம்கள் மத்தியிலே பெரும் ஐயப்பாடு ஏற்பட்டுள்ளது. இந்த நல்லாட்சி அரசாங்கத்திலே இனங்களுக்கிடையே புரிந்துணர்வையும் இன ஐக்கியத்தையும் ஏற்படுத்த வேண்டுமென்று அனைவரும் எதிர்பார்க்கின்ற வேளையிலே, இவ்வாறான துன்பியல் சம்பவங்கள் எம்மை ஏமாற்றமடையச் செய்கின்றன.

சட்டத்தையும் ஒழுங்கையும் மதிக்கின்ற ஒற்றுமையான இலங்கைத் தேசத்தை நாம் அனைவரும் கட்டியெழுப்ப வேண்டும். அதனூடாக ஆசியாவிலே முன்மாதிரியான ஒரு தேசமாக நம் நாடு திகழ வேண்டுமென்பதுவே நம் அனைவரினதும் எதிர்பார்ப்பாகும். நாட்டின் சட்டத்தின் மீதும் நல்லாட்சி மீதும் நீதித்துறை மீதும் முஸ்லிம்கள் நம்பிக்கை வைத்தவர்களாக இன்னமும் பொறுமையுடன் இருக்கிறார்கள். இவர்களின் நம்பிக்கையும் பொறுமையும் வீண்போகாமல் இனவாத நோக்குடன் இடம்பெறும் பிரச்சினைக்கு முற்றுப்புள்ளி வைக்க வேண்டியது அவசியமாகும். எனவே, இந்தப் பிரச்சினையுடன் சம்பந்தப்பட்ட சகலருக்கும் சட்டத்தின் மூலம் தண்டனை வழங்கப்பட வேண்டுமென நான் எதிர்பார்க்கின்றேன்.

அப்பாவி முஸ்லிம்கள் தாக்கப்பட்டமையும் அவர்களின் வர்த்தக நிலையங்கள், வீட்டு உடைமைகள் அழிக்கப் பட்டமையும் முஸ்லிம்களின் பள்ளிவாசல்கள் தாக்கப் பட்டமையும் இலங்கையில் சிறுபான்மையின முஸ்லிம் களுக்கு உரிமையும் பாதுகாப்பும் இல்லை என்பதை எடுத்துக்காட்டுகின்றது. நாங்கள் இந்தச் செய்தியை சர்வதேசத் திற்குக் கொண்டுசெல்வோம் என்பதை யாரும் மறுக்கக்கூடாது. இதுவரைக்கும் முஸ்லிம்கள் ஐக்கிய நாடுகள் சபைக்கு இதுசம்பந்தமாகப் பேசச் செல்லவில்லை. இருந் தாலும் இவ்வாறாக நடந்துகொள்ளும்போது முஸ்லிம்களும் ஐக்கிய நாடுகள் சபை சென்று தம் சமூகத்தைப் பற்றிப் பேச வேண்டிய காலம் எதிர்காலத்தில் வரும் என்று நான் நம்புகின்றேன்.

அதுமட்டுமல்ல, இன்று பாதுகாப்பு வழங்க வேண்டிய பாதுகாப்பு அதிகாரிகள் முன்னிலையிலே இந்த மக்கள் தாக்கப்பட்டமை மட்டுமல்லாமல், அவர்களின் உடைமைகளும் சூறையாடப்பட்டுள்ளன; இந்தச் சம்பவங்களை நான் வன்மையாகக் கண்டிக்கின்றேன். முஸ்லிம்களுக்கு எதிரான பேரினவாதத் தாக்குதலிலே முறையான திட்டமிடல்களும் சில பொதுத் தன்மைகளும் காணப்படுகின்றன. தாக்குதலுக்காக பெற்றோல் குண்டுகள் பயன்படுத்தப்பட்டுள்ளமையை வைத்து வன்முறைகள் ஏற்கெனவே திட்டமிடப்பட்ட செயலென்று நான் கூற விரும்புகின்றேன். தாக்குதல் நடைபெற்று சொத்துக்கள் அழிந்ததன் பின்னர் நடவடிக்கை எடுப்பதில் பாதிக்கப்பட்ட மக்களுக்கு எந்தப் பயனும் இல்லை. அவர்களின் சொத்துக்கள் அழிந்த நிலையிலே அவர்களுக்கு இதற்குரிய நியாயங்கள் கிடைப்பதற்கு, கிட்டத்தட்ட இன்னுமொரு வருடம் செல்லவேண்டும்.

அரசாங்கப் படையினராகச் செயற்பட வேண்டியவர்கள் சிங்களப் படையினராக நடந்துகொள்கின்றார்கள் என்ற குற்றச்சாட்டுக் காணப்படுகின்றது. இவ்வாறான அச்சுறுத்தல் எமது முஸ்லிம் மக்களிடையே பயத்தை ஏற்படுத்துகின்றது. காலத்திற்குக்காலம் முஸ்லிம் மக்கள் மீது தாக்குதல் நடத்தப்படுவதும் அதன் பின்னர் அறிக்கைவிடுவதுமாக இருந்தால், இதற்கு முடிவு எப்போது கிடைக்கப்போகின்றது? என்று நான் கேட்க விரும்புகின்றேன். இவ்வாறான வன்முறைகள் தொடர்ந்தவண்ணமுள்ளன. இது இவ்வாறிருக் கையிலே, கடந்த திங்கட்கிழமை வவுனியா ஜும்மா பள்ளி வாசலுக்கருகிலே உள்ள கடைகளுக்குப் பெற்றோல் குண்டுகள் வீசப்பட்டன என்று நாங்கள் கேள்விப்பட்டோம். இதனை நாங்கள் வன்மையாகக் கண்டிக்கிறோம். இந்தக் கடைகள் தீக்கிரையாக்கப்பட்டுள்ளன. அதிலிருந்த சொத்துக்கள் சூறையாடப்பட்டுள்ளன. ஆகவே, இதனைக் கண்டறியும் பொருட்டு பொலிஸ் திணைக்களம் உடனடியாகச் சட்டரீதியான நடவடிக்கை எடுக்கவேண்டுமென்று நான் கோரிக்கை விடுக்கின்றேன்.

அதுமாத்திரமன்றி, தம்புள்ளை பள்ளிவாசல் பிரச்சினை கூட இன்னமும் தொடர்ந்தவண்ணம் உள்ளது. அப்பள்ளி வாசலிலே கழிவறையின் குழி பெருக்கெடுத்துத் துர்நாற்றம் வீசும் நிலையிலே, அதில் திருத்த வேலைகளைச் செய்வதற்குப் பொலிசார் தடை விதித்துள்ளார்கள். நாடெங்கிலும் முஸ்லிம் களின் பள்ளிவாசல்களும் வர்த்தக நிலையங்களும் உடைமைகளும் தொடர்ந்து இலக்கு வைக்கப்பட்டிருப்பது துரதிஷ்டவசமான நிகழ்வாகும். எனவே, இவ்வாறான சம்பவங்கள் வன்மையாகக் கண்டிக்கத்தக்கவை என்பதையும் இச்சபையிலே கூற விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இனி இன்றைய அமைச்சுகளின் விடயங்களுக்கு வருகின்றேன். நீண்ட நாட்களுக்குப் பின்னர் நேற்று நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சர் அவர்கள் ஆலோசனைக் குழுக் கூட்டம் ஒன்றை நடத்தியிருந்தார். அதன்போது எங்களது அதிகமான பிரச்சினைகளுக்குத் தீர்வு காணப்பட்டதையிட்டு நான் கௌரவ அமைச்சர் காமினி விஜித் விஜயமுனி சொய்சா அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

அதுமட்டுமல்லாமல், பொத்துவில் பிரதேசத்திலே மிகவும் பிரச்சினைக்குரிய நீர்ப்பாசனத் திட்டமான ஹெடஓயா திட்டத்தை நடைமுறைப்படுத்துவதற்காக பல்வேறு தடைகளுக்கு மத்தியில் கௌரவ அமைச்சர் விஜித விஜயமுனி சொய்சா அவர்களும் கௌரவ ரவூப் ஹக்கீம் அவர்களும் இணைந்து அமைச்சரவைப் பத்திரத்தை சமர்ப்பித்து, அதற்கான அனுமதியைப் பெற்றுக்கொண்டார்கள். இதற்காக அப்பிரதேச மக்கள் சார்பாக எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இத்திட்டத்தை நடைமுறைப் படுத்துவதற்குத் தேவையான நிதியை ஒதுக்கீடு செய்த கௌரவ நிதியமைச்சர் மங்கள சமரவீர அவர்களுக்கும் நன்றி தெரிவிக்கக் கடமைப்பட்டுள்ளேன். அதுமட்டுமல்லாது, இத்திட்டம் விரைவாக நடைமுறைப்படுத்துவதற்காக, இந்தப் பிரதேச மக்களின் நீர்ப்பாசனத் தேவைகளைப் பூர்த்தி செய்வதற்காக, மகாவலி அமைச்சின் கீழுள்ள வன வளப் பாதுகாப்புத் திணைக்களம், மத்திய சுற்றாடல் அதிகாரசபை என்பன அனுமதி வழங்கி, அதற்கு ஒத்துழைப்பு வழங்கவேண்டுமென நான் இச்சபையில் வேண்டுகோள் விடுக்கின்றேன்.

நான் கிட்டத்தட்ட 13 வருடங்களாக இப்பாராளுமன்றத்தில் அங்கம் வகித்து வருகின்றேன் என நினைக்கின்றேன். இன்றுவரைக்கும் பொத்துவில் பிரதேசத்திலுள்ள காணிப் பிரச்சினையானது, தீர்வற்ற நிலையிலேயே காணப்படு கின்றது. இதனையிட்டு நான் கவலையடைகின்றேன். ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸின்

தற்போதைய தலைவர் ரவூப் ஹக்கீம் அவர்கள் இவ்விடயம் தொடர்பில் கிட்டத்தட்ட 03 கூட்டங்களை அரசாங்க அதிபர் தலைமையிலே நடத்தியிருக் கின்றார். அதுமாத்திரமன்றி, அவர்கூட அந்த இடங்களுக்குச் சென்று பார்வையிட்டார். எனினும், இன்றுவரைக்கும் இந்தப் பிரச்சினை தீர்க்கப்படவில்லை என்பதை நான் இங்கு கூறவிரும்புகின்றேன்.

நான் கௌரவ பிரதி அமைச்சர் அவர்களுக்கும் வன இலாகாவினர் செய்த அக்கிரமமான செயலைக் காட்டி யிருந்தேன். அதை அவர் ஏற்றுக்கொண்டார் என்பதையும் நான் இங்கு கூறவிரும்புகின்றேன். பொத்துவில் பிரதேசத்தில் லாஹுகல பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட லாஹுகல பள்ளியடிவட்டை, சோனிகம, கராங்கோ வயற்காணிகளும் பொத்துவில் பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட பங்கந்தன்வெளி (பூவரசடி தோட்டம்), வேகாமம் என 2,927 ஏக்கர் வயற்காணிகளில் கிட்டத்தட்ட 192 குடும்பங்கள் 20-30 வருடங்களாக விவசாயம் செய்து வந்துள்ளனர். தற்பொழுது, வனசீவராசிகள் திணைக்களமும் வன வள இலாகாவும் இணைந்து, அந்த வயற்காணிகளில் இந்த மக்கள் விவசாயம் செய்வதைத் தடுத்து வருகின்றன. இதனை நான் உங்களது கவனத்துக்குக் கொண்டுவருகின்றேன். இவ்வாறான பிரச்சினைகளுக்கு அரசாங்கம் என்ன நடவடிக்கைகளை எடுக்கப்போகின்றது? என்பது தொடர்பில் நாங்கள் அறிய ஆவலாக இருக்கின்றோம்.

இவ்வாறு அம்பாறை மாவட்டத்திலே முஸ்லிம் மக்களின் அதிகமான காணிகள் வனசீவராசிகள் இலாகாவுக்கு சுவீகரிக்கப்பட்டிருக்கிறது. இதனால், அவர்கள் தங்களது வாழ்வாதாரங்களை இழந்து நிற்பதை நாங்கள் காண்கின் றோம். உங்களுக்குத் தெரியுமோ, தெரியாது! ஒரு காலத்தில் பொத்துவில் மக்கள் வாழ்வாதாரத்தை ஈட்டுவதற் காக, காட்டுக்குச் சென்று கொள்ளி வெட்டி விற்பனை செய்தார்கள். வனசீவராசிகள் பாதுகாப்புக் கட்டளைச் சட்டம் வந்ததன் பின்னர், அவர்களது தொழில்கள் இல்லாமல் செய்யப்பட்டு வாழ்வாதாரம் தடுக்கப்பட்டுள்ளது. இதனையிட்டு நாங்கள் கவலையடைகின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ பிரதி அமைச்சர் அவர்களே, உங்களது நேரம் முடிவடைந்துவிட்டது. ஆகையால், உரையை நிறைவுசெய்யுங்கள்!

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)
தயவுசெய்து ஒரு நிமிடம் தாருங்கள்!

மேதகு ஜனாதிபதி அவர்களின் கீழுள்ள இந்த அமைச்சின் பிரதி அமைச்சர் அவர்கள் இங்கு இருக்கின்றார். ஆகவே, இது தொடர்பில் அவர் உடனடியாக நடவடிக்கை எடுக்க வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன். நான் இன்னும் பேசவேண்டியிருப்பதால், எனது மிகுதி உரையை *ஹன்சாட்டில் பதியுமாறு கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, Hon. Anuradha Jayaratne?

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් පිළිබඳව අපේ ගරු ෆයිසාල් කාසිම් මැතිතුමා ඉදිරිපත් කළ කාරණා සම්බන්ධයෙන් අදහස් දැක්වීමට මම ඔබතුමාගෙන් අතිරේක කාලයක් ඉල්ලනවා. අපි මේ වෙන කොට මේ පිළිබඳව සමීක්ෂණයක් කරමින් පවතිනවා. මොණරාගල දිස්ත්‍රික්කයෙන් මෙම කටයුත්ත ආරම්භ කරලා තිබෙනවා. අපි ආවාට-ගියාට මෙම වන සංරක්ෂණ ඉඩම් නිදහස් කරන්න ගියොත්, මෙම කටයුත්ත අප හිතනවාට වඩා බරපතළ අර්බුදයකට ලක් වෙනවා. ඔබතුමන්ලාත් දන්නවා, එම ප්‍රදේශවල ඇති වුණු තත්ත්වය ගැන. ඒ නිසා මේ පිළිබඳව හරියාකාර සමීක්ෂණයක් සිදු කිරීමට අපට කාලය ලබා දෙන්න. ස්ථිරව ඔබතුමන්ලා වගා කරන ඉඩම් මොනවාද කියා බලා, එම ඉඩම් ටික ඔබතුමන්ලාට නිදහස් කරලා ඉතුරු ටික -කැළෑව, වන සංරක්ෂණ සහ ගම්මුන් සිටින ප්‍රදේශ- අර්බුදයක් ඇති නොවන ආකාරයට නිදහස් කිරීම සඳහා අවශ්‍ය කාලය ලබා දෙන්න කියලා අප ඉල්ලීමක් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ துரைரெட்ணசிங்கம் அவர்கள்!

[பி.ப. 3.07]

**ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා**
(மாண்புமிகு க. துரைரெட்ணசிங்கம்)
(The Hon. K. Thurairetnasingam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீர்ப்பாசன மற்றும் நீர் வளமூல முகாமைத்துவ அமைச்சு, கமத்தொழில் அமைச்சு, மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு, ஆரம்பக் கைத்தொழில் அமைச்சு ஆகிய நான்கு அமைச்சுக்களின் ஒதுக்கீடுகள்மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்குச் சந்தர்ப்பமளித்தமைக்கு நன்றி கூறுகிறேன். இந்த நான்கு அமைச்சுக்களுடனும் சம்பந்தப்பட்ட கௌரவ அமைச்சர்கள், பிரதி அமைச்சர்கள் தங்களுடைய பொறுப்புக்களை மக்களு டைய நலன் கருதி, நாட்டினுடைய நலன் கருதிச் செம்மையாகச் செய்து வருவதையிட்டு எங்களுடைய பாராட்டுக்களையும், நன்றிகளையும் தெரிவித்துக்கொள்கின்றேன். அதேபோல், இந்த அமைச்சுக்களினுடைய உயர் அதிகாரிகளுக்கும் பாராட்டுக்களையும், நன்றிகளையும் தெரிவித்துக் கொள்கின்றேன்.

மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சைப் பொறுத்தளவிலே, அது ஜனாதிபதி அவர்களுடைய பொறுப்பின்கீழ் உள்ளது. அந்த வகையில், அவர் இந்த நாட்டை மிகவும் அழகாக வைத்திருக்க வேண்டும்; நாட்டின் சுற்றாடல் மாசடையாமல் பாதுகாக்கவேண்டுமென்ற உயரிய நோக்கத்தோடு செயற்படுகின்றார். அண்மையில் அவர் திருகோணமலை மாவட்டத்திற்கு வந்திருந்தார். திருகோண மலை நகரத்திலே சுற்றாடல் பாதுகாப்பு பற்றி ஒரு மகாநாட்டினை நடத்தியிருந்தார். அந்த மகாநாட்டுக்கு அந்த மாவட்டத்திலுள்ள சகல தரப்பினரும் அழைக்கப்

[ගරු க. තුරෛයිරෙත්නසිංහම් මහතා]

பட்டிருந்தார்கள். அங்கு ஜனாதிபதி அவர்களுடைய உரை மிகவும் காத்திரமானதாக இருந்தது. ஆனால், ஜனாதிபதி அவர்களுடைய அந்த உரைக்கும் இன்று திருகோணமலை மாவட்டத்தில் ஏற்பட்டிருக்கின்ற சூழல், சுற்றாடல் பாதுகாப்பற்ற தன்மைக்கும் இடையில் வேறுபாடு இருப்பதைப் பார்த்து நாங்கள் மிகவும் வேதனைப் படுகின்றோம்.

மூதூர் கிழக்குப் பகுதியிலே உள்ள மலைத்தொடர் ஓர் இயற்கை வளமாகும். அவை புராதன காலத்து மலைகள்! அம்மலைத்தொடர் மூன்றாம்கட்டை மலை தொடக்கம் மயிலிமலை வரை நீண்டிருக்கின்றது. அதன் இரண்டு பக்கமும் வயல்வெளிகள். கோடை காலங்களில் மேற்காவுகை மழை பெய்வதால் அந்த மலைத்தொடரை அண்டிய பகுதிகள் செழிப்பாக இருக்கின்றன. அந்த மலைகளிலே தெய்வங்கள் இருப்பதாகக்கூட அந்தப் பகுதி மக்கள் நம்புகிறார்கள். அப்படிப்பட்ட மலைகள் இன்று உடைக்கப்படுகின்றன. அதைப்பற்றி ஜனாதிபதி அவர்களுக்கு நான் பலமுறை கடிதம் எழுதியிருக்கிறேன். அங்குள்ள அதிகாரிகள் அதைத் தடுத்து நிறுத்துவதற்குப் பயப்படுகின்றார்கள். அப்படிப் பயப்படுவதற் கான காரணம் என்னவென்று விளங்கவில்லை. அதில் தலையிடுகின்ற பாராளுமன்ற உறுப்பினர்களான எங்களுக்குக்கூட அச்சுறுத்தல்கள் விடுக்கப்படுகின்றன. அந்த இடத்தைப் பொறுத்தளவிலே, அங்கு கல்வெடிகள் வைக்கப் படுகின்றன. அப்படி வெடி வைப்பதற்கு முன்னர் முன்னறிவித்தல்கூடக் கொடுக்கப்படுவதில்லை. அந்த மலைகளைச் சூழவுள்ள சிறிய, சிறிய குடிசைகளிலே மக்கள் வாழ்கின்றார்கள். இந்த வெடிகளினால் அந்தக் குடிசைகளிலே கல் விழுவதால் மக்கள் இன்றும் அச்சத்தோடு வாழ்ந்து கொண்டிருக்கிறார்கள். அந்த மலைத்தொடருக்கு இடையிலே ஒட்டுமலை என்ற ஒரு மலை இருக்கிறது. அது இன்று பூரணமாக உடைக்கப்பட்ட நிலையில் உள்ளதென்பதை அங்கு சென்று பார்த்தால் தெரியும். அது இயற்கையான அழகான ஓர் இடமாகும். அந்தப் பிரதேசத்தைச் சேர்ந்தவன் என்ற முறையிலே இதை நான் எடுத்துக்கூறுகின்றேன். ஆனபடி யினால், ஜனாதிபதி அவர்கள் இதிலே தலையிட வேண்டும். நாட்டிலே கற்களின் தேவைகள் இருக்கின்றன. ஆனால், ஓர் ஒழுங்கான, கட்டுப்பான முறையிலே அச்செயற்பாடுகள் இருக்க வேண்டுமென்பது என்னுடைய கருத்தாகும்.

அத்தோடு, மகாவலி கங்கை ஓரத்தில் மற்றும் மூதூர் கிழக்குப் பகுதி மலையடிவாரங்களில் மண் அகழ்வுகள் நடைபெறுகின்றன. அதற்கு எந்தவிதமான கட்டுப்பாடுகளும் இல்லை. அப்படி மண் அகழ்கின்ற இடங்களை அதிகாரிகள் சென்று பார்க்கிறார்களாவென்றால், அதுகூட எங்களுக்கு ஐயமாக இருக்கின்றது. மண் அகழ்ந்து அகழ்ந்து அங்கு ஒரு பாரிய குழி ஏற்பட்டிருந்தது. அந்தக் குழியிலே ஒரு 7 வயது சிறுமி விழுந்து இறந்திருக்கிறார். இப்படியான நிலைமைகள் அங்கு தொடர்கின்றன. மேலும், மகாவலி கங்கை கரையிலே மண் எடுப்பதற்கும் எந்தவிதமான கட்டுப்பாடும் இருப்பதாகத் தெரியவில்லை. இதனால் அந்த மகாவலி கங்கையோரங்களில் இருக்கின்ற விவசாயிகள் மிகவும் அதிருப்தியோடு வாழ்கின்றார்கள். அங்கு பல வருடங்களாகத் திருத்தப்படாத வீதிகள் இப்பொழுது திருத்தப்பட்டிருக்கின்றன. அந்த வீதிகளூடாக அந்த மண்ணை ஏற்றிக்கொண்டு லொறிகள் செல்கின்ற காரணத்தினால் அந்த வீதிகள் சேதப்படுத்தப் படுகின்றன. ஆகவே, இதற்கு உடனடியாக நடவடிக்கை எடுக்கவேண்டுமென்று ஜனாதிபதி அவர்களை நான் மிகவும் விநயமாகக் கேட்டுக்கொள்கின்றேன்.

அண்மையில் விவசாய அமைச்சர் அவர்கள் கந்தளாய் பிரதேசத்திற்கு வந்து, அங்குள்ள விவசாயிகள், தோட்டத் தொழிலாளர்கள் என விவசாயத்திலே முன்னோடிகளாகத் திகழ்ந்தவர்கள் எல்லோரையும் அழைத்துப் பாராட்டிய சம்பவம் வரவேற்கக்கூடியது. அந்த வைபவத்திலே நாங்களும் கலந்துகொண்டோம். இப்படியாக விவசாய மேம்பாட்டிற்காகப் பல முயற்சிகள் எடுக்கப்படுகின்றன. ஆனால், விவசாயத்துக்கான சிறு குளங்களைத் திருத்த முடியாத ஒரு நிலைமை இன்றும் அங்கிருக்கின்றது. சில குளங்களைத் திருத்துவதற்கு வன பரிபாலன இலாகா தடை விதிக்கிறது.

முப்பது வருடங்களுக்கும் மேலாக இந்த நாட்டிலே ஒரு பாரிய யுத்தம் நடந்து. யுத்த காலத்தில் அப்பகுதி விவசாயிகள் தமது வயல் நிலங்களுக்குச் செல்ல முடியாத நிலைமை காணப்பட்டதனால் அந்த நிலங்களுக்கு செல்லவில்லை. இப்பொழுது சமாதானம் நிலவுகின்ற காலத்திலே அவர்கள் தங்களுடைய வயல் நிலங்களுக்குச் சென்று, அங்குள்ள குளங்களைத் திருத்தி நெற்செய்கையை மேற்கொள்ள முனைகின்றவேளையில், அவ்வயல்களில் பற்றைகள் வளர்ந்து காடுபோல் இருப்பதால், அக்காணிகள் வனபரிபாலன இலாகாவுக்குச் சொந்தமானதென உரிமைகோருகின்றார்கள். சில காணிகளுக்கு உறுதிகள் இருக்கின்றன, வேறு சில காணிகளுக்குப் 'பேமிற்று'க்கள் இருக்கின்றன. ஆகவே, அவற்றைப் பரிசீலனை செய்து, அவர்களை அவர்களுக்கு உரித்தான காணிகளில் பயிர்செய்வதற்கு அனுமதிக்க வேண்டுமென நாங்கள் பிரதேச சபை ஒன்றிணைப்புக் கூட்டங்களிலே பல தடவைகள் வலியுறுத்தியும் இன்றும் இத்தகைய நிலைமைகள் தொடர்கின்றன.

நாங்கள் விவசாயத்தை அபிவிருத்தி செய்ய வேண்டுமாக விருந்தால் கிராமியப் பொருளாதாரம் கட்டி வளர்க்கப்பட வேண்டும். கிராமப்புறங்களிலுள்ள சிறு குளங்கள் திருத்தப்பட வேண்டும். அங்குள்ள வாய்க்கால்கள் திருத்தப்பட வேண்டும். வயல் நிலங்களை மக்கள் பிரயோசனப்படுத்தக்கூடிய சூழ்நிலை இருக்க வேண்டும். அவை யாவும் தேசிய வருமானத்தில் முக்கிய பங்கென்பதை மறந்துவிடக்கூடாது. தேசிய வருமானத்தைப் பற்றிக் குறிப்பிடும்பொழுது தேசிய வருமானத்துக்கு வலுச்சேர்க்கின்ற ஆக்கபூர்வமான வேலைகளில் அரசாங்கம் மிகவும் கவனமாக இருக்க வேண்டும். அப்படிப்பட்ட விவசாயிகளுக்கு உதவவேண்டு மென நான் இச்சந்தர்ப்பத்திலே வலியுறுத்திக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்ததாக, சம்பூர் ஒரு மீள்குடியேற்றப்பட்ட கிராமம். மேதகு ஜனாதிபதி அவர்களுடைய முயற்சியினாலும் கௌரவ பிரதம மந்திரி அவர்களும் எமது எதிர்க்கட்சித் தலைவர் அவர்களும் எடுத்துக்கொண்ட முயற்சியினாலும் அக் கிராமத்திலே மக்கள் மீள்குடியமர்த்தப்பட்டிருக்கின்றார்கள். அங்குள்ள மக்கள் விவசாயம், தோட்டப் பயிர்ச்செய்கை, கடற்றொழில் ஆகிய தொழில்களை மேற்கொள்பவர்களாக இருக்கின்றார்கள். ஆனால், இன்று அவர்கள் தமது தொழில்களைச் செய்ய முடியாது, வாழ்வாதாரம் குன்றிய நிலையில் இருக்கின்றார்கள். காரணம், அவர்களுக்குப் பக்கத்திலுள்ள காணிகளில் பயிர்செய்ய முடியாது; சிறு குளங்களைத் திருத்த முடியாது; அவர்கள் தமது காணிகளுக்குச் செல்வதற்கான அதிகாரமும் இல்லை. இவற்றுக்குத் தடைகள் விதிக்கப்பட்ட நிலையில் இருக்கின்றார்கள். அதனால் அவர்களுக்கு வேறு வழி இல்லை. அவர்கள் பரம்பரை பரம்பரையாகப் பயிர்செய்துவந்த உறுதிக் காணிகளில் பயிர்செய்ய முடியாத, வயல்களுக்கு நீரை வழங்குகின்ற சிறு குளங்களைத் திருத்த முடியாத நிலைமைகள் தொடர்கின்றன. ஆனபடியால், சம்பந்தப்பட்ட அமைச்சர்கள் இதற்கு ஒரு முற்றுப்புள்ளி வைக்கவேண்டும் என இச்சந்தர்ப்பத்திலே வலியுறுத்திக்கூற விரும்புகின்றேன்.

நீர்ப்பாசனத்தைப் பொறுத்தவரையில் மகாவலி கங்கை திருகோணமலை மாவட்டத்திலே கடலில் சங்கமிக்கின்றது. அந்த மகாவலி கங்கையினால் அப்பிரதேசத்துக்கு வளமும் இருக்கின்றது; அழிவும் ஏற்படுகின்றது. அதிகளவான நீர் மகாவலி கங்கை நீர் வீழ்வதால் அப்பிரதேசத்திலே அழிவு ஏற்படுகின்றது. சில காலங்களில் அந்த நீரின் பயன் பாட்டினால் அபிவிருத்தியும் செய்யக்கூடியதாக இருக்கின்றது. திருகோணமலையில் இரண்டு புதிய நீர்ப்பாசனத் திட்டங்கள் மேற்கொள்ளப்படவேண்டியுள்ளன. ஒன்று, திருகோண மலையின் தெற்குப் பகுதியிலே மகாவலி கங்கையின் ஒரு கிளையாக இருக்கின்ற வெருகல் கங்கையை மறித்து, அங்குள்ள கல்லரிப்பு என்ற இடத்திலே ஓர் அணைக்கட்டை அமைத்தால், அதன்மூலமாக வெருகல் பிரதேசத்திலே, பப்பியாவெளி, ஈச்சிலம்பற்று, கறுக்காய்முனை, மதுரங்குடா ஆகிய பிரதேசங்களில் கிட்டத்தட்ட 1,500 ஏக்கர் நிலப்பரப்புக்கு மேற்பட்ட விஸ்தீரணம் கொண்ட நிலங்களில் இரண்டு போகமும் பயிர் செய்யக்கூடிய நிலைமை உருவாகும். அந்த வசதியைச் செய்து கொடுத்தால், வெருகல் பிரதேச மக்கள் வசதி வாய்ப்புகளைப் பெற்று நல்ல நிலையில் வாழ வழிபிறக்குமென நான் நினைக்கின்றேன்.

அதேபோன்று, குச்சவெளிப் பிரதேசத்திலே பேராறு என்னும் அணைக்கட்டை அமைத்தால், அப்பிரதேசத்திலும் 1,500 ஏக்கர் நிலப்பரப்பை இரண்டு போகமும் பயிர்ச்செய்கை மேற்கொள்ளக்கூடியதாக இருக்கும். நான் நேற்றைய தினமும் அமைச்சரவர்கள் கலந்துகொண்ட கூட்டத்தில் இதுபற்றிக் குறிப்பிட்டிருந்தேன். அவர் தான் அவ்விடயத்தில் கவனமெடுப்பதாகக் கூறியிருந்தார். கௌரவ பிரதி அமைச்சர் அவர்களும் இச்சபையிலே இருக்கின்றார். அவர்கள் அடுத்த வருடத்தில் இந்த விடயத்தில் முக்கிய கவனமெடுத்து, இந்த இரு நீர்ப்பாசனத் திட்டங்களையும் முன்னெடுத்து உதவவேண்டுமென நான் மிகவும் அன்பாகக் கேட்டுக்கொள்கின்றேன். இந்த விடயம் பற்றி நாங்கள் பாராளுமன்றத்துக்கு வந்த காலம் தொடக்கம் கேட்கின்றோம்.

அடுத்ததாக, கந்தளாய்க் குளத்தின் நீர் தம்பலகாமம் பகுதியிலுள்ள புராதன வயல்களுக்கு நீர்ப்பாசனம் செய்வதற்கானது. முன்னைநாள் பிரதம மந்திரி டி.எஸ். சேனாநாயக்க அவர்களுடைய ஆட்சிக் காலத்தில் அந்த நீரை அப்பிரதேசத்துக்கு வழங்கிய பின்னர், மேலதிகமான நீரை வேறு வயல்களுக்குக் கொடுக்க வேண்டும் என வர்த்தமானி அறிவித்தல் விடுக்கப்பட்டது. ஆனால், இன்று கந்தளாய்க் குளத்தின் நீர் சீரான முறையில் புராதன வயல்களுக்குச் செல்லமுடியாத நிலைமை காணப்படுகின்றது. காரணம், அங்கு புதுப்புதுக் குடியேற்றங்கள், வயல்கள் ஏற்பட்டிருப்பதாகும். எனவே, அந்த நீரைச் சீரான முறையில் புராதன வயல்களை நம்பி வாழ்கின்ற தம்பலகாமம் வாசிகள் பெறக்கூடிய விதத்தில் தேவையான நடவடிக்கைகளை மேற்கொண்டு, அந்த மக்களின் வாழ்வாதாரத்துக்கு உதவிகளையும் ஒத்தாசைகளையும் செய்யவேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவுசெய்கின்றேன் நன்றி, வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
විනාඩි 14ක් තිබෙන්නට ඕනෑ. මොකද, ශ්‍රියාණි විජේවික්‍රම මහත්මියගේ විනාඩි 5ත් මගේ විනාඩි 9ක කාලයත් එකතුව විනාඩි 14ක් තිබෙන්නට ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා එම කාලයෙන් විනාඩි තුනක් ලබාගෙන තිබෙනවා.

[අ.භා. 3.18]

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
හොඳයි. කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ වත්මන් ප්‍රවණතාවන් පිළිබඳව කථා කරන මේ අවස්ථාවේදී පසුගිය වසර 60ක, 70ක කාලය තුළ නිදහස් ශ්‍රී ලංකාවේ විශාල ප්‍රගතියක් අත් කර ගත් සහ ඵලදායිතාව අතින් ඉතා ඉදිරියට ගිය අංශයක් හැටියට වී වගාව පිළිබඳ කාරණය අපට හඳුන්වන්න පුළුවන්. නමුත් අවාසනාවකට වාගේ වර්තමාන ශ්‍රම බලකාය වී වගාවෙන් ඈත්වෙලා තිබෙනවා. මේ රටේ වී වගාව අධෛර්යවත් කිරීමට විවිධ අංශවලින් මතු කළ කරුණු කාරණා හරහාත් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අප ලබාගත් ජයග්‍රහණ වියැකී යන්නට පටන් ගෙන තිබෙන බව සඳහන් කරන්න සතුටුයි. 1940 ලංකාවේ ජනගහනය මිලියන 6යි. ලක්ෂ 60ක ජනගහනයක් තමයි මීට වසර 70කට, 80කට කලින් ලංකාවේ ඉඳලා තිබෙන්නේ. පසුගිය වසර 70ක, 80ක කාලය තුළ ජනගහනය තුන් ගුණයකින් වැඩිවෙලා මිලියන 20 ඉක්මවා තිබෙනවා.

නිදහස් ශ්‍රී ලංකාවේ හිටපු මහාමාන්‍ය ඩී.එස්. සේනානායක අගමැතිතුමා ඇතුළු අගමැතිවරු, කෘෂිකර්ම ඇමතිවරු කෘෂි කර්මාන්තයට දෙන ලද ප්‍රමුඛස්ථානය නිසා අපේ රටේ වී වගාව විශාල ලෙස ප්‍රවර්ධනය වුණා. වගා කරන භූමි ප්‍රමාණය වැඩි වුණා වාගේම නිෂ්පාදන ඵලදායිතාව වැඩි වුණා. ඒ නිසා මෙට්‍රික් ටොන් මිලියනයකටත් වඩා අඩු එනම් මෙට්‍රික් ටොන් මිලියන දශම පහක, හයක තිබුණු වී වගාව විශාල ලෙස ප්‍රවර්ධනය වෙලා නිෂ්පාදන ධාරිතාව මෙට්‍රික් ටොන් මිලියන 4.8ක් එහෙම නැත්නම් ලක්ෂ 48ක ප්‍රමාණයකට වර්ධනය වුණා. 2015 වෙනකොට ලංකාව සහලින් ස්වයංපෝෂණය වෙලා තිබුණා. දැවැන්ත වී ප්‍රමාණයක් මේ රටේ නිෂ්පාදනය වුණා. මේ රටේ කෘෂි කර්මාන්තයේ ප්‍රවර්ධනය වෙනුවෙන් විවිධ දායකත්වයන් කෘෂි විද්‍යාඥයන් ඇතුළු පිරිස් ලබා දුන්නා. විශේෂයෙන්ම 1960 දශකයේ ලෝකයේ හරිත විප්ලවය සිදුවෙනකොට ඒ හා බැඳුණු සමහර කරුණු කාරණා ලංකාවේ කෘෂි කර්මාන්තයටත් ලැබිච්ච නිසා ලංකාවේ වී වගාව ඉදිරියට ගියා. එසේ ඉදිරියට ගිය වී වගාව පිළිබඳ කාරණය ලංකාවේ වාරි කර්මාන්තයේ දියුණුවත් එක්ක පසුගිය වසර 10ක, 15ක කාලය තුළ ප්‍රවර්ධනය වෙලා වී වගා කරන භූමිවල නිෂ්පාදන ඵලදායිතාව ඉහළට ගියා. ඵලදායිතාව හත් ගුණයකින් ඉහළට ගියා. නිෂ්පාදනය ඉතා විශාල ලෙස ඉහළ ගියා. එය මීට අවුරුදු පනහකට පෙර තිබුණාට වඩා 16 ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. ඒ විධියට සහලින් ස්වයංපෝෂණය වුණාට පස්සේ ඉතාම අවාසනාවන්ත ලෙස අපේ රටට සහල් වැඩිය කියන මතවාදයක් මේ රටේ ප්‍රචාරණය වුණා. වැඩිපුර තිබිච්ච වී ටික අර මත්තල ගුවන්තොටුපොළේ ගොඩ ගහලා, මේ රටට වී වැඩිය; වී ටික ගන්නට ආණ්ඩුවට හැකියාවක් නැත කියන මතවාදයක් ප්‍රචාරය කරලා කෘෂිකර්ම ඇමතිවරයා ජනතාව ඉදිරියට ඇවිල්ලා වහාම හෙක්ටයාර ලක්ෂයක වී වගාව නතර කරන්න කියලා ඉතාම අවාසනාවන්ත ලෙස වී වගා කරපු ගොවියා අධෛර්යයට පත් කළා.

වී වලට තිබිච්ච ස්ථානය පිළිබඳව සැකයක් මතු කළා. 2015 ඇති වෙච්ච ඒ තත්ත්වයත් එක්ක 2016, 2017 වර්ෂ වෙනකොට අපේ රටේ වී වගාවේ තත්ත්වය පහළ ගියා. ඊට යම් පමණකට

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

නියඟය බලපෑවා. ඒ වාගේම පොහොර සහනාධාරය අහිමිවීම නිසාත්, නියඟයේ බලපෑම නිසාත්, ගොවියා අධෛර්යවත් කිරීම නිසාත් ලංකාවේ සහල් නිෂ්පාදනය අඩු වුණා. ඒ නිසා මේ වන විට මෙට්‍රික් ටොන් 50,000ක, 60,000 සහල් ප්‍රමාණයක් පිටරටින් ආනයනය කරලා ලංකාවට බත සපයන්න වෙන තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවා. මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ ඇයි? අපේ මුතුන් මිත්තන් වී වගාවෙන් ජීවත් වෙච්ච අය. මගේ අම්මාගේ තාත්තාත්, මගේ තාත්තාගේ තාත්තාත් වී වගාවෙන් ජීවත් වෙච්ච ගොවි මහත්වරු. ඔවුන් හරි ආඩම්බරයෙන් තමයි කිව්වේ, "අපි වී ගොවිතැන කරන්නේ." කියලා. ඔවුන්ගේ සංස්කෘතිය ගොඩනැගිලා තිබුණේ කුඹුරු ගොවිතැනත් එක්ක. අපේ සිංහල සමාජය, ද්‍රවිඩ සමාජය ගොඩ නැගිලා තිබුණේ ගොවිතැන් කිරීම හරහා; කෘෂි කර්මාන්තය හරහා. මේ රටේ ජනගහනයෙන් තුනෙන් එකක් කෘෂි කර්මාන්තයෙන් සෘජුව සහ වක්‍රව යැපෙනවා. අදටත් කෘෂි කර්මාන්තය හා සම්බන්ධ වුණු විශාල ජනකායක්, මිලියන දෙකකට අධික ජනකායක් ඉන් සෘජුව යැපෙනවා. ඒ තත්ත්වය අකර්මණ්‍ය කරන්න ආණ්ඩුව කරන කටයුතු නිසා දිගින් දිගටම කෘෂි කර්මාන්ත පැත්ත අකර්මණ්‍ය වෙන බව අපි විශ්වාස කරනවා. දැනටමත් එය වෙලා තිබෙනවා. මොන ගැටලු තිබුණත් පසුගිය වසර 10ක මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පාලන කාලයේ පොහොර සහනාධාරය ලබාදීම හරහා මේ රටේ ගොවියාට විශාල සෙතක් සිදුවෙච්ච බව අපි පිළිගන්න අවශ්‍යයි. නිෂ්පාදන ධාරිතාව වැඩි කරන්න, ඵලදායිතාව වැඩි කරන්න පොහොර සහනාධාරය විශාල ලෙස ඉවහල් වුණා. යහ පාලන ආණ්ඩුව බලයට පත්වෙලා වග විභාගයක් නැතුව කෘෂි රසායන ද්‍රව්‍යක් වන ග්ලයිෆොසෙට් තහනම් කිරීම හරහා කෘෂි ක්ෂේත්‍රය විශාල ලෙස අකර්මණ්‍ය වෙලා, ගොවියා අධෛර්යවත් වෙලා තිබෙනවා කියන කාරණය අපි සඳහන් කරන්න සතුටුයි. ඒත් එක්කම මූර්ත සහනාධාරය මුල්‍ය සහනාධාරයක් බවට පත් වුණාට පස්සේ තමුන්ට වී වගාව සඳහා හෙක්ටෙයාරයකට ලැබුණු මුදල් සහනාධාරය ගොවි ජනතාව සමහර වෙලාවට තමුන්ගේ පෞද්ගලික පරිභෝජනයට පාවිච්චි කළා. පොහොර යොදනවා වෙනුවට තමුන්ගේ පෞද්ගලික පරිභෝජනය සඳහා මේ මුදල් පාවිච්චි කළ නිසා කුඹුර හරියට කර ගන්න තිබුණු අවස්ථාව ඔවුන්ට නැති වුණා. පොහොර ටික දාන්නේ නැතුව කටයුතු කිරීම හේතුවෙන් නිෂ්පාදනය බොහොම පැහැදිලි ලෙස අඩු වෙලා තිබෙනවා.

අපේ ආණ්ඩුව පැවැති කාලයේ වාර්ෂිකව රුපියල් බිලියන 38ක්, 40ක් වාගේ මුදලක් වැය කරලා වී ගොවිතැනට පමණක් නොව කුරුඳු වගාවට, රබර් වගාවට, පොල් වගාවට අවශ්‍ය සෑම පොහොර වර්ගයක්ම සහනාධාර මුදලට ලබා දුන්නා. හැබැයි, ඒක මුල්‍ය සහනාධාරයක් බවට පත් වුණාට පසුව ජනතාව කෘෂි කර්මාන්තයට ඒ මුදල් වැය කරන්නේ නැතිව තමන්ගේ පෞද්ගලික අවශ්‍යතා වෙනුවෙන් වැය කිරීම නිසා මේ රටේ කෘෂි කර්මාන්තය වෙනුවෙන් ගත් සාධනීය පියවර රැසක් දැන් අඩපණ වෙලා තිබෙනවා කියන කාරණය අපි සඳහන් කරනවා.

වී පර්යේෂණ ආයතනයේ වැඩ කරපු නිලධාරි මහත්වරුන් මේ රටේ වී වගාව ප්‍රවර්ධනය කිරීමට නව වී ප්‍රභේද හඳුන්වා දෙමින් විශාල කර්තව්‍යයක් ඉටු කළා. ඔවුන්ට අපේ ජාතියේ ගෞරවය, ප්‍රණාමය හිමි වෙන්න අවශ්‍යයි කියලා අපි කියනවා. දැන් සාලින්ද දිසානායක මැතිතුමා මේ ස්ථානයේ හිටියා. වර්තමානයේ හෙක්ටෙයාරයකින් ලබා ගන්නා වී අස්වැන්න ප්‍රමාණය වන මෙට්‍රික් ටොන් 4.3, ලෝක මට්ටමට ගිය හොඳ ගොවි මහත්මයෙක් තමයි සාලින්ද දිසානායක මහත්මයා. හෙක්ටෙයාරයකින් තුන්වැනි වැඩිම නිෂ්පාදන ධාරිතාව - නිෂ්පාදන ප්‍රමාණය- කරපු ගොවි මහත්මයා හැටියට එතුමාට සම්මානයක් ලැබුණා.

චීනයේ හෙක්ටෙයාරයකින් මෙට්‍රික් ටොන් 18ක් නිෂ්පාදනය කරනකොට, එතුමා මෙට්‍රික් ටොන් 17ක් නිෂ්පාදනය කරලා හොඳ වාර්තාවක් තිබ්බා. ඒකට අදාළ තාක්ෂණික කරුණු, දැනුම එතුමා සතුව තිබුණා. ඒ වාගේ ගොවි මහත්වරු ලංකාවේ ඉන්නවා. ඒ වාගේම ලංකාවේ හෙක්ටෙයාරයකින් ලබන අස්වැන්න මීට වඩා තුන් ගුණයක්, හතර ගුණයක් බවට පරිවර්තනය කරන්න පුළුවන් බව කෘෂි කර්මාන්තයට සම්බන්ධ පිරිස් දන්නවා. හැබැයි, ඒකට අවශ්‍ය තාක්ෂණය ලබා දීමේ ගැටලුවක් තිබෙනවා. අපේ තරුණ පිරිස කෘෂි කර්මාන්තයෙන් ඉවත් වෙන්නේ ඇයි ? ඔවුන්ට තාක්ෂණය පිළිබඳ ගැටලුවක් තිබෙනවා. අපි දැකලා තිබෙනවා, සමහර කුඹුරු යායවල තාක්ෂණික වශයෙන් උසස් අලුත් මැෂින් වර්ග, යන්ත්‍ර සූත්‍ර පාවිච්චි කරනවා. හැබැයි, සත්‍ය වශයෙන් මූලික කාරණයේ ඉඳලා, පැළ සිටුවීම සඳහා භාවිත කරන යන්ත්‍රය - transplanter එක-, අස්වැන්න නෙළීමට යොදා ගන්නා යන්ත්‍රය - harvester එක- සහ වල් නාශක ඉසීම වෙනුවෙන් භාවිත කරන යන්ත්‍රය -weeder එක- ඇතුළු මේ යන්ත්‍ර සූත්‍ර සියල්ල තාක්ෂණික දැනුමෙන් අනුනව තමන්ගේ කුඹුර සඳහා පාවිච්චි කිරීමේ නොහැකියාවක් වර්තමානයේ අපේ කෘෂි කර්මාන්තයේ නියැලෙන පිරිස් අතර තිබෙනවා. ඒ නිසා අපේ කෘෂි කර්මාන්තය යථාවත් කරන්න නම්, අනාදිමත් කාලයක් තිස්සේ අපේ රටේ පැවත ගෙන ආ කෘෂි කාර්මික ජීවන රටාව ඉදිරියටත් පවත්වා ගෙන යෑමට අවශ්‍යයි, ලාභය කොපමණ වුණත්. ලාභයෙන් තොර යැපුම් ආර්ථිකයක් හැටියට හරි ගම්මානවල තවම මේක හොඳට කෙරෙනවා. හැබැයි, අපි මෙතැනින් ඉදිරියට ගිහින් තාක්ෂණයේ දියුණුවත් නිවැරදි තාක්ෂණික දැනුම ලබා දුන්නොත් නිෂ්පාදන පිරිවැය අඩු කරලා, විශාල ඵලදායිතාවකට ගෙන යන්න පුළුවන්. බංග්ලාදේශයේ මේක කෙරෙනවා නම්, වියට්නාමයේ මේක කෙරෙනවා නම්, චීනය ඉතාම සාර්ථක ලෙස මේක කරලා සහල් අපනයනයෙන් විශාල මුදලක් ඔවුන් උපයනවා නම්, ලංකාවේ කෘෂි කර්මාන්තයට ඒ තත්ත්වයට ළඟා වෙන්න බැරි වෙන්න හේතුවක් නැහැ. හැබැයි, ඒකට මැදිහත් වෙලා කටයුතු කරන්න අවශ්‍යයි.

කෘෂි කර්මාන්තයට දිරි දෙන්නට අවශ්‍යයි. කෘෂි කර්මාන්තයෙන් ජීවත් වෙන්නට බැරිය, ලාභ ලබන්නට බැරිය, හෙක්ටෙයාර ලක්ෂයක, දෙකක වගාව නතර කරන්න ඕනෑය කියලා ඇමැතිවරු කියනවා නම්, ඒක රටේ අවාසනාවක්ය කියන කාරණය නැවත නැවත කියන්න අවශ්‍යයි. මොකද, පිටරටින් සහල් ගෙන්වන්න අවශ්‍යතාවක් නැහැ. 2015 වර්ෂය වන විට මෙට්‍රික් ටොන් මිලියන 4.8ක වී ප්‍රමාණයක් මේ රටේ නිෂ්පාදනය කළා. ඒක ඉතාම ශක්තිමත් තත්ත්වයක්. එතැනින් ඉහළට යනවා මිස, ඉදිරියට යනවා මිස ආපසු හැරී බලන්නට එපාය කියන කාරණය අපි ඉතාම ගෞරවයෙන් මේ ආණ්ඩුවට මතක් කරනවා. පුරන් කුඹුරු පිළිබඳ ප්‍රශ්නය පසු ගිය කාලයේ මේ සභාවේ කථා වෙනවා, විවිධ ස්ථානවල කථා වෙනවා අපි දැක්කා. පසුගිය වසර කිහිපය තුළ රත්නපුර සහ ගාල්ල ඇතුළු අනෙක් දිස්ත්‍රික්කවල වී වගාව පිළිබඳ ඇති වුණු මේ සෘණාත්මක ආකල්පයත් එක්ක විශාල කුඹුරු ප්‍රමාණයක් පුරන් වෙලා තිබෙනවා. නමුත්, අපේ පුරන් කුඹුරුවල වෙනත් වගාවන් සඳහා කරන දිරිගැන්වීම් ඉතාම අඩු මට්ටමක පවතින බව අපි කියන්න අවශ්‍යයි. පසු ගිය කාලයේ අපේ රටේ බඩ ඉරිඟු වගාවෙන් විශාල ආදායමක් ලැබුවා. බඩ ඉරිඟුවලින් මේ රට ස්වයංපෝෂිත තත්ත්වයට පත් වුණා. මුං ඇට, කව්පි, බඩ ඉරිඟු වැනි දේ සහ සමහර විට පුවක් වැනි දේ පවා පුරන් කුඹුරු ආශ්‍රිතව වගා කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. ඒ හරහා විශාල ආදායමක් මේ රටට ලබා ගැනීමේ හැකියාව තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

හොඳයි. විකල්ප ගොවිතැන් සඳහා විශාල ලෙස පුරන් කුඹුරු යොදා ගැනීමේ හැකියාවක් තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය ශක්‍යතාව තිබෙනවා. ගොවි මහත්වරුන් දැනුවත් කරලා පුරන් කුඹුරු යම් පමණකට අස්වද්දන්න පුළුවන්. අය වැය යෝජනාවල ඉදිරිපත් කරලා තිබුණා, කුඹුරු පනත ඉවත් කිරීම සහ සංශෝධනය කිරීම පිළිබඳ යෝජනා. අපි ඒ සඳහා විරුද්ධ වෙනවා. කෘෂිකර්ම ඇමතිවරයා කිව්වා, "එම ස්ථානයට යන්නේ නැහැ." කියලා. අපි ඒ ගැන සතුටු වෙනවා. ඒ එක්කම විකල්ප යෝජනාවලියක් ක්‍රියාත්මක කරලා පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා හෝ වෙනත් විකල්ප බෝග සඳහා යොමු කිරීමේ වැඩසටහනක් අවශ්‍ය වෙනවා. ඒ වාගේම අපි සඳහන් කරන්න අවශ්‍යයි, ගාල්ල දිස්ත්‍රික්කයේ ඉතාම ශක්තිමත්ව ක්‍රියාත්මක වන විශාල පිරිසකට සහන සැලසෙන කුරුඳු වගාව පිළිබඳව. කුරුඳු වගාව ආශ්‍රිතව පවුල් රාශියක් ජීවත් වෙනවා.

ඔවුන් ඉතාම ශක්තිමත්ව තමුන්ගේ වගාව කරගෙන, කිසිවෙකුටත් අත නොපා ඉතාම ශක්තිමත් ජීවන මට්ටමක් ළඟා කරගෙන සිටියා. හැබැයි, පොහොර සහනාධාරය ඉවත් කිරීම හරහා පොහොර හොණ්ඩරය රුපියල් 2,750ට, 3,000ට ගන්නට සිදුවීමෙන්, ඔවුන් අද විශාල ලෙස මූල්‍යමය වශයෙන් හිරවීමකට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා කුඹුරු වගාවට වාගේම තේ වගාව, කුරුඳු වගාව හා රබර් වගාව ඇතුළු සියලු වගාවලට මේ පොහොර සහනාධාරය ඉවත් කිරීම බලපානවා. අපි ආණ්ඩුවට යෝජනා කරනවා, නැවත වතාවක් මෙම සහනාධාරය හඳුන්වා දෙන්න කියලා. මොකද, එය කෘෂි කාර්මික අංශයේ ජීවත් වෙන, කෘෂි කර්මාන්තයෙන් මේ රට පෝෂණය කරන, කාටවත් අත නොපා කෘෂි කර්මාන්තයෙන් ජීවත් වෙන ලක්ෂ සංඛ්‍යාත පිරිසකට කරන දිරි දීමනාවක්ය, දිරිමත් කිරීමක්ය කියන කාරණයත් අපි මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

පසුගිය කාලයේ ගාලු දිස්ත්‍රික්කයේ කුරුඳු වගාකරුවන්ට පැළයක් රුපියල් 14ක් වුණත්, ඒ පැළ සියල්ල නොමිලේ ලබා දුන්නා. වාණිජ වගාව කරන, විශාල ගොවිබිම් හිමි කුරුඳු වගාකරුවන්ට පැළ නොමිලේ ලබා දුන්නා. නමුත් දැන් පැළයක් රුපියල් 6.50ක් වෙනවා. දැන් එක පැත්තකින්, පැළ ගන්න සල්ලි වියදම් කරන්න වෙනවා; නැවත වගාවන් සඳහා දිරි දීමනාවක් නැහැ; පාළු සිටුවන්න පැළ ටික නොමිලේ ලබා දෙන්නේ නැහැ. අනෙක් පැත්තෙන්, පොහොර සහනාධාරය ඉවත් කරලා තිබෙනවා. ඒ නිසා වගාව ආර්ථිකමය වශයෙන් -දැනට පාඩු නොලබන තත්ත්වයක තිබුණත්- නැවත වතාවක් විශාල ලෙස අභියෝගයකට ලක් වෙමින් තිබෙනවා. ඒ නිසා මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, Hon. Sujith Sanjaya Perera. You have four minutes.

[අ.භා. 3.30]

**ගරු සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. Sujith Sanjaya Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් අමාත්‍යාංශ ගණනාවක් අය වැය කාරක සභා අවස්ථාවේදී විවාදයට ගන්නා මේ වේලාවේ ඒ සම්බන්ධව අදහස් දක්වන්නට අවස්ථාව සලසා දීම පිළිබඳව මගේ ස්තුතිය ඔබතුමාට පළමුකොටම පිරිනමනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය අපේ රටේ ගොවි ජනතාවටත්, රටේ සියයට 36ක් විතර ප්‍රමාණයකටත් බලපාන ඉතාම වැදගත් අමාත්‍යාංශයක්. මෙම අමාත්‍යාංශය ගැන කථා කරන කොට, පසුගිය කාලයේ පැවැති ආණ්ඩු ගණනාවකදීම කෘෂිකර්මය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරලා ජාතික ආදායමෙන් විශාල මුදල් ප්‍රමාණයක් කෘෂිකර්මය නඟා සිටුවීම සඳහා වෙන් කළාය කියන එක අපි මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

පසුගිය රජය කාලයේ විශේෂ ව්‍යාපෘතියක් හැටියට "අපි වවමු-රට නඟමු" වැඩසටහන ක්‍රියාත්මක කරන්න කටයුතු කළ ආකාරය අපට මතකයි. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කළාට, ඒවා සම්බන්ධයෙන් ආපසු සොයා බලන කොට, ඒවායේ ප්‍රගතිය සම්බන්ධයෙන් අපට සෑහීමකට පත් වෙන්න පුළුවන්කමක් නැහැ කියන කාරණය අප දන්නවා. මම හිතන්නේ අද වෙන කොට, එම වැඩසටහන ක්‍රියාත්මක වෙනවාද, එහි ප්‍රතිඵලයක් තිබෙනවාද කියලාවත් සොයන්න-බලන්න පුළුවන් තත්ත්වයක් නැහැ. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, අපි මොන දේවල් කළත්, මොන තරම් මුදල් වියදම් කරලා, මොන තරම් ව්‍යාපෘති ඇති කරලා කෘෂිකර්මය නඟා සිටුවන්න වැඩ කටයුතු කළත්, මේවා සම්බන්ධව පසු විපරමක් එහෙම නැත්නම් මේවා සම්බන්ධව සොයා බැලීමක් සිදු කළ යුතුයි කියලායි. එසේ කරන්නේ නැත්නම් මේවාට කරන ආයෝජනවලින් වැඩක් නැහැ කියන එක තමයි මේ අවස්ථාවේදී මම කිව යුත්තේ. ඇත්තවශයෙන්ම වර්තමාන රජය බලයට පත් වුණාට පසුව විවිධ චෝදනා හා විවිධ අදහස්-උදහස් ඉදිරිපත් කළා වුණත්, ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාත්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත් එක්ව "ගොවිතැනට මුල්තැන" යනුවෙන් ලොකු වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ තුළින් ඉදිරි වසර තුන ඇතුළතදී කෘෂිකර්මය නඟා සිටුවීම සඳහා ලොකු වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබෙනවාය කියන එකත් මේ අවස්ථාවේදී මම මතක් කරන්න ඕනෑ.

ගොවි පවුලකින් බිහි වුණු පුද්ගලයෙකු හැටියට අතිගරු ජනාධිපතිතුමා ගොවිතැනට කැමැත්තක් දක්වන කෙනෙකු බව අප දන්නවා. එතුමා බලයට පත් වුණාට පසුව ආහාර නිෂ්පාදන වැඩසටහනක් ක්‍රියාත්මක කරලා, ඒ තුළින් කෘෂිකර්මය නඟා සිටුවන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධව වැඩ පිළිවෙළක් දියත් කර තිබෙනවාය කියන එක අප මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. පසුගිය කාලයේ ඒ සම්බන්ධයෙන් විශේෂ උත්සව අවස්ථාවක් තිබුණා; මූලාරම්භක අවස්ථාවක් තිබුණා. එහිදී අපි මන්ත්‍රීවරුන් හැටියට තම-තමන්ගේ බල ප්‍රදේශවල තිබෙන කුඹුරුවලට ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එසේ ගිය අවස්ථාවේදී අපි දැකපු දෙය තමයි, එසේ පුරන් වුණු කුඹුරු අස්වද්දන්න එම අද ගොවීන්ට හෝ කුඹුරු හිමියන්ට විශාල වියදමක් දරන්න සිද්ධ වෙනවා කියන කාරණය. එම කුඹුරු යථා තත්ත්වයට පත් කර ගන්න ඔවුන්ට විශාල පිරිවැයක් දරන්න සිද්ධ වෙනවා.

විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කය වැඩියෙන් කුඹුරු අස්වද්දන්නේ නැති දිස්ත්‍රික්කයක්. අපේ ප්‍රදේශයේ තිබෙනවා, කුඹුරු අක්කර හාරදහසක්. මේ කුඹුරු අක්කර හාරදහසෙන් පුරන් වෙලා තිබෙන කුඹුරු අක්කර දෙදහසක් පමණ නැවත වගා කරන්න මේ වසර දෙක ඇතුළතදී කටයුතු කර තිබෙනවාය කියන කාරණයත් මේ අවස්ථාවේදී මම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂිකර්මය නඟාසිටුවන්න ගොවීන් විසින් තවත් අදහස් ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම එවැනි පුරන් වෙච්ච කුඹුරු අස්වද්දන්න, ගොවිජන බැංකු හරහා ලබා දෙන ණය මුදල්වල වාරිකය සහ ඊට අදාළ

[ගරු සුජිත් සංජය පෙරේරා මහතා]

පොලිය අඩු කරන්න ඉල්ලීම් කරලා තිබෙනවා. ඒ තත්ත්වය ඇති කළොත්, ඒ අයට අවශ්‍ය ට්‍රැක්ටර් වැනි දේ සහ වෙනත් කෘෂි උපකරණ ලබා ගෙන මේ කර්මාන්තය දියුණු කිරීමට කටයුතු කරන්න පුළුවන් කියන අදහස ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙනුත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් ඉල්ලා සිටින්න කැමැතියි, දැනට වැඩි වී තිබෙන මේ ගොවිජන බැංකු හරහා ලබා දෙන ණය මුදලේ වාරිකය සහ පොලිය අඩු කර ඒ අයට යම් සහනයක් සලසා දෙන ලෙස.

ඊට අමතරව කිව යුතු කරුණු රැසක් තිබුණත් කාලය නොමැති නිසා ඉදිරිපත් කරන්නට නොහැකි වනවා. නමුත්, මම විශේෂයෙන්ම වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය ගැන වචන කිහිපයක් කථා කරන්නට අවශ්‍යයි.

අය වැය කථාවේදී ගරු මුදල් ඇමතිතුමා ගංවතුර පාලනය සම්බන්ධව කථා කරන කොට, විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයේ ජලාශ තුනක් ඇති කරනවාය කියන අදහසක් ඉදිරිපත් කළා. මම නියෝජනය කරන යටියන්තොට මැතිවරණ කොට්ඨාසයේ වී ඔය ප්‍රදේශයේත්, නවට ප්‍රදේශයේ තිබෙන වසම් දෙකක මේ ජලාශ ඇති කරනවාය කියලා ප්‍රකාශයක් කළා. මම හිතන විධියට ඒක යෝජනාවක් පමණයි. කැලණි ගඟ හරස් කරලා, එහෙමත් නැත්නම් වී ඔය හරස් කරලා ඒ වතුර ටික වයඹට ගෙන යනවා කියන අදහසක් ඇති නිසා, අද අපේ ප්‍රදේශවාසීන් අනවශ්‍ය ලෙස කලබලයට පත් වෙලා තිබෙනවා. නමුත්, ඒ අදාළ නිලධාරින් ඊයේ දවසේ ගෙන්වා ඒ සම්බන්ධව දැනුවත් කිරීමට කටයුතු කිරීම ගැන ගරු වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වනවා. මෙය තවම යෝජනාවක් පමණයි. මෙය ක්‍රියාත්මක කිරීම සඳහා පරිසර වාර්තාවක් හෝ ශක්‍යතා වාර්තාවක් තවම හදා නැහැ. ඒවා හදන අවස්ථාවක් ඉදිරි කාලයේදී ඒවි. අපි ගංවතුර පාලනයට කැමැතියි. ඒ නිසා අපේ ප්‍රදේශවාසීන්ට අවම හානියක් වන ආකාරයට මේ කටයුත්ත කරන්න කියන ඉල්ලීම කරමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ சாள்ஸ் நிர்மலநாதன் அவர்கள்! உங்களுக்குப் 12 நிமிடங்கள் உள்ளன.

[பி.ப. 3.35]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை ஒரு விவசாய நாடு! இந்த நாட்டின் ஜனாதிபதி ஒரு விவசாயி! இன்று குழுநிலை விவாதத்துக்கு எடுத்துக் கொள்ளப்பட்டிருக்கின்ற நான்கு அமைச்சுக்களும் விவசாயிகளை மேம்படுத்தும் நோக்கத்துக்காகவே உருவாக்கப் பட்டிருக்கின்றன. இந்த அமைச்சுகள் தமது சேவைகளைச் சரியாகச் செய்தால் - மக்களின் தேவைகளை நிறைவேற்றினால் - நாங்கள் இன்னொரு நாட்டிலிருந்து அரிசியை இறக்குமதி செய்யவேண்டிய தேவை இருக்காது என்று நான் நினைக்கின்றேன். அரிசியை இறக்குமதி செய்த பின்பு, சதொச மூலம் இறக்கிய அரிசிக்கு 15,000 மில்லியன் ரூபாய் நட்டம் காட்டவேண்டிய தேவையும் ஏற்பட்டிருக்காது. இந்த நாட்டில் விவசாயம் சரியாக இருந்திருந்தால், இந்த நாட்டுக்கு அரிசியை இறக்குமதி செய்கின்றவேளையில், பல மோசடிகள் நடைபெறுவதற்கு வாய்ப்பு இருக்காது என்பதையும் நான் இந்த நேரத்தில் குறிப்பிட விரும்புகின்றேன். விவசாயிகளின் தேவைகள் மிக முக்கியமான வையாக இருக்கின்றன. இன்று விவசாயிகள் தங்களுடைய சாப்பாட்டுக்கே விவசாயப் பொருட்களைக் கொள்வனவு செய்யவேண்டிய ஒரு சூழ்நிலை காணப்படுகின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் கடந்த 02 மாதங்களுக்கு முன்பு முல்லைத்தீவு மாவட்டத்தில் மகாவலி அமைச்சின் கீழ் இருக்கின்ற "L" வலயக் காணி தொடர்பில் சபை ஒத்திவைப்புவேளைப் பிரேரணை யொன்றைக் கொண்டுவந்தேன். அதன்போது, இக்காணி தொடர்பில் மிக விரைவில் மகாவலி அபிவிருத்தி அதிகாரசபையின் பணிப்பாளர் நாயகத்துடன் ஒரு சந்திப்பை ஏற்படுத்தி, தீர்வைப் பெற்றுத்தருவதாக கௌரவ அமைச்சர் மஹிந்த அமரவீர அவர்களும் கௌரவ பிரதி அமைச்சர் அநுராத ஜயரத்ன அவர்களும் உறுதிமொழி வழங்கினார்கள். 146 பேருக்குச் சொந்தமான 614 ஏக்கர் காணிகளுக்குரிய அனுமதிப்பத்திரத்தை இன்னமும் வழங்க முடியாத ஓர் அமைச்சாகவே நான் மகாவலி அமைச்சைப் பார்க்கின்றேன். அதேபோல, 1984ஆம் ஆண்டு கொக்கிளாய், கொக்குத்தொடுவாய், கருநாட்டுக்கேணி பிரதேசத்தில் இருக்கின்ற மக்கள் வலுக்கட்டாயமாக இடம்பெயர்க்கப்பட்ட பின்பு, அவர்களது 833 ஏக்கர் காணிகள் சகோதர இனத்துக்கு வழங்கப்பட்டிருக்கிறது. இவ்விடயம் தொடர்பில் பதிலளித்த கௌரவ அமைச்சர் மஹிந்த அமரவீர அவர்கள், "நாங்கள் அந்த மக்களுடன் சந்திப்பொன்றை ஏற்படுத்தி, இது பற்றிக் கலந்தாலோசித்து ஒரு முடிவுக்கு வருவோம்" என்று கூறினார். ஆனால், இரண்டு மாதங்களுக்கு மேலாகியும் இன்னமும் அந்தச் சந்திப்பு நடைபெறவில்லை என்பது மனவேதனையை அளிக்கின்றது. முல்லைத்தீவு மாவட்டத்துக்கு மகாவலி அதிகாரசபையின் பணிப்பாளர் நாயகம் அவர்கள் வருகை தருவதாக இரண்டு முறைகள் அறிவிக்கப்பட்டும்கூட, அவர் அங்கு வரவில்லை. இதனால், அந்த மக்களுக்குரிய தீர்வும் சரியான முறையில் கிடைக்கவில்லை என்பதையும் நான் இந்த நேரத்தில் குறிப்பிட விரும்புகின்றேன்.

அதேநேரத்தில் மன்னார், வவுனியா, முல்லைத்தீவு, கிளிநொச்சி போன்ற மாவட்டங்களில் காடழிப்பானது தொடர்ந்தும் நடைபெற்றுக்கொண்டிருக்கிறது. மக்கள் குடியிருக்கின்ற நிலங்களை வன இலாகாவினர் கைப்பற்றிக் கொண்டிருக்கின்ற இந்த நேரத்தில், மிகப் பெரிய காடுகளைப் பலர் தொடர்ந்தும் அழித்துக்கொண்டிருக்கிறார்கள். அது அரசாங்கத்துக்கும் தெரியும்; அங்குள்ள அதிகாரிகளுக்கும் தெரியும்! ஆனால், அவர்கள் நடவடிக்கை எடுப்பதற்குப் பயப்படுகின்றார்கள்.

கடந்த ஆண்டு வரவு செலவுத் திட்ட விவாதத்தில் நான் உரையாற்றும்போது மேதகு ஜனாதிபதி அவர்கள் இந்த சபையில் இருந்தார். அவரிடம் நான் தெளிவாக சில விடயங்களைக் கூறியிருந்தேன். அதற்கு அவர் அப்போதைய செயலாளர் மூலமாக முல்லைத்தீவு, வவுனியா மாவட்ட அரச அதிபர்களுக்கு காடழிப்பதை அனுமதிக்க முடியாதென்று கடிதம் எழுதியிருந்தார். ஆனால் கடிதம் மட்டும்தான் வந்தது. அங்கு எந்தவித நடவடிக்கைகளோ, மாற்றங்களோ தெரியவில்லை. தற்போழுது ஏற்படும் வரட்சிக்கு இந்தக் காடுகள் அழிக்கப்படுவது மிக முக்கியமான காரணமாக அமைகின்றது. எனவே, காடுகள் அழிக்கப்படுவதை உடனடியாக நிறுத்த வேண்டும். அதற்கு இந்த நாட்டின் தலைவர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டுமென்பதை நான் இந்த நேரத்தில் வலியுறுத்த விரும்புகின்றேன்.

கௌரவ நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சர் அவர்களே, எங்களுடைய மன்னார் மாவட்டத்தில் கட்டுக்கரைக் குளத்தின் நீரைப் பயன்படுத்தி 32,000 ஏக்கரில் நெற்செய்கை மேற்கொள்ளப்படுகின்றது. ஆனால் அங்கு ஒரு போகம் மட்டும், அதாவது காலபோகத்தில் மட்டும் பயிர் செய்யக்கூடிய அளவுக்குத்தான் நீர் இருக்கின்றது. மல்வத்து ஓயாத் திட்டத்தை நீங்கள் ஆரம்பித்திருக்கிறீர்கள். ஆனால் அதற்குரிய வேலைத்திட்டங்கள் இன்னமும் ஆரம்பித்ததாகத் தெரியவில்லை. வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள எட்டு மாவட்டங்களிலுமுள்ள -முல்லைத்தீவு, வவுனியா, மன்னார், கிளிநொச்சி, யாழ்ப்பாணம், மட்டக்களப்பு, திருகோணமலை, அம்பாறை -விவசாயிகளுக்கு இரண்டு போகம் செய்யக்கூடிய நீரை வழங்க வேண்டியது தங்களுடைய பொறுப்பும் கடமையுமாகும். அந்த வகையில், கட்டுக்கரைக் குளத்திலிருந்து இரண்டு போகத்திற்கு பயிர்செய்யக்கூடிய வகையில் நீரைப் பெறக்கூடியதாக மல்வத்துஓயாத் திட்டத்தை மிகவிரைவில் ஆரம்பிக்க வேண்டும். அதனை ஆரம்பிப்பதன் ஊடாக கட்டுக்கரைக்குளம், வியாடிக்குளம், அகத்தி முறிப்புக்குளம் ஆகிய குளங்களின் நீர்ப்பாசனத்தின்கீழ் விவசாயிகள் இரண்டு போகங்கள் பயிர் செய்கின்ற சூழ்நிலை உருவாகும். அதற்கான தங்களுடைய முயற்சியை வேண்டி நிற்கின்றேன்.

அதேநேரம் கட்டுக்கரைக்குளத்தின்கீழ் பத்து பிரதான வாய்க்கால்கள் - main canals இருக்கின்றன. இந்த canals நீண்ட காலங்களாகப் புனரமைக்கப்படவில்லை. எல்லாப் பாராளுமன்ற உறுப்பினர்களையும் அழைத்து தத்தம் பிரதேசங்களில் இருக்கின்ற குறைபாடுகளைக் கூறும் வகையில், நேற்று ஒரு கூட்டத்தைக் கூட்டியமைக்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இந்த வரவு செலவுத் திட்டம் பற்றிய விடயங்கள் குறித்து நீங்கள் மட்டும்தான் எல்லாப் பாராளுமன்ற உறுப்பினர்களையும் அழைத்துக் கேட்டிருக்கின்றீர்கள் என்று நினைக்கின்றேன். நீங்கள் குறித்த விடயங்களை நிறைவேற்றுவீர்களோ, இல்லையோ எனக்குத் தெரியாது. ஆனால், எங்களை அந்தக் கூட்டத்திற்கு அழைத்தமைக்காக உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා අමාත්‍යතුමා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු මන්ත්‍රීතුමනි, අපි ඊයේ දවසේ සියලු මන්ත්‍රීතුමන්ලා සමඟ සාකච්ඡාවක් කළා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ඒක තමයි මා බොහොම ස්තුතියි කියා කිව්වේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
බොහොම ස්තුතියි. අපි සැලසුම් හදලා තිබෙනවා. නමුත් අපි බලාපොරොත්තු වෙනවා දේශපාලන නායකත්වයේ අදහස්. ජනතාවගේ ඉල්ලීම් තමුන්නාන්සේලාටයි ලැබෙන්නේ. ඒ ඉල්ලීම් ඔබතුමන්ලාට ලැබුණාට පසුව -ඇළ මාර්ග සම්බන්ධ කරුණු- ලිඛිතව අපට දෙනවා නම් අපේ සැලසුම්වලට ඒවා ඇතුළත් කරන්න පුළුවන් කියන එක මා මේ අවස්ථාවේ මතක් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු අමාත්‍යතුමා. கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் பேசுங்கள்!

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා.

கட்டுக்கரைக்குளத்தின்கீழ் 162 சிறிய குளங்கள் இருக்கின்றன. நேற்றைய கூட்டத்தில் தங்களுடைய அதிகாரிகளுடன் இது சம்பந்தமாக அளவளாவியபோது, அந்த162 குளங்களும் நீர்ப்பாசனத் திணைக்களத்தின் நிர்வாகத்தின்கீழ் வராது என்று கூறினார்கள். மற்றைய மாவட்டங்களில் எப்படியோ தெரியாது. ஆனால், மன்னார் மாவட்டத்தில், கட்டுக்கரைக்குளத்தின் கீழுள்ள 162 சிறிய குளங்களும் நீர்ப்பாசனத் திணைக்களத்தின் கீழ்தான் வருகின்றன. அவற்றில் 40 குளங்கள் 30 வருடங்களாக எந்தவிதமான புனரமைப்பும் செய்யப்படவில்லை. கௌரவ அமைச்சர் அவர்களே, அந்த 40 குளங்கள் சம்பந்தப்பட்ட விபரங்களை நான் நேற்று தங்களுடைய பணிப்பாளர் நாயகத்திடம் கொடுத்திருக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කතා කරන්න.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அந்த ஒவ்வொரு குளத்தையும் புனரமைப்பதற்கு நான்கு - ஐந்து மில்லியன் ரூபாய்தான் தேவைப்படுகின்றது. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விடயங்களைக் கருத்திலெடுக்க வேண்டும்.

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

மேலும், விவசாயிகளுக்கு நீர் வழங்கக்கூடிய ஒரு பொறிமுறையை உருவாக்க வேண்டும். இப்பொழுது இந்தச் சபையில் எங்களுடைய நாட்டின் தலைவர் பிரசன்னமாகியிருக்கின்றார். "விவசாயிகளுக்கு முக்கியத்துவம் கொடுக்க வேண்டும்" என்று அவர் பல உரைகளில் கூறியிருப்பதை நான் கேட்டிருக்கின்றேன். நான் அவருக்கு அதற்காக நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். அதேநேரம் இன்று விவசாயிகளுக்கு அரசாங்கத்தால் செய்யப்படுகின்ற மானியங்கள் மற்றும் உதவிகள் பல அதிகாரிகளுடைய குறைபாடுகள் காரணமாக அவர்களைச் சரியான முறையில் சென்றடைவதில்லை. குறிப்பாக மன்னார் மாவட்டத்தில் கமநல சேவைத் திணைக்களத்தால் கொடுக்கப்படுகின்ற மானியம் விவசாயிகளுக்குச் சென்றடைவதில்லை. அதேநேரம் அங்குள்ள அதிகாரிகள் நபர்களின் போலிப் பெயர்களில் மானியங்களை வழங்கி, தங்களுக்குள் அவற்றைப் பங்கிடுகின்ற சூழ்நிலைதான் அங்கே இருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා අමාත්‍යතුමා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගොවිජන සේවා එක ද?

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
දුමින්ද දිසානායක ඇමතිතුමාගේ අමාත්‍යාංශයටයි අයිති වන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
අපි එතුමාට එය කියන්නම්.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ஆகவே, அரசாங்கத்தால் விவசாயிகளுக்குக் கொடுக்கப்படுகின்ற மானியங்கள் அவர்களை நேரடியாகச் சென்றடைய வேண்டும். அவை சரியான முறையில் சென்றடைகின்றதா என்பதை அமைச்சர்கள்தான் கவனிக்க வேண்டும்.

இங்கிருந்து அந்தப் பிரதேசங்களுக்கு மானியங்களை அனுப்பிவிட்டு அந்த மக்களுக்கு அவை சென்றடைந்துவிட்டன என்று வெறுமனே நினைக்கக்கூடாது. தாங்கள் அதில் கூடிய கவனம் செலுத்தவேண்டும். "நாங்கள் விவசாயம் செய்கின்றோம். எங்களுக்குச் சகல ஆவணங்களும் இருக்கின்றன; ஆனால், எங்களுக்கு அந்த 25,000 ரூபாய் மானியம் இன்னமும் கிடைக்கவில்லை" என்று பல விவசாயிகள் என்னிடம் வந்து முறையிட்டிருக்கின்றார்கள். அதேநேரம் அவர்கள் பெயர்ப்பட்டியல்களைக் கொண்டுவந்து அவற்றில் இருக்கின்ற பெயர்கள் தங்களுடைய கிராமத்தவர்கள் இல்லை என்றும் கூறுகின்றார்கள். ஆனால், அந்தப் பெயர்கள் பட்டியலில் இருக்கின்றன. ஆகவே, அந்தப் பணத்தை யார் எடுத்தார்கள்? என்று கேட்கின்றார்கள்.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඔබතුමා කියන්නේ, පොහොර සහනාධාර ගැන නේද?

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ඔව්. ඒ සඳහා රුපියල් 25,000ක් දැන් දෙනවා නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගොවි මහත්වරුන්ගේ ගිණුමට තමයි පොහොර සහනාධාරයට අදාළ මුදල් යැවෙන්නේ.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මොකක්ද, ඇමතිතුමා?

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගොවි මහත්මයාගේ account එකට තමයි ඒ මුදල් යන්නේ.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Account එකට යවනවා තමයි. බොරු නම් දාලා තිබෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
එහෙම නම් ඒ ගැන පැමිණිලි කරන්න. අපි ඒ ගැන සොයා බලන්න කියන්නම්.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluvihare - State Minister of Agriculture) **

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත අලුවිහාරේ රාජ්‍ය අමාත්‍යතුමා.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare )
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අපට කරුණු ඉදිරිපත් කළොත්-

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මා ලියුමක් යවා තිබෙනවා. මාසයකට ඉස්සර ලියුමක් යවා තිබෙනවා. ගරු දුමින්ද දිසානායක ඇමතිතුමාට address කරලා

එය යවා තිබෙනවා. එහෙම යැව්වේ නැත්නම් මා ඒ ගැන කියන්නේ නැහැ.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare )
ඒ රුපියල් 25,000 අනිවාර්යයෙන්ම ඒ ගොවියාගේ ගිණුමට තමයි යන්නේ.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ඒක දෙනවා. ඇමතිතුමා වැරදි කළා කියා මම කියන්නේ නැහැ. එහේ ඉන්න නිලධාරින් set කරලා බොරුවට ඒ ගමේ අයගේ නම් දෙකතුනක් දමනවා. ඒ අය කුඹුරු බිස්නස් කරන්නේ නැහැ. එතකොට ඇත්තටම කුඹුරු කරපු මිනිහාට ඒ සල්ලි වැටෙන්නේ නැහැ. ඒකයි ප්‍රශ්නය.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare )
මා ඒ ගැන සොයා බලන්නම්. ඔබතුමා ලිඛිතව ඉදිරිපත් කර තිබෙනවා නේ.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මා ළඟ list එක තිබෙනවා. Mark කරලාත් තිබෙනවා. ඒ අය කුඹුරු කරන්නේ නැහැ.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare )
මා ඒ ගැන සොයා බලන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් කළ කාලයෙන් තවත් විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே!

நான் மேதகு ஜனாதிபதி அவர்களுக்கு ஒரு விடயத்தைக் கூறவேண்டும். இந்த நாட்டினுடைய பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்காகவும் விவசாயிகளை மேம்படுத்துவதற்காகவும் என இந்த நான்கு அமைச்சுக்களும் இருக்கின்றன. மேதகு ஜனாதிபதி அவர்கள் இந்தச் சபைக்கு வருவதற்கு முன்பு நான் இந்தச் சபையில் இது தொடர்பில் குறிப்பிட்டிருந்தேன். நாங்கள் எமது நாட்டில் விவசாயத்தை ஒரு கட்டமைப்புக்குள் வைத்திருக்காமையினால்தான் அயல் நாடுகளிலிருந்து இந்த நாட்டுக்கு அரிசியை இறக்குமதி செய்கின்றோம் என்பதை நான் மேதகு ஜனாதிபதி அவர்களிடம் குறிப்பிட விரும்புகின்றேன். அரிசியை நாங்கள் இறக்குமதி செய்கின்றபோது அதில் பல ஊழல்கள் நடைபெறுகின்றன. அமைச்சர்கள் பலர் அதில் குளிர் காய்கின்றார்கள். பல மோசடிகள் நடைபெறுகின்றன. 'கோப்' குழுவில் இது தொடர்பில் விசாரிக்கப்பட இருக்கின்றது. அரிசி இறக்குமதியால் இந்த நாட்டுக்கு 15,000 மில்லியன் ரூபாய் நஷ்டம் எற்பட்டிருக்கின்றது. எங்களுடைய விவசாய நாட்டுக்கு இன்னொரு நாட்டிலிருந்து ஏன் நாங்கள் அரிசியை இறக்குமதி செய்ய வேண்டும்? என்பதை நான் மேதகு ஜனாதிபதி அவர்களிடம் கேட்க விரும்புகின்றேன்.

மேதகு ஜனாதிபதி அவர்களே, நான் கடந்த வரவு செலவுத் திட்ட உரையின்போது இந்தச் சபையிலே முல்லைத்தீவு, மன்னார், கிளிநொச்சி, வவுனியா ஆகிய மாவட்டங்களில் காடுகளை அழித்துக்கொண்டிருக்கின்றார்கள் என்று குறிப்பிட்டிருந்தேன். ஆனால், அங்குள்ள அதிகாரிகள் அதிகாரம் மிக்கவர்களுடைய செயலைக் கண்டுகொள்வதில்லை. சாதாரண பாமர மக்களிடம் போய், தங்களுடைய சட்டத்தை நடைமுறைப்படுத்துகின்றார்கள். பல காடுகளில் வாகனங்கள் செல்கின்ற பாதைகள் இருக்கின்றன. ஏன், காட்டுக்குள் வாகனங்கள் செல்கின்ற பாதைகள் இருக்கவேண்டும்? அங்குள்ள அதிகாரிகளுக்குத் தெரியும், யார் இதைச் செய்கின்றார்கள் என்று. ஆனால், அவர்கள் உங்களிடம் முறையிடப் பயப்படுகின்றார்கள். தாங்கள் முறையிட்டால் தங்களுக்கு இடமாற்றம் வந்துவிடுமோ? என்ற ஓர் அச்சம் அவர்களுக்கிருக்கின்றது.

மேதகு ஜனாதிபதி அவர்களே, மகாவலி அபிவிருத்தி அமைச்சு தங்களுக்குக் கீழிருக்கின்றது. கௌரவ பிரதி அமைச்சர் அநுராத ஜயரத்ன அவர்கள் என்னுடைய நண்பர். முல்லைத்தீவு மாவட்டத்தில் மகாவலிக் காணி தொடர்பான நீண்ட நாள் பிரச்சினை இருக்கின்றது. 1984ஆம் ஆண்டிலிருந்து இந்தப் பிரச்சினை இருக்கின்றது. இந்தப் பிரச்சினை தங்களுடைய அரசாங்க காலத்தில் வந்ததென்று நான் கூறவில்லை. ஆனால், தாங்கள் அந்த மக்களுக்கு ஒரு நல்ல தீர்வைக் கொடுக்க முடியும். கௌரவ இராஜாங்க அமைச்சர் மஹிந்த அமரவீர அவர்கள் இரண்டு மாதங்களுக்கு முன்பு, அந்தப் பிரச்சினையைத் தான் தீர்த்துவைப்பதாக உறுதிமொழி வழங்கினார். ஆனால், அதைச் செய்வதற்கான நடவடிக்கைகளை எடுக்கவில்லை என்பது மனவேதனை அளிக்கின்றது. பணிப்பாளர் நாயகத்துடன் கதைத்து அந்த 614 ஏக்கருக்கும் உறுதிகள் தருவதாக அவர் உறுதிமொழி வழங்கியிருந்தார். மக்களுடைய 833 ஏக்கர் காணிகளும் வேறு நபர்களுக்கு வழங்கப்பட்டது உண்மையென்றும் தங்களுடைய அரசாங்க காலத்தில் அது வழங்கப்படவில்லையென்றும் அவர் தெரிவித்திருந்தார். அத்தோடு, அதற்குப் பதிலாக மாற்றுக்காணி கொடுத்தால், அதைப் பெற்றுக்கொள்ளத் தயாரா? என்றும் அவர் இந்தச் சபையில் கேட்டார். தற்போது அதற்கு என்னால் பதில் சொல்ல முடியாதென்றும் பாதிக்கப்பட்ட மக்களுடன் கலந்தாலோசித்து உரிய நடவடிக்கைகளை எடுப்போமென்றும் அப்போது நான் கூறியிருந்தேன். ஆனால், அதற்குரிய நடவடிக்கைகள் எதுவும் இடம்பெறவில்லை. மேதகு ஜனாதிபதி அவர்களே, அதற்குரிய நடவடிக்கை எடுப்பதற்கான பணிப்புரையை வழங்கவேண்டுமென்று நான் இந்த நேரத்தில் உங்களைக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

மன்னார் மாவட்டத்தில் கமநல சேவைத் திணைக்களத்தின்கீழ் பல வெற்றிடங்கள் இருக்கின்றன. அங்கு அதிகாரிகள் குறைந்தளவிலே இருக்கின்றார்கள். Divisional Officers 12 பேர் இருக்க வேண்டும். ஆனால், 3 பேர்தான் இருக்கின்றார்கள். எங்களுக்கு 9 பேர் இன்னும் தேவையாக இருக்கின்றது. Development Officers 15 பேர் இருக்க வேண்டும். 7 பேர்தான் இருக்கின்றார்கள். Agricultural Research and Production Assistants 153 பேர் இருக்க வேண்டும். 30 பேர்தான் இருக்கின்றார்கள். ஆகவே, அங்கிருக்கின்ற வெற்றிடங்களுக்கான நியமனங்களை

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

மன்னார் மாவட்டத்தைச் சேர்ந்த தகுதியுடைய இளைஞர்களுக்கு வழங்க வேண்டும். அது தமிழர்களாக இருக்கலாம்; முஸ்லிம்களாக இருக்கலாம்; சிங்களவர்களாக இருக்கலாம்! யாராக இருந்தாலும் மன்னார் மாவட்டத்தைச் சேர்ந்தவர்களுக்கு மட்டும் அந்தப் பதவிகளை வழங்க வேண்டுமென்று நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ அமைச்சர் துமிந்த திஸாநாயக்க அவர்களே, உங்களுடைய அமைச்சின் பொறுப்பின் கீழ்தான் இந்த கமநல சேவைத் திணைக்களம் இயங்குகின்றது. நீங்கள் சபைக்கு வருவதற்கு முன்பு கமநல சேவைத் திணைக்களத்தின் குறைபாடுகள் தொடர்பாக விளக்கிக்கொண்டிருந்தேன். பிரதி அமைச்சர் அவர்கள் அதைக் கேட்டுக்கொண்டிருந்தார். எனவே, நீங்கள் அவருடன் கலந்தாலோசித்து உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். அங்கிருக்கின்ற வெற்றிடங்கள் நிரப்பப்பட வேண்டும். 153 பேர் சேவையாற்ற வேண்டிய நேரத்தில் 30 பேரால் எப்படிச் சேவையாற்ற முடியும்? அதன்படி, 123 பேர் பற்றாக்குறையாக இருக்கின்றார்கள். மக்களுடைய விவசாய நடவடிக்கைகள் மேம்பட வேண்டும். அதற்காக இந்த நான்கு அமைச்சுக்களும் சரியாக உழைக்க வேண்டும்.

முப்பது வருடங்களாக எங்களுடைய பிரதேசத்தில் அபிவிருத்திகள் செய்யப்படவில்லை. ஆனால், அதை இரண்டு வருடங்களில் செய்து தாருங்களென்று நாங்கள் கேட்கவில்லை. அதற்குரிய பொறிமுறைகளை உருவாக்க வேண்டும். கட்டுக்கரைக்குள திட்டத்தின் கீழ் 40 சிறிய குளங்கள் 30 வருடங்களாகப் புனரமைப்புச் செய்யப்படவில்லை. அதற்காக அந்த 40 குளங்களையும் 2018ஆம் ஆண்டு புனரமைப்புச் செய்துதர வேண்டுமென்று நான் கேட்கவில்லை. அங்கு செய்ய வேண்டிய சேவைகளைச் சுட்டிக்காட்டிக் கொண்டிருக்கின்றேன். தங்களுடைய நிதிக்கேற்ற வகையில் செய்து தரவேண்டுமென்றுதான் கேட்கின்றேன். இலங்கையில் இருக்கின்ற ஏனைய மாவட்டங்களைப் போல எங்களுடைய மாவட்டங்களுக்கும் முக்கியத்துவம் கொடுக்க வேண்டும் என்பதற்காகத்தான் நான் இந்த விவாதத்தில் பேசிக்கொண்டிருக்கின்றேன்.

மேதகு ஜனாதிபதி அவர்கள் கடந்த வரவு செலவுத் திட்டத்தின்போது பாராளுமன்ற உறுப்பினர்களை அழைத்து தங்களுடைய பிரதேசத்தில் இருக்கின்ற குறைபாடுகள் தொடர்பாக எழுத்துமூலம் தரும்படி கேட்டிருந்தார். அதற்கமைய நானும் எழுத்துமூலம் கொடுத்திருந்தேன். அதில் மேதகு ஜனாதிபதி அவர்களுடைய அமைச்சுப் பொறுப்பின் கீழுள்ள மத்திய சுற்றாடல் அதிகாரசபைக்குரிய விடயம் தொடர்பாக ஒரு கேள்வியைக் கேட்டிருந்தேன். அதாவது, வவுனியா மாவட்டத்தின் ஓமந்தையில் ஈயத் தொழிற்சாலையொன்று இயங்கி வருகின்றது. அது அனுமதியற்ற முறையில் அந்த இடத்தில் இயங்கிக்கொண்டிருக்கின்றது. பொருளாதார மத்திய நிலையம் அங்கு அமைந்தால் அந்த ஈயத் தொழிற்சாலையை மூடவேண்டி வருமென்ற நோக்கத்திற்காக பல அரசியல் சூழ்ச்சிகளை மேற்கொண்டு, ஓமந்தையில் அமையவிருந்த அந்த பொருளாதார மத்திய நிலையத்தைத் தாண்டிக்குளத்துக்கு மாற்றுவதாகக் கூறி, கடைசியாக அது இல்லாமலே போய்விட்டது. அதற்குரிய நடவடிக்கைகளை எடுக்க முடியுமா? எனக் கேட்டிருந்தேன். மேதகு ஜனாதிபதி அவர்களே, நீங்கள் அதற்குரிய பதிலைச் சில வாரங்களில் வழங்குவதாகக் கூறியிருந்தீர்கள். இன்று வரையில் எனக்கு எந்தவிதமான பதிலும் வழங்கப்படவில்லை. நீங்கள் பதில் வழங்கவில்லையோ அல்லது நீங்கள் எழுத்து மூலமான பதிலை அனுப்பி அது எனக்குக் கிடைக்கவில்லையோ என்பது தெரியவில்லை. ஆனால், ஈயத்தொழிற்சாலை நடத்துவதற்குரிய அனுமதிப்பத்திரம் பெறாமலேயே அங்கு ஈயத்தொழிற்சாலை இயங்கிக்கொண்டிருக்கிறது.

மேதகு ஜனாதிபதி அவர்களே, எங்களுடைய பிரதேசங்களில் குறிப்பிட்ட சில நபர்கள் தாம் என்ன வேண்டுமானாலும் செய்ய முடியும் என்ற இறுமாப்பில் இருக்கிறார்கள் என்ற விடயத்தையே நான் குறிப்பிட விரும்புகின்றேன். அவர்கள் இலங்கையிலுள்ள அரசியல் யாப்புக்கு முரணாக, சட்ட வரைவுகளுக்கு முரணாக அந்தப் பிரதேசத்திலுள்ள அதிகாரிகளைத் தங்கள்வசம் வைத்துக் கொண்டு, தாம் விரும்பியவாறு எதையும் செய்ய முடியும் என்ற நினைப்பில் இருக்கிறார்கள். நீங்கள் அவர்களுடைய அந்த நினைப்பில் மாற்றத்தைக் கொண்டுவர வேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன்.

மேலும், எங்களுடைய பிரதேசத்தில் பல ஜனநாயகப் போராட்டங்கள் நடைபெற்றுக்கொண்டிருக்கின்றன. அந்த ஜனநாயகப் போராட்டங்களுடைய வலியை நாங்கள் உங்களிடம் பல தடவைகள் கூறியிருக்கின்றோம். அதில் உண்மையான விடயங்கள் இருக்கின்றன. கடந்த அரசாங்கத்தின் ஆட்சிக்காலத்தில் ஏன், ஜனநாயகப் போராட்டங்கள் நடைபெறவில்லை? அந்த ஜனாதிபதிக்கெதிரான கோரிக்கைகளை முன்வைத்து மக்கள் ஏன், வீதியின் முன் நிற்கவில்லை? என்ற கேள்விகளை நீங்கள் கேட்க முடியும். அந்த அரசாங்கத்தின் ஆட்சிக்காலத்தில் ஜனநாயகப் போராட்டம் செய்வதற்குரிய சூழ்நிலை இருக்கவில்லை. அந்த வகையில் நான் மேதகு ஜனாதிபதி அவர்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இப்போது ஜனநாயகப் போராட்டம் செய்வதற்குரிய சூழ்நிலையை நீங்கள் உருவாக்கிக் கொண்டிருக்கின்றீர்கள். கடந்த அரசாங்கத்தில் மக்கள் கேட்பதற்குரிய காரணமும் இருக்கவில்லை. ஏனெனில் தமிழர்கள் மஹிந்த ராஜபக்ஷ அரசாங்கத்தை முற்றுமுழுதாக வெறுத்தார்கள். அந்த அரசாங்கம் வேண்டாம் என்று சொன்னார்கள். ஆனால், நீங்கள் வேட்பாளராக வரும்பொழுது தமிழ் தேசியக் கூட்டமைப்பு உங்களுக்கு வாக்களிக்கச் சொல்வதற்கு முன்னர், உங்களுக்கே வாக்களிப்பதென மக்கள் தீர்மானித்துவிட்டார்கள்.

மேதகு ஜனாதிபதி அவர்களே, அவ்வாறு வாக்களித்த உரிமையிலேதான் மக்கள் இன்று உங்களிடம் கேட்கின்றார்கள். பல எதிர்பார்ப்புடன் இந்த அரசாங்கத்துக்கு அவர்கள் வாக்களித்தார்கள். 2009ஆம் ஆண்டில் முடிவடைந்த யுத்தத்துக்குப் பின்பு மக்களிடம் பல கேள்விகள் இருந்தன. ஆனால், வெளியில் கதைப்பதற்குப் பயந்தார்கள். காரணம், புலனாய்வுத் துறையினருடையதும் அரசாங்கத்தினுடையதும் அச்சுறுத்தல் இருந்தது. நீங்கள் ஆட்சிக்கு வந்த பின்னர் பல மாற்றங்கள் நடைபெற்றிருந்தன. ஆனால், மக்கள் எதிர்பார்த்த விடயங்களில் முக்கியமான விடயங்கள் இன்னமும் நடைபெறவில்லை. இன்று மக்கள், "நாங்கள் இந்த ஜனாதிபதிக்கு வாக்களித்தோம்; எனவே, எங்களுக்கு உரிய பதிலை வழங்குங்கள்" என உரிமையுடன் கேட்கின்றார்கள்.

மேதகு ஜனாதிபதி அவர்களே, நான் ஒரேயொரு விடயத்தை மட்டும் உங்களிடம் விநயமாகக்

கேட்டுக்கொள்கின்றேன். அதாவது, வவுனியா நீதிமன்றத்தில் நடைபெற்றுக்கொண்டிருந்த 3 அரசியல் கைதிகளுக்கெதிரான வழக்கை அநுராதபுர நீதிமன்றத்துக்கு மாற்றியமை தொடர்பாக வடக்கிலுள்ள தமிழ், முஸ்லிம் வர்த்தகர்கள் அனைவருமே தமது எதிர்ப்பைத் தெரிவித்தார்கள். எதிர்ப்பு எனும்பொழுது அவர்கள் இவ்விடயம் தொடர்பாக தங்களின் கவனத்துக்குக் கொண்டுவருவதற்காகச் செய்கின்றார்கள். பல்கலைக்கழக மாணவர்கள் போராட்டங்களை நடத்தினார்கள். பின்னர் தங்களை நேரில் வந்து சந்தித்தார்கள். மொழி தெரியாத ஒரு நீதிமன்றத்தில் சட்டத்தரணிகள் இல்லாமல் வெறுமனே குற்ற ஒப்புதல் வாக்குமூலத்தை மட்டும் சாட்சியமாக ஏற்று, விசாணை நடைபெறுவதென்பது மனித உரிமை மீறல் செயலாகும். அந்தக் கைதிக்கு நீதிமன்றில் என்ன கதைக்கிறார்கள் என்று தெரியாது; சாட்சிக்காரர் சாட்சியம் அளிக்கும்பொழுது அவரால் புரிந்துகொள்ள முடியாது; அவருக்கு சிங்கள மொழியில் சாட்சியமளிக்க முடியாது. இவ்வாறிருக்கும்போது, வழக்கின் சாட்சிக்காரர் வவுனியாவுக்குச் செல்லமுடியாது என்ற காரணத்துக்காக அவ்வழக்கை அநுராதபுர நீதிமன்றத்துக்கு மாற்றுவதென்பது எவராலும் ஏற்றுக்கொள்ள முடியாத விடயம். மேதகு ஜனாதிபதி அவர்களே! நீங்கள் கூறலாம், "நீதித்துறையில் நான் தலையிட மாட்டேன், அது சுதந்திரமாக நடைபெற்றுக்கொண்டிருக்கின்றது" என்று. நீதித்துறை சரியாக இருந்தால் வவுனியா வேறு, அநுராதபுரம் வேறு என்று பிரிக்கத் தேவையில்லை. நாங்கள் அவ்வாறு பிரிக்கவில்லை; நீங்கள்தான் பிரிக்கிறீர்கள். அநுராதபுரத்திற்கு வரக்கூடிய சாட்சிக்கு ஏன், வவுனியாவுக்கு வரமுடியாது?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න. Please wind up now.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මට තව විනාඩියක් දෙන්න.

மேதகு ஜனாதிபதி அவர்களே, நீங்கள் இந்த விடயத்தைச் சட்ட மாஅதிபருடன் கலந்தாலோசித்து நல்லதொரு பதிலை வழங்க வேண்டும்.

இந்த நாட்டில் அரசியல் தீர்வொன்று வருமென்று தமிழ் மக்கள் எல்லோரும் எதிர்பார்த்துக்கொண்டிருக்கிறார்கள். அரசியல்வாதிகள் பலர் இது நடைபெறாதென்று சொல்கிறார்கள். அவ்வாறானவர்கள் தெற்கிலும் இருக்கிறார்கள், வடக்கிலும் இருக்கிறார்கள். இதனால் மக்கள் பலருக்கு சந்தேகம் இருக்கிறது. ஆனால், இந்த இரண்டு கட்சிகளும் இணைந்திருக்கின்ற இந்தத் தருணத்தில், கௌரவ எதிர்க்கட்சித் தலைவர் அவர்களின் முயற்சியில் அரசியல் தீர்வொன்றைப் பெற்றுக்கொள்ள வேண்டுமென்று நாங்கள் விரும்புகின்றோம். ஆனால் மக்களில் சிலர், "நீங்கள் சில விட்டுக்கொடுப்புகளைச் செய்கிறீர்கள், அவ்வாறு செய்யாதீர்கள்" என்று எங்களைப் பேசுகிறார்கள். நாங்கள் இன்றும் உங்களை நம்புகின்றோம். இந்த நாட்டில் ஓர் அரசியல் தீர்வு ஏற்படுவதற்கு நீங்கள் முயற்சி செய்கிறீர்கள்; அது நிறைவேற வேண்டும். அதற்கு நல்லெண்ண அடிப்படையில் இந்த மூன்று அரசியல் கைதிகள் விடயத்தில் நீங்கள் தலையிட்டு நடவடிக்கையெடுக்க வேண்டும். அவர்களுக்கு நீதிமன்றம் தீர்ப்பு வழங்கட்டும்; அதில் பிரச்சினையில்லை. ஆனால், அந்த மூன்று அரசியல் கைதிகளின் வழக்கு ஏற்கெனவே நடந்த நீதிமன்றத்தில் விசாரிக்கப்பட வேண்டுமென்பதுதான் எங்களது கோரிக்கை. இந்த நாட்டினுடைய நீதித்துறை அநுராதபுரம் வேறு வவுனியா வேறு என எங்களுடைய ஒற்றுமையைப் பிரிக்காமல், ஒன்றிணைக்கும் நடவடிக்கைகளை எடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

இறுதியாக, மேதகு ஜனாதிபதி அவர்கள் எனது உரையைக் கேட்டுக்கொண்டிருந்ததற்கு நன்றி தெரிவித்துக் கொள்கின்றேன். அத்துடன், விவசாயத்தை மேம்படுத்துவதற்காக இந்த நான்கு அமைச்சுகளும் முயற்சி செய்ய வேண்டும் என்றும் விவசாயிகளை நேரடியாகச் சென்றடையக்கூடிய வகையில் நடவடிக்கையெடுக்க வேண்டுமென்றும் கேட்டு, வாய்ப்புக்கு நன்றிகூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු දයාසිරි ජයසේකර මැතිතුමා.

මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிரா சனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. EDWARD GUNASEKARA left the Chair, and THE HON. DEPUTY SPEAKER took the Chair.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු දයාසිරි ජයසේකර මැතිතුමා.

[අ.භා. 4.04]

**ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)
ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂයන් සම්බන්ධයෙන් විවාද කරන අද දවසේ අතිගරු ජනාධිපතිතුමා මේ අවස්ථාවට සම්බන්ධ වීම ගැන අපි සන්තෝෂ වෙනවා.

විශේෂයෙන්ම මේ කාල වකවානුව තුළ එතුමාගේ අමාත්‍යාංශය යටතේ වයඹ පළාතට සේවාවන් විශාල ප්‍රමාණයක් ආරම්භ කර තිබෙනවා. විශේෂයෙන්ම මොරගහකන්ද ජලාශයේ ඉඳලා මී ඔය සිට දඹුලු ඔය දක්වා කිලෝ මීටර් 94ක් ජලය ගෙන ඒමේ ව්‍යාපෘතියත් එක්ක වයඹ පළාතේ වාරිමාර්ග ව්‍යාපාර විශාල ප්‍රමාණයකට ජලය ලබා දෙන, වැව් ප්‍රමාණයකට ජලය ලබා දෙන වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. ඒ සඳහා ඩොලර් මිලියන 300කට වැඩි ප්‍රමාණයක් අතිගරු ජනාධිපතිතුමා වෙන් කර තිබෙනවා. ලබන අවුරුද්ද, ඊළඟ අවුරුද්ද වෙන කොට මේ ඇළ කපලා සම්පූර්ණයෙන්ම අවසන් වුණාම වයඹ පළාතට ජලය පිළිබඳව තිබෙන විශාලතම අර්බුදය සැහෙන ප්‍රමාණයකින් අවසන් කර ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම කළු ගඟ ව්‍යාපෘතිය ලබන අවුරුද්දේ අවසන් කරන්න

[ගරු දයාසිරි ජයසේකර මහතා]

එතුමා බලාපොරොත්තු වෙනවා. ඒ අනුව ජලය පිළිබඳව තිබුණ විශාල අර්බුදයක්; ප්‍රශ්නයක් අවසන් කර ගන්න හැකියාව ලැබේවිය කියා අපි විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, මම කියන්න කැමැතියි, මහවැලි ව්‍යාපාරය යටතේ ඉඩම් ඔප්පු ප්‍රදානය කිරීම ගැන. මහවැලි ව්‍යාපාරය පටන් ගත්තේ 1977. මේ අවුරුදු ගණනාව තිස්සේම ලක්ෂයක් පමණ අපේ අහිංසක ගොවි ජනතාවගේ ඉඩම්වලට ඔප්පු තිබුණේ නැහැ. ඔප්පු නැති අය තවත් මීට වඩා ප්‍රමාණයක් ඉන්නවා. නමුත් පළමුවැනි වතාවට රටේ ජනාධිපතිවරයා හැටියටත්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා විධියටත්, එතුමා අද ලක්ෂයක් ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනවා. ඉන්න හිටින්න තැනක් නැතිව, ඉඩම්වල හිටියත් යම් තැනකට ගිහිල්ලා අඩුම තරමින් ණයක්වත් ගන්න බැරිව, තමන්ගේ දරුවා ඉස්කෝලයකට දමා ගන්න බැරිව, අර්බුද විශාල ප්‍රමාණයක හිරවෙලා හිටපු අහිංසක මහවැලි ගොවීන්ට ලක්ෂයක් ඉඩම් ඔප්පු ලබා දීමේ වැඩ පිළිවෙළ යටතේ මේ වන විට ඉඩම් ඔප්පු 86,000ක් පමණ ප්‍රමාණයක් ලබා දී අවසන් කරන්නට හැකිවීම ගැන අපි සන්තෝෂ වෙනවා.

ගරු සභාපතිතුමනි, පරිසරය සම්බන්ධයෙන් ගත්තොත්, එතුමා පොලිතීන් පිළිබඳව දැවැන්ත තීරණයක් ගත්තා. ඒක කවුරුවත් අත ගහන්නේ නැතිව හිටපු කටයුත්තක්. ඒ සම්බන්ධයෙන් මහා දැවැන්ත උද්ඝෝෂණ ව්‍යාපාර ගෙන ගියා. හැබැයි, ඒවායින් එතුමා සැලුණේ නැහැ. එතුමා ගත්ත තීරණය මත microns 20කට වඩා වැඩි පොලිතීන් කිසිම විධියකට පාවිච්චි කරන්න දෙන්නේ නැති තත්ත්වයකට අද පත් කර තිබෙනවා. ඒ වාගේම lunch sheets, grocery bags, lunch boxes වැනි ඒවා මේ රටේ ඉතා විශාල වශයෙන් භාවිත වුණා. එම පොලිතීන් භාවිතය දැන් සම්පූර්ණයෙන්ම තහනම් කරලා පරිසරයට හිතකර වැඩ පිළිවෙළක් ඇති කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, පොලිතීන් වෙනුවට භාවිත කළ හැකි විකල්ප නිෂ්පාදන දිරි ගැන්වීම සඳහා, එම නිෂ්පාදනයන් සඳහා ගෙන්වන යන්ත්‍ර සූත්‍ර සියයට 100ක් බද්දෙන් නිදහස් කර තිබෙනවා. එම ක්‍රියාදාමය තුළ පරිසරය සම්බන්ධයෙන් මේ රටේ විශාල වැඩ කොටසක් ක්‍රියාත්මක කර තිබෙන බව මම කියන්න කැමැතියි. ඒ වාගේම 2040 වන විට මේ රටේ electronic cars වැඩි කරලා, ඉන්ධන දහනයෙන් දුවන වාහන සංඛ්‍යාව අඩු කිරීමේ වැඩ පිළිවෙළත් එතුමා යටතේ ක්‍රියාත්මක වෙනවා.

ගරු සභාපතිතුමනි, මීට අමතරව අපේ රටේ සහල් නිෂ්පාදනය ගැනත් කාරණා ගණනාවක් මතු කළා. සහල් නිෂ්පාදනය කඩා ගෙන වැටිලාය කිව්වා. මම කියන්න කැමැතියි, මේක අවබෝධයක් නැතිව කරන කථාවක් බව. මේ රටේ කවුරුත් දන්නවා, 1974න් පසුව ඇති වුණු දැවැන්තම නියඟයට තමයි මේ කාල වකවානුව තුළ අපි මුහුණ දුන්නේ කියලා. පසු ගිය කාලයේ අපේ දිස්ත්‍රික්කයේ විතරක් කන්න තුනක් වගා කළේ නැහැ. සමහර දිස්ත්‍රික්කවල කන්න දෙකක් වගා කරලා නැහැ. එවැනි වාතාවරණයක් තුළ විශාල සහල් හිඟයක්, සහල් අර්බුදයක් ඇති වී තිබෙනවා. ඇත්තටම කියනවා නම්, පසුගිය කාලයේ අපේ තිබුණු සහල් අතිරික්තය නිසා අපි යන්තම් බේරිලා ඉන්නවා. සාමාන්‍යයෙන් අපි සහල් ආනයනය කර තිබෙන ප්‍රමාණය සියයට 15කටත් අඩුයි. මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි, සහල් හිඟයක් නොතිබුණු, සහල් අපනයනය කළ 2014 අවුරුද්දේත් සහල් ටොන් 2,50,000ක් ආනයනය කළ බව. ඒ ගැනත් පොඩ්ඩක් මතක් කර ගත්තොත් හොඳයි කියලා මම විශේෂයෙන් කියන්න කැමැතියි. 2015 යල කන්නයේ සහල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.3ක් දක්වාත්, 2015- 2016 මහ කන්නයේ සහල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 1.97ක් දක්වාත් අඩුවෙලා තිබෙනවා.

මෙසේ අඩු වෙලා ගිහින් 2017 යල කන්නයේදී නියඟය කියන ප්‍රශ්නයත් එක්ක සහල් මෙට්‍රික්ටොන් මිලියන 0.65ක් දක්වා අපේ නිෂ්පාදනය අඩු වෙලා තිබෙනවා. ඒ නිසා නැවත වගා කිරීම සඳහා වන වැඩ පිළිවෙළ ගැන තමයි ඊළඟට අප කල්පනා කළ යුත්තේ. වෙනදා වාගේ දැන් අපට කියන්න බැහැ, 'මේ කාලයට වහීවි' කියා. මේ කාලයේ ඍතු සම්පූර්ණයෙන් වෙනස් වෙලායි තිබෙන්නේ. මේ වාගේ වාතාවරණයක් තුළ අපට කරන්න තිබෙන්නේ, මේ රටේ දුවන වතුර පුළුවන් තරම් ඇවිද්දවීමයි. වැස්සක් වැහැපු ගමන් විනාඩි 45කින්, පැයකින් මුහුදට ගලාගෙන යන වතුර මේ පොළොව මත ඇවිද්දවන වැඩ පිළිවෙළ වෙනුවෙන් විශාල වැඩ කොටසක් අපට කරන්න තිබෙනවා. ඒ නිසා තමයි විශාල ගංගා ආශ්‍රිතව දැවැන්ත ජලාශ ඉදි කරලා ඒ ගංගාවලින් එන වතුර ටික රඳවා තබා ගැනීම සඳහා වන වැඩ පිළිවෙළක් අපේ ගරු විජිත් විජයමුණි සොයිසා ඇමතිතුමා යෝජනා කර තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අමාත්‍යතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු සභාපතිතුමනි, මා එක විනාඩියක් ගෙන කියන්න කැමැතියි, ගරු දුමින්ද දිසානායක මැතිතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව. මා ඒ කාරණයත් කියලාම කතාව අවසන් කරන්නම්. එතුමා ගොවි ජන රක්ෂණය වෙනුවෙන් විශාල වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. 2016-2017 මහ කන්නයේ පවුල් 520,000ක් වියළි කාල ගුණයෙන් බැට කෑවා. මේ ගැන අවබෝධයක් ලබාගෙන එතුමා ඒ වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා. 2018, 2019 වර්ෂවල ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා. ඒ යටතේ අක්කරයකට රුපියල් 40,000ක රක්ෂණ ආවරණයක් ලබා දීමේ ක්‍රමයක් එතුමා සකස් කර තිබෙනවා. ඒ වාගේම, අපේ දිස්ත්‍රික්කය තුළ විශාල වැව් ප්‍රමාණයක් සංවර්ධනය කරන්නත් එතුමා අපට මුදල් ලබා දුන් බව මා විශේෂයෙන්ම කියන්න කැමැතියි. ඒ සම්බන්ධයෙනුත් මගේ ගෞරවනීය ස්තුතිය එතුමාට පුද කරනවා.

අතිගරු ජනාධිපතිතුමාත් මේ වෙලාවේ මේ ගරු සභාවේ සිටින නිසා මා එතුමාට කියන්න කැමැතියි, මගේ ආසනයේ පමණක් වැව් 408ක් තිබෙන බව. ගරු සභාපතිතුමනි, එක ග්‍රාම සේවා කොට්ඨාසයක තිබෙනවා, වැව් 19ක්. තවත් ග්‍රාම නිලධාරි කොට්ඨාසයක තිබෙනවා, වැව් 17ක්. මේ විධියට ගත්තාම, කුඩා ආසනයක් තුළ වැව් 408ක් තිබෙනවා. මා මේ වෙලාවේ මතක් කරන්න කැමැතියි, වැව්වලින් හොරා කන එක, ගසා කන එක නතර කරලා හමුදාව යොදවා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වාරි ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් අතිගරු ජනාධිපතිතුමා පටන් ගත් බව. මා එතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, ලබන වසරේ කුරුණෑගල දිස්ත්‍රික්කයටත් එම වැඩ පිළිවෙළ ලබා දෙන්න කටයුතු කරන්න කියා. එයත් ප්‍රකාශ කරමින් අපේ නිලධාරින් සියලුදෙනාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මීළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරයි තිබෙන්නේ.

[අ.භා. 4.11]

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ස්තුතියි, ගරු සභාපතිතුමනි.

අද අප උදේ ඉඳන් මේ විවාදය අහගෙන සිටියා. අද ඒකාබද්ධයේ මන්ත්‍රීතුමන්ලා කතා කරන්නේ මේ රටේ නියඟයක් තිබිලාම නැති විධියටයි; කන්න තුනක් වගා කිරීමට නොහැකියාවක් තිබිලාම නැති විධියටයි. එතුමන්ලා කියන විධියට, සහල් නිෂ්පාදනය ඇතුළු කෘෂිකාර්මික නිෂ්පාදන බිඳ වැටිලා තිබෙන්නේත් රුපියල් 350ට පොහොර නොදීපු හින්දායි. මේ වාගේ බොරු මත පතුරුවන්න උත්සාහ කරන්න එපා කියා මා ඉල්ලා සිටින්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ අනුරාධපුරය දිස්ත්‍රික්කයේ දිගින් දිගටම නියඟය තිබුණා. ඒ වාගේම දඟවන මාසයේ ඉඳන් වර්ෂාව පතිත වන්න පටන් ගත්තා. හැබැයි අවාසනාවන්ත සිද්ධියක් වුණා, පසු ගිය සතියේ. පසු ගිය සතියේ - 12වන දා- අනුරාධපුරයේ "දෙවන මහින්දාගමනය" සිදු වුණාට පසුව ඒ රැස්වීමේදී මුදා හැරපු ද්වේෂය, ක්‍රෝධය, ජාතිවාදය, ආගම්වාදය ආදිය නිසා දෙවියන් කෝප වෙලා නැවතත් අනුරාධපුරයට නියඟය ඇවිත් තිබෙනවා. ඒ නිසා මේ වන විට ඒ රැස්වීම මෙහෙයවපු මන්ත්‍රීවරුන් දෙපළ එන කල් ජනතාව බෝල්තු අරගෙන බලාගෙන ඉන්නවා, ඒ අයට සලකන්න.

ඒක තමයි ඇත්ත තත්ත්වය. ගරු සභාපතිතුමනි, නියඟය නිසා කුඹුරු අක්කර ලක්ෂ ගණනක් අද වෙනකොට වගා කරන්නට නොහැකි වෙලා තිබෙනවා. මහවැලි ඉඩම්වල වෙනත් වගාවන් කරන්නට අවසර දෙන්නේ නැති නිසා, මේ ඉඩම්වල වෙනත් කෙටිකාලීන භෝග වගාවන් සඳහා හෝ අවසර දෙන්නට කියා මම යෝජනා කරනවා. ඒ වාගේම කෘෂිකර්මාන්තයේ නියැළෙන ගොවියාට අද මුහුණ දෙන්නට තිබෙන තවත් ඇබැද්දියක් තමයි වන සත්ත්ව උවදුර. මාස ගණනක් මහන්සි වෙලා වගා කළ තමන්ගේ වගා බිම එක රැයට වනසතුන් ඇවිත් විනාශ කරනවා. එම නිසා වන සතුන්ගෙන් වන හානිය සම්බන්ධයෙන් කෘෂි රක්ෂණ ක්‍රමයක් ආරම්භ කළ යුතුයයි මා විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම කෘෂිකාර්මික කටයුතු සඳහා අවුරුදු තිහක කාලයක සිට වගා ළිං ක්‍රමය ක්‍රියාත්මක වුණා. ඒ වගා ළිං ක්‍රමය හඳුන්වා දුන්නේ මගේ පියා. අද වෙනකොට අවසර පත්‍ර නැති හේන් ගොවිතැන් කරන ඉඩමක වගා ළිං කපන්න අවසර නැහැ. මේවාට ආධාර ගන්න ක්‍රමයකුත් නැහැ. එම නිසා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර අහිංසක ගොවීන්ට තමන්ගේ වගා ළිඳ හාරා ගන්න අවස්ථාවක් ලබා දෙන්නටය කියා මම කියන්නට කැමැතියි.

කුඩා හා මධ්‍යම පරිමාණ වැව්වල මේ වන විට වැලි ගොඩ ගැසී තිබෙනවා. ඒවායේ රොන් මඩ ඉවත් කරනවා වාගේම වැලි ඉවත් කිරීමටත් බලපත්‍ර සහිත ක්‍රමවේදයක් නිර්මාණය කළ යුතුයයි මා විශ්වාස කරනවා. මම එය යෝජනාවක් හැටියට ඉදිරිපත් කරන්නට කැමැතියි.

කුඩා වැව් ආශ්‍රිතව ගඩොල් කර්මාන්තය ගැනත් කියන්නට ඕනෑ. පසුගිය කාලයේ ගඩොල් කර්මාන්තය ක්‍රියාත්මක වුණාට අද වෙනකොට ගඩොල් කපන්න අවසර දෙන්නේ නැහැ. සහනාධාර දෙනවා වෙනුවට ගඩොල් කර්මාන්තය ක්‍රියාත්මක කරන්නට දෙනවා නම් වඩාත්ම සුදුසුයයි මම විශ්වාස කරනවා. ඒ වාගේම ජල සම්පත් සංවර්ධන ආයෝජන සඳහා මිලියන 7380ක් වෙන් කර තිබෙනවා.විශේෂයෙන් වයඹ ඇළ ව්‍යාපෘතිය ගැන කියවුණා. ඒ වාගේම ඉහළ ඇලහැර ඇළ ගැන කියවුණා. මේවායින් ජලය ලබා දෙනකොට ඒ ආශ්‍රිත වැව්වලටත් ජලය ලබා දෙනවා නම් මේ සඳහා වන ශක්‍යතාව ඉතාමත් ඉහළ යනවා යයි කියන්නට පුළුවන්.

ප්‍රාථමික කර්මාන්ත සම්බන්ධයෙනුත් කියන්න ඕනෑ. කුරුඳු වගාව අද උතුරු මැද පළාතේ ව්‍යාප්ත වෙමින් පවතිනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට නියමිත කාලය නම් අවසානයි.

**ගරු චන්දිම ගමගේ මහතා**
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ගරු සභාපතිතුමනි, මේ කුරුඳු වගාව ව්‍යාප්ත වීම වැඩසටහනක් වශයෙන් ක්‍රියාත්මක කරනවා නම් ජනතාවගේ ජීවන මට්ටම වාගේම ආදායම් මට්ටමත් උසස් කරන්නට හැකියාව ලැබෙයි කියා මම විශ්වාස කරනවා.

මෙ අවස්ථාවේදී දිගින් දිගටම ඡන්දය ගැන කථා වුණා. මම විශේෂයෙන් මෙය කියන්න ඕනෑ. මගේ ගම් ප්‍රදේශය ආශ්‍රිතව පසුගිය කාලයේ සමෘද්ධි නිලධාරිනියක් ගංජා කිලෝ විස්සක් එක්ක අහු වුණා. මේ සමෘද්ධි නිලධාරිනියත්, එතුමියගේ පුතාත් තමයි මේ ගංජා ව්‍යාපාරය කරන්නේ. කිලෝ විස්සක් අහුවුණා. මේ ගොල්ලෝ තමයි බෙහෝවිට ඡන්දය ඉල්ලන්නේ. මම විශේෂයෙන් කියන්න ඕනෑ, ඡන්දය ගැන කථා කරන්නට ඉස්සෙල්ලා හරියට අපේක්ෂකයින් දමා ගන්න. ගංජා, කුඩු, හෙරොයින්, කසිප්පු ජාවාරම් කාරයෝත් එක්ක ඡන්දය කරන්න ලැහැස්ති වෙන්න එපාය කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Sivasakthi Ananthan . You have 13 minutes.

[பி.ப. 4.15]

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)
கௌரவ தவிசாளர் அவர்களே, நீர்ப்பாசன மற்றும் நீர் வளமூல முகாமைத்துவ அமைச்சு, கமத்தொழில் அமைச்சு, மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு, ஆரம்பக் கைத்தொழில் அமைச்சு ஆகிய நான்கு அமைச்சுக்களின் இன்றைய குழுநிலை விவாதத்தில் முக்கியமான சில விடயங்களை குறிப்பிடலாமென நினைக்கின்றேன். இங்கே மாண்புமிகு ஜனாதிபதி அவர்கள் சமுகமாயிருக்கின்றபடியால், எங்களுடைய வன்னி மாவட்டத்திலிருக்கின்ற விவசாயிகள் எதிர்நோக்குகின்ற சில பிரச்சினைகளை அவருடைய கவனத்திற்கு கொண்டுவரலாமென்று நினைக்கின்றேன்.

முக்கியமாக, 2015-2016 காலப்பகுதியிலே இந்த நாட்டில் ஏற்பட்ட வரட்சி காரணமாக இரண்டு போகப் பயிர்ச்செய்கையிலும் விவசாயிகளுக்குப் பாரிய நஷ்டம் ஏற்பட்டிருக்கிறது. அதனால் அந்த விவசாயிகள் வங்கிகளில்

[ගරු සිවශක්ති ආනන්දන් මහතා]

பெற்றுக்கொண்ட கடன்களை மீளச் செலுத்த முடியாமல் மிகுந்த கஷ்டப்படுகின்றார்கள். அதுமட்டுமல்ல, வங்கிகள் கடன்களுடன் வட்டியையும் சேர்த்துச் செலுத்தும்படி அவர்களை வற்புறுத்துவதன் காரணமாக விவசாயிகள் தற்கொலை செய்கின்ற ஒரு நிலைமை ஏற்பட்டிருக்கின்றது. ஆகவே, வரட்சி காரணமாக இரண்டு போகங்களும் முற்றுமுழுதாக அழிந்திருக்கின்ற காரணத்தினால், வங்கிகளில் பெற்றுக்கொண்ட கடன்களை மீளச் செலுத்த முடியாமல் பல கஷ்டங்களை அனுபவிக்கின்ற இந்த விவசாயிகளுக்கு, குறைந்தபட்சம் அதற்குரிய வட்டியையாவது தள்ளுபடி செய்வதற்குரிய நடவடிக்கையெடுக்க வேண்டுமென்று அந்த விவசாயிகளின் சார்பிலே உங்களிடம் நாங்கள் கேட்டுக்கொள்கின்றோம்.

யுத்த காலத்தில் எங்களுடைய வன்னி மாவட்டத்தில் பல இடங்களிலும் இராணுவத்தினரால் மண் அரண்கள் அமைக்கப்பட்டன. தோட்டம் செய்யக்கூடிய காணிகளிலும் சரி, வயல்நிலக் காணிகளிலும் சரி, மேட்டு நிலக் காணிகளிலும் சரி, பல மைல் தூரத்திற்கு அவை அமைக்கப்பட்டிருக்கின்றன. அந்த வகையில், பொதுமக்களின் தோட்டக் காணிகள், வளவுக் காணிகள் மற்றும் கிராமங்களை ஊடறுத்துச் செல்கின்ற பல இடங்களில் இப்படியாக அமைக்கப்பட்டிருக்கின்ற மண் அணைகளை அகற்றவேண்டிய ஒரு பாரிய தேவை இருக்கின்றது. ஆகவே, பொதுமக்களின் காணிகளுக்கூடாகச் செல்கின்ற மண் அணைகளை அகற்றுவதற்குரிய நடவடிக் கைகளை நீங்கள் எடுக்கவேண்டும்.

எங்களுடைய பிரதேசத்தில் தேவையானவு மேட்டுநிலக் காணிகள் பாரியளவிலே இருக்கின்றன. யுத்த இடப்பெயர்வுகளுக்குப் பிறகு மேட்டு நிலப் பயிர்ச்செய்கை செய்வதற்கான ஊக்குவிப்புக்கள் அந்த மக்களுக்கு இல்லை. ஒரு புள்ளிவிபரத்தின்படி, வருடந்தோறும் 33 பில்லியன் ரூபாய் பெறுமதியான மிளகாய், வெங்காயம், நிலக்கடலை, உழுந்து, திராட்சை, தோடம்பழம், மாதுளம்பழம் போன்ற உணவுப் பொருட்கள் வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்யப் படுவதாகத் தெரியவருகின்றது. உண்மையிலே எங்களுடைய பிரதேசத்தில் பாரியளவில் நிலம் இருக்கின்றது. அந்த நிலத்தை துப்புரவு செய்து, அந்த விவசாயிகளுக்கு பிரித்துக் கொடுத்து, வங்கிகள்மூலம் இலகு கடனும் வழங்கப்படுமாக இருந்தால் வருடந்தோறும் இந்த 33 பில்லியன் ரூபாய் பணத்தை மீதப்படுத்திக்கொள்ளலாம். இவற்றை வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்வதைத் தவிர்த்து, அந்தப் பணத்தை மீதப்படுத்துவதன்மூலம் உள்ளூரில் உற்பத்தியில் ஈடுபடுகின்ற எங்களுடைய விவசாயிகளுக்குத் தேவையான வசதிகளைச் செய்து கொடுக்க முடியும்.

வவுனியா, மன்னார், முல்லைத்தீவு போன்ற பிரதேசங்களில் பருவ காலத்தில் கிடைக்கின்ற பெருமளவிலான மழை நீர் ஆற்று நீரினூடாகக் கடலிலே கலக்கின்றது. அந்த ஆற்று நீரை முறையாக முகாமைத்துவம் செய்து, அதை மறிப்புச் செய்து, தேக்கி வைத்தால் பல்லாயிரக்கணக்கான வயல் நிலங்களில் செய்கை செய்து பெருமளவு நெல்லை அறுவடை செய்யவும் முடியும். குறிப்பாக, மன்னார் மாவட்டத்திலே கூராய்த் திட்டம் என்ற ஒரு திட்டம் பற்றி நீண்ட காலமாகப் பேசப்பட்டு வருகின்றது. இந்த கூராய் ஆற்றுநீரை மறித்து அதைச் சரியாக முகாமைத்துவம் செய்வோமாக இருந்தால், கிட்டத்தட்ட இருபதுக்கும் மேற்பட்ட குளங்களிலே நீரைத் தேக்க முடியும். அத்தோடு 20,000க்கும் மேற்பட்ட வயல் காணிகளிலே நெல்லை உற்பத்தி செய்யக்கூடியதாகவும் இருக்கும். இதன்மூலம் பெருமளவிலான நீர் கடலிலே சென்று கலப்பதைத் தடுக்கலாம். ஆகவே, நீர்ப்பாசனத் திணைக்களத்தினூடாக அந்த நீரைச் சரியான முறையிலே முகாமைத்துவம் செய்வது பற்றித் திட்டமிடப்பட வேண்டும்.

கடந்த வரவு செலவுத் திட்டத்திலும் எங்களுடைய பிரதேசங்களுக்கு குளங்கள் புனரமைப்பு, நீர்ப்பாசன வாய்க்கால்கள் புனரமைப்பு என்பவற்றுக்காக நிதிகள் ஒதுக்கப்பட்டாலும்கூட, உரிய நிதிகள் உரிய காலத்திற்கு சம்பந்தப்பட்ட திணைக்களங்களுக்கு கிடைக்கவில்லையென நாங்கள் அறிகின்றோம். அதனால் பல குளங்கள், வாய்க்கால்கள் என்பன புனரமைக்கப்பட முடியாத நிலைமை இருக்கின்றது. எங்களுடைய மாவட்டத்திலே, மாகாணத் திற்குட்பட்ட 12 குளங்கள் அவசரமாகப் புனரமைக்கப்பட வேண்டிய தேவையிருக்கின்றது. அதற்கு 135 மில்லியன் ரூபாய் தேவையாகவுள்ளது. அதேபோல், மத்திய நீர்ப்பாசனத்திற்குக் கீழான 5 குளங்கள் புனரமைக்கப்பட வேண்டியிருக்கின்றது. எங்களுடைய வவுனியா மாவட்டத் திலே 2018ஆம் ஆண்டுக்கு மொத்தமாக 428 குளங்கள் புனரமைக்க வேண்டியிருக்கின்றன. அதற்கு 855.80 மில்லியன் ரூபாய் தேவைப்படுகிறது. கைவிடப்பட்ட 116 குளங்கள் இருக்கின்றன. அவற்றைப் புனரமைப்பதற்கு 583.70 மில்லியன் ரூபாய் தேவைப்படுகின்றது.

இதற்கப்பால், கமநல சேவைத் திணைக்களங்கள் ஊடாக குளங்களின் அணைக்கட்டுகள் புனரமைக்கப்பட வேண் டியிருக்கின்றன; உரக்களஞ்சியங்களை அமைக்க வேண்டியிருக்கின்றன. நெல் உலர் தளங்கள், அதாவது தற்போது இயந்திரமூலம் நெல் அறுவடை செய்கின்றபடியால் - நெல்லைப் பச்சையாக வெட்டுவதால், அந்த நெல்லைக் காயப்போடுவதற்கான தளங்கள் பல தேவைப்படுகின்றன. விதைநெல் பதனிடும் நிலையங்கள் அவசியமாகத் தேவைப்படுகின்றன. மேலும், விவசாயக் கிணறுகள், விவசாயத்துக்கான உள்ளீடுகள் மற்றும் விளைபொருட்களை எடுத்துச் செல்வதற்கான போக்குவரத்து வீதிகள் போன்றனவும் அவசியமாகத் தேவைப்படுகின்றன.

இதற்கு அப்பால், எங்களுடைய பிரதேசத்திலே 5,414 ஏக்கர் வயல் காணிகள் யுத்தத்தின் காரணமாகப் பயன்படுத்தப்படாமல் காடுகளாக இருக்கின்றன. அவற்றைத் துப்புரவு செய்ய முடியாமல் விவசாயிகள் மிகுந்த கஷ்டப்படுகிறார்கள். ஆகவே, காடுபற்றியிருக்கின்ற அந்த விவசாயக் காணிகளைத் துப்புரவு செய்து கொடுக்க வேண்டுமென்றும் இந்த நேரத்திலே கேட்டுக்கொள் ளுகின்றேன்.

அதைவிட, மேதகு ஜனாதிபதி அவர்களின்கீழ் வருகின்ற வன பரிபாலனத் திணைக்களம் மற்றும் கனிய வளத்துக்குப் பொறுப்பான அமைச்சு தொடர்பான முக்கிய விடயம் பற்றியும் குறிப்பிட வேண்டும். எங்களுடைய மாவட்ட ஒருங்கிணைப்புக் குழு, மற்றும் பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களில் அந்தப் பிரதேசத்தினுடைய இணைத் தலைவர்கள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்கள், மாகாண சபை உறுப்பினர்கள், அரசாங்க அதிபர்கள் எல்லோரும் சேர்ந்து மூன்று - நான்கு மணித்தியாலங்கள் பல்வேறுபட்ட விடயங்களைக் கலந்து பேசி எடுக்கின்ற தீர்மானத்தைக்கூட நிறைவேற்ற முடியாத அளவுக்கு, உங்களுடைய அமைச்சின்கீழ் வருகின்ற வன பரிபாலனத் திணைக்கள அதிகாரிகள், மற்றும் கனிய வளத்துக்குப் பொறுப்பான அமைச்சின் அதிகாரிகள் தனி அதிகாரம் படைத்தவர்களாக, அல்லது மாவட்டத்தில் யாருமே

அவர்களைக் கட்டுப்படுத்த முடியாதவர்களாக இருந்து தாம் ஒரு முறையைக் கடைப்பிடிக்கின்றார்கள். முக்கியமாக, வவுனியா, மன்னார், முல்லைத்தீவு அரசாங்க அதிபர்களும் சரி, மாவட்டத்தினுடைய இணைத் தலைவர்களாக இருக்கக்கூடிய அமைச்சர்கள் சரி, நிறைவேற்றுகின்ற எந்தத் தீர்மானத்தையும் அவர்கள் நடைமுறைப்படுத்துகின்றார்கள் இல்லை. இது ஒரு பாரிய பிரச்சினையாக இருக்கின்றது. இதனால் அங்கு கட்டுமானப் பணிகளுக்கு gravel எடுக்க முடிவதில்லை, மணல் எடுக்க முடியவதில்லை. மாவட்டத்தினுடைய ஒருங்கிணைப்புக் குழுவால் கால்நடைகளுக்கு மேய்ச்சல் நிலத்துக்கான காணிகளைப் பெற்றுக்கொள்வதற்கான தீர்மானம் நிறைவேற்றப்பட்டாலும்கூட அந்தக் காணிகளை ஒதுக்கிக் கொடுக்கின்றார்கள் இல்லை. ஆனால், சட்டவிரோதமான பல விடயங்களில் ஈடுபடுகின்றார்கள். களவாக மரங்கள் வெட்டப்படுகின்றன. கிரவல் மற்றும் மணல் களவாக எடுத்துச் செல்லப்படுகின்றது. ஆகவே, நீங்கள் இது சம்பந்தமாகச் சம்பந்தப்பட்ட அதிகாரிகளுக்குக் கண்டிப்பான உத்தரவு பிறப்பிக்க வேண்டும். ஏனென்றால் இவர்கள் மாவட்ட மட்டத்தில் எடுக்கப்படுகின்ற தீர்மானங்களை நிறைவேற்றுவதில் பெரியதொரு தடையாகவும் முட்டுக்கட்டையாகவும் இருக்கின்றார்கள். நீங்கள் இந்த விடயத்தில் கவனம் செலுத்த வேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Member, you have only a few minutes to wind up.

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

இன்னுமொரு முக்கியமான விடயத்தை நான் குறிப்பிட வேண்டியிருக்கின்றது. அண்மையிலே, வடக்கு மாகாணக் கல்வி அமைச்சர் சர்வேஸ்வரன் அவர்கள் வவுனியா மாவட்டத்திலே ஒரு பாடசாலை நிகழ்விலே தேசியக் கொடியை ஏற்றவில்லை என்பதற்காக அந்த மாகாணத்தினுடைய ஆளுநர் அவர்கள் சட்ட மா அதிபருடைய ஆலோசனையைக் கேட்டு, அதற்குரிய நடவடிக்கை எடுக்கப்போவதாகக் குறிப்பிட்டிருந்தார். உண்மையிலே ஆறு தசாப்த காலமாக இந்த நாட்டிலே இந்தத் தேசியக் கொடி தொடர்பாகக் கூறப்பட்டு வருகின்றது. தந்தை செல்வநாயகம், ஜீ.ஜீ. பொன்னம்பலம், அமிர்தலிங்கத்தினுடைய காலத்திலே இருந்து, இரண்டாவது தலைமுறையாக இருக்கக்கூடிய எங்களுடைய எதிர்க்கட்சித் தலைவர், மூன்றாவது தலைமுறையாக இருக்கக்கூடிய எங்களுடைய காலம்வரை - அன்று தொடக்கம் இன்றுவரை - எங்களுக்குச் சொல்லப்பட்ட விடயம், இந்த நாட்டினுடைய சுதந்திர தினமாக இருக்கலாம் அல்லது தேசியக் கொடி ஏற்றுகின்ற எந்தவொரு நிகழ்வாகவும் இருக்கலாம், தமிழ் மக்களுக்குச் சுதந்திரம் இல்லாதவரை, இந்தத் தேசியக் கொடியை ஏற்ற முடியாத ஒரு நிலைமைதான் இருக்கிறது என்பது. அந்த நிலைமைதான் வழமையாக இருந்து வந்தது.

அண்மையிலே வடக்கு மாகாணக் கல்வி அமைச்சர் ஒரு பாடசாலைக்குச் சென்று, "மாகாணக் கொடி இருக்கின்றதா?" என்று கேட்டபோது, "மாகாணக் கொடி இல்லை, தேசியக் கொடி இருக்கின்றது" என்று கூறப்பட்டபோது, தேசியக் கொடியைப் பாடசாலையின் அதிபரிடம் ஏற்றச் சொல்லியிருந்தார். அதற்கு அப்பால் அவர் பௌத்த மத வழிபாட்டிலே ஈடுபட்டிருக்கின்றார். ஆகவே, அவர் தேசியக் கொடியை ஏற்றவில்லை என்பதற்காகச் சட்ட மா அதிபரிடம் ஆலோசனை பெற்று நடவடிக்கை எடுக்கவேண்டும் என்று கூறுகின்ற ஆளுநர், குறைந்தபட்சம் இந்த நாட்டின் அரசியல் யாப்பின் 13வது திருத்தச் சட்டத்தில் இருக்கக்கூடிய காணி அதிகாரங்கள் பொலிஸ் அதிகாரங்கள், தமிழ் மொழிக்கு இருக்கக்கூடிய சம உரிமை போன்ற பல விடயங்கள் நிறைவேற்றப்படாமல் இருக்கின்றது என்பதையும் புரிந்துகொள்ள வேண்டும்.

இந்த நாட்டின் ஜனாதிபதியாக இருக்கலாம், பிரதம அமைச்சராக இருக்கலாம், ஏனைய மக்கள் பிரதிநிதிகளாக இருக்கலாம். எல்லோரும் சத்தியப்பிரமாணம் செய்துதான் பதவிகளை ஏற்றுக்கொள்கின்றோம். ஆனால், குறைந்தபட்சம் அரசியலமைப்பில் இருக்கக்கூடிய இந்த விடயங்கள்கூட இதுவரைகாலமும் நிறைவேற்றப்படவில்லை. மத்திய அரசின் முக்கிய அமைச்சர்களே அதனை நிறைவேற்றாத பட்சத்தில், மாகாண அமைச்சர் அந்தத் தேசியக் கொடியை ஏற்றவில்லை என்பதற்காகச் சட்ட மா அதிபரிடம் சென்று ஆலோசனை பெற்று நடவடிக்கை எடுக்க முடியுமாக இருந்தால், அரசியலமைப்பில் இருக்கக்கூடிய இந்த அதிகாரங்களை வழங்காத அல்லது நிறைவேற்றாத சம்பந்தப்பட்ட அமைச்சுக்கள் அல்லது அதிகாரிகளின்மீது நடவடிக்கை எடுக்க முடியாதா?

2012ஆம் ஆண்டு யாழ்ப்பாணத்திலே நடந்த ஒரு மே தினக் கூட்டத்திலே எதிர்க்கட்சித் தலைவர் அவர்கள் தேசியக் கொடியை ஏற்றியிருந்தார். அன்று அவர்மீது கடுமையான விமர்சனங்கள் முன்வைக்கப்பட்டபோது, அவரது கட்சியினுடைய தலைவராக இருக்கக்கூடிய மாவை. சேனாதிராஜா அவர்கள் பகிரங்கமாக மன்னிப்புக் கோரியிருந்தார். அதுமட்டுமல்லாமல், எதிர்க்கட்சித் தலைவர் தான் தேசியக் கொடியை ஏற்றவில்லை என்றும் தான் வணங்குகின்ற காளி தெய்வத்தினுடைய கொடியைத்தான் ஏற்றியதாகவும் குறிப்பிட்டிருந்தார். எனவே, தேசியக் கொடி ஏற்றுகின்ற விடயத்தில் தமிழ் மக்கள் மத்தியிலே நீண்ட காலமாக இருந்துவருகின்ற ஒரு பாரம்பரியம்தான் தமிழ் மக்களுக்குச் சுதந்திரம் கிடைக்காதவரை அந்தக் கொடியை ஏற்ற முடியாது என்பது. ஆகவே, ஆளுநர் அவர்கள், அரசியல் யாப்பில் இருக்கக்கூடிய அதிகாரங்கள் வழங்கப்படாமல் இருப்பதற்கு எதிராகவும் சட்ட மா அதிபரை அணுகி நடவடிக்கைகளை எடுக்க வேண்டும் என்பதையும் இந்த நேரத்திலே கூறிக்கொண்டு விடைபெறுகின்றேன்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

මීළඟට, ගරු සනත් නිශාන්ත පෙරේරා මැතිතුමා.

[අ.භා. 4.28]

**ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த பெரேரா)
(The Hon. Sanath Nishantha Perera)

ගරු සභාපතිතුමනි, වෙලාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට මාගේ ස්තුතිය පුද කරනවා. අද දින විෂයයන් ගණනාවක් සාකච්ඡාවට ගැනුණත්, ඒ අතරින් කෘෂිකර්මය, වාරිමාර්ග සහ සත්ත්ව නිෂ්පාදනය කියන කාරණා තුන පිළිබඳව විතරක් මෙම වැය ශීර්ෂ යටතේ මට ලැබී තිබෙන සීමිත කාල සීමාව තුළ කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, 1948 වසරේ නිදහස ලැබුණු දා සිට මේ දක්වා මේ රට පාලනය කළ සහ කරන නායකයන් සියලුමදෙනා

[ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා]

ඇතුළු අප අපේ හෘදය සාක්ෂියෙන් අහලා බලන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ තමයි සම්පත් ආකරයක් වන මේ රට අස්සේ ජීවත් වන මිනිසුන් හැටියට, දේශපාලනඥයින් හැටියට අපෙන් මේ මහ පොළොවට වුණු සේවය ඇතිද කියන කාරණය.

ගරු සභාපතිතුමනි, මේ කථා කරන මොහොත වෙද්දී කෘෂි කාර්මික රටක් හැටියට අපි අපේ රටට අවශ්‍ය කරන සහල්, එළවලු, පලතුරු සහ අනෙකුත් භෝග වර්ග පිට රටින් ආනයනය කරන රටක් බවට පත් වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, 1948 වසරේ නිදහස ලැබෙද්දී අපේ රටේ සහල් අවශ්‍යතාවෙන් සියයට 36යි අපි නිෂ්පාදනය කරලා තිබුණේ. අනෙක් ප්‍රමාණය අපි ආනයනය කරලා තිබුණා. ඒකට ප්‍රධාන හේතුව වෙලා තිබුණේ, සුද්දා අපේ රට ආක්‍රමණය කරලා, සුද්දාට ඕනෑ විධියට මේ රට පාලනය කිරීමයි. එතැනින් පස්සේ තට්ටු මාරු ක්‍රමයට එක එක ආණ්ඩු මේ රට පාලනය කරගෙන ඉස්සරහට ගියා. අපට අවුරුදු 18 සම්පූර්ණ වුණු කාලයේදී පමණ අපට මතකයි, ඒ ගිය ගමනේ ප්‍රතිඵලයක් හැටියට කෘෂිකර්මය කඩා වැටිලා, ගොවියා අනාථ වෙලා, ගොවියාගේ තිබුණු ඉඩ කඩම්, යාන වාහන, රත්තරන්, හරක බාන උකස් තියලා, තමුන්ගේ ණය ගෙවා ගන්න බැරුව වහ බොන ගොවියෙක් ඉන්න රටක් තමයි චන්ද්‍රිකා මැතිනිය භාර ගත්තේ. එතුමියගේ කාලයේ යම් කිසි වැඩ පිළිවෙළක් ගෙනිහිල්ලා කෘෂිකර්ම ක්ෂේත්‍රය යම් මට්ටමකට ඉහළට ගෙනාවා.

ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ අපේ දයා ගමගේ ඇමතිතුමා කිව්වා, 2001 වසරේදී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේදී ඉස්සර වෙලාම සහල් නැවක් පිට රට යැව්වා කියලා. ඒ සහල් නැව පිට රට යැව්වේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය කළ වැඩ පිළිවෙළ නිසා මිසක් රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇවිල්ලා පෙන්වපු එයාගේ වික්‍රමය නිසා නොවෙයි කියන කාරණය මතක් කරන්න ඕනෑ. එතැනින් පස්සේ මේ රටේ පස්වන විධායක ජනාධිපතිවරයා විධියට මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට භාර ගත්තාට පසුව සහල්, මුං, කව්පි, උඳු, බඩ ඉරිඟු ආදී සියල්ලෙන්ම අපේ රට ස්වයංපෝෂිත රටක් බවට පත් කරන්න පුළුවන්කම ලැබුණා.

ගරු සභාපතිතුමනි, අපේ රටේ තිබුණු මහා දැවැන්ත යුද්ධය අවසන් වීමත් ඒකට ප්‍රධාන හේතුවක් වුණා. යුද්ධය ජයග්‍රහණය කිරීමේ ප්‍රතිඵලයක් හැටියට අපේ රටේ වී නිෂ්පාදනයට මහවැලි ව්‍යාපාරය හරහා එක්කාසු වුණු ගොවි බිම් වාගේ දෙගුණයක් ගොවි බිම් නිදහස් වුණා. ඒ නිසා අපි සහලින් ස්වයංපෝෂිත වුණා. ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අපට මොනවාද මදි, අපට මොනවාද අඩුපාඩු කියලා බලමින් හරියාකාර වැඩ පිළිවෙළක් ඉස්සරහට අරගෙන ගියා. මේ රට කොතැනටද යන්නේ කියන කාරණය පිළිබඳව යම් කිසි ඉලක්කයක්, යම් කිසි දිශානතියක් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙළ තුළ තිබුණා. එදා හිටපු සමහර රාජ්‍ය නිලධාරින් වෙන්න පුළුවන්, දේශපාලනඥයින් වෙන්න පුළුවන්, එතුමාගේ හිත හදන්න ඕනෑ නිසා ඒ හදපු ප්‍රතිපත්ති මාලාවට "මහින්ද චින්තන" කියලා නමක් දැම්මා. අනෙක් ආණ්ඩුව ආපු ගමන් කෙළින්ම ඒ පොත විසි කරලා දමලා, වෙනම ක්‍රමයකට රට ඉස්සරහට අරගෙන ගියා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට මේ වෙද්දී පොහොර සහනාධාරය කැපෙනවා; වීවලට මිලක් නැති වෙනවා; වී ගොවියා වැටෙනවා, නන්නත්තාර වෙනවා.

මහ ලොකුවට අපේ දේශපාලනඥයෝ කියනවා, account එකට සල්ලි යවනවා කියලා. ගමේ අහිංසක ගොවියාට account එකට සල්ලි ගියාම, ඔහු කරන්නේ ඒ සල්ලි ටික අරගෙන අරක්කු ටිකක් බීලා නිදා ගන්න එක. අපේ රට දියුණු වෙන රටක් නේ. ඒ නිසා මහජන නියෝජිතයන් හැටියට, රාජ්‍ය නිලධාරින් හැටියට අපි රට දිහා බොහොම පරිස්සමෙන් බලන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, අද අපේ රටේ සහල් නිෂ්පාදනය කරන්න තිබෙන ප්‍රධාන ගැටලුව හැටියට මම දකින්නේ, එක පැත්තකින් පොහොර සහනාධාරය නොලැබීමයි. නියඟය නිසා අපේ කන්න තුනක් පාඩු වුණා. අපි ඒකත් පිළිගන්නවා. අපේ ප්‍රධාන ගැටලුවලින් එකක් තමයි පොහොර සහනාධාරය; අනෙක් එක තමයි වී මාෆියාව. වී මාෆියාව නිසා සමහර උදවිය අහිංසක මිනිහාගෙ තිබෙන ලේ ටික සූරා බොනවා. අද, මේ වී මාෆියාව නිසා ව්‍යාපාරිකයන් තුන්, හතර දෙනෙක්ගේ අතට මුළු රටම ගිහිල්ලා තිබෙනවා. එම නිසා ගොවියා අන්ත අසරණ වෙලා. අස්වැන්න ගෙට ගෙනෙන කාලය වෙනකොට වී මිල රුපියල් 20ට, රුපියල් 25ට පහළ බසින තත්ත්වයට වැටිලා අද අපේ ගොවියා විනාශ වෙලා තිබෙනවා. තව පැත්තකින් ඇමෙරිකාව සතුටු කරවන්න, - ඇයි, මහින්ද රාජපක්ෂව ගෙදර යවන්න ඇමෙරිකාව උදවු කළා නේ. - අද ඇමෙරිකන් පිටිවලට සහන දීලා රට තවත් පැත්තකට යනවා.

ගරු සභාපතිතුමනි, ඊළඟ කාරණය ලෙස අපි සත්ව නිෂ්පාදන විෂය පිළිබඳ කථා කළ යුතුයි. මට විනාඩි 9ක් තිබෙන නිසා අපට මේ ගැන වැඩිදුර කතා කරන්න බැරි වෙයි. ගරු සභාපතිතුමනි, මම කිරි නිෂ්පාදනය ගැන විතරක් කියන්නම්.

අපේ දයාසිරි ජයසේකර මැතිතුමා වයඹ ප්‍රධාන අමාත්‍යතුමා වශයෙන් සිටියදී මම වයඹ පළාත් සභාවේ සත්ව නිෂ්පාදන සහ සංවර්ධන ඇමතිවරයා ලෙස සිටියා. එදා අපි "වයඹින් කිරි රටට" යන තේමාව ඔස්සේ ව්‍යාපෘතියක් හැදුවා. එමඟින් අපි ගණනය කළා, ලංකාවේ වැඩිම කිරි නිෂ්පාදනය කරන්නේ කොහේද කියලා. දෛනික කිරි නිෂ්පාදනය වැඩියෙන්ම තිබෙන්නේ මධ්‍යම පළාතේ. ඔවුන්ගේ දෛනික නිෂ්පාදනය කිරි ලීටර් 207,000යි. දෙවැනි ස්ථානයේ හිටියේ අපි. අපේ දෛනික කිරි නිෂ්පාදනය, කිරි ලීටර් 179,000යි. අපි මේක වැඩි කරන්න ඕනෑ කොහොමද? වයඹ පළාත තුළ කිරි ගොවි පවුල් 52,000යි; කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 1,035යි. මේ සඳහා සියයට 6 පොලිය යටතේ ණය ව්‍යාපෘතියක් -එක සමිතියක ලක්ෂ 50 ගණනේ දෙන ව්‍යාපෘතියක්. - ක්‍රියාත්මක කරලා, අපි වෙනම mega farm කරන්නේ කොහොමද, සාමාන්‍යයෙන් මැද පන්තියේ ගොවියා නඟා සිටුවන්නේ කොහොමද, කිරිවලට මිලක් දෙන්නේ කොහොමද කියන එක පිළිබඳ යම් කිසි ඉලක්කයක්; යම් කිසි වැඩ පිළිවෙළක් අපි ළඟ තිබුණා. ඒ සඳහා එදා අපි හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ සාකච්ඡා කළා.

අපි කිව්වා, ආනයනය කරන පිටි කිරි කිලෝ එකකට රුපියල් 250ක බද්දක් අනිවාර්යෙන්ම ගහන්න කියලා. අපි ඒ එන බද්දෙන් කොටසකින් දේශීය කිරි ගොවියා ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් එදා ක්‍රියාත්මක කළා. රවි කරුණානායක මහත්තයා ආපු ගමන්ම, "ඔන්න, ඔයාලාට අපි දැන් බඩු ගණන් අඩු කරන්න හොඳ වැඩක් යෙදුවා" කියලා, රුපියල් 250ට ගහලා තිබුණු tax එක රුපියල් 150 දක්වා අඩු කළා. රුපියල් 150 දක්වා අඩු කරපු එකේ ප්‍රතිඵලයක් හැටියට ග්‍රෑම් 400 පිටි කිරි පැකට් එකක් රුපියල් 25කින් ගණන අඩු වුණා. අපි හිතමු, ග්‍රෑම් 500යි කියලා. ග්‍රෑම් 500 පැකට් එකට රුපියල් 25යි නම්, කිලෝ එකකට අඩු වෙලා තිබෙන්නේ, රුපියල් 50යි. හැබැයි, සමාගමට දුන්නු වාසිය රුපියල් 100යි. මේ සල්ලි ටික ගියේ පාරිභෝගිකයන්ට නොවෙයි, සමාගමේ අයගේ සාක්කුවලටයි.

ගරු සභාපතිතුමනි, මේකෙන් පසුව තව අර්බුදයක් ඇති වෙනවා. නෙස්ලේ සමාගම තීරණය කරනවා, "ආනයනය කරන පිටි කිරිවලට බද්ද අඩු වෙලා තිබෙන්නේ. දැන් අපි ලංකාවේ කිරි අරගෙන කිරි නිෂ්පාදනය කරන එකේ, පිටි කිරි හදන එකේ කිසි තේරුමක් නැහැ, අපි කිරිපිටි bulk එක import කරලා මෙහේ පැකට් කරලා බෙදමු" කියලා. ඒ අනුව, නෙස්ලේ සමාගම කිරි

මිලදී ගැනීම නතර කරලා කිරිපිටි ආනයනය කරන්න පටන් ගන්නවා. දැන් ලංකාවේ කිරි නිෂ්පාදනය වැඩි වෙලා තිබෙන්නේ, නෙස්ලේ සමාගම කිරි මිලදී ගන්නේ නැහැ, කිරි විකුණා ගන්න තැනක් නැහැ. ආණ්ඩුව මිල්කෝ එකට බල කරනවා, "ඔයාලා කොහොම හරි ගන්න" කියලා. ඔවුන්ට කිරි රඳවා ගැනීමේ ස්ථාන නැහැ. මේකේ ප්‍රතිඵලයක් හැටියට මිලදී ගත්ත කිරි ටික විසි කරන්න සිදු වෙනවා. මිල්කෝ සමාගම පාඩු ලබනවා. අද මේ වෙනකොට මිල්කෝ සමාගමට කිරි දෙන අහිංසක ගොවියන්ගේ කිරි ලීටරයට රුපියල් 50ක් රුපියල් 55ක් තමයි ගෙවන්නේ. fat එක දිහා බලලා මේක රුපියල් 70 දක්වා වැඩි කරනවා කියලා කියනවා. හැබැයි, තිබෙන ලොකුම අර්බුදය, මිල්කෝ එකට කිරි දෙන අයට කිරිවලට සල්ලි හම්බ වෙන්නේ මාස ගණනක් ගිහිල්ලා. ලොකු පටලැවිල්ලක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු මන්ත්‍රීතුමනි, කාලය නම් අවසානයි. ඔබතුමාට නියමිත විනාඩි 9 අවසානයි.

**ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு சனத் நிசாந்த பெரேரா)
(The Hon. Sanath Nishantha Perera)

ගරු සභාපතිතුමනි, ඔබතුමා විනාඩි 9 අවසානයි කියලා කියනවා. මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මේ රටේ නායකයන්ගෙන් මම අවසාන වශයෙන් ඉල්ලනවා, යූඑන්පී, ශ්‍රී ලංකා, ජේවීපී, සමසමාජ කියන කාරණය පැත්තකට දාලා, සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් කියන කාරණය පැත්තකට දාලා අඩුම ගණනේ අපේ රටට අල්ලපු රට වෙච්ච ඉන්දියාව දිහාවත් බලලා කටයුතු කරන්න කියලා. අපේ රටේ ජාතික ප්‍රතිපත්තිය මොකක්ද, අපේ රට යන්නේ කොහේටද, මොකක්ද කරන්නේ කියන එක ගැන වැඩ පිළිවෙළක් අපට තිබෙන්න ඕනෑ.

අද මේ රටේ ආණ්ඩුව මේ රට කොහේටද ගෙන යන්නේ කියන කාරණය පිළිබඳව මේ කිසිම කෙනෙකුට කියන්න පුළුවන්කමක් නැහැ. ගරු සභාපතිතුමනි, මා හට කාලය වෙන් කිරීම පිළිබඳව ඔබතුමාට ස්තුතිය පුද කරමින් අපි රටක් හැටියට; ජාතියක් හැටියට හෙට දවසේ නැඟිටින්නේ කොහොමද කියන කාරණය පිළිබඳව කල්පනා කරමුය කියන යෝජනාව කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

බොහොම ස්තුතියි. ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.38]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු සභාපතිතුමනි, මා හට කාලය වෙන් කර දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා. අද දිනය තුළ අමාත්‍යාංශ ගණනාවක වැය ශීර්ෂ සාකච්ඡා කරනවා. විශේෂයෙන්ම ගරු සනත් නිශාන්ත පෙරේරා මන්ත්‍රීතුමා වෙනදා නම් කථා කරන්නේ ආවේගශීලීව, ඒ වාගේම ඉතාමත්ම විවේචනාත්මකවයි. නමුත්, එතුමා අද ඉතාමත්ම සානුකම්පිතව එතුමාගේ කථාව කළා. එම නිසා ඔබතුමාගේ පක්ෂයේ නායකත්වය පිළිගනිමින් ඔබතුමා කටයුතු කරනවාදෝ කියන සැකයක් මට තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අද මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂත් විවාදයට භාජන වනවා. විශේෂයෙන්ම මා ඒ සම්බන්ධයෙන් කථා කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, පරිසරය හා සම්බන්ධ යම් කිසි ව්‍යාපෘතියක් කරන කොට අනිවාර්යයෙන්ම මධ්‍යම පරිසර අධිකාරියෙන් අවසර ගන්න ඕනෑය කියලා අපි දන්නවා. විශේෂයෙන්ම මා නියෝජනය කරන බදුල්ල දිස්ත්‍රික්කයට අයත් ඇල්ල කොට්ඨාසයේ කළු ගල් ඇඹරුම්හලක් සඳහා අවසරය ලබා ගැනීම වෙනුවෙන් අයදුම් පත්‍රයක් ඉදිරිපත් කරලා මධ්‍යම පරිසර අධිකාරියේ පළාත් අධ්‍යක්ෂවරයා මේ සඳහා නිර්දේශ කිහිපයක් සහිතව ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. මා සතුව මීට අදාළ ගොනුව තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ එකම නිර්දේශයක්වත් ඉටු නොකර මේ කළු ගල් වළ ආරම්භ කර තිබෙනවා. ගරු සභාපතිතුමනි, මෙහි තිබෙන බරපතළ ප්‍රශ්නය මොකක්ද? මා ළඟ තිබෙනවා, මීට අදාළ ඉඩම් ඔප්පුව. මේ ඉඩම් ඔප්පුව ලබා දීමේදී කොන්දේසියක් දමා තිබෙනවා, මේ ඉඩම තුළ කිසිම ඉදිකිරීමක් සඳහා අවසර නොදෙන බවත්, මේ සඳහා අවශ්‍ය අවසරය ලබා දෙන්නේ විශේෂයෙන්ම වන වගාවක් සඳහාය කියලා. ගරු සභාපතිතුමනි, ඊට හේතුව වන්නේ මේ ස්ථානය ඉතා දැඩි පරිසර හිතකාමී ස්ථානයක් වීමයි. ඊට උදාහරණ වශයෙන් එම ස්ථානයේ ඡායාරූප මා සතුව තිබෙනවා. ගරු සභාපතිතුමනි, මෙහි තිබෙන ඛේදනීය තත්ත්වය තමයි, මේ ස්ථානය තුළ මේ ව්‍යාපාරය ආරම්භ කරන්න පළාත් සභාවේ අනුමැතියක් නොලැබීම. හැබැයි, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න අවසර දීම පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂවරයාගෙන් අහන කොට එතුමා කිව්වා, මේ නිර්දේශ අනුව කටයුතු නොකිරීම තුළ එතුමාට නීති උපදෙස් ගන්න සිදු වුණා කියලා. ගරු සභාපතිතුමනි, මෙතැන අදාළ ඇමතිතුමා ඉන්නවා නම්, මා එතුමාගෙන් මේ සම්බන්ධයෙන් අහන්න අවස්ථාවක් කර ගන්නවා. තමන් විසින්ම ලබා දෙන බලපත්‍රයේ කොන්දේසි කඩනවා නම්, ඒ කඩපු කොන්දේසිය පැහැර හැරීම වෙනුවෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමේ බලයක් එතුමාට නැහැයි කියන කාරණයයි එතුමා මේ කියන්නේ.

තවත් කාරණයක් තමයි, අපේ පළාතේ, අපේ දිස්ත්‍රික්කයේ අපි හැම දාම ගරු කරන අපේ උගත් බුද්ධිමත් ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා තමයි, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සමසභාපතිවරයා. එතුමාත් මේක පිළිගන්නවා. නමුත්, මට මේක කිසිසේත්ම පිළිගන්න බැහැ. විශේෂයෙන්ම ඇල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා කියනවා, ඉහත ගල් ඇඹුරුම් හල හෝ ඒ ආශ්‍රිත කිසිදු කර්මාන්තයක් සඳහා ඇල්ල ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා නැහැයි කියන කාරණය. ගරු සභාපතිතුමනි, මෙපමණ බලයක් තිබෙන්නේ කොහොමද? මේ සම්බන්ධයෙන් දේශපාලන අධිකාරියක් ක්‍රියාත්මක වනවා.

අපේ අතිගරු ජනාධිපතිතුමා ඊයේ ප්‍රකාශ කළා, එතුමාගේ ආගමනයත් එක්ක එතුමා විශාල වැඩ පිළිවෙළක් මේ රටට කරන්න ආවා කියන කාරණය. එතුමා මූලිකත්වය ගනිමින් පරිසර හිතකාමී වැඩ පිළිවෙළක් ගෙන යන බව මා දන්නවා. එතුමාගේ අමාත්‍යාංශයේ සිටින නිලධාරින් එතුමාගේ නම පාවිච්චි කරලා; එතුමාගේ බලය පාවිච්චි කරලා එදා මහින්ද රාජපක්ෂ යුගයේදී වාගේ අදත් ක්‍රියාත්මක වනවා නම්, මේවාට විරුද්ධව කථා කරන්නේ කවුද, ගරු සභාපතිතුමනි? එම නිසා අතිගරු ජනාධිපතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා, මේක මේ ප්‍රදේශයේ බලවත් දේශපාලන නායකයෙකු විසින් කරන කර්තව්‍යයක්, මේක නැවැත්විය යුතුයි කියලා. ගොවි සංවිධානය දිගින් දිගටම

[ගරු චමින්ද විජේසිරි මහතා]

ඔබතුමාට ලියා තිබෙනවා, මේක කරන්න දෙන්න එපා කියලා. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ අමාත්‍යාංශයේ සියලු දෙනාටම ගොවි සංවිධානය මේ සම්බන්ධයෙන් ලියා තිබෙනවා. මා සතුව ඒ ලියුම් තිබෙනවා. මේ සියලු දේවල් කරන අතරේ අපි පරිසරය රැක ගන්නත් කටයුතු කරනවා, ගරු සභාපතිතුමනි. මේ මොකක්ද වෙන්නේ?

මා ඊළඟට කථා කරන්නේ වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය ගැනයි. උමා ඔය ව්‍යාපෘතිය කියන්නේ ඉතාම අකර්මණ්‍ය වූ ව්‍යාපෘතියක්. එම ව්‍යාපෘතිය නිසා අද එම ප්‍රදේශවල ජනතාව විශාල පීඩන තත්ත්වයක ඉන්නවා. අද ඔවුන්ට වන්දි ගෙවනවා කියන කාරණය පැත්තකට දමා මාර්ග හදන්න මුදල් වෙන් කළාට, ඒ මාර්ගත් හදන්නේ උමා ඔය ව්‍යාපෘතියෙන් අසරණ වූ ජනතාවට නොවෙයි කියන කාරණය මා මතක් කර දෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වනවා.

[பி.ப. 4.43]

**ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)

கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய குழுநிலை விவாதத்தில் பேசுவதற்கு வாய்ப்பளித்தமைக்கு நன்றி. மகாவலிக் கருத்திட்டம் என்பது ஒரு பட்டினி ஒழிப்புத் திட்டமாக உருவாக்கப்பட்டது. அது UNDP இனது Food and Agriculture Organization இன் ஆலோசனையிலும் அனுசரணையுடனும் உருவாக்கப்பட்டது. ஆரம்ப கருத்திட்டம் 9 லட்சம் ஏக்கர் நீர்ப்பாசனத்துக்காகவும் நீர் மின்சாரத்துக் காகவும் உருவாக்கப்பட்டது. ஆரம்பத்தில் 3 துணைக் கருத்திட்டங்கள் 30 வருட கால எல்லைக்குள் நடைமுறைப் படுத்துவதற்குத் திட்டமிடப்பட்டிருந்தது. 1970ஆம் ஆண்டு Prime Minister Dudley Senanayake அவர்களால் இது ஆரம்பிக்கப்பட்டிருந்தது.

1970ஆம் ஆண்டு பொதுத்தேர்தலில் UNP அரசு தனது அரசாட்சியை இழந்த காரணத்தினால் இந்தக் கருத்திட்டம் அடுத்த ஆட்சியமைத்த திருமதி சிறிமாவோ பண்டாரநாயக்க அவர்களின் கைகளுக்குச் சென்றது. அவருடைய ஆட்சிக் காலத்தில் வடக்குக்கும் மகாவலி நீர் வந்தது; புதுக்குடியிருப்பு நகரத்துக்கு அண்மையில் அமைந்துள்ள மன்னாகண்டல் என்ற பிரதேசம் பிரதேசத்துக்கு முத்தையன்கட்டு குளத்தினூடாக மகாவலி நீர் வழங்கப் பட்டிருந்தது. இந்தத் தண்ணீர் வழங்கல்மூலம் அப்பிரதேசத்தி லுள்ள விவசாயிகள் மிளகாய், உப உணவுப் பயிர்ச்செய்கை மேற்கொண்டதன்மூலமும் நெற்செய்கைமூலமும் பாரிய இலாபம் ஈட்டினார்கள். அதன் பின்னர்தான் புதுக்குடியிருப்பு பிரதேச மக்கள் டிராக்டர் போன்ற வாகனங்களைக் கொள்வனவு செய்து சிறந்த விவசாயிகளாக மாற்றம் பெற்றனர்.

அந்தக் காலகட்டத்தில் "படித்த வாலிபர் திட்டம்" என்னும் புதிய திட்டத்தினூடாகத் தமிழ் இளைஞர்கள் உள்வாங்கப் பட்டு, அவர்களுக்கு முத்தையன்கட்டுப் பிரதேசத்தில் காணிகள் வழங்கப்பட்டிருந்தன. இது தலைவர் பிரபாகரன் அவர்களுடைய காலத்திலிருந்த இளைஞர்களுக்குக் கிடைத்த ஒரு திட்டமாக இருந்தது. இந்த "படித்த வாலிபர்கள் காணி அபிவிருத்தித் திட்டம்" பின்னர் தடைப்பட்டது. முத்தையன் கட்டுக்கு வந்த மகாவலி நீர் மணலாறு நோக்கித் திருப்பி விடப்பட்டது; மக்களுக்கிடையில் இனவாதம் விதைக்கப் பட்டது. சிங்களக் குடியேற்றங்கள் வெலிஓயா பிரதேசத்தில் மேற்கொள்ளப்பட்டன. மணலாறு என்ற தமிழ்ப் பிரதேசம் 'வெலிஓயா' என மாறியது. 1988ஆம் ஆண்டின் விசேட வர்த்தமானி அறிவித்தல் அங்கீகரிக்கப்பட்டதன்மூலம் இந்த அநியாயம் இதே பாராளுமன்றத்தில் நிறைவேற்றப்பட்டது. மணலாறு பிரதேசத்திலிருந்த தமிழ் மக்கள் விரட்டப்பட்டனர். அதனால் இளைஞர்கள் கொதித்தெழுந்தார்கள். மகாவலி அபிவிருத்தித் திட்டத்தில் இவ்வாறான இடையூறுகள் ஏற்படுத்தப்பட்டதும்கூட இனமோதலுக்கு ஒரு காரணமாக அமைந்தது.

1983ஆம் ஆண்டில் கொடூர இன யுத்தம் இடம்பெற்றது. மணலாறு பிரதேசத்திலிருந்த தமிழ் மக்கள் இராணுவத்தின ரால் வெளியேறுமாறு கட்டளையிடப்பட்டனர். அதன்படி உடுத்த உடையுடன் ஒரேநாளில் பலாத்காரமாக வெளியேற்றப்பட்டார்கள். அதன் காரணமாக மணலாறு சூனியப் பிரதேசமாகியது. 1984ஆம் ஆண்டிலிருந்து அங்கு சிங்களக் குடியேற்றங்கள் ஆரம்பிக்கப்பட்டது. அக்கரைவெளி, மாரியமுறை, எரிஞ்சகாடு, நாயடிச்சமுறிப்பு, முந்திரிகைக் குளம், கூமாங்குளம், மணல்கேணி போன்ற, தமிழ் மக்கள் விவசாயம் செய்துவந்த கிராமங்களில் இருந்த சுமார் 2000-3000 ஏக்கர் விஸ்தீரணமுள்ள விவசாயக் காணிகள் அனைத்தும் தமிழ் மக்களிடமிருந்து பறிக்கப்பட்டன. மணலாறு தமிழ் பிரதேசம், 'வெலிஓயா' சிங்கள குடியேற்றமாக மாறியது. இது முறை தவறிய ஒரு பொறிமுறையாகும்.

அந்தக் காலத்திலிருந்து இன்றுவரை ஆட்சிக்கு வந்த அரசுகள், பலஸ்தீனத்தில் இஸ்ரேலியர்கள் கடைப்பிடித்த நடைமுறையைப் போன்று இதைச் செயற்படுத்தியிருந்தன. Resettlers என்ற ரீதியில் பலஸ்தீனியர்களின் மண்ணை இஸ்ரேலியர்கள் பறித்துக்கொண்டமை உலகறிந்த உண்மை. இதனால் இன்றும் அங்கு பலஸ்தீனப் பிரச்சினை தொடர்ந்துகொண்டுதான் இருக்கின்றது. அதேபோன்று தமிழ் மக்களுடைய வடபகுதிப் பிரதேசத்தை இவர்கள் resettlers என்ற திட்டத்தின் கீழ் மகாவலி அபிவிருத்தி அதிகார சபையின்மூலம் 'எல்' வலயம் என்னும் திட்டங்களை நடைமுறைப்படுத்தி அவற்றை அபகரித்துக்கொண்ட நடவடிக்கை வெளிப்படையாக இன்றும் நடைபெற்றுக் கொண்டிருக்கிறது. இவைதான் தமிழ் மக்களைச் சீற்றங்கொள்ள வைத்தன. விடுதலைப் புலிகளை தமிழர் விடுதலைப் போராட்டத்தில் இணைய வைத்தது.

பின்னரான காலத்தில் மணலாறை விடுவிப்பதற்காக விடுதலைப் புலிகள் ஒரு போரை ஆரம்பித்தனர். அந்த நேரத்தில் மணலாறு மண்ணில் 600க்கு மேற்பட்ட பெண் போராளிகள் ஒரேநாளில் பலியாக நேரிட்டது. இது மேலும் இந்த யுத்தத்தை உக்கிரமடையச் செய்தது. இதன் விளைவாகத்தான் Gajaba Regiment படைப் பிரிவைச் சேர்ந்த 1,800க்கு மேற்பட்ட அப்பாவி இராணுவத்தினர் முல்லைத்தீவு இராணுவ முகாமுக்குள் வைத்து முற்றுகைச் சமர் மூலம் பலியாக்கப்பட்டனர். தமிழ், சிங்கள இளைஞர்கள் அநியாயமாகப் பலியாக வேண்டிய நிலை ஏற்பட்டது. கனரக ஆயுதங்கள், 'ஆட்டிலறிகள்', கனரக வாகனங்கள் போன்றன விடுதலைப் புலிகளின் கைகளுக்குப் போய்ச்சேர்ந்தன. இது யுத்தத்தில் ஒரு மாற்றத்தைக் கொண்டுவந்தது. இந்த நிகழ்வு முல்லைத்தீவு இராணுவ முகாம் தாக்குதலின்மூலம் ஏற்பட்டது. எனவே, இந்த மகாவலி அபிவிருத்தி அதிகாரசபையின் ஓர் அநீதியான செயற்பாடு இப்படியான ஒரு யுத்தத்தை நோக்கி எமது நாட்டைத் தள்ளியிருந்தது என்பதை இந்த இடத்தில் குறிப்பிட விரும்புகின்றேன். இன ரீதியான குடியேற்றம் ஒரு நாட்டை நிர்மூலமாக்கியது என்பது நிதர்சனம். அதற்கு

மகாவலி அபிவிருத்தி அதிகாரசபையின் மகாவலி அபிவிருத்திக் கருத்திட்டம் காரணமாக இருந்தது.

இன்று நடப்பது என்ன? வன வளத் திணைக்களம், கனிய வளத் திணைக்களம், மகாவலி அபிவிருத்தி அதிகாரசபை போன்றவை எமது மக்களின் காணிகளைத் தங்களது பிரதேசங்களாக எடுத்துக்கொண்டன. 2010ஆம் ஆண்டளவில் எமது மக்களனைவரும் அந்த வன்னிப் பிரதேசத்திலிருந்து வெளியேற்றப்பட்ட பின், வன வளப் பிரிவானது, அந்தப் பிரதேசங்களை satellite மூலம் எல்லையிட்டு, அவை அனைத்தையும் காடுகளாகப் பிரகடனப்படுத்தியது. இந்த அநீதியான செயல் இடம்பெற்றபோது - இப்படியாக வன வளப் பிரிவுக்கு இந்தப் பிரதேசங்களை உள்ளகப் படுத்தியபோது பிரதேச செயலர்களின், கிராம சேவகர்களின், மக்களின் அபிப்பிராயங்கள் பெற்றுக்கொள்ளப்பட்டிருக்க வேண்டும். ஆனால், இங்கு நடைபெற்றது என்ன? அங்கு பிரதேச செயலகங்களே இயங்காத நிலையில், அரச பணிமனைகளே இயங்காத நிலையில் இந்த வன வளத் திணைக்களம் வெறுமனே satellite மூலம் அடையாளமிட்டு தமிழ் மக்களுக்கு மீண்டும் ஓர் அநியாயத்தை இழைத்திருக் கின்றது.

2009இல் யுத்தம் முடிவடைந்த பின் நல்லிணக்கத்தைக் கொண்டுவருவதாக முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ச அவர்கள் கூறியிருந்தார். அதனை ஐ.நா. சபையும் சேர்ந்து ஓர் அறிக்கையாக விட்டிருந்தது. ஆனால், அதன்பின் நடந்ததென்ன? 2010ஆம் ஆண்டிலேயே மீண்டும் ஓர் இனமுறுகல் நிலை ஏற்படுத்தப்பட்டது. இந்த மகாவலி அபிவிருத்தி அதிகாரசபையின் கனிய வளப் பிரிவானது, 'எல்' வலயம் என்கின்ற போர்வையில் எமது காணிகளை அபகரித்துக்கொண்டிருக்கின்றது.

பதின்மூன்றாவது திருத்தத்தின் மூலம் தமிழர்களுக்குத் தீர்வு வழங்குவதாக இந்திய அரசுடன் முன்னாள் ஜனாதிபதி ஜே.ஆர்.ஜயவர்தன அவர்கள் ஒப்பந்தம் செய்தார். ஆனால், நடந்ததோ வேறு! காலத்துக்குக் காலம் வர்த்தமானி அறிவித்தல்களை வெளியிட்டு மகாவலி அபிவிருத்தி அதிகாரசபை 'எல்' வலயத்தின் கீழ் தமிழர்களின் காணிகளைப் பறித்துக்கொண்டதுதான் நடந்த உண்மை. இதன் பின்னரும் இந்த மகாவலி அபிவிருத்தி அதிகாரசபையானது, இப்படியான காணிப் பறிப்புக்களில் ஈடுபட்டு எமது மக்களுக்கு அநீதியையே செய்தது.

682 Brigade என்பது புதுக்குடியிருப்புப் பிரதேசத்தில் அமைந்துள்ள ஓர் இராணுவ முகாம். இது அமைந்திருக்கும் காணியை விடுவிப்பதாக எமது மேதகு ஜனாதிபதி அவர்கள் தெரிவித்திருந்தார். மேதகு ஜனாதிபதி அவர்களின் உத்தரவை ஏற்றுக்கொண்ட இராணுவ முகாம் அதிகாரிகள் இந்தக் காணிகளைத் தாங்கள் விடுவிப்பதாக எழுத்துமூலம் உறுதிமொழி வழங்கியிருக்கின்றனர். அந்த உறுதிமொழிக் கிணங்க அரசாங்க அதிபரினால் இந்த விடயம் மக்களுக்கு எழுத்துமூலம் வழங்கப்பட்டது. ஆனால், இன்றுவரை அந்தக் காணி முழுவதுமாக விடுவிக்கப்படவில்லை. இராணுவத்தினர் தங்களது நிலைப்பாட்டினை மாற்றிக்கொண்டிருக்கின்றார்கள். 682 Brigade இன் நடுப்பகுதியில் 12 ஏக்கர் அளவில் விடுவிக்கப்பட்டது. மிகுதியான 10 ஏக்கர் அளவிலான காணி விடுவிக்கப்பட வேண்டியுள்ளது. அதை விடுவிக்காது இராணுவத்தினர் வைத்துக்கொண்டிருக்கின்றார்கள். எனவே, இந்த விடயத்தில் மேதகு ஜனாதிபதி அவர்களும் பாதுகாப்புப் பிரதி அமைச்சர் அவர்களும் உடனடியாக நடவடிக்கை எடுக்கவேண்டுமெனக் கோருகின்றேன். 682 Brigade முகாமிலுள்ள இராணுவத்தினர் இவ்வாறு தன்னிச்சையாகச் செயற்பட்டு, ஜனாதிபதி அவர்களின் உத்தரவை மீறுவது சரியா? என இந்த இடத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

Sir, I want to reveal the unauthorized forest clearing which is taking place in the Welioya area. According to the Gazette Notification 772/22 of 24th June, 1993 issued under the National Environment Act, No. 47 of 1980, prior approval is necessary; after an EIA, before using a forest land of over one hectare for any development activity. But, it has been revealed that over 6,000 acres of Andankulam Forest Reserve and the Kokilai Sanctuary in the Welioya area have been cleared and distributed among some henchmen of powerful politicians under the pretext of creating the Mahaweli L Zone. The clearing up of forest land and distributing it among powerful businessmen and political henchmen have been increasing since the end of the war in 2009.

I accept that development is essential, especially in the war-affected areas, but unplanned activities ignoring all the Environmental Acts would bring about negative results. Therefore, I would like to bring these matters to your notice. Finally, they may end up with the human-elephant conflict, conflicts with other wildlife, destroying livelihood of farmers and devastating catchment areas which are essential for future sustainability.

Sir, the villagers in Kokilai, Kokkthuoduvai, Karunattukerny have gathered several times in front of the District Secretariat in Mullaitivu demanding an end to the process of moving the Sinhala people to the North-East in large scale colonization projects. In April 2013, the Hon. Mahinda Rajapaksa handed over 3,000 land deeds to the farmers in the Mahaweli area without concerning the Tamil people and the Sinhalese who are living there. This issue has been raised this year at the DCC at Weli-Oya by the permanent Sinhalese farmers. Most of the lands in Welioya area were given to the people from other districts. His Excellency the President, I want to bring to your notice this type of unjustifiable incidents happening in the North-East, especially in the Welioya area. As you are in charge of the Ministry of Mahaweli Development, please look into and take actions to stop these unjustifiable acts.

[අ.භා. 4.55]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු සභාපතිතුමනි, අද කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳව වචන කිහිපයක් කථා කරන්න ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. ඒ වාගේම වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාත් දැන් මේ ගරු සභාවේ ඉන්නවා. ඒ විෂයයන් දෙක එකට සම්බන්ධ වුණු විෂයයන් දෙකක්. අද අපට මේ අමාත්‍යාංශයේ, ඒ වාගේම මේ රටේ කෘෂි කර්මාන්තය පිළිබඳව කථා කරන්න වෙලා තිබෙන්නේ එක්තරා විධියක කනගාටුවකිනුයි. ලෝක ආහාර සංවිධානයේ වාර්තා අනුව මේ මොහොත වන විට අද අපේ රටේ වී නිෂ්පාදනය සියයට 43කින් අඩුවෙලා තිබෙනවා. මෑත කාලයේ එයට ප්‍රධාන වශයෙන් හේතු වුණේ, ජලයේ හිඟකම, නියඟය වගේ ප්‍රශ්නයි.

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

ගරු සභාපතිතුමනි, ඔබතුමාට මතක ඇති අපි ආණ්ඩුව භාරදෙන වෙලාවේ මේ රටේ වී අතිරික්තයක් තිබුණා. ජනතාවට අවුරුදු එකහමාරක් බුක්ති විඳින්න පුළුවන් ආකාරයේ වී අතිරික්තයක් අපේ රටේ තිබුණා. එසේ අතිරික්තයක් තිබුණු නිසා තමයි මත්තල ගුවන් තොටුපළෙත් වී ගබඩා කරන්න සිද්ධ වුණේ. ඒ තරම් විශාල වී අස්වැන්නක් එදා ගොඩගසා තිබුණා. ඒ අස්වැන්න දැන් අවසානයි; ඒ ප්‍රමාණය ඉවරයි. අද ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් සහල් ආනයනය කරන රටක් බවට පත්වෙලා තිබෙනවා. අපි මේ තත්ත්වයට මුහුණ දෙන්නේ නියඟය නිසාම නොවෙයි. මේ මොහොත වන විට කන්න තුනකට නියඟය බලපෑ බව ඇත්ත. නමුත්, ප්‍රධාන වශයෙන් නියඟය නිසාම මේ තත්ත්වය ඇති වුණාය කියලා කාටවත් තර්ක කරන්න පුළුවන්කමක් නැහැ. නියඟයක් එනකොට, වතුර අඩු වෙනකොට ඒකට ඔරොත්තු දෙන විධියේ වගාවලට ගොවි ජනතාව යොමු කරන්න කෘෂිකර්ම අමාත්‍යාංශයට, එහෙම නැත්නම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සැලැස්මක් තිබෙන්න ඕනෑ. විශේෂයෙන්ම වී වගාවට තරම් ජලය අවශ්‍ය නොවන වගාව තිබෙනවා. බඩ ඉරිඟු, බතල වැනි වගාවලට ජනතාව යොමු කරවන්න වුවමනා කරන පහසුකම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් හදලා තිබුණේ නැහැ. ඒ නිසා තමයි මේ අංශය ඉතාම දුර්වල මට්ටමකට පත් වුණේ.

අදත් මේ රටේ ජනතාවට අවශ්‍ය කරන බීජ කෘෂිකර්ම අමාත්‍යාංශයේවත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේවත් නැහැ. බොහෝ වෙලාවට මේ මොහොත වන විට මහ කන්නය වගා කරලා අවසන්. දැන් තිබෙන කාලගුණය දිහා බැලුවාම අපට බයක් ඇතිවෙනවා. මොකද, වර්ෂාව නිසා මේ කන්නයත් පාළු වුණොත් ගොවීන්ට නැවත දෙන්න බීජ නැහැ. ගරු සභාපතිතුමනි, මට බීජ වුවමනා වෙලා මම කිලෝමීටර් 67ක් ගිහිල්ලා තමයි බීජ සොයාගෙන ආවේ. ඒ, අපේ වුවමනාවට. සාමාන්‍යයෙන් ඒ කාලයේ ගමේ ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් තමයි අපි බීජ ලබාගත්තේ. නමුත්, දැන් එහෙම ලබාගන්න බැහැ. ඒ සඳහා අද බටඅතටම යන්න ඕනෑ. බටඅතට ගිහිල්ලා තමයි අපි බීජ ගෙනාවේ. බටඅත තිබුණේත් ඉතා සීමිත ප්‍රමාණයක් විතරයි. මේ මොහොත වන විට ඒටී 362 වර්ගයේ බීජ අපේ පළාත්වල කොහේවත් සොයාගන්න බැහැ. ඉතින්, ඒ වාගේ හොඳ බීජ නොමැතිව ගොවි ජනතාවට හොඳ අස්වැන්නක් බලාපොරොත්තු වෙන්න පුළුවන්කමක් නැහැ. මෙහිදී අපි කල්පනා කරන්න ඕනෑ, මෙය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අඩු පාඩුවක්ද, එහෙම නැත්නම් වෙනත් අංශවල තිබෙන අඩු පාඩුවක්ද කියන එක. ඒක අපට හිතාගන්න බැහැ.

කොහොම වුණත්, පසු ගිය කාල වකවානුවේ ආණ්ඩුව ප්‍රතිපත්තියක් හැටියට පොහොර සහනාධාරය නතර කළ නිසා මේ මොහොත වන විට නිෂ්පාදනය හැම අතින්ම අඩු මට්ටමකට වැටිලා තිබෙනවා. වී වගාව විතරක් නොවෙයි, බඩ ඉරිඟු ගත්තොත්, ඒ කාලයේ හයිබ්‍රිඩ් බීජවලින් ලබන අස්වැන්න මෙට්‍රික්ටොන් හතක් විතර වුණා. නමුත්, දැන් ඒ ප්‍රමාණය මෙට්‍රික්ටොන් හතර දක්වා අඩුවෙලා තිබෙනවා.

තව කලක් යන කොට මේ පසේ සරුභාවය නැති වෙලා, අපට තවත් විශාල අර්බුදයකට මුහුණ දෙන්න සිදුවෙනවා. "මොර සූරන වැස්ස" නමින් වියළි කලාපයේ හඳුන්වන මේ වැස්සෙන් පස සෝදායාමක් සිද්ධ වෙනවා. මේ වෙනුවෙන් ගත යුතු ක්‍රියා මාර්ග අප මේ වනතුරු අරගෙන නැහැ. ඒ ගැනත් අප කල්පනා කරන්න ඕනෑ. ඒ වාගේම පොහොර භාවිතයෙන් ඉවත් වුණු නිසා බොහෝ තැන්වල පසේ සරුභාවය නැති වුණා. මේ වෙනුවෙන් නියමිත උපදේශන සේවාව හරියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ ගැනත් අපේ නිලධාරි මහත්වරුන්ට මම මතක් කරන්න කැමැතියි. ගොවීන් සඳහා තිබුණු මේ උපදේශන සේවාව ක්‍රියාත්මක විය යුතුයි.

විශේෂයෙන්ම මෙවැනි අර්බුදකාරී අවස්ථාවක, අපට පාලනය කරන්න බැරි යම් තත්ත්වයක් රටේ ඇති වුණු වෙලාවක, ඒ සඳහා ඔරොත්තු දෙන්නේ කොහොමද කියා ගොවීන් දැනුවත් කරන උපදේශන සේවාවක් තවමත් අපේ රටේ හරියට ක්‍රියාත්මක වන්නේ නැහැ. මේ සඳහා වී වගා කරන්න කියා අපි කියන්නේ නැහැ. වී වගා කරන්න බැරි තැන්වල වෙනත් වගාවලට යන්න අපේ තවමත් සැලැස්මක් නැහැ. ලෙහෙසියෙන් වගා කරන්න පුළුවන් සෝයා බෝංචි වගාවට කවුරුවත් කැමැති නැහැ. ගොවියාගේ ලාභය ගැන අප තවමත් සැලකිල්ලට අරගෙන නැහැ. ගොවියාට ලාභයක් නැත්නම් කවදාවත් එයා ඒ ගැන උනන්දුවක් දක්වන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, ලාභයක් නැති ගොවිතැනකට තරුණ ගොවියෝ උනන්දු කරවන්නත් පුළුවන්කමක් නැහැ. ඒ සම්බන්ධයෙනුත් දැනුවත් කිරීමක් කරන්න ඕනෑ.

ඊළඟ කාරණය, ගොවීන්ට තමන්ගේ කෘෂි නිෂ්පාදන ලාභදායීව නිෂ්පාදනය කර ගැනීමට හැකිවන විධියේ පරිසරයක් තවමත් නැහැ. විශේෂයෙන්ම එදා අප ක්‍රියාත්මක කළ වැඩසටහන් සියල්ලම වාගේ දැන් එක්තරා ප්‍රමාණයකට අතහැරිලා ගිහින් කියන එක තමයි මට දැනගන්නට තිබෙන්නේ. හෙට අනිද්දා මහා ගංවතුරක් හෝ වෙනත් ස්වාභාවික ආපදාවක් ඇති වුණොත්, අපට නැවත මේ කටයුතු සඳහා ජනතාව සූදානම් කරන්න වුවමනා කරන තාක්ෂණය අප තවමත් හඳුන්වා දීලා නැහැ. නියඟයක් එන කොට ඒ කාලයේ අප ජල බින්දු තාක්ෂණය හඳුන්වා දුන්නා. එම වැඩසටහන දැන් සම්පූර්ණයෙන්ම නතර කර තිබෙනවා කියන එක තමයි මට දැනගන්නට තිබෙන්නේ. අපි විතරක් නොවෙයි, ලෝකයේ බොහෝ රටවල් ජලය පිරිමසා ගැනීම සඳහා භාවිත කරන ක්‍රමයක් තමයි මේ ජල බින්දු තාක්ෂණය. දැන් ඒ වැඩසටහන එහෙම පිටින්ම නතර කර තිබෙනවා. අපි මුදල් නාස්ති කරන්නේ නැතිව මෙවැනි වැඩසටහන්වලට යා යුතුයි.

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයට ළඟදි ගොඩනැඟිල්ලක් ගත්තා නේ. ඒ ගැන රටේ විශාල ආන්දෝලනයක් ඇති වුණා. ඇත්ත වශයෙන්ම මේ ගොඩනැඟිල්ල අවශ්‍ය නැහැ. අනවශ්‍ය ගොඩනැඟිල්ලක් ඒ ගත්තේ. කෘෂිකර්ම අමාත්‍යාංශයට තිබෙන ගොඩනැඟිල්ල හොඳටම ප්‍රමාණවත් ඒ කටයුත්ත කරන්න. ඒ විතරක් නොවෙයි, එතැන තව අක්කර 8ක හිස් ඉඩමක් තිබෙනවා. මේ ගොඩනැඟිල්ල වෙනත් කාර්යකට අවශ්‍ය නම්, මේ මුදල්වලින් ඒ හිස් ඉඩමේ අඩුම තරමේ තාවකාලික ගොඩනැඟිල්ලක් හදන්න තිබුණා. ඒ අවට කට්ටිය අක්කර 8ක ඒ හිස් ඉඩමත් ටික ටික කොටු කර ගැනීමේ වැඩ පිළිවෙළක දැන් යෙදී සිටිනවා. ඒ දවස්වලත් ඒ ප්‍රශ්නය තිබුණා. අප ඒකට කිසියම් පියවරක් ගත්තා. ඒ වෙලාවේ අපි ඒ ඉඩමේ පොල් සිටෙව්වා. නමුත් දැන් ඒ වගාවත් එහෙම පිටින්ම නැහැ කියන එක තමයි අපට දැනගන්න තිබෙන්නේ.

ඊළඟට, අතුරු බෝග වගාව ගැන කථා කරනවා නම්, බතල, මඤ්ඤොක්කා, බඩ ඉරිඟු වැනි අතුරු බෝග වගා කරන්න පුළුවන්. බඩ ඉරිඟු ගැන දැන් කථා කරන්න අවශ්‍ය නැහැ. මෙච්චර කාලයක් අප ඉතාම සාර්ථකව බඩ ඉරිඟු වවාගෙන ආවා. දැන් ඒක එහෙම පිටින්ම වාගේ නතර වෙලා තිබෙනවා. කොටසක් ඉතා සුළුවෙන් වගා කරනවා. නමුත් රටේ අවශ්‍යතාවට අනුව ඒ කාර්ය සිද්ධ වන්නේ නැහැ. අපේ කාලයේ විවිධ ව්‍යාපෘති ආරම්භ කර තිබුණා. ඒ ව්‍යාපෘතිත් එකින් එක නතර කරලා, දැන් ක්‍රියාත්මක වන්නේ නැහැ.

විශේෂයෙන්ම අපේ රවීන්ද්‍ර සමරවීර රාජ්‍ය අමාත්‍යතුමා අද උදේ අර්තාපල් වගාව ගැන කථා කළා. ඒ කථා කළ කාරණයට වඩා බරපතළ තත්ත්වයක් අද තිබෙනවා. සියලුම දේවල් පිට රටින් ගෙන්වන්න තමයි අද බලාපොරොත්තු වෙන්නේ. අපේ වැඩ පිළිවෙළ යන්නේ එහෙමයි. බීජ අල නිෂ්පාදනය අද සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ලොකු ලූනුවල තත්ත්වයත් එහෙමයි. ලොකු ලූනු ගැන කථා කරලා වැඩක් නැහැ.

දැන් ලොකු ලූනු ගෙන්වීමෙන් ඉන්දියාවේ ගොවියා පොහොසත් කරනවා. අපේ රටේ ගොවි ජනතාව ලොකු ලූනු වගාවෙන් ඉතාමත් ශීඝ්‍රයෙන් ඉවත් වෙමින් යනවා. මේ කන්නයේ බීජ නිෂ්පාදනය එහෙමපිටින්ම -සම්පූර්ණයෙන්ම- ඇණ හිට තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මේ විෂය ඔබතුමාට ඉතාම සමීප වුණත්, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු අමාත්‍යතුමාට කියන්නේ, මේ ගැන අවධානය යොමු කරන්න කියලායි. මෙය, ඉතාම සාර්ථකව කරගෙන ගිය වැඩ පිළිවෙළක්. මේ වැඩ පිළිවෙළ අඩ පණ වීම ගැනත්, පොහොර සහනාධාරය ගොවි ජනතාවගෙන් ඉවත් කිරීම ගැනත් මේ අවස්ථාවේදී කනගාටුව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය හමාර කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The next speaker is Hon. Mohamed Navavi. You have six minutes.

[5.05p.m.]

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Mr. Chairman, thank you very much for giving me this opportunity. I must really thank the Hon. Minister of Irrigation and Water Resources Management, even though he is not here, for extending the Deduru Oya Project from the Kurunegala District to the Puttlam District. As you know, people of my District have been suffering as it has not been raining in our area since July 2016. Due to that, almost all the cultivations including coconut, paddy and cashew have been affected.

Since our State Minister is here, I would like to refer to Kala Oya Phase II Project. As all of us know, there is an anicut across Kala Oya at Neela Bemma which extends up to 15 kilometers to Yoda Ela. I have already informed the Minister about the problems in that area and the State Minister is also aware of this since it is part of his Electorate as well. Once the water passes through that area, it does not reach the other areas and because of that, water at Kala Oya overflows and goes into the nearby lagoon. When we look at this project, we can see that there are so many tanks downstream of Ottupallama. I can name a few: Potana *Wewa*, Ralmoda *Wewa* and Puliyankulama *Wewa*. Like that, there are a number of ancient tanks downstream. When I take my Electorate, which is also the Hon. Palitha Range Bandara's Electorate, Wanathawilluwa has over 1,000 acres of cashew and coconut land; Karadipulla has over 500 acres of coconut land; Malayankulam has over 300 acres of paddy land; Ismailpuram has over 200 acres of paddy land and Karaitvu has over 2500 acres of cultivable land. So, if we can provide water to these tanks, which were built by our ancient kings, all these lands could be irrigated throughout the year. For the last two to three years, the Hon. Range Bandara, State Minister and I have been trying to move this project forward. We felt the real need of this from July, last year. But I think we cannot start this project; I am sure all these officials are aware of this. Very unfortunately, there is a problem regarding the lands, because most of those lands are coming under the Department of Wildlife. But, there is no cultivable land coming under this area.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව භාර තිරසර සංවර්ධන හා වනජීවී ඇමතිතුමා, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු නිලධාරින් සමඟ පුත්තලම දිසාපතිතුමාගේ කාර්යලයේ දී අපි සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ අනුව ඒ ගොල්ලන් ක්ෂේත්‍රයට ගිහින් පරීක්ෂණයක් පැවැත්වූවා. නිදහස් කරන්න පුළුවන් ප්‍රමාණය පිළිබඳව එහිදී යම් එකඟතාවකට පැමිණ තිබෙනවා. ඒ අනුව දෙවන අදියර ක්‍රියාත්මක කිරීමේ ඉලක්කය තිබෙන්නේ 2018 දීයි.

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
එම සාකච්ඡාවට මමත් සිටියා නේද, රාජ්‍ය ඇමතිතුමනි?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔබතුමා එදා සිටියේ නැහැ.

Sir, we will have to take this matter into consideration. I must thank the Hon. State Minister for considering this Project and organizing those meetings. Please, be good enough to invite me also for the next meeting. You invited me for one of those meetings regarding the Kala Oya Project.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you are running out of time. You have only one more minute to speak.

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)

As promised by the Hon. Minister and the Hon. State Minister, I am sure we will be able to cultivate this whole area and also solve a lot of problems faced by the people of that area. Actually, the Kala Oya receives water from Mahaweli River which flows down to Matale, Ukuwela, Kala Wewa and Rajanganaya. Finally, it comes to Kala Oya and then goes into the Puttalam Lagoon. Therefore, this is a very good Project. I am sure, with the support of the Hon. Minister and the Hon. State Minister, we can solve this major problem in the near future.

With regard to the agricultural sector, I would like to mention that there are 17,000 acres of land being cultivated in Kalpitiya. I think the Hon. Minister is aware of that. The Ministry of Agriculture has also taken some decisions in improving the standards and helping the farmers. We always talk about Dambulla. But, very unfortunately, we have -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Member, your time is up now. You have already taken six minutes.

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)

Sir, give me only one more minute, please.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

But, that is very difficult.

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)

Actually, 50 per cent of our agricultural products from Kalpitiya goes to Dambulla through Norachcholai Economic Centre and a half of the balance comes to Colombo. About 25 per cent of the products goes to waste by the evening. It is a loss for the farmers. Therefore, I request the Hon. Minister and the Hon. State Minister to consider this matter and provide them with a cold room so that the products can be preserved and the farmers will be benefitted.

Thank you.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

පුත්තලම දිස්ත්‍රික්කය භාර දීලා තිබෙන්නේ අපේ රාජ්‍ය අමාත්‍යතුමාටයි. ඔබතුමා කියන ආකාරයට උස් තැන්වලටත් ජලය ගෙන යන උස්සාන වාරිමාර්ග - lift irrigation - ක්‍රම යොදා හෝ ඒ කටයුත්ත කරන්න අපි සම්පූර්ණයෙන් උදවු කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

හොඳයි. බොහොම ස්තුතියි.

ඊළඟට ගරු එම්.එස්. තව්ෆික් මන්ත්‍රීතුමා. You have four minutes.

[பி.ப. 5.13]

**ගරු එම්.එස්. තව්ෆික් මහතා**
(மாண்புமிகு எம்.எஸ். தௌபீக்)
(The Hon. M.S. Thowfeek)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தவிசாளர் அவர்களே, இன்று நான்கு அமைச்சுகளின் நிதியொதுக்கீடுகள்மீது குழுநிலையில் நடைபெறுகின்ற விவாதத்திலே கலந்துகொண்டு ஒருசில வார்த்தைகளைக் கூறச் சந்தர்ப்பமளித்தமைக்கு நன்றி தெரிவித்துக்கொள்கின்றேன்.

திருகோணமலை மாவட்டத்தைப் பொறுத்தவரையில், அங்குள்ள மக்கள் கடந்த 25 - 30 வருட காலமாக யுத்தம் நடைபெற்றதன் காரணமாக, அதற்கு முன் குடியிருந்த பிரதேசங்களுக்கும் அதேபோன்று விவசாயம் செய்து வந்த பிரதேசங்களுக்கும் சென்று தங்களுடைய விவசாய நடவடிக்கைகளை மேற்கொள்ளவும் குடியிருக்கவும் முடியாத நிலை இருந்தது. தற்பொழுது யுத்தம் முடிவடைந்த பின்பு அந்தப் பிரதேசங்களுக்குச் செல்லுகின்ற அப்பாவிப் பொதுமக்கள், அங்கு வளர்ந்திருக்கின்ற காடுகளைத் துப்புரவு செய்யப்போகின்றபொழுது பாரியதொரு பிரச்சினையை எதிர்நோக்கிக்கொண்டிருக்கின்றனர். அதாவது, வனபரிபாலனத் திணைக்கள அதிகாரிகள் வந்து அவர்களைக் கைதுசெய்து நீதிமன்றத்திற்குக் கொண்டுசெல்லுகின்ற நடைமுறை, கிண்ணியா பிரதேச செயலகத்திற்குட்பட்ட பிரதேசமான கண்டல்காடு, மூதூர் பிரதேச செயலகத்திற்குட்பட்ட அரபா நகர், குச்சவெளி, புல்மோட்டைப் பிரதேசங்களில் தொடர்ச்சியாக இடம்பெறுகின்றது. இதனால் அவர்கள் பெரும் பாதிப்புக்குள்ளாகின்றார்கள். வனபரிபாலத் திணைக்கள உத்தியோகத்தர்கள் அந்த அப்பாவிப் பொதுமக்களிடம் காணிக்கான அனுமதிப்பத்திரத்தைக் கேட்கிறார்கள். அவர்கள் 30 வருடங்களுக்கு மேல் அதில் குடியிருந்திருந்தாலும் அந்தக் காணிகளுக்கான அனுமதிப்பத்திரம் பிரதேச செயலகத்தினால் அவர்களுக்கு வழங்கப்படவில்லை. காரணம், பிரதேச செயலகம் யுத்த காலங்களில் உரிய முறைப்படி நடவடிக்கையெடுத்து காணி அனுமதிப்பத்திரத்தை வழங்கவில்லை. இதனால் தற்பொழுது அந்த மக்கள் பாதிப்படைந்து வருகிறார்கள். எனவே, அவர்களைக் கைதுசெய்வதை நிறுத்தி, அவர்கள் உரிய முறைப்படி அந்தக் காணி அனுமதிப்பத்திரத்தைப் பெறுவதற்கு வனபரிபாலனத் திணைக்களத்தின்மூலம் அனுமதியை வழங்க வேண்டுமென்று கௌரவ அமைச்சர் அவர்களிடம் நான் வேண்டிக்கொள்கின்றேன்.

திருகோணமலை மாவட்டத்தைப் பொறுத்தவரையில் கந்தளாய், கிண்ணியா பிரதேசங்களுக்குட்பட்ட குளங்கள், மற்றும் விவசாய நிலங்களை அபிவிருத்தி செய்து விவசாயத்தை மேம்படுத்துவதற்காக, அதாவது இரண்டு போகம்-மூன்று போகம் விவசாயம் செய்யக்கூடிய வகையில் விவசாய நிலங்களை மேம்படுத்துவதற்காக, என்னுடைய வேண்டுகோளுக்கிணங்க, சவூதி அரேபிய அரசாங்கத்தின் கிட்டத்தட்ட 45 மில்லியன் ரூபாய் நிதியுதவியுடன் பாரியதோர் அபிவிருத்தித் திட்டத்தை அரசாங்கம் முன்னெடுக்க இருக்கின்றது. அந்த வகையில் அரசாங்கத்திற்கு நன்றி கூறக் கடமைப்பட்டிருக்கின்றேன். அதற்கான கடன் ஒப்பந்தம் கடந்த ஒக்ரோபர் 24ஆந் திகதி சவூதி அரேபிய அரசாங்கத்திற்கும் இலங்கை அரசாங்கத்திற்குமிடையில் கைச்சாத்திடப்பட்டிருக்கின்றது.

அதேபோன்று, யுத்த காலங்களில் கிட்டத்தட்ட 30 - 40 வருட காலமாக அபிவிருத்தி செய்யப்படாத விவசாயப் பிரதேசங்களும் அங்கு இருக்கின்றன. முள்ளிப்பொத்தானை, நாலாம் வாய்க்கால், பீங்கான் உடைந்த ஆறு, மூதூர் பிரதேசத்தில் சம்மாந்துறை விவசாயப் பிரதேசம், குச்சவெளிப் பிரதேசம், புல்மோட்டைப் பிரதேசங்களில் அபிவிருத்தி செய்யப்படாத விவசாய வாய்க்கால்கள் திருத்தப்பட வேண்டியிருக்கின்றன; விவசாய நிலங்களுக்குச் செல்லும் வீதிகள் அபிவிருத்தி செய்யப்பட வேண்டியிருக்கின்றன. கௌரவ அமைச்சர் அவர்கள் இவற்றைக் கவனத்திற்கொண்டு, இந்தப் பிரதேச விவசாயிகளின் நன்மை கருதி, எதிர்வரும் காலங்களில் இந்த வேலைத்திட்டங்களை முன்னெடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

மேலும், குச்சவெளிப் பிரதேசத்தில் இருக்கின்ற முக்கியமான ஒரு குளமான சமுலங்குளம் அபிவிருத்தி செய்யப்பட வேண்டுமென்று கௌரவ கமத்தொழில் அமைச்சர் அவர்களிடம் வேண்டுகோள் விடுத்திருந்தேன்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු එම්.එස්. තව්ෆික් මහතා**
(மாண்புமிகு எம்.எஸ். தௌபீக்)
(The Hon. M.S. Thowfeek)
Sir, please give me one more minute.

அதற்காக கடந்த வருடம் 20 மில்லியன் ரூபாயை கௌரவ அமைச்சர் அவர்கள் ஒதுக்கீடு செய்து தந்திருந்தார். அந்த நிதி உரிய நேரத்தில் கிடைக்காததன் காரணமாக அந்த வேலைத்திட்டத்தை ஆரம்பிக்க இயலாதுபோய்விட்டது. எனவே, அதற்குரிய நிதியை 2018ஆம் ஆண்டுக்குரிய நிதியிலிருந்து ஒதுக்கித் தரும்படி கேட்டு, எனது உரையை முடித்துக்கொள்கின்றேன். Thank you very much.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඊළඟට, ගරු තාරානාත් බස්නායක නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 5.18]

**ගරු තාරානාත් බස්නායක මහතා**
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க)
(The Hon. Tharanath Basnayaka)
ගරු සභාපතිතුමනි, අද සුවිශේෂී වැය ශීර්ෂ කිහිපයක් පිළිබඳව කථා කරන්න ලැබීම පිළිබඳව මා සන්තෝෂ වනවා. විශේෂයෙන්ම අපේ රටේ කෘෂි කර්මාන්තයත් එක්ක සම්බන්ධ වුණු අමාත්‍යාංශ කිහිපයක් තමයි, කෘෂිකර්ම අමාත්‍යාංශය, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය. කුරුණෑගල දිස්ත්‍රික්කය සුවිශේෂී වූ දිස්ත්‍රික්කයක්. මොකද, වාරිමාර්ග ක්ෂේත්‍රයක්, කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයක්, මහවැලි හා පරිසර කියන ක්ෂේත්‍රත් නියෝජනය වන දිස්ත්‍රික්කයක්. විශේෂයෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කය "බත් කෝරළය" කියලායි හඳුන්වන්නේ. මේ අවස්ථාව, විශේෂයෙන්ම කෘෂි කර්මාන්තයේ නියැලෙන ජනතාවක් සිටින කුරුණෑගල දිස්ත්‍රික්කයට වාගේම මුළු රටේම කෘෂි කර්මාන්තයට ප්‍රමුඛතාව ලැබී තිබෙන අවස්ථාවක්.

මා හිතන හැටියට කෘෂි කර්මාන්තයට වාගේම හැම කෙනාගේම ජීවනෝපාය තුළින් තමන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීම සඳහාත් ජලය අත්‍යවශ්‍ය සාධකයක්. ගොවි ජනතාවට ජලය කොයි විධියටද ලැබෙන්නේ? ඒ හරහා ඔවුන්ගේ කෘෂි කර්මාන්තය දියුණු කර ගන්නේ කොයි විධියටද? විශේෂයෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කයේ බල ප්‍රදේශ කිහිපයක මේ වනකොට දැදුරුඔය ව්‍යාපාරය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතිනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව සහ යාපහුව කියන බල ප්‍රදේශ ඉතාම දුෂ්කර ප්‍රදේශ. ඒ ප්‍රදේශවල ගොවි ජනතාවට ස්ථිර ජල යෝජනා ක්‍රමයක් අත්‍යවශ්‍යයි.

විශේෂයෙන්ම මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා හැටියට අතිගරු ජනාධිපතිතුමාගේ සුවිශේෂී වූ දායකත්වය වයඹ ඇළ ව්‍යාපෘතිය සඳහා ලැබීම පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වන්න ඕනෑ. වයඹ ඇළ ව්‍යාපෘතිය යටතේ විශේෂයෙන්ම මොරගහකන්ද -කළුගඟ ව්‍යාපෘතිය ආරම්භ කරලා, ඒ ව්‍යාපෘතිය හරහා පළාත් හතරක අහිංසක මිනිසුන්ට, ගොවි ජනතාවට ජලය ලබා දීමේ ප්‍රතිඵලයක් හැටියට වයඹ ඇළ ව්‍යාපෘතියේ බෝවතැන්න හරහා ගල්ගමුව කියන ප්‍රදේශයටත්, යාපහුව කියන ප්‍රදේශයටත් ඉතාමත් ඉක්මනින් ජලය ලැබෙමින් පවතිනවා. මා හිතන හැටියට රුපියල් මිලියන 16,000කට අධික මුදල් සම්භාරයක් ආසියානු සංවර්ධන බැංකුව යටතේ ලැබී තිබෙනවා. ලබන වර්ෂයේ පෙබරවාරි මාසය වනකොට මහකිතුල, මහකිරුල හා මහදඹේ කියන මහා ජලාශ තුනක් ඉදි කිරීම සඳහා මේ වනකොට කටයුතු කරලා තිබෙනවා.

2019 අවසාන වෙනකොට කිලෝමීටර 92කින් සමන්විත වයඹ ඇළ ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මෙයින් කුඹුරු අක්කර 15,000කට ආසන්න ප්‍රමාණයකට සහ ගොවි පවුල් 25,000කට ආසන්න ප්‍රමාණයකට සෙත සැලසෙනවා. ඒ වාගේම කුඩා වැව් 315කට ආසන්න ප්‍රමාණයක් පෝෂණය වෙලා මේ ස්ථිරසාර වූ ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වෙනවා. මේ තුළින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5ක් ආවරණය වෙනවා. පොල්පිතිගම, ඇහැටුවැව, ගල්ගමුව, මහව සහ අඹන්පොළ කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 කියන්නේ ඉතාමත් දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5ක්. මේ වාරි යෝජනා ක්‍රමය මඟින් ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජීවත් වන ජනතාවට තමන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට ඉතාමත්ම සුවිශේෂී අවස්ථාවක් ලැබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මේ ප්‍රදේශයේ ජනතාව බහුලවම මුහුණ පා තිබෙන ප්‍රශ්නයක් තමයි, වකුගඩු ප්‍රශ්නය. මේ ප්‍රදේශයේ ජීවත් වන බොහෝ දෙනෙකුට වකුගඩු ප්‍රශ්නය බලපා තිබෙනවා. එම නිසා මේ ව්‍යාපෘතිය තුළින්ම, -අතිගරු ජනාධිපතිතුමා ඒ සඳහා විශේෂ සහයෝගයක් ලබා දුන්නා.- මේ වාරි යෝජනා ක්‍රමය තුළින්ම බීමට ජලය ලබා දෙන ව්‍යාපෘතියක් සුදුසු ප්‍රදේශයක ඇති කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ වාරි යෝජනා ක්‍රමය මඟින් ලැබෙන ජලය තුළින් මේ ප්‍රදේශ පෝෂණය වුණොත් ඒ ප්‍රදේශ නියෝජනය කරන මහජන නියෝජිතයන් හැටියට අපි බොහොම සන්තෝෂ වෙනවා. ඒ සඳහා සුවිශේෂී දායකත්වයක් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය තුළින් ලැබෙනවා. ඒ වාගේම මහවැලි ඔප්පු ලබාදීම, -කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව මැතිවරණ කොට්ඨාශය තමයි මහවැලි යෝජනා ක්‍රමයට අයිති වෙන්නේ.- ඉඩම් ඔප්පු ලක්ෂයක් ලබාදීමේ වැඩ පිළිවෙළ අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පය තුළ සිදු වෙනවා. පසුගිය දිනවල, මීට මාසයකට දෙකකට පෙර අතිගරු ජනාධිපතිතුමා මේ ප්‍රදේශවලට ඇවිල්ලා ඒ ඉඩම් ඔප්පු ලබාදීමේ කටයුතු කළා. ඒ සඳහාත් අපි විශේෂයෙන්ම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

[ගරු තාරානාත් බස්නායක මහතා]

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මම වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මහා වාරි ක්‍රම 7ක් නියෝජනය වන මැතිවරණ කොට්ඨාසය හැටියට, උස්ගල සියඹලන් ඔය හරස් කර රුපියල් මිලියන 500කට අධික මුදල් සම්භාරයකින් මේ වන විට ඒ වාරි ඇළේ වැඩ අවසන් වෙමින් පවතිනවා. ඒ වාගේම සුවිශේෂී වූ අවස්ථාවන්වලදී ගොවි ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දීලා තිබෙනවා. එම නිසා අපි ගරු ගාමිණී විජිත් විජයමුනි සොයිසා අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. ඊයේ දිනයේදීත් අපි එතුමා සමඟ සාකච්ඡා කළා. යම් යම් අවස්ථාවලදී අපි සාකච්ඡා කළ කාරණා සම්බන්ධයෙන් ඉදිරියේදී අවශ්‍ය සහයෝගය ලබා දෙන බව එතුමා ප්‍රකාශ කළා. ඒ වාගේම අපේ ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාටත් අපි ස්තුතිවන්ත වෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසයේ කෘෂිකර්මය සඳහා භාවිත කරන වැව් 758ක් තිබෙනවා. රුපියල් ලක්ෂ 4,000කට අධික මුදලක් කුරුණෑගල දිස්ත්‍රික්කයට එතුමා කෘෂිකර්ම අමාත්‍යවරයා හැටියට ලබා දීලා මේ වන විට මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසයේ වැව් 40කට අධික ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කරමින් පවතිනවා.

ඉදිරියේදී ජාතික ආහාර සුරක්ෂා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරලා තිබෙනවා. ඒ වාගේම, ඉදිරියේදී කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ ගොවියා ශක්තිමත් කරන්නට ඔබ තුමන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙන්න කියලා බොහොම ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිනවා. කෘෂි කර්මාන්තයත්, වාරි ක්ෂේත්‍රයත් ඒ වාගේම මහවැලියත් ගත්තාම අද රටේ සියලුම ජනතාවට ඉතාමත් වටිනා අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂයන් තමයි අද දින සාකච්ඡා කරන්නේ. ඉදිරි අනාගතයේදී මේ අමාත්‍යාංශ තුළින් ඒ ක්ෂේත්‍ර සඳහා විශේෂ වූ දායකත්වයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින්, අතිගරු ජනාධිපතිතුමාට, එතුමාගේ නියෝජ්‍ය අමාත්‍ය ගරු අනුරාධ ජයරත්න මැතිතුමාට, ගරු ගාමිණී විජිත් විජයමුනි සොයිසා ඇමතිතුමාට, වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමාට, ගරු දුමින්ද දිසානායක අමාත්‍යතුමාට සහ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයාට මාගේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම ඒ සියලු අමාත්‍යාංශවල ලේකම්වරුන්, සභාපතිවරුන්, අධ්‍යක්ෂ ජෙනරාල්වරුන් ඇතුළු සියලුම නිලධාරින්ට ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඒ වාගේම, හෙට දවසේ අනාගත දරු පරපුර වෙනුවෙන් සුන්දර ලෝකයක් මේ රට තුළ ගොඩ නඟන්නට ඔබ තුමන්නාන්සේලාගේ සහයෝගය ලබා දෙන්න කියා ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 5.25]

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற வரவு செலவுத் திட்டக் குழுநிலை விவாதத்தில் உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்கு முதலில் எனது நன்றியைத் தெரிவித்துக்கொண்டு, கமத்தொழில் அமைச்சு தொடர்பான சில விடயங்களை முன்வைக்க விரும்புகின்றேன்.

நான் பிரதிநிதித்துவப்படுத்தும் யாழ்ப்பாண மாவட்டம் விவசாயத்துக்குப் பெயர்பெற்ற பிரதேசம்; அது இங்குள்ள பலருக்குத் தெரிந்திருக்கும். போருக்கு முன்னர் விவசாயத்தில் யாழ்ப்பாணம் கொடிகட்டிப் பறந்தது என்று கூறினால் அது மிகையாகாது. அந்தளவுக்கு விவசாய உற்பத்திகளில் யாழ். மாவட்டம் தன்னிறைவடைந்திருந்ததுடன், ஏனைய மாவட்டங்களுக்கும் ஏற்றுமதி செய்யும் நிலை காணப்பட்டது. 30 ஆண்டுகள் நீடித்த போர் எல்லாவற்றையும் தலைகீழாகப் புரட்டிப்போட்டது. சொந்த மாவட்டத்தின் தேவையைக்கூட முழுமையாகப் பூர்த்திசெய்ய முடியாத நிலையிலேயே இன்றைய யாழ்ப்பாணம் இருக்கின்றது. தம்புள்ளயிலிருந்து மரக்கறிகள் கொள்வனவு செய்யப்பட்டு யாழ்ப்பாணச் சந்தைகளில் விற்கப்படும் நிலைதான் இன்று காணப்படுகின்றது.

எமது விவசாயிகள் போரின் முன்னரான காலப்பகுதியில் கோலோச்சியிருந்தபோது அப்போதைய அரசுகளால் உதவிகளும் கிடைக்கப்பெற்றிருந்தன. இந்த வரவு செலவுத் திட்டத்தின் இரண்டாம் வாசிப்பின்போது கௌரவ உறுப்பினர் குமார வெல்கம அவர்கள் தனது உரையில், "யாழ்ப்பாண விவசாயிகளுக்கு சிறிமாவோ அரசு உதவியமையால் அவர்கள் சிறிமாவோ அரசின்மீது மதிப்பு வைத்திருந்தார்கள்" என்று குறிப்பிட்டிருந்தார். போரின் பின்னர் விவசாயத்துறையில் முன்னைய இடத்தைப் பிடிப்பதற்கு எமது மாவட்டம் கடுமையாகப் போராடிக்கொண்டிருக்கின்றது. யாழ்ப்பாணத்தின் ஒட்டுமொத்த நிலப்பரப்பில் 50 சதவீதம் வயல்களாகவும் தோட்டங்களாகவுமே உள்ளன. ஆயினும், எமது விவசாய நிலங்களை மக்கள் முழுமையாகப் பயன்படுத்த முடியாத நிலையே இன்று இருக்கின்றது. பாதுகாப்புத் தரப்பினர் போர் முடிந்து 8 ஆண்டுகளாகியும் எமது மக்களின் நிலங்களை ஆக்கிரமிப்புச் செய்தே வைத்திருக்கின்றார்கள். அதற்குள் விவசாய நிலங்களும் உள்ளடங்கியுள்ளன.

எமது விவசாய மண்ணை, குறிப்பாக வலிகாமப் பிரதேச மண்ணைச் 'சிவப்புத் தங்கம்' என்று குறிப்பிடுவார்கள். அதில் எந்தப் பயிரைச் செய்தாலும் செழித்து வளர்ந்து விளைச்சலை அள்ளிக்கொடுக்கும். இன்று அந்த நிலங்கள் பாதுகாப்புத் தரப்பினரின் பிடியிலிருந்து முற்றாக விடுவிக்கப்படவில்லை. விடுவிக்கப்பட்ட பலாலியின் ஒரு பகுதி நிலத்தை இப்போதுதான் மக்கள் பயன்படுத்த ஆரம்பித்திருக்கின்றனர். இந்த அரசின் கமத்தொழில் அமைச்சராக இருப்பவர், விவசாயிகள் அதிகம் வாழுகின்ற பிரதேசத்திலிருந்து வந்திருக்கின்ற ஒருவர். விவசாயத்துக்கு நிலம் எந்தளவுக்கு முக்கியமானதென்பது அவருக்கு நான் சொல்லித் தெரியவேண்டியதில்லை. எனவே, மக்களின் விவசாய நிலங்களைப் பாதுகாப்புத் தரப்பினரின் பிடியிலிருந்து உடனடியாக மீட்டுக்கொடுக்க அவர் நடவடிக்கை எடுக்க வேண்டும்.

போரினால் பாதிக்கப்பட்ட வடக்கு மக்கள்மீது ஓரளவு கரிசனையை இந்த அரசு வரவு செலவுத் திட்டத்தினூடாகச் செலுத்தியிருக்கின்றது. யாழ்ப்பாணத்தில் புதிய பொருளாதார மையம் அமைப்பதற்கு 100 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டதை வரவேற்கின்றேன். இது வெறும் எழுத்துவடிவில் இல்லாமல், செயலுருப்பெறவேண்டும் என்று விரும்புகின்றேன். கிளிநொச்சியில் விவசாயக் களஞ்சியத்தின் மறுசீரமைப்புக்கு நிதி ஒதுக்கப்பட்டுள்ளமைக்கும் எனது நன்றிகளைக் கூறுகின்றேன். வடக்கு விவசாயிகளுக்கு நேரடியாகக் கிடைக்கப்பெற்ற நன்மைகள் இவை இரண்டும்தான். போரினால் ஏனைய மாகாணங்களைவிடப் பின்தங்கிய நிலையில் இருக்கும் வடக்கு மாகாணத்திற்கு இவை மாத்திரம் போதாது என்பதை இங்குள்ள எல்லோரும் ஏற்றுக்கொள்வீர்கள் என்று நம்புகின்றேன்.

எமது யாழ்ப்பாணத்தின் ஒட்டுமொத்தச் சனத்தொகையின் 27 சதவீதமானோர் விவசாயம் சார்ந்த குடும்பங்களைச்

சேர்ந்தவர்களாவர். 31,927 குடும்பங்கள் நேரடியாக விவசாயத்தை முன்னெடுக்கின்றன; விவசாயத் தொழிலாளர்களாக 20,322 குடும்பங்கள் இருக்கின்றன. அந்த வகையில், ஒட்டுமொத்தச் சனத்தொகையின் காற்பங்குக்கும் அதிகமானோர் விவசாயத்திலேயே தங்கி வாழ்கின்றனர். இவர்களில் பெரும்பாலானவர்கள் இன்னமும் 5,000 ரூபாய்க்கும் குறைவான மாதாந்த வருமானத்தையே பெற்றுக்கொள்கின்றனர் என்பது வேதனையான விடயம். ஒட்டுமொத்த யாழ்ப்பாணச் சனத்தொகையின் 56 சதவீதத்தினர் 5,000க்கும் குறைவான மாதாந்த வருமானத்தையே பெற்றுக்கொள்கின்றனர் என்ற மாவட்டப் புள்ளிவிபரத்தையும் நான் இந்தச் சபைக்குச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். விவசாயத் தொழிலை செய்வோர் குறைவடைந்து செல்கின்றனர் என்ற தகவலையும் இங்கு பதிவுசெய்கின்றேன்.

2015ஆம் ஆண்டு யாழ்ப்பாணத்தின் ஒட்டுமொத்த சனத்தொகையின் 32 வீதமானோர் விவசாயத்தைச் சார்ந்த நடவடிக்கைகளில் ஈடுபட்டிருந்தனர். அது கடந்த ஆண்டு 27 சதவீதமாகக் குறைவடைந்துள்ளது; சடுதியாக ஓர் ஆண்டில் 5 சதவீத இழப்பு ஏற்பட்டிருக்கின்றது. "விவசாயமே இந்த நாட்டின் முதுகெலும்பு" என்று நாம் கூறிக்கொண்டு, விவசாயிகள் தொழிலைக் கைவிட்டுச் செல்வதை வேடிக்கை பார்க்க முடியாது. காலநிலை தரும் ஏமாற்றத்தினால் இழப்புக்களைச் சந்தித்துத் தொழிலைக் கைவிடும் விவசாயிகளை, மீளவும் விவசாயத்தை முன்னெடுக்க ஊக்குவிக்கவேண்டும்.

கௌரவ சனாதிபதி மைத்திரிபால சிறிசேன கடந்த மாதம் யாழ்ப்பாணத்துக்கு வந்திருந்தார்; விவசாயிகளைச் சந்தித்திருந்தார். அவர்கள் அவரிடம் முக்கியமான கோரிக்கையை முன்வைத்திருந்தனர்; வங்கிகளில் தாம் பெற்றுக்கொண்ட விவசாயக் கடன்களைத் தள்ளுபடி செய்யுமாறு கேட்டுக்கொண்டனர். அரச தலைவர் அந்தக் கோரிக்கையை ஏற்று ஆராய்வதாகப் பதிலளித்திருந்தார். ஆனால், இன்றுவரை அந்த மக்களின் விவசாயக் கடன்கள் தள்ளுபடி செய்யப்படவில்லை. காலநிலையினால் ஏமாற்றப்பட்டு நொந்துபோன விவசாயிகளை இந்த வங்கிக் கடன்களும் மேலும் வாட்டி வதைக்கின்றது. அதிலிருந்து விடுதலை பெற்றுக்கொடுக்கவேண்டியது இந்த அரசின் பொறுப்பாகும். கௌரவ விவசாய அமைச்சர் அவர்களும் கௌரவ சனாதிபதியுடன் அந்த நிகழ்வில் பங்கேற்றிருந்தவர் என்ற அடிப்படையில், நான் கூறும் விடயம் அவருக்கு நினைவில் இருக்கும் என்று நம்புகின்றேன். போரால் பாதிக்கப்பட்டு, காலநிலையினால் வஞ்சிக்கப்படும் அந்த மக்களை அரசும் வதைக்கக்கூடாது என்று கேட்டுக்கொள்கின்றேன். கௌரவ விவசாய அமைச்சர் அவர்கள் இந்த விடயத்தை இனியும் காலதாமதப்படுத்தாமல் செய்துமுடிக்க நடவடிக்கை எடுக்கவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

யாழ்ப்பாணத்தில் முன்னெடுக்கப்படும் விவசாயம் பெரும்பாலும் கிணற்று நீரை நம்பியே மேற்கொள்ளப்படுகின்றது. 21,174 விவசாயக் கிணறுகள் யாழ்ப்பாணத்தில் காணப்படுகின்றன. இவை எல்லாம் தமது ஆயுளை இழுத்துத் தக்கவைத்துக் கொண்டிருக்கின்றன. வடக்கு மாகாண விவசாய அமைச்சினால் இந்தக் கிணறுகள் சில புனரமைக்கப்பட்டன; அவர்களால் இதுவரை 241 கிணறுகளை மாத்திரமே புனரமைக்க முடிந்திருக்கின்றது. இந்த நிலையில் எஞ்சிய விவசாயக் கிணறுகளைத் துரித வேலைத்திட்டத்தின்கீழ் மத்திய அரசு புனரமைத்துக் கொடுக்கவேண்டும். ஏற்கெனவே, இந்தப் பணியை ஆரம்பித்துள்ள வடக்கு மாகாண விவசாய அமைச்சினூடாக இதைச் செய்து முடிக்கலாம்.

இங்கு மற்றொரு முக்கிய விடயத்தையும் இச்சந்தர்ப்பத்தில் சுட்டிக்காட்டுவது பொருத்தம் என்று நினைக்கின்றேன். நிலத்தடி நீரை நம்பியே எமது மக்கள் விவசாயத்தை முன்னெடுக்கின்றனர். யாழ்ப்பாணத்திலுள்ள நிலத்தடி நீர் தொடர்பான பிரச்சினையை இங்குள்ள சகலரும் அறிவீர்கள் என்று நம்புகின்றேன். நிலத்தடி நீர் அருகிச் செல்வது, நிலத்தடி நீர் உவராவது என்று பல பிரச்சினைகள் அங்குள்ளன. இந்த நிலையில் எமது விவசாயிகள் எதிர்காலத்தில் விவசாயத்தை முன்னெடுப்பது குதிரைக்கொம்பாக மாறிவருகின்றது. நிலத்தடி நீரைச் சிக்கனமாகப் பயன்படுத்தும் வகையில், சொட்டு நீர்ப்பாசனம், தூவல் நீர்ப்பாசனம் என்பவற்றைப் பரந்தளவில் விரைந்து அறிமுகப்படுத்தவேண்டிய தேவை இருக்கின்றது. ஆனால், இதற்கான அரசின் ஊக்குவிப்புகள் என்பது மிகச் சொற்ப அளவிலேயே உள்ளது. இந்த விடயத்தில் கௌரவ விவசாய அமைச்சர் கூடியளவு கவனத்தைச் செலுத்தவேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

யாழ்ப்பாணத்தில் நிலத்தடி நீர் கடந்தகால செயற்கை உரப் பாவனையால் மாசடைந்துள்ளது. அது மட்டுமல்லாது, வரட்சிக் காலங்களில் நிலத்தடி நீர் முற்றாக வற்றிப்போகின்ற -

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

අපි භූගත ජලය සම්බන්ධයෙන් කටයුතු කරන්න යාපනයේ වෙනම කාර්යාලයක් විවෘත කළා. ගරු මන්ත්‍රීතුමනි, ඒක විවෘත කිරීමේදී මට මතක විධියට ඔබතුමාත් ආවා. වාරිමාර්ග දෙපාර්තමේන්තු යටතේයි ඒ කටයුත්ත කළේ. ඒ විතරක් නොවෙයි, භූගත ජලය අපිරිසිදු වුණු ප්‍රදේශ ගැනත්, භූගත ජලය ආරක්ෂා කළ යුතු ප්‍රදේශ ගැනත් වෙනම සමීක්ෂණයක් කළා.

ඒ විතරක් නොවෙයි, පොකුණු හැදීමේ කටයුත්ත ගැන හිටපු වාරිමාර්ග අමාත්‍යවරයා සමඟත් සාකච්ඡා කළා. නමුත්, අපට ලැබෙන ප්‍රතිචාර සහ ඉල්ලීම් පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා හොඳ ප්‍රතිචාර ලැබෙනවා නම් අපට මැදිහත් වෙන්න පුළුවන්. එහෙම මැදිහත් වෙලා ඔබතුමන්ලාට, විශේෂයෙන් යාපනය ප්‍රදේශයට, උදවු කරන්න අපි කැමැතියි. මොකද, අපි දන්නවා, යුද්ධය නිසා ඔබතුමන්ලාගේ සංවර්ධනය ගොඩක් අඩාළ වුණු බව. ඒකට අපි විශේෂ ක්‍රියා මාර්ග ගන්න සූදානම්. ඒ සඳහා ඔබතුමන්ලාගේ සහාය අපට අවශ්‍ය වනවා; ඉල්ලීම් අවශ්‍ය වනවා. සම්පූර්ණ තාක්ෂණික මහ පෙන්වීම් කටයුතු අපි කරනවා.

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! நிச்சயமாக நாங்கள் உங்களுக்கு ஒத்துழைப்புக் கொடுப்போம். ஏனெனில், இது ஒரு பாரதூரமான விடயம். எனவே, எந்த நேரத்திலும் எப்போதும் ஒத்துழைப்புக் கொடுப்பதற்குத் தயாராக இருக்கின்றோம்.

யாழ்ப்பாணத்தில் நிலத்தடி நீர் கடந்த காலச் செயற்கை உரப் பாவனையால் மாசடைந்துள்ளது. யாழ்ப்பாணத்தின் தரைத்தோற்றத்தில் இயற்கை ஆறுகள் இல்லை. ஆனால்,

[ගරු ඊ. සරවනපවන් මහතා]

குளங்கள் இருக்கின்றன. அவற்றில் நீரைச் சேமிப்பதன் ஊடாக நிலத்தடி நீரின் மட்டத்தை ஓரளவாவது பேணமுடியும். கடந்தகால நிதி ஒதுக்கீடுகள் ஊடாக 350 விவசாயக் குளங்கள் மறுசீரமைக்கப்பட்டிருக்கின்றன. இன்னமும் 700 குளங்கள் மறுசீரமைக்கப்பட வேண்டியுள்ளன. இவை அவசரமாகச் செய்து முடிக்கப்பட வேண்டியுள்ளது. கௌரவ விவசாய அமைச்சர் இவற்றின் பெறுமதிகளை உணர்ந்து அவற்றின் மறுசீரமைப்புப் பணிகளை உடனடியாகச் செயற்படுத்த நடவடிக்கை எடுப்பார் என்று நம்புகின்றேன்.

கடந்த மூன்று ஆண்டுகளின் எந்தவொரு போகத்திலும் மிளகாய், வெங்காயம், பயறு, கௌபி போன்ற சிறுதானியப் பயிர்ச் செய்கையில் உரிய இலக்கை எமது விவசாயிகளால் அடைந்துகொள்ள முடியாமல் இருப்பதாகப் புள்ளிவிபரங்கள் கூறுகின்றன. அதைப்போன்று நெல் விதைப்பிலும் உரிய அறுவடை கிடைக்கவில்லை என்று அந்தப் புள்ளிவிபரங்கள் மேலும் கூறுகின்றன. இதே நிலைமைதான் தொடர்ச்சியாக நீடிக்கின்றது. விவசாயிகளுக்கு விவசாயத்தின்மீது சலிப்பு ஏற்படுத்தும் வகையிலேயே இது அமைந்துள்ளது. இந்தச் சூழ்நிலைகளில் விவசாயிகளுக்கு அரசு கைகொடுக்க வேண்டும். வரட்சியால் பாதிக்கப்பட்ட விவசாயிகளுக்கு வரட்சி உதவி நிதி வழங்க அரசு நடவடிக்கை எடுத்தது. மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் மாதாந்தம் 10,000 ரூபாய் வழங்கப் பணிப்புரை விடுத்திருந்தார். ஆனால், இந்தப் பணம் விவசாயிகளுக்கு எப்போது கிடைத்தது என்பதைக் கௌரவ விவசாய அமைச்சர் அவர்கள் அறிந்துகொள்ளவேண்டும். வரட்சி முடிந்து, மழை கொட்டத் தொடங்கும்போதுதான் எமது பகுதி விவசாயிகளுக்கு அந்த வரட்சி உதவி நிதி கிடைக்கப்பெற்றது. ஆகவே, அரசு உதவிகள் வழங்கும்போது அது உரிய காலத்தில் விவசாயிகளைச் சென்றடையவேண்டும். எதிர்காலத்தில் இத்தகைய தவறுகளை அரசு திருத்திக் கொள்ளவேண்டும் என்று தயவாகக் கேட்டுக்கொள்கின்றேன்.

வடக்கு மாகாண விவசாய அமைச்சு அரசினால் ஒதுக்கப்படும் நிதியில் தம்மால் முடிந்த திட்டங்களைச் செயற்படுத்துகின்றது. கடந்த காலங்களில் போரினால் அழிக்கப்பட்ட மரங்களை மீள்நடுகை செய்து பிரதேசத்தைப் பசுமையாக்கும் நடவடிக்கைகள் முன்னெடுக்கப்படுகின்றன. இவற்றைக் அரசு ஊக்குவிக்கவேண்டும். மாகாண அரசுக்கு மேலதிக நிதிகளை இதற்காக விடுவிக்கவேண்டும். மாறிவரும் காலச் சூழலுக்கு ஏற்ப எமது விவசாயிகளையும் பணம் பெறும் பழச் செய்கையில் ஊக்குவிக்க வேண்டும். ஏனைய மாகாணங்களுடன் ஒப்பிடுகையில் இதற்கான வாய்ப்புக்கள் எங்கள் விவசாயிகளுக்குக் குறைவாகவே வழங்கப்படுகின்றன.

புகையிலைச் செய்கை தொடர்பிலும் இதன்போது சுட்டிக்காட்டப்படுவது பொருத்தமாக இருக்கும் என்று நினைக்கின்றேன். யாழ்ப்பாணத்தைப் பொறுத்தவரையில் புகையிலையைப் 'பணப்பயிர்' என்றுதான் சொல்வார்கள். அதனூடாகப் பெருமளவு இலாபத்தை விவசாயிகள் பெற்றுக்கொண்டனர். இந்த அரசு 2020இல் புகையிலையை முழுமையாகத் தடைசெய்ய நடவடிக்கை எடுத்துள்ளது. இதனால் பாதிக்கப்படுவது தமிழ் விவசாயிகள்தான். அவர்களுக்கு மாற்றுப் பயிர்ச் செய்கைக்கான முழுமையான ஊக்குவிப்பு இதுவரை வழங்கப்படவில்லை. பெயரளவில் மாற்றுப் பயிர்ச்செய்கைக்கு அவர்களை ஊக்குவிப்பது பொருத்தமாக இருக்காது. புகையிலைச் செய்கையின் ஊடாக அவர்கள் பெற்றுக்கொண்ட இலாபத்துக்கு நிகரான இலாபத்தை மாற்றுப் பயிர்ச் செய்கையின் ஊடாக அவர்கள் பெற்றுக்கொள்ள வேண்டும். அப்போதுதான் புகையிலைச் செய்கையை மேற்கொண்ட விவசாயிகள் அதிலிருந்து விடுபட்டு முழுதாக மாற்றுப் பயிர்ச் செய்கைக்கு மாறுவார்கள். இது தொடர்பிலும் கௌரவ விவசாய அமைச்சர் அவர்கள் கவனம் செலுத்தவேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

விவசாயிகள் காலநிலையால் பாதிக்கப்படுவது போதாதென்று, கட்டாக்காலியான கால்நடைகளும் அவர்களுக்குப் பாதிப்பை ஏற்படுத்துகின்றன. காலநிலையில் தப்பி வளரும் பயிர்கள்கூட கட்டாக்காலிக் கால்நடைகளால் அழிக்கப்படுகின்றன. குறிப்பாக, யாழ்ப்பாணத்தின் தீவகப் பிரதேசங்களில் இந்த நிலைமை அதிகமாக உள்ளது. இதனால் அவர்கள் நெல் விதைப்புக்களில் இந்த முறை ஆர்வத்தை வெளிப்படுத்தாமல் இருக்கின்றனர். உதாரணமாக, வேலணைப் பிரதேச செயலர் பிரிவில் உள்ள 2,900 ஏக்கர் காணியில் 400 ஏக்கரில் மாத்திரமே விதைப்பு மேற்கொள்ளப்பட்டுள்ளது. கட்டாக்காலிகளின் தொல்லையாலேயே ஏனைய 2,500 ஏக்கரில் விதைப்பு மேற்கொள்ளப்படவில்லை. அந்த விவசாயிகள் இந்த விடயத்தைப் பல தடவைகள் ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களில் சுட்டிக்காட்டியும் நடவடிக்கை எடுக்கப்படவில்லை. பாதுகாப்பு வேலி அமைப்பதற்கு விவசாயிகளுக்கு உதவி வழங்கப்பட வேண்டும். இந்த உதவிகள் உடனடியாக வழங்கப்பட்டால், அந்த விவசாயிகள் எஞ்சிய ஏக்கர்களிலும் நெல் விதைப்பை மேற்கொள்ளக்கூடிய சாத்தியங்கள் இருக்கின்றன. கௌரவ விவசாய அமைச்சர் இந்த விடயத்தில் கூடிய கவனம் செலுத்தவேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன். நன்றி.

[අ.භා. 5.39]

**ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)

(The Hon.Wasantha Aluvihare - State Minister of Agriculture)

ගරු සභාපතිතුමනි, අද මේ කාරක සභා අවස්ථාවේ විවාදයේදී කෘෂිකර්ම අමාත්‍යාංශය කිසිම දෙයක් කළේ නැති විධියට තමයි ඒකාබද්ධ විපක්ෂය විසින් කරුණු ඉදිරිපත් කළේ. පසුගිය රජය කාලයේදී ඒ අය ආහාර භෝග නිෂ්පාදනය වැඩි කළා නම්, අද අපට එච්චර ගැටලුවක් ඇති වන්නේ නැහැ. නමුත් ඒ අයට අමතක වුණා, මේ අවුරුදු දෙක තුළ අපේ රට දරුණු නියඟයකට මුහුණ පෑව බව. අනෙක් පැත්තෙන් ගංවතුර තත්ත්වයක් ඇති වුණු බව. ඒ නිසා අපේ ආහාර භෝග නිෂ්පාදනය සියයට 50කින් අඩු වුණා. ඒ අඩු වීම නිසා තමයි, අපට ගැටලුවක් ඇති වුණේ. එහෙම නොවුණා නම්, ඇත්තෙන්ම අද අපි සහලින් ස්වයංපෝෂිත වනවා. ඒ වාගේම ආහාර භෝගවලින් අපි ස්වයංපෝෂිත වනවා.

ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා විසින් "තුන් අවුරුදු ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන" කියලා හොඳ සැලැස්මක් යෝජනා කර තිබෙනවා. මම ඒ ගැන ගරු සභාවේ අවධානය යොමු කරන්න ඕනෑ. කෘෂි කාර්මික රටක් ලෙස වගාවට සුදුසු බිමක් හා දේශගුණික තත්ත්වයක් අපේ රටේ තිබුණත් නිදහසින් පසුව, පසු ගිය දශක කීපය තුළදීම අපේ රටේ වගා කළ හැකි ආහාර භෝග පිට රටින් ආනයනය කිරීමට අපට සිදු වී තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව, 2015 සැප්තැම්බර් මස 05වන දින එතුමාගේ ප්‍රධානත්වයෙන් ඉරණමඩුවේදී තුන් අවුරුදු ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන අප විසින් දියත් කිරීමේ ප්‍රධාන පරමාර්ථය වන්නේ, දේශීයව නිෂ්පාදනය කළ

හැකි ආහාර භෝග හා ඒ සඳහා වාර්ෂිකව වැය කරන විශාල මුදල අවම කිරීම; වැඩි වන ජනගහනයට සාපේක්ෂව දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම; පිරිවැයද අවම කිරීම සඳහා ගොවීන් පරිසර හිතකාමී කොම්පෝස්ට් හා කාබනික පොහොර භාවිතයට වඩාත් නැඹුරු කර වීම; ගොවියා ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සහ ගොවිතැනින් ඈත් වන තරුණ පරපුර නැවතත් ගොවිතැන සඳහා පෙලඹවීම. ගරු සභාපතිතුමනි, මේ කරුණු සම්බන්ධව අවධානය යොමු කරලා, "ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන" මේ වන විට ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් අද සාර්ථකව ක්‍රියාත්මක වන බව මම සිහිපත් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මේ වැඩසටහන යටතේ මාතලේ, රත්තොට, මකුලේතැන්නේ යල කන්නයේදී කුරක්කන් බීජ වගා කළ භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 1,029යි. මහ කන්නයේදී වගා කළ භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 5,925යි. අපේක්ෂිත ඉලක්කය කිලෝ ග්‍රෑම් 10,000යි. ගරු සභාපතිතුමනි, අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අවශ්‍ය බීජ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 10,000යි. අපි කිලෝ ග්‍රෑම් 7,500ක ඉලක්කයක් සපුරාගත් බව අද සිහිපත් කරන්න ඕනෑ. අපි සියයට 75ක් අද මාතලේ ප්‍රදේශයේ නිෂ්පාදනය කරනවා කියන එක මම මතක් කරනවා. මෙහි විශේෂ කරුණ වන්නේ, ආනයනය කිරීම සඳහා වැය කරන විශාල මුදල් ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගැනීමට හැකියාව ලැබී තිබීමයි. මේ සියල්ල ක්‍රියාත්මක කර ගන්නට පුළුවන් වුණේ ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේයි.

ගරු සභාපතිතුමනි, කාන්තාවන් සවිබල ගන්වා වැඩි වශයෙන් කෘෂි කර්මාන්තය වෙත නැඹුරු කරවීමේ පරමාර්ථයෙන් පසු ගිය වර්ෂයේ "සිතමු" කාන්තා ගොවි සංවිධානය පිහිටුවීමේ ක්‍රියාවලිය අප විසින් ආරම්භ කළා. මේ අන්දමින් කාන්තාවන් වෙනුවෙන්ම කාන්තා ගොවි සංවිධාන පිහිටුවීම සිදු කළේ ඉතිහාසයේ ප්‍රථම වතාවට බව මම විශේෂයෙන්ම සඳහන් කිරීමට කැමැතියි. ගරු සභාපතිතුමනි, ඒ අනුව එක් ගමකට එක් කාන්තා ගොවි සංවිධානයක් බැගින් මේ වන විටත් දිවයින පුරා කාන්තා ගොවි සංවිධාන 25,000ක් පිහිටු වීමට අප විසින් කටයුතු කර තිබෙනවා. මෙම සියලු වැඩසටහන් කෘෂිකර්ම අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මැතිතුමාගේ සංකල්පයක් මත ආරම්භ වුණු බව සඳහන් කරන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, රසායනික පොහොර වෙනුවට හැකිතාක් දුරට කොම්පෝස්ට් සහ කාබනික පොහොර භාවිත කොට "වස විසෙන් තොර" ආහාර භෝග වගා කිරීම පිණිස, විශේෂයෙන්ම කාන්තා සහභාගිත්වයෙන් ගෙවතු වගාව ප්‍රචලිත කිරීම සඳහා අප විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන ඉතාමත් සාර්ථකව ක්‍රියාත්මක වන බවද, මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම සඳහන් කිරීමට කැමැතියි. පලතුරු ගම්මාන 15,000ක් ආරම්භ කිරීමේ වැඩසටහන මෙයට සමගාමීව ආරම්භ කළා.

ගරු සභාපතිතුමනි, පසු අස්වනු හානිය අවම කිරීම සඳහා තම අස්වැන්න ගබඩා කිරීමේදී හා අලෙවිකරණයේදී ගොවීන් මුහුණ දෙන ගැටලු ද සුළුපටු නැහැ. මෙහිදී සිදුවන පසු අස්වනු හානිය සියයට 30ක් සියයට 40ක් පමණ වෙනවා. මෙයට යම් තරමක හෝ විසඳුමක් ලෙස උසස් තත්ත්වයේ ගබඩා පහසුකම් ගොවීන්ට සැපයීම සඳහා 2016 වර්ෂයේ අය වැයෙන් රුපියල් මිලියන 1,000ක්ද, 2017 වර්ෂයේදී පෞද්ගලික මෝල් හිමියන් නවීන ගබඩා ඉදි කිරීමට දිරි ගැන්වීම සඳහා ක්‍රියාත්මක කළ විශේෂ ණය ක්‍රමය වෙනුවෙන් සියයට 50ක පොලී සහනාධාරයක් ලබා දීම සඳහා රුපියල් මිලියන 400ක්ද, පොළොන්නරුව, කිලිනොච්චිය හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි ඉදිවන නවීන ගබඩාවල ඉදි කිරීම් කටයුතු අවසන් කිරීම සඳහා 2018 වර්ෂයේ අය වැයෙන් රුපියල් මිලියන 250ක්ද යහ පාලන රජය විසින් වෙන් කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, එමෙන්ම අනුරාධපුර හා මොණරාගල දිස්ත්‍රික්කවල මෙවැනි උසස් තත්ත්වයේ ගබඩා දැනටමත් ඉදිකර ඇති බවද සඳහන් කිරීමට කැමැතියි. මෙවැනි නවීන ගබඩා ඉදි කිරීමේ ප්‍රධානතම වාසිය වන්නේ, තම අස්වැන්න ගබඩා කිරීමෙන් පසුව, ගබඩාවෙන් ලැබෙන ලදුපත වාණිජ බැංකුවක් වෙත ඉදිරිපත් කොට, ගබඩා කළ අස්වැන්නේ වටිනාකමින් සියයට 50ක මුදලට සාපේක්ෂව ණය මුදලක් වාණිජ බැංකුවකින් ක්ෂණික මුදල් අවශ්‍යතාවන් සඳහා ගොවීන්ට ලබා ගැනීමට හැකිවීම සහ අතරමැදියාගේ සූරාකෑමට ලක් නොවී අවාරයේ මිල ගණන් යහපත් වන අවස්ථාවේදී ගබඩා කළ අස්වැන්නට ඉහළ මිලක් ලබා ගැනීමට ගොවියාට අවස්ථාව උදා වීමයි.

ඊළඟට, වගා හානි සඳහා වන්දි ගෙවීම සම්බන්ධයෙනුත් කථා කළ යුතු වෙනවා. 2016 වර්ෂයේ හටගත් ඉතිහාසය තුළ ඇති වූ දරුණුම නියඟය හා ගංවතුර වැනි ස්වාභාවික විපත්වලින් හානියට පත්වූ කුඹුරු සඳහා රක්ෂණ ආවරණයක් නොමැතිව වුවද වන්දි ගෙවීමට අපි කටයුතු කළා. ගොවීන් ලක්ෂ පහකට ආසන්න පිරිසකට වන්දි ගෙවීම සඳහා වැය කළ මුදල රුපියල් බිලියන 5.2ක්. මෙතරම් විශාල මුදලක් වගා හානි සඳහා ගෙවා තිබෙන්නේ ඉතිහාසයේ ප්‍රථම වතාවටයි. වගා හානි සඳහා මේ දක්වා වන්දි මුදල් වශයෙන් අක්කරයකට ගෙව්වේ රුපියල් 10,000ක් පමණයි. එම මුදල අක්කරයකට රුපියල් 40,000 දක්වා වැඩි කිරීමට මෙවර අය වැයෙන් කටයුතු කර ඇති බවද ඒකාබද්ධ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට සිහිපත් කරන්නට කැමැතියි.

මේ දක්වා වන්දි ගෙවූයේ වී වගාව සඳහා පමණක් වුවත්, ඊට අමතරව මෙවර අය වැයෙන් බඩඉරිඟු, සෝයා, ලොකු ලූනු, අල සහ මිරිස් යන භෝග වර්ග 05ද ඇතුළත් වන රක්ෂණ ක්‍රමයක් සඳහා රුපියල් මිලියන තුන්දහසක් වෙන් කර තිබීම බලවත් සතුටට කාරණයක්. ගරු සභාපතිතුමනි, ඉතිහාසයේ ප්‍රථම වතාවට ගොවියාට රක්ෂණය ලබා ගැනීම සඳහා සහනදායී ක්‍රමයක් හඳුන්වා දී තිබෙනවා. ඒ අනුව, අක්කරයකට රුපියල් 1,800ක් වන වාරිකයක් ගොවියා ගෙවිය යුත්තේ රුපියල් 675ක් පමණයි. ඉතිරි සියයට 70ක මුදල සඳහා රජය දායක වන බව මා විශේෂයෙන් සඳහන් කිරීමට කැමැතියි.

ගරු සභාපතිතුමනි, පොහොර සහනාධාරය සම්බන්ධයෙන් ගත්තොත්, යහපාලන රජය බලයට පත්වීමෙන් පසුව ගොවීන්ට රසායනික පොහොර ලබා දීම වෙනුවට හෙක්ටෙයාරයකට රුපියල් 25,000 බැගින් මූල්‍යමය ආධාරයක් ලබා දීමට තීරණය කළේ, තම වගාවට රසායනික පොහොර පමණක්ම යොදවනවා වෙනුවට වගා බිමේ යෝග්‍යතාව පරිදි, කොම්පෝස්ට් හා කාබනික පොහොර භාවිතයට ගොවීන් වඩ වඩාත් දිරිගැන්වීමේ සහ එමගින් වගා බිමට අවශ්‍ය යෙදවුම් තීරණය කිරීමේ නිදහස ගොවියාට ලබා දීමේ අරමුණ ඇතිවයි. මෙම අලුත් වැඩසටහන පිළිබඳව ආරම්භයේදී බොහෝ විරෝධතා සහ චෝදනා එල්ල වුණත්, මේ වන විට එම වැඩසටහන ඉතාම සාර්ථක ලෙස ක්‍රියාත්මක වන බව විශේෂයෙන් සඳහන් කිරීමට කැමැතියි. 2016 වර්ෂයේ සිට සෑම අය වැයකින්ම මේ සඳහා රුපියල් මිලියන තිස්පන්දහසකට වැඩි මුදලක් රජය විසින් වැය කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. පුරන් කුඹුරුවල වෙනත් භෝග වගා කිරීමට ගොවීන්ට අවස්ථාවක් සලසා දීමත් සිදුකර තිබෙනවා. ප්‍රමාණවත් තරම් ජල පහසුකම් නොමැතිවීම දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම පාහේ බොහොමයක් කුඹුරු පුරන්වීමට ප්‍රධාන හේතුව වුණා. එවැනි ඉඩම්වල වෙනත් විවිධ භෝග වගා කිරීමට හැකිවන පරිදි, කුඹුරු ඉඩම් පනත සහ කෘෂිකාර්මික ඉඩම් පනත සංශෝධනය කිරීමට මෙවර අය වැය මඟින් පියවර ගෙන තිබෙනවා. සමහර ගරු මන්ත්‍රීතුමන්ලා ඒ සම්බන්ධයෙන් විවේචනාත්මකව කරුණු ඉදිරිපත් කළා. නමුත්,

[ගරු වසන්ත අලුවිහාරේ මහතා]

ඒ සම්බන්ධයෙන් අපට සාකච්ඡා කරන්න ඉදිරියේදී පුළුවන්කමක් ඇති වෙනවා. මොකද, ඒක යෝජනාවක් පමණයි. ගරු ඇමතිතුමා කිව්ව ආකාරයටම අපි ඒක ගැන සාකච්ඡා කරලා තීරණයක් ගන්න බලාපොරොත්තු වනවා.

ගරු සභාපතිතුමනි, කෘෂිකර්මාන්තයේ නියැලී සිටින ගොවීන්ට ලබා දෙන සහනයක් ලෙස 2016 වර්ෂය වන තෙක් ආනයන බදු අය කළ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ රාශියක්, ආනයන බද්දෙන් නිදහස් කිරීමට 2016 අය වැය යෝජනා යටතේ අපගේ රජය කටයුතු කළ බවද ප්‍රකාශ කිරීමට කැමැතියි.

ගරු සභාපතිතුමනි, පසු ගිය රජයේ අදූරදර්ශී විදේශ ප්‍රතිපත්තිය නිසා අපේ රටට GSP Plus සහනය අහිමි වුණා. දේශීය නිෂ්පාදන බොහොමයකට මෙන්ම විශේෂයෙන් අපනයන බෝග නිෂ්පාදනයට මෙම තත්ත්වය ඉතාම අහිතකර බලපෑමක් ඇති කළා.

ස්විට්සර්ලන්තයේ පැවති ලෝක ආර්ථික සමුළුවට සහභාගී වූ ප්‍රථම ශ්‍රී ලාංකික රාජ්‍ය නායකයා ලෙස, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට GSP Plus තහනමත්, යුරෝපා මත්ස්‍ය තහනමත් ඉවත් කර ගැනීමට පුළුවන්කම ලැබීම රටේ වාසනාවක් බව මා විශේෂයෙන්ම සඳහන් කිරීමට කැමතියි. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන භාණ්ඩ බහුතරයක්ම අපනයනය කරනු ලබන්නේ යුරෝපීය වෙළෙඳ පොළටයි. ඒ අනුව අපගේ කෘෂි කාර්මික නිෂ්පාදන විශේෂයෙන්ම අපනයන බෝග යුරෝපා වෙළෙඳ පොළට යැවීමෙන් වගාකරුවන්ට මෙන්ම අපනයනකරුවන්ට තම ආදායම ඉහළ නංවා ගැනීමට නැවතත් අවස්ථාව උදා වී ඇති බව ඒකාබද්ධ විපක්ෂයට සිහිපත් කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare )
මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු සභාපතිතුමනි.

මෙවර අය වැයෙන් යාපනයේ නවීන ආර්ථික මධ්‍යස්ථානයක් පිහිටුවීමට කටයුතු කර තිබෙනවා. පසු ගිය සන්ධාන රජය මෙන් වත්මන් යහපාලන රජය දිවයිනේ එක් පළාතකට පමණක් වැඩිපුර මුදල් යොදවා තවත් සමහර පළාත්වලට කුඩම්මාගේ සැලකිල්ලක් දැක්වීමට කිසිම අවස්ථාවක කටයුතු කරන්නේ නැහැ. මෙවර අය වැයෙන් යෝජනා කර ඇති යාපනයේ නවීන ආර්ථික මධ්‍යස්ථානය එයට කදිම උදාහරණයක්. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය සහ කොළඹ සම්බන්ධ කොට පිහිටුවීමට යෝජිත මෙම නවීන ආර්ථික මධ්‍යස්ථානය නිසා අතරමැදියන්ගේ සූරා කෑමට ලක් නොවී තම නිෂ්පාදනවලට සාධාරණ මිලක් ලබා ගැනීමට උතුරේ ගොවීන්ට අවස්ථාව උදා වනු ඇතැයි මා තරයේ විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, තවත් කරුණු කීපයක් ඉදිරිපත් කරන්න තිබුණත් කාලය සීමිත නිසා මා මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා. කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති රාජකාරි ඉටු කිරීමේදී කෘෂිකර්ම අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මැතිතුමාගෙන් ලැබෙන සහයෝගය හා සුහදශීලී භාවයත්, අමාත්‍යාංශයේ ලේකම්තුමා, රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලුම අතිරේක ලේකම්වරු, අධ්‍යක්ෂ ජනරාල්තුමන්ලා, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා අදාළ ආයතන ප්‍රධානීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයෙන් මා වෙත ලැබෙන පූර්ණ සහයෝගය වෙනුවෙන් මාගේ ස්තුතිය පළ කිරීමටද මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ස්තුතියි.

[பி.ப. 5.51]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா.  காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய நான்கு அமைச்சுக்கள் தொடர்பான குழுநிலை விவாதத்தில் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்காகத் தங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். 30 வருட யுத்தத்தின் கசப்பான அனுபவத்துடன் யுத்த இழப்புக்களையும் அதன் பாதிப்புக்களையும் நாம் எவரும் மறக்கவில்லை, மறக்கவும் முடியாது. ஒரு நாட்டின் அபிவிருத்தியானது அந்த நாட்டின் சமாதானச் சூழலிலேயே தங்கியுள்ளது. இன்று எமது மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களதும் மற்றும் கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களதும் தலைமையிலான நல்லாட்சி அரசின் அனைத்து அபிவிருத்தி முயற்சிகளையும் சீர்குலைப்பதில் சில சக்திகள் முனைப்புடன் செயற்பட்டு வருகின்றன. அதன் எதிரொலியாக நாட்டின் பல திசைகளிலும் இனவாதத் தீச்சுவாலை மீண்டும் தலைதூக்கியுள்ளது.

கடந்த வெள்ளிக்கிழமை காலி கிந்தோட்டைப் பகுதியில், அதற்கு இரு தினங்களுக்கு முன்னர் ஏற்பட்ட ஒரு நிகழ்வை அடிப்படையாகக்கொண்டு அப்பிரதேச முஸ்லிம்கள் குறிவைத்துத் தாக்கப்பட்டதுடன், 70 கட்டடங்களும் 10 வாகனங்களும் 2 பள்ளிவாசல்களும் உடைக்கப்பட்டும் தீவைக்கப்பட்டும் உள்ளன. அதேபோன்று, எனது பிரதேசமான வவுனியா நகரில் கடந்த திங்கட்கிழமை 20ஆம் திகதி பள்ளிவாசலுக்குச் சொந்தமான, முஸ்லிம்கள் வியாபாரம் செய்யும் இரண்டு கடைகள் தீக்கிரையாகின. இது இப்பிரதேச இன உறவை இலக்குவைத்த ஒரு தாக்குதல் என்றும் குறிப்பிடலாம். நாடளாவிய ரீதியில் முஸ்லிம்களின் வியாபாரத்தை - வர்த்தகத்தை இலக்குவைத்து மிக மோசமான விசமப் பிரசாரங்கள் திட்டமிட்டபடி முன்னெடுக்கப்படுவதை நான் வன்மையாகக் கண்டிக்கின்றேன். அரசாங்கம் இந்தத் தீய சக்திகளுக்கு எதிராக உரிய சட்ட நடவடிக்கை எடுக்கவேண்டும் என்று கேட்டுக்கொண்டு, இன்றைய அமைச்சுக்கள் தொடர்பான விவாதத்திற்கு வருகின்றேன்.

கௌரவ தவிசாளர் அவர்களே, உலர் வலயத்தில் அமையப்பெற்றுள்ள வன்னிப் பிரதேசத்தின் 3 மாவட்டங்களிலும் உள்ள விவசாய நிலங்களும் கால்நடைகளும் கடுமையான வரட்சிக் காலங்களில் மிக மோசமாகப் பாதிக்கப்படுவதனால் மக்கள் பாரிய இழப்புக்களை எதிர்கொள்கின்றனர். இந்த வருடத் தொடர் வரட்சி காரணமாக வவுனியா, மன்னார், முல்லைத்தீவு ஆகிய மூன்று மாவட்டங்களிலும் சுமார் ஓரிலட்சம் குடும்பங்களைச் சேர்ந்த சுமார் 3,50,000 மக்கள் கடுமையாகப் பாதிக்கப்பட்டனர். இப்பிரதேச நீர் நிலைகள், குளங்கள் மற்றும் கிணறுகள் முழுமையாக வற்றிவிட்டன. மக்கள் தமது குடிநீரைப் பெறச் சில கிலோமீற்றர் தூரம் நடந்து

செல்லவேண்டி ஏற்பட்டது. இதனால் அதிகம் பாதிக்கப்பட்டவர்கள் பெண்களாவர்.

கௌரவ தவிசாளர் அவர்களே, இந்த வரட்சியை எதிர்கொண்டு மழைநீரைச் சேகரிக்கும் நோக்கில், வவுனியாவில் கைவிடப்பட்ட நிலையிலுள்ள 260 குளங்களும் முல்லைத்தீவிலுள்ள 130 குளங்களும் மன்னாரிலுள்ள சுமார் 123 குளங்களும் உடனடியாகப் புனரமைக்கப்பட வேண்டும். அதேபோல, வவுனியாவில் 250 குளங்களும் முல்லைத்தீவில் 100 குளங்களும் மன்னாரில் 100 குளங்களும் திருத்தப்பட வேண்டியுள்ளன. கைவிடப்பட்ட நிலையில் உள்ள அணைக்கட்டுக்களாக, குறிப்பாக வவுனியாவில் 27உம் முல்லைத்தீவில் 19உம் மன்னாரில் 15உம் அடையாளம் காணப்பட்டுள்ளன. இவை அனைத்தும் சீர்செய்யப்பட வேண்டும். இதன்மூலம் வன்னிப் பகுதியில் கைவிடப்பட்ட நிலையிலுள்ள சுமார் 14,000 ஏக்கர் வயல் காணிகளில் மீண்டும் விவசாயம் செய்ய முடிவதுடன், இப்பிரதேச நீர்ப்பாசனம் மேலும் விருத்திபெறும்.

1983 தொடக்கம் 1990 வரையான காலப்பகுதியில் நாட்டில் ஏற்பட்ட அசாதாரண சூழ்நிலை காரணமாக இடம்பெயர்ந்து, தற்போது மீளக் குடியேறித் தமது வாழ்வாதாரத்திற்காக விவசாயம் செய்யக்கூடிய மக்கள், தமது விவசாயக் காணிகளுக்குள் செல்ல முடியாதவாறு 2012 மற்றும் 2017ஆம் ஆண்டின் வன பரிபாலனத் திணைக்கள வர்த்தமானி அறிவித்தல் காணப்படுகின்றது. தற்போது அந்த விவசாயக் காணிகளுக்கு எல்லைக் கற்கள் இடப்பட்டுள்ளன. இதனால், இடப்பெயர்வுக்கு முன் அங்கு விவசாயம் செய்தமைக்கான சகல ஆவணங்களும் அம்மக்களிடம் காணப்படுகின்றபோதிலும் இன்று அவர்கள் அங்கு தமது விவசாயத்தை மேற்கொள்ள முடியாத நிலை ஏற்பட்டுள்ளது. எனவே, அவர்களுடைய காணிகளை விடுவித்து, அவர்களது ஜீவனோபாயச் செயற்பாடுகளைச் சீர்செய்வதற்குரிய நடவடிக்கைகளை எடுக்குமாறு தங்களைக் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், மன்னார் மாவட்டத்தில், சிலாவத்துறை, உயிலங்குளம் ஆகிய இடங்களிலும், முல்லைத்தீவு மாவட்டத்தில் குமுளமுனை, பாண்டியன்குளம் ஆகிய இடங்களிலும் கமநலச் சேவை நிலையங்கள் நிறுவப்பட வேண்டும்.

விவசாய வீதிகளைப் பொறுத்தவரையில், வவுனியா மாவட்டத்தில் 900 கி.மீ. வீதியும் முல்லைத்தீவு மாவட்டத்தில் 630 கி.மீ. வீதியும் மன்னார் மாவட்டத்தில் 1,450 கி.மீ. வீதியும் செப்பனிடப்பட வேண்டியுள்ளன.

மேலும், நெல் உலர வைக்கும் தளங்கள் வவுனியாவில் 80உம் முல்லைத்தீவில் 60உம் மன்னாரில் 200உம் தேவைப்படுகின்றன.

இராணுவக் கட்டுப்பாட்டின்கீழ் இருந்த விவசாய நிலங்களில் இடப்பட்டிருந்த தடுப்புக் கட்டுக்கள் பல இன்னும் அகற்றப்படாதுள்ளன. இதன் காரணமாக வவுனியா மாவட்டத்தில் 500 ஏக்கர் வயல் நிலமும் முல்லைத்தீவில் 200 ஏக்கர் வயல் நிலமும் பாதிக்கப்பட்டுள்ளன.

குறிப்பாக வட பகுதியில் பெரும்பாலான குளங்கள் தனிநபர்கள் பாவனைக்காகச் சட்டவிரோதமான முறையில் மூடப்பட்டும் அபகரிக்கப்பட்டுமுள்ளன. இது தொடர்பாகச் சட்ட நடவடிக்கை எடுக்கப்பட வேண்டும். அத்துடன் அடையாளம் காணப்படாத நிலையிலுள்ள குளங்கள் பற்றிய உரிய தரவுகள் சேகரிக்கப்பட்டு, அவை உரிய நிறுவனத்தின்மூலம் விருத்தி செய்யப்பட வேண்டும் என்றும் கேட்டுக்கொண்டு, விடைபெறுகின்றேன்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

මීළඟට, ගරු පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

[අ.භා. 5.57]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன இராஜாங்க அமைச்சர்)
The Hon. Palitha Range Bandara - State Minister of Irrigation)

ගරු සභාපතිතුමනි, මේ රටට විශේෂයෙන්ම වැදගත් අමාත්‍යාංශ හතරක් සම්බන්ධයෙන් අද දිනයේදී කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව මුලින්ම මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද දිනයේදී කාරක සභා අවස්ථාවේ විවාදයට ගන්නා කෘෂිකර්ම අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව මා බෙහෙවින් සංතෝෂ වෙනවා.

ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමනි, ඔබතුමාට පොඩි වෙලාවක් ගරු සභාවේ රැඳෙන්න පුළුවන් නම් වඩාත් හොඳයි. ඔබතුමා අපේ අමාත්‍යාංශයට අදාළ කරුණු ගණනාවක් පිළිබඳව කියපු නිසා ඒවාට පිළිතුරක් දෙන තුරු.

ගරු සභාපතිතුමනි, අද මේ ගරු සභාවේ විවාදය කිරීමට තිබුණු අමාත්‍යාංශවල වැය ශීර්ෂ සම්බන්ධයෙන් කථා නොකොට, උදේ වරුවේ සිට මේ ගරු සභාවේ කළේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයක් ද කියලා අපට හිතුණා. මොකද, ඒ සම්බන්ධ විවාදයක් තමයි අද උදේ සිට මේ ගරු සභාවේ සිද්ධ වුණේ.

විපක්ෂයේ මන්ත්‍රීවරු අද නිතරම ගොවිතැන පිළිබඳව කථා කරනවා; ගොවියා පිළිබඳව කථා කරනවා; වී වගාව පිළිබඳව කථා කරනවා; අස්වැන්න පිළිබඳව කථා කරනවා. ඔවුන් ගොවීන්ට අමුඩ ගස්වලා කොළඹ අරගෙන එනවා. අමුඩයක් ගහගෙන කුඹුරක වැඩ කරන එක ගොවියෙක් අද දකින්න නැහැ. ඒත් එහෙම ගොවීන් කොළඹට ගෙනැල්ලා අමුඩ ගස්සලා උද්ඝෝෂණ කර වනවා. එහෙම කරවන උදවිය එක්කෙනෙක්වත් දැන් මේ ගරු සභාවේත් නැහැ.

කෘෂිකර්මාන්තයට අදාළ වැදගත් විවාදයක් යන අද දවසේ මේ වෙලාවේ මේ ගරු සභාවේ විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙක්වත් නැහැ. පම්පෝරි ගහන්න, කෑ ගහන්න, උද්ඝෝෂණය කරන්න විතරයි විපක්ෂයේ මන්ත්‍රීවරු ඉන්නේ. මේ ගරු සභාවේ කටයුතුවලට සක්‍රිය දායකත්වයක් දෙන්න ඔවුන්ට වුවමනාවක් නැහැ. මේ විවාදයේ තිබෙන වටිනාකම, අමාත්‍යාංශවල තිබෙන වටිනාකම පිළිබඳව කථා කරලා, ඒකෙන් ප්‍රයෝජනය ගන්න ඒකාබද්ධ විපක්ෂය ඇතුළු විරුද්ධ පක්ෂය මේ ගරු සභාවේ නොසිටීම පිළිබඳව අපි බෙහෙවින්ම කනගාටු වෙනවා.

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

ගරු සභාපතිතුමනි, මම නියෝජනය කරන අමාත්‍යාංශයේ කැබිනට් අමාත්‍ය ගරු විජිත් විජයමුණි සොයිසා අමාත්‍යතුමා එක්ක ඉතාම සුහදව, සන්තෝෂයෙන් වැඩ කරන්න පුළුවන්. ඒ බව මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මම වැඩිමනත් කරුණු පසුව කථා කරන්නම්.

අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කළා. අවසාන වශයෙන් අදහස් දැක්වූ අපේ ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා, මුලතිව් ප්‍රදේශය, සිලාවතුර ප්‍රදේශය, මුරුන්කන් ප්‍රදේශය, අකතිමුරුප්පු ප්‍රදේශය පිළිබඳවත්, මන්නාරම් දිස්ත්‍රික්කය සහ වව්නියාව දිස්ත්‍රික්කය පිළිබඳවත් සඳහන් කළා. ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු ආරම්භ කළාට පස්සේ දැවැන්ත සංවර්ධනයක් කළා.

විශේෂයෙන්ම අපේ රටේ අක්කර 49,600ක් යල මහ දෙකන්නයේ වැඩ කරන්න පුළුවන් දැවැන්ත ව්‍යාපෘතියක් තමයි මල්වතු ඔය ව්‍යාපාරය. මල්වතු ඔය ව්‍යාපාරය තුළින් ගිගාවොට් හයක විදුලි බලාගාරයක් ආරම්භ කොට තිබෙනවා. ඒ වාගේම, වව්නියාව සහ මන්නාරම දිස්ත්‍රික්ක දෙකේ ලක්ෂ ගණනාවක ජනතාවටත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ලක්ෂ ගණනාවක ජනතාවටත් පැය විසිහතර පුරා අඛණ්ඩව පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘතියක් ආරම්භ කොට තිබෙනවා. ඒ වාගේම, විල්පත්තුව ජාතික වනෝද්‍යානයත් එක්ක බද්ධ වෙච්ච සංචාරක නගරයක් ඇති කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. මේ සියලු කාරණා පදනම් කරගෙන ඒවා සංවර්ධනය කරන අපේ ව්‍යාපෘතියක් තිබෙනවා. මේ ව්‍යාපෘතියේ කටයුතු කරද්දී අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට අපිත් සමඟ සම්බන්ධ වෙන්න කියලා අවස්ථා ගණනාවකදී දැනුම් දුන්නා.

මුරුන්කන් වාරි අධ්‍යක්ෂතුමාගේ කොටසේ යම් යම් අඩු පාඩු තිබුණා; යන්ත්‍ර සූත්‍රවල අඩු පාඩු තිබුණා. එතුමන්ලාගේ ඉල්ලීම් අනුව අපි ඒ සියල්ලම ලබා දෙන්න කටයුතු කළා. අපි අවස්ථා දෙකකදීම ගරු මන්ත්‍රීතුමන්ලාට දැනුම් දුන්නා, අපිත් එක්ක මේ වැඩ කටයුතුවලට සහභාගි වෙන්න කියලා. මට සන්තෝෂයි ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා එම අවස්ථාවට සහභාගී වීම ගැන. නමුත්, එතුමා හැර වෙන කිසිම මහජන නියෝජිතයෙක් ඒ අවස්ථාවට සහභාගි වුණේ නැහැ. ඔබේ ප්‍රදේශයේ ජනතාවගේ පිපාසය සංසිඳුවන්නට, යෝධ වැව පුරවලා වතුර ලබා දෙන්නට, අකතිමුරුප්පු ජලාශය තවත් ශක්තිමත් කරන්නට ඔබතුමන්ලාට අවස්ථාව තිබුණා, අපිත් එක්ක එකතු වෙලා වැඩ කරන්න. ඒ වාගේම, යෝධ ඇල ජලාශයේ සංවර්ධන කටයුතු මේ වන විට සිදු වනවා.

යෝධ ඇළ ජලාශයට වතුර ගෙන යන ඇළ මාර්ග දැන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ සංවර්ධනය කරගෙන යනවා. ගරු මන්ත්‍රීතුමන්ලා මේ ගරු සභාවේ අදහස් දැක්වීම පමණක් නොවෙයි කළ යුත්තේ. ඔබතුමන්ලා කරුණාකරලා තමන්ගේ කොට්ඨාසයේ තිබෙන වැඩ කටයුතුවලටත් සම්බන්ධ වෙන්න. මේ වැඩ කටයුතුවලට සම්බන්ධවෙලා, දේශපාලන නායකත්වය ලබා දුන්නා නම්, මීට වඩා ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් කියන කාරණය මා කාදර් මස්තාන් මන්ත්‍රීතුමාට ගෞරවයෙන් සිහිපත් කරන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, අද අපේ ගරු මන්ත්‍රීතුමන්ලා වාගේම ගරු අමාත්‍යතුමන්ලා ගණනාවක් අදහස් දැක්වූවා. මා තවදුරටත් අදහස් දක්වන්න ඉස්සෙල්ලා, එලෙස අදහස් දක්වපු අය ඉදිරිපත් කරපු ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන්න කැමැතියි.

පුත්තලම දිස්ත්‍රික්කයේ ගරු නවවි මන්ත්‍රීතුමා නීලබැම්ම ව්‍යාපාරය, පොතාන සහ රහල්මඩුව ආදී පහළ කලා ඔය නිම්නයේ සංවර්ධන කටයුතු පිළිබඳව අදහස් කීපයක් ඉදිරිපත් කළා. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරින් වාගේම අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා, අපේ අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු නිලධාරින්, සැලසුම් අංශය කියන මේ සියල්ල එකට එකතුවෙලා අපි කණ්ඩායමක් විධියට මේ කියපු කාරණා සියල්ල පිළිබඳව අවධානය යොමු කර තිබෙනවා. රාජාංගණය ජලාශයේ ඉඳලා කලා ඔයට ගලා බසින ජලය පහරියට ගෙනෙන්න පුළුවන්ද, තබ්බෝව ජලාශයට ගෙනෙන්න පුළුවන්ද කියන කාරණය පිළිබඳව අපි අධ්‍යයනය කර තිබෙනවා. අපේ සැලසුම් අංශය සහ පරීක්ෂණ අංශය මේ වනකොට අනාවරණය කරගෙන තිබෙනවා, ඉහළ පුලියන්කුලම ජලාශය දක්වා එම ජලය ගෙනෙන්නට පුළුවන් කියලා. අපි ඒ වැඩ කටයුතු ආරම්භ කරන්න දැන් සැලසුම් කරගෙන යනවා. ගරු ඇමතිතුමාත් එක්ක මේ තත්ත්වය පිළිබඳව මා අද කථා කළා. එතුමා කිව්වා, "ඉහළ පුලියන්කුලමට ජලය ගෙනෙන්න පුළුවන් නම්, එතැනින් එහාට එම ජලය පහරියට ගෙනි යෑම සඳහා සූර්ය බලශක්තියත් උපයෝගී කරගෙන උස්සාන ජල ක්‍රමයක් -lift irrigation එකක්- එතැන සකස් කරමු" කියලා.

ඒ අන්දමට පහරියටත්, තබ්බෝව ජලාශ දෙකටත් මේ අපතේ යන ජලය ලබා දීමට කටයුතු කරමු කියලා කිව්වා. අපි මේ පිළිබඳව සැලසුම් කරලා තිබෙනවා. අපේ නිලධාරින් පුත්තලම දිස්ත්‍රික්කයට ඇවිල්ලා තිබෙනවා. මම කලින් සඳහන් කළ අපේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්තුමා සහ එතුමාගේ නියෝජිත නිලධාරි මහත්වරු කණ්ඩායමක් ආවා. ඒ වාගේම, අපේ වනජීවී අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ සූරියබණ්ඩාර මැතිතුමා පෞද්ගලිකවම ආවා. ඒ වාගේම, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුත්තලම දිස්ත්‍රික්කයේ අධ්‍යක්ෂතුමා ඇතුළු එම නිලධාරින් ඒක රාශී වුණා; මේ පිළිබඳව සාකච්ඡා කළා. අපි ක්ෂේත්‍ර පරීක්ෂණය පැවැත්තුවා. ගරු නවවි මන්ත්‍රීතුමනි, ඒ ක්ෂේත්‍ර පරීක්ෂණයේදී මේ වන විට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නීලබැම්ම දෙවන අදියර ක්‍රියාත්මක කිරීමටත්, ඉහළ පුළියන්කුලම දක්වා ජලය ගෙන ඒමට කටයුතු කරන්නටත්, ඒ වාගේම සෙංගල්ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහාත් අවශ්‍ය අනුමැතිය; සහයෝගය ලබා දෙන්නටත් තීන්දු කරලා ඉවරයි. මේ වන විට අපේ ගරු ඇමතිතුමා සහ මම, අපේ නිලධාරින්, අපේ ලේකම්තුමන්ලා, එම ව්‍යාපෘතිය භාර අධ්‍යක්ෂ සුනිල් මැතිතුමා ඇතුළු කණ්ඩායම සෙංගල් ඔය ව්‍යාපාරය සම්බන්ධ සැලසුම් සකස් කර අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ජනවාරි මාසයේ පළමුවැනිදාත්, හත්වැනිදාත් අතර අපේ ගරු ඇමතිතුමාට එන්න පුළුවන් සතියේ දිනයක එය ආරම්භ කරන්න බලාපොරොත්තු වනවා. අපි සෙංගල්ඔය ආරම්භ කරලා අවුරුදු ගණනාවක් වෙනවා. නමුත් යම් යම් තාක්ෂණික කරුණු මත එය අසාර්ථක වෙලා තිබෙනවා. මෙවර අපේ සියලුම කණ්ඩායම් ඒක රාශී වෙලා කරන ලද අධ්‍යයනයක ප්‍රතිඵලයක් වශයෙන්, නැවත අසාර්ථක නොවන සාර්ථක ක්‍රමයක් අපි සොයා ගෙන තිබෙනවා. ඒ සාර්ථක ක්‍රමවේදය තුළ වැඩ කටයුතු ආරම්භ කරන්නත්, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙන වැව් 16ක් දක්වා ජලය සැපයීමටත්, ඒ වැව් 16ම සංවර්ධනය කරන්නටත් අපි සැලසුම් කරලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, 2018 වසරේ කිසිදු කාලගුණික, දේශගුණික බලපෑමකින් තොරව; බාධාවකින් තොරව මේ වැඩ කටයුතු ටික කරලා, එය සංවර්ධනය කරලා දෙන්න අපට පුළුවන් වෙයි කියලා. ඒ වාගේම, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේත්, ගරු අග්‍රාමාත්‍යතුමාගේත් මැදිහත්වීම තුළ නීලබැම්ම දෙවන අදියර ක්‍රියාත්මක කරවන්නට අපි සැලසුම් කරලා තිබෙනවා. අපේ නිලධාරින් මේ සම්බන්ධ

සැලසුම් සියල්ල සකස් කර අවසන් වුණාම 2018 වසරේ මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ත්‍රිකුණාමලයේ ගරු තුරෙයිරෙත්නසිංහම් මන්ත්‍රීතුමා, වෙරුගල් වේල්ල සහ කුච්චවේලි අමුණ පිළිබඳව කථා කළා. කුච්චවේලි සහ වෙරුගල් වේල්ල ප්‍රදේශයේ වාරි සංවර්ධන කටයුතු කරන ආකාරය ගැන අපේ ගරු අමාත්‍ය විජිත් විජයමුණි සොයිසා මැතිතුමා අපේ නිලධාරින් එක්ක මේ වන කොටත් සාකච්ඡා කරලා සැලසුම් කර ගෙන යනවා. අපේ සැලසුම් අවසන් කළාම ඉදිරියේදී මේ වැඩ කටයුතු කර ගන්නට පුළුවන්කම ලැබෙන බව ගරු මන්ත්‍රීතුමාට සිහි පත් කරන්නට කැමැතියි.

ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා වැලි ගැනීමේ බාධාවක් ගැන සඳහන් කළා. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පමණක් නොවෙයි, මහවැලි අමාත්‍යාංශයට අයත් අපේ වාරි පද්ධතියේ සියලු ඇළ, වේලි දැන් විනාශ කරලා ඉවරයි, ගරු සභාපතිතුමනි. වසර ගණනක ඉඳලා නියඟය නිසා දැන් අපේ ඇළවල්වල වතුර නැහැ. වතුර නැතිව තිබියදීත් ඇළ දෙපැත්තේ ඉවුර හාරා ගෙන, කඩාගෙන යටින් යනවා වැලි ගන්න. පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්අඩිය ප්‍රදේශයේ මී ඔයේ ඒ විධියට පස් යටින් රිංගා ගෙන වැලි හාරා ගෙන, හාරා ගෙන යන කොට, ඉවුරේ ඉතිරි ටික කඩා ගෙන වැටිලා පුද්ගලයින් දෙදෙනෙක් මිය ගියා. ඒක බොහොම අවාසනාවන්ත තත්ත්වයක්. නැවත වර්ෂාවක් ආපු ගමන් මේ ඉවුරු ඔක්කෝම කඩා ගෙන වැටිලා ඔයේ, එහෙම නැත්නම් ඇළේ දැනට තිබෙන ප්‍රමාණය දෙගුණයකට වඩා විශාල වෙනවා. මේ නිසා වාරිමාර්ග දෙපාර්තමේන්තුව වශයෙන්, ගරු ඇමතිතුමාගේ උපදෙස් අනුව අපි තීන්දුවක් අරගෙන තිබෙනවා, නියං සමය තුළ වැලි ලබා ගැනීම සඳහා බලපත්‍ර නිර්දේශ කිරීමෙන් වැළකිලා ඉන්න. ඒ වෙනුවෙන් අපි විකල්පයක් දීලා තිබෙනවා.

කන්නය ඉවර වුණාට පස්සේ වැවේ වතුර හිඳිලායි තිබෙන්නේ. ඉතිහාසයේ ඉඳලා අපට මතකයි, අපි පුංචි කාලයේ අපේ ගොවි මහත්වරු කන්නය අවසන් වුණාට පස්සේ වැවේ "කට්ටි කපනවා" කියලා දෙයක් කරනවා. ඒ කට්ටි කපන පස් ටික අරගෙන ගිහිල්ලා දමන්නේත් වැවේ බන්ට් එකට. වැඩිපුර තිබෙනවා නම් පිටතට අරගෙන යනවා. ඒ ක්‍රියාව නිසා එක පැත්තකින් බන්ට් එක ශක්තිමත් කර ගන්නවා; අනෙක් පැත්තෙන් වැව ගැඹුරු කර ගන්නවා. ගොවි සංවිධානවල ඉල්ලීම අනුව; ගොවි සංවිධානවල අධීක්ෂණය යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ නිලධාරින්, තාක්ෂණික නිලධාරින්, ඉංජිනේරු මහත්වරුන් මේ පිළිබඳව ඇස්තමේන්තුවක් කරලා, නියම ක්‍රමවේදය තුළ පස් ඉවත් කර ගැනීමේ ක්‍රමයක් දැන් සකස් කර දීලා තිබෙනවා. අවශ්‍ය කෙනෙක් ඉන්නවා නම්, ඒ ක්‍රමවේදය තුළ පස් ඉවත් කරන්නට පුළුවන්; වැව ගැඹුරු කරලා දෙන්න පුළුවන්. කැමැති නම් ඔහුට ඒ පස් ටික ඉවත් කර ගන්නට පුළුවන්. සමාජයට අවශ්‍ය; රටට අවශ්‍ය වැලි ටික එතැනින් නිෂ්පාදනය කරලා දෙන්න පුළුවන්. එහෙම නැතිව, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයිති; රටේ පරිසරයට අයිති මේ ඇළ, වේලි, වැව්, පොකුණු විනාශ කරන්නට දෙන්න පුළුවන්කමක් නැහැ. ඒවා ආරක්ෂා කර ගෙන තමයි අපට ඉදිරියට යන්න සිදු වෙලා තිබෙන්නේ.

ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමනි, මෙම ක්‍රමවේදය තුළ ඔබතුමන්ලාගේ කොට්ඨාසයේත් වැඩ කරන්න පුළුවන්. එසේ නැතුව අපිට එකඟ වෙන්න බැහැ, අනෙක් කටයුතුවලට. ඒ වාගේම ගරු අමීර් අලි සිහාබ්දීන් නියෝජ්‍ය ඇමතිතුමා එතුමාගේ දිස්ත්‍රික්කය වන මඩකලපුව දිස්ත්‍රික්කයේ, වාකනේරි ප්‍රදේශය පිළිබඳව, රුගම්, කිතුල් වැනි වැව් පිළිබඳව සඳහන් කළා. ගරු ඇමතිතුමා අද කැබිනට් පත්‍රිකාව අත්සන් කළා. ඊළඟ කැබිනට් එකේදී එය අනුමත වේවි. 2018දී අපිට ගරු අමීර් අලි නියෝජ්‍ය අමාත්‍යතුමන්ලාගේ මඩකලපුව දිස්ත්‍රික්කය පිළිබඳව බලන්නට පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමා වැව් අලුත්වැඩියා කර දෙන එක සම්බන්ධව කථා කළා. අපිට එතුමාගේ ඉල්ලීම් ලැබුණාම, ඒ පිළිබඳව කටයුතු කරන්න පුළුවන් කියන එකත් අප සිහිපත් කරන්න කැමැතියි. අද මෙම විවාදය ආරම්භයේදී ගරු චමල් රාජපක්ෂ මැතිතුමාත් කථා කළා. අනාගතයේදී හම්බන්තොටට සහ මොණරාගලට ජලය ගැනීමට යුද්ධ කරන්න වෙයි කියලා කිව්වා. කිසිම යුද්ධයක් කරන්නට අපට අවශ්‍යතාවක් ඇති වෙන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමා, රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා, අපේ අධ්‍යක්ෂ ජනරාල්තුමා, එක් එක් දිස්ත්‍රික්කය භාරව ඉන්නා අපේ අධ්‍යක්ෂතුමන්ලා හා ඉංජිනේරු මහත්වරුන් කළමනාකරණය පිළිබඳව විශේෂ දැනුමක් තිබෙන උදවිය. ඒ වාගේම අපේ වාරි කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ, චන්ද්‍රිකා ඇතුගල මැතිනිය හා එම කළමනාකරණ නිලධාරි මහත්වරුන්ට මේ පිළිබඳව අවබෝධයක් තිබෙනවා. එක් ව්‍යාපෘතියකට කොපමණ ජලය අවශ්‍යද, ඊළඟ ව්‍යාපෘතියට කොපමණ ජලය අවශ්‍යද, ජලය නිකුත් කළ යුත්තේ කොහොමද, අඩු කන්නයේදී කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක පිළිබඳව ඔවුන් හොඳින් දන්නවා; ඒ සම්බන්ධයෙන් ඔවුන්ට හොඳ නිපුණතාවක් තිබෙනවා. පසුගිය ගංවතුර උවදුර ඇති වුණු අවස්ථාවේදී අපි එය දැක්කා. රත්නපුරයේ සිටින වාරි ඉංජිනේරුතුමා දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී ප්‍රකාශ කළා, "මෙච්චර වතුර ප්‍රමාණයක් මේ මේ කාල පරිච්ඡේදයේදී එන්න පුළුවන්, රත්නපුරයට මෙවැනි දැවැන්ත ගංවතුරක් එන්න පුළුවන්" කියලා. එතැනින් පැහැදිලිව පෙනෙන්නේ, අපේ නිලධාරින් සතු දැනුමේ තිබෙන වටිනාකම සහ ඔවුන්ට ඒ පිළිබඳව තිබෙන අවබෝධයයි කියන එක මේ අවස්ථාවේදී සිහිපත් කිරීම අත්‍යවශ්‍යයි, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය නම් දැන් අවසානයි. විනාඩි 12ක් ගත වෙලා තිබෙනවා. තව විනාඩියකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

තව විනාඩි 2කින් මගේ කථාව අවසන් කරන්නද, ගරු සභාපතිතුමනි?

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

හොඳයි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමනි, අපි ඉදිරියේදී වාරිමාර්ග ක්ෂේත්‍රයේ විශාල වැඩ කොටසක් කිරීමට සැලසුම් සකස් කර තිබෙනවා. ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, ජේ.ආර්. ජයවර්ධන කියන නායකතුමන්ලාගෙන් පසුව ගොවියා ගැන හිතපු, ගොවියා ගැන දකින, වාරි ක්ෂේත්‍රය ගොඩනගන්නට ඕනෑය කියා හිතන, ගංගා ද්‍රෝණි ටික සංරක්ෂණය කරන්නට ඕනෑය කියා හිතන, ගංගාවල ගලා යන ජලය මහ මුහුදට නොයවා ගොඩබිම රඳවා ගෙන,

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

ගොවීන්ට ගොවිතැන සඳහා උදව් කරන්නට ඕනෑය කියා හිතන, ඒ ගැන සැලැස්මක්, දැක්මක් තිබෙන නායකයෙක් තමයි වර්තමාන අතිගරු ජනාධිපතිතුමා. මේ ඇළදොළවලින් ප්‍රයෝජන අරගෙන මේ රටේ මිනිසුන්ගේ පිපාසය නිවන්නත්, ගොවිතැන ශක්තිමත් කරන්නත් එතුමාට අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. ඒ අනුව ඉදිරි කාල පරිච්ඡේදයේදී ගංගා ද්‍රෝණි 10ක් සංවර්ධනය කිරීමට අපි සැලසුම් කරලා තිබෙනවා. මල්වතු ඔය, පහළ මල්වතු ඔය, කලා ඔය, දැදුරු ඔය, මා ඔය, අත්තනගලු ඔය, ගල් ඔය, කැලණි ගඟ, ගිං ගඟ, නිල්වලා ගඟ හා මහවැලි ගඟ කියන මේ ගංගා ද්‍රෝණි සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ඉදිරි කාල පරිච්ඡේදයේදී ක්‍රියාත්මක වෙනවා.

මේ වෙන කොටත්, ගරු අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ අපි කැලණියේ වැඩ කටයුතුවලට අත ගසා තිබෙනවා. ඒ අනුව දැන් එම වැඩ කටයුතු ආරම්භ වෙලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. ඒ වාගේම මෙවර අය වැයේදී පහළ මල්වතු ඔය ව්‍යාපාරය, යාන් ඔය ව්‍යාපාරය, කුඹුක්කන් ඔය ව්‍යාපාරය, හැඩඔය ව්‍යාපාරය, නිල්වලා ව්‍යාපාරය ආදී ව්‍යාපාර රාශියක් ආරම්භ කරන්නටත් අපි පියවරක් යෝජනා කරලා තිබෙනවා. ඒ අනුව ඉදිරි කාල පරිච්ඡේදය තුළදී මෙම වැඩ කටයුතු ආරම්භ කරන්න අපිට පුළුවන් වෙයි.

අතීතයේදී දිගින්-දිගටම දේශීය සංවිධානවලින් තොරව, අපේ වාරි නිලධාරින්ගේ සහභාගිත්වයත් නැතුව විදේශීය ආයතනවලට, විදේශීය කොන්ත්‍රාත් සමාගම්වලට අපේ රටේ විවිධ ඉදිකිරීම් භාර දීලා තිබුණා. ඒ හේතුවෙන් නිපුණතාවක් තිබෙන, දැනුම් සම්භාරයකින් සමන්විත වුණු අපේ නිලධාරින්ගෙන් වැඩක් නැතුව ගිහිල්ලා තිබෙනවා; පහසුකම් ගණනාවකින් සමන්විත වුණු, සම්පත්වලින් සමන්විත වුණු අපේ ආයතනවලින් වැඩක් නැතුව ගිහිල්ලා තිබෙනවා. හැබැයි, අපේ සැලැස්ම වනුයේ, ඉදිරි කාල පරිච්ඡේදයේදී ඒ සියලු දෙනාගේ දැනුම හා අපේ සම්පත් සියල්ල පාවිච්චි කරලා -අපේ නිලධාරින්ගේ, අපේ ශ්‍රමිකයන්ගේ දායකත්වය ඇතුව- මේ රටේ වැඩ කටයුතු වැඩි ප්‍රමාණයක් සිදු කිරීමයි. ගරු සභාපතිතුමනි, අපි පුත්තලම දිස්ත්‍රික්කයේ තවත් විශාල ව්‍යාපෘතියකට අත ගසා තිබෙනවා. මෙම කාරණය ඉතාම වැදගත්.

හංගේරියාවේ අයිපොලි ගංගාව හරස් කර ජලය හැරවීමේදී තමයි collapsible ගේට්ටු ක්‍රමය ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. මීටර 11ක දිගින් සමන්විත ගේට්ටුවක් තමයි අයිපොලි ගඟට සවි කරලා තිබෙන්නේ. අද අපේ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ සිටින දක්ෂ නිලධාරින්ගේ හැකියාව දැනුම ඉතාමත් මැනවින් පෙන්නුම් කරමින් ඔවුන් පුත්තලම් දිස්ත්‍රික්කයේ මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාදම්පේ දක්වා ජලය ගෙනඒම සඳහා යක්අමුණ ව්‍යාපාරය ආරම්භ කරන්නට දැන් වැඩ කටයුතු කරගෙන යනවා. අයිපොලි ගඟ හරස් කර ජලය හැරවූ ආකාරයට මීටර් 24ක් දිග collapsible ගේට්ටුවක් සහිත ව්‍යාපෘතියක් ලංකාවේ සකස් වෙන පළමු වතාව මෙයයි.

මමත්, ගරු ඇමතිතුමාත් බලාපොරොත්තු වෙනවා, අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මේ කටයුත්ත ලබන අවුරුද්දේ ජනතා අයිතියට පත් කරන්න පුළුවන් වෙයි කියා. මම ඔබතුමාට ස්තුති කරනවා, අවස්ථාව ලබාදීම ගැන. ඒ වාගේම මට වැඩිපුර විනාඩි දෙක තුනක් ලබාදීම පිළිබඳව නැවතත් ස්තුති කරමින් මම නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අනුරාධ ජයරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 6.14]

**ගරු අනුරාධ ජයරත්න මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுராத ஜயரத்ன - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne- Deputy Minister of Mahaweli Development and Environment)

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, අද මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයට ගන්නා අවස්ථාවේ මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව. මේ අය වැය පිළිබඳව කථා කරනකොට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හැටියට අපට ඒ පිළිබඳව සුබවාදී ලෙස සතුටු වියහැකියි. පසුගිය අය වැයේදී අපි ඉදිරිපත් කරපු තර්ක, කරුණු කාරණා අපට මේ අය වැයේදී නිවැරදි කර ගන්න පුළුවන්වීම තුළ අපට සතුටු වියහැකියි. විශේෂයෙන් අපි ඒ ගැන මුදල් අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ අය වැයේ තේමාව හැටියට එතුමා යොදාගෙන තිබෙන්නේ "නීල හරිත අය වැය" කියන තේමාවයි. ඒ තේමාව යටතේ තමයි 2018 අය වැය ඉදිරිපත් කරන්නේ.

පරිසර අමාත්‍යාංශය මූලික කරලා කථා කරනකොට ගරු සභාපතිතුමනි, ඔබතුමාම සභාපතිත්වය දරන තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ විශේෂ කාරක සභාව සිහියට නැගෙනවා. තිරසර ඉලක්ක 17 සම්පූර්ණ කිරීම සඳහා පමණක් නොවෙයි, පැරිස් ගිවිසුමට අනුව අපි විවිධ වූ කරුණු කාරණා සම්පූර්ණ කර ගත යුතුයි. මේ කියන කාරණාවලට විතරක් නොවෙයි, එතැනින් එහාට ගිහිල්ලා තිරසර වූ සංවර්ධනයක් රටට අත්පත් කර ගැනීම සඳහා මේ අය වැයට ඇතුළත් කළ යුතු කරුණු කාරණා රැසක් ඇතුළත් කරලා තියෙනවා කියන එකත් විශේෂයෙන් මේ අවස්ථාවේ සිහිපත් කරනවා. අපි දන්නා කාරණයක් තමයි අතිගරු ජනාධිපතිතුමා පරිසරය සහ මහවැලි විෂයයට නායකත්වය ලබා දෙන බව. පසුගිය අවුරුදු දෙකක කාලය ගත්තොත්, මහවැලිය හා පරිසරය කියන විෂය පද්ධති දෙකේ වැඩිම වැඩ කොටසක් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

විශේෂයෙන්ම මහවැලිය හරහා ජල කළමණාකරණය වෙනුවෙන් වැඩිම ව්‍යාපෘති ප්‍රමාණයක් ක්‍රියාත්මක කරන්නත්, ඒ වාගේම පරිසර අමාත්‍යාංශය හරහා පරිසරය ආරක්ෂා කිරීම වෙනුවෙන් ගත යුතු තීන්දු තීරණ, ක්‍රියාමාර්ග යන මේ සියලු දේවල් - විවිධ සමාගම් වේවා, විවිධ පුද්ගලයන් වේවා, විවිධ බාහිර බලපෑම් වේවා මේ සියල්ලක්ම යටපත් කරගෙන - හරියාකාරව ක්‍රියාත්මක කරන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. පරිසර අමාත්‍යාංශය භාර නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට යම් යම් කරුණු කාරණා ගැන විශේෂයෙන් කථා කළ යුතුයි කියා මා විශ්වාස කරනවා.

අපි දන්නවා, 2040 වෙනකොට ඛනිජ තෙල් භාවිත නොකර වාහන භාවිත කිරීමට රජයට අවශ්‍ය ප්‍රතිපත්තීන් හඳුන්වා දෙන්න අපේ මුදල් අමාත්‍යතුමා කටයුතු කරලා තිබෙන බව. මේ සඳහා බොහෝවිට 2025 වෙනකොට දෙමුහුං - hybrid - වාහන එහෙම නැත්නම්, ඉලෙක්ට්‍රික් වාහන පමණක් රජයේ වාහන සඳහා යොදා

ගන්නත් එතුමා යෝජනා කරලා තිබෙනවා. ඉතින් මේ කාරණා ගැන ඔබතුමාට, අපට සතුටු වෙන්න පුළුවන්. අපි දන්නවා, ඔබතුමා තිරසර ඉලක්ක 17 සම්පූර්ණ කර ගැනීම වෙනුවෙන් විශාල කැපවීමක් කරන බව. අද වෙනකොටත් ඔබතුමා ඒ වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටු කරන පුද්ගලයෙක්. ඔබතුමා දන්නවා, මේ අය වැයේ ඉදිරිපත් කරපු කාරණා අවුරුද්දකට දෙකකට පමණක් සීමා කරන්නේ නැතුව, තිරසාරව 2030 වෙනකොට මේ ඉලක්ක සම්පූර්ණ කිරීමයි තමයි අපේ අභිමතාර්ථය බවට පත් වෙන්නේ කියලා. ඒ කාරණා වෙනුවෙන් හරියාකාරව යොමු වෙන්න පුළුවන් වීම අපි ලබපු ජයග්‍රහණයක් කියා මා විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, අපි මේ කාරණා ඉදිරිපත් කළාට විතරක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. මේ කාරණා වෙනුවෙන් රජය හැටියට අපි ආරම්භයක් ලබාදිය යුතු වෙනවා. බොහෝ විට අපි විදුලිත් - electric - කාර් පිළිබඳව කථා කරනවා. නමුත් අපි මේ සඳහා ආරම්භය ලබා දෙන්නේ කොහෙන්ද? සමහර කණ්ඩායම් කියනවා, මේවා charge කරන්න charging stations නැහැ; ඒ නිසා අපි මේ කාර් ගෙනැල්ලා වැඩක් නැහැ කියනවා. කාර් තියෙන කණ්ඩායම් මේ දෙපැත්තට තර්ක කරනවා. රජයට හැටියට මේ කාරණා සම්බන්ධයෙන් ආරම්භයක් ලබාදිය යුතුයි. මේ කාරණා ගැන පරිසර හිතකාමීව හිතලා කටයුතු කරනවා නම්, රජයක් හැටියට මේවාට වියදම් කරලා, ඒවා ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කළ යුතුයි. අපි SLTB එක හරහා ඉලෙක්ට්‍රික් බස් රථ 50ක් යොදවන්න මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා.

බස් ප්‍රමාණය හැටියට ගත්තාම ඒක කුඩා ප්‍රමාණයක් වෙන්න පුළුවන්. හැබැයි, පරිසර විෂයයත් එක්ක, පරිසර අමාත්‍යාංශයත් එක්ක ගත්තාම අපි සතුටු වෙනවා. ඒ ආරම්භය තුළින් අපට හොඳ දිසාවකට, හොඳ තැනකට රට අරගෙන යන්න පුළුවන්කම ලැබෙනවා කියලා මම හිතනවා. ඒ වාගේ තත්ත්වයක් තමයි ත්‍රි රෝද රථ පිළිබඳව තිබෙන්නේත්. ත්‍රි රෝද රථ පිළිබඳව බැලුවොත්, අද වන විට විශේෂයෙන් කොළඹ සහ රට හැටියට ගත්තත් වැය වන වියදම් පිළිබඳ අපි බරපතළ අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. ත්‍රි රෝද රථ මිල වැඩි වෙනකොට විදුලිත් ත්‍රි රෝද රථ හඳුන්වා දීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා.

ලීසිං පහසුකම් ලබා දීමේදී ණය අනුපාතය 90:10 ලෙස සංශෝධනය කරන්නත් මුදල් අමාත්‍යතුමා කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේ තවත් එක් සුවිශේෂී කාරණාවක් තමයි කාබන් බද්දක් පැනවීම. අපි බොහෝ විට දන්න දෙයක් තමයි, වායු විමෝචනයත් එක්ක කථා කරනකොට සංසන්දනය කරලා මේ, මේ වාහන පරිසර හිතකාමී බවට පෙන්නුම් කරන්න බොහෝ දෙනෙක් කටයුතු කරන බව. මේ පිළිබඳ පරීක්ෂණ කරනකොට ඊට වැඩිය පහළ දුර්වල තත්ත්වයක තිබෙන්නේ කියලා අපි හඳුනා ගෙන තිබෙනවා. හැබැයි, මේවාට බදු අය කරන ක්‍රමවේදයක් රටේ නැහැ. වාහනයක සැප පහසුකම් හොඳ නම්, seats ටික හොඳට තිබෙනවා නම්, වාහනය හොඳට තිබෙනවා නම්, එන්ජින් ධාරිතාව හොඳ නම් අපි ඒවායින් බදු අය කරනවා. හැබැයි, පරිසරයට හානි වන, පරිසරයට නුසුදුසු ද්‍රව්‍ය අපේ රටට ආනයනය කරනවා නම්, ඒවාට අය කිරීම් කෙරෙන්නේ කොහොමද කියන එක පිළිබඳව අපි කථා කරන්නේ නැහැ. හැබැයි, මෙවර අය වැයෙන් එම කටයුත්ත වෙනස් කරලා තිබෙනවා. කාබන් පිළිබඳ බද්දක් පැනවීම තුළ අපට පරිසරය ආරක්ෂා කර ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම පරිසර විනාශකාරී ද්‍රව්‍ය එනවා නම්, වාහන වේවා; කුමක් හෝ වේවා ඒ අදාළ දෙයට බදු අය කරලා ඒවා පාලනය කිරීමේ ක්‍රමවේදයකුත් අපට මේ තුළින් නිර්මාණය කර ගැනීමේ හැකියාවක් තිබෙනවා. ඒත් එක්කම අපි පසුගිය කාලය පුරා පොලිතීන් තහනම පිළිබඳව දිගින් දිගටම කථා කළා. පොලිතීන් තහනම් කිරීම තුළින් අපට අවශ්‍ය වුණේ අපේ දේශීය කර්මාන්තකරුවන් විනාශ කිරීමට නොවෙයි. දේශීය වශයෙන් අපේ කණ්ඩායම් ටික ශක්තිමත් කරලා ඔවුන්ට හොඳ ඉදිරියක් ගොඩ නැඟීම තමයි රජයක් හැටියට අපේ බලාපොරොත්තුව බවට පත් වන්නේ. ඒ නිසා දිරාපත් වන ඇසුරුම් නිෂ්පාදනයට අවශ්‍ය මැෂින් සහ යන්ත්‍ර සූත්‍ර, අමු ද්‍රව්‍ය ගෙන්වීමේදී බදු අය නොකිරීමට මෙවර අය වැය හරහා ක්‍රියා කරලා තිබෙනවා.

මේ වන විට අතිගරු ජනාධිපතිතුමා ඊට අවශ්‍ය කරන කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කර, ඒ ක්ෂේත්‍රවල සිටින කණ්ඩායම්වලට පරිසර හිතකාමී ව්‍යාපාරවලට මාරුවීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීලා තිබෙනවා. අපි අමාත්‍යාංශය හැටියට විශේෂයෙන් පරිසර විෂය මූලික කරගෙන කථා කරනකොට මේ කරුණු කාරණා එක්ක සුබවාදී විධියට කටයුතු කිරීමට හැකිවීම ගැන සතුටු වෙනවා. මේ අවුරුද්ද ඇතුළත සියලු දේවල් සම්පූර්ණ කරන්න පුළුවන් කියන කාරණය නොවෙයි මම කියන්නේ. අපට අනාගත බලාපොරොත්තුවක් තියලා අපේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන්කම ලැබෙනවා කියන එකත් මෙතැනදී විශේෂයෙන් සිහිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, මේ අය වැයේ කාරණා මේ විධියට සකස් වෙනකොට අපි රට හැටියට කොහාටද යන්නේ, රට හැටියට අපි කොහොමද ඉදිරිය පිළිබඳ බලන්නේ කියන කාරණා පිළිබඳ මීට වැඩිය ගැඹුරින් අපි විශ්ලේෂණය කළ යුතුව තිබෙනවා. මොකද, අද බොහෝ දෙනෙක් අය වැය පිළිබඳ විශ්ලේෂණය කරන්නේ අය වැයේ තිබෙන සහන ප්‍රමාණය මතයි. හැබැයි, අය වැයක ඇතුළත් සහන ප්‍රමාණය වැඩි වූ පළියට ඒ අය වැය ඉතාම හොඳ අය වැයක් හැටියට අපට විග්‍රහ කරන්න පුළුවන්කමක් නැහැ. එහෙම අය වැයක් නොවෙයි අපි බලාපොරොත්තු වන්නේ. විශේෂයෙන් තරුණ දේශපාලනඥයෝ හැටියට අපට අවශ්‍ය කරන්නේ ඒක නොවෙයි. බෙදිල්ල වැඩි වෙච්ච තරමට අය වැය ඉතා හොඳයි කියලා කවුරු හෝ කියන්න උත්සාහ කරනවා නම්, ඒක නොවෙයි අපේ බලාපොරොත්තුව බවට පත් වන්නේ. තිරසර නිවැරදි සංවර්ධනයක්, ඒ වාගේම ජනතාව බලාපොරොත්තු වන ඉලක්කවලට යන්න පුළුවන් දීර්ඝ කාලීන විසඳුම් ලබා දෙන පැහැදිලි අය වැයක් තමයි අපේ බලාපොරොත්තුව බවට පත් වන්නේ. ඒකේදී අපි එක යෝජනාවක් විශේෂයෙන් සඳහන් කරනවා.

අපට අපේ භූමිය වාගේ විසිහය ගුණයක සාගර කලාපයක් අයිති වෙනවා. විසිහය ගුණයක සාගර කලාපය අපි ප්‍රයෝජනයට ගන්න ආකාරය පිළිබඳ මීට වැඩිය කල්පනා කළ යුතු වෙනවා. සාගර කලාපය පාවිච්චි කිරීම සඳහා රජයක් හැටියට අපි නීති සම්පාදනය කළ යුත්තේ කොහොමද කියන කාරණය සලකා බැලිය යුතු වෙනවා. සංචාරක කර්මාන්තයත් එක්ක මේ සාගරය උපයෝගී කරගෙන අපේ රටට තවත් විදේශ විනිමය ලැබෙන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අද බොහෝ දෙනෙකුට පුළුවන්කම තිබෙනවා. හැබැයි, අපි මේ සියලු දේවලට නීති දමාගෙන, සේවා සැපයීම මත අපේ ආර්ථිකය දියුණු කරන්න උත්සාහ කරනවා කියලා අපි බොහෝ විට විග්‍රහ කරනවා. ඒක තමයි අපේ ඉලක්ක බවට පත් වෙන්නේ. මේ වන විට අපි සපයන සේවාවලින් වැඩිම ආදායමක් ලබන්නේ සංචාරක කර්මාන්තයෙනුයි. අපි සංචාරක කර්මාන්තය දියුණු කිරීමට කටයුතු කරන විට දැනට පනවලා තිබෙන නීති රීති, මේ සියලු දේවල් එක්ක අපට මේ ගමන යන්න පුළුවන් කොච්චර දුරකටද කියන අර්බුදය, ගැටලුව අපට තිබෙනවා. විශේෂයෙන් අපි මේ කාරණය කියන්නේ වෙන මොනවත් නිසා නොවෙයි.

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මීපා ආයතනය ආදි ආයතන අපේ අමාත්‍යාංශය යටතට එන විට මේවායේ අවශ්‍ය

[ගරු අනුරාධ ජයරත්න මහතා]

සංශෝධනයන් කිරීම මඟින් සංචාරක කර්මාන්තය ඇතුළු සේවා සැපයීම් දියුණු කිරීමෙන් රටට අවශ්‍ය කරන විදේශ විනිමය වැඩි වැඩියෙන් උපයා ගැනීමේ හැකියාව අපට ලැබෙනවා.

ගරු සභාපතිතුමනි, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ අය වැය යටතේ යෝජනා ඉදිරිපත් කරමින් රුපියල් මිලියන 800ක පමණ මුදලක් ඉල්ලා තිබුණා දෙහිවල, රත්මලාන වෙරළ තීරය සංවර්ධනය කරන්න. දෙහිවල වෙරළ තීරය සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කාරණාවක්, ගරු සභාපතිතුමනි. මොකද, ප්‍රධාන අග නගරයත් එක්ක ඒ වෙරළ තීරය සංවර්ධනය කර ගත්තොත් තමයි සංචාරක කර්මාන්තය දියුණු කරන්න අපට පුළුවන්කම ලැබෙන්නේ. හැබැයි මෙහිදී වෙන් වූ මුදල් ප්‍රමාණය මදි. රුපියල් මිලියන 400ක් ගල්කිස්සේ සිට රත්මලාන දක්වා වෙරළ තීරය සංවර්ධනය කරන්න වෙන් කර තිබෙනවා. සමස්තයක් හැටියට රටේ වෙරළ තීරයේ අනෙක් සියලු ප්‍රමාණය සංවර්ධනය කිරීම සඳහා වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 800යි. මෙය ප්‍රායෝගික කාරණාවක් කියා මා විශ්වාස කරන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මුලසුන ගන්නවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ගරු සභාපතිතුමනි, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මුදල් වෙන් කිරීම් පිළිබඳව විශේෂයෙන් සිහිපත් කළේ, වෙරළ සංවර්ධනය කිරීම තුළ රටක් හැටියට ඉදිරියට යෑමට අපට ලොකු අවස්ථාවක් තිබෙන නිසායි. සංචාරක කර්මාන්තය ඇතුළු සියලු දේවල් සංවර්ධනය වෙන්න නම් වෙරළ සංවර්ධනය කිරීම එක්තරා විධියක අත්‍යවශ්‍ය කාරණාවක්. මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න කියා අපි අපේ මුදල් අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, රුපියල් මිලියන 12,000ක විතර මුදල් ප්‍රමාණයකින් සමස්ත සංවර්ධනයක් බලාපොරොත්තු වෙන්න අපට කිසිසේත් පුළුවන්කමක් නැහැ.

ගරු සභාපතිතුමනි, අප අබලි යකඩ ආනයනය කිරීම සඳහා 2015, 2016 අවුරුදුවල පනවා තිබූ සියයට 5ක බදු ප්‍රමාණය මෙවර සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබෙනවා. ඒ ඉවත් කිරීම තුළ අපට පරිසරය පිළිබඳව බරපතළ අර්බුදයක් පැන නඟිනවා. මොකද, අබලි යකඩ එකතු කිරීමේ කර්මාන්තය, ඒවා නැවත පාවිච්චි කිරීම, ප්‍රතිචක්‍රීකරණ වැඩ පිළිවෙළ ආදි සියලු කාරණා ඒ හරහා අඩ පණ වෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, පිට රටින් අබලි යකඩ ගෙන්වීමේදී පනවා තිබූ බදු ප්‍රමාණය නැවත පැනවීම හෝ ඊට අවශ්‍ය සංශෝධන කිරීම සුදුසු වනවා කියා. එහෙම නැති වුණොත්, දේශීය වශයෙන් සිටින කර්මාන්තකරුවන්ට ඒ තුළ බරපතළ අර්බුදයකට, ගැටලුවකට මුහුණ දෙන්න සිද්ධ වනවා කියන කාරණාව මෙහිදී විශේෂයෙන් සිහිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, අපි පොලිතීන් නිෂ්පාදනය සම්බන්ධයෙන් බදු පැනවීම කියන කාරණාව ගනිමු. මා අය වැය ලේඛනය කියවද්දී දැක්කා, පොලිතීන් කිලෝ එකකට රුපියල් 10ක ප්‍රමාණයක බදු පැනවීමක්. හැබැයි, පොලිතීන් කිලෝ එකකට රුපියල් 10ක බදු පැනවීම තුළ පොලිතීන් නිෂ්පාදන දුර්වල කරන්න අපි බලාපොරොත්තු වනවා නම් ඒ කටයුත්ත කොච්චර ප්‍රායෝගිකද කියන කාරණාව පිළිබඳව අපි කල්පනා කළ යුතු වෙනවා. කිලෝ එකකට රුපියල් 10ක් ලෙස පනවන බදු ප්‍රමාණය තුළින් පමණක් එකී අරමුණ ඉටු කරගන්න අපට බැහැ. ඒ නිසා මේ පිළිබඳව වෙනත් වූ විශේෂ සංශෝධනවලට යෑම සඳහා කටයුතු කරන්න අපට සිද්ධ වනවා කියන එකත් මෙහිදී සිහිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
හොඳයි ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, මහවැලි සංවර්ධන අමාත්‍යාංශය බාර අමාත්‍යතුමා හැටියට අතිගරු ජනාධිපතිතුමාගේ සිහිනයක් බඳුව තිබූ මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියේ වැඩ මේ වන විට සෑහෙන දුරට අවසන්. මොරගහකන්ද ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන්නත්, කළු ගඟ ව්‍යාපෘතිය ජනතා අයිතියට පත් කරන්නත් අපට පුළුවන්කම ලැබෙනවා. මොරගහකන්ද කළු ගඟ ව්‍යාපෘතිය නිම කර අපේ අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ හයිය, ශක්තිය තුළ ජනතා අයිතියට ලබා දෙනකොට, ගාමිණී දිසානායක මැතිතුමා ක්‍රියාත්මක කරපු - අවුරුදු 10ක් ඇතුළත ක්‍රියාත්මක කරපු- කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ අවසාන ව්‍යාපෘතිය බවට මෙය පත් වෙනවා. හැබැයි, මේ ව්‍යාපෘතිය අවසන් කරනකොට අප සිතා බැලිය යුතු කාරණාවක් තිබෙනවා. මේ රටේ කෘෂි කර්මාන්තය සඳහා මහවැලිය හරහා ගෙනැවිත් ලබා දෙන ජල ප්‍රමාණය අද කොතෙක් දුරට ප්‍රමාණවත්ද කියන ප්‍රශ්නය අපට පැන නැඟී තිබෙනවා. කුඹුරු වගා කරන ඉඩම් ප්‍රමාණය අඩු කිරීම පිළිබඳව අද අපේ ගරු මන්ත්‍රීතුමන්ලා බොහෝ තර්ක විතර්ක ගෙනාවා. හැබැයි, ප්‍රායෝගික වූ ක්‍රමවේදයකට යන්න අපට සිදු වෙනවා. හැම දාම අප මේ කාරණා පිළිබඳව වාද කරලා වැඩක් නැහැ. "අපට ජලය නැහැ. කුඹුරු ටික තිබෙනවා. වගා කරන්න ඕනෑ." කියමින් අපි දෙපැත්තට තර්ක කරකර ඉඳලා හරි යන්නේ නැහැ. එක්කෝ, ඒ වෙනුවට බෝග හඳුන්වා දීලා ඒ ගොවීන්ට වගාවේ අස්වැන්නෙන් ආදායමක් ගන්න පුළුවන් තත්ත්වයට පත් කරන්න ඕනෑ. එහෙම නැත්නම් තවත් දීර්ඝ කාලීන සැලසුමකට ගිහින් ඔවුන්ට ජලය ලබා දෙන ක්‍රමවේදයක් අප ක්‍රියාත්මක කළ යුතු වනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ කාරණා පිළිබඳව මීට වඩා අවධානය යොමු කරලා අපට කටයුතු කරන්න සිදු වෙනවා. ඊට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කළ යුතුව තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීතුමන්ලා විවිධ කාරණා ඉදිරිපත් කළා.

පෞද්ගලික වශයෙන් ඉදිරිපත් කළ ඒ කාරණාවලට -ගල් කොරියක් ගැන වෙන්න පුළුවන්, මැණික් පතලක් ගැන වෙන්න පුළුවන්, වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ ඒ කාරණාවලට - මෙතැනදී පිළිතුරු දෙන්න පුළුවන්කමක් නැහැ, ගරු සභාපතිතුමනි. හැබැයි අපේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මතක් කළා, කළුතර දිස්ත්‍රික්කයේ ලබුගල-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
වෙලාව අවසාන වෙමින් පවතිනවා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

**ගරු අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)
ගරු සභාපතිතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

කළුතර දිස්ත්‍රික්කයේ, ලබුගල ප්‍රදේශයේ අක්කර හතක ඉඩම් ප්‍රමාණයක භූගත ජල තටාකයක් ඉදි කිරීම සඳහා අවසර ලබා දී තිබෙන කාරණාවක් ගැන සහ ඇහැලියගොඩ ප්‍රදේශය පිළිබඳව දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කළා. හැබැයි මේ ඉඩම් ප්‍රමාණය ලබා දීලා තිබෙන්නේ නැවත පදිංචි කිරීම සඳහා. ඒ වාගේම රාජ්‍ය දැව සංස්ථාව මඟින් තමයි ඒ සියලු ගස් ඉවත් කිරීම සිදු කෙරෙන්නේ. කාරණා කිහිපයක් සඳහා මගේ ළඟ පිළිතුරු තිබෙනවා. නමුත් මම හිතන විධියට ඒ සියලු කාරණාවලට පිළිතුරු දෙන්න මෙය අවස්ථාවක් නොවෙයි. ඒ නිසා වෙන් වෙන් වශයෙන් ඔවුන්ට අවශ්‍ය කරන කාරණා ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා, ගරු සභාපතිතුමනි.

අපේ අමාත්‍යාංශය පිළිබඳව, අපේ අමාත්‍යාංශය කරන වැඩ පිළිවෙළ පිළිබඳව විවිධ මන්ත්‍රීතුමන්ලා අද අදහස් උදහස් ඉදිරිපත් කළා; යම් යම් තැන්වලදී අප විවේචනයට ලක් කළා; සමහර තැන්වලදී අපට හොඳ අදහස් ඉදිරිපත් කළා. ගරු සභාපතිතුමනි, ඒ සියලුදෙනාට අපි ස්තුතිවන්ත වෙනවා. මේ අමාත්‍යාංශය තවත් ශක්තිමත්ව ඉදිරියට ගෙන යන්න, අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අනෙකුත් අමාත්‍යාංශවලට ආදර්ශවත් අමාත්‍යාංශයක් බවට පත් කරන්න අවශ්‍ය සහයෝගය, උපදෙස් සියල්ල ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අතිරේක ලේකම්තුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු අපේ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 17ක සභාපතිතුමන්ලා ඇතුළු මේ සියලුදෙනාට - මම හිතන විධියට අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන්නේ බොහෝ විට ජනතාවත් එක්ක බැඳිලා වැඩ කරන ආයතන. ඒ නිසා අපට එන ප්‍රශ්න ප්‍රමාණය වැඩියි.- 2018 වර්ෂයේ පැමිණෙන ප්‍රශ්න සියල්ලටම සාර්ථකව මුහුණ දීලා, නිවැරදි තීන්දු තීරණ අරගෙන මේ ආයතන හරියාකාරව පවත්වාගෙන යන්න අවශ්‍ය ශක්තිය ලැබේවා!යි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා.

මීළඟට, ගරු දුමින්ද දිසානායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.30]

**ගරු දුමින්ද දිසානායක මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Duminda Dissanayake - Minister of Agriculture)
ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශයේත්, තවත් අමාත්‍යාංශ තුනකත් වැය ශීර්ෂ විවාදයේදී කෘෂිකර්ම අමාත්‍යාංශය සම්බන්ධව කථා කිරීමට ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා.

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ ඉන්න අති බහුතරයක් මන්ත්‍රීතුමන්ලා පසුගිය කාලයේ පැවැති ආණ්ඩුවල අය වැය ලේඛනත් දැකලා තිබෙනවා; ඒ වාගේම ඊට කලින් ආණ්ඩුවල අය වැය ලේඛනත් දැකලා තිබෙනවා. බඩු මිල අඩු වුණාම, තෙල් මිල අඩු වුණාම, ඒ අය වැය හොඳයි කියලා අපි කිව්වා; රටේ ජනතාවත් කිව්වා. රූපවාහිනීවලට ගිහිල්ලා, රේඩියෝවලට ගිහිල්ලා අපි කිව්වා, ඉතාමත් හොඳ අය වැයක් කියලා. හැබැයි මේ අය වැයට දැක්මක් තිබෙනවා; වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ වාගේම මේ අය වැය, මේ රටේ ජනතාවට අනාගත බලාපොරොත්තුවක් ඇති කර ගන්න පුළුවන් අය වැයක්. ඒ නිසා වෙන්න ඇති මම හිතන්නේ අපේ මුදල් ඇමතිතුමා ඒ ගැන කල්පනා කරලා, අය වැයට කලින් දිනයේ බඩු මිල අඩු කළේ. මොකද, අය වැයක් කියන්නේ බඩු මිල අඩු කිරීමයි කියන අදහස සාමාන්‍ය ජනතාවගේ ඔළුවෙන් අපි අයින් කළ යුතු වෙනවා. එහෙම නැතුව හැමදාමත් පත් වෙන ආණ්ඩු වාගේ අය වැයකින් ලැබෙන සහන ටික විධියට මොනවා හරි දේවල් ටිකක මිල අඩු කරනවා හැර, රට ඉස්සරහට යන වැඩ පිළිවෙළක් හැදුණේ නැත්නම්, ඒක මම හිතන්නේ ජාතික අපරාධයක් සහ ජාතික ව්‍යසනයක් බවට පත් වෙනවා. ඒ නිසා අපි මේ අය වැය පිළිබඳව ඉතාමත් හොඳින් මතක් කරන්න ඕනෑ, මේක දැක්මක් තිබෙන, අරමුණක් තිබෙන, බලාපොරොත්තුවක් තිබෙන අය වැයක් කියන කාරණාව.

ගරු සභාපතිතුමනි, කෘෂිකර්ම අමාත්‍යාංශය ගැන කියනවා නම්, පසුගිය වසර තුන තුළ අපි වැඩ කරලා තිබෙන්නේත් අනාගත බලාපොරොත්තුවක්, දැක්මක් එක්ක බව කියන්න ඕනෑ. අපේ තිබෙන ප්‍රශ්නවලට විසඳුම් හොයන වැඩසටහන් තමයි අපි මේ කෘෂිකර්ම අමාත්‍යාංශය තුළ කරලා තිබෙන්නේ. අනෙකුත් කාලවල වාගේ නොවෙයි, බඩු බෙදන එක සීමා කරලා තිබෙනවා; පෞද්ගලික ප්‍රතිලාභ ලබා දීම අපි සීමා කරලා තිබෙනවා. පුළුවන් තරම් දැක්මක්, වැඩ පිළිවෙළක් ඇතුව, ගොවියාගේ ආර්ථිකය, ගොවි පවුලේ ආර්ථිකය ශක්තිමත් කිරීමට තමයි අපි කටයුතු කළේ. ගොවි ජනතාව ශක්තිමත් කිරීම තුළ දෙකෝටියක් ජනතාවට කන්න ටික ලබා දෙන්න කටයුතු කළා. ඒ වාගේම ආනයනය කරන භෝග වර්ග හැකිතාක් දුරට අඩු කරලා, ඒවා රට තුළම නිෂ්පාදනය කර ගන්න කියන සංකල්පය තුළ තමයි කෘෂිකර්ම අමාත්‍යාංශය පසුගිය කාල සීමාව තුළ වැඩ කරලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, ඉස්සර වෙලාම කථාව පටන් ගන්න ඕනෑ වී වගාවෙන්. මොකද, වී වගාව ගැන බොහෝ කට්ටිය බොහෝ දේවල් කථා කළා. අපේ විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා සඳහන් කළා,- ඒ වාගේම ඒ හැමෝම නියඟය ගැනත් කථාබහ කළා. නියඟය ගැනත් කාරණා පිළිගන්නා ගමන්ම මේ රටේ සහල් නිෂ්පාදනය ගැන එක එක මන්ත්‍රීතුමන්ලා තමන්ට තේරෙන විධියට කරුණු පැහැදිලි කළා.

ගරු සභාපතිතුමනි, අපට පසුගිය කාලයේ -2015, 2016, 2017 වර්ෂයන්වල- ඇති වුණු නියඟය 1974 වර්ෂයේදී ලක් වූ නියඟය හා සමානයි. 1974 වසරේදී රටේ ජනතාවට කන්න දෙන්න හාල් සියයට 50ක් ආනයනය කරන්න සිදු වුණා. ඒ, අද වාගේ කෝටි දෙකක් ජනතාව ඉන්න කාලයක නොවෙයි. හැබැයි, අපේ කන්න තුනක් නියඟයට හසු වුණත් තවමත් ලංකාවට සහල් ආනයනය කරලා තිබෙන්නේ, මෙට්‍රික් ටොන් ලක්ෂ 4යි. ඒ කියන්නේ, ආනයනය කරලා තිබෙන්නේ මාස දෙකකට අවශ්‍ය කරන සහල් ප්‍රමාණයයි. එතකොට අපට 2015 යල කන්නයත්, 2015, 2016 මහ කන්නයත්, 2016 යල කන්නයත් කියන කන්න තුනෙන්, දෙකක් අපට ඉතාමත් සාර්ථක කන්න බවට පත් කර ගන්න පුළුවන්කම ලැබුණා. මේකට දේශගුණය බලපෑවා. ඒ වාගේම ගොවි ජනතාවගේ උනන්දුවීම් බලපෑවා. මේ සියල්ලම බලපාලා මේ රටට හොඳ නිෂ්පාදනයක් ඇති කර ගන්න පුළුවන්කම ලැබුණා.

[ගරු දුමින්ද දිසානායක මහතා]

2016 යල කන්නයත්, 2016, 2017 මහ කන්නයත්, 2017 යල කන්නයත් ගත්තාම, නියඟය දැඩිව බලපාලා අපේ නිෂ්පාදනය සියයට 50කින් අඩු වුණා. ගරු සභාපතිතුමනි, කන්න දෙකක් සාර්ථකවීමත් එක්ක අපට තවමත් මේ රටට සහල් ගෙන්වන්න ඕනෑ වෙලා තිබෙන්නේ, සහල් මෙට්‍රික් ටොන් ලක්ෂ 4යි. ඒ කියන්නේ, මාස දෙකක අවශ්‍යතාව පමණයි. මේ නියඟය පිළිබඳ කථා කිරීමත්, ඒ සම්බන්ධව කථා කරපු කාරණාත් නිසා මම ඒ ගැන විශේෂයෙන් සිහිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, අපි පසුගිය කාල සීමාවේ කෘෂිකර්ම අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කළේ, යම් අරමුණක් ඔස්සේ ගමන් කරන වැඩසටහනක්. මම හිතන්නේ, මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා වෙනදා වාගේ එතුමාට කරන්න බැරි වුණු ටික අද මේ ආණ්ඩුවේ ඇඟේ ගහලා තිබුණා. ඒ, බිත්තර වී නැති බව, අර්තාපල් බීජ නිෂ්පාදන වැඩ පිළිවෙළක් නැති බව, ලොකු ලූනු බීජ සම්බන්ධව, සහල් පිටරටින් ගෙන්වන බව. එතුමාගේ කාලයේදීත් සහල් නිෂ්පාදනය මේ රට තුළ තිබෙද්දිත් විශාල ප්‍රමාණයක් පිට රටින් ගෙන්වන්න කටයුතු කළා.

ගරු සභාපතිතුමනි, "බිත්තර වී නැහැ" කියන කාරණාවට අපි ඉතාමත් පැහැදිලිව යමක් මතක් කරන්න ඕනෑකම තිබෙනවා. මේ රටේ සාර්ථක මහ කන්නයක් සඳහා බිත්තර වී බුසල් ලක්ෂ 40ක් අවශ්‍ය වෙනවා. අපට මේ වෙනකොට බිත්තර වී බුසල් ලක්ෂ 37ක් රට තුළ තිබෙනවා. බිත්තර වී බුසල් ලක්ෂ තුනක හිඟයක් තිබුණා. අපි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විධියට, මේ වෙනකොට හිඟයක්ව පැවති බිත්තර වී බුසල් ලක්ෂ තුනත් මිලදී අරගෙන තිබෙනවා. ඉදිරියේදී වර්ෂාපතනය නිසි වෙලාවට ලැබුණොත්, ගොවීන්ට අවශ්‍ය කරන ඒ වගා භූමිය සශ්‍රීක කර ගන්න; වගා කරන්න අවශ්‍ය කරන බිත්තර වී ටික අපි ළඟ තිබෙනවා කියන එක අපි ඉතාමත් වගකීමෙන් ප්‍රකාශ කළ යුතු වෙනවා.

ගරු සභාපතිතුමනි, ඒත් එක්කම බීජ අර්තාපල් නිෂ්පාදනය ගැන කථා කළ යුතුයි. මේ රටේ අපි වර්ෂයකට මෙට්‍රික් ටොන් දෙලක්ෂ විසිදාහක් අර්තාපල් පරිභෝජනය සඳහා ගන්නවා. මෙම මෙට්‍රික් ටොන් දෙලක්ෂ විසිදාහෙන්, ලංකාවේ අපි නිෂ්පාදනය කරන්නේ මෙට්‍රික් ටොන් එක්ලක්ෂ දහදාහයි. ඒ කියන්නේ, අපි නිෂ්පාදනය කරන්නේ අපේ අවශ්‍යතාවෙන් හරියටම අඩක් පමණයි. නමුත්, අපි මේ ආණ්ඩුව ආවාට පසුව දැන් ඒ සඳහා සැලසුමක් හදලා තිබෙනවා. අර්තාපල් නිෂ්පාදනය සඳහා අවශ්‍ය කරන බීජ අර්තාපල් මෙට්‍රික් ටොන් 15,000න් 12,000ක් ම අපේ ගොවි මහත්තුරු වගාවට පාවිච්චි කළේ පරිභෝජනයට ගන්න අර්තාපල්. ඒ අර්තාපල් වගාවට පාවිච්චි කිරීමත් එක්ක, එක හෙක්ටයාර් එකකින් ටොන් 10යි අස්වැන්න ලැබුණේ. ඉතිරි 3,000න් දෙපාර්තමේන්තුව තුළ බීජ අර්තාපල් ටොන් 1,500ක් නිෂ්පාදනය වෙනවා; තවත් ටොන් 1,500ක් ආනයනය කරනවා. අපි සැලසුමක් හැදුවා, දැන් මේ රටේ පරිභෝජනයට අවශ්‍ය කරන අර්තාපල් මෙට්‍රික් ටොන් 220,000 රට තුළ නිෂ්පාදනය කර ගැනීම සම්බන්ධයෙන්. අපි අර්තාපල් වගා කරන ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 6,000යි. මේ හෙක්ටයාර් 6,000ක භූමි ප්‍රමාණය අපට වැඩි කරන්න පුළුවන්ද?

ගරු සභාපතිතුමනි අපට එය වැඩි කරන්න බැහැ. ඒකට හේතුව, මේ තිබෙන දේශගුණික කලාපයත් එක්ක අර්තාපල්වලට ගැළපෙන භූමිය තිබෙන්නේ හෙක්ටයාර් 6,000ක් පමණක් නිසා. එහෙමනම්, ඒ හෙක්ටයාර් 6,000 තුළ දැනට ලබා ගන්නා අර්තාපල් මෙට්‍රික් ටොන් 110,000ක අස්වැන්න අපි මෙට්‍රික් ටොන් 220,000 දක්වා වැඩි කර ගන්නේ කොහොමද? ඒ සඳහා මේ වන විට අපි G-zero ක්‍රමය යටතේ හරිතාගාර හදලා, ගොවි ජනතාව දැනුවත් කරලා මේ සියල්ල සැලසුම් කරලා තිබෙනවා. අපට දැන් පුළුවන්කමක් තිබෙනවා, හෙක්ටයාර් එකකින් ටොන් 20ක් ගන්න. ඒ නිසා 2019 වන විට G-zero බීජ අර්තාපල් ටොන් 7,500ක් නිෂ්පාදනය කර ගන්න අපට පුළුවන්කම තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ කියන්නේ එදා මෙට්‍රික් ටොන් 1,10,000ක් නිෂ්පාදනය කළ ගොවි මහත්වරුන්ට G-zero අර්තාපල් බීජ භාවිතා කිරීමත් එක්ක ඒ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,80,000 දක්වා වැඩි කර ගන්න පුළුවන්කම තිබෙනවා. මේ වන විට අපි හරිතාගාර හදලා ගොවි ජනතාව දැනුවත් කරලා ගොවි ජනතාවත් සමඟ තමයි මේ අර්තාපල් බීජ නිෂ්පාදනය කරන්න සැලසුම් කරලා තිබෙන්නේ. ලබන අවුරුද්දේ ජනවාරි මාසයේ අතිගරු ජනාධිපතිතුමාගේ සහ අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් එය විවෘත කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඉදිරි වර්ෂ කිහිපය තුළ අපි තවත් හෙක්ටෙයාරයක හරිතාගාරයක් හදලා, මේ වැඩ සටහන ක්‍රියාත්මක කළාම අපට හෙක්ටෙයාරයකින් ටොන් 20ක් ලබා ගන්න පුළුවන් අර්තාපල් බීජ රට තුළම නිෂ්පාදනය කර ගන්න පුළුවන්කම ලැබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම එළවලු බීජ ටික ඇතුළු මේ රටට අවශ්‍ය බීජ වර්ග ගෙන්වීමට මේ වන විට අපි විශාල මුදලක් වියදම් කරනවා. ඒ සඳහා වර්ෂයකට රුපියල් බිලියන 1.5කට ආසන්න මුදලක් රටින් එළියට යනවා. ගරු සභාපතිතුමනි, මේ රුපියල් බිලියන 1.5 අපි ක්‍රම ක්‍රමයෙන් අඩු කර ගන්නේ කොහොමද? ඒ සඳහා දැන් අපේ සැලැස්මක් තිබෙනවා. අපි ඉතිහාසයේ සංඛ්‍යාලේඛන අරගෙන බැලුවොත් බීජ ගෙන්වන්න වියදම් කර තිබෙන ප්‍රමාණය වර්ෂයෙන් වර්ෂයට වැඩිවෙලා තිබෙන බව පෙනෙනවා. අපේ වගාව වැඩි වෙනවාත් එක්කම බීජ ගෙන්වීමත් වැඩිවෙලා තිබෙනවා නම්, ඒ සඳහා රටින් එළියට යන ඒ මුදල ඉතිරි කර ගන්න නම් රට තුළ දෙමුහුන් බීජ නිෂ්පාදනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට තව විනාඩි පහක කාලයක් තිබෙනවා.

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)
හොඳයි, ගරු සභාපතිතුමනි.

ඒ වැඩසටහන යටතේ අපේ ගොවි මහත්වරුත් එක්ක, අපේ විද්‍යාඥයින් එක්ක, අපේ පර්යේෂණාගාර තුළ, අපේ ඉඩම් තුළ හැකිතාක් දුරට මේ බීජ නිෂ්පාදනය කර ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාට මතක ඇති, අපේ මහ ඉලුප්පල්ලම ගොවි පර්යේෂණායතනය බංග්ලාදේශයට විකුණුවාය කියා අපට එරෙහිව විශාල මඩ ප්‍රචාරයක් ගෙන ගිය බව. ගරු සභාපතිතුමනි, අපට අවශ්‍ය කරන්නේ රටෙන් එළියට යන රුපියල් බිලියන 1.5න් යම් මුදලක් රට තුළ තියා ගන්නයි. ඒ නිසා අපේ ගොවි මහත්වරුන්ගේ ආර්ථිකය ශක්තිමත් කරන්න, ඒ ගොවි මහත්වරුත් සමඟ මේ බීජ නිෂ්පාදන වැඩ පිළිවෙළට අපි මුල පුරලා තිබෙනවාය කියන කාරණාවත් අපි මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මට තව විනාඩි පහයි තිබෙනවා කිව්වේ. ඒ නිසා ඔබතුමාත් ඉන්න වෙලාවේ මම තව එක කාරණයක් මතක් කරන්න ඕනෑ. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අපට හිටපු තැනින් වෙනත් පෞද්ගලික තැනකට යන්න සිද්ධ වුණු නිසා පසු ගිය වසර දෙක තුළම විශාල මඩ ප්‍රචාරයන්ගෙන් කෘෂිකර්ම

අමාත්‍යාංශයත්, අමාත්‍යවරයා විධියට මමත්, මේ ආණ්ඩුවත් බැට කෑවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්න නිසා දන්නවා වෙනත් තැනකට යන්න ඕනෑ වුණේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ අපට නොවෙයි කියලා. මේ පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කාරක සභා පිහිටුවීම සඳහා ඔබතුමන්ලාට බිල්ඩිමක් අවශ්‍ය වුණා. අපේ අවාසනාවටද දන්නේ නැහැ, ඔබතුමන්ලා ඒ සඳහා තෝරා ගත්තේ කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් ගොඩනැඟිල්ලමයි. ඒ අවස්ථාවේ රටේ දියුණුවක් වෙනුවෙන් අපට බැහැයි කියන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපට අපේ භූමිය, අපේ ගොඩනැඟිල්ල දමලා වෙනත් තැනකට යන්න සිද්ධ වුණා, ගරු සභාපතිතුමනි. හැබැයි, ඒ සඳහා අපට යන්න තැනක් සොයන කොට අපට ඉතාමත් ආසන්නයේ තැනක් හම්බ වුණා. නමුත් අපි ඒ තැනට යන කොට ඒ ගොඩනැඟිල්ල සම්පූර්ණ අමාත්‍යාංශයකට අවශ්‍ය කරන විධියට සකසා ගැනීම සඳහා යම්කිසි කාලසීමාවක් ගත වුණා. ඒ ගත වුණු කාලසීමාව තුළත් අපි බැණුම් ඇහුවා. අපේ ගොඩනැඟිල්ල පාර්ලිමේන්තුවට දීලා පෞද්ගලික තැනකට ගිහිල්ලාත් අපි බැණුම් ඇහුවා. ඒ කෙසේ වෙතත් රටේ අභිවෘද්ධිය වෙනුවෙන් හොඳ වැඩක් කරන කොට කොතරම් අවලාද ඇහුවත්, කොතරම් බැණුම් ඇහුවත් රටේ අනාගත වැඩ පිළිවෙළක් එක්ක යන ගමනේදී අපි එකිනෙකාට සහයෝගය දක්වන්න අවශ්‍ය වෙනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය කාලයේ මම හැම තැනකම කිව්ව දෙයක් තමයි, මම පුංචි මෝඩ වැඩක් කර ගත්තාය කියන එක. ඒක තමයි, ගරු සභාපතිතුමනි, ඔබතුමා මගෙන් මේ බිල්ඩිම ඉල්ලන කොට, "ඔබතුමා බිල්ඩිමක් හදලා, මට අවශ්‍ය විධියට සියල්ලම සකස් කරලා යතුර දෙන දවසට මම යන්නම්" කිව්වා නම් මේ බැණුම් අහන්න වෙන්නේ මට නොවෙයි, ඔබතුමාටයි. හැබැයි, ඔබතුමා බේරිලා, මම බැණුම් ඇහුවා. ඒකට කමක් නැහැ, රටේ අනාගත වැඩසටහන් වෙනුවෙන් අපි ඒ සියල්ල අහන්න සූදානම්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මම ඉල්ලුවේ නැහැ, කැබිනට් මණ්ඩලයෙන් අපට දුන්නා. මම ඉල්ලුවේ නැහැ.

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)
නැහැ, පාර්ලිමේන්තුවේ සංවර්ධනය වෙනුවෙන්. ඔබතුමාට පෞද්ගලිකව නොවෙයි. පාර්ලිමේන්තුවේ දියුණුව වෙනුවෙන්.

ගරු සභාපතිතුමනි, උතුර නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා ඉල්ලීම් කිහිපයක් කර තිබෙනවා. රජයේ නිලධාරින් නැති බව, සංවර්ධනයට අවශ්‍ය කරන මුදල් නැති බව වැනි කාරණා කිහිපයක් එතුමන්ලා කියලා තිබෙනවා. අපි ඒ සියලු දෙනාටම මතක් කරන්න ඕනෑ පසු ගිය කාලය පුරාම නොකෙරුණු සංවර්ධනයක් තමයි ඒ අපේ මන්ත්‍රීතුමන්ලා ක්ෂණිකව බලාපොරොත්තු වන්නේ කියන එක.

නමුත් අපට ලැබෙන මුදල් ප්‍රමාණය අනුව තමයි ඒ පළාත්වලට, ඒ දිස්ත්‍රික්කවලට වෙන් කර තිබෙන්නේ. නමුත් අපට සතුටුවන්නට පුළුවන්කම තිබෙනවා, අද ඒ පළාත්වලත් දැනෙන සංවර්ධනයක් අපට කරන්නට පුළුවන්කම ලැබී තිබීම ගැන. ඒත් එක්කම සංවර්ධන වැඩ ගැන කථා කළොත් ගරු සභාපතිතුමනි, මේ වර්ෂය තුළ අපිට පුළුවන්කම ලැබුණා, නියං කාලය තුළ වතුර වැඩියෙන් රඳවා ගන්නට පුළුවන් වන ආකාරයට වැව් 1400ක ගැඹුර වැඩි කරන්න; ඒ වාගේම කෘෂි මාර්ග ටික මේ නියං කාලය තුළ සංවර්ධනය කර ගන්න. ඒ වාගේම නියඟය බල පෑ ගොවි මහත්වරුන්ට වගා ළිං 2000ක් හදා දී වගා ළිඳෙන් වතුර ටික අරගෙන වගා කර ඒ පවුල් ශක්තිමත් කරන්නට වැඩසටහන් ක්‍රියාත්මක කරන්නට අපට පුළුවන්කම ලැබුණා. ඊට අමතරව බීජ නිෂ්පාදනය, ගොවි කාන්තා සමිති පිහිටුවීම, ඒ වාගේම තුන්වන කන්නයක් පටන් ගැනීම වාගේ ගොවියාගේ ආර්ථිකය ශක්තිමත් කරන විශාල වැඩසටහන් ප්‍රමාණයක් අපිට පසු ගිය කාලය තුළ සූදානම් කරන්නට පමණක් නොවෙයි ක්‍රියාත්මක කරන්නට පුළුවන්කම ලැබුණා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම පළතුරු ගම්මාන වැඩසටහන යටතේ මේ වර්ෂය තුළ පළතුරු ගම්මාන 2000ක් අපි ඇති කර තිබෙනවා. මේවායේ ප්‍රතිඵල එන්නේ තව අවුරුදු කිහිපයක් තුළයි. ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශයට දැන් අලුත් මුහුණුවරකින් අලුත් ගමනක් යන්නට පුළුවන්කම ලැබී තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
වෙලාව අවසාන වෙනවා, ගරු ඇමතිතුමා.

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)
ගරු සභාපතිතුමනි, මම කථාව අවසන් කරන්නම්.

මේ කටයුතු සාර්ථක කර ගන්නට අපට සහයෝගය ලබා දුන් සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාට අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. අපි ඒ පළාත්වල සියලුම මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලීමක් කළා, තමන්ට අවශ්‍ය සංවර්ධන කටයුතු අපට දන්වා එවන්නටය කියා. කිහිප දෙනෙක් හැරෙන්නට සියලු දෙනාගේම සහයෝගය අපිට ලැබුණා. ඒ සියලු දෙනාටම අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපේ ලේකම්තුමා, රාජ්‍ය අමාත්‍ය ලේකම්තුමා, අපේ ආයතන සියල්ලේම සභාපතිතුමන්ලා, අධ්‍යක්ෂතුමන්ලා, ඒ වාගේම අපේ කාර්යාලවල වැඩ කරන උසස්ම තනතුරේ සිට පුංචිම තනතුර දක්වා සිටින සියලුම දෙනා අද එක පවුලක් විධියට කෘෂිකර්ම අමාත්‍යාංශයේ කටයුතු කරමින් රටේ අභිවෘද්ධිය වෙනුවෙන් වැඩ කටයුතු කරමින් යනවා. ඒ සියලු දෙනාටත් මගේ ස්තුතිය පුද කරනවා.

අද පාර්ලිමේන්තුවේ යම් විවේචනයක් කළා නම්, හොඳක් කිව්වා නම් ඒ සියලු දෙනාටත් අපි ආරාධනා කරනවා, අපේ කෘෂිකර්ම වැඩසටහන් එක්ක අත්වැල් බැඳගන්න කියා. අවසාන වශයෙන් රටේ ඉන්න සියලුම ජනතාවගෙන් මම ඉල්ලීමක් කරනවා, තමන්ගේ නිවසේ පැළයක් සිටුවන්න පටන් ගන්න කියා. මල් පැළයක් වෙනුවට ආහාර භෝගයක් සිටුවා මේ වගා සංග්‍රාමයේදී අපිත් එක්ක අත්වැල් බැඳගන්න කියන ආරාධනාව කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමා. ඊළඟට ගරු දයා ගමගේ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

[අ.භා. 6.45]

**ගරු දයා ගමගේ මහතා (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயா கமகே - ஆரம்பக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Primary Industries)
ගරු සභාපතිතුමනි, 2018 වසරේ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂ වෙනුවෙන් කථා කිරීමට ලැබීම ගැන

[ගරු දයා ගමගේ මහතා]

මම සතුටු වෙනවා. ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය පටන් ගෙන වසර දෙකක් අවසානයේ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය තුළින් රටේ ආර්ථික ඵලදාව උදෙසා දැවැන්ත අත්තිවාරමක් දැමීමට අවශ්‍ය කරන සැලසුම් නිසියාකාරව සකස් කිරීමට ලැබීම ගැන මම හුඟක් සතුටු වෙනවා.

හෙළ රජ දවස ඇරඹී වැවයි දාගැබයි සංකල්පය තුළ ගොඩ නැඟූ වැව් පද්ධතිය තුළින් පරාක්‍රමබාහු රජතුමා රට සහලින් ස්වයංපෝෂිත කර සහල් පිට රට යැවූ ඉතිහාසය ගැන අපි කොතෙක් කථා කළත් අද අපට අවශ්‍ය කරන ආහාර ටික අපේ රට තුළ නිෂ්පාදනය කරන්නට නොහැකි වීම ගැන ආණ්ඩු පක්ෂයේ ඉන්න අපිත් ආණ්ඩු කරපු විරුද්ධ පක්ෂයේ ඉන්න උදවියත් අපි දෙගොල්ලන්ම එකතු වෙලා කනගාටු වෙන්න ඕනෑ කියා මම විශ්වාස කරනවා.

අපි එක් එක්කෙනාට ඇඟිල්ල දික් කර ගනිමින් මේ වැරැද්ද, මේ වැරැද්ද කළාය කියනවාට වඩා අපි සැලසුම් සකස් කරන්නට ඕනෑ, අපේ අපනයන ආදායම වැඩි කර ගන්න. අපේ ආනයන වියදම හැටියට රුපියල් බිලියන 300ක් විතර අපි ආහාර පිට රටින් ගෙන්වීමට වියදම් කරනවා. අතිගරු ජනාධිපතිතුමා 2015 අවුරුද්දේ විශාල වැඩ පිළිවෙළක් සකස් කළා. ඒ වැඩ පිළිවෙළ තුළින් 2016 වර්ෂය වෙනකොට පිට රටින් ගෙනෙන ආහාර ද්‍රව්‍යවලට වියදම් කළ මුදල අපිට ඩොලර් මිලියන 140කින්- රුපියල් බිලියන 20කින්- පමණ අඩු කර ගන්න පුළුවන් වීම ගැන මම සතුටු වෙනවා. නමුත් අවාසනාවකට වාගේ 2017 වර්ෂය වෙනකොට අපට බලපාන්නට සිද්ධ වුණු නියඟය හා ගංවතුර හේතුකොටගෙන අපේ රට තුළ ආහාර නිෂ්පාදනය විශාල වශයෙන් අඩු වුණා. එම නිසා මේ දවස්වල අපට බැණුම් අහන්න සිද්ධ වෙනවා. මොකද, හාල් මිල වැඩි වුණා. ඒ වාගේම අද අපේ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් පොල් ගැන හැම අවස්ථාවකම කථා කරනවා. හාල්, පොල් කියන භාණ්ඩවල මිල වැඩි වෙන්න ප්‍රධාන හේතුව වුණේ විශාල වශයෙන් ඇතිවුණු පැවිල්ලයි.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම අපේ අමාත්‍යාංශය යටතේ කර ගෙන යන වැඩ පිළිවෙළ ගැන මම කථා කරන්නට බලපොරොත්තු වෙනවා. අපේ අපනයන ආදායම වැඩි කර ගත්තේ නැත්නම් අපිට කවදාවත් රාජපක්ෂ ආණ්ඩුව අරගෙන තිබෙන මේ ණය කන්දරාව ගෙවා අවසන් කරන්නට පුළුවන් වෙන්නේ නැහැ. 2005 වර්ෂය ගැන අපි නැවත වතාවක් බැලුවොත් 2005 වර්ෂයේදී අපේ ආර්ථිකයෙන් සියයට 38 ක් අපි අපනයන ආදායම තුළින් ලබා ගත්තා.

නමුත්, ඒ ප්‍රමාණය 2014 වර්ෂය අවසන් වනකොට සියයට 14ක් තරම් පහළට කඩා ගෙන වැටුණා. අද රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ එකම අභිප්‍රාය වෙලා තිබෙන්නේ අපේ අපනයන ආදායම අපේ රටේ ආර්ථිකයෙන් අඩුම වශයෙන් සියයට 50ක් දක්වා වැඩි කරන්නයි. බ්‍රිතාන්‍යයන්ට අපි කොපමණ බැන්නත්, ඇඟලුම් කර්මාන්තයට අමතරව අද අපි විශාල අපනයන ආදායමක් ලබා ගන්නේ ඒ රටවලට යවන තේ වලින්, රබර්වලින්, පොල්වලින්.

ගරු සභාපතිතුමනි, ඇඟලුම්වලට පස්සේ කෘෂිකර්ම ආදායමේ පළමුවෙනි ස්ථානයට අපේ කුළු බඩු ගෙනෙන්න මා බලාපොරොත්තු වනවා. මේ සඳහා අපි විශාල වැඩ පිළිවෙළක් අද සකස් කරලා තිබෙනවා. අවාසනාවකට වාගේ මේ දිනවල ලෝක වෙළෙඳ පොළේ ගම්මිරිස් මිල එක පාරටම අඩු වුණා. ගම්මිරිස් මිල තාවකාලිකව අඩු වුණත්, ඒකටත් සුදුසු වැඩ පිළිවෙළක් සකස් කරන්න අපි සැලසුම් කරලා තිබෙනවා. භාණ්ඩාගාරයෙනුත් රුපියල් මිලියන 600ක් ඒ වෙනුවෙන් වෙන් කර ගන්න මට පුළුවන් වුණත්, ඊට අවශ්‍ය මගේ අමාත්‍යාංශය යටතේ ආයතනයක් නැතිකම නිසා ඒක කර ගන්න බැරි වීම ගැන මා කනගාටු වනවා. නමුත් ඒ සඳහා තිබුණු පරණ ආයතනයක් නැවත පිහිටුවීම සඳහා අවශ්‍ය ගැසට් නිවේදනය නිකුත් කරන්න අවශ්‍ය කටයුතු මේ වනකොට ජනාධිපතිතුමා විසින් සකස් කරලා තිබෙනවා. ගම්මිරිස් ගොවීන් බලාපොරොත්තු වුණු සහනය ඒ ආයතනය තුළින් ලබා දෙන්න මා බලාපොරොත්තු වනවා.

කුරුඳු අපනයනය ගත්තොත්, ඒ තුළින් ඩොලර් මිලියන 169ක ආදායමක් අපි බලාපොරොත්තු වනවා. අපි දැනට කුරුඳු අපනයනය කරන්නේ රටවල් 13ට පමණයි. නමුත්, රටවල් 100ක් දක්වා හෝ අපේ කුරුඳු අපනයනය වැඩි කරන්න ඕනෑ. අපට GSP Plus බදු සහනය ලැබිලා යුරෝපයේ මිලියන 700ක වෙළෙඳ පොළක් අපට විවෘත වුණත්, කුරුඳු යුරෝපයට යවන්න පුළුවන් විධියට කුරුඳු සකස් කිරීමේ කර්මාන්තශාලා අපට නැහැ. එම නිසා අද අපි කෘෂිකර්ම ක්ෂේත්‍රය නවීකරණය කරන වැඩසටහන තුළින් අපි ඒ කර්මාන්තශාලාවලට උදවු කරන්න විශාල වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. ඒ වාගේම අපි කුරුඳු සැකසුම්කරුවන් 10,000ක් පුහුණු කරලා ඒ අයට සහතිකයක් ලබා දීලා, ඒ අය තුළින් වෙළෙඳ පොළට සුදුසු තත්ත්වයේ හොඳ කුරුඳු නිෂ්පාදනයක් කරන්නත් බලාපොරොත්තු වනවා. අපේ කුරුඳු අස්වැන්න වැඩි කිරීමත් එක්ක කුරුඳු පිට රට යවා අගයදාමය වැඩි කිරීම තුළින් ඩොලර් මිලියන 500ක් දක්වා අපේ අපනයන ආදායම වැඩි කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම, කුරුඳුවල ඖෂධීය ගුණය තවම අපට වෙළෙඳ පොළට හඳුන්වා දෙන්න බැරි වෙලා තිබෙනවා. අපි විශ්වවිද්‍යාල පහක් එක්ක එකතු වෙලා මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කරන්න රුපියල් මිලියන 142ක් වෙන් කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාට තව විනාඩි තුනක් තිබෙනවා.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
ගරු සභාපතිතුමනි, කුරුඳුවල ඖෂධීය ගුණය සම්බන්ධයෙන් පරීක්ෂණ කරලා ඒ තුළින් අගයදාමය වැඩි කරලා තවත් ඩොලර් මිලියන 500ක විදේශ විනිමය ප්‍රමාණයක් අපේ රටට එකතු කරන්න අපි බලාපොරොත්තු වනවා.

ඊයේ මම කුළු බඩු ආශ්‍රිත පැළ තවාන්කරුවන් ඔක්කෝටම කථා කළා. එම අවස්ථාවේ ඔවුන්ගේ ප්‍රශ්න ගොඩක් අපට කිව්වා. අද එක පැත්තකින් අපි පරිසරය ආරක්ෂා කරන්න ඕනෑ. අද පරිසර අමාත්‍යාංශයට හොඳ ලේකම්වරයෙක් ඉන්නවා. ඒ තමයි, අනුර දිසානායක මැතිතුමා. එතුමාත් සමඟ එකතු වෙලා මේ වැඩ කටයුත්ත කරන්න පුළුවන් වෙයි කියලා මා හිතනවා. අද අපේ සංවර්ධන වැඩ පිළිවෙළට විශාල වශයෙන් අපේ නීති හරස් කර ගෙන සමහර නිලධාරින් ඒ වැඩපිළිවෙළ කඩාකප්පල් කරන තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. කොටින්ම කිව්වොත් පැළ තවාන්කරුවන් කිව්වා, ඔවුන්ට පැළ තවාන් කරන්න අවශ්‍ය පස් ටිකවත් ඒ ස්ථානවලට ගෙනෙන්න පුළුවන්කමක් නැහැ කියලා. මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු සපයා ගත්තේ නැත්නම්, අපි බලාපොරොත්තු වන තැනට රට ගෙන යන්න පුළුවන් වන්නේ නැහැ. ඒ නිසා පරිසර අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරුන්ගෙන් මා ඉල්ලීමක් කරනවා, මේ රටේ සංවර්ධන වැඩ පිළිවෙළට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා. ජනාධිපතිතුමා තමයි පරිසර ඇමතිවරයා හැටියට කටයුතු කරන්නේ. එතුමාට වෙලාවක් නැහැ, මේ හැම දෙයක්ම බලන්න; කරන්න.

ඒ නිසා නිලධාරි මහත්වරු ඒ ගැන කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා. තවාන්වල නිෂ්පාදනය කරන පැළ ප්‍රමාණය වැඩි කළේ නැත්නම්, අපි බලාපොරොත්තු වන පරිදි අස්වැන්න ලබාගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මේ රට තුළ කවදාවත් නිෂ්පාදනය කළේ නැති තරම් පැළ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි පටන් අරගෙන තිබෙන ව්‍යාපෘතියක් හරහා ටීජේසී නමැති අඹ ප්‍රභේදය ව්‍යාප්ත කිරීම සඳහා කටයුතු කරනවා. ඒ මඟින් ලබන අවුරුද්ද තුළ පැළ ලක්ෂ 25ක් නිෂ්පාදනය කර නොමිලේ බෙදා හරින්න අපි බලාපොරොත්තු වෙනවා. "ධනසවිය" ජාතික වැඩසටහන තුළින් අපි ඒ සියලු පැළ දිරිය කාන්තාවන් දසලක්ෂයකට ලබා දෙනවා.

අන්නාසි අගයදාම ව්‍යාපෘතිය තුළින් අපි ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක ආදායමක් අපි බලාපොරොත්තු වෙනවා. කටු අනෝදාවල පිළිකා රෝගය මඩින ඒ ඖෂධීය ගුණය තිබෙනවා. අපි කටු අනෝදාවලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක ආදායමක් බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, ස්ට්‍රෝබෙරිවලටත් ලෝකයේ හොඳ ඉල්ලුමක් තිබෙනවා. ඒ මඟින් අපි ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක් බලාපොරොත්තු වෙනවා. කෙසෙල්වල අගයදාමය වැඩි කිරීම තුළින් අපි ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක ආදායමක් බලාපොරොත්තු වෙනවා. පැපොල් සහ තවත් පළතුරු කිහිපයක අගයදාමය වැඩි කර ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක ආදායමක් ලබාගන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාට වෙන් කළ කාලය අවසන් වෙමින් පවතිනවා.

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, 1980 ගණන්වල ෆෙස්ටස් පෙරේරා මැතිතුමා ඇමතිවරයා වශයෙන් ඉන්නකොට දයා සමූහ ව්‍යාපාරය තමයි මුලින්ම හලාවත ඉස්සන් බෝ කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළේ. එදා එක්සත් ජාතික පක්ෂ රජයක් යටතේ තමයි ඉස්සන් බෝ කිරීමේ ව්‍යාපෘතිය පටන් ගත්තේ. ඒක ඉතාම දියුණු තත්ත්වයට පත් වුණා. නමුත්, පසු ගිය ආණ්ඩුව වැරදි විධියට, එක එක්කෙනාට අවශ්‍ය විධියට, හැම තැනකටම ඉස්සන් පොකුණු ලබාදීම නිසා ඒවා ලෙඩ රෝගවලින් විනාශ වුණා. අපි ඉස්සන් වගාකරුවන්ට උදව් කරලා, ඒ මඟින් අවුරුදු දෙකක් ඇතුළත ඇමෙරිකානු ඩොලර් මිලියන 200කින් අපනයන ආදායම වැඩි කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ඉස්සෝ, බෙල්ලන්, මුහුදු කුඩැල්ලන්, sea bass, තිලාපියා වගා කර ඒවා අපනයනයෙන් ඉදිරි අවුරුදු පහ තුළ අපට ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500ක් ලබාගන්න පුළුවන්.

මේ ආකාරයටම මී මැසි පාලන වැඩසටහන්, මිරිදිය මත්ස්‍ය අගයදාමය, බිම්මල් වගාව, මල් වගාව වාගේ ඒවා තුළිනුත් අඩුම වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 3,000ක පමණ අපනයන ආදායමක් එකතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.විශේෂයෙන්ම මේ අවස්ථාවේ විරුද්ධ පක්ෂයේ සිටින සෑම මන්ත්‍රීවරයෙකු විසින්ම ඉදිරිපත් කළ කරුණු අපි සැලකිල්ලට ගත්තා. අපේ තිබෙන වැරදි හදාගෙන අපි ඉදිරියට යනවා.

මගේ අමාත්‍යාංශයේ ලේකම් බන්දු වික්‍රමාරච්චි මැතිතුමාට, අතිරේක ලේකම්තුමිය සහ අනෙකුත් කාර්ය මණ්ඩලයට, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ එහි සියලු කාර්ය මණ්ඩලයට මේ අවස්ථාවේ මගේ ගෞරවනීය ස්තුතිය පුද කරන අතර, අපේ මෙම ව්‍යාපෘතිය 2018 අවුරුද්දේ ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ සහයෝගය බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මීළඟට, ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා අමාත්‍යතුමා.

[අ.භා. 6.57]

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා (වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Irrigation and Water Resources Management)
ගරු සභාපතිතුමනි, ඔබතුමා මූලාසනයේ සිටියදී කෘෂිකර්ම අමාත්‍යාංශය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය යන අමාත්‍යාංශ හතර ගැන කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා.

අද උදේ රුපියල් 10කින් මේ වැය ශීර්ෂවල cut එක move කරලා මෙම විවාදය ආරම්භ කළා. ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු, වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරු ඉතාම වැදගත් අදහස්, විවේචන සහ සාධනීය කාරණා විශාල ප්‍රමාණයක් අපට ඉදිරිපත් කළා. ඒ පිළිබඳව අපි ඒ සියලුදෙනාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මාත් මගේ නිලධාරි මණ්ඩලයත් එයින් වැදගත් කරුණු රාශියක් සටහන් කර ගත්තා.

විශේෂයෙන්ම අපේ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය ඊයේ දවසේ පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරලා ඔවුන්ගේ යෝජනා, අදහස් සහ අපට තිබෙන චෝදනා පිළිබඳව සාකච්ඡා කළා. සාකච්ඡා කරලා, එහිදී මතුවුණු කරුණු පිළිබඳ සියලු දේ සටහන් කරගත්තා.

2018 අවුරුද්දේ අපි මේ රටේ ගොවි ජනතාවගේ අවශ්‍යතා සම්පූර්ණ කරන්නේ කොහොමද කියන කරුණු ගැන ඉතා මැනවින් සාකච්ඡා කළා. අද මේ කථාවෙන් පසු ඒ කටයුතු අවසන් වෙනවා.

ගරු සභාපතිතුමනි, රටට නායකත්වය දෙනවා වාගේම, කැබිනට් මණ්ඩලයට නායකත්වය දෙනවා වාගේම, මේ අමාත්‍යාංශ කීපයටත් නායකත්වය දෙන අපේ අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ගැනත් මම කෙටියෙන් යමක් කිව යුතුයි. රෝමයේ සින්සිනාටස් ගැන අප දන්නවා. සින්සිනාටස් රෝම අධිරාජයා ලෙස රජ මාළිගාවට ගියේ උදැල්ලයි නඟුලයි අරගෙනයි. ඒ වාගේම ඔහු ඔහුගේ කාර්යභාරය ඉටු කරලා, රෝමයේ ජනතාවගේ හඬා වැළපීම් සහ දුක්ඛ දෝමනස්ස මධ්‍යයේ තමයි නැවත ගොවි බිමට ගියේ. ඒ වාගේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් පරාක්‍රම සමුද්‍රයේ අක්කර හතරක බිම් තීරුවක ගොවියකුගේ පුතෙක් හැටියට, ග්‍රාම නිලධාරිවරයෙක් හැටියට රාජ්‍ය සේවයේ කටයුතු කරලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ

[ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා]

ලේකම්වරයා හැටියට දීර්ඝ කාලයක් වැඩ කරලා, පොදු අපේක්ෂකයා හැටියට ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙලා මේ රටේ ජනාධිපති පදවියට පත් වුණා. එතුමා සාමාන්‍ය පවුලකින් පැවත එන, නිර්ධන පන්තියේ නායකයෙක්. දෙවැනි රාජසිංහ රජ්ජුරුවන්ගෙන් පසුව නියම සිංහල බෞද්ධ ගොවි නායකයෙක් මේ රටේ ජනාධිපති පදවියට පත් වුණා නම්, ඒ ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාය කියන කාරණය මම මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ සංස්කෘතිය බැඳී තිබෙන්නේ වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි එක්කයි. ගාමිණී දිසානායක මැතිතුමා ඒ සංකල්පය තුළ ඉඳගෙන මේ රටේ විශාල වැඩ කොටසක් කළා. ඒ පිළිබඳව එතුමාට අපේ ගෞරවය හැම දාමත් තිබෙනවා. නමුත් එතුමාට අමතක වුණු දෙයක් තමයි වනය. වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි, වනයයි කියන මේ සියල්ල ඒකාබද්ධ කරලා, මේ අමාත්‍යාංශ හරහා රටේ තිරසර සංවර්ධනයක් ඇති කරන්න අද අපේ අතිගරු ජනාධිපතිතුමා කටයුතු කරගෙන යනවා. එතුමා අපට නායකත්වය දෙනවා; උපදෙස් දෙනවා; මඟ පෙන්වනවා. භූමියේ අයිතිය, ජලයේ අයිතිය ගොවි ජනතාවට ලබාදෙන්න, දිළිඳුකම පිටුදකින්න, වකුගඩු රෝගය නිවාරණය සඳහා පානීය ජලය ලබාදීම සඳහා එතුමා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබෙනවා. ගරු සභාපතිතුමනි, සා පිපාසාවෙන්, කුසගින්නෙන් පෙළුණු මේ රටේ ජනතාව වෙනුවෙන් එතුමා විශාල වැඩ කොටසක් කළා. වකුගඩු රෝගයෙන් එකා පිට එකා මැරී වැටුණු තත්ත්වයක් මේ රටේ උදා වෙලා තිබුණා. තව පැත්තකින් පිළිකා රෝගය. මේ වාගේ බෝ නොවන රෝග සහ බෝ වන රෝග පැතිරිලා මහා භයානක ව්‍යසනයකට මේ රට මුහුණ දී තිබුණා. ඒ ව්‍යසනවලින් මේ රට බේරා ගන්න හිටපු සෞඛ්‍ය ඇමතිවරයා හැටියට එතුමා විශාල වැඩ කොටසක් කළා.

අද මේ රටේ වාරි කර්මාන්ත රාශියක් ආරම්භ කර තිබෙනවා. ඉන් එකක් තමයි මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය. එම ජල ව්‍යාපෘතියේ වැඩ අවසන් වෙලා, දැන් අවසාන අදියරේ තිබෙන්නේ. එම ව්‍යාපෘතිය නිසා නිවාස අහිමි වූ ජනතාවට ඉඩම් ලබා දීලා, ජලය ලබාදෙන අවස්ථාවට දැන් ඇවිල්ලා තිබෙනවා. පසුගිය රජය කාලයේ යාන් ඔය ව්‍යාපෘතිය ආරම්භ කළා. නමුත් එහි සම්පූර්ණ වියදම කළේ -ඒ ගොවි ජනතාවට වන්දි ලබා දුන්නේ, ඔවුන්ට මඟ පෙන්වීම කළේ- අපේ ජනාධිපතිතුමාගේ මඟ පෙන්වීමෙන් වර්තමාන රජයේ වාරිමාර්ග අමාත්‍යාංශයයි. ඊළඟට, බදුල්ල දිස්ත්‍රික්කයේ මොරාණ ජල ව්‍යාපෘතිය, අම්පාර දිසත්‍රික්කයේ කළුගල්ඔය ව්‍යාපෘතිය, උමා ඔය ඉහළ කොටස සහ පහළ කොටස ජල ව්‍යාපෘතිවල වැඩ කටයුතු දැනට කෙරීගෙන යනවා.

ගරු සභාපතිතුමනි, කුඹුක්කන් ඔය හා හැඩඔය ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා අද දිනයේ අප ගිවිසුම් අත්සන් කළා. මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවගේ අක්කර 13,000කට කන්න දෙක වගා කරන්න ජලය සපයන්නත්, එම දිස්ත්‍රික්කයේ තුනෙන් දෙකක පිරිසකට පානීය ජලය ලබාදෙන්නත්, විශේෂයෙන්ම ජාතික විදුලිබල පද්ධතියට විදුලි බල ධාරිතාවක් එකතු කිරීම සඳහාත් අප කුඹුක්කන් ඔය ව්‍යාපාරය ආරම්භ කළා. හැඩ ඔය ව්‍යාපෘතියෙනුත් අක්කර 15,000ක වගා කටයුතු සඳහා ජලය සපයන්න අප බලාපොරෙත්තු වෙනවා. ඊළඟට මොනරාගල දිස්ත්‍රික්කයේ උස්සාන වාරි මාර්ගවලින් අක්කර 5,000කට ජලය ලබාදෙන්නත් අප බලාපොරොත්තු වෙනවා.

අරුගම්බේ කියන්නේ අද ලෝකය පිළිගන්නා හොඳම සංචාරක පුරයක්. Surfingවලට ලෝකයේ තිබෙන හොඳම ස්ථානය තමයි අරුගම්බේ. නමුත් අරුගම්බේ ප්‍රදේශයට අද පානීය ජලය නැහැ. එම ප්‍රදේශයේ සිටින සිංහල, දමිළ, මුස්ලිම් ජනතාවට පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘතියක් අප දැනට ක්‍රියාත්මක කරගෙන යනවා.

ගරු සභාපතිතුමනි, අපට වැව් අමුණු 340ක් තිබෙනවා. අක්කර 780,900ක් අපේ වපසරියට යටත්ව තිබෙනවා. ඒ වාගේම ප්‍රධාන ඇළ පද්ධති කිලෝමීටර් 2,550ක්, අවශේෂ ඇළ පද්ධති කිලෝමීටර් 8,000ක් අපට අයත්. මෙන්න මේ කාරණය මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. 2018දී මේවා සංවර්ධනය කරන්න රුපියල් බිලියන 11.2ක් වෙන් වෙලා තිබෙනවා. අමාත්‍යවරුන්ට, අමාත්‍යාංශවලට වෙන් කළ මුදල් පාවිච්චි කරන්නේ නැහැ කියා පසු ගිය දවස්වල කථාවක් තිබුණා. ගරු සභාපතිතුමනි, කන්න දෙකක් හෝ තුනක් ජලය ලබාදීලා, වර්ෂාව දිහා බලලා, ඒ ආදී සියලු කාරණා මැද්දේ තමයි අපේ අමාත්‍යාංශයේ ප්‍රගතිය ලබාගන්න අපට සිද්ධ වෙලා තිබෙන්නේ.

නමුත් අප ආඩම්බරයෙන් කියනවා, රුපියල් බිලියන 11.2න්, අපි රුපියල් බිලියන 6.7ක් වියදම් කරලා තිබෙනවාය කියලා. අපේ අමාත්‍යාංශය සියයට 60ක වාර්තාගත ප්‍රගතියක් ලබාගෙන තිබෙනවා. ඒ වාගේම අපි මේ වනකොට වසර 10ක රාජ්‍ය ආයෝජන සැලැස්මක් සකස් කරලා තිබෙනවා. ගංගාවලින් මුහුදට ගලාගෙන යන ජලය සියයට 30ක් අඩු කිරීම තමයි අපේ ප්‍රධාන පරමාර්ථය වන්නේ. වැව්, අමුණු, පොකුණු සහ විල් අලුතින් නිර්මාණය කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. ඒ වැව්වල දැනට තිබෙන ධාරිතාව වැඩි කරලා, වේළි සංරක්ෂණය කරලා, මේ සියලු දේ කරලා, නව යෝජනා ක්‍රමය යටතේ වර්ෂාවෙන් ලැබෙන ජලයෙන් සියයට 30ක ප්‍රමාණයක් රඳවා ගන්නේ කොහොමද? මේ වසර 10 සඳහා රාජ්‍ය ආයෝජන සැලැස්ම අනුව දැනට වගා කරන බිම් ප්‍රමාණය හෙක්ටයාර් 8,50,000යි. මේ ප්‍රමාණය හෙක්ටයාර් 1,10,900කින් වැඩි කරන්න අපි බලාපොරොත්තු වනවා. වාර්ෂික වගා තීව්‍රතාව සියයට 1.8ක් ලබා ගන්න බලාපොරොත්තු වනවා.

ගරු සභාපතිතුමනි, CRIP ව්‍යාපෘතිය ගැනත් අපි මතක් කරන්න ඕනෑ. මේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 35,468ක් තිබෙනවා. මේ ව්‍යාපෘතියට ගංගා ද්‍රෝණි 10ක් එනම්, කැලණි ගඟ, අත්තනගලු ඔය, ගිං ගඟ, නිල්වලා ගඟ, මහවැලි ගඟ, මල්වතු ඔය, දැදුරු ඔය, මා ඔය, කලා ඔය, ගල්ඔය ඇතුළත් වනවා.

ආරම්භ කර ඇති ව්‍යාපෘති ගැන කියනවා නම්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව ව්‍යාපෘති 374ක් ආරම්භ කර ඇති අතර ව්‍යාපෘති 200ක් අවසන් කර තිබෙනවා. ව්‍යාපෘතිවල මුළු වටිනාකම රුපියල් මිලියන 5,690යි. අපි මේ වර්ෂයේ රුපියල් මිලියන 1,963ක් වියදම් කරලා තිබෙනවා.

කැලණි ගඟේ ගංවතුර ප්‍රශ්නය කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාවට අතිශය දැවැන්ත අර්බුදයක් හැටියට පත්වෙලා තිබෙනවා. ගංවතුර පවතින අවස්ථාවල වැඩි ජලය කැලණි ගඟේ වඩාත් සුදුසු ස්ථානයකින් මුහුදට හරවා යැවීමත්, ඉහළ මධ්‍යම කැලණි ජල පෝෂක ප්‍රදේශයේ හඳුනාගත් ස්ථානවල නව බහුකාර්ය ජලාශ ඉදි කිරීමත්, කැලණි ගඟේ ඉවුරු දෙපස හංවැල්ල සිට කොළඹ දක්වා -ප්‍රධාන අතු ගංගා ඇතුළුව- ගංවතුර පාලන වේළි ඉදි කිරීම හා දැනට ඇති ගංවතුර වේළි ශක්තිමත්කොට වැඩිදියුණු කිරීමත්, පෙතියාගොඩ පොම්පාගාරය වැනි පොම්පාගාර නවීකරණය කිරීමත් අපේ වැඩසටහනට ඇතුළත් වනවා. ඒ වාගේම කැලණි ගඟේ ඉහළ ජල පෝෂක ප්‍රදේශයේ පවත්නා විදුලිබල ජලාශවල මෙහෙයුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම තුළින් පහළ කැලණි මිටියාවතේ ගංවතුර පාලනය කිරීමට ඇති හැකියාවත්, මීට සමගාමීව කාලගුණ පුරෝකථන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට ඇති හැකියාවත්, කැලණි ගඟේ ජලය වේගයෙන් මුහුදට බැස යෑමට පවත්නා බාධක ඉවත් කොට ස්ථාවර සුමට ජල ප්‍රවාහයක් ස්ථාපනය කිරීමට ඇති

හැකියාවත් සොයා බැලීමට අපි කටයුතු කර ගෙන යනවා. ගංවතුර නිසා පීඩාවට පත්වන ජනතාවට දැනට පවත්නා පූර්ව දැනුම් දීමේ ක්‍රමවේදය නවීකරණය කර වැඩිදියුණු කිරීමටත් අපි බලාපොරොත්තු වනවා. මේ සියල්ල අපි දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියෙන් -CRIP ව්‍යාපෘතියෙන්- ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වනවා, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
හොඳයි. ගරු සභාපතිතුමනි, මා විනාඩි 5 තුළ පුළුවන් තරම් කථා කරන්නම්.

මේ කථාව සම්පූර්ණයෙන්ම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න කියලා ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටින්නේ, මේ රජය කරන ලද ඒ දැවැන්ත වූ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් මේ රටේ මාධ්‍යවලින් දැනුවත් කිරීමක් නොකරන නිසායි. මොකක් හෝ වචනයක් වැරදිලා කටින් පැන්නොත්; අටුවක් විතර හොඳ දේවල් ගැන කථා කරලා, මිටක් විතර නරක දෙයක් ගැන කියවුණොත්, මේ රටේ මාධ්‍ය ආයතන සියල්ලම එයට තමයි මුල් තැන දෙන්නේ. ගරු සභාපතිතුමනි, නමුත් අපි කරන ලද මේ සංවර්ධන වැඩ ගැන, ඒ සියලුම දේවල් ගැන කිසිම දැනුවත් කිරීමක් නැහැ. මේ රජය අවුරුදු දෙකහමාරක්, අවුරුදු තුනක් වැනි කාලයක් තුළ කරන ලද සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව අඩු ගණනේ හැන්සාඩ් වාර්තාවටවත් ඇතුළත් වෙන්න ඕනෑ නිසා එම තොරතුරු ඇතුළත් මෙම ලියවිලි මා **සභාගත*** කරනවා.

ගරු සභාපතිතුමනි, අපේ අමාත්‍යාංශය විතරක් නොවෙයි, මගේ ඉංජිනේරු මහත්වරුන්, නිලධාරින්, ලේකම්තුමා, අධ්‍යක්ෂතුමන්ලා දැවැන්ත කාර්ය භාරයක් කරලා තිබෙනවා. සමහර විදේශීය ආයතනවලට කරන්න බැරි වැඩ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් කරලා තිබෙනවා. ඒ හැකියාව, ශක්තිය, දැනුම, කුසලතාව ඇති නිලධාරින් සිටින දෙපාර්තමේන්තුවක් හැටියට මේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් ආරක්ෂා කරගෙන, එහි නිලධාරින්ගේ අවශ්‍යතා පිළිබඳවත් සලකා බැලීම වැදගත් කාරණයක් හැටියට මා මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, මා ඉංජිනේරු මහත්වරුන්ගේ ගැටලු ගැනත් මතක් කරනවා. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ වෘත්තිකයන් වැඩිම සංඛ්‍යාවක් සේවය කරන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේයි.

ඒ විතරක් නොවෙයි. දුම්රිය, වරාය වාගේ අනෙකුත් සියලුම ආයතනවල සිටින ඉංජිනේරු වෘත්තිකයන්ගේ සංගමයේ සභාපතිවරයා ඉන්නෙත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ. මට ලොකු ඇණයක් ඒක. නමුත් අපි කොහොම හරි කළමනාකරණය කරගෙන ඒ අයත් සමඟ බොහොම සහයෝගයෙන් වැඩ කරනවා. අපේ අමාත්‍යාංශය තුළ ඉංජිනේරු පුරප්පාඩු සියයක් පමණ තිබෙනවා. රජයේ අනිකුත් ආයතනවලද තත්ත්වය මෙසේමයි. සෑම ආයතනයකම අනුමත ඉංජිනේරු තනතුරුවලින් තුනෙන් එකක් පමණ පුරප්පාඩු වී තිබෙනවා. මේ පිළිබඳව අධ්‍යනයක් කිරීමෙන් අනතුරුව ලැබූ විද්වත් නිර්දේශ මත ගරු රංජිත් මද්දුම බණ්ඩාර අමාත්‍යතුමා අමාත්‍ය මණ්ඩල ප්‍රතිකාවත් ඉදිරිපත් කරලා තිබෙනවා. මම ඒ පිළිබඳව එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ කැබිනට් ප්‍රතිකාවේ මේ අයගේ පඩි වැඩි වීමක් පිළිබඳවත් සඳහන් වෙනවා. මෙම පඩි වැඩිවීම ලබාදීමේ යෝජනාව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ සඳහා යොමු කර දැනට මාස හයකට වැඩි කාලයක් ගත වී තිබෙනවා. එය බලවත් ප්‍රමාදයක් ලෙසයි මා දකින්නේ ගරු සභාපතිතුමනි. ඉංජිනේරු වෘත්තිකයන්ගේ ගැටලු විසඳීමකින් තොරව සංවර්ධනයක් ගැන කථා කිරීම ඵලදායී නොවන බව මතක් කිරීමට කැමැතියි. මේ සඳහා මුදල් අමාත්‍යවරයාගේ සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමේ අවධානය යොමු කර අවම වශයෙන් මොවුන්ගේ වැටුපට මෙය දීමනාවක් වශයෙන් හෝ එකතු කරන්නේ නම් අතිශයින් වැදගත් කියන එක මම මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, CRIP ව්‍යාපෘතිය මඟින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හරහා ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා ආයෝජනය කළ වියදම, ඒ ඒ දිස්ත්‍රික්කය ලබාගෙන තිබෙන ප්‍රගතිය පිළිබඳ විස්තරය ඇතුළත් ලේඛනය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම **සභාගත*** කරනවා.

දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ප්‍රතිසංස්කරණය කළ වාරි කර්මාන්තවල නම් මම කියන්නම් ගරු සභාපතිතුමනි. සේනානායක සමුද්‍රය, පදවිය, තිසා වැව, නුවර වැව, හුරුළු වැව, නවකිරි, උනච්චි, රුගම්, වහනේරි, හක්වටුනා ඔය, කවුඩුල්ල, මින්නේරිය, ගිරිතලේ, ඇලහැර, පරාක්‍රම සමුද්‍රය, ඉඟිණිමිටිය, කන්තලේ, අල්ලෙයි, මුරුතවෙල, යෝධ වැව සහ තිසා වැව, රිදීගම, මුතුකණ්ඩිය, සෙවනගල, යෝධ වැව, අකත්මුතුප්පු, වියදිකුලම්, මිනිපේ ඇළ, අංගමුව, පදවිය, තෝපූර්, මහකනදරාව, මහවිලච්චිය, ජනරංජන වැව, වැන් ඇල, කොට්ටුකච්චිය, සොරබෝර වැව, බඳගිරිය, නවකිරි, උන්නච්චිය, කච්චිමඩු, මුතුකණ්ඩිය, බද්දුලු ඔය සහ රාජාංගන ජලාශයේ වාන් දොරටු ස්ථාපිත කිරීම. ගරු සභාපතිතුමනි, මේවාට සවි කරන නවීන radial gates හදන්නට පුළුවන් ලංකාවේ ස්ථාන තුනක පමණයි. එකක් රජයේ වැඩ දෙපාර්තමේන්තුව; අනෙක් ස්ථාන දෙක වරාය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව. මේ ආයතන තුනෙන්ම radial gates සවි කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේවා බිලියන ගණන්වල ව්‍යාපෘති. නමුත් මේ රටේ මේවා ගැන කිසිම දැනුවත් වීමක් නැහැ. එම නිසා අපි කනගාටු වෙනවා, මේ රටේ මාධ්‍ය මේ රජය කළ කටයුතු පිළිබඳව රටට හෙළි නොකිරීම ගැන. අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන්, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ මඟ පෙන්වීමෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් මේ රටේ ගොවි ජනතාවට ජලය ලබා දීම සඳහා දැවැන්ත මෙහෙවරක් කරලා තිබෙනවා. ඒක අපේ එක අධිෂ්ඨානයක්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අමාත්‍යතුමා දැන් අවසන් කරන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු සභාපතිතුමනි, මම අවසන් කරන්නම්. අනෙක් කාරණය තමයි අපි විදුලි බලය ජනනය සඳහා ජලය ලබා දෙනවා. ඒ වාගේම අපි පානීය ජලය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ජලය ලබා දෙනවා. ගරු සභාපතිතුමනි, කාල වේලාව නොමැති නිසා ජල සම්පත් මණ්ඩලයේ ප්‍රගතිය සහ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல்நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා]

කාර්ය භාරය පිළිබඳ පැහැදිලි කිරීම ඇතුළත් ලේඛනය මම **සභාගත**** කරනවා.

ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යාංශවලට නායකත්වය දීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, මාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අධ්‍යක්ෂ ජෙනරාල්තුමා, සියලුම අධ්‍යක්ෂවරුන්, - පහළ වැවේ වැඩ කරන කම්කරුවාගේ ඉඳලා සියලුම දෙනාටත්- අනෙකුත් අමාත්‍යාංශවල ලේකම්වරුන් ඇතුළු සියලුම නිලධාරීන්ටත් මාගේ ස්තුතිය පිරිනමනවා. අවසාන වශයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ස්තුති කරන්නට ඕනෑ, අපට තිබෙන යම් යම් බාධක ඉවත් කරලා දීලා මේ කටයුතු ඉක්මනින් කරගෙන ගිහින් ජනතාවට සේවය කරන්නට අවස්ථාව ලබාදීම ගැන.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මට හොඳ එඩිතර රාජ්‍ය ඇමතිවරයෙක් හම්බ වෙලා තිබෙනවා. අපි එතුමාට පුත්තලම් දිස්ත්‍රික්කයේ සහ මන්නාරම දිස්ත්‍රික්කයේ සම්පූර්ණ සංවර්ධන කටයුතු භාර දීලා තිබෙනවා. අපි සහයෝගයෙන් වැඩ කරනවා. එම නිසා එතුමාටත් මාගේ ස්තුතිය පළ කරමින්, කාලය ලබාදීම පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**** සභාමේසය මත තබන ලද ලියවිල්ල :***
**சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
**Document tabled:*

**CRIP ව්‍යාපෘතිය මඟින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හරහා ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා ආයෝජන සහ වියදම් ප්‍රමාණය**

| | දිස්ත්‍රික්කය | ව්‍යාපාරය | මුළු මුදලරු. මිලියන | වියදමරු. මිලියන |
|---|---|---|---|---|
| 1. | අම්පාර | සේනානායක සමුද්‍රය | 720.50 | 200.25 |
| 2. | අනුරාධපුරය | පදවිය | 914.72 | 254.67 |
| 3. | | තිසා වැව | | |
| 4. | | නුවර වැව | | |
| 5. | | හුරුළු වැව | | |
| 6. | මඩකලපුව | නවකිරි | 871.43 | 433.59 |
| 7. | | උනච්චි | | |
| 8. | | රූගම් | | |
| 9. | | වහනේරි | | |
| 10. | කුරුණෑගල | හක්වටුනා ඔය | 536.84 | 152.06 |
| 11. | පොලොන්නරුව | කවුඩුල්ල | 1371.62 | 364.81 |
| 12. | | මින්නේරිය | | |
| 13 | | ගිරිතලේ | | |
| 14. | | ඇලහැර | | |
| 15. | | පරාක්‍රම සමුද්‍රය | | |
| 16. | පුත්තලම | ඉගිණිමිටිය | 359.70 | 122.22 |
| 17. | ත්‍රිකුණාමලය | කන්තලේ | 480.58 | 175.48 |
| 18. | | අල්ලෙයි | | |
| 19. | හම්බන්තොට | මුරුතවෙල | 984.43 | 173.25 |
| 20. | | යෝධ වැව සහ තිසා වැව | | |
| 21. | | රිදීගම | | |
| 22. | මොණරාගල | මුතුකණ්ඩිය | 606.70 | 233.25 |
| 23. | | සෙවනගල (MASL) | | |
| 24. | මන්නරාම | යෝධ වැව | 205.00 | |
| 25. | | අකත්මුතුප්පු | | |
| 26. | | වියදිකුලම් | | |
| 27. | මහනුවර | මිනිපේ | 540.00 | |
| 28. | **එකතුව** | | 7591.53 | 2109.59 |

| | වෙල්ලේ නම/ කාර්යය | ප්‍රදානය කල මුදල රු. මිලියන | ගෙවන ලද මුදල 2017 ඔක්තෝම්බර් 30 දක්වා | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1. | අංගමුව | 166.97 | 186.31 | 112% |
| 2. | පදවිය | 126.54 | 98.41 | 78% |
| 3. | තෝප්පූර් | 48.30 | 37.62 | 78% |
| 4. | මහකනදරාව | 102.30 | 102.45 | 100% |
| 5. | මහවිලච්චිය | 210.50 | 149.44 | 71% |
| 6. | ජනරංජන වැව | 108.47 | 78.12 | 72% |
| 7. | වැන් ඇල | 69.17 | 53.36 | 77% |
| 8. | කොට්ටුකච්චිය | 74.54 | 42.98 | 58% |
| 9. | සොරබෝර වැව | 20.17 | 10.43 | 52% |
| 10. | බඳගිරිය | 78.29 | 35.66 | 46% |
| 11. | නවකිරි | 89.06 | 26.12 | 29% |
| 12. | උන්නච්චිය | 76.47 | 22.68 | 30% |
| 13. | කච්චිමඩු | 97.00 | 33.87 | 35% |
| 14. | මුතුකණ්ඩිය | 20.05 | 6.26 | 31% |
| 15. | බදුලු ඔය | 59.85 | 13.21 | 22% |
| 16. | රාජාංගන ජලාශයේ වාන් දොරටු ප්‍රතිස්ථාපනය කිරීම (1-15) | 282.58 | 154.64 | 55% |
| 17. | රාජාංගන ජලාශයේ වාන් දොරටු ප්‍රතිස්ථාපනය කිරීම (16-30) | 255.79 | 124.46 | 49% |
| 18. | රාජාංගන හා කවුඩුල්ල ජලාශවල | 226.47 | 145.58 | 64% |
| | විද්‍යුත් හා යාන්ත්‍රික ගේට්ටු අළුත්වැඩියාව | | | |
| 19. | **එකතුව** | 1,668.41 | 896.82 | |

*****සභාමේසය මත තබන ලද ලියවිල්ල :***
*** சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
*** Document tabled:*

ජල සම්පත් මණ්ඩලය.

වසර ගණනාවකට පසුව ජල සම්පත් මණ්ඩලය ප්‍රථම වතාවට 2016 වර්ෂයේ මිලියන 27ක ලාභයක් උපයා ඇති අතර, 2017 වර්ෂයේද එය ප්‍රවර්ධනය කරමින් පවතී.

2016 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ සහ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 80 සහ මූල්‍ය ප්‍රගතිය සියයට 90 වේ.

වසර 52කට පසු ජල සම්පත් මණ්ඩලයේ පනතට අදාළ රෙගුලාසි 2017 වර්ෂයේ මාර්තු මාසයේදී ගැසට් කරන ලද අතර, ඒ තුළින් භූගත ජලයේ ගුණාත්මක බව සහ ප්‍රමාණාත්මක බව නිසි ලෙස කළමනාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. ගැසට් අංකය 2010/23

ප්‍රථම වතාවට ශ්‍රී ලංකාවේ භූ විමර්ශන මධ්‍යස්ථානයක් පිහිටුවා ඒ තුළින් ශ්‍රී ලංකාවේ ගංගා ද්‍රෝණිවල භූගත ජලයේ ඇතිවන වෙනස්කම් නිරීක්ෂණය කර ඊට අදාළ පිළියම් යෙදීමටත්, නියමු ව්‍යාපෘතියක් ලෙස කුඹුක්කන් ඔය, මල්වතු ඔය, මාදුරු ඔය ආශ්‍රිතව මෙම ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් මාසයේ සිට ආරම්භ කිරීමත් සිදු වේ. දළ වියදම රුපියල් මිලියන 3,360කි.

ජල සම්පත් මණ්ඩලය තවදුරටත් පුළුල් කර එහි කාර්යයන් දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම සිදු කිරීම සඳහා කාර්යාල ස්ථාපිත කිරීමටත්, භූගත ජලය නිසි ලෙස කළමනාකරණය කර පරිසර හිතකාමී වැඩ පිළිවෙළක් සක්‍රීය කිරීමටත් 2018 වර්ෂයේ විශේෂ ව්‍යාපෘති රැසක් දියත් කිරීමට නියමිතය.

වකුගඩු රෝගයට විසඳුමක් වශයෙන්....

අනුරාධපුර නවීන රසායනාගාරයක් ඉදි කර අවසන්. ඊට අවශ්‍ය උපකරණ වෙලි ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ ස්ථාපනය කිරීමට නියමිත අතර, 2018 වර්ෂයේදී විවෘත කිරීමට බලාපොරොත්තු වේ. එමෙන්ම ජංගම රසායනාගාර වැඩි වශයෙන් යොදවා ජංගම ජල සායන සංඛ්‍යාව වැඩි කිරීමට බලාපොරොත්තු වේ.

යාපනයේ දැනට පවත්වාගෙන යනු ලබන කාර්යාලයට ස්ථිර ඉඩමක් ලබාගෙන ඇති අතර, එහි නව ගොඩනැගිල්ලක් 2018 වසරේදී ආරම්භ කිරීමට නියමිතය.

පලෙයි කාර්යාලය ඉදි කර අවසන් අතර, ඕමන්තෙයි සහ වවුනියාවේද කාර්යාල ස්ථාපිත කරමින් පවතී.

භූගත ජලයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කරන ගමන් ජලය අවභාවිතය වැළැක්වීම සඳහා සෑම පියවරක්ම ගනිමින් පවතින අතර,

නියතයට සරිලන ආකාරයේ භූගත ජලය කෘත්‍රිම ආරෝපණය කිරීමේ වැඩසටහන් සහ ගංගා ද්‍රෝණි අතර ජලය හුවමාරු කර ජල ආරෝපණ ප්‍රදේශ කරා ජලය ලබා දී භූගත ජල මට්ටම ඉහළ දැමීම සඳහා දැවැන්ත යෝජනාවක් 2018 වසරේදී ඉදිරිපත් කිරීමට නියමිතය.

"118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 522,846,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 21,500,000

"118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 21,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 4,157,458,000

"118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 4,157,458,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 2,868,350,000

"118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 2,868,350,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

118 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**281 වන ශීර්ෂය.- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 479,400,000

"281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 479,400,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 85,000,000

"281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 85,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 6,348,200,000

"281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 6,348,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 2,091,500,000

"281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 2,091,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

281 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**285 වන ශීර්ෂය.- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 557,074,000

"285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 557,074,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 93,700,000

"285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 93,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 4,724,969,000

"285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 4,724,969,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 1,839,950,000

"285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,839,950,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

285 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 522,846,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 21,500,000

"தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 21,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 4,157,458,000

"தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 4,157,458,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 2,868,350,000

"தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 2,868,350,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 118, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 281.- கமநல அபிவிருத்தித் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 479,400,000

"தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 479,400,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 85,000,000

"தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 85,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 6,348,200,000

"தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 6,348,200,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 2,091,500,000

"தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 2,091,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 281, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 285.- கமத்தொழில் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 557,074,000

"தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 557,074,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 93,700,000

"தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 93,700,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 4,724,969,000

"தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 4,724,969,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,839,950,000

"தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 1,839,950,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 285, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 522,846,000, for Head 118, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 21,500,000

Question, "That the sum of Rs. 21,500,000, for Head 118, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure,
Rs. 4,157,458,000

Question, "That the sum of Rs. 4,157,458,000, for Head 118, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure,
Rs. 2,868,350,000

Question, "That the sum of Rs. 2,868,350,000, for Head 118, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 118, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 281.- DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 479,400,000

Question, "That the sum of Rs. 479,400,000, for Head 281, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 85,000,000

Question, "That the sum of Rs. 85,000,000, for Head 281, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure,
Rs. 6,348,200,000

Question, "That the sum of Rs. 6,348,200,000, for Head 281, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure,
Rs. 2,091,500,000

Question, "That the sum of Rs. 2,091,500,000, for Head 281, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 281, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 285.- DEPARTMENT OF AGRICULTURE
Programme 01.- Operational Activities - Recurrent Expenditure,
Rs. 557,074,000

Question, "That the sum of Rs. 557,074,000, for Head 285, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure,
Rs. 93,700,000

Question, "That the sum of Rs. 93,700,000, for Head 285, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure,
Rs. 4,724,969,000

Question, "That the sum of Rs. 4,724,969,000, for Head 285, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure,
Rs. 1,839,950,000

Question, "That the sum of Rs. 1,839,950,000, for Head 285, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 285, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

"160 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.375,250,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

160 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු.22,800,000

"160 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.22,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

160 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු.3,458,000,000

"160 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.3,458,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

160 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු.38,347,130,000

"160 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.38,347,130,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

160 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**283 වන ශීර්ෂය.- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.1,404,954,000

"283 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.1,404,954,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

283 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.834,200,000

"283 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.834,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

283 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**291 වන ශීර්ෂය.- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.226,200,000

"291 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.226,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

291 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.942,620,000

"291 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.942,620,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

291 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 375,250,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 22,800,000

"தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 22,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 3,458,000,000

"தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 3,458,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 38,347,130,000

"தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 38,347,130,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 160, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 283.- வனவள பாதுகாப்புத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 1,404,954,000

"தலைப்பு 283, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 1,404,954,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 283, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 834,200,000

"தலைப்பு 283, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 834,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 283, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 291.- கரையோரம் பேணல் மற்றும் கரையோர மூலவள முகாமைத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 226,200,000

"தலைப்பு 291, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 226,200,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 291, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 942,620,000

"தலைப்பு 291, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 942,620,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 291, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 375,250,000, for Head 160, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 160, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 22,800,000

Question, "That the sum of Rs. 22,800,000, for Head 160, Programme 01, Capital Expenditure, be inserted in the Schedule " put and agreed to.

Head 160, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 3,458,000,000

Question, "That the sum of Rs. 3,458,000,000, for Head 160, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 160, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure, Rs. 38,347,130,000

Question, "That the sum of Rs. 38,347,130,000, for Head 160, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 160, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 283.- DEPARTMENT OF FORESTS

Programme 01.- Operational Activities - Recurrent Expenditure Rs. 1,404,954,000

Question, "That the sum of Rs. 1,404,954,000, for Head 283, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 283, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 834,200,000

Question, "That the sum of Rs. 834,200,000, for Head 283, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 283, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 291.- DEPARTMENT OF COAST CONSERVATION AND COASTAL RESOURCE MANAGEMENT

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 226,200,000

Question, "That the sum of Rs. 226,200,000 for Head 291, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 291, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 942,620,000

Question, "That the sum of Rs 942,620,000, for Head 291, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 291, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

"198 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.355,740,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

198 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.49,700,000

"198 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.49,700,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

198 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.159,970,000

"198 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.159,970,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

198 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු.9,975,100,000

"198 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.9,975,100,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

198 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**282 වන ශීර්ෂය.- වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.657,620,000

“282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන පුනරාවර්තන වියදම සඳහා රු.657,620,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය” යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.47,000,000

“282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන මූලධන වියදම සඳහා රු.47,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය” යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.2,458,050,000

"282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන පුනරාවර්තන වියදම සඳහා රු.2,458,050,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු.10,928,200,000

"282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන මූලධන වියදම සඳහා රු.10,928,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

282 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 198, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 355,740,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 198, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 49,700,000

"தலைப்பு 198, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 49,700,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 198, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 159,970,000

"தலைப்பு 198, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 159,970,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 198, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 9,975,100,000

"தலைப்பு 198, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 9,975,100,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 198, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 282.- நீர்ப்பாசனத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 657,620,000

"தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 657,620,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 47,000,000

"தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 47,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 2,458,050,000

"தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 2,458,050,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா10,928,200,000

"தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 10,928,200,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 282, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 355,740,000, for Head 198, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 198, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 49,700,000

Question, "That the sum of Rs. 49,700,000, for Head 198, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 198, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 159,970,000

Question, "That the sum of Rs. 159,970,000, for Head 198, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 198, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 9,975,100,000

Question, "That the sum of Rs. 9,975,100,000, for Head 198, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 198, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 282.- DEPARTMENT OF IRRIGATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 657,620,000

Question, "That the sum of Rs. 657,620,000, for Head 282, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 282, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 47,000,000

Question, "That the sum of Rs. 47,000,000, for Head 282, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 282, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 2,458,050,000

Question, "That the sum of Rs. 2,458,050,000, for Head 282, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 282, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 10,928,200,000

Question, "That the sum of Rs. 10,928,200,000, for Head 282, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 282, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

"199 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.130,345,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

199 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.9,500,000

"199 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.9,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

199 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු.2,200,000,000

"199 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.2,200,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

199 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**289 වන ශීර්ෂය.- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.615,655,000

"289 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන පුනරාවර්තන වියදම සඳහා රු.615,655,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

289 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු.555,500,000

"289 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන මූලධන වියදම සඳහා රු.555,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

289 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 199, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 130,345,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 199, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 9,500,000

"தலைப்பு 199, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 9,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 199, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 2,200,000,000

"தலைப்பு 199, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 2,200,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 199, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 289.- ஏற்றுமதி கமத்தொழில் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.-அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 615,655,000

"தலைப்பு 289, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 615,655,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 289, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.-அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 555,500,000

"தலைப்பு 289, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 555,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 289, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 130,345,000, for Head 199, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 199, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 9,500,000

Question, "That the sum of Rs. 9,500,000, for Head 199, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 199, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 2,200,000,000

Question, "That the sum of Rs. 2,200,000,000, for Head 199, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 199, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 289.- DEPARTMENT OF EXPORT AGRICULTURE

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 615,655,000

Question, "That the sum of Rs. 615,655,000, for Head 289, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 289, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 555,500,000

Question, "That the sum of Rs. 555,500,000, for Head 289, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 289, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

"කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයිද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය"යි ද මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අ. භා. 7.15 ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.***

***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2017 නොවැම්බර් 23වන බ්‍රහස්පතින්දා.***

*பி.ப. 7.15 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2017 நவம்பர் 23, வியாழக்கிழமை.*

*At 7.15 p.m., the Chairman left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Thursday, 23rd November, 2017.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

න්‍යාය පත්‍රයේ විෂය අංක 2, 3 හා 4 අනුමත කිරීම.

## I

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය : වාර්ෂික වාර්තාව හා ගිණුම් (2012)
## இலங்கை மகாவலி அதிகாரசபை: ஆண்டறிக்கையும் கணக்குகளும் (2012)
## MAHAWELI AUTHORITY OF SRI LANKA : ANNUAL REPORT AND ACCOUNTS ( 2012)

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 34 වගන්තිය යටතේ 2016.05.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.03.09 දින සලකා බලන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය : වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013)
## இலங்கை மகாவலி அதிகாரசபை: ஆண்டறிக்கையும் கணக்குகளும் (2013)
## MAHAWELI AUTHORITY OF SRI LANKA : ANNUAL REPORT AND ACCOUNTS ( 2013)

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 34 වගන්තිය යටතේ 2016.11.15 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.03.09 දින සලකා බලන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රාජ්‍ය දැව සංස්ථාව : වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013)
### அரச மரக் கூட்டுத்தாபனம் : ஆண்டறிக்கையும் கணக்குகளும் (2013)
### STATE TIMBER CORPORATION: ANNUAL REPORT AND ACCOUNTS (2013)

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2016.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(තිරසර සංවර්ධනය හා පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.03.09 දින සලකා බලන ලදී.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
### ஒத்திவைப்பு
### ADJOURNMENT

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගරු අබ්දුල්ලාහ් මහරූෆ් මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

ගරු කථානායකතුමනි, "ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්,* **ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

## ගුරු පත්වීම් අපේක්ෂකයින්ට පදිංචි ප්‍රදේශය තුළම පත්වීම් ලබාදීම
### விண்ணப்பதாரிகள் வசிக்கும் பிரதேசத்தினுள் ஆசிரியர் நியமனங்களை வழங்குதல்
### PROVIDING TEACHING APPOINTMENTS WITHIN THE RESIDENTIAL AREA OF APPOINTEES

[பி.ப. 7.15]

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சபை ஒத்திவைப்புவேளையில் பின்வரும் பிரேரணையை முன்மொழிய விரும்புகின்றேன்:

தற்பொழுது வழங்கப்படும் பட்டதாரி, தொண்டர், போதனா, டிப்ளோமா சார்ந்த ஆசிரிய நியமனங்கள் அனைத்தும் பெரும்பாலும் விண்ணப்பதாரிகளின் வசிப்பிடங்களுக்கு வெளியில் - குறிப்பிட்ட மாகாணங்களுக்கு வெளியில் - வழங்கப்படுவதை அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. இதனால் ஆசிரிய நியமனங்களை எதிர்பார்ப்பவர்கள் குறிப்பிட்ட நியமனங்களை ஏற்றுக்கொள்ளாத ஒரு நிலை தோன்றியுள்ளதுடன், பெரும்பாலான மாகாணங்களில் அமைந்துள்ள மாவட்டங்களில் ஆசிரியர் சமநிலையும் காணப்படுவதில்லை.

அண்மைக்காலம் முதல் இது ஒரு பாரிய பிரச்சினையாக உருவெடுத்துள்ளது. இது தொடர்பில் உகந்த மற்றும் துரித நடவடிக்கை மேற்கொண்டு, குறிப்பிட்ட விண்ணப்பதாரிகள் வசிக்கும் பிரதேசத்தினுள், ஆசிரிய பற்றாக்குறை நிலவும் பாடசாலைகளுக்கு குறிப்பிட்ட ஆசிரிய நியமனங்களை வழங்கும் ஒரு வேலைத்திட்டத்தைத் தயாரிக்குமாறு இச்சபைக்குப் பிரேரிக்கின்றேன்.

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)

Hon. Presiding Member, I would like to second the Motion moved by the Hon. Abdullah Mahrooff.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)

முக்கியமாக, இன்று பட்டதாரிகளுக்கான விண்ணப்பங்களைக் கோரும்பொழுது, அதற்குரிய வயதெல்லை 35 ஆகக் காணப்படுகின்றது. 2012ஆம் மார்ச் 31ஆந் திகதிக்குப் பின்னர் போட்டிப் பரீட்சைகள் மூலமாகவே நியமனங்கள் வழங்கப்படுகின்ற நிலை காணப்படுகின்றமையால், எமது கிழக்கு மாகாணத்தில் 1,442 நியமனங்கள் வழங்கப்படவுள்ள நிலையில், 35 வயதுக்கும் 45 வயதுக்கும் இடைப்பட்ட பல பட்டதாரிகள் அந்நியமனங்களைப் பெறமுடியாத நிலையில் பாரிய

[ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා]

பின்னடைவைச் சந்திக்கின்றார்கள். காரணம், இன்று இளம் வயதினர் பரீட்சைகளில் சித்தியடைந்து விடுகிறார்கள். ஆனால், தமது பட்டப்படிப்பை நிறைவுசெய்த பின்னர் 10 வருட காலத்துக்கும் மேலாக வேலைவாய்ப்பின்றி வீடுகளில் இருப்பவர்கள், திருமணம் செய்து பிள்ளைகளுடன் தமது வேலைவாய்ப்பைக் கருதி ஏங்கிய நிலையில், பரீட்சைகளை எழுதியும் சித்தியடைய முடியாத நிலையில் உள்ள பட்டதாரிகளுக்கு 3 மாத காலம் அல்லது 6 மாத காலம் பயிற்சியை வழங்கி அவர்களுக்குரிய நியமனங்களை வழங்கவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

எமது பிரதம மந்திரி அவர்கள் தனது தேர்தல் விஞ்ஞாபனத்தில் பட்டதாரிகளுக்கு நியமனம் வழங்குவது தொடர்பாகக் குறிப்பிட்டிருக்கிறார். அதேவேளையில் இஸ்லாமிய ஆசிரியர் சங்கம் பல தடவைகள் பிரதம மந்திரி அவர்களிடமும் மேதகு ஜனாதிபதி அவர்களிடமும் ஒரு கோரிக்கை விடுத்திருந்தது. 2008ஆம், 2009ஆம் ஆண்டுகளில் காணப்பட்ட 424 வெற்றிடங்களில் 148 ஆசிரியர்களுக்கான நியமனங்கள் மாத்திரமே வழங்கப்பட்டிருக்கின்றன. எங்களுடைய தேர்தல் விஞ்ஞாபனத்தில்கூட "ஆசிரிய நியமனங்கள் வழங்கப்படாத பட்டதாரிகளுக்கான நியமனங்களை வழங்குவோம்" எனக் கூறியிருந்தோம். ஆனால், இன்றுவரையில் அந்நியமனங்கள் வழங்கப்படாத நிலைமையே காணப்படுகின்றது. இன்று அவர்கள் வீதிகளில் நின்று போராட வேண்டிய சூழ்நிலை ஏற்பட்டிருக்கிறது.

அதேபோன்று, 445 தொண்டர் ஆசிரியர்களுக்கு நியமனங்கள் வழங்குவதற்கான அனுமதி வழங்கப்பட்டபொழுதிலும் இன்றுவரையில் அவர்களுக்குரிய நியமனங்கள் வழங்கப்படவில்லை. முதலாவது list இலே 445 volunteer ஆசிரியர்களும், இரண்டாவது list இலே 160 ஆசிரியர்களும், மூன்றாவது list இலே 130 ஆசிரியர்களுமாக மொத்தமாக 735 தொண்டர் ஆசிரியர்கள் தங்களுடைய நியமனங்களை எதிர்பார்த்துக் காத்திருக்கின்றார்கள். கடந்த 30 வருடகால யுத்த சூழ்நிலையிலே அவர்கள் அரசாங்கத்துக்கு உறுதுணைபுரிந்தவர்கள். போக்குவரத்து வசதிகள் இல்லாத சூழ்நிலையில், கஷ்டமான சூழ்நிலையில், பாடசாலைகளுக்குச் சென்று அம்மாணவர்களுக்குக் கல்வி கற்றுக் கொடுத்தவர்கள். இரண்டு வருடங்களுக்கு முன்னர் 445 தொண்டர் ஆசிரியர்களுக்கு நியமனங்கள் வழங்குவதற்கான அனுமதி கிடைக்கப்பெற்றபொழுதிலும் அவர்களுக்கு வழங்கப்படாததற்கான காரணம், 2007ஆம் ஆண்டுக்குப் பின்னரான கிழக்கு மாகாணத் தொண்டர் ஆசிரியர்களை அனுமதிக்க வேண்டாமென்று 2013இல் அனுப்பப்பட்ட சுற்றுநிருபமே. அதன் காரணமாக அவர்கள் பாடசாலைகளுக்குச் செல்ல முடியாத நிலைமை ஏற்பட்டது. இதனால் அவர்கள் 2013ஆம் ஆண்டு கல்வி அமைச்சரையும் பிரதம அமைச்சர் அவர்களையும் சந்தித்துத் தங்களுடைய நிலைமையை எடுத்துக் கூறியபோது, அந்த நியமனங்கள் அண்மையில் வழங்கப்படும் என்று கூறப்பட்டிருந்தும், இற்றைவரை வழங்கப்படவில்லை. இந்த விடயத்தைப் பொறுப்பேற்றுச் செயற்படுத்துவதற்கு பிரதம அமைச்சர் அவர்களால் திருஞானசோதி அவர்கள் நியமிக்கப்பட்டிருந்தும்கூட இந்த நியமனங்கள் இன்னும் வழங்கப்படவில்லை. தற்பொழுது அங்கு நடைபெறவிருந்த உள்ளூராட்சித் தேர்தல் பின்போடப்படுகின்ற சூழல் ஏற்பட்டிருப்பதன் காரணமாக எதிர்வரும் டிசம்பர் மாதத்துக்குள் அந்தத் தொண்டர் ஆசிரியர் நியமனங்கள் வழங்கப்பட வேண்டும்; கல்வி அமைச்சு அதனை உறுதிப்படுத்த வேண்டும்.

அதேநேரம், பட்டதாரி ஆசிரியர்களுடைய நியமனத்தைப் பொறுத்தவரையில், தற்பொழுது இலங்கையிலே 35க்கும் 45க்கும் இடைப்பட்ட வயதுடைய வேலையற்ற பட்டதாரிகள் 3,500 பேரே இருக்கின்றார்கள். அவர்களில் 377 பேர் மட்டுமே கிழக்கு மாகாணத்தைச் சேர்ந்தவர்கள். இவர்களுக்கு இந்த நியமனங்களை வழங்கிவிட்டால் 35க்கும் 45க்கும் இடைப்பட்ட வயதைக்கொண்ட வேலையற்ற பட்டதாரிகளின் பிரச்சினை தீர்ந்துவிடும். ஆகவே, இந்தப் பட்டதாரி நியமனத்தில் அவர்களுக்கு முன்னுரிமை வழங்கப்பட வேண்டும். இதற்கு கௌரவ பிரதம அமைச்சர் அவர்களும் கல்வி அமைச்சர் அவர்களும் தகுந்த நடவடிக்கை எடுக்க வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

ஆசிரியர் நியமனங்களைப் பொறுத்தவரையில், அங்குள்ள கல்விக் கல்லூரிகளிலிருந்து அண்மையிலே வெளியான பெண் ஆசிரியர்கள் வெளி மாகாணங்களில் ஆசிரியர்களாக நியமிக்கப்பட்டுள்ளார்கள். கிழக்கு மாகாணத்திலுள்ள வெற்றிடங்கள் பற்றிய விபரம் கல்விப் பணிப்பாளரால் தயாரிக்கப்பட்டுள்ளது. அதன் பிரகாரம் அங்கு 3,600 வெற்றிடங்கள் இருந்தும்கூட, 745 நியமனங்கள்தான் வழங்கப்பட வேண்டும் என்று தற்போது ஆளுநருடைய செயலாளராக இருக்கின்ற முன்னாள் கிழக்கு மாகாணச் செயலாளர் கூறியிருக்கின்றார். காரணம், 2016ஆம் ஆண்டு அங்கு 158,000 முஸ்லிம் மாணவர்கள் இருந்தும்கூட அவர்களுக்காக 90 ஆசிரியர் நியமனங்களே வழங்க வேண்டும் என்று cadre position தீர்மானிக்கின்றவர்கள் பரிந்துரை வழங்கியிருப்பதாகும். அதேபோல, 1,29,000 இந்து மாணவர்கள் இருக்கின்றபோது, அவர்களுக்கு 89 ஆசிரியர்களே நியமிக்கப்படவேண்டுமென்றும் 78,000 பௌத்த மாணவர்கள் இருக்கின்றபோது, அவர்களுக்கு 60 ஆசிரியர்களே வழங்கப்படவேண்டுமென்றும் கூறுகின்ற அதேவேளை, 18,000 கிறிஸ்தவ மாணவர்களுக்கு 165 ஆசிரியர்கள் நியமிக்கப்படவேண்டுமென்று சிபாரிசு செய்யப்பட்டிருக்கிறது. இதற்குக் காரணம், 2016ஆம் ஆண்டின் circular ஆகும். அதன்படி அவர்கள் 04 கிறிஸ்தவ மாணவர்களுக்கு ஓர் ஆசிரியர் என்ற அடிப்படையில், 165 cadre positionஐக் கேட்கிறார்கள். எனவே, இந்து, இஸ்லாமிய, பௌத்த மாணவர்கள் இருக்கின்ற பாடசாலைகளுக்கு குறைந்தபட்சம் அவர்கள் தங்களது மதக் கல்வியைக் கற்றுக்கொள்வதற்கு ஓர் ஆசிரியராவது நியமிக்கப்படவேண்டும். இவ்வாறு இஸ்லாமிய, இந்து, பௌத்த பாட ஆசிரியர்களை நியமிப்பதன்மூலம் தற்போது காணப்படுகின்ற அநாசாரங்களிலிருந்து - பிழையான சூழலில் இருந்து - மாணவர்களைப் பாதுகாக்க முடியும். அதேநேரத்தில், பாடவிதான அடிப்படையில் மேலும் பல ஆசிரியர்கள் நியமிக்கப்படவேண்டும்.

அத்தோடு, இங்கு முன்வைக்கப்பட்டிருக்கின்ற கோரிக்கையின் அடிப்படையில், ஆசிரியர் நியமனங்கள் வழங்கப்படுகின்றபோது, அவர்கள் அந்ததந்த மாவட்டங்களில் நியமிக்கப்படவேண்டும். கிழக்கு மாகாணத்தில் இருக்கின்ற 15 வலயங்களில், திருகோணமலையிலே இருக்கின்ற கிண்ணியா, மூதூர், திருகோணமலை வடக்கு, திருகோணமலை, கந்தளாய் ஆகிய ஐந்து கல்வி வலயங்களில்தான் ஆகக்கூடுதலான ஆசிரியர் பற்றாக்குறை இருக்கின்றது. அவர்கள் கிழக்கு மாகாணத்திலுள்ள ஒட்டுமொத்த வெற்றிடங்களையும் கணக்கிடுவதால், திருகோணமலை மாவட்டத்துக்கு ஆசிரிய நியமனங்களைத் தர மறுக்கின்றார்கள். தற்பொழுது, திருகோணமலை மாவட்டத்தில் 1,116 ஆசிரிய வெற்றிடங்கள் இருக்கின்றன. எனினும், தற்போது நியமனங்கள் வழங்கப்பட்ட அனைவரும் கிழக்குக்கு வெளியே அனுப்பப்பட்டிருக்கின்றார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා**
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
அவர்களை - பெண் பிள்ளைகளை - உடனடியாக எமது மாவட்டத்துக்குத் திருப்பித் தரவேண்டும் என்று கேட்டபோது, கல்வி அமைச்சின் செயலாளர் அவர்கள் வருகின்ற 08ஆம் திகதிக்குப் பின்னர் அவர்களை அங்கு உள்வாங்குவதாக வாக்குறுதியளித்திருந்தாலும் கூட, அது நடைபெறுமா என்பதில் சந்தேகம் இருக்கின்றது. ஏனென்றால், இன்றும்கூட பொலன்னறுவை மாவட்டத்தில் 05 மாணவிகள் உள்வாங்கப்பட்டிருக்கிறார்கள். அதேபோன்று ஏறாவூரிலும் நேற்று நியமனம் பெற்று வந்திருக்கிறார்கள். ஆகவே, கிழக்கு மாகாணத்தில், திருகோணமலை மாவட்டத்திலுள்ள ஐந்து வலயங்களிலும் ஆசிரியர் பற்றாக்குறை இருப்பதன் காரணமாக, அண்மையில் இடம்பெறவிருக்கின்ற பட்டதாரி மற்றும் தொண்டர் ஆசிரியர் நியமனங்களின்போது, எமது மாகாணத்தைச் சேர்ந்த அனைவரையும் கிழக்கு மாகாணத்துக்குத் தரவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

அவ்வாறே மௌலவி ஆசிரியர்களின் நியமனம் தொடர்பிலும் எங்களுடைய தேர்தல் விஞ்ஞாபனத்தில் கூறப்பட்டிருந்தது. அந்த வகையில், 2009ஆம் ஆண்டில் 212 பேரும் 2008ஆம் ஆண்டில் 68 பேரும் என வழங்கப்படவிருந்த மௌலவி ஆசிரியர் நியமனங்களும் வழங்கப்பட வேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you. The next speaker is the Hon. Mohamed Navavi. You have three minutes.

[7.24p.m.]

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Thank you, Sir, for giving me this opportunity to second this Motion. Last week, when I went to meet the Hon. State Minister of Education, who is present in this House now, I saw about 200 to 300 Moulavi Teachers right opposite his Ministry. I had a discussion with them and I came to know that there had been about 275 vacancies and the Hon. Minister had got approval in the Cabinet to appoint these teachers some time back. But very unfortunately, up to date, these appointments had not been made. The Hon. Minister said during elections that he had made arrangements to do this. But I do not know how the Hon. Minister and the Hon. State Minister were not able to do this, especially the State Minister being in charge of the Tamil medium. So, as Members of Parliament, five or six of us went there and had a discussion with them and since it it has got the Cabinet approval, I hope, the Hon. Minister and the State Minister would take action as promised earlier.

Further, I would like to refer to the North Western Provincial Council. The Hon. Minister and the State Minister so far have visited my Electorate twice and helped me immensely in providing buildings and so on. Sir, a few months back, the former Minister of Education of the North Western Provincial Council had called for applications for 1,000 teachers. Finally what happened was, out of the 1,000 applications, Tamil medium got only 170. Out of that, 85 was for Puttalam District and the other 85 was for Kurunegala District. When we were having a shortage of 1,250 Tamil medium teachers and 1,000 Sinhala medium teachers in the Puttalam District alone, the biggest number was sent to Kurunegala and the shortage of 2,250 was filled with only 250 teachers.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Sir, please give me two more minutes.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
No, I cannot. You had only three minutes. There are four more speakers.

**ගරු මොහොමඩ් නවවි මහතා**
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Now the Provincial Minister of Education has been changed and the Hon. Chief Minister has taken over. The Central Government passes money on to the Provincial Councils. But they do not do a proper job. Therefore, I request the Hon. Minister and the State Minister to look into this. There are so many problems like this. Unfortunately I have no time to refer to all that. Please look into this. Although we do a proper job, the benefits do not reach the schools. Therefore, I request you to look into this.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 7.28]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත්ම දක්ෂ, ඉතාමත්ම නිහතමානී හා සහජ හැකියාවක් තිබෙන ගරු රාධක්‍රිෂ්නන් රාජ්‍ය අමාත්‍යතුමාව අද පැත්තකට දාලා, කුණු කූඩයට විසි කරලා තමයි තිබෙන්නේ. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඒ නිසා මම තමුන්නාන්සේට විශේෂයෙන්ම පැහැදිලි කරලා කියනවා, මේ වාගේ මරාළවලට කර ගහන්නේ නැතුව ඔබතුමා පැත්තකට වෙලා ඉන්න කියලා.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මන්ත්‍රීතුමා ගෙනා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ඉතාමත්ම ඵලදායකයි. හැබැයි, මෙය අපි

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

දවසක් විතර විවාද කරලා උත්තර හොයාගත යුතු ප්‍රශ්නයක්. මොකද අපි විශ්වාස කරනවා, රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයටවත්, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයටවත්, කාලීනව සංවර්ධනය වන නිශ්චිත ගුරුමාරු ප්‍රතිපත්තියක් හෝ ගුරුවරුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් ඇත්තේම නැහැ කියලා. මෙතෙක් අධ්‍යාපන විෂයය භාරව සිටි මේ රටේ ඇමතිවරුන්ට, නියෝජ්‍ය ඇමතිවරුන්ට, ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමන්ලා ඇතුළු ඉන්න කිසිදු බලධාරියෙකුට නිශ්චිත ප්‍රතිපත්තියක් ඇති කරන්න වුවමනාවක් තිබුණෙත් නැහැ. ඉදිරියේදී, කරන්නෙත් නැහැ; ඇති කරන්න බලාපොරොත්තුවකුත් නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නය දිගින් දිගටම පැටව් ගහමින් මේක මහා දැවැන්ත අගාධයක් කරා යනවා මිසක්, මේකට උත්තරයක් ලැබෙන්නේ නැහැ කියන එක මා විශේෂයෙන්ම මේ මොහොතේ ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා.

මේ ප්‍රශ්නයේදී මොකක්ද කියන්නේ? බලධාරින් කියන්නේ, එක පළාතකට ගුරු පුරප්පාඩු 100ක් තිබෙනවා නම්, ගුරුවරු 1,000ක් ඉල්ලනවාලු. ඒ නිසාලු ගුරුවරු බඳවා ගැනීමේදී ගුරු ව්‍යවස්ථාවේ හැටියට විභාගයක් පවත්වන්න සිද්ධ වෙලා තිබෙන්නේ. සම්මුඛ පරීක්ෂණ නොවෙයි; විභාගයක් පවත්වන්න. විභාගයක් පවත්වලා විභාගය සමත් වුණත් ගුරුවරු ගන්නේ නැහැ; තෝරනවා; ලකුණු මට්ටමක් බලනවා. ඒ නිසා සිද්ධ වෙලා තිබෙන්නේ, මේ ගුරුවරුන්ට හැම දාමත් තැවි තැවී, තැවි තැවී, වේදනා විඳ විඳ සිටින්නයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, අවසාන කරන්න.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
බඳවා ගැනීමේදී වයස් සීමාවක් තිබෙනවා. අනිවාර්යයෙන් වයස අවුරුදු 35ට අඩු විය යුතුයි. අවුරුදු 32දී උපාධිය ගත්තොත් එළියට ඇවිල්ලා කොච්චර කාලයක් ඉන්න වනවාද? ඒවා මේ මහත්වරුන්ට, ඇමතිවරුන්ට, බලධාරින්ට තේරෙන්නේ නැහැ. මේ ඇමතිවරු, මේ බලධාරින්, අඩුම ගානේ පාසලක දවසක් හෝ උගන්වපු ගුරුවරයෙක් නම්, විදුල්පතිවරයෙක් නම්, ඒ වෘත්තිය කරලා තිබෙනවා නම්, කවදාකවත් මේ අපරාධයට හවුල් වෙලා මේ වාගේ විනාශයක් කරන්නේ නැහැ කියන එක මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නයට ඵලදායී විසඳුමක් බලාපොරොත්තු වුණත් මේ ඇමතිවරුන්ට, මේ නිලධාරින්ට ඒකට කිසිම නිහතමානිකමක් නැති නිසා මේ තත්ත්වය තවත් දිගින් දිගටම ගිහින් මහා දැවැන්ත විනාශයක් කරා යනවා කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අරවින්ද් කුමාර් මන්ත්‍රීතුමා. You have three minutes.

[பி.ப. 7.32]

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
இன்று இங்கே முன்வைக்கப்பட்டிருக்கும் ஒத்திவைப்புவேளைப் பிரேரணையை காலத்திற்கேற்றதொன்றாக நான் பார்க்கின்றேன். இதிலே விசேடமாக ஒன்றைக் குறிப்பிட விரும்புகின்றேன். கடந்த மாதம் பதுளை மாவட்டத்தில் தேசிய கல்வியியற் கல்லூரியிலிருந்து 68 பேர் டிப்ளோமா பட்டம் பெற்று வெளியேறியிருக்கிறார்கள். இவர்களில் 24 பேருக்கு மாத்திரம் பதுளை மாவட்டத்தில் நியமனம் வழங்கிவிட்டு, மிகுதி 44 டிப்ளோமாதாரிகளுக்கும் வெளிமாவட்டங்களிலே பல்வேறு பிரதேசங்களில் நியமனம் வழங்கப்பட்டிருக்கின்றது. "ஏன், இவ்வாறு வழங்கப்பட்டது?" என்று கேட்டபோது, "பதுளை மாவட்டத்தில் இவர்களை உள்வாங்கக்கூடிய வெற்றிடங்கள் இல்லை; அதனால்தான் இவர்களை வெளிமாவட்டத்திலே நியமிக்க வேண்டிய தேவை ஏற்பட்டது" என்று மத்திய கல்வி அமைச்சு கூறுகின்றது. ஆனால், மாகாணக் கல்வி அமைச்சோ, "இல்லை, இவர்களை உள்வாங்க முடியும்; உள்வாங்கக்கூடிய வெற்றிடங்கள் இங்கே இருக்கின்றன" என்று கூறுகின்றது. ஆகவே இந்த நிலைமைகளைப் பார்க்கும்போது மத்திய கல்வி அமைச்சுக்கும் மாகாணக் கல்வி அமைச்சுக்குமிடையில் சரியான ஒருங்கிணைப்பு இல்லையென்பதைப் புரிந்துகொள்ளக்கூடியதாக இருக்கின்றது. துரதிருஷ்டவசமாக இந்தச் சம்பவம் நடந்தபோது நான் இந்த நாட்டிலே இருக்கவில்லை. நான் கனடா சென்றிருந்தேன். நான் இங்கே இருந்திருந்தால் மத்திய கல்வி அமைச்சுக்கும் மாகாணக் கல்வி அமைச்சுக்கும் இடையிலேயுள்ள இந்த முரண்பாட்டைத் தீர்த்து, விடயத்தைத் தெளிவுபடுத்தி அவர்களுக்கு அங்கேயே நியமனம் பெறுவதற்கான வாய்ப்பினை ஏற்படுத்திக் கொடுத்திருப்பேன். நியமனத்தைப் பெற்றவர்கள் 14 தினங்களுக்குள் தத்தமது பாடசாலையிலே சென்று கடமையைப் பொறுப்பேற்க வேண்டுமென்ற நியதியொன்று இருப்பதன் காரணமாக அவர்கள் செய்வதறியாது, தொழிலைக் காப்பாற்றிகொள்ள வேண்டும் என்பதற்காக அந்தப் பாடசாலைகளில் போய் கடமையேற்றிருக்கிறார்கள். இவ்வாறு தங்களுக்கு விருப்பமில்லாத பிரதேசங்களிலே போய் ஆசிரியர் தொழிலை மேற்கொள்பவர்கள் -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
அங்கிருந்து எப்போது திரும்பிப் போகலாமென்ற நிலையில் இருப்பார்களேயொழிய, இதய சுத்தியோடு தங்களுடைய தொழிலைச் செய்யக்கூடிய ஒரு நிலைமை இருக்காது. அதுமாத்திரமல்ல, அங்கே வெற்றிடங்கள் இருக்கின்றன. இல்லாவிட்டால் அவர்கள் அங்கே வரவேண்டிய அவசியமோ அல்லது அங்கே அவர்களை நியமனம் செய்ய வேண்டிய தேவையோ இருக்காது. ஆகவே, இவ்வாறு வெளிமாவட்டங்களிலே நியமனம் பெற்ற 44 ஆசிரியர்கள மீண்டும் பதுளை மாவட்டத்திற்கு இடமாற்றம் செய்து, அங்கே அவர்கள் தொழிலைச் செய்வதற்கான நிலைமையை ஏற்படுத்த வேண்டுமென்று நான் இந்த சபையிலே விநயமாகக் கோரிக்கை விடுக்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Please, wind up now.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடைசியாக ஒரேயொரு விடயதைச் சொல்லி அமர்கின்றேன். நேற்று பல்லேகட்டுவ பிரதேசத்திலேயுள்ள தமிழ் பாடசாலையில் கனிஷ்ட பிரிவு இப்பொழுது ஆயிரம் பாடசாலைத் திட்டத்தின் கீழ் மூடப்பட்டுள்ளது. இந்தக் கனிஷ்ட பாடசாலைக் கட்டிடத்திலே வெளியாள் ஒருவர் அத்துமீறி உள்ளே நுழைந்து அடாவடித்தனங்களை மேற்கொள்கின்றார்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have to wind up now.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
உள்ளே நுழைந்த அவரின் அடாவடித்தனத்தை மற்றவர்கள் கைகொட்டிச் சிரித்துப் பார்த்துக்கொண்டிருக்கின்ற நிலைமை அங்கு இருக்கின்றது. ஆகவே, இதற்கும் தகுந்த நடவடிக்கை எடுக்க வேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Mylvaganam Thilakarajah. You have three minutes.

[பி.ப.7.35]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, காலத்துக்குப் பொருத்தமானதும் மிகவும் அவசியமானதுமான சபை ஒத்திவைப்புவேளைப் பிரேரணையொன்றைக் கௌரவ உறுப்பினர் அப்துல்லாஹ் மஹ்ரூப் அவர்கள் முன்வைத்திருக்கின்றார். ஆசிரியர் பணியில் ஈடுபடும் ஆசிரியர்கள் அரச உத்தியோகத்தர்களாக இருந்தபோதிலும், மிகக் குறைந்த வேதனத்தைப் பெறுகின்ற சந்தர்ப்பத்தில், குறிப்பிட்ட மாவட்டம் தவிர்ந்த வெளிமாவட்டங்களுக்கு நியமிக்கப்படுகின்ற பட்சத்தில், அவர்கள் பொருளாதாரப் பிரச்சினைகள் உட்பட குடும்பத்தைக் கொண்டு நடாத்துவது தொடர்பான பல்வேறு பிரச்சினைகளை எதிர்கொள்கின்றார்கள். அர்ப்பணிப்பான தொழிலைச் செய்கின்ற இவர்களது பிரச்சினை பேசப்பட வேண்டியதாகும்.

குறிப்பாக, நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மலையகம் சார்ந்த பகுதிகளிலுள்ள பெருந்தோட்டப் பாடசாலைகளுக்கு ஆசிரிய உதவியாளர் என்ற அடிப்படையில் பலர் நியமிக்கப்பட்டிருக்கிறார்கள். இவ்விடயம் தொடர்பில் இந்தச் சபையிலே பல தடவைகள் பேசப்பட்டிருக்கின்றது. இப்பொழுது அவர்கள், தங்களது சம்பள விவகாரம் தொடர்பில் பல்வேறு பிரச்சினைகள் எழுந்திருப்பதாக எங்களிடம் முறைப்பாடுகளைத் தெரிவித்தவண்ணம் இருக்கிறார்கள். தற்பொழுது, எங்களுடைய கல்வி இராஜாங்க அமைச்சர் இந்தப் பிரேரணைக்கு பதிலளித்து உரையாற்ற இருக்கின்ற நிலையில், நேரம் போதாமை காரணமாக இரண்டு வினாக்களை மாத்திரம் தொடுத்து, எனது உரையைச் சுருக்கிக்கொள்ளலாம் என்று நினைக்கின்றேன்.

இந்த ஆசிரிய மாணவர்கள் தமது வாழ்விடப் பிரதேசமல்லாத வெளிமாவட்டங்களில் - உதாரணமாக, மலையகத்தைச் சேர்ந்தவர்கள் மட்டக்களப்பு, யாழ்ப்பாணம் போன்ற மாவட்டங்களில் - பயிற்சிக்காகச் சேர்ந்திருக்கிறார்கள். அவர்களுக்கு வழங்கப்படுகின்ற சம்பளம் 10,000 ரூபாயாக இருப்பதன் காரணமாக, அதனைக்கொண்டு தங்களால் அந்தப் பயிற்சியைத் தொடர முடியாத நிலைமை இருப்பதாகவும் அவர்களுக்கு நியமனம் வழங்கப்பட்ட அதேநாளில் சிங்கள மொழியில் பௌத்த பாடத்தைக் கற்பிப்பதற்காக நியமிக்கப்பட்ட ஆசிரிய உதவியாளர்களுக்குச் சம்பளம் உயர்த்தப்பட்டுள்ளதாகவும் குற்றச்சாட்டாகக் குறிப்பிடுகின்றார்கள். ஏன், இவ்வாறு பாரபட்சம் காட்டப்பட்டிருக்கிறது? என்ற கேள்வியை அவர்கள் எழுப்பியிருக்கிறார்கள்.

அதேநேரம் இன்னுமொரு கேள்வியையும் நான் அவர்கள் சார்பாக கேட்க விரும்புகின்றேன். ஆசிரிய உதவியாளர்களாக நியமிக்கப்பட்டவர்கள் வழமையான ஆசிரியர்களிலிருந்து வேறுபட்ட சம்பளத்தையும் வேறுபட்ட தரநிர்ணயங்களையும் கொண்டிருப்பதனால், அவர்கள் இந்த வரவு செலவுத் திட்டத்தில் பெரிய எதிர்பார்ப்பைக் கொண்டிருக்கிறார்கள். இந்த வரவு செலவுத் திட்டம் சமர்ப்பிக்கப்பட்டதன் பின்னர், உள்நாட்டலுவல்கள் அமைச்சர் அவர்கள் அரச ஊழியர்களுக்குச் சம்பளம் அதிகரிக்கப்படும் என்ற ஓர் உறுதிமொழியை இந்தச் சபையிலே வழங்கினார். அரச ஊழியர்களுக்கான சம்பள அதிகரிப்பின்போது, தங்களுக்கும் சம்பள அதிகரிப்புக் கிடைக்குமா என்ற எதிர்பார்ப்பு இந்த ஆசிரிய உதவியாளர்களிடத்திலும் இருக்கிறது. எனவே, அதுதொடர்பில் தெளிவுபடுத்துமாறு நான் கௌரவ அமைச்சர் அவர்களை விநயமாகக் கேட்டுக்கொள்வதோடு, அவர்களது பிரச்சினைகளை எந்த வகையில் தீர்க்கமுடியும் என்பதையும் சபைக்குத் தெரியப்படுத்துமாறு கூறி, வாய்ப்புக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. M.H.M. Salman. You have three minutes.

[7.37p.m.]

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)
Hon. Presiding Member, thank you for giving me a little time to speak on this important Adjournment Motion moved by the Hon. Abdullah Mahrooff.

I have here with me a Memorandum submitted to all Members of Parliament by the All Ceylon Muslim Educational Conference. In it, they are highlighting a number of issues pertaining to the education of the Muslim community. Since I have very little time, I would like to draw the attention of the Hon. State Minister to the burning issues they have highlighted in point form.

[ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා]

The first issue they are raising is, the appointment of Moulavi Teachers. The Hon. Mohamed Navavi also referred to it. I want the Hon. State Minister to look into and find a speedy solution to that vexed problem. The second issue is, the appointment of graduate teachers. The third one is, the appointment of teachers holding Diploma in Teaching from Colleges of Education. The fourth point refers to the appointment of uncertificated teachers and the fifth point relates to the upgrading and enhancement of facilities at Aluthgama and Addalaichenai Colleges of Education.

I would like to hand over a copy of this Memorandum to the Hon. State Minister. Please, look into this and try to remedy the issues raised by the All Ceylon Muslim Educational Conference.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. V.S. Radhakrishnan. You have five minutes.

[பி.ப. 7.39]

**ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා (අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. V.S. Radhakrishnan -State Minister of Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට five minutes නම් මදි. මිනිත්තු දහයක්වත් මට ලබා දෙන්න, මේවාට උත්තර දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි පහක කාලයක් තමයි අපට ලබා දෙන්න පුළුවන්. උපරිම වශයෙන් විනාඩි හයක් ලබා දෙන්නම්.

**ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாட்டிலுள்ள 9,809 மாகாணப் பாடசாலைகளிலும் 353 தேசிய பாடசாலைகளிலும் நிலவும் ஆசிரிய வெற்றிடங்களுக்கு அமைவாக நியமனங்கள் வழங்கப்படுகிறது. இலங்கை ஆசிரிய சேவைக்கு சேர்த்துக்கொள்ளல், பயிற்சியளித்தல் மற்றும் நியமனம் வழங்குதல் தேசிய மட்டத்தில் நடைபெறுவதோடு, நியமனம் வழங்கிய இடத்திற்கு நியமனங்களைப் பெற்றுக் கொள்வதற்கு நியமனதாரி கட்டுப்பட்டவராக இருக்கின்றார். மாகாணப் பாடசாலைகளுக்குப் பட்டதாரிகளை இணைத்துக் கொள்வது அந்தந்த மாகாண சபைகளினாலும் தேசியப் பாடசாலைகளுக்குப் பட்டதாரிகளை இணைத்துக்கொள்ளுதல் மத்திய அரசினாலும் மேற்கொள்ளப்படும். ஆசிரிய வெற்றிடங்கள் நிலவும் முறைமைக்கு அமைவாக ஆசிரியர்களை நியமிப்பதோடு, வதிவிடப் பிரதேசங்களுக்கு ஆசிரிய நியமனங்கள் வழங்கும் வாய்ப்புகள் இல்லை. அந்தந்தப் பாடங்களுக்கு ஏற்றவகையில் ஆசிரியர்கள் இலங்கையில் எல்லாப் பகுதிகளிலிருந்தும் தேர்வாகாதவிடத்து, புவியியல் முறைப்படி சில பிரதேசங்களில் சில பாடங்களுக் காக அதிகப்படியான ஆசிரியர்கள் உருவாக்கப்படுவார்கள். எனவே, நாட்டிலுள்ள பாடசாலைகளில் நிலவும் வெற்றிடங் களுக்கு அமைவாக ஆசிரியர்களை நியமிப்பது வழக்கமாக இருக்கின்றது.

கௌரவ உறுப்பினர் அப்துல்லா மஹ்ரூப் அவர்கள் குறிப்பிட்ட விடயங்களை எடுத்துக்கொள்வோம். ஆட்சேர்ப்பு நியமத்தின்படி, 35 வயதிற்குக் குறைந்தவர்கள் ஆசிரிய சேவையில் உள்வாங்கப்படுவது இலங்கை ஆட்சேர்ப்புத் திணைக்களத்தினால் சொல்லப்படுகின்ற ஒரு விடயமாகும். அதேபோல் பட்டதாரி ஆசிரியர்கள் மாகாணசபை மூலமாக உள்வாங்கப்படுவது வழக்கமாக இருக்கின்றது. தேசிய பாடசாலைகளுக்கு 422 பட்டதாரி ஆசிரியர்களை வெள்ளிக்கிழமை நியமிப்பதற்கான ஏற்பாடுகள் செய்யப் பட்டிருக்கின்றன. இவர்கள் பொதுவாக தேசிய பாடசாலைகளுக்குத்தான் நியமிக்கப்படுவார்கள்.

மேலும், அவர் 445 தொண்டர் ஆசிரியர்கள் பற்றியும் குறிப்பிட்டிருந்தார். கிழக்கு மாகாணத்தைப் பொறுத்தளவில், 2009ஆம் ஆண்டுக்கு முதல் சேவையில் சேர்ந்த தொண்டராசிரியர்கள் முதலாவதாகத் தெரிவுசெய்யப்பட வேண்டுமென்ற அடிப்படையில் அவர்களுக்கு நியமனக் கடிதங்கள் அனுப்பப்பட்ட பொழுதும், அவர்கள் ஒன்றுசேர்ந்து அதற்கு முன்னுள்ள ஆண்டாக அதனை மாற்றவேண்டுமென்று விடுத்த வேண்டுகோளின்படி, 2007ஆம் ஆண்டுக்கு முன்பு வேலை செய்தவர்களுக்கு இந்த நியமனம் வழங்குவதற்கான ஏற்பாடுகள் இப்பொழுது செய்யப்பட்டிருக்கின்றன. கௌரவ பிரதம மந்திரி அவர்களின் ஆலோசனையின்படி அமைச்சின் செயலாளர் திரு. சிவஞானசோதி அவர்களின் மூலமாக 445 பேருக்கு நியமனம் வழங்குவதற்கான அமைச்சரவைப் பத்திரம் இப்பொழுது தாக்கல் செய்யப்பட்டிருக்கின்றது. அதேபோல, வடமாகாணத்திலே 682 தொண்டராசிரியர்களுக்கு இப்பொழுது நியமனம் வழங்குவதற்கான ஏற்பாடுகள் செய்யப் பட்டுள்ளன. இதிலே ஒரு பகுதியாக 182 பேர் இப்பொழுது தெரிவு செய்யப்பட்டிருக்கின்றார்கள். மிகுதியானோரை வெகு விரைவிலே தெரிவு செய்வதற்கான நடவடிக்கை எடுக்கப்படும் என்பதையும் தெரிவித்துக்கொள்கின்றேன்.

பொதுவாக College of Education - கல்வியற் கல்லூரியிலிருந்து வெளியேறும் ஆசிரியர்களை ஆசிரிய சேவையில் உள்வாங்கும்பொழுது இலங்கையிலே எந்தப் பகுதிக்கும் சென்று சேவை செய்ய வேண்டுமென்று அவர்களுக்கு ஒரு condition விதிக்கப்படுகிறது. அதை மாற்ற முடியாது. Bond signed பண்ணிய பிறகுதான் அவர்கள் சேவையில் உள்வாங்கப்படுகிறார்கள். ஆகவே, கிழக்கு மாகாணத்திலே அத்தகைய ஆசிரியர்களை இடமாற்றம் செய்யவேண்டுமென்ற உங்களது கோரிக்கையை நிறை வேற்றுவது சற்று சிரமமாக உள்ளதென்பதை உங்களுக்கு நாங்கள் தெரிவித்துக்கொள்ள வேண்டும். அதேநேரத்தில், physically - உடல் ரீதியாக மிகவும் கஷ்டத்தை அனுபவிக் கின்றவர்களால் கொடுக்கப்பட்டிருக்கின்ற appeal இப்பொழுது பரிசீலனையில் இருக்கின்றது.

அதேபோல, மௌலவி ஆசிரியர் நியமன விடயமானது விசேடமாக கருதப்படவேண்டிய ஒரு விடயமாகும். சென்ற கிழமைகூட அது சம்பந்தமாக ஒரு கவனயீர்ப்புப் போராட்டம் அமைச்சுக்கு முன்னால் நடந்தது. இது தொடர்பாக அமைச்சர் அவர்கள் Cabinet இற்கு அமைச்சரவைப் பத்திரமொன்றை தாக்கல் செய்திருக்கிறாரென நான் நினைக்கின்றேன். வெகு விரைவிலே மௌலவி ஆசிரியர்கள் மற்றும் இந்து சமய

ஆசிரியர்களை உள்வாங்குவதற்கான வழிவகைகள் செய்யப் பட்டிருக்கின்றன.

இலங்கையிலே இப்பொழுது 14,000 ஆசிரிய வெற்றி டங்கள் நிலவுகின்றன. கல்வியியற் கல்லூரிகளிலிருந்து வெளியாகிய ஆசிரியர்கள் 3,500 பேர்தான்! இந்த 3,500 பேரையும் வைத்துக்கொண்டு நாட்டின் எல்லாப் பகுதி களுக்கும் நியமிக்கவேண்டிய சூழ்நிலை ஏற்பட்டிருக்கிறது. ஒவ்வொரு மாகாணத்திலுமுள்ள மாகாண கல்விச் செயலாளர்கள் தங்களுக்கு இத்தனை ஆசிரியர்கள் வேண்டுமென்று கேட்டதன் அடிப்படையில் அதில் ஒரு தொகுதியினர்தான் கொடுக்கப்பட்டது. அதாவது, ஆயிரம் ஆசிரியர்களைக் கேட்டிருந்தால் 500 அல்லது 400 ஆசிரியர்கள்தான் கொடுக்கப்பட்டிருக்கிறது. பதுளையிலே எந்த ஆசிரியர் வெற்றிடமும் இல்லையென்று கௌரவ அரவிந்த் குமார் அவர்கள் சொன்னார். ஊவா மாகாணத்திலே 17 ஆசிரிய வெற்றிடங்கள்தான் இருப்பதாக அவர் சுட்டிக்காட்டியிருக்கிறார். ஏனென்றால், அதிகமாக பட்டதாரி ஆசிரியர்களை உள்வாங்குவதற்காக vacancy இல்லையென்று அவர் சுட்டிக்காட்டியிருக்கிறார். Diploma ஆசிரியர்களை நியமனம் செய்வதற்கான சந்தர்ப்பம் அங்கு இல்லாமல் செய்யப்பட்டிருக்கிறது என்பதுதான் உண்மை! அமைச்சுக்கு நீங்கள் வந்தால் அவர்கள் அனுப்பிய கடிதங்களை உங்களுக்கு காட்டலாம்! இத்தனை vacancy தான் இருப்பதாகக் கூறப்பட்டிருப்பதைக் காட்டலாம்!

அதேபோல திரு. திலகராஜா அவர்கள் 3,026 ஆசிரியர்கள் சம்பந்தமாக கேட்டிருந்தார். அதற்காக 2014ஆம் ஆண்டு இதற்கு முன்பிருந்த அரசாங்கத்தினால் gazette பண்ணப் பட்டது. அந்த gazette இலே ஆசிரிய உதவியாளராக அவர்கள் உள்வாங்கப்படுமென்றும் அவர்களுக்கு கொடுப்பனவாக ஆறாயிரம் ரூபாய் கொடுக்கப்படுமென்றும் சொல்லப் பட்டிருந்தது. ஆசிரிய கலாசாலையிலே 3 வருட பயிற்சியைப் பெற்ற பிறகு 3-1 தர ஆசிரியர்களாக அவர்களை நியமிப் பதற்கான ஏற்பாடுகள் செய்யப்படுமென்றும் அதில் சொல்லப்பட்டிருந்தது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. State Minister, please wind up now.

**ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
Please, give me two more minutes, Sir.

அதற்குப் பிறகு அமைச்சரவைப் பத்திரத்தின் மூலம் கல்வி அமைச்சர் கௌரவ அக்கில விராஜ் காரியவசம் அவர்களால் அவர்களுக்கு மேலும் நாலாயிரம் ரூபாய் பெற்றுக் கொடுக்கப்பட்டது. அவர்களுடைய பயிற்சி ஏப்பிரல் மாதத்தில் முடிவடைகிறது. அந்த வகையில், ஏப்பிரல் மாதத்திற்குப் பிறகு அவர்கள் இலங்கை ஆசிரியர் சேவை 3-1 தரத்திற்கு உள்வாங்கப்படுவார்கள் என்பதையும் நான் தெரிவித்துக் கொள்கின்றேன். இந்த பிரச்சினை ஒரு பாரிய பிரச்சினை என்பது எனக்குத் தெரிந்த விடயமாகும்.

அதேபோல, பௌத்த ஆசிரியர்கள் contract basis இலே ஒப்பந்தம் மூலம் உள்வாங்கப்பட்டிருப்பதாகவும் அவர் சொன்னார். நிச்சயமாக அவர்கள் அப்படி உள்வாங்கப் பட்டிருக்கிறார்கள். ஏனென்றால், அந்த gazette இற்கும் இந்த gazette இற்கும் வித்தியாசம் இருக்கிறது. அவர்களுக்கு contract basis இலே நியமனம் கொடுக்கப்பட்டதற்குப் பிறகு அமைச்சரவைப் பத்திரம் தாக்கல் செய்யப்பட்டு அவர்கள் ஆசிரிய சேவையில் உள்வாங்கப்பட்டார்கள். ஆனால், 2014ஆம் ஆண்டைய gazette இன்படிதான் இவர்களுக்கு நியமனம் கொடுக்கப்பட்டிருக்கிறது.

கௌரவ உறுப்பினர் சல்மான் அவர்கள் 4 - 5 கோரிக்கை களை இங்கு விடுத்திருக்கின்றார். அவை பரிசீலனைக்குரிய விடயங்களென நான் நினைக்கின்றேன். பரிசீலனைக்குப் பிறகு அமைச்சரவைக்குக் கொண்டு சென்று உரிய நடவடிக்கைகளை எடுக்க முடியும் என்பதையும் தமிழ் மொழிமூலப் பாடசாலைகளிலுள்ள வெற்றிடங்களை நிரப்பு வதற்கான நடவடிக்கை எதிர்காலத்திலே நிச்சயமாக எடுக்கப்படும் என்பதையும் தெரிவித்துக்கொள்ள விரும்பு கின்றேன்.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.46ට, 2017 නොවැම්බර් 15 වන දින සභා සම්මතිය අනුව 2017 නොවැම්බර් 23වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 7.46 மணிக்கு பாராளுமன்றம், அதனது 2017 நவம்பர் 15ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க, 2017 நவம்பர் 23, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 7.46 p.m. until 9.30 a.m. on Thursday, 23rd November, 2017 pursuant to the Resolution of Parliament of 15th November, 2017.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.